# සිදත්සඟරා විස්තර සන්නය

ප්‍රතිරාජපරිවෙණාධිපති
මහාමහොපාධ්‍යාය වෙදෙහ මහා ස්වාමිපාදයන් වහන්සේ
විසින් විරචිත
සිංහල ව්‍යාකරණය ඇසුරු කොට
පැලියගොඩ
විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය
උපාධ්‍යාය ධුරන්ධර

## රත්මලානේ ධර්මකීර්ති ශ්‍රී ධර්මාරාමාභිධාන

කොළඹ හලාවත දෙදිශාවේ ප්‍රධාන සඞ්ඝනායක
ස්වාමිපාදයන් වහන්සේ විසින්
ප්‍රතිපාදිත යි

ඩී. ඒ. ජයතිලක ගම්සභාපති මහත්මයා
විසින් ප්‍රකාශිත යි.

(පසුවම මුද්‍රාඞ්කනය)

සත්‍යසමුච්චය යන්ත්‍රාලයෙහි මුද්‍රිත යි.

1942

# සංඥාපනය

සිංහලභාෂාතොමෝ වනාහි මීට අවුරුදු දෙදහස් දෙසියයෙකින් පූර්වයෙහි ද ත්‍රිපිටකාර්ථකථාදි උතුම් පොත් පත් ලියන්ට පමාංසුදුසු ව පැවැති පිරිසුදු ව්‍යාකරණලක්ෂණයෙන් යුක්ත ආර්‍ය්‍ය භාෂාවකි. මේ ස්වදෙශභාෂාව ලක්දිව්වැස්සන්ට පමණක් සාධාරණ වූ හෙයින් අන් සමහරභාෂා පමණ දෙශාන්තරවිපරිණාමයට නොපැමිණියහැකි නමුත් කාලාන්තරවශයෙන් අවුරුදු දහසෙකින් පෙර පැවැති රීතියට වඩා වර්තමාන රීතියෙහි විශෙෂත්වයක් පවතී. අනුරාධපුර-පුලස්තිපුර-රාජධානිකාලයන්හි පිහිටුවනලද ශිලාලෙඛනාදියෙන් ද ඒ ඒ කාලවල ලියනලද පොතපතින් ද ඒ බව ප්‍රකාශ වේ. පුරාතන රීතියට අනු ව පැවැති සිංහල ව්‍යාකරණ පොත් සිදත්සඟරාව ප්‍රකාශ වූ පසු ක්‍රමයෙන් අභාවයට ගියේය යි සිතියයුතුයි. අවුරුදු 800 කින් මෑතකාලයෙහි සිංහලභාෂාවේ සංරක්ෂණය පිණිස පැවැති ව්‍යාකරණ ග්‍රන්ථය නම් මේ සිදත්සඟරාව ම ය. ෂඩ්භාෂාපරමෙශ්වර තොටගමුවේ ශ්‍රීරාහුල සඞ්ඝරාජ ස්වාමිපාදයන් විසින් කාව්‍යශෙඛරයෙහි :-

"තත්වරද ලොප් — වන
ක්‍රිය අදියර සත් — වන
අදෙස් හැදහිලි — වන
එසද ගුණයෙන් සඳලකුණු — වන"

යන ශ්ලෙෂකාව්‍යයෙන් දක්වනලද ව්‍යාකරණශාස්ත්‍රය ද මේ සිද්ධාන්තසඞ්ග්‍රහය ම ය. මේ ඉතා සංක්ෂෙපයෙන් කරනලද්දක් වුවත් මාගධසංස්කෘතාදි ව්‍යාකරණයන් ආධාර කොට ඇති හෙයින් අසම්පූර්ණ නො වේ. මෙහි සඞ්ගෘහීත වූ ව්‍යාකරණොපදෙශ රාශිය මේසා ග්‍රන්ථලාඝවයෙකින් යුක්ත කොට දක්වීමෙන් ප්‍රතිරාජපරිවෙණාධිපති ආචාර්‍ය්‍යපාදයන්ගේ චාතුර්‍ය්‍යාතිශය ප්‍රකාශ වේ. මෙසේ සංක්ෂිප්ත වූ මෙයින් සිංහල ව්‍යාකරණය පුහුණුකරන ආධුනිකයන්ට මාගධාදි අන්‍යව්‍යාකරණයන්ගෙන් විස්තරාර්ථග්‍රහණය නිරතුරු ම වුවමනා වේ. පුරාතන සිද්ධාන්ත ව්‍යාඛ්‍යානයෙහි මීට වුවමනා වූ බාහිර ව්‍යාකරණවිධි විස්තර සේ නො දක්වූයෙන් හෙ ද මේ සඳහා සංක්ෂෙප ව්‍යාඛ්‍යානයෙක් විය. මෙකල ආධුනිකයන්ට වුවමනා සේ බාහිර ව්‍යාකරණොපදෙශ සහිත විස්තර ව්‍යාඛ්‍යානයෙක් ඇතිවී නම් යෙහෙකැයි සැලකූ අප විසින් අයදනාලද පූජ්‍යාචාර්‍ය්‍ය විද්‍යාලඞ්කාරපරිවෙණාධිපති නායක

ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් මේ විස්තරසන්නයේ පූර්වාර්ධය මීට අවුරුදු තුදුසකින් පූර්වයෙහිදී සම්පාදනයකරනලදින් වර්ෂ 1887 දී අපේ කර්තෘත්වයෙන් පැවැති සත්‍යසමුච්චය සඟරාවෙහි ද ඒ විස්තර සන්නයෙන් කොටසක් ප්‍රකාශකරවීමු. එයින් විපුලප්‍රයෝජන ලැබූ ආධුනිකයෝ සම්පූර්ණපොත ලබාගැන්මෙහි සාපේක්ෂක වූහ. එහෙයින් ස්වභාෂාභිවෘද්ධිකාමී අප මිත්‍ර ශ්‍රීමත් ද සිල්වා සෙනෙවිරත්න වාසලමුදලිමැතිතුමාගේ හා අපගේත් ආරාධනාව පිළිගත් යථොක්ත නායක ස්වාමීන්ද්‍රයන්වහන්සේ යථාවකාශයෙන් ඒ අවසානභාගය ද ලියා පූර්වභාගය ද සකස් කොට මේ විස්තර ව්‍යාඛ්‍යානය සම්පූර්ණ කර වදාළෝ ය.

මෙසේ සම්පූර්ණත්වයට පැමිණි මේ විස්තරසන්නය සිංහල ව්‍යාකරණයේ විශේෂ දීප්තිමත්භාවයක් ගෙනදීමට යෝග්‍ය පරිද්දෙන් පිළියෙළ වී තිබෙනු දක්ම ශාස්ත්‍රාභිවෘද්ධිකාමී සියල් ලන්ට ම ප්‍රීතියට හේතු වේ යයි සලකමු. කාලාන්තරයක් මුළුල් ලෙහි පැවත ආයෙන් උගතුන්ට පවා වාචොද්ගත ව ආ බොහෝ දූෂිතපාඨ මේ සන්නයේ පෙළෙහි ද ශුද්ධියට පමුණුවනලද්දේ ය. එසේ ම පදාර්ථ භාවාර්ථ වරදවා ගැන්මෙන් ව්‍යාකූල ව ආ නොයෙක් තැන් ද නිරාකූල ලෙස හේතු උදාහරණ සහිත ව මෙහි විස්තර කරනලද්දේ ය.

සිදත්සඟරාවේ "මෙඟි පදනුවග" යනාදි කව හා එහි සන්නයත් ප්‍රසාදවහ නො වූ අව්‍යක්ත ගෙදුමක් ලෙස පැවත ආ නමුත් මේ ව්‍යාඛ්‍යා සහිත පාඨශුද්ධියේදී යටපත් මහානිධානයක් මතුකොට දක්වන්නාක් මෙන් ශබ්දාලඞ්කාර අර්ථාලඞ්කාර දෙකින් විසිතුරු වූ මාහැඟි කාව්‍යයක් බවට පමුණුවා ලීම සියලු සිංහල සුධීන්ට ම ප්‍රීතිජනක ලාභයක් වේ. එය වනාහි මේතාක් ම ස්වභාෂාවේ (කව්සිළුමිණෙහි හැර) අන් කිසි කව්පොතක දකින්ට නො ලැබෙන ශාස්ත්‍රනාමකර්තෘනාමගර්භචක්‍රයකි. "ෂඩරචක්‍රබන්ධ" නම් විචිත්‍ර විශිෂ්ට කාව්‍යබන්ධනයක් වූ මෙයින් කාව්‍යාභිලාෂීන්ට ලැබියහැකි ප්‍රමොදය අප්‍රමාණ ය. මෙය ඇසුරු කොටගෙන නායක ස්වාමිපාදයන් වහන්සේ විසින් ව්‍යාඛ්‍යානාවසානයෙහි යොදනලද අභිනව පද්‍යය ද මෙසේ ම ෂඩරචක්‍රබන්ධනවශයෙන් විරචිත ය. එහි චක්‍රවින්‍යාසය මෙසේ යි :-



"ප පණා ඈහි, ආණෑපය ද යුතුබස්, බත් තුසි බෙම්, තොප කිත් කිළිය, සොමි කිසවන සුලු, විරූදුවා නම්, වියරණ සිඳු බජ මිත, විනඩනදපිතිපිලෙන, දියදදනා තර නනා මිත" යනාදි වශයෙන් මෙහි නොයෙක් තත්හි කරනලද පාණ්ඩුදධි ද සූක්ෂ්මබුද්ධි මතුත්ව අතිශයෙන් ප්‍රීතිජනක වේ.

තවද පාණිනීය, චාන්ද්‍ර; කාතන්ත්‍ර, මුග්ධබෝධ, මහාභාෂ්‍ය, භාෂ්‍යප්‍රදීප, වාක්‍යපදීය, වෛයාකරණසර්වස්ව, ත්‍රිලොචනදාස පඤ්ජිකා, නිරුක්තශාස්ත්‍ර, ප්‍රාකෘතශාස්ත්‍ර, අපභ්‍රංශශාස්ත්‍ර, (තර්ක) න්‍යායශාස්ත්‍ර, වෛශෙෂිකශාස්ත්‍ර, මීමාංසාමකරන්ද, වාත්ස්‍යායන භාෂ්‍ය, ආකර, මනුස්මෘති, භරතශාස්ත්‍ර, අමරකොශ, මෙදිනීකොශ, කාව්‍යප්‍රකාශ, කාව්‍යාදර්ශ, අලඞ්කාරසර්වස්ව, ආග්නෙයපුරාණ, සරස්වතීකණ්ඨාභරණ, වාග්භටාලඞ්කාර, සාහිත්‍යදර්පණ, නෛෂධ කාව්‍ය, (ශිශුපාලබධ=) මාඝකාව්‍ය, වාසවදත්තා, කාදම්බරී ආදි

සංස්කෘත ග්‍රන්ථවලින් ද— මෞද්ගල්‍යායන ව්‍යාකරණ, පඤ්චිකා ප්‍රදීප, බාලාවතාර, සුබොධාලඞ්කාර, මහාබොධිවංශ, ධර්මප්‍රදීපිකා, අභිධර්මාර්ථකථාදි මාගධානුගත ග්‍රන්ථවලින් ද— සියබස්ලකර, ලකුණුසර, මුවදෙව්දා, ගුත්තිලදා, කව්සේකර, හංස-කීර-ශාරිකා සන්දෙශ, බුදුගුණඅලඞ්කාරාදි එළුපොත්වලින් ද „ සුදුසුතන්හි ගෙනහැර දක්වනලද මානැඟි උපදෙශනිදර්ශනවලින් මේ සත්කෘතය ප්‍රතිමණ්ඩිත ව තිබේ. අවසානයෙහි කවිසමය සම්බන්ධ වූ විශෙෂොපදෙශ ද සංක්ෂෙපක්‍රමයෙකින් දක්වනලද්දේ ය.

මෙසේ ලොකාර්ථදායි වූ මේ උතුම් සත්කෘත්‍යය අපගේ ආරාධනාවෙන් සිද්ධ කර වදාළා වූ විද්වජ්ජනශෙඛරායමාණ පූජ්‍යාචාර්ය විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත ද, මෙවැනි ප්‍රාචීනශාස්ත්‍රාභිවෘද්ධිදායි ග්‍රන්ථයක් ප්‍රකාශකිරීමෙහි ධෛර්ය ගෙන දෙමින් සාදරයෙන් ප්‍රතිග්‍රහණය කළා වූ ප්‍රසිද්ධාධ්‍යාපනයෙහි අධ්‍යක්ෂ ධුරන්ධර ඇස්. ඇම්. බරෝස් මහතාණන් වෙත ද අපගේ ගෞරව ස්තොත්‍රය හා ශුභාශංසනයත් මෙයින් ප්‍රකාශ කරම්හ.

මේවගට,

D. B. Jayatilaka.

1902 සැප්තැම්බර් මස
2 වෙනි දින කොළඹදී ය.

# සූචිපත්‍රය


| | පිට |
|---|---|
| **1–සංඥාධිකාරය** | |
| සංඥාදී පඤ්චකය | 1 |
| අඞ්ගසූත්‍රවර්ණනා | 4 |
| සංඥා විධිය | 7 |
| සන්ධි ,, | 11 |
| ලිඞ්ග ,, | 12 |
| විභක්ති ,, | 13 |
| සමාස ,, | 14 |
| ප්‍රකෘති ,, | 15 |
| ප්‍රත්‍යය ,, | 19 |
| ක්‍රියා ,, | 20 |
| ලෝප ,, | 21 |
| ආදේශ ,, | 22 |
| ආගම ,, | 23 |
| පූර්වරූප ,, | 24 |
| ද්විරූප ,, | 25 |
| විපර්යාස ,, | 26 |
| වෘද්ධි ,, | 30 |
| මාත්‍රාහානි ,, | 31 |
| නිපාත ,, | 32 |
| නියම ,, | 33 |
| අනියම ,, | 34 |
| අවිද්‍යමාන ,, | ,, |
| ජාත්‍යාදිපඤ්චකය හා අර්ථාදිද්විකය | 35 |
| ජාති ශබ්දය | ,, |
| ද්‍රව්‍ය ,, | 36 |
| ගුණ ,, | 37 |
| ක්‍රියා ,, | ,, |
| භාවක්‍රියා අර්ථක්‍රියා ශබ්ද | 38 |
| සංඥා ශබ්දය | 39 |
| අර්ථාරූඪද්විභේදය | 40 |
| භකාරවිනිශ්චය | 42 |
| ආදේශභකාරය | 43 |

| | පිට |
|---|---|
| ආගමභකාරය | 45 |
| ප්‍රකෘති ,, | 47 |
| ප්‍රාණාක්ෂරපාඨ | ,, |
| සමානපාඨ | 48 |
| ස්වරභකාරපාඨයන්ගේ අනියමවිධිය | 49 |
| **2–සන්ධ්‍යධිකාරය** | |
| 1. පූර්වස්වරලෝපසන්ධි | 52 |
| 2. පරස්වරලෝප ,, | 53 |
| 3. ස්වර ,, | 54 |
| 4. ස්වරාදේශ ,, | ,, |
| 5. ගත්‍රාදේශ ,, | 55 |
| 6. පූර්වරූප ,, | 56 |
| 7. ගාත්‍රාක්ෂරලෝප ,, | 57 |
| 8. ආගම ,, | ,, |
| 9. ද්විරූප ,, | 58 |
| **3–ලිඞ්ගාධිකාරය** | |
| ප්‍රාණිවාචිශබ්දයන්ගේ ලිඞ්ගභේදය | 61 |
| අප්‍රාණි පුංලිඞ්ගිකශබ්ද | ,, |
| අප්‍රාණි ස්ත්‍රීලිඞ්ගික ශබ්ද | 63 |
| ස්ත්‍රීප්‍රත්‍යයවත් ,, | 64 |
| ස්ත්‍රීලිඞ්ගික අර්ථක්‍රියා ,, | ,, |
| ,, ගුණ ,, | 65 |
| පුරුෂලිඞ්ගිකයෙන් සිද්ධ ස්ත්‍රීලිඞ්ගික ,, | 65 |
| ද්විලිඞ්ගසම ,, | 67 |
| ක්‍රියාශබ්දයන්ගේ ලිඞ්ගභේදය | ,, |
| අලිඞ්ගශබ්ද | ,, |
| නිපාත-උපසර්ග | 69 |
| **4–විභක්ත්‍යධිකාරය** | |
| ස්වරාන්ත හලන්තශබ්ද | 71 |
| 1. ප්‍රථමාවිභක්ති | 72 |
| විභක්ත්‍යාශ්‍රිත ආගමසංහිතා | 76 |

| | පිට |
|---|---|
| විභක්තිප්‍රතිපාත | 77 |
| 2. කර්මවිභක්ති | 78 |
| 3. කර්තෘ ,, | 85 |
| 4. කරණ ,, | 88 |
| 5. සම්ප්‍රදාන ,, | 90 |
| 6. අවධි ,, | 94 |
| නිර්ධාරණ | 96 |
| 7. සම්බන්ධවිභක්ති | 97 |
| 8. ආධාර ,, | 101 |
| 9. ආලපන ,, | 105 |
| ආණප්‍රත්‍යයාදිය | 107 |
| ද්විවිභක්තිප්‍රයොග | 110 |
| **5–සමාසාධිකාරය** | |
| සමාසවිධි | 111 |
| අව්‍යයසමාසය | 113 |
| 1. යවාදිසමාස | 114 |
| 2 ඛාදි ,, | 115 |
| 3. පාදි ,, | ,, |
| 4. නඅරුත්සමස් | 116 |
| විභක්තිසමාසය | 117 |
| 1. කර්මවිභක්තිසමාස | ,, |
| 2. කර්තෘ ,, ,, | 118 |
| 3. කරණ ,, ,, | 119 |
| 4. සම්ප්‍රදාන ,, ,, | 120 |
| 5. අවධි ,, ,, | ,, |
| 6. සම්බන්ධ ,, ,, | ,, |
| 7. ආධාර ,, ,, | 121 |
| විශෙෂණසමාසය | ,, |
| අන්‍යාර්ථ ,, | 124 |
| තද්ගුණඅතද්ගුණ | 126 |
| දකාරාර්ථසමාසය | 128 |
| **6–විශෙෂණවිශෙෂ්‍යාධිකාරය** | |
| විශෙෂණවිශෙෂ්‍යවිධි | 130 |
| සමානාධිකරණ විශෙෂණ | 131 |
| භින්නාධිකරණ ,, | 132 |
| කාමිචාරවිශෙෂණ | |
| විශෙෂ්‍ය විනිශ්චය | 134 |
| **7–ක්‍රියාධිකාරය** | |
| අකර්මක ධාතු | 135 |
| සකර්මක ,, | 136 |
| ත්‍රිකාලය | 137 |
| අන්‍යකාරක | |
| ත්‍රෛකාලිකප්‍රත්‍යය | 138 |
| ක්‍රියාපදසිද්ධි | 139 |
| තශබ්දකාරක | |
| මශබ්දකාරකප්‍රත්‍යය | 144 |
| අර්ථක්‍රියා සිද්ධි | 146 |
| ප්‍රයොජ්‍යක්‍රියා | 148 |
| විධික්‍රියා | 151 |
| ආශීඃක්‍රියා | 153 |
| කර්මක්‍රියා | 164 |
| අසම්භාව්‍යක්‍රියා | 158 |
| පූර්වක්‍රියා | 161 |
| මිශ්‍රක්‍රියා | 164 |
| **8–ප්‍රත්‍යයාර්ථාධිකාරය** | |
| කෘදන්ත ප්‍රත්‍යයාර්ථ ශබ්ද | 166 |
| තද්ධිත ,, ,, | 173 |
| අභෙදොපචාරය | 176 |
| තර්කවිද්‍යාගත උපචාර | |
| විස්තරය | 177 |
| **9–උක්තානුක්තාධිකාරය** | |
| උක්තානුක්තවිධි | 179 |
| **10–ක්‍රියාකාරකපදසම්බන්ධාධිකාරය** | |
| කාරකනාමාර්ථ | 183 |
| ක්‍රියාකාරකපදයොජනා | 184 |
| **11–ඉෂ්ටානිෂ්ටාධිකාරය** | |
| අෂ්ටගණභෙද | |
| ඉෂ්ටානිෂ්ටතා | 185 |
| ඉෂ්ටානිෂ්ටවර්ණ | 189 |
| ,, යොනි | ,, |
| කාව්‍යදොෂ | 190 |
| 1. පුනරුක්ත දොෂය | 191 |
| 2, ග්‍රාම්‍යාර්ථ ,, | 192 |

| | පිට | | පිට |
|---|---|---|---|
| 3. අපක්‍රම දෝෂය | 194 | නින්දාප්‍රශංසා අලංකාරය | 218 |
| 4. නෙය ,, | 196 | අත්‍යාලාප ,, | 220 |
| 5. අසමත්‍ථාව්‍ය ,, | 199 | උත්ප්‍රේක්ෂා ,, | 222 |
| 6. ගූඪාර්ථ ,, | 200 | රූපක ,, | 223 |
| 7. භින්නලිංගවචන | | හේතුරූපක ,, | 226 |
| හා හීනෝත්කෘෂ්ටතා | 201 | උල්ලේඛ ,, | 227 |
| රසස්වරූපය | 204 | යමඇවණ | 228 |
| එළිසම | 205 | කවිසමය | 229 |
| යවහත් | 206 | කාව්‍ය හා කාව්‍යහෙතු | 230 |
| 1?-අලංකාරාධිකාරය | | ග්‍රන්ථෝපසංහාරය | 231 |
| උපමා උපමේයලක්ෂණ | 208 | සිද්ධාන්තයෙහි | |
| වස්තූපමා අලංකාරය | 209 | ෂඩරචක්‍රබන්ධනය | 232 |
| අද්භූතෝපමා ,, | 210 | මාසයෙහි ,, ,, | 233 |
| ශ්ලේෂෝපමා ,, | 211 | එහි රචනාවිධිය | ,, |
| 1. පදශ්ලේෂ ,, | 212 | ශාස්ත්‍රකර්තෘ නාමාංක | |
| 2. අර්ථශ්ලේෂ ,, | ,, | ගර්භචක්‍රය | 234 |
| නින්දෝපමා ,, | 213 | ව්‍යාඛ්‍යාවසාන | |
| විරෝධෝක්ති ,, | ,, | ෂඩරචිත්‍රබන්ධනය | 235 |
| උභයභාෂා ,, | 216 | ශාස්ත්‍රකර්තෘනාමාංකසඥගර්භගීති | ,, |

## ශුද්ධිපත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 14 | 3 | සඝායෙහි | සභායෙහි |
| 18 | 3 | සඳභ : සි | සඳහාසි |
| 2 | 21 | විරූප | ද්විරූප |
| 32 | 9 | වැනී | වැනි |
| ,, | 37 | හෙළිම | හෙළීම |
| 41 | 9 | තෘතියා | තෘතීයා |
| ,, | 17 | අනුකුල | අනුකූල |
| 43 | 5 | සැඳහීලි | සැඳහිලි |
| 47 | 6 | ඝකාරස | හකාරය |
| 52 | 19 | දිග් උ-අඃ | දිග් උ-ආ |
| 55 | 20 | මහණු | මහණ |

මේ ආදි වශයෙන් හ්‍රස්ව දීර්ඝයන්ගේ හා ඝකාර හකාර වකාර වකාරාදීන්ගේ ද අශුද්ධස්ථාන ශුද්ධකොට ගත හැකි හෙයින් නො දක්වමු.

## PREFACE TO THE FIRST EDITION

In the following pages the student of Sinhalese will find a full commentary on the Sidat-Sangara. Of the importance of the latter work in the study of the Sinhalese language it is not necessary to speak here at length. For seven centuries it has been recognised as the standard Grammar of our tongue, and as such it is likely to hold undisputed away for a long time to come. Several grammars on modern, and, it may be even conceded, simpler methods have in recent times appeared, some of which have deservedly become popular. But the advanced student will find his knowledge of Sinhalese Grammar much deficient unless and until he masters the Sidat-Sangara. This old Grammar is, however, composed in such concise form that a full commentary on it is a need felt by every student. That need, I hope, will be amply supplied by this volume.

The first part of this Commentary appeared several years ago in the Oriental Magazine, **Satyasamuccaya,** and was eagerly welcomed by a large circle of readers. That magazine however, ceased to exist before half of the book was published, and the work was left incomplete. At the request of Mr. Simon de Silva, Wasala Mudaliyar, and myself, the learned Nayaka Thera who originally contributed the first part to the **Satyasamuccaya** kindly consented to complete the book and revise it for the press.

In this volume the text is carefully explained, and every point of difficulty and obscurity elucidated and interpreted with a fulness that leaves no room for uncertainty. The copious illustrations, drawn from various sources, Sanskrit, Pali, and Sinhalese, are admirably selected and serve to enhance the value of the expositions.

Another feature of this work which will interest the student and the scholar alike, is the revision of the text which embodies the results of much critical labour and careful research. In several instances, corrupt readings will be found, for the first time, corrected here. I would only refer to the brilliant emendation of the last stanza of the **Sidat-Sangara,** long misread and misunderstood, which in this edition asssumes what must undoubtedly have been its original form as a rare and elegant composition of its kind, worthy of the great Grammarian and his memorable work.

**D. B. Jayatilaka.**

Colombo,
30th September, 1902.

# සිදත්සඟරා විස්තර සන්නය.

## නමව් මුනි සරණ.

**මහද ගඳකිළි කැර—සව්නේ ගෙවා දත්හට**
**දුහුනන් දැනුම් සඳහා—කරනෙම් සිදත්සඟරා. (1)**

---

මුනිසරණ, (සම්‍යක්සම්බුද්ධ) මුනිහුගේ චරණය; නමව්, නමස්කාර කරව්.

(1) **පදාර්ථ**—සව්නේ, සකලඥෙයමණ්ඩලය; ගෙවා, කෙළවර කොට; **දත්හට**, අවබොධ කළා වූ (සර්වඥයා)හට; **මහද**, මාගේ හෘදය; **ගඳකිළි කැර**, ගන්ධකුටියක් කොට; **දුහුනන්**, ආධුනික යන්ගේ; **දැනුම් සඳහා**, ජානනය පිණිස; **සිදත්සඟරා**, එනම් ව්‍යාකරණයක්; **කරනෙමි**, කරන්නෙමි.

**භාවය**– දතයුතු සියලු ධර්මයන් නිමවා දත්තාවූ සර්වඥයන් වහන්සේට මාගේ හෘදය (බුද්ධාවාස වූ) සුවඳගෙයක් කොට ඉහවත් සර්වඥයන්වහන්සේ මාගේ හෘදය නමැති ගන්ධකුටියෙහි වස්වාගෙන අලුත උගන්නවුන්ගේ දැන ගැන්ම පිණිස සිදත්සඟරා නම් ව්‍යාකරණ ග්‍රන්ථයක් කෙරෙමි.

"සිදත්සඟරා" නම් ස්වභාෂාව්‍යාකරණශාස්ත්‍රය කරනුකැමැති ආචාර්ය්‍යපාදයෝ අභීෂ්ටසංසිද්ධිය සඳහා පළමුකොට 'මහද' යනාදි මේ කාව්‍යයාගේ පූර්වාර්ධයෙන් ඉෂ්ටදෙවතානුස්මරණස්වරූප වූ මඞ්ගලාචරණය ද 'දුහුනන්' යනාදි අපරාර්ධයෙන් සංඥාපිත ප්‍රයොජනය ද දැක්වූහ.

ශාස්ත්‍රාරම්භයෙහි ප්‍රාර්ථිත වූ ශාස්ත්‍රයාගේ නිර්විඝ්නපරිසමාප්තිය (=උවදුරක් නො ව නිමවාලීම) පිණිස ඉෂ්ටදෙවතාවන් සිහිකිරීම ශාස්ත්‍රකර්තෘ වූ පණ්ඩිතවරයන්ගේ සදාචාරපරම්පරාපරිප්‍රාප්ත වූ ශිෂ්ටධර්මතාවකි. "මහද" යනාදි මෙකාවෙහි 'ඉෂ්ටදෙවතා' නම් අන්වර්ථවශයෙන් සර්වඥ වූ අප බුදුරජාණන් වහන්සේ ය. ශිවාදීන් කෙරෙහි වැටෙන 'සර්වඥ' නාමයෙකුදු සංස්කෘත කොශාදියෙහි පෙනේ. අසර්වඥ වූ ඔවුන්කෙරෙහි එය රූඪිනාමයෙක් වේ. මෙසේ අසර්වඥශිවාදීන් කෙරෙහි ද ලොකසම්මත වූ රූඪිසර්වඥ

නාමයක් ඇතිහෙයින් මේ ඉෂ්ටදෙවතානුස්මරණය ඔවුන් කෙරෙන් වෙන්කොට ශබ්දාන්තරසාහචර්යයෙන් ශ්‍රොතෘජනයාගේ සැක දුරුකරනු සඳහා ගෘහවාචක සාමාන්‍ය ශබ්දයක් නොයොදා ගෘහවිශෙෂවාචක වූ **'ගඳකිළි'** ශබ්දය ම යොදන ලද්දේ ය. ගඳකිළි (=ගන්ධකුටි) කියා ශිවාදීන්ගේ දෙවොලකට ව්‍යවහාර නො වේ. **"ජිනස්ස වාසභවනම්පි ගන්ධකුටිපුමෙ"** යනු අභිධාන යි. බුදුන්ගේ ලැගුම්ගෙය ගන්ධකුටි (=ගඳකිළි) නමි. සුගන්ධයෙන් ගන්ධිත වූ බුදුගෙය ම අර්ථානුගත ව්‍යවහාරයෙන් "ගඳකිළි" නම් වන හෙයින් **'ගඳකිළි'** යන ශබ්දාන්තරයාගේ සාහචර්යයෙන් (=සමඟ පැවැත්මෙන්) මෙහි අභිමත වූ **'සව්නේ ගෙවා දත්'** ඉටුදෙවිහු බුදුරජාණන්වහන්සේ ම ය යි ශ්‍රොතෘජනයාහට නිසැක ව අවබොධ වේ.

අපරාර්ධයෙන් ප්‍රකාශිත අර්ථපඤ්චකය- **සංඥා, නිමිත්ත, කර්තෘ, පරිමාණ, ප්‍රයොජන,** යන මේ යි.

එහි **'සංඥා'** නම්—වක්තෘශ්‍රොතෘ (=කියන අසන) ජනයාගේ ව්‍යවහාරසෞකර්යය පිණිස කරනුලබන නාමය යි. ඕතොමෝ සාමාන්‍යසංඥාය, විශෙෂසංඥාය යි දෙවැදෑරුම්. මෙහි වනාහි 'හෙළ වියරණ' යනු සාමාන්‍යසංඥා යැ, 'සිදත්සඟරා' යනු විශෙෂසංඥා යි.

**'නිමිත්ත'** නම්-ග්‍රන්ථරචනාවට මුල් වූ කාරණ යැ. හෙ ද අන්තර් නිමිත්ත ය, වාහ්‍යනිමිත්ත ය යි දෙවැදෑරුම්. මෙහි 'සිදත්සඟරා කරනෙම්' යන ප්‍රතිඥාවට මූලකාරණය වූ ආචාර්යයන්ගේ අභ්‍යන්තරයෙහි පැවැති කරුණාව අන්තර්නිමිත්ත යැ, බැහැර පැවැති විප්‍රග්‍රාමවංශෛකකෙතුභූත බන්ධුශ්‍රෙෂ්ඨ වූ **ප්‍රතිරාජදෙව** මන්ත්‍රීශ්වරයාණන්ගේ අධ්‍යෙෂණාව ද ආචාර්යයන්විසින් අනුග්‍රහ කටයුතු වූ ආධුනික විද්‍යාර්ථිජනතාව ද වාහ්‍යනිමිත්ත යි.

**'කර්තෘ'** නම්—මෙහි 'කරනෙම්' යන මසදකරු අනාකල් එකබස් කතුකිරියපෙදෙන් උක්ත වැ අධ්‍යාහෘත වූ 'මම්' යන තත් තුල්‍යාධිකරණ උත්තමපුරුෂෛකවචන කර්තෘස්වරූපයෙන් සිටි විප්‍රග්‍රාමවංශොද්භූත වාඞ්මයපාරාවාරපාරදර්ශී ප්‍රතිරාජපරිවෙණාධිපති **වෙදෙහ** මහාස්වාමිපාදයෝ යි.

**'පරිමාණ'** නම්—පරිච්ඡෙදාදිවශයෙන් දක්වනු ලබන ශාස්ත්‍රයාගේ ප්‍රමාණය යි. මෙහි සිදත්සඟරා යන සමුදායසංඥායෙන් සඞ්ග්‍රහකරනලද **'සන්අදියර'** පටන් කොට **'ලකරඅදියර'** අවසන් කොට ඇති **දොළොස්අදියර පරිමාණ** යි.

'ප්‍රයෝජන' නම්—'යස්‍ය හි යදුද්දිශ්‍ය ප්‍රවෘත්තිරස්ති තත්තස්‍ය ප්‍රයොජනම්' යූ බැවින් යමක් උදෙසා ග්‍රන්ථය කරනුලැබේ ද ඒ උද්දෙශ්‍ය වූ අර්ථය ප්‍රයොජන නමි. හේ මෙහි සිංහලව්‍යාකරණ ග්‍රන්ථකරණය නිසා වක්තෘශ්‍රොතෘජනයා විසින් ලැබිය යුතු ඓහිකපාරත්‍රිකඵලවිශෙෂ යි. හෙ ද මුඛ්‍යප්‍රයොජන ය, ආනුෂඞ්ගික ප්‍රයොජන ය යි දෙවැදෑරුම්. මෙහි "දුහුනන් දැනුම් සඳහා" යන්නෙන් දක්වනලද ආධුනිකයන්ගේ ශබ්දශාස්ත්‍රාවබොධය ප්‍රධාන හෙයින් මුඛ්‍යප්‍රයොජන යැ, ඊට අනතුරු වැ සිද්ධවන ඵලවිශෙෂ ආනුෂඞ්ගිකප්‍රයොජන යි. හේ වනාහි කවිත්වය, වක්තෘත්වය, යසසය, සත්කාරය, ලාභය, යනාදි ඓහිකප්‍රයොජනවිශෙෂ හා ශබ්දශාස්ත්‍රාවබොධයෙන් ආගමශාස්ත්‍රඥතාය, එයින් සුචරිතප්‍රතිපත්තිය, එයින් ස්වර්ගාපවර්ගසම්පත්ප්‍රාප්තිය යන පාරත්‍රිකප්‍රයොජන විශෙෂ ද වේ.

මෙසේ පළමුවන කවෙන් මෙතෙක් අර්ථයන් ප්‍රකාශිතහෙයින් පුරාතන සිද්ධාන්තව්‍යාඛ්‍යානකාරයෝ "ඉෂ්ටදෙවතානමස්කාර පූර්වකකොට සංඥදි පඤ්චකය දක්වනු පිණිස 'මහද' යනාදි කව කියනලදැ"යි කීහු.

මෙකවෙහි **මහද, ගඳකිළි, සව්නේ, සිදත්සඟරා** යන සතර පදයෝ සමාසාන්ත නාමයෝ ය. මා හද= මහද; සම්බන්ධවිභක්ති සමාස යි. ගඳැතියේ– ගඳ, ගඳ ද එම කිළි= ගඳකිළි; විශෙෂණසමාස යි. ගඳින් යුත් කිළි=ගඳකිළි යි කරණවිභක්තිසමාස හෝ වෙයි. සව් ද එම නේ=සව්නේ; විශෙෂණසමාස යි. ව්‍යස්තපක්ෂයෙහි සව්, නේ, යි විශෙෂණවිශෙෂ්‍ය පදරූප දෙකෙක් හෝ වෙයි. සිදු වූ අත් යමෙක්හි, (යමෙකින් හෝ) එතෙම සිදත් (=තතු අරුත්); සිදතුන්ගේ සඟරා= සිදත්සඟරා; අන්‍යාර්ථසමාස ගර්භ කොට ඇති සම්බන්ධවිභක්තිසමාස යි.

මේ සමාසාන්තයෝ සතරදෙන 'කරනෙම්' යන කතුකිරිය පෙදෙන් හා කැරැ, ගෙවා, යන පෙරකිරිය දෙපෙදෙනුන් උක්ත නො වැ කර්මත්වය භජනය කළහෙයින් අනුක්තකර්මයෝ වෙති. **'සව්නේ'** යනු **'ගෙවා'** යන පෙරකිරියට අනුක්තකර්ම වූයේ **'දන්හට'** යන අරුත්කිරියට ද අනුක්තකර්ම වේ—**'සඳහා'** යන පෙරකිරියපෙදෙන් අනුක්තහෙයින් **'දැනුම්'** යන භව්කිරිය ද අනුක්තකර්ම යි. එයට භින්නාධිකරණවිශෙෂණ වූ දුහුනන්ගේ අනුක්තසම්බන්ධ යි. කර්මයාගේ භෙදවිවක්ෂායෙහි මහද යනු විකාර්‍යකර්ම යැ, ගඳකිළි යනු නිර්වර්ත්‍යකර්ම යැ, සව්නේ යනු ද, දැනුම් යනු ද ප්‍රාප්‍යකර්මයෝ යි.

**"සඳරුත්විදි සියල්—අනුරූ සේපියෝනන්"**
**ඉති සන් සඳ සමස් ඈ—වහරනුසෙරෙන් සපයා.** (2)

---

දුහුනන් යන්නෙහි **දුහුන** යනු ශබ්දප්‍රකෘතිය යි; මෙය මාගධ සංස්කෘත දෙක්හි සම වැ පැවැති වර්තමානකාලාර්ථ වූ 'අධුනා' යන අව්‍යයශබ්දයෙන් ස්වභාෂානුරූප වැ පූර්වවර්ණයහට ලොප් වැ තද්භව වැ බිඳුණා වූ 'දුහුනා' ශබ්දයෙන් සිද්ධ ය. ඒ මෙසේ යි:- දුහුනා යන්නහු කෙරෙන් පරව අඞ්ගසූත්‍රය සම්බන්ධවන්නෙහි **දසින් නෙමෙන් හොත** යනාදි උපාඞ්ගසූත්‍රයෙන් භවාර්ථයෙහි හෙවත් **'දුහුනා වූයේ'** යන අර්ථයෙහි අ ප්‍රත්‍යය කොට **පෙරපරව ණන්** යනාදි උපාඞ්ගසූත්‍රයෙන් පූර්වස්වරලොපසන්ධි කොට **'දුහුන'**යි සිටි ප්‍රත්‍යයාර්ථශබ්දයා කෙරෙන් ප්‍රථමෛකවචන අ විභක්ති කිරීමෙන් **'දුහුන'** යන පදරූපය සිද්ධ වේ. 'දුහුනා'(වත්මන්හි) වූයේ 'දුහුන' යනු ප්‍රත්‍යයාර්ථවාක්‍යය යි. මේ ප්‍රත්‍යයාර්ථ (=තද්ධිතාන්ත) දුහුනශබ්දය මෙහි **'දැනුම්'** යන අනුක්තකර්මස්වරූප විශෙෂ්‍යය හට ස්වාමිභාවයෙන් භින්නාධිකරණවිශෙෂණ වැ සිටි හෙයින් **'දුහුන'**යි සම්බන්ධවිභක්ත්‍යන්ත යි.

තද්භවප්‍රකෘති වූ මේ දුහුනශබ්දය, සිංහලභාෂාව දෙශීය ප්‍රාකෘතවිශෙෂයට ඇතුළත්හෙයින්, ප්‍රාකෘතව්‍යාකරණරීතියට ද අනු ව තද්භවවූබැව් සැලකියයුතු ය. ප්‍රාකෘතව්‍යාකරණයෙහි **'ඛඝථධභාං හඃ'** යන සූත්‍රයෙන් ස්වරයා කෙරෙන් පර වූ අසංයුක්ත වූ ශබ්දයාගේ **ආ**දියෙහි නොසිටියා වූ ඛ, ඝ, ථ, ධ, භ, යන ව්‍යඤ්ජනාක්ෂරයන්ට බොහෝසෙයින් හකාරාදෙශය නියමිත ය. සිංහල භාෂායෙහි මෙකී ව්‍යඤ්ජනාක්ෂරයන්ට හකාරාදෙශය කළකල්හි ඊට පූර්වයෙහි කිසිතැනෙක ඔවුන්ගේ ම අල්පප්‍රාණව්‍යඤ්ජනාක්ෂරය ද ආගමකිරීම ශබ්දධර්ම යි.

මෙකව්හි අලඞ්කාරවශයෙන් භාවිකත්වගුණයෙන් යුක්ත වූ 'ආශයොදාත්ත' නම් අලඞ්කාරය වේ. කවිහුගේ භක්ත්‍යතිශය හා ඉෂ්ටදෙවතා වූ භාග්‍යවත්හුගේ ඥානමහත්ත්වය ද ප්‍රකාශිත හෙයිනි.

එයින් කිහ-ස්වභාෂාලඞ්කාරයෙහි:-

"සැපතට සිතට හෝ-අනුතුරු යම් මහත්බැව්
කියත් වියත් මහත්මෝ-උදාත්තය යෙත් හෙ මෙසේ"යි.

මෙසෙයින් ඉෂ්ටදෙවතානුස්මරණමඞ්ගලාචරණපූර්වක ග්‍රන්ථාරම්භකාව්‍යය දක්වා ඉක්බිති ස්වභාෂාව්‍යාකරණයෙහි පූර්වවාක්‍යය රචනාකරන්නාහු **'සඳරුත්'** යනාදි කව කීහු.

(2) **"සඳරුත්විදි සියල් අනුරූ සේපියෝනන්"** යනු අඞ්ග සූත්‍ර යි. **සඳරුත්විදි** යන පද ය, **සියල්** යන පද ය, අනුරූ යන

**මෙ සබඳ සිදත්පිරියත් හිමි. (3)**

---

පද ය, **සේපියෝනන්** යනු පද යි.

**පදාර්ථ**—සියල් සදරුත්විදි, සකල ශබ්දාර්ථවිධිතෙම; සේපියෝනන්, ඡේකප්‍රයොගයන්ට; අනුරූ, අනුරූප ය; (=යොග්‍ය ය) යනු අර්ථ යි.

ඉති, මෙසෙසින්; හෙවත් මේ අඞ්ගසූත්‍රයෙන්; සන්, සංඥා ය; සඳ, සන්ධි ය; සමස්අෑ, සමාසය යනාදිය; වහරනුසෙරෙන්, (ශිෂ්ට) ව්‍යවහාරානුසාරයෙන්; සපයා, සම්පාදනය කරවි.

**භාවාර්ථ**—ශබ්ද අර්ථ දෙදෙනා පිළිබඳ වූ සියලු යෙදුම් ශබ්දාර්ථයෙහි නිපුණ වූ පණ්ඩිතාචාර්‍ය්‍යවරයන්ගේ පදවාක්‍යයොජනාවන්ට අනුකූල ය, අවිරුද්ධ ය. යනු අඞ්ගසූත්‍රයාගේ අභිප්‍රාය යි. මෙසේ හෙයින් ශිෂ්ටව්‍යවහාරයට අනුව යාමෙන් සංඥා, සන්ධි, සමාසාදි (ව්‍යාකරණවිධි) සිද්ධ කරවි. යනු අඞ්ගසූත්‍රයට සංක්‍ෂෙපවර්‍ණනාස්වරූප වූ අපරාර්ධයාගේ අභිප්‍රාය යි. මේ අඞ්ගසූත්‍රයාගේ විස්තර වර්‍ණනාව නාම් මෙය මුල්කොට මතු කියනුලබන සියලු සිංහල ව්‍යාකරණ ශාස්ත්‍රය යි.

(3) **ප**—සිදත්, සිද්ධාන්තයාගේ; පිරියත් හිමි, පර්‍ය්‍යන්තය සීමා කොට; මෙ සබඳ, මේ (=සූත්‍රය) සම්බන්ධ යි.

**භා**—සිද්ධාන්ත (ව්‍යාකරණ)යාගේ කෙළවර දක්වා මේ අඞ්ගසූත්‍රය සම්බන්ධ කටයුත්තේ ය.

**විස්තරාර්ථ**—සිද්ධාන්තයාගේ කෙළවර ය යනු අලඞ්කාරාධිකාර නම් ද්වාදසම පරිච්ඡේදය යි. එය මෙහි සීමා කරනලද්දේ අභිවිධි වශයෙනි. එහෙයින් ඒ සීමාභූත අන්තිමාධිකාරය ද නොහැර මේ අඞ්ගසූත්‍රයාගේ සම්බන්ධය දතයුතු යි. මීට අඞ්ගසූත්‍රය යි නම් කළ හෙයින් මේ ව්‍යාකරණයෙහි සෙසු සූත්‍රයෝ උපාඞ්ගසූත්‍ර නම් වෙති. සංඥාසූත්‍රාදිවශයෙන් සංස්කෘත මාගධ වෛයාකරණයන් විසින් දක්වනලද ෂඩ්විධ සූත්‍රයන් අතුරෙහි මේ අඞ්ගසූත්‍රය අධිකාරසූත්‍ර නම් වෙයි. ත්‍රිවිධ අධිකාරයන් අතුරෙහි නදීශ්‍රොතොධිකාරය වෙයි. අතරතුර සූත්‍රයන් නොහැර ක්‍රමයෙන් සම්බන්ධවන හෙයිනි. මාගධව්‍යාකරණයෙහි සියලු ශබ්දාර්ථවිධිය බුද්ධවචනයට අනුරූප කොට දක්වනලදි. **“ජිනවචනයුත්තං හි-නාදනුපරොධෙන”** යනු ඒ සඳහා නිර්දිෂ්ට වූ අධිකාරපරිභාෂාසූත්‍ර යි. බුද්ධවචනභූත පාලිධර්මය හෝ වෙදවෙදාඞ්ගාදි අන්‍යශාස්ත්‍රාගමයක් හෝ සිංහල භාෂාව මූල්කොට නොපැවැති හෙයින් චිරන්තන සිංහල ශාබ්දිකයන්ගේ වාග්ව්‍යවහාරය ම (=ආප්තවචනය ම) පිහිට වනසේ මේ අඞ්ගසූත්‍රය හඳුළහ. මෙසේ ශිෂ්ටව්‍යවහාරය පිහිට කොට සූත්‍ර රචනාව සංස්කෘතප්‍රාකෘතවෛයාකරණයන්ට ද

**එබැවින් සන් සඳ-ලිඟු විබත් සමස් පියවි**
**පස කිරිය ලොපදෙසගම්-පෙරරූ දෙරූ පෙරළි.**

**වැඩි අඩු නිපා නියම්-අනියම් අවිදුමන්විදි**
**වි විසිවැදෑරුම්-වියරණවිදි සපයා.** (4)

**පණකුරු ගතකුරු ඈ නම්ලකුණෙන් හඳුන්වනු සන්නම්.** (5)

---

අභිමත ය. "**ලොකාවෙක්ෂස්‍ය සිද්ධිඃ-ලොකාදවගන්තව්‍යඃ**" යන සංස්කෘතප්‍රාකෘතසූත්‍රයන්ගෙන් ද ඒ ප්‍රකාශ වේ. මෙසේ හෙයින් සිද්ධාන්තසඞ්ග්‍රහ පෞරාණික ව්‍යාඛ්‍යානකාරයෝ "ශබ්ද පාරායණයෙහි* '**ශිෂ්ටප්‍රයොගාඃ සාධවඃ**' යන එකසූත්‍රයෙන් සකලසුශබ්දවිධිය සිද්ධකළාක් මෙන් මෙහි දු '**සදරූත්විදි සියල් අනුරූ සේපියෝනන්**' යන එක සූත්‍රයෙකින් ම සියලු ව්‍යාකරණ විධි සාධනු පිණිස" යනාදිය කීහු.

ශබ්දපාරායණ සූත්‍රයාගේ පදාර්ථ:- ශිෂ්ටප්‍රයොගාඃ, සපිර බුද්ධිමතුන්ගේ (වාක්) ප්‍රයොගයෝ; සාධවඃ, සාධුහු (වෙත්); සුශබ්දයෝ වෙති සි සේයි.

(4) ඉක්බිති සංඥසඞ්ඛ්‍යාදී විංශතිභෙද ව්‍යාකරණවිධීන්ගේ මාතෘකාව දක්වන්නෝ '**එබැවින් සන් සඳ**' යනාදි දෙකව කීහු.

**ප**—එබැවින්, ඒ භාවයෙන්; සන්, සංඥ ය; සඳ, සන්ධි ය; ලිඟු, ලිඞ්ග ය; විබත්, විභක්ති ය; සමස්, සමාස ය; පියවි, ප්‍රකෘති ය; පස, ප්‍රත්‍යය; කිරිය, ක්‍රියා ය; ලොප්, ලොප ය; අදෙස්, ආදෙශ ය; අගම්, ආගම ය; පෙරරූ, පූර්වරූප ය; දෙරූ, ද්විරූප ය; පෙරළි, විපර්‍ය්‍යාස ය; වැඩි, වෘද්ධි ය; අඩු, හානි ය; නිපා, නිපාත ය; නියම්, නියම විධි ය; අනියම්, අනියමවිධි ය; අවිදුමන්විදි වි, අවිද්‍යමාන විධි ය යි කියා; විසිවැදෑරුම්, විංශතිවිධ වූ; වියරණවිදි, ව්‍යාකරණවිධිය; සපයා, සම්පාදනය කරව.

**භා**—පෙර කී අඞ්ගසූත්‍රය සියලු සිංහලව්‍යාකරණයෙහි සම්බන්ධවන හෙයින් සංඥවිධිය ආදිකොට අවිද්‍යමානවිධිය අවසන් කොට ඇති ව්‍යාකරණ විධිවිංශතිය අඞ්ගසූත්‍රයට අනුකූල ව සිඞකරන්නේ ය.

(5) මෙසේ මාතෘකායෙහි නම්පමණින් කියනලද විංශති විධිය පිළිවෙළින් වණ්නා කරනුවෝ '**පණකුරු ගතකුරු ඈ**' යනාදිය දක්වූහු.

---

* '**ශබ්දපාරායණ**' නම් ඉතා පුරාතන සංස්කෘතව්‍යාකරණයෙකි. මේ නාමය පවා නවීනග්‍රන්ථයන්හි සඳහන් නො වේ. 'ශබ්දපාරායණශබ්දෙ යොගරූඪඃ ශාස්ත්‍රවිශෙෂස්‍ය' යනු පාණිනීයාචාර්‍ය්‍ය ජෛයටයන් විසින් කියන

**පණකුරු පසෙක් එ ද–ලුහුගුරුබෙයින් දස වේ**
**ගතකුරු ද වේ විස්සෙක්–වහරට යුහු සියබසැ.** (6)

**අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ, මෙදස පණකුරු නම්.** (7)

**ක ග ජ, ට ඩ ණ, ත ද න, ප බ ම, ය ර ල ව, ස හ ළ අං, මෙ විසි ගතකුරු නම්.** (8)

---

ප – පණකුරු ගතකුරු ඈ, ප්‍රාණාක්‍ෂර ගාත්‍රාක්‍ෂර ආදිය; නම්ලකුණෙන්, නාමසඞ්ඛ්‍යාත ලක්‍ෂණයෙන්; හඳුන්වනු, හැදින වීම; සන් නම්, සංඥා නම් වේ.

භා—මේ ප්‍රාණාක්‍ෂර නම, මේ ගාත්‍රාක්‍ෂර නම, යනාදීන් නාමයෙකින් හැදිනවීම සංඥාවිධි නම් වේ.

(6) මේ සංඥාවිධිප්‍රස්තාවයෙහි සිංහලභාෂාවට ඇතුළත් අක්‍ෂරසඞ්ඛ්‍යා දක්වන්නෝ 'පණකුරු පසෙක්' යනාදි කව කීහු.

ප—සියබසැ, ස්වභාෂායෙහි; වහරට, ව්‍යවහාරයට; යුහු, යොග්‍ය වූ; පණකුරු, ප්‍රාණාක්‍ෂරතෙමෙ;* පසෙක්, පඤ්චකයෙකි; එ ද, ඒ (පඤ්චකය)ද; ලුහුගුරුබෙයින්, ලඝු ගුරු භෙදයෙන්; දස වේ, දශකයෙක් වේ; ගතකුරු ද, ගාත්‍රාක්‍ෂරතෙමේ ද; විස් සෙක් වේ, විංශතියක් වේ.

(7) අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ, අකාරය පටන් ඕකාරය අව සන්කොට ඇති; මෙ දස, මේ දශකය; පණකුරු නම්, ප්‍රාණාක්‍ෂර නම් වේ.

(8) ක ග ජ, ට ඩ ණ, ත ද න, ප බ ම, ය ර ල ව, ස හ ළ අං, කකාරය පටන් බින්දුව අවසන්කොට ඇති; මෙ විසි, මේ විංශ තිය; ගතකුරු නම්, ගාත්‍රාක්‍ෂර නම් වේ.

---

ලද්දේ ය. 'ශබ්දපාරායණශබ්දය ශාස්ත්‍රවිශෙෂයකට අර්ථානුරූප ව ව්‍යවහාර වූ නාමයෙකැ' යන අර්ථ යි. පතඤ්ජලිඍෂිහු විසින් ද "වෘහස්පතිරින්ද්‍රාය දිව්‍යං වර්ෂ සහස්‍රං ප්‍රතිපදොක්තානාං ශබ්දනාං ශබ්දපාරායණං ප්‍රොවාච" යනුවෙන් වෘහස්පතිතෙම ඉන්ද්‍රයාහට දිව්‍ය වූ වර්ෂදහසක් මුළුල්ලෙහි පදයක් පාසා කියන ලද ශබ්දයන් සම්බන්ධ ව ශබ්දපාරායණය ප්‍රකාශකොට කීයේ ය යි දක්වනලද්දේ ය. මෙයින් ශබ්දපාරායණ නම් ව්‍යාකරණශාස්ත්‍රයාගේ අතිශයචිරන්තනත්වය හා ගරීයස්ත්වයත් හැඟේ. ආචාර්ය්‍ය ශ්‍රීපතිදත්තයන් විසින් විරචිත වූ "පාරායණතන්ත්‍රප්‍රදීප" නමැති ව්‍යාකරණය ද මීට අනුගත ග්‍රන්ථයකැ යි සිතමු.

* ජාත්‍යපෙක්‍ෂායෙහි එකවචන යි.

භා—සිංහලදෙශවාසීන්ගේ භාෂායෙහි වාග්ව්‍යවහාරයට (-පණ්ඩිත ව්‍යවහාරයට) යොග්‍ය වූ ප්‍රාණාක්‍ෂරයෝ පස්දෙනෙක, ඔව්හු ලඝු වූ ද ගුරු වූ ද මාත්‍රා ඇතිකොට උච්චාරණය කිරීමේ භෙදයෙන් ලඝුපසෙක ගුරුපසෙකැයි දස දෙනෙක් වෙති, ගාත්‍රාක්‍ෂරයෝ ද විස්සෙක් වෙත්.

**විස්තරාර්ථ**—'අ ඉ උ එ ඔ' යනු ප්‍රාණාක්‍ෂර පඤ්චකය යි. මේ පඤ්චකයේ එකෙකි අක්‍ෂරයක් එක් එක් මාත්‍රායෙකින් කියනු ලබනවිට ලඝු පඤ්චකය වේ. එකෙකි අක්‍ෂරයක් මාත්‍රා දෙකෙකින් කියනු ලබනවිට 'ආ ඊ ඌ ඒ ඕ' යන ගුරුපඤ්චකය වේ. එහෙයින් පළමු කී අක්‍ෂරපඤ්චකය ලඝු ගුරු භෙදයෙන් ලඝු පසෙක ගුරු පසෙකැයි කියා දශකයෙක් වේ. කකාරය පටන් බිඳුව දක්වා විසි අක්‍ෂරයෝ ගාත්‍රාක්‍ෂර නම් වෙත්. ප්‍රාණය යනු ජීවිතෙන්ද්‍රියහට නාමයෙකි; යම්සේ ප්‍රාණයෙන් වෙන් ව හුදකලා වූ ශරීරය ගමනාගමනාදි ක්‍රියා සිදුකළ නොහේ ද, එසෙයින් ම ප්‍රාණාක්‍ෂරයෙන් වෙන් ව ගාත්‍රාක්‍ෂරයෝ අර්ථප්‍රකාශය නොකළහෙති. එහෙයින් ගාත්‍රතුල්‍ය වූ කකාරාදීන්ට ගාත්‍රාක්‍ෂරනාමය ද ප්‍රාණතුල්‍යවූ අකාරාදීන්ට ප්‍රාණාක්‍ෂරනාමය ද මේ ව්‍යාකරණයෙහි දක්වනලදහ. පර වෛයාකරණයෝ ප්‍රාණාක්‍ෂරයන්ට **'ස්වර'** සංඥව ද ගාත්‍රාක්‍ෂරයන්ට **'ව්‍යඤ්ජන'** සංඥව ද අර්ථානුගතසංඥවශයෙන් කිහු. රූඪිවශයෙන් වනාහි ස්වරයන්ට **'අච්'** සංඥව ද, ව්‍යඤ්ජනයන්ට **හල්, හස්, හෂ,** යන සංඥ ද කිහු. මාගධශාබ්දිකයෝ අන්‍යයන්ගේ ස්වර ව්‍යඤ්ජන සංඥවන් ම මාගධානුරූපකොට ගෙන ප්‍රාණාක්‍ෂරයන්ට **'සර'** නාමය ද, ගාත්‍රාක්‍ෂරයන්ට **'බ්‍යඤ්ජන'** නාමය ද ගත්හ. එයින් **'සර'** සංඥව සිංහලව්‍යාකරණයෙහි ද ලැබේ. 'සරසඳ' සරඅත්' යනාදි වශයෙනි. ගාත්‍රාක්‍ෂරයන්ට නම් වූ ව්‍යඤ්ජන සංඥව සිදතට ඇතුළත් නොකොට පාණිනීයචාන්ද්‍රමතානුසරණයෙන් **'හල්'** සංඥව ම ඇතුළත් කර ගත්හ. එය 'සර අත් හලත් වෙසෙසින්' යනාදි තන්හි පෙනේ. කකාරාදි ගතකුරු විස්ස ස්වභාවයෙන් ස්වරරහිත ම ය. ක්, ග්, ජ්, යනාදි වශයෙන් මෙසේ ප්‍රාණාක්‍ෂර නැති ව (=හල් ව) සිටිකලැ දුකසේ කියයුතුවන බැවින් සුඛොච්චාරණය සඳහා හල් වූ ගතකුරු ද 'අ' යන ප්‍රාණාක්‍ෂරය හා යුක්තකොට 'කගජ' යනාදීන් දක්වනලද්දේ ය. ආකාරාදී සෙසු ප්‍රාණාක්‍ෂරයෝ ද හල් අක්‍ෂරයන් හා මෙසේ ම යුක්තවෙති. 'හල්' යනු පාණිනීය චාන්ද්‍රව්‍යාකරණයන්හි සියලු ව්‍යඤ්ජනාක්‍ෂරයන්ට ම දක්වනලද ප්‍රත්‍යාහාර සංඥවකි. 'අල්' යනු ස්වර ව්‍යඤ්ජන සියල්ලන්ට ම පාණින්‍යාදීන්ගේ සංඥ යි. ගාත්‍රාක්‍ෂර ප්‍රාණාක්‍ෂර දෙපක්‍ෂය එක්ව ද වෙන්ව ද වර්ණාත්මක වූ ව්‍යක්ත

**ආ ඊල් උඵල් ඒල් ඕනා ඈඟි හුදුව ද, සා ස් සූ සේ සෝ ඈඟි ගත් අරුණු කැරැ උසුරුවනුහෙයින් ද, ගුරු පස ද– (9)**

---

ශබ්දයන් පහළ කෙරෙයි. ගාත්‍රාක්ෂරයෝ ව්‍යක්තශබ්දයක් පහළ නො කෙරෙතැ යි ඇතැම් කෙනකුන් සලකතත් ඒ මතය සහේතුක නො වේ. වර්ණාත්මක ශබ්දය අව්‍යක්ත නො වන හෙයිනි.

ශබ්දය වනාහි වර්ණාත්මක ය, ධ්වන්‍යාත්මක ය යි දෙවැදෑරුම් වෙයි. එයින් කීහ නෛයායික විශ්වනාථ තර්කපඤ්චානනයෝ:–

“ශබ්දො ධ්වනිශ්ච වර්ණශ්ච මෘදඞ්ගාදිභවො ධ්වනිඃ
කණ්ඨසංයොගාදිජන්‍යා වර්ණාස්තෙ කාදයො මතාඃ” යි.

“ධ්වනිය ද වර්ණය ද ශබ්ද නම් වෙයි; මිහිඟුබෙර ආදියෙන් හට ගන්නේ ධ්වනිය යි; කණ්ඨසංයොගාදියෙන් හටගන්නාහු වර්ණයෝ යි; ඔහුතුමූ කකාරය ආදිකොට ඇත්තාහ යි දන්නාලදහ” යනු භාව යි. අකාරය පටන් ඔකාරය අවසන් කොට ඇති මේ දශකය ප්‍රාණාක්ෂර නම් වෙයි; කකාරය පටන් බින්දුව අවසන් කොට ඇති මේ විංශතිය ගාත්‍රාක්ෂර නම් වේ. පෙර සමහර ආචාර්‍ය්‍ය කෙනෙක් ප්‍රාණාක්ෂර පසෙක, ගාත්‍රාක්ෂර එකුන්විස් සෙකැ යි කියා සිංහලභාෂායෙහි අකුරු සූවිස්සක් දක්වූහ. හේ අසම්පූර්ණය යි සලකන ප්‍රතිරාජපරිවෙණාධිපති ආචාර්‍ය්‍යපාදයෝ සිංහල භාෂායෙහි අකුරු සමතිසක් ම හඳුළහ. ඒ බව පුරාතන ව්‍යාඛ්‍යානයෙහි “කිසි ආචාර්‍ය්‍ය කෙනෙක් ශුද්ධාක්ෂර පඤ්චකය ද අං යන බින්දුවර්ණය ද වර්ණසංඛ්‍යාවට නො නැගූහ; එසේ කල්හි බොහෝ ව්‍යවහාරශබ්දයන්ගේ පරිහානිය වේනු යි ඔවුනුදු මෙහි ම අන්තර්ගත කරනු පිණිස ව්‍යවහාර වශයෙන් ද ප්‍රමාණපාඨ වශයෙන් ද අ ආ යනාදි ආපාතවචන කියනලද යි” කීහ.

(9) “ශුද්ධාක්ෂරපඤ්චකය හා බින්දුවර්ණය ඡේකප්‍රයොගයෙහි කවර තැනෙක පැනේ ද?” යන අන්තර්ගත චොදනාවට පරිහාර වශයෙන් උදාහරණ සිද්ධාන්ත දක්වන්නෝ **ආ ඊල්** යනාදිය කියත්.

ප—ආ ඊල් උඵල් ඒල් ඕනා ඈඟි, ආ ඊල් උඵල් ඒල් ඕනා යනාදි තන්හි; හුදු ව ද, (ගාත්‍රාක්ෂරයන් හා) අමිශ්‍ර ව ද; සා සි සූ සේ සෝ ඈඟි, සා සි සූ සේ සෝ යනාදි තන්හි; ගත් අරුණු කැරැ, ගාත්‍රාක්ෂරාරූඪ කොට; උසුරුවනුහෙයින් ද, උච්චාරණය කරනු ලබන හෙයින් ද; ගුරුපස ද, ශුද්ධාක්ෂර පඤ්චකය ද—

"තමා වදනය පොමින්-නො ඉකතැ යි හැංගේ"

"නරනිඳුහු ඉංගෙන්-සෙමෙනද නැසී පසැඟී"

මෙඇ කව්ලැකියෙහිදු "හංමැටි වංඇපල" ඇ ලෙව්ලැකියෙහිදු සපුරා උසුරුවනු හෙයින් ද "රඟබඟහර" ඇඟි උනුමතින් උසුරුවනු හෙයින් ද මෙහි බිඳු ද රූසී. මෙ ඇඟී. (10)

---

(10) ප—තමාවදනය යනාදි අසක්දකවෙහි හැංගේ යනු ද; නරනිඳුහු යනාදි කව්සිළුමිණෙහි ඉංගෙන් යනුදු යි; මෙ ඇ, මේ ආදි වූ; කව්ලැකියෙහිදු, කාව්‍යලක්‍ෂණයෙහිදු; හංමැටි වංඇපල ඇ, හංමැටි වංඇපල යනාදි වූ; ලෙව්ලැකියෙහිදු, ලෞකිකලක්‍ෂණයෙහිදු; සපුරා, සම්පූර්ණ කොට; උසුරුව නුහෙයින් ද, (බිඳුව) උච්චාරණය කරනු ලබනහෙයින් ද; රඟ බඟහර ඇඟි, රඟ බඟහර යනාදියෙහි; උනුමතින්, (බිඳුහුගේ) ඌනමාත්‍රායෙන්; උසුරුවනු හෙයින් ද, උච්චාරණය කරනු ලබන හෙයින් ද; මෙහි, මේ අක්‍ෂර සඞ්ඛ්‍යා දක්වීමෙහි; බිඳු ද, බින්‍දුවර්ණය ද; රූසී, රුචි යි.

වි—ආ යනු, ආයුෂට නම්; ඊල්, දෛලාවට (=ඔිවිලියට) නම්; ඌල්, ප්‍රස්‍රවණයට (උල්පතට) නම්; ඒල්, පක්වමධූකඵලයට (=පැසුණු මීගෙඩියට) නම්; ඔිනා, ප්‍රවෙශ කාරන්තා වූ යන අර්‍ථ ඇති ක්‍රියා විශෙෂයෙකි; සා, ශාඛා ක්‍ෂුධාදියට නම්; සී, සිංහ කෘෂිකර්‍ම යනාදියට නම්; සූ, සූප සූත්‍ර යනාදියට නම්; සේ, ජේත ශෙවත යනාදියට නම්; සෝ, ශ්‍රොත්‍ර ශොක යනාදියට නම්.

තමා වදනය, තමාගේ වචනය; පොමින්, ප්‍රභුත්වය කරණ කොටගෙන; නො ඉකතැ යි, නො ඉක්මවත් යයි; හැංගේ, කල්පනා කෙළේ ය; යනු අසක්දකව* පද්‍යාඩියෙහි අර්‍ථ යි.

කව්සිළුමිණෙහි සම්පූර්ණපද්‍යය මෙසේ යි:—

"නරනිඳුහු ඉංගෙන්-සෙමෙනද නැසී පසැඟී
විලස කළ ලඟ කප්තුරු-මඳලෙළ හෙම්ලියකලබ"

නරනිඳුහු, නරෙන්‍ද්‍රයාගේ; ඉංගෙන්, අභිප්‍රායෙන්; සෙමෙන්, මන්‍ද වැ; අද, අවුත්; පසැඟී, පාර්‍ශ්වයෙක්හි; නැසී, ගුප්ත වැ; කප් තුරුළඟ, කල්පවෘක්‍ෂසමීපයෙහි; මඳලෙළ, මන්‍ද වැ ලීලෝපෙත වූ; හෙම්ලියකලබ, හෙමලතාකලාපයෙක්හි; විලස, විලාසය; කළ, ප්‍රකාශ කළා- යනු පදාර්‍ථ යි.

---

* මෙ නම් කාව්‍යපොත මෙ කල අවිද්‍යමානය යි සලකනු ලැබේ.

**පෙරපරවණින් ගළපනු සඳ නම්:- සඳෙව් මොහොර ඈයි.** (11)

මේ කවිදෙකින් ගත් පද්‍යාර්ධ දෙක පුරාණ සිංහල කාව්‍යයන්හි ද* සම්පූර්ණ බිඳුව ව්‍යවහාරකරනලදබවට දෘෂ්ටාන්ත යි. කාව්‍යයෙන් දක්නායුත්ත කාව්‍යලක්ෂ්‍ය යි. හේ වනාහි කාව්‍යනිදර්ශන යි.

හංමැටි, සම්මැට්ට නම් තෘණවිශෙෂය යි; වංඇපල, පාවට්ටා නම් ඖෂධවිශෙෂය යි. මෙයින් ලොකව්‍යවහාරයෙහි ද සම්පූර්ණ බිඳුව ඇති බැව් දක්වූහ. ලෞකිකලක්ෂ්‍ය නම් ලොකයාගේ (කථා) ව්‍යවහාරයෙන් දතයුතු නිදර්ශන යි. රඟ, නෘත්‍යස්ථානය යි; බහහර, සුරාව යි†. මෙ ඈගී, (සංඥවිධි තෙමේ) මේ ආදි ආකාර ඇත්තේ යි.

ප්‍රාණාක්ෂර ගාත්‍රාක්ෂර සංඥදෙක මූල්කොට දක්වා සන්ධි ලිඞ්ගවිභක්ත්‍යාදි වක්ෂ්‍යමාණ සංඥ ද මෙසෙයින් ම සංඥවිධියෙහි ඇතුලත් කරනු පිණිස මෙහි "ඈ" ශබ්දය දක්වනලදි.

## 2—සන්ධිවිධිය.

(11) **ප** – පෙරපරවණින්, පූර්වවර්ණ පරවර්ණයන් සම්බන්ධ වූ; ගළපනු, සවනාව; සඳනම්, සන්ධිනම්; සඳෙව් මොහොර ඈයි, (සඳ+එව් මහ+උර යනාදි තන්හි) සඳෙව් මොහොර යනාදි ආකාර ඇත්තේ යි.

භා—අතරෙහි අකුරක් හෝ කාලයක් හෝ නැති සේ පෙර පසු දෙතැන සිටි අක්ෂරයන් දෙදෙනකුන්ගේ ගැළපීම හෙවත් ඒ දෙදෙනාගේ අතර නො පැනෙන සේ ලංකිරීම සන්ධි නම් වේ.

ඊට උදාහරණ:- සඳ+එව් යන තන්හි දකාරයෙහි සිටි අකාරය පෙරකුර යි. එව්ශබ්දයේ එකාරය පරකුර යි. මේ දෙක ගැළපී මෙහිදී එක ම එකාරයෙක් ව සිටී. ඒ මෙසේ යි:- **සඳ්අ+එව්**. මෙහි අකාරය ලොප් කළ කල්හි **සඳ්+එව්**. හල් දකාරය එකාරය හා එක් වූ කල **සඳෙව්** කියා සන්ධිය වේ. මහ+උර යන තන්හි මහ ශබ්දයාගේ හකාරයෙහි සිටි අකාරය පෙරකුර යි. උරශබ්දයාගේ උකාරය ඊට පරකුර යි. මේ දෙදෙනාගේ ගැළපීමෙහි (එක්වීමෙහි) දෙක එක් ව ඔකාරයෙක් වෙ යි. ඒ මෙසේ යි:-

---

* මෙයින් කාව්‍යචූඩාමණිකාව්‍යය ප්‍රතිරාජපරිවෙණාධිපතීන්ට සමකාලීන වූ කලිකාලසාහිත්‍යසර්වඥ පණ්ඩිතපරාක්‍රමබාහු මහරජාණන් විසින් කරනලද්දකි. එබව එහි මේ අන්තිමපද්‍යයෙන් පෙනේ:-

"සඳකුල කැත්කොත්-වහත් පදරණත් නත්වත්
මෙත් කිත් පතළ කලිකල්-සවැණි නිරිඳු පසළ මේ"

† බහගර යන පාඨයෙහි: බහ, භඞ්ගය; අගර, අඞ්ගරාගය යනු අර්ථ යි.

**මේය මෝය යන වහරට කාරුණු වූයේ ලිඟු නම්:-
දිය විදු ඇඟි.** (12)

---

මහ + උර  මහ්අ + උර  මහ් + ඔර

මෙහි හයන්න ඔකාරය හා එක් වූ කල 'මහොර' කියා සන්ධි වෙයි. නැවත සුවසේ හැදූරීම පිණිස අනික් වියරණවිධියකින් (=පිළිපෙරළිවිධියෙන්) මකාරයෙහි වූ අකාරය විපර්‍යාස කොට ඔකාරයක් කිරීමෙන් 'මොහොර' කියා සිද්ධ වේ. මේ ආදි ආකාර ඇත්තේ සන්ධිවිධිය යි*. මීට සංස්කෘත මාගධ වෛයාකරණයෝ 'සංහිතා' යන නාමයකුදු කියති. සංහිතා, සන්ධි දෙදෙනාගේ ඇති සූක්ෂ්මභෙදය නො සලකා නො වෙනස් කොට ගැන්මෙති— **"පරඃ සන්නිකර්ෂඃ සංහිතා"** යනු පාණිනිසූත්‍ර යි. (වර්ණයන්ගේ) අව්‍යවධානයෙන් වූ අතිශයසන්නිධිය සංහිතා නම. අක්ෂර යන්ගේ අතරක් නැති ඉතා ළං වීම සංහිතා නමැ යි සේ යි.†

---

### 3—ලිඞ්ගවිධිය.

(12) **ප**—**මේය**, මේ (පුරුෂ)ය; **මෝය**, මෝ (ස්ත්‍රී)ය යි; **යන වහරට**, කියනුලබන ව්‍යවහාරයට; **කාරුණු වූයේ**, කාරණ වූයේ; **ලිඟු නම්**, ලිඞ්ග නම්; **දිය විදු ඇඟී**, ජගත්තෙමේ විද්‍යුතොමෝ යනාදි ආකාර ඇත්තේ යි.

**වි**—ලිඞ්ගවිධිය ප්‍රකාශකරන ආචාර්‍යයන් විසින් 'මෙ' ශබ්දය පළමුකොට ගෙනහැර දක්වනලද්දේ මෙයින් ලිඞ්ගව්‍යවහාර යාගේ විශෙෂ දැන්ම පහසුහෙයිනි. පාලිභාෂායෙහි ලිඞ්ගව්‍යවහා රය දක්වන්නෝ 'මෙ' යන අර්ථ ඇති '**එත**' ශබ්දයෙන් ම ලිඞ්ගත්‍ර යට රූප තුනක් දැක්වූහ. "**එසො එසා එතං**" යන රූප තුන යි. එසො, මේ; යන අර්ථ යි. එසා, මෝ; යන අර්ථ යි. එතං, මේ; යන අර්ථ යි. මේ පාලිභාෂාවට අයත් වචන තුනින් තුන්ලිඟුවේ වෙනස් ව්‍යවහාරය පෙනේ. පුරුෂලිඞ්ගයෙහි '**එසො**' කියා ද ස්ත්‍රීලිඞ්ග යෙහි '**එසා**' කියා ද නපුංසකලිඞ්ගයෙහි '**එතං**' කියා ද එක ම '**එත**' ශබ්දය ලිඟු තුනට තුන්පරිද්දෙකින් ව්‍යවහාර වේ. ඊට සිංහලභාෂායෙන් අර්ථ කියන කලැ එසේ තුන්ආකාරයකට සිංහලව්‍යවහාරය නො ලැබේ. එසො, එතං, යන පුරුෂලිඞ්ගික

---

* සූත්‍ර දැක්වීමෙන් සන්ධිකටයුතු පරිදි සන්ධ්‍යධිකාරයෙහි මතු කියනුලැබේ.

† වර්ණාගමාදියෙන් වන සන්ධිහු ද වර්ණදෙකක්හුගේ අව්‍යවධානසන්නි කර්ෂය ඇත්තෙන් සන්ධි නම් වෙති. එතකුදු වුවත් සන්ධි නම් මුඛ්‍යවශයෙන් වර්ණවිකාරයාගේ ප්‍රභෙදයෙකි.

**නමින් පර වැ බෙදනුලබනුයේ විබත් නම්:-**
**යෙහෙ සෙබෙහි ඇඟි. (13)**

---

නපුංසකලිඞ්ගික දෙකට ම එකලෙස "මේ" කියා සිංහලභාෂායෙහි ව්‍යවහාර කටයුතු හෙයිනි.*

මෙසේ පුන්නපුංසකලිඞ්ගව්‍යවහාරයන්ගේ වෙනසක් හෙළදිව්බසෙහි නො පැනෙන බැවින් පුන්නපුංසකලිඞ්ගද්වය ම පුමලිඟුවට ඇතුළත්කොට "මේ" යන ව්‍යවහාරය ද ස්ත්‍රීලිඞ්ගයට "මේ" යන ව්‍යවහාරය ද දක්වා ඊට කාරණ වූයේ ලිඞ්ගවිධි නමැ යි මෙයින් ප්‍රකාශකරනලදි. භාෂායෙහි ප්‍රාණිවාචක අප්‍රාණිවාචක සියලු ශබ්ද ම මෙසේ ලිඞ්ගවශයෙන් දෙවැදෑරුම් වන බව දක්වන්නෝ දිය විදු ශබ්දද්වය උදාහරණ කළහ. දිය, ජගත් තෙමේ යන අර්‍ථ යි. ලොකයට සංස්කෘත අභිධානයෙහි "ජගත්" යන නාමය කියන ලදි. එය නපුංසක යි. එයින් භින්න ව සිංහලට ආ "දිය" ශබ්දය ද නපුංසක වියයුතු නමුත් එළුබසෙහි නපුංසක ලිඞ්ගව්‍යවහාරය නොමැති හෙයින් පුරුෂලිඞ්ගිකවශයෙන් උදාහරණ කරනලදි. විදු, විද්‍යුත්තොමේ යන අර්‍ථ යි. මේ විදු ශබ්දය (සංස්කෘත) විද්‍යුත් ශබ්දයෙන් තද්භව වූයේ ය. විද්‍යුත්ශබ්දය ලිඞ්ගානුශාසක පුරාතනාචාර්‍ය්‍යයන් විසින් ස්ත්‍රීලිඞ්ගිකය යි සම්මත හෙයින් එයින් භින්න වූ විදුශබ්දය ද ස්ත්‍රීලිඞ්ගිකය යි සලකනු ලැබේ. ප්‍රාණවත් සත්ත්වයන්ගේ චෙෂ්ටාආදියෙන් ලිඞ්ගභෙදය පැනෙන්නාක් මෙන් ප්‍රාණිවාචක ශබ්දයන්ගේ ද ලිඞ්ගභෙදය වාග්ව්‍යවහාරයෙහි පැනේ. අප්‍රාණිවාචී ජගත් විද්‍යුත් යනාදීන්ට ද එපරිද්දෙන් ම ලිඞ්ගභෙදය වෘද්ධ ව්‍යවහාරානුසාරයෙන් දන්නාලැබේ. මෙහි විස්තර ලිඞ්ගාධිකාර වර්‍ණනායෙහිදී දක්වුවමනා හෙයින් මෙහි නො ලියමු.

---

## 4—විභක්තිවිධිය.

(13) ප—නමින් පර වැ, නාමයකින් පර වැ; බෙදනුලබනුයේ, විභාගකරනුලබන්නේ; විබත් නම්, විභක්ති නම්; යෙහෙ සෙබෙහි ඇඟි, යෙහෙ සෙබෙහි යනාදි ආකාර ඇත්තේ යි.

භා—නාමයකින් හෙවත් ශබ්දයකින් අගට ප්‍රථමා විභක්තිය කර්‍ම විභක්තිය යනාදිවශයෙන් අර්‍ථවිභාගකරන යම් ප්‍රත්‍යයාක්‍ෂරයෙක් යොදනු ලැබේ ද ඒ විභක්ති නමි.

වි—විභක්තිප්‍රත්‍යය අකුරු එකකින් හෝ දෙකකින් හෝ කිසිතැනෙක ඉන් වැඩියකින් හෝ යුක්ත වෙයි.

---

* ගඩලාදෙණිසන්න පුරාණ පුස්කොළපොත්හි පෙනේ.

**නේසදන් සියො වැ එකසදඅයුරක් වනසේ ගළපනු සමස් නම්:- මිපල් නිලුපුලැසි ඈ යි. (14)**

---

ප—සෙහෙ, ශුභයෙක් තෙමේ ය; සෙබෙහි, සභායෙහි යන අර්ථයි.

වි—මේ උදාහරණ දෙකින් **සෙහෙ** යනු ප්‍රථමාවිභක්ත්‍යෙකවචනාන්ත පදයෙකි. **සෙබෙහි** යනු ආධාරවිභක්ත්‍යෙකවචනාන්ත පදයෙකි. සභශබ්දයා කෙරෙන් පර ව පෙරවිබත් එකබස් 'එ' ප්‍රත්‍යය කොට සකාරස්ථ අකාරයහට පිළිපෙරළි කළ කල්හි **'සෙහෙ'** යනු වේ. **සබ** ශබ්දයා කෙරෙන් අදරවිබත් එකබස් **'එහි'** ප්‍රත්‍යය කොට **ස**කාරස්ථ අකාරයහට පිළිපෙරළි කළ කල්හි **'සෙබෙහි'** යනු වේ. විභක්ති සතින් මුල අග දෙකට පමණක් මේ උදාහරණ දක්වූයේ සියලු විභක්තීන්ගේ ම විනිශ්චය 'මිගපදවලඤ්ජන' න්‍යායයෙන් මෙහි ඇතුළත් වන හෙයිනි. විස්තර විභක්ත්‍යධිකාරයෙහි මතු පහළවන්නේ ය.

---

## 5 – සමාසවිධිය.

(14) **ප**—නේසදන්, අනෙකශබ්දයන්; සියො වැ; සංගත වැ; එකසද අයුරක් වනසේ, එකශබ්දාකාරයක් වන පරිද්දෙන්; ගළපනු, ඝටනා කිරීම; සමස් නම්, සමාස නම්; මිපල් නිලුපුලැසි ඈ යි, මිපල් නිලුපුලැසි යනාදි ආකාර ඇත්තේ යි.

භා—නොයෙක් ශබ්දයන් අතරතුර විභක්ති නැති ව එක්වීමෙන් එක ශබ්දයක් වන ලෙස ගැළපීම සමාස නම් වේ.

වි—මිය පල්නේ යන වාක්‍යයෙහි මෙවත් පෘථිවිය පාලනය කරන්නේ යන අර්ථයෙහි, මිපල් යනු වේ. මිය පල්නේ යනු කම් විභක්තිසමාසයෙහි වාක්‍ය යි. මිය යනු මී ශබ්දයා කෙරෙන් කම් විභක්ති 'අ' ප්‍රත්‍යය කොට යකාරයක් ආගම කොට ඊකාරයට මත් අඩු කළ කල්හි සිද්ධ වූ කම්විභක්ති එකවචනාන්තපදයෙකි. **මිය පල්** කියා තුබූ තන්හි ශබ්ද දෙක එකක් වන පිණිස මැද තුබූ **'අ'**විභක්තිය ද ඒ සම්බන්ධ යකාරය ද ලොප් කොට පෙරපදය ප්‍රකෘතිභාවයට (=පළමු තුබූ ඊකාරාන්තබවට) පත් කළ කල්හි **මිපල්** කියා එකශබ්දාකාරයෙන් ගැළපී එකපදයක් ව සිටියි. මෙසේ කරනු ලබන පදයන්ගේ සංක්‍ෂෙපභාවය සමාසවිධි නම් වේ.

නිලුපුල් වන් ඇස් (ඇත්තී) යන අර්ථයෙහි අන්‍යාර්ථසමාස වැ නිලුපුල් ශබ්දයා කෙරෙන් පර වූ පෙරවිබත ද 'වන්' යන නිපාතය ද සමාසවිධියෙන් ලොප් වැ "**නිලුපුල්+ඇස්**" කියා එකශබ්දාකාරයෙන් ගැළපී නැවත නිලුපුලැස් යි සන්ධි වැ නිලු

**පියවි දෙවැදෑරුම් දුපියවි සදපියවි වී:- පදයොන් දුපියවි නම්, විබත්නට ඇසිරු සදපියවි නම්.** (15)

---

පුලැස් ශබ්දයා කෙරෙන් ඉ ප්‍රත්‍යය වැ 'නිලුපුලැසි' කියා සිද්ධ වෙයි. මෙහි විස්තර ද මතු සමාසාධිකාරයෙන් දතහැකි වේ.

---

## 6—ප්‍රකෘතිවිධිය

(15) **ප**—පියවි, ප්‍රකෘතීතොමෝ; දුපියවි, ධාතුප්‍රකෘතිය; සදපියවි වී, ශබ්දප්‍රකෘතිය යි කියා; දෙවැදෑරුම්, ද්විවිධ වන්නී ය; පදයොන්, පදයන්ට යොනි වූවා හෙවත් උත්පත්තිස්ථාන වූවා; දුපියවි නම්, ධාතුප්‍රකෘති නම; විබත්නට; විභක්ත්‍යාදීන්ට; ඇසිරු, ආශ්‍රය වූවා; සදපියවි නම්, ශබ්දප්‍රකෘති නම.

භා—ධාතුප්‍රකෘතිය ශබ්දප්‍රකෘතිය කියා ප්‍රකෘතිය දෙආකාර යි. ක්‍රියාපද ආදීන්ට උත්පත්තිස්ථාන වූවා ධාතුප්‍රකෘතිය යි. විභක්ත්‍යාදීන්ට ආශ්‍රයස්ථාන වූවා ශබ්දප්‍රකෘතිය යි.

**වි**—සංස්කෘත වෛයාකරණයෝ වනාහි ප්‍රකෘතිය සිවුවැදෑරුම්ය යි කියති. එය නාමප්‍රකෘති, ධාතුප්‍රකෘති, උපසර්ගප්‍රකෘති, නිපාතප්‍රකෘති යන සතරදෙනාගේ වශයෙනි. එහි ඇතම් ආචාර්යකෙනකුන්ට නිපාත උපසර්ග දෙපක්‍ෂයාගේ නාමත්වය අභිමත හෙයින් නාමප්‍රකෘති ධාතුප්‍රකෘති දෙක බහුතරාචාර්ය සම්මත වේ. එහෙයින් ප්‍රතිරාජපරිවෙණාධිපතීන් විසින් ද ධාතුප්‍රකෘති නාම ප්‍රකෘති දෙක ප්‍රමාණකරනලදි. නාමප්‍රකෘති යනු ද ශබ්දප්‍රකෘති යනු ද එකාර්ථ යි. ප්‍රකෘති යනු මුලින් තුබූ ස්වරූපය යි හෙවත් මුල් ස්වභාවය යි. පදසිද්ධි කාලයෙහි පළමුකොට තබනුලබන රූපය හෙවත් ශබ්දවිශෙෂය ප්‍රකෘතිය යි. ඒ ප්‍රකෘතිය කෙරෙන් පරව (=අගට) යොදනුලබන්නේ ප්‍රත්‍යය යි. ඔවුන් දෙදෙනාගේ සම්බන්ධයෙන් පදසිද්ධිය වේ. එසේ සිද්ධ වූ පදයාගේ ඇතුළත් කොටස (=ඇතුළු අවයවය) අන්තරඞ්ග නම්. එය ප්‍රකෘතිය යි කියනු ලැබේ. ප්‍රකෘතියෙන් පර ව සිටි කොටස වහිරඞ්ග නම්; පිටත් අවයවය යි. එහි අන්තරඞ්ගය යි කියනලද ප්‍රකෘතිය කිසිතැනෙක ධාතුවක් වෙයි; කිසිතැනෙක නාමයෙක් හෙවත් ශබ්දයෙක් වෙයි. එයින් ධාතුප්‍රකෘතිය ත්‍රෛකාලිකාර්ථයෙහි ද භාවයෙහි ද සිද්ධවන ක්‍රියාවන්ට හා ප්‍රත්‍යයාර්ථශබ්දයන්ට උත්පත්තිස්ථාන යි. ශබ්දප්‍රකෘතිය පෙරවිබත් ආදි වූ සියලු නාම විභක්තීන්ට ආශ්‍රයස්ථාන යි. විභක්ත්‍යධිකාර ක්‍රියාධිකාර ප්‍රත්‍යයාර්ථාධිකාර තුනින් මෙහි වෙන්‍ත්‍ය සුබොධ වේ.

යථොක්ත ද්විවිධ ප්‍රකෘතීන්ගේ ප්‍රභෙද දක්වන්නෝ 'වෙන වෙන' යනාදි දෙකාව කියත්.

**වෙන වෙන දෙක නිපන්-තසම තබවැයි එ තෙබේ**
**කිසි අන් බසින් නුමුසු-හෙළදිවැ පළ නිපන් නම්.**

**මගද සකු ඈ බණ-සම වූ බස තසම නම්**
**බිඳුණේ තබව නම් වී-විමසා දනු එහි පියෝ.**

**රුකුර නරඹ ඈ නිපන්දපියවි නම්.**
**සා දු කර ඈ තසමදපියවි නම්.**
**දන නැඟි සමර තුලුර ඈ තබවදපියවි නම්.** (16)

---

(16) **ප**—එදෙක, ඒ (පූර්වෝක්ත ප්‍රකෘති) ද්විකය තෙමේ; වෙන වෙන, වෙන් වෙන් වැ; නිපන්, නිෂ්පන්න ය; තසම, තත්සම ය; තබවැයි, තද්භවය යි කියා; තෙබේ, ත්‍රිභෙද වෙයි; කිසිඅන්බසින්, කිසි අන්‍යභාෂායෙකින්; නුමුසු, මිශ්‍ර නො වූ; හෙළදිවැ, සිංහලද්වීපයෙහි; පළ, ප්‍රකට වූ (වචනය); නිපන් නම්; නිෂ්පන්න නම්.

මගද සකු ඈ, මාගධසංස්කෘතාදි වූ; බණ, භණිතයට; සම වූ, තුල්‍ය වූ; බස, වචනය; තසම නම්; තත්සම නම්; බිඳුණේ, (එසින්) භින්න වූයේ; තබව නම් වී, තද්භව නමැ යි කියා; එහි, ඒ (සවැදෑරුම්) ප්‍රකෘතියෙහි; පියෝ, ප්‍රයෝගයන්; විමසා, වීමංසනය කොට; දනු, ජානනය කරනු.

**භා**—ඒ ධාතුප්‍රකෘතිය ශබ්දප්‍රකෘතිය යන දෙක වෙන් වෙන් වශයෙන් නිෂ්පන්නප්‍රකෘතිය, තත්සමප්‍රකෘතිය, තද්භවප්‍රකෘතිය යි කියා තුන් තුන් ප්‍රභෙද ඇත්තේ වේ. අන්කිසිභාෂායෙකින් මිශ්‍ර නො වූ සිංහලද්වීපවාසීන් කෙරෙහි ම ප්‍රසිද්ධ වූ වචනය නිෂ්පන්න නම් වේ. මාගධ සංස්කෘත ආදි අන්‍යභාෂාවන්ගේ වචන හා සමාන වූ වචනය තත්සම නම් වේ. එබඳු අන්‍ය භාෂාවචනයෙකින් බිඳුණේ හෙවත් මදක් වෙනස්ව ව්‍යවහාර වූයේ තද්භව නම් වේ. මෙසේ ප්‍රකෘතීන් දෙදෙනාගේ වෙන් වෙන් වශයෙන් වූ තුන් ප්‍රභෙදයන් සවැදෑරුම් ප්‍රකෘතීහුගේ යෙදුම් පරීක්ෂාකොට බලා අවබොධ කරව.

**වි**—මගදසකු ඈ යන්නෙහි ඈ ශබ්දයෙන් ප්‍රාකෘතාදි භාෂාවන් සඞ්ග්‍රහ කළහ. එහෙයින් මහාරාෂ්ට්‍රී, ලාටී, ගෞඩී, ශෞරසෙනී, ආදි දෙශීය ප්‍රාකෘතවිශෙෂ ද, ද්‍රාවිඩී ආදි දෙශ භාෂා ද තත්සම තද්භව ප්‍රකෘති දෙක්හි ලා විමසිය යුතු යි. තද්භව, තත්සම, දෙශීය යන හෙද තුනක් ප්‍රාකෘතයෙහි ද කියන ලද්දේ ය. එහි දෙශීය නම් මෙහි දැක්වූ නිෂ්පන්නය යි. අන්‍ය භාෂා හා සම නො වූ එසින් බිඳුණේය යි සැලකිය යුතු සමීප ශ්‍රුතියකුදු නැත්තා වූ සියල්ල නිෂ්පන්නභෙදයෙහි ඇතුළත් වේ. මඳකින් සමානාකාරය ද ඇති වචනසමූහය තද්භවභෙදයෙහි ඇතුළත් වේ. ඒ වනාහි සිංහල ද්වීපවාසීන්ගේ ශාස්ත්‍රාගම

සම්බන්ධ වූ භාෂාන්තර ව්‍යවහාර හා සමාන ව ද එයින් භින්න ව ද පවත්නා වචන යි.

ත්‍රිභේදයෙහි දෘෂ්ටාන්ත දක්වන්නෝ "රුකුර තරඹ" යනාදිය කිහු.

**ප**—රුකුර තරඹ ඈ, රුකුර- කිරීමෙහි, තරඹ- බැලීමෙහි යනාදිය; නිපන් දුපියවි නම්, නිෂ්පන්නධාතුප්‍රකෘති නම්; යා දා කර ඈ, යා- පැමිණීමෙහි, දා- දීමෙහි, කර- කිරීමෙහි, යනාදිය; තසම දුපියවි නම්, තත්සම ධාතුප්‍රකෘති නම්; දන නැඟි සමර තුලුර ඈ, දන- ජයෙහි, නැඟි- ගමනරුත්හි, සමර- සිහිකිරීමෙහි, තුලුර- වැළඳීමෙහි, යනාදිය; තබව දුපියවි නම්, තද්භව ධාතුප්‍රකෘති නම්.

**භා**—කිරීම ය යන අර්ථයෙහි රුකුර යන ධාතුව ද, බැලීම ය යන අර්ථයෙහි තරඹ යන ධාතුව ද, සිංහලභාෂායෙහි ම සිද්ධ ය. මාගධ ව්‍යාකරණාදියෙහි අසිද්ධ ය. එහෙයින් මේ ආදි ආකාර ඇත්තේ නිෂ්පන්න ධාතුප්‍රකෘතිය යි.

**වි**—**යා දා** යන ධාතු දෙක '**යා**- ප්‍රාපණෙ' යී සංස්කෘතභාෂායෙහි ද, '**යා**= පාපුණනෙ' යී මාගධභාෂායෙහි ද, '**යා**- පැමිණීමෙහි' යී සිංහලභාෂායෙහි ද, '**යා**' යන එකස්වරූපයෙන් පැනේ. **කර** යන ධාතුව '**කර**- කරණෙ' යී මාගධභාෂායෙහි ද, '**කර**- කිරීමෙහි' යී සිංහලභාෂායෙහි ද, එකස්වරූපයෙන් පැනේ. මේ ආදීන් අන්‍යභාෂා හා සමානත්වයෙන් මෙහි පැනෙන ධාතු තත්සම ධාතුප්‍රකෘති යි. ජයගැනීම ය යන අර්ථ ඇති '**දන**' ධාතුව පාලිභාෂායෙහි '**ජි**- ජයෙ' යන ධාතුවෙන් විකරණ සහිත ප්‍රත්‍යයවත් ව සිද්ධ වූ '**ජිනාති**' '**ජිනනති**' යනාදි ධාතුපදයන්ගේ පූර්වභාගයෙන් හෙවත් '**ජින**' යන්නෙන් බිඳී ආයේ ය. **නැඟි** යන ධාතුව පාලි සංස්කෘත දෙක්හි '**ලඞ්ඝි**- සොසගත්‍යු; **ලඞ්ඝි**- අතික්‍රමෙ' යී, එක්වැනි වූ '**ලඞ්ඝි**' යන්නෙන් භින්න ව (=වෙනස් ව) ආයේ ය. **සමර** යන ධාතුව සංස්කෘතභාෂායෙහි '**ස්මෘ**-චින්තායාම්' යන්නෙන් සිද්ධ වූ '**සමරති**' යනාදි ධාතුපදයන්ගේ '**සමර**' යන භාගයෙන් **සමර** කියා බිඳී (=වෙනස් ව) ආයේ ය.

වැළඳගැනීම ය යන අර්ථ ඇති '**තුලුර**' යන ධාතුව කිනම් භාෂායෙකින් බිඳී ආයේදැ යි මෙකල බොහෝදෙනා කෙරෙහි අවිනිශ්චිත ව පරීක්ෂ්‍යස්ථානයක් ව පවතී. මාගධ සංස්කෘත දෙක්හි තුලුර යන්නට ආසන්න වූ ධාතුප්‍රකෘතියක් නො පැනේ. ද්‍රවිඩශබ්දකොෂයන්හි "**තළුවු**" යන ආලිඞ්ගනාර්ථශබ්දය ව්‍යඤ්ජනාක්ෂර දෙකකින් සමානව ද, එකකින් අසමානව ද, පැනෙන හෙයින් ද්‍රාවිඩ්‍යාදි අන් කිසි භාෂාවකින් බිඳී ආයේය යි සැලකිය යුතු යි.* මේ 'තුලුර' යන ධාතුව තුරුලු, තුලුරුතෙප්ල, යනාදියෙහි ධාතුප්‍රකෘති ව සිටී.

* තුලු, වර, කියා ධාතු දෙකොකැ යි සමහරු සලකති. එසේ කලැ '**තුලුල්, තුරුල්**' යනාදිය අසිද්ධ හෙයින් එය ප්‍රමාණ කටයුතු නො වේ.

**කොළඹ කරළු ඈ නිපන් සදපියවි නම්.**
**ගජ කර කිරණ ඈ තසම සදපියවි නම්.**
**අත් රුක් සමන්බඟුරු ඇඳුරු කන් ඇඹුල් ඈ**
**තබව සදපියවි නම්.** (17)

---

(17) **ප**—කොළඹ කරළු ඈ, කොළඹ කරළු යනාදිය; නිපන් **සදපියවි නම්**, නිෂ්පන්න ශබ්දප්‍රකෘති නම්; ගජ කර කිරණ ඈ, ගජ කර කිරණ යනාදිය; තසමසදපියවි නම්, තත්සම ශබ්දප්‍රකෘති නම්; අත් රුක් සමන්බඟුරුඇඳුරු කන් ඇඹුල් ඈ, අත් රුක් සමන්බඟුරු ඇඳුරු කන් ඇඹුල් යනාදිය; තබව සදපියවි නම්, තද්භව ශබ්දප්‍රකෘති නම්.

**වි** – යාත්‍රාතීර්ථවාචි කොළඹශබ්දය, නවවස්ත්‍රවාචි කරළුශබ්දය, යනාදිය නිෂ්පන්න ශබ්දප්‍රකෘති යි. කොළඹ ශබ්දය කොළොඹ කියා ද, සමාසවිෂයෙහි කොළොම් කියා ද, ව්‍යවහාර වේ. තීර්ථවාචී වූ මේ නාමය මාගධ සංස්කෘතාදි අන්‍යභාෂාවක් පිළිබඳ වචනයක් හා සම නො වන හෙයින් ද, එයින් බිඳී ආවක් නො වන හෙයින් ද, තත්සම ශබ්දප්‍රකෘතියක් හෝ තද්භව ශබ්ද ප්‍රකෘතියක් හෝ නො වෙයි. සිංහලද්වීපයෙහි ම සිදු වූ ව්‍යවහාර යක් හෙයින් නිෂ්පන්න ශබ්දප්‍රකෘතියක් ම වෙයි.† අලුත් පිළියට ව්‍යවහාර වූ කරළු ශබ්දය ද මෙසේ මැ යි.

හස්තිවාචි '**ගජ**' ශබ්දය, හස්තවාචි '**කර**' ශබ්දය, රශ්මිවාචි '**කිරණ**' ශබ්දය යනාදිය පාලි සංස්කෘතාදි භාෂාන්තර හා සමාන ව (=එක්වැනි ව) සිංහලභාෂායෙහි ද පවත්නා හෙයින් තත්සම ශබ්දප්‍රකෘති යි.

අර්ථවාචි '**අත්**' ශබ්දය, වෘක්ෂවාචි '**රුක්**' ශබ්දය, සමන්තභද්‍ර වාචි '**සමන්බඟුරු**' ශබ්දය, ආචාර්‍ය්‍යවාචි '**ඇඳුරු**' ශබ්දය, නෙත්‍ර වාචි '**කන්**' ශබ්දය, විශ්‍රාමශාලාවාචි '**ඇඹුල්**' ශබ්දය යනාදිය පාලි සංස්කෘතාදි අන්‍යභාෂාවකින් බිඳී (=වෙනස් ව) ව්‍යවහාර වූ

---

† 'කොළඹ' යන නාමය ලක්දිව එක ම සමුද්‍රතීර්ථයකට සිංහලයන් කෙරෙහි රූඪ ය. කල්‍යාණීප්‍රකරණාදි පුරාණ ලිපිවල "කලම්බතිත්ථ" යි පාලිභාෂායෙන් කියනලදි. මෙකල පාලිභාෂාවෙනුත් "කොළම්බ" කියා ව්‍යවහාර කෙරෙත්. ධර්මකීර්ති මාහිමියන් විසින්, මීට අවුරුදු පන්සිය ගණනකින් පෙර, ජයවර්ධනපුරයාගේ ආරම්භ ප්‍රවෘත්තිය දැක්වූ තන්හි "කදම්බාඝධාන ද්‍රොණිමුඛ" යයි කියන ලද්දේ මේ කොළොම්තොට සඳහා යි. 'කදම්බ' යනු පාලි සංස්කෘත දෙක්හි සමාන වූ වෘක්ෂවිශෙෂවාචී ශබ්දයෙකි, හෙවත් කොළොම් ගසට නමෙකි. කදම්බශබ්දයෙන් තද්භව වූ බැව් ධර්මකීර්ති මාහිමියාණන්ගේ ලිපියෙන් හැඟෙන හෙයින් එයින් බිඳුණේ ද වෘක්ෂවාචක වෙයි; එය කෙසේ තීර්ථවාචක වී දැයි සිතිය යුතු ය. ලොකයෙහි නදීතීර්ථ සමුද්‍රතීර්ථාදිය ඊට ළංව තුබූ වෘක්ෂාදීන්ගේ නමින් ද ව්‍යවහාර කිරීම පැනෙන හෙයින් කොළොම්රුකක් අසල තීර්ථය 'කොළොම්තොට' කියා ද

**දයින් නමින් හොත කරනුයේ පස නම්:- තිළි කරණි නියරි ඇගි.** (18)

---

හෙයින් තද්භව ශබ්දප්‍රකෘති යි. මෙහි අත් යනු '**අත්ථ**' යන මාගධ ප්‍රකෘතියෙන් සිංහලට බිඳී ආයේ ය. '**අත්ථ**' ශබ්දයෙන් කියනු ලබන තේරුම **අත්** ශබ්දයෙන් ප්‍රකාශ වේ. එයින් බිඳී ආ හෙයිනි. **හත්ථ**ශබ්දයෙන් බිඳුණේ ද **අත්** කියා වෙයි. එය හස්තයට නමි. **රුක්** යනු පාලිභාෂායෙහි රුකට නම් වූ '**රුක්ඛ**' ශබ්දයෙන් බිඳුණේ ය. **සමන්බහදුරු** යනු සංස්කෘතභාෂායෙහි සුගත පර්‍ය්‍යාය වූ '**සමන්තභද්‍ර**' ශබ්දයෙන් බිඳුණේ ය. **ඇදුරු** යනු පාලිභාෂායෙහි ගුරුපර්‍ය්‍යාය වූ '**ආචරිය= ආචෙර**' ශබ්දයෙකින් හෝ සංස්කෘත භාෂායෙහි '**ආචාර්‍ය්‍ය**' ශබ්දයෙන් හෝ බිඳුණේ ය. ඇජර යනු ද ඇදුරු යනු ද එකාර්‍ථපාඨ යි.

'**කන්**' යනු නෙත්‍රවාචි කලැ ද්‍රවිඩභාෂායෙහි '**කණ්**' ශබ්දයෙන් ද, ශ්‍රොත්‍රාදිවාචි කලැ ද්‍රවිඩභාෂායෙහි '**කාරණා**' ශබ්දයෙන් ද, බිඳුණේ වේ. '**ඇඹුල්**' යනු ද්‍රවිඩභාෂායෙහි '**අම්බලම්**' යන ශබ්දයෙන් බිඳුණේ ය. රසයෙහි වැටෙන කල "**අම්බිල= අම්ල**" යන පාලි සංස්කෘත ශබ්දයෙකින් බිඳුණේ ය යි සැලකිය යුතු යි. "පණ්ඩුකම්බල" යන සමාසශබ්දය 'පඬුඇඹුල්' යි තද්භව වූ ලෙසින් '**කම්බල**' ශබ්දයෙන් ද **ඇඹුල්** යි තද්භව වේ. මෙසේ අන්‍ය භාෂාවලින් බිඳී සිංහල භාෂාවට ඇතුළත් ව ව්‍යවහාර වන තද්භව ශබ්දප්‍රකෘති ඉතා බොහෝ යි.

---

## 7—ප්‍රත්‍යයවිධිය.

(18) **ප**—දයින් හොත, ධාතුවකින් පර ව හෝ; නමින් හොත, නාමයකින් පර ව හෝ; කරනුයේ, කරනුලබන්නේ; පස නම්, ප්‍රත්‍යය නමි. තිළි කරණි නියරි ඇගි, තිළි කරණි නියරි යනාදි ආකාර ඇත්තේ යි.

**වි** - ධාතුප්‍රකෘතියකින් හෝ ශබ්දප්‍රකෘතියකින් හෝ අනට යම් කිසි අර්‍ථයක් සලකා යොදනු ලබන අක්ෂරය ප්‍රත්‍යය නම් වේ*. සතුටු වීමෙහි වැටෙන '**තුෂ**' යන ධාතුප්‍රකෘතිය තුස කියා

---

'කොළොම්ඹ' කියා ද ව්‍යවහාරයට පැමිණිය හැකි වේ. එකල ව්‍යාඛ්‍යාවක වූ කොළොම් ශබ්දය අභෙදෝපචාරයෙන් තීර්‍ථවාචි වෙයි. තීර්‍ථවාචී වූ මාගධ සංස්කෘතාදි භාෂාන්තරවචනයක් හා සම නො වන හෙයිනුත්, එබඳු වචනයෙකින් නො බිඳුණු හෙයිනුත්, තීර්‍ථවාචි 'කොළොම්ඹ' ශබ්දය නිෂ්පන්නාය යි සැලකීම අනුචිත නො වේ. ව්‍යාඛ්‍යාදීන්ගේ නාම තීර්‍ථාදියට ව්‍යවහාර කිරීම 'මාදම්පාතොට' යනාදි ව්‍යවහාරවලින් ද ප්‍රසිද්ධ ය. 'මාදම්පාතොට' යනු මාදඹ ගසක් අසල තීර්‍ථය යි පුරාතනයන් විසින් 'ජම්බුපාදපතිත්‍ථ' යයි පෙළඹසට ද නගනලදී.

* ප්‍රකෘතෙඃ පරඃ ප්‍රත්‍යයො නිර්දිෂ්ටඃ- යනු කාතන්ත්‍රදෞර්ගසිංහි වෘත්ති යි. ප්‍රකෘතියෙන් පර වූයේ ප්‍රත්‍යය යි දතයුතු ය යන අර්‍ථ යි.

**නො දූව් නුගුණ දූව් නිසා සකරුනෙන් දුමුව වැ සිදු කිරිය නම්:- දිනි වැජඹෙහි දෙන්නෙම් ඇගි.** (19)

---

තබා, එයින් පර ව අතීතකාලික අන්‍යකාරක එකවචනාර්ථය සලකා ඊ ප්‍රත්‍යයකොට 'තුස+ඊ' කියා තුබූ තන්හි තකාරයට උකාරයට පිළිපෙරළි වශයෙන් ඉකාරාදෙශ හා සකාරයට ළකාරාදෙශ ද කොට ඊ ප්‍රත්‍යය පර කල්හි පූර්වස්වරය ලොප් කොට, පරස්වරයා ගාත්‍රාරූඪ කළ කල්හි '**සතුටු වී**' යන අර්ථයෙහි '**තිළි**' යනු වේ. කිරීමෙහි වැටෙන '**කර**' යන ධාතුප්‍රකෘතිය 'කර' යි තබා, ඔහු කෙරෙන් පර වැ කර්මාර්ථය සලකා '**ණී**' ප්‍රත්‍යය කළ කල්හි, '**කටයුතු ය**' යන අර්ථයෙහි '**කරණී**' යනු වේ. නගරාර්ථ වූ නුවර ශබ්දය ප්‍රකෘති කොට ගෙන '**නුවරෙහි**' කියා තබා, එයින් පර වැ '**වූයේ**' යන අර්ථය සලකා **ඉ** ප්‍රත්‍යය කොට, විභක්තිලොපය හා උකාරයහට පිළිපෙරළි ඉකාරාදෙශ ද, වකාරයහට යකාරාදෙශ ද, ප්‍රත්‍යයස්වර පූර්වස්වර දෙදෙනාගේ ගැළපීම ද කළ කල්හි නුවරෙහි වූයේ යන අර්ථයෙහි '**නියරි**' යනු වේ. මෙහි **තුස, කර,** යන ප්‍රකෘති දෙක ධාතු යි. ඔවුන් කෙරෙන් පර වැ යෙදූ **ඊ** යනු ද **ණී** යනු ද ප්‍රත්‍යය යි; නුවර යනු ශබ්දප්‍රකෘති යි. එයින් පර වැ යෙදූ ඉකාරය ප්‍රත්‍යය යි. මෙහි විස්තර ප්‍රත්‍යයාර්ථාධිකාරයෙහි මතු ප්‍රකාශ වේ.

---

## 8—ක්‍රියාවිධිය.

(19) **ප**—නො **දූව්**, ද්‍රව්‍යයක් නො වූ; **නුගුණ**, ගුණයක් නො වූ; දූව් නිසා, ද්‍රව්‍යයක් ආශ්‍රය කොට; සකරුනෙන්, ෂට් කාරකයෙන්; දූමුව වැ, ධාතුමය වැ; සිදු, සිද්ධ වූයේ; කිරිය නම්, ක්‍රියා නම්. දිනි වැජඹෙහි දෙන්නෙම් ඇගි, දිනී වැජඹෙහි දෙන් නෙම් යනාදි ආකාර ඇත්තේ යි.

**භා**—ඝටපටාදි ද්‍රව්‍යයක් හෝ කෘෂ්ණශ්වේතාදී ගුණයක් හෝ ප්‍රකාශ නො කරන්නා වූ, ද්‍රව්‍යයක් ආශ්‍රය කොට කාරකසමූහයා විසින් ධාතුවක් ප්‍රකෘති කොට සිදු කරනලද, පදාර්ථය ක්‍රියා නම් වේ.

**වි**—'දන- දිනීමෙහි' යන ධාතු '**දන**' යි තබා ඔහු කෙරෙන් පර වැ '**ඒ ඉ ඊ උ ද අයු**' යනාදි උපාඞ්ගසූත්‍රයෙන් අතීතකාලික අන්‍යකාරක එකවචන (කර්තෘකාරක) ක්‍රියාවක් කිවමනා කල්හි **ඊ** ප්‍රත්‍යය කොට පූර්වස්වර ලොපය හා පරස්වරයා ගාත්‍රාරූඪ කිරීම ද, දකාරස්ථ අකාරයහට පිළිපෙරළි ඉකාරාදෙශ ද, කළ කල්හි '**දිනි**' යනු සිද්ධ යි. ජයග්‍රහණය කෙළේ ය යන අර්ථ යි.

**වණින් අනුසුරුවීම් ලොප් නම්:- නත් වරද මහසුප් රදූ බා පා ඇයි.** (20)

---

ජනිතවී යන අර්ථය ද මෙයින් වාච්‍ය වේ. මේ ක්‍රියාපදය අන්‍ය කාරකෛකවචන හෙයින් (හෙවත් සංස්කෘත මාගධ වෛයාකරණයන්ගේ සංඥාවශයෙන් ප්‍රථමපුරුෂෛකවචන හෙයින්) 'හෙතෙම' යන කර්තෘකාරකය උක්ත වේ. අන්‍යකාරක හෙයින් තශබ්ද මශබ්ද හැර එයින් පිටත් ශබ්දයෙක් කර්තෘපදවශයෙන් සිටී. දිනී යන මෙය ද්‍රව්‍යයක් හෝ ගුණයක් හෝ ප්‍රකාශ නො කොට, කර්තෘස්වරූප වූ ද්‍රව්‍යයක් ඇසුරු කොට, කර්තෘ ආදි කාරකයන් කරණකොටගෙන ධාතුප්‍රකෘතික වැ සිද්ධ වූ හෙයින් ක්‍රියා නම් වෙයි. මෙසේ ම **'වි'** යන උපසර්ගය පූර්ව කොට ඇති **'ජඹ=** ගත්නැමුම්හි' යන ධාතු **'විජඹ'** යි තබා ඔහු කෙරෙන් පර වැ වර්තමානකාලික තශබ්දකාරක එකවචන කර්තෘකාරක ක්‍රියාවක් කියටි කල්හි **'නසඳසරු අරුනැ'** යනාදි උපාඞ්ගසූත්‍රයෙන් **'එහි'** යන ප්‍රත්‍යය කොට, පූර්වස්වර වූ ඔකාරයට අකාරයහට ලොප් හා පරස්වර වූ එකාරයා ගාත්‍රාරූඪ ද කොට, විශබ්දයාගේ ඉකාරය හට පිළිපෙරළි (අකාරාදේශ) හා මාත්‍රාවෘද්ධි ද කළ කල්හි **'වැජඹෙහි'** යනු සිද්ධ යි. විජෘම්භණය කෙරෙහි, විකසිත වෙහි, යන අර්ථ මෙයින් වාච්‍ය වේ. මෙය තශබ්දකාරකෛකවචන (=මධ්‍යමපුරුෂෛකවචන) හෙයින් 'තෝ' යන කර්තෘකාරකය උක්ත වේ.

දී= පණ දැරීමෙහි යන ධාතු **'දී'** යී තබා ඔහු කෙරෙන් පර වැ අනාගතකාලික මශබ්දකාරක එකවචන කර්තෘකාරක ක්‍රියාවක් කියටි කල්හි **'නසඳසරු අරුනැ'** යනාදි උපාඞ්ගසූත්‍රයෙන් **'එන්නෙම්'** යන ප්‍රත්‍යය කොට, පූර්වස්වර වූ දකාරයට ඊකාරය හට ලොප් හා පර එකාරය ගාත්‍රාරූඪ ද කළ කල්හි **'දෙන්නෙම්'** යනු සිද්ධ යි. ජීවත්වන්නෙම් යන අර්ථය මෙයින් වාච්‍ය වේ. මෙය මශබ්දකාරක (=උත්තමපුරුෂ) එකවචන හෙයින් 'මම්' යන කර්තෘකාරකය මෙයින් උක්ත වේ. ක්‍රියාපදයන්ට උදාහරණ දක්වන ආචාර්යයන් විසින් අන්‍යකාරකාදියට එකෙකි උදාහරණයක් මෙහි දක්වුව ද විස්තර ක්‍රියාධිකාරයෙහි මතු ප්‍රකාශ කරනු ලැබේ.

---

## 9—ලොපවිධිය.

(20) **ප**—වණින්, වර්ණයන් සම්බන්ධි වූ; අනුසුරුවීම්, අනුච්චාරණය; ලොප් නම්, ලොප නම්. නත් වරද මහසුප් රදූ බා පා ඇයී, නත් වරද මහසුප් රදූ බා පා යනාදි ආකාර ඇත්තෝ යි.

**වණක්හු ලොපා වණක්හු කිරීම් අදෙස් නම්:- සැරියුත් අයුණු වැහැප් ඇගී.** (21)

---

**භා**—පදයන්ගේ ආදියෙහි හෝ මධ්‍යයෙහි හෝ අන්තයෙහි ඇති සිටි අක්ෂරයන් සූත්‍රබලයෙකින් නො කියා හැරීම ලොප නම් වේ.

**වි**—'**අනන්ත**' ශබ්දයෙන් තද්භව වූ **අනත්** ශබ්දය අනත් යී ම කියයුතුවත් අඞ්ගසූත්‍රබලයෙන් පූර්වවර්ණ ලොපය කොට '**නත්**' යී කියනු ලැබේ. අනන්තරහිතය යන අර්ථ යි. ශෙෂනාග විෂ්ණු මෙඝ ආකාශාදි අර්ථයෙහි ද වැටේ. '**යුවරාජ**' ශබ්දයෙන් තද්භව වූ **යුවරද** යන්න යුවරද යීම කියයුතු තන්හි සුඛොච්චාරණය සඳහා පූර්වවර්ණ ලොපය කොට '**වරද**' යී කියනු ලැබේ. යුවරජ යන අර්ථ යි.

'**මහාකස්සප**' ශබ්දයෙන් තද්භව වූ **මහකසුප්** යන්න මහකසුප් යී ම කියයුතු තන්හි අඞ්ගසූත්‍ර බලයෙන් මධ්‍යවර්ණලොපය කොට '**මහසුප්**' යී කියනු ලැබේ. එනම් මහාශ්‍රාවකයන් වහන්සේ ය යන අර්ථ යි.

'**රාජදුහිතෘ**' ශබ්දයෙන් තද්භව වූ **රදදූ** ශබ්දය රදදූ යී ම කියයුතු තන්හි අඞ්ගසූත්‍රබලයෙන් මධ්‍යවර්ණලොපය කොට '**රදූ**' යයි කියනු ලැබේ. රාජපුත්‍රී යන අර්ථ යි.

**භාග, භාග්‍ය** යන ශබ්දයන් අතුරෙන් එකකින් තද්භව වූ **බාග** යන්න හෝ, **බාහු** ශබ්දය හා තත්සම වූ **බාහු** යන්න හෝ, බාග කියා ද බාහු කියා ද කිවමනා තන්හි, අඞ්ගසූත්‍රබලයෙන් අන්තවර්ණ ලොපය කොට, '**බා**' යයි කියනු ලැබේ. කොටස ය, භාග්‍ය ය, භුජ ය යන අර්ථ යි.

**පාද, පාප** ශබ්දයන් හා තත්සම වූ **පාද** යනු ද **පාප** යනු ද එසේ ම කිවමනා තන්හි, අඞ්ගසූත්‍රබලයෙන් අන්තවර්ණය ලොප් කොට, '**පා**' ය යි කියනු ලැබේ. **පාත්‍ර** ශබ්දදියෙන් තද්භව වූ කල ද '**පා**' ය යි කියනු ලැබේ. පාදය, පාපය, පාත්‍රය යනාදි අර්ථ වාච්‍ය වේ.

---

## 10—ආදෙශවිධිය.

(21) **ප**—වණක්හු, වර්ණයකු; ලොපා, ලොප් කොට; වණක්හු, (අනික්) වර්ණයක්හුගේ; කිරීම්, (උච්චාරණ) කරණය; අදෙස් නම්, ආදෙශ නම්. සැරියුත් අයුණු වැහැප් ඇගී, සැරියුත් අයුණු වැහැප් යනාදි ආකාර ඇත්තේ යි.

**භා**—ස්ථානි ව සිටි අක්ෂරය නැති කොට ඔහුගේ ස්ථානයෙහි අනික් අක්ෂරයක් ඇතිකිරීම ආදෙශ නම් වේ.

**වණ්ණක්හු නිසා ඔහු නො ලොපා වනුයේ අගම් නම්:- නිරලඹ රුවාරු ඇගී.** (22)

---

වි—පාලිභාෂායෙහි **'සාරිපුත්ත'** ශබ්දයෙන් එළුබසට තද්භව වූ ආ **'සැරිපුත්'** යන්න, **'සැරියුත්'** කියා ආදෙශවිධියෙන් වෙනස් කොට, ව්‍යවහාර කෙරෙත්. මෙහි **පුත්** ශබ්දයාගේ ආදියෙහි සිටි **ප** යන්න අඞ්ගසූත්‍රබලයෙන් නැති කොට එ තන්හි **ය** කාරයක් ඇතිකිරීම ආදෙශවිධිය යි. පළමු තුබූ අකුර නසා එතන්හි අතික් අකුරක් පිහිටුවීම ආදෙශ නම් වන හෙයින් 'ශත්‍රුවද්දෙශඃ' යි (=ආදෙශය තෙමේ සතුරකු වැන්නැ යි) අනුභූතිස්වරූපාදි පුරාතන වෛයාකරණයන් විසින් කියන ලද්දේ ය. සංස්කෘත මාගධ ප්‍රකෘති හා අවිශෙෂ වූ අග්ගණ ශබ්දය, පිළිපෙරළියෙන් 'අඟුණු' යයි ගත් කලැ **ග**කාරයහට අඞ්ගසූත්‍රබලයෙන් **ය**කාරාදෙශ වැ, අසුණු කියා සිද්ධ වේ. සඨානි වූ ගකාරය අන්‍යඨානියකට පැමිණ යකාර වැ සිටි හෙයින් මෙ ද ආදෙශ විධිය යි. මාගධ **'වසභ'** ශබ්දයෙන් **වසබ්** කියා හෙළුබසට තද්භවප්‍රකෘතිය වේ. එහි **ස** කාරයහට **හ** කාරයක් **ද**, බකාරයහට පකාරයක් **ද**, අඞ්ගසූත්‍රබලයෙන් ආදෙශ කොට එම සූත්‍රයෙන් වකාර හකාර දෙදෙනා කෙරෙහි සිටි අකාරයන්ට මාත්‍රාවෘද්ධි **ද**, කළ කල්හි **'වැහැප්'** කියා සිද්ධ වේ*.

සැරියුත් නම් ප්‍රථම අග්‍රශ්‍රාවකයන්වහන්සේ හෝ එබඳු නම් ඇත්තෙක. අසුණු නම් අගුණ ය. වැහැප් නම් ගෙරිහු ය.

---

## 11—ආගමවිධිය.

(22) **ප**—වණ්ණක්හු, වර්ණයක්හු; නිසා, ආශ්‍රය කොට; ඔහු, ඒ (ආශ්‍රිතවර්ණය); නො ලොපා, ලොප් නො කොට; වනුයේ, (ඇති) වන්නේ; අගම් නම්, ආගම නමි. නිරලඹ රුවාරු ඇගී, නිරලඹ රුවාරු යනාදි ආකාර ඇත්තේ යි.

භා—කිසියම් වර්ණයක් ළඟ පෙර නො තුබූ වර්ණයක් ඇති කෙරේ නම් එය පළමුවර්ණය නො නසා ආශ්‍රය කරන මිතුරකු වැනි හෙයින් ආගම නම් වෙයි. "මිත්‍රවදාගමඃ" යන්නෙන් පුරාතන වෛයාකරණයෝ 'ආගම වන අකුර මිතුරකු වැන්නැ' යි කීහු.

---

* 'වහප්' කිවත් 'වැහැප්' කිවත් මාත්‍රා තුනෙක. එබැවින් මෙහි මාත්‍රාවෘද්ධියක් නැතැ යි සමහර ආධුනිකයෝ සලකති. සම්පූර්ණ මාත්‍රාවකගේ වැඩීම ද මාත්‍රාංශයකගේ වැඩීම දැයි විවිධමාත්‍රාවෘද්ධියක් වෛයාකරණයන් විසින් ප්‍රතිපාදිත ය. එහි සම්පූර්ණ මාත්‍රාවක් වැඩීමෙන් මාත්‍රාගණන වැඩි, සතර මාත්‍රාවක් ඇති 'උවරණ' යන්නෙහි මාත්‍රාවෘද්ධි කිරීමෙන් 'ඌවාරණ'

**පරවණහට පෙරරූ කරනු පෙරරූ නම්:- විස්සම් ඈගී. (23)**

වි—'එල්ලීමක් නැති' යන අර්ථයෙහි මාගධ සංස්කෘත දෙක්හි ම 'නිරාලම්බ' යන නාමයෙක් වේ. එයින් හෙළුබසට 'නිරලඹ' යි තද්භව වේ. මාගධප්‍රකෘතිය 'නි + ආලම්බ' කියා ද, සංස්කෘත ප්‍රකෘතිය 'නිර් + ආලම්බ' කියා ද පදබිඳෙන සේ, නිරලඹ යනුත් පදබිඳුණු විට 'නි + අලඹ' කියා වෙයි. 'නි + අලඹ' යන තන්හි පූර්වපරස්වර වැ සිටි ඉකාර අකාර දෙදෙනා මධ්‍යයෙහි අඞ්ග සූත්‍රය සම්බන්ධ වන්නෙහි **'පෙරපරවණන්'** යනාදි උපාඞ්ගසූත්‍රයෙන් රකාරයක් ආගම කොට පරස්වරයා ගාත්‍රාක්ෂරාරූඪ කළ කල්හි 'නිරලඹ' යනු වේ. රූපය ද අරූපය ද යන අර්ථයෙහි මාගධ සංස්කෘත දෙකින් ම 'රූපාරූප' යන සමාසාන්තනාමයෙක් නිපදී. එයින් හෙළුබසට 'රූවාරූ' යි තද්භව වැ සිටිනේ ය. පදබිඳීමෙහි රූ + අරූ කියා සිටි කල පූර්වපරස්වර වූ ඌකාර අකාර දෙදෙනා මධ්‍යයෙහි පෙරසේ ම වකාරයක් ආගම කොට ගාත්‍රාක්ෂරාරූඪ කළ කල්හි 'රූවරූ' කියා සිටි යි. ඉක්බිති ආදි ස්වරයට මාත්‍රාහානි හා වකාරස්ථ අකාරයහට මාත්‍රාවෘද්ධි ද කිරීමෙන්, 'රූවාරූ', යනු සිද්ධ යි. සන්ධ්‍යධිකාරයෙහි මේ ආදෙශාගමාදි විධීන්ගේ විස්තර පහළ වන හෙයින් මෙහිදී සංක්ෂෙප කළහ.

---

## 12—පූර්වරූපවිධිය.

(23) ප—පරවණහට, පරවර්ණයාහට; පෙරරූ කරනු, පූර්වවර්ණයාගේ රූපය (ආදෙශ) කිරීම; පෙරරූ නම්; පූර්වරූප නම්. විස්සම් ඈගී, විස්සම් යනාදි ආකාර ඇත්තේ යි.

ගා—සන්ධි කරන කල්හි පර වැ සිටි අකුර පූර්ව වැ සිටි අකුර හා සමානරූප කිරීම පූර්වරූප නම්. මෙද ආදෙශවිධියෙහි අවාන්තර භෙදයකි

වි—පාලිභාෂායෙහි දෙවශිල්පීහු කෙරෙහි වැටෙන 'විස්සකම්ම' ශබ්දයෙන් හෝ සංස්කෘත 'විශ්වකර්මන්' ශබ්දයෙන් හෝ හෙළුවට 'විස් + කම්' කියා තද්භව වෙයි. විස් + කම් යන තන්හි සන්ධි කටයුතු තැනැ පරවර්ණ වැ සිටි කකාරයාහට පූර්වවර්ණ වැ

---

කියා පස්මාත්‍රාවක් වීම මෙනි. මාත්‍රාවකගේ අංශයක් (-කොටසක්) වැඩීමෙන් මාත්‍රා ගණන නො වැඩේ. මාත්‍රා දෙකක් ඇති 'අස්' යන්නට මාත්‍රාංශයක් වැඩි කිරීමෙන් 'ඇස්' කී විට ද ද්විමාත්‍රාව ම සිටින්නාක් මෙනි. මේ වෘද්ධි විධියෙහි වූ සූක්ෂ්මභෙදය සිද්ධාන්තයෙහි විංශතිවිධ ව්‍යාකරණවිධි නිර්දේශයෙහි නො දුක්වූ බැවින් ආධුනිකයන්ගේ වෙහෙසට කරුණු වුවත් ආචාර්ය්‍ය ප්‍රතිරාජ පරිවෙණ ස්වාමීන් විසින් ම එහි තත්ත්වය ඉෂ්ටානිෂ්ටාධිකාරයෙහි 'ඇප් ඇ මතයින් වැඩීයෙන් මත්වැඩි නම්' යනුවෙන් සුප්‍රකාශිත යි

**වණ්ණහට ද පදහට ද දෙරූ දැනවුම් දෙරූ නම් - තුටු කෙළේ එ ලොපල්ලා, කුළුණෙන් ළතෙත්තා, තෙදියට එකනෙත්තා, රණමැද දියකොත්තා, දිදී, විඳ විඳ, පල පල.** (24)

---

සිටි සකාරයාගේ රූපය කිරීමෙන් හෙවත් කයන්න ද (මුලින් සිටි සයන්න සේ) සයන්නක් ම කිරීමෙන් 'විස්සම්' කියා සන්ධි වේ.

—— ——

## 13—ද්විරූපවිධිය.

(24) **ප**—වණ්ණහට ද, වර්ණයක්හට **ද**; පදහට ද, පදයක් හට **ද**; දෙරූ දැනවුම්, රූපද්වයොත්පාදනය; දෙරූ නම්, ද්විරූප නම්; තුටු කෙළේ එ ලොපල්ලා යනාදිය උදාහරණ යි.

එ ලොපල්ලා, ඒ ලොකපාලතෙම; තුටු කෙළේ, තුෂ්ට කෙළේ යන අර්ථ යි; කුළුණෙන් ළතෙත්තා, කරුණාවෙන් ආර්ද්‍ර වූ හෘදය ඇත්තේ යන අර්ථ යි; තෙදියට එකනෙත්තා, ජගත්‍රයට අසහාය නෙත්‍ර වූයේ යන අර්ථ යි; රණමැද දියකොත්තා, යුද්ධ මධ්‍යයෙහි ජයකෙතු වූයේ යන අර්ථ යි; දිදී, දානය කොට කොට; විඳ විඳ, විඳිනය කොට කොට; පල පල, යව යව යන අර්ථ යි; 'පල' යනු පුරාතන සන්නයෙහි අනුකරණ ශබ්දයෙකැ යි දක් වූ හෙයින් පල පල යනු 'පල පල' යන ශබ්ද ඇත්තේ ය යන අර්ථ ද වේ.

**භා**—අක්ෂරයක්හට හෝ පදයක්හට හෝ සවකීය රූපය වැනි තවත් රූපයක් ඉපදවීම ද්විරූප නම් වේ.

**වි**—ලොපල්ලා යන තන්හි **ලොපල්** ශබ්දයා කෙරෙන් ප්‍රථමෛකවචන **ආ**විභක්ති වැ '**ලොපල්+ආ**' කියා සිටි කල්හි විභක්ති යෙන් පෙර වැ සිටි ලකාරයහට රූපද්වයක් ඉපදවීමෙන් '**ලොපල්ලා**' යනු සිද්ධ යි. ළතෙත්තා යන තන්හි **ළතෙත්** ශබ්දයා කෙරෙන් කර්මවිභක්ත්‍යෙකවචන **ආ**විභක්ති ව '**ළතෙත්+ආ**' කියා සිටි කල්හි විභක්තියෙන් පෙර වැ සිටි තකාරයහට රූපද්වයක් ඉපදවීමෙන් '**ළතෙත්තා**' යනු සිද්ධ යි. එකනෙත්තා යන්නෙහි **එකනෙත්** ශබ්දයා කෙරෙන් කර්ම විභක්ත්‍යෙකවචන **ආ** විභක්ති වැ '**එකනෙත්+ආ**' කියා සිටි කල්හි විභක්තියෙන් පූර්ව වැ සිටි තකාරයට ද්විරූපොත්පාදන යෙන් '**එකනෙත්තා**' යනු සිද්ධ යි. දියකොත්තා යන්නෙහි **දියකොත්** ශබ්දයා කෙරෙන් ප්‍රථමෛකවචන **ආ** විභක්ති වැ '**දියකොත්+ආ**' කියා සිටිකල්හි විභක්තියෙන් පූර්ව වූ තකාරය හට ද්විරූපොත්පාදනයෙන් '**දියකොත්තා**' යනු සිද්ධ යි. මේ වර්ණයක්හුගේ ද්විරුක්තියට නිදර්ශන යි.

**පාසායෝගි සකින් උසුරුවනු ද රුසි. සක්වළක් පාසා මහමෙර ඇගි.** (25)

**පිළිපෙරළි වණපෙරළි පදපෙරළි විබත්පෙරළි කිරිය පෙරළි වි පෙරළි පස්වැදෑරුම්.** (26)

---

දී යන පූර්වක්‍රියාපදයහට ද්විරූපොත්පාදනයෙන් 'දිදී' කියා සිටි කල්හි ප්‍රථමරූපයට මාත්‍රාහානි කිරීමෙන් 'දිදී' යනු සිද්ධ යි. දීර්ඝස්වරයක් අන්ත වූ පූර්වක්‍රියා පදයක්හට ද්විරූප කිරීමෙහි ප්‍රථම රූපයාගේ අන්තය හ්‍රස්ව වනු ස්වභාෂාවෙහි රීති යකි. කා, බී, කියා, අසා, බලා, යනාදිය ද්විරූපවිධියෙහි මුල් රූපයට හ්‍රස්ව වීමෙන් කකා, බිබී, කිය කියා, අස අසා, බල බලා, යනාදීන් දතයුතු යි. විඳ යන පූර්වක්‍රියා පදයහට ද **පල** යන අපරක්‍රියා හෝ අනුකරණයහට ද ද්විරූපොත්පාදනයෙන් විඳ විඳ, **පල පල,** යන ප්‍රයොගයන්ගේ සිද්ධිය වේ. මේ විධිය ද අඩහ සූත්‍රසාමර්ථ්‍යයෙනැ යි සැලකියයුතු යි.

(25) නැවත ද්විරූපයෙහිදු විශෙෂ දක්වන්නෝ **'පාසායෝගි'** **යනාදිය කියත්.**

**ප**—පාසායෝගි, පාසා යන (නිපාතය හා) යොගයෙහි; **සකින්,** වාරයක්; උසුරුවනු **ද,** උච්චාරණය කිරීම **ද;** රුසී, රුචි යි. සක්වළක් පාසා මහමෙර ඇගි, සක්වළක් පාසා මහ මෙර යනාදි ආකාර ඇත්තේ යි.

හා—පාසා යන නිපාතයාගේ යෙදීම ඇති කල්හි විරූපක වුවහුගේ එක්රූපයක් අප්‍රයොග කිරිමෙන් එක්රූපයක්හුගේ උච්චාරණය ද ආචාර්‍ය්‍ය යන්ට අභිමත යි.

සක්වලෙහි සක්වලෙහි කිවමනා තන්හි **පාසා** යන නිපාතය යොදතහොත් **'සක්වළක් පාසා'** කියා ද කියනුලැබේ. මෙහි **'සකින් උසුරුවනු ද'** යන්නෙන් සමුච්චයාර්ථ දකාරයක් දැක්වූ හෙයින් පාසා යොගයෙහි අසකෘදුච්චාරණය ද නිරවද්‍ය වේ. එහෙයින් **'ගමක් ගමක් පාසා'** කියා ද ව්‍යවහාර කෙරෙත්. අන්‍ය ව්‍යාකරණයන්හි කර්මප්‍රවචනීයයන්ට ඇතුළත් 'පති-ප්‍රති' දෙදෙනා ද්විතීයාන්තයක් හා ම යෙදෙන්නාක් මෙන් පාසා යනු **ද** කර්මවිභක්ත්‍යන්තයක් හා ම යෙදේ. එහෙයින් **සක්වළක්** යනු **ද** කර්මවිභක්ත්‍යන්තය මැයි.

---

## 14—විපර්‍ය්‍යාසවිධිය.

(26) **ප**—පිළිපෙරළි, ස්වරවිපර්‍ය්‍යාසය; වණපෙරළි, ව්‍යඤ්ජන විපර්‍ය්‍යාස ය; පදපෙරළි, පදවිපර්‍ය්‍යාසය; විබත්පෙරළි,

**වසල් රික් කිසුම් ඉපැන් ඈ පිළිපෙරළි. (27)**

**කෙණෙර හුරිර යහන් මහණ ඈ වණපෙරළි. (28)**

විභක්තිවිපර්‍යාසය; කිරියපෙරළි වී, ක්‍රියාවිපර්‍යාසය කියා; පෙරළි, විපර්‍යාසය; පස්වැදෑරුම්, පඤ්චවිධ යි.

(27) ප—වසල් රික් කිසුම් ඉපැන් ඈ, (විසල් රුක් කුසුම් උපන් කිවමනා තන්හි) වසල් රික් කිසුම් ඉපැන් යනාදිය; පිළිපෙරළි, ස්වරවිපර්‍යාස නම් වේ.

වි—මාගධ **විසාල** ශබ්දයෙන් හෝ සංස්කෘත **විශාල**ශබ්දයෙන් හෝ හෙළුබසට බිඳී ආ **විසල්** යන්න ස්වරවිපර්‍යාසයෙන් **වසල්** කියා සිද්ධ යි. මාගධ **රුක්ඛ**ශබ්දයෙන් බිඳී ආ '**රුක්**' යන්න '**රික්**' කියා ද, සංස්කෘත ප්‍රාකෘත මාගධ භාෂාවන්හි සමාන වැ ආ '**කුසුම**' ශබ්දයෙන් භින්න වූ **කුසුම්** යන්න **කිසුම්** කියා ද, පාළි '**උප්පන්න**' ශබ්දයෙන් හෝ සංස්කෘත '**උත්පන්න**' ශබ්දයෙන් හෝ බිඳී ආ **උපන්** යන්න '**ඉපැන්**' කියා ද ස්වරවිපර්‍යාසයෙන් සිද්ධ යි. පෙර තුබූ ස්වරයක් ලොප් කොට අනික් ස්වරයක්හුගේ උච්චාරණය ඇති හෙයින් මේ පිළිපෙරළිය ද ආදේශ විශෙෂයෙක් මැයි.

(28) ප—කෙණෙර හුරිර යහන් මහණ ඈ, (කෙරෙණ රුහිර හයන් හමණ යි කිවමනා තන්හි) කෙණෙර හුරිර යහන් මහණ යනාදිය; වණපෙරළි, වර්ණවිපර්‍යාස නම් වේ.

වි—සංස්කෘත '**කරෙණු**' ශබ්දයෙන් පිළිපෙරළි ව බිඳී හෙළුබසෙහි '**කෙරෙණ**' කිවමනා තන්හි රකාර ණකාර දෙදෙනාගේ පෙරළීමෙන් **කෙණෙර** කියා වෙයි. වර්ණවිපර්‍යාසයට උදාහරණ ප්‍රස්තාව හෙයින් මෙය පාළි කණෙරු ශබ්දයෙන් බිඳුණේ නො වේ. එසේ වුව පිළිපෙරළියෙහි ම සඞ්ග්‍රහ වන හෙයිනි*. **රුහිර** යන ප්‍රාකෘත ශබ්දප්‍රකෘතිය තත්සමවශයෙන් **රුහිර** යයි කියයුතු තැනැ රකාර හකාර දෙදෙනාගේ විපර්‍යාසයෙන් හෙළුබසට **හුරිර** කියා වෙයි. මෙද වර්ණවිපර්‍යාස යි. පාළි '**සයන**' ශබ්දයෙන් හෝ සංස්කෘත '**ශයන**' ශබ්දයෙන් හෝ තද්භවප්‍රකෘති වශයෙන් හෙළුයෙහි '**සයන්**' කිවමනා තන්හි සකාරයට හකාරාදෙශ වැ '**හයන්**' යන රූපයට පැමිණ ඉක්බිති හකාර යකාර යන්ගේ විපර්‍යාසයෙන් **යහන්** යනු සිද්ධ යි. පාළි '**සමණ**'

* කරෙණු ශබ්දය පාළිභාෂාවේ ප්‍රකෘතියකැ යි සමහරු සලකති. හේ නො මැනවි. එය සංස්කෘතශබ්දප්‍රකෘතියක් ම හෙයිනි.

**රජදත් ඈ පදපෙරළි.** (29)

**"ගතුගතු ද දුදනෝ- සඟකටමැණ සපුන් මෙන්**
**පිරිරැඹැ නිරිඳුමලඳු- පරනට බිය මැ රැකුළෝ"**

**ඈ විබත් පෙරළි.** (30)

---

ශබ්දය හා තත්සමවශයෙන් හෝ සංස්කෘත 'ශ්‍රමණ' ශබ්දයෙන් තද්භවවශයෙන් හෝ හෙළු බසෙහි '**සමණ**' යි කිය යුත්තෙහි සකාරයහට හකාරාදෙශ වැ 'හමණ' යන රූපයට පැමිණ නැවත හකාර මකාර දෙදෙනා විපර්‍ය්‍යාසනවීමෙන් **මහණ** යනු සිද්ධ යි. පිළිපෙරළි නමින් ස්වරයන්ගේ ම විපර්‍ය්‍යාසයට නිදර්ශන දක්වා අනතුරු වැ වර්ණවිපර්‍ය්‍යාසය කී හෙයින් මෙහි වර්ණ ශබ්දයෙන් ස්වරයෝ වාච්‍ය නො වෙති. පාරිශෙෂික න්‍යාය යෙන් තදවශිෂ්ට ව්‍යඤ්ජනාපරනාමධෙය ඇති ගාත්‍රාක්‍ෂරයෝ ම වාච්‍ය වෙත්.

(29) **ප**—රජදත් ඈ, (දත්රජ කිවමනා තන්හි) රජදත් යනාදිය; පදපෙරළි, පදවිපර්‍ය්‍යාස නම් වේ.

වි—රජදත් යනු ශබ්ද දෙකක් එක් වැ එක ශබ්දාකාර වැ සිටි සමාසාන්තයෙකි. '**දත්නට රජ**= **දත් රජ**' යි සම්බන්ධවිභක්ති (=තත්පුරුෂ) සමාසයෙන් වාක්‍ය ගෙන අඞ්ගසූත්‍රය සම්බන්ධ වන්නෙහි '**පෙරපසු**' යනාදි උපාඞ්ගසූත්‍රයෙන් විභක්තිසමාස කළ කල්හි '**දත්රජ**' කියා සිද්ධ යි. ඉක්බිති අඞ්ගසූත්‍ර සාමර්ථ්‍ය යෙන් **දත්** යන පූර්වපදය හා **රජ** යන පරපදයත් දෙක පූර්වපර කොට පදපරිවර්තනය කිරීමෙන් **රජදත්** කියා සිද්ධ යි. මෙය මාගධ සංස්කෘත දෙක්හි අවිශෙෂ වැ ෂෂ්ඨීතත්පුරුෂ සමාස කොට පරනිපාතයෙන් සිද්ධ වූ 'රාජදන්ත' යන්නෙන් හෙළු බසෙහි තද්භව ප්‍රකෘතිවශයෙන් ආයේ ය. මුඛයෙහි උඩුඇන්දේ මැද පිහිටි දෙදත 'රාජදන්ත' නම් වේ.

(30) විභක්ති විපර්‍ය්‍යාසයට උදාහරණ දක්වන්නෝ '**ගතුගතුද**' යනාදි පූර්ව කවිප්‍රයොගය දක්වත්.

**ප**—දුදනෝ, දුර්ජනයෝතුමූ; ගත් උගතු ද, ග්‍රන්ථසඞ්ඛ්‍යාත ශාස්ත්‍රයන් උද්ග්‍රහණය කළාහු ද; සඟකටමැණ, කණ්ඨමාණික්‍ය සහිත වූ; සපුන් මෙන්, සර්පයන් පරිද්දෙන්; නිරිඳුමලඳු, නරෙන්ද්‍ර නමැති මලයජය හෙවත් චන්දනවෘක්‍ෂය; පිරිරැඹැ, පරි රම්භණය කොට; පරනට, අන්‍යයන්ට; බිය මැ, භීතියක් මැ; රැකුළෝ, (ආවහනය) කළෝ.

භා—දුර්ජනයෝ ශාස්ත්‍ර උගත්තාහු නමුත් ගෙළෙහි මිණි ඇති නාග යන් සඳුන්රුක් වෙළාගෙන අනුන්ට බිය එළවන්නා සේ රජුන් ඇසුරු කොට ගෙන ලෝ වැස්සන්ට භය ම එළවූහ.

**තමා වරදස නො දිස්නේ; මොනරිඳු එකල්හි පුල්සලගෑ නවාගනි ඈ කිරිය පෙරළි.** (31)

**සඳදහමින් සඳහෙනි හොත පස්පෙරළි ඈ කරනු.** (32)

---

මෙහි '**දුදනෝ**' යන පෙරවිබත් බුහුබයින් සිටි උපමෙයයා හට සමානාධිකරණ උපමාන වූ **සප්** ශබ්දයා කෙරෙහුදු එම විබත් බස් යෙදුව මනා තැනැ එසේ නො කොට '**සපුන්**' යි කම් විබත් බුහුබස යෙදීම විභක්ති විපර්‍යාසය යි දතයුතු. "**සපුන් මෙන්**" යන්නෙහි '**මෙන්**' යනු විතර්කද්‍යෝතක වූ '**මඤ්ඤ**' යන සංස්කෘත තිඞන්ත ක්‍රියාපදයෙන් හෝ පාලිභාෂාවෙහි '**මඤ්ඤෙ**' යන අව්‍යයපදයෙන් හෝ බිඳී එළුබසෙහි අව්‍යයස්වරූපයෙන් සිටි උපමා වාචක නිපාතයෙකි. මෙ ද උපමාන ශබ්දයෙකින් පරව ම යෙදේ. චිරන්තන සිංහල කවීන්ගේ ප්‍රයොගයෙහි මෙබඳු උපමාද්‍යෝතක අව්‍යය යෙදුව මනා තැන බෙහෙවින් ම උපමානයා කෙරෙන් ප්‍රථමාර්ථයෙහි කර්මවිභක්ති ප්‍රයොගය දක්නා ලැබේ. මෙවැන්නක් පරව්‍යාකරණයන්හි නො පැනෙතුදු සිංහල වෛයාකරණයන්ට අභිමත බැව් මේ විභක්ති විපර්‍යාස ප්‍රස්තාවයෙහි දැක්වූ නිදර්ශනයෙන් හැඟේ.

(31) ප—තමා වරද, ආත්මීය අපරාධය; හෙවත් ස්වකීය දෝෂය; අස, ලේශයකුදු; නො දිස්නේ, නො දක්නේ ය. (යන්නෙහි ද)—

මොනරිඳු, මයුරෙන්ද්‍රය; එකල්හි, ඒ (සන්ධ්‍යා) කාලයෙහි; පුල් සලගෑ, ඵුල්ලශාල (වෘක්ෂා)ග්‍රයෙහි; නවාගනි, නිවාසග්‍රහණය කෙරෙහි; හෙවත් නවාතැන් ගනී; ඈ, (මේ) ආදිය; කිරිය පෙරළි, ක්‍රියා විපර්‍යාස නම් වේ.

වි- මෙහි '**නො දිස්නේ**' යි වර්තමානයෙහි අනාගත ක්‍රියාවගේ යෙදීම ද '**නවාගනි**' යන්නෙහි විධික්‍රියාර්ථයෙහි වර්තමාන සාමාන්‍ය ක්‍රියාවගේ යෙදීම ද කළ හෙයින් ක්‍රියාවිපර්‍යාසය යි දක්වනලදි. පුරාතන ව්‍යාඛ්‍යානයෙහි මෙහි ව්‍යුත්පත්තිය ප්‍රකාශිත පරිදි මෙසේ යි.

"**දිස**- නැරඹීමෙහි" යන ධාතුහු කෙරෙන් අනාගතාර්ථ අන්‍ය කාරකෛකවචනයෙහි '**නේ**' ප්‍රත්‍යය කළකල්හි **දිස්නේ** යනු වේ. '**ගහ**-උපදන්හි' යන ධාතුහු කෙරෙන් වර්තමානාර්ථ තශබ්දකාර කෛකවචන **ඉ** ප්‍රත්‍යය වෙයි. හිප්‍රත්‍යය අනියම හෙයින් නො වෙයි. හකාරයහට අඞගසූත්‍රයෙන් නකාරාදෙශ වැ **ගනි** යනු වේ"

(32) ප—සඳදහමින් හොත, ශබ්ද ධර්මයෙන් වේවයි; සඳ හෙනි හොත, ඡන්දොහෙතුයෙන් වේවයි; පස්පෙරළි ඈ කරනු, පඤ්චවිපර්‍යාසාදිය කරව්.

**වැඩි නම් මත්වැඩි: ඇස් ඇල් ඇප් උවාරණ නවාම් මල වල සල සිහිලේහි ඇගි. (33)**

භා—යථොක්ත ධම්පියාටුවාදිය පෙරප්‍රයොගයෙහි ශබ්ද සවභාව වශයෙන් දක්නා ලැබීමෙන් හෝ ඡන්දශ්ශාස්ත්‍රවිධියෙන් (කාව්‍යරචනායෙහි) ප්‍රයොජනවත් වීමෙන් භාෂා කටයුතු යි.

## 5—වෘද්ධිවිධිය.

(33) ප— වැඩි නම්, වෘද්ධි නම්; මත්වැඩි, මාත්‍රාවෘද්ධිය යි; ඇස් ඇල් ඇප් උවාරණ නවාම මල වල සල සිහිලේහි ඇගි, (අස් අල් අප් උවාරණ නවම් මල් වල් සල් සිහිලෙහි කිව මනා තන්හි) ඇස් ඇල් ඇප් උවාරණ නවාම් මල වල සල සිහිලේහි යනාදි ආකාර ඇත්තේ යි.

වි—වෘද්ධිය යනු මාත්‍රාසඞ්ඛ්‍යාත උච්චාරණ කාලවිශෙෂයාගේ වැඩීම ය. නිමෙෂප්‍රමාණ කාලය හෙවත් ඇසිපිය හෙළන පමණ කාලය මාත්‍රා එකකි. මාත්‍රාවකගේ අඩියක් ගාත්‍රාක්ෂරයාගේ කාලය යි. මාත්‍රා එකක් ලඝුවර්ණයාගේ කාලය යි. මාත්‍රා දෙකක් ගුරුවර්ණයාගේ කාලය යි. තුන් මාත්‍රාවක් ප්ලුතයාගේ කාලය යි*. යම් වර්ණයෙක් මෙසේ තමහට නියත වූ කාලප්‍රමාණය ඉක්මවා කියනු ලැබේ ද හේ මාත්‍රාවශයෙන් වැඩීමට පැමිණියේ වෙයි, එසේ වැඩීම ද මාත්‍රාංශවෘද්ධිය, මාත්‍රාවෘද්ධිය හෙවත් මාත්‍රාවකගේ කොටසක් වැඩීම ය, පුරමාත්‍රාවක් වැඩීම ය කියා දෙපරිද්දෙකි. එයින් ඇස් ඇල් ඇප් යනු මාත්‍රාංශවෘද්ධියට උදාහරණ යි. අස් අල් අප් කියා සිටි කල්හි අකාරයහට මාත්‍රාංශයක් වැඩීමෙන් 'ඇස් ඇල් ඇප්' කියා වෙයි. උවාරණ නවාම් මල වල සල සිහිලේහි යනු සම්පූර්ණ මාත්‍රාවකගේ වෘද්ධියට උදාහරණ යි. 'උවරණ නවම් මල් වල් සල් සිහිලෙහි' යි තුබූ තන්හි සම්පූර්ණ මාත්‍රාවක් වැඩීමෙන් 'උවාරණ නවාම් මල වල සල සිහිලේහි' කියා වෙයි. මල් වල් සල් යන තන්හි අඩමාත්‍ර හල්වර්ණ වූ සිටි ලකාරයන්ට එකමාත්‍ර වූ අකාරයක් යුක්ත කිරීමෙන් 'මල වල සල' යි සිද්ධ යි†. සිහිලෙහි යන තන්හි එකමාත්‍ර වූ ලකාරයේ එකාරයහට ද්විමාත්‍ර වූ ඒකාරයක් කිරීමෙන් 'සිහිලේහි' යි සිද්ධ යි.

* ප්ලුතය උච්චාරණයෙහි මුත් ලිපියෙහි විශෙෂ ඇත්තේ නො වේ.

† මෙහි ලකාරයන් සස්වර වූ කලැ ඔවුන්ගේ පෙර තුබූ අර්ධමාත්‍රාව සඞ්ඛ්‍යාවට නො ගැනේ. එම සස්වර වූ ව්‍යඤ්ජනයා හ්‍රස්ව වර්ණය යි ගැන්මෙන් එකමාත්‍ර ම වෙයි. මල් වල් සල් කිව ද මල වල සල කිව ද මාත්‍රා ගණයෙක, මාත්‍රාවෘද්ධියක් කොහිදැයි එක්ලෙසකින් ප්‍රශ්න කළ හැකි වේ.

**අඩු නම් මත්අඩු: දඟ සැඬ කඳ බඹු සෙගුණෙන් නුවණ නිසයුරු ඇගි.** (34)

---

ඇස්, නෙත්‍ර ය; ඇල්, සිහිලස හෝ ශාලි ධාන්‍ය ය; ඇප්, අස්මද් ශබ්දවාච්‍යයෝ ය; උච්චාරණ, උපකරණ ය; නවාම්, නවකම් ය; මල වල සල සිහිලේහි, පුෂ්පයෙන් ආකීර්ණ ශාල (වෘක්‍ෂ) යන්ගේ ශීතවර්‍ජායායෙහි ය යනු අර්‍ථ යි.

---

## 16—මාත්‍රාහානිවිධිය.

(34) **ප**—අඩු නම්, හානිය නම්; මත්අඩු, මාත්‍රාහානිය යි; දඟ සැඬ කඳ බඹු සෙගුණෙන් නුවණනිසයුරා ඇගි, (දංග සැණ්ඩ කන්ද බම්බු සේගුණෙන් නුවණනීසයුරු යයි කිව මනා තන්හි) දඟ සැඬ කඳ බඹු සෙගුණෙන් නුවණනිසයුරු යනාදි ආකාර ඇත්තේ යි.

**වි**—හානිය යනු මාත්‍රා සංඛ්‍යාත උච්චාරණකාලයාගේ අඩු බව ය; අර්‍ධමාත්‍ර ඒකමාත්‍රාදීන් නියමිතකාලයක් ප්‍රමාණ කොට සිටි යම් වර්‍ණයෙක් ඊට අඩු මාත්‍රාවෙකින් කියනු ලැබේ ද, හේ මාත්‍රාහානියට පැමිණුණේ වේ. අඩු වීම ද මාත්‍රාංශහානි මාත්‍රා හානි වශයෙන් ද්විවිධ යි. **ජංඝා** යන මාගධ සංස්කෘත දෙකට සමාන වූ ශබ්ද ප්‍රකෘතිය එළුබසට '**දංග**' කියා තත්භව වෙයි. මෙහි අර්‍ධමාත්‍ර වැ සිටි බිඳුහට මාත්‍රාංශහානිය කිරිමෙන් '**දඟ**' කියා සිද්ධ යි. මෙසේ ම මාගධ සංස්කෘත '**චණ්ඩ**' ශබ්දයෙන් **සැණ්ඩ** කියා ද, මාගධ '**ඛන්ධ-ඛන්ද**' ශබ්දද්වයෙන් හෝ සංස්කෘත '**ස්කන්ධ-ස්කන්ද**' ශබ්දද්වයෙන් හෝ **කන්ද** කියා ද, '**බ්‍රහ්ම**' ශබ්දයෙන් '**බම්බු**' කියා ද, තද්භව වන කල්හි ණකාර නකාර මිකාර යන්ගේ අර්‍ධමාත්‍ර ප්‍රමාණ වූ කාලය අඩු බවට පැමිණවීමෙන් මාත්‍රාංශහානිය කොට '**සැඬ කඳ බඹු**' කියා සිද්ධ යි. මේ ශබ්ද ධර්මයෙන් වූ මාත්‍රාහානිය යි. **ජේෂ්ඨශබ්දාදියෙන් බිඳී** ඒකාරාන්ත ප්‍රකෘති ව සිටි '**සේ**' ශබ්දය ගුණශබ්දය හා සමාසයෙන් **ඒකශබ්ද** කාර වැ '**සේගුණෙන්**' කියා සිටි කල්හි ඡන්දෝහෙතුයෙන් ඒකාර යාගේ එක්මාත්‍රාවක් අඩු වැ '**සෙගුණෙන්**' කියා වෙයි. '**නුවණ නිසයුරු**' යන්නෙහි නදීවාචක නි ශබ්දයහට මාත්‍රාහානි

---

මෙහි මාත්‍රාවෘද්ධි කිරීමෙන් වූ විශෙෂය ගුරු ලඝු විසින් ගණවිසින් සලකන කල්හි පෙනේ. 'මල් වල් සල්' කිව ගුරු තුනෙකි, ගණවිසින් එක් මගණයෙක් වේ. වෘද්ධි කළ පසු 'මල වල සල' යි ලඝුෂට්කයක් වන හෙයින් නගණ දෙකෙක් වේ. මේ එහි වෙනස යි.

**පියවි නිසා හොත නොනිසා හොත කෙළේ නිපා නම්: ගුරුළුගෝමි සඳගෝමි රතැසිපා ගොස් ඈගි.** (35)

---

කිරීමෙන් '**නුවණනිසයුරා**' යි මුවදෙව්දාසාවෙහි ජනෛරක්ෂණය සඳහා කියනලදි.

'**දහ**' ජංඝාය හෙවත් කකුල ය. '**සැඩ**' තීව්‍ර වූයේ හෝ ඉතා කිපෙන සුලු වූයේ ය. '**කඳ**' සකන්ද කුමාර, වෘක්ෂකාණ්ඩ, සමූහ, ශරීර යනාදීහු ය. '**සෙගුණෙන්**' ශ්‍රේෂ්ඨගුණයෙන් හෝ සෙව්‍ය වූ ගුණයෙනි. නුවණනිසයුරා යනු, (මාත්‍රාභාතිපක්ෂයෙහි) ඥාන නමැති නදීන්ට සාගරය වැනි වූ යන අර්‍ථ යි. ශ්ලෙෂහෙයින් මාත්‍රාභාතියක් නුවූ සේ සලකන පක්ෂයෙහි නුවණනි, ඥානයෙන්; සයුරා, සාගරය වැනි වූ; යන අර්‍ථ යි.

---

## 17—නිපාතවිධිය.

(35) **ප**—පියවි නිසා හොත, ප්‍රකෘතියක් ආශ්‍රය කොට හෝ; නොනිසා හොත, ආශ්‍රය නො කොට හෝ; කෙළේ, කරනලද්දේ; නිපා නම්, නිපාත නමි. ගුරුළුගෝමි සඳගෝමි රතැසිපා ගොස් ඈගි; ගුරුළුගෝමි සඳගෝමි රතැසිපා ගොස් යනාදි ආකාර ඇත්තේ යි.

**වි**—ධාතුප්‍රකෘති ශබ්දප්‍රකෘතීන් අතුරෙන් යම්කිසි ප්‍රකෘතියක් ඇසුරු කොට හෝ නො කොට හෝ අවශිෂ්ට ව්‍යාකරණ විධියකින් නො සිද්ධවන යම් පදසිද්ධියක් වේ ද එය නිපාත නම්*. ධම්ප්‍රදීපිකාදි ප්‍රශස්ත ග්‍රන්ථකාර ගරුඩාචාර්‍ය්‍යයන්ට හෙළුබසින් ගුරුළු යයි කියයුතුතැන '**ගෝමි**' යන්නක් පරනිපාත† කොට '**ගුරුළු ගෝමි**' යයි කියනු ලැබේ. පිදිය යුතු යන අර්‍ථය එයින් සලකනු ලැබේ. චාන්ද්‍රව්‍යාකරණ නම් සංස්කෘතව්‍යාකරණයාගේ කර්තෘභූත චන්ද්‍රාචාර්‍ය්‍යයන්ට හෙළුබසින් '**සඳ**' යයි කිය යුතු තැන පූජ්‍යාර්‍ථයෙහි '**ගෝමි**' යන්නක් නිපාත කොට සඳගෝමි යයි කියනු ලැබේ. '**රතැසි**' නම් ආචාර්‍ය්‍යයාහට පූජ්‍යාර්‍ථ වූ '**පා**' යන්නක් පරනිපාත කොට '**රතැසිපා**' යයි කියනු ලැබේ. රතැසිපා යනු ද ගුරුළුගෝමීන්ට ම නමෙකැ යි සලකමු. '**ගොස්**' යනු ප්‍රකෘතියක් ඇසුරු නො කොට නිපතිත වූ ආදරාර්‍ථ ශබ්දයෙකි.

දක්වනලද උදාහරණයන්හි '**ගුරුළු සඳ රතැසි**' යන ප්‍රකෘතීන් ආශ්‍රය කොට '**ගෝමි, පා**' ශබ්දයන් පරනිපාත වන බැව් කියනලදි. '**ගෝමි**' යනු සංස්කෘතභාෂායෙහි '**ගොමින්**' ශබ්දයෙන් "**බෞද්ධ මහොපාසක**" යන පූජ්‍යාර්‍ථය සලකා නකාරය

---

* නිපාත, නිපාත්‍ය, නිපාතන, යන ශබ්දත්‍රය ම සමානාර්‍ථ යි. නිපාත නාමය අව්‍යයන් කෙරෙහි ද වැටේ.

† පරනිපාත නම් ප්‍රකෘතියෙන් පර කොට හෙළීම යි.

හැර තද්භව කොට ගත් ශබ්දයෙකි. “මහොපාසකගොමිනෞ” යනු මෙදිනිකොශ යි. ‘පා’ යනු පාලිභාෂායෙහි අත්‍යන්තාදරාර්ථයෙහි ‘ථෙරපාද– ආචරියපාද’ යනාදි තන්හි ව්‍යවහාර වූ පාද ශබ්දයෙන් බිඳී ආ ශබ්දයෙකි. චිරන්තන ව්‍යාඛ්‍යායෙහි ද: “පූජ්‍යාර්ථයෙහි අඞ්ගසූත්‍රයෙන් ‘ගෝමි’ කියා ද ‘පා’ කියා ද නිපාත කොට ගුරුළුගෝමි යනාදිය දතයුතු යි. පූජ්‍ය වූ ගරුඬ නම් ආචාර්‍ය්‍ය තෙම යන අර්ථ යි. රතැසිපා යනු ද මෙම අර්ථ යි” යනු කියන ලදි. මෙහි ‘**රතැසිපා** යනු ද මෙම අර්ථ යි’ කීමෙන් **පා** ශබ්දය ද පූජ්‍යාර්ථ බැව් ප්‍රකාශිත යි.

---

## 18—නියමවිධිය.

(36) **ප**—දමෝරා ඈ, දමෝරා යනාදිය; නියම්විධි, නියම විධි නම්.

**වි**—‘**දම උදරෙහි මොහට**’ යන වාක්‍යයෙහි අන්‍යාර්ථසමාසයෙන් එකශබ්දාකාර වැ ‘**දම + උදර**’ කියා සිටි කල්හි **උදර** ශබ්දයහට ‘**සඳරූක්**’ යනාදීන් ‘**ඕර**’ යන ආදෙශය කිරීමෙන් **දමෝර** කියා වෙයි. ඔහු කෙරෙන් ප්‍රථමෙකවචන **ආ** විභක්තිය යෙදීමෙන් ‘**දමෝරා**’ යනු සිද්ධ යි. ‘**දමුදරා**’ යී සිද්ධකටයුත්තෙහි එසේ නො කොට ‘**දමෝරා**’ යී නිත්‍යයෙන් කීම නියමවිධි නම් වේ*.

‘**දමෝරා**’ යනු විෂ්ණුහට නමෙකි. ඉතිහාසකථාවශයෙන් නන්දගොපයාගේ භාර්‍ය්‍යා වූ යශොදා නම් ගොපිය විසින් ඇවිදීම වළක්වනු පිණිස ළඳරු වූ විෂ්ණුහුගේ උදරයෙහි දාමයක් කළ හෙයින් උදරයෙහි දාමයක් ඇති යන අර්ථයෙන් මේ නාමය විෂ්ණුහට ව්‍යවහාර වූ බැව් කියත්. මෙය සංස්කෘත ‘**දාමොදර**’ ශබ්දයෙන් බිඳී ආයේ ය. ‘**දාම උදරෙ යස්‍යාසෞ දාමොදරඃ**’ යනු එහි ව්‍යධිකරණබහුව්‍රීහිසමාසනිර්වචන යි. නියමවිධි නම් වූ මේ ව්‍යාකරණ විධියෙහි එක ලෙසකින් මුත් අනික් ලෙසකින් සිදු නො වන සියලු පදසිද්ධි සඞ්ග්‍රහ වෙයි. ඒ මෙසේ යි. ‘**විදුරු + අවියේ**’, ‘**සඳ + එව්**’ යන දෙතැන සන්ධි කිරීමෙහි පූර්වස්වරලොපය නියම කරනලදි. එහෙයින් ‘**විදුරවියේ**’, ‘**සඳෙව්**’ කියා ම සන්ධි වේ. එසේ මුත් පරස්වරලොප සන්ධිවශයෙන් ‘**විදුරුවියේ**’, ‘**සඳව්**’ යී සන්ධි නො වේ. මෙසේ එකලෙසකින් ම (=නිත්‍යයෙන්) සිද්ධකට යුත්තේ නියමවිධි නමැ යි දතයුතු.

---

* මාගධ සංස්කෘත ශබ්දප්‍රකෘතීන් සම්බන්ධ තත්සම තද්භව ශබ්දවශයෙන් සිංහල භාෂායෙහි දාමෝදර, දමුදර, දමෝදර යන ශබ්දරූප ද ඇසේ.

**කිසිසඳවිබත් ඈ අනියම්විදි. (37)**

**සියරූ නො හළ සුදඅත් පඬුඈඹුල් ඈ අවිබත් අවියසඳ ඈ අවිදුමන්විදි. (38)**

**ඉති විසිවැදෑරුම් වියරණවිදි නිමි.**

**සව් පදන් සිදුසේ සලකනු. (39)**

---

## 19—අනියමවිධිය.

(37) **ප**—කිසිසඳවිබත් ඈ, කිසි සන්ධි විභක්ති ආදියක්; අනියම්විදි, අනියමවිධි නම්.

**භා**—සමහර සන්ධි විභක්ති ආදිය විකල්පවශයෙන් (-අනිත්‍යයෙන්) නොයෙක් ලෙස සිඬ වන හෙයින් අනියම්විධි නම්.

---

## 20—අවිද්‍යමානවිධිය.

(38) **ප**—සියරූ නො හළ, (විභක්ත්‍යාශ්‍රය කොට) ස්වකීය රූපය වර්ජිත නො කළා වූ ශබ්දය; සුදඅත් පඬුඈඹුල් ඈ, සුද අත් පඬුඈඹුල් යනාදි (විසන්ධිරූපයෙන් සිටි) ශබ්දය; අවිබත්, අවිභක්තික ශබ්දය; අවියසඳ ඈ, අව්‍යයශබ්දය යනාදිය; අවිදුමන් විදි, අවිද්‍යමානවිධි නම්.

**භා**—පෙරවිබත් කම්විබත් ආදීන්ගේ එකවචන බහුවචන දෙක්හි ම විභක්තිප්‍රත්‍යය යොගයක් නිසා ප්‍රකෘතිරූපය නො හැර ස්වකීයරූපයෙන් සිටිනා ශබ්ද ද*, සුදඅත් පඬුඈඹුල් යනාදීන් පද මධ්‍යයෙහි සන්ධි විය යුතු තැනැ සන්ධි නොව භින්නරූපයෙන් සිටිනා සමාසශබ්ද ද, නිති, අනුබඳ, යනාදි ලිඞ්ගමුක්ත අවිභක්තික ශබ්ද ද, උපසර්ග නිපාත වශයෙන් දෙවැදෑරුම් වූ අව්‍යය ශබ්ද දැයි මේ ආදිය සාමාන්‍යවිධියෙහි නො පවත්නා විශෙෂක්‍රම හෙයින් අවිද්‍යමාන විධි නම් වේ.

**වි**—චිරන්තනව්‍යාඛ්‍යානයෙහි: "ශුද්ධාන්ත ශබ්දයහට හකාරාගම හෝ ස්වරලොප හෝ කොට සුදහන් කියා හෝ සුදන් කියා හෝ කිවමනා තැනැ ඒ නො කොට භින්නරූපයෙන් සුදඅත් කියා ම නිපද වූ හෙයින් අවිද්‍යමානවිධි නම් වේ. සුදඅත් නම් අන්තඃපුරය යි. ඇඹුල්ශබ්දයෙන් පලස් කියති. ස්වරලොපය කොට පඬැඹුල් කියා නො හදළ හෙයින් අවිද්‍යමානවිධි නම් වේ. පඬුඇඹුල් නම් පාණ්ඩුකම්බලශිලාසනය යි" යනු කියනලදි.

(39) **ප**—ඉති, මෙසේ; විසිවැදෑරුම්, විංශතිවිධ වූ; වියරණ විදි, ව්‍යාකරණවිධිය; නිමි, අවසිත යි. සව්, සියලු (විංශතිවිධ

---

* සිංහලභාෂායෙහි විභක්තිකරණයෙන් නො වෙනස්රූප ඇති වැ ප්‍රකෘතිරූපයෙන් සිටිනා පදයෝ කාව්‍යරචනායෙහි ඉතා බහුල වෙති. එහෙයින් ශ්ලෙෂකාව්‍යාදිය අතිශයින් දුර්බොධ වැ සිටී,

**දූ දැව් ගුණ කිරිය- සන් වී සදන් පස්බේ**
**අනුරුත් අරුණු වෙසෙසින්- විමසා දෙබේ හා දන්.** (40)

**බුන්අරුත්හි නියසදදෙදෙනා නො බිඳැ පවත්වන්නි දූ නම්: සුර නර ගොන් ඈ.** (41)

---

ව්‍යාකරණ විධිය); පදන්, අඞ්ගසූත්‍රයෙන්; සිදුසේ, සිද්ධ වූ පරිද්දෙන්; සලකනු, සංලක්ෂණය කරනු†.

ව්‍යාකරණවිධිනිර්දේශයාගේ කෙලවර ද සර්වත්‍රව්‍යාපි වූ අඞ්ග සූත්‍රානුසමරණය කිරීම්වශයෙන් මෙය කීහ.

---

## ජාත්‍යාදිපඤ්චකය හා අන්වර්ථාදි ද්විකය.

භාෂායෙහි සියලු ශබ්දයන් පඤ්චවිධ ද ද්විවිධ ද කොට දක්වන්නෝ '**දූ දැව්**' යනාදි කව කීහු.

(40) **ප**—දූ, ජාතිශබ්දය; දැව්, ද්‍රව්‍යශබ්දය; ගුණ, ගුණශබ්දය; කිරිය, ක්‍රියාශබ්දය; සන් වී, සංඥාශබ්දය යි කියා; සදන්, ශබ්දයන්ගේ; පස්බේ, පඤ්චභෙදය ද; අනුරුත්, අන්වර්ථශබ්දය; අරුණු, ආරූඪ ශබ්දය යන; වෙසෙසින්, විශෙෂයෙන්; දෙබේ හා, ද්විභෙදය ද; විමසා, විමංසනය කොට; දන්, ජානනය කරනු.

**භා**—ජාතිශබ්දය ද්‍රව්‍යශබ්දය ගුණශබ්දය ක්‍රියාශබ්දය සංඥාශබ්දය කියා සියලු ශබ්දයන් සම්බන්ධ වැ පවත්නා පස්වැදෑරුම් ප්‍රභෙදයන් ද, අන්වර්ථශබ්දය ආරූඪශබ්දය කියා නැවතත් ඒ සියලු ශබ්දයන් සම්බන්ධ වූ දෙවැදෑරුම් ප්‍රභෙදයන් ද නුවණින් සලකා දතගන්නේ ය.

---

## ජාතිශබ්දය.

(41) **ප**—බුන්අරුත්හි, භින්න වූ පදාර්ථයෙහි; නියසද දෙදෙනා, ඥාතශබ්ද දෙදෙනා; නො බිඳැ, අභින්න කොට; පවත්වන්නී, ප්‍රවර්තනය කරන්නී; දූ නම්, ජාති නමු; සුර නර ගොන් ඈ, සුර නර ගොන් යනාදිය යි.

**වි**—සුරශබ්දයෙන් දෙවියෝ කියනු ලැබෙති. ඔවුන්ගේ නානාප්‍රකාර නාම ගොත්‍ර ලක්ෂණ ශරීරාකාර උත්තම මධ්‍යම අධමාදි ප්‍රභෙදයෙන් එකෙකි දෙවියෙක් අනික් අනික් දෙවියකු හා අසමාන වෙයි; භින්න වෙයි. නරශබ්දයෙන් මනුෂ්‍යයෝ

---

† 'ප්‍රධාන' ශබ්දය ප්‍රභව කොට නකාරාන්ත වැ සිද්ධ වූ 'පදන්' ශබ්දය ප්‍රධානාර්ථවාචක යි. එයින් අඞ්ගසූත්‍රය ප්‍රකාශ වන බැව් සිදතෙහි "**මෙහි පදනුවග දැනැ**" යනාදි කවෙන් දතයුතු. "**සව්පදන්**" යනාදි මේ වාක්‍යය පුරාතන ව්‍යාඛ්‍යායෙහි නැතත් පෙළපොත්හි පැනෙන හෙයින් ද ප්‍රකරණොචිත හෙයින් ද පූර්වපාඨයෙක් මැ යි සලකනු ලැබේ.

කියනු ලැබෙති. ඔවුන්ගේ ද නානාප්‍රකාර නාම ගොත්‍ර ලක්‍ෂණ ශරීරාකාර උත්තම මධ්‍යම අධමාදි ප්‍රභෙදයෙන් එකෙකි මනුෂ්‍ය යෙක් අනිකකු හා සමාන නො වෙයි; භින්න වෙයි. ගොන් ශබ්දයෙන් ගෙරිහු වාච්‍ය වෙති. ඔවුහු ද එසේ ම නානාවිධ භෙදයෙන් එකකු හා අනිකෙක් සමාන නො වෙයි; භින්න වෙයි. ආදිශබ්දයෙන් දක්වූ මෘග පක්‍ෂි ආදිහු ද එසේ ම භෙදභින්නයෝ වෙත්. මෙසේ එකකු හා අනිකකු අසමාන වැ භින්න වැ (=වෙන් වැ) පවත්නා කල ඔවුන්ගේ ඒ ප්‍රභෙදයන් කල්පනා නො කොට යම් එක් ශබ්දයෙකින් ඔවුන් බොහෝ දෙනා එක් වැනි කොට කියනුලැබෙත් නම් ඒ ජාතිශබ්ද නම් වෙයි. නොයෙක් ආකාර පැවතුම් ඇතත් භේ නො සලකා එකාකාර කොට ශබ්දයෙකින් ව්‍යවහාර කිරීම ජාතිවශයෙන් සිද්ධ යි. එහෙයින් මෙසේ වෙන් වෙන් වැ පැවති පදර්‍ථයෙහි නො වෙන් වූ දෙයක මෙන් බුද්ධිය ද ධ්වනිය ද පවත්වන්නී ජාති නමැ යි සේයි*.

---

## ද්‍රව්‍යශබ්දය.

(42) ප—ගුණඈනට, ගුණාදීන්ට; අදර වූයේ, ආධාර වූයේ; දැව් නම්, ද්‍රව්‍ය නම්. වැඹ කුඹු ඈ, වැඹ කුඹු යනාදි (ශබ්ද) යි. වැඹ, ස්තම්භය; කුඹු, කුම්භය යන අර්‍ථ යි.

වි—ගුණාදීන්ට ආධාර වූයේ ද්‍රව්‍යය යි. වැම් කළ ආදිය ඊට උදාහරණ යි. ගුණය ආදි කොට කී හෙයින් ගුණ ක්‍රියා සංඥා යන ත්‍රිභෙදයෙහි ශබ්දයන්ට ද්‍රව්‍යය ආධාර බැව් කියනලද්දේ වේ. මෙහි ජාතිවාචක ශබ්ද සඞ්ග්‍රහ නො කරනලද්දේ නමුත් ඔවුන්ට ද ද්‍රව්‍යය ආධාර වේම ය. එහෙයින් මාගධ වෛයාකරණයෝ "ජාත්‍යාදීනමාධාරො දබ්බං" යී කීහු. ජාත්‍යාදි සතරට ආධාර වූයේ ද්‍රව්‍ය නම් වෙයි යන අර්‍ථ යි. ප්‍රතිරාජපරිවෙණාධිපතීන් විසින් ද්‍රව්‍යශබ්දවර්‍ණනායෙහි ගුණය ප්‍රධාන කරනලද්දේ සෙසු ජාති ක්‍රියාදීන්ට වඩා ගුණය ද්‍රව්‍යාශ්‍රය කරන හෙයිනි. 'සගුණමෙව හි ද්‍රව්‍යමුත්පද්‍යතෙ' යනු තාර්කික මත යි. ගුණයක් සහිතව ම ද්‍රව්‍යය උපදී යනු එහි අර්‍ථ යි. ඝටපටස්තම්භකුම්භාදි

---

* සුරශබ්දයෙන් සියලු ප්‍රභෙද ඇති දෙවියෝ ද, නරශබ්දයෙන් සියලු ප්‍රභෙද ඇති මනුෂ්‍යයෝ ද, ගොන්ශබ්දයෙන් සියලු ප්‍රභෙද ඇති ගෙරිහු ද භෙදයක් නැති සේ වාච්‍ය වෙති. මොහු සුරශබ්දයෙන් නරශබ්දයෙන් ගොන් ශබ්දයෙන් කියනුලබත්තෝය යි දැනගන්නා බුඹිය ද ඒ ඒ ශබ්ද හා සමඟ ම පවත්නී ය.

**දූව් ඇසුරු පෙරළෙනසුලු වී ගුණ නම්:**
**කළු හෙළ නැඹුළු ඈ. (43)**

**කිරියලකුණු වියනලද මැ යි. එහි බේ මෙතැන්හි නොසැ බැහැව්නී බැවින් කිරියඅදියරැ පවස්නමෝ. (44)**

---

ද්‍රව්‍යයෝ ගුරු බර කඨින මෘදු ස්ථිර සථූලතාදි ගුණයක් ඇතිව ම උපදිති. එහෙයින් ගුණය ද්‍රව්‍යයාගේ අඞ්ගවශයෙන් ප්‍රධානත්‍ව යෙන් මෙතැන්හි අඞ්ගීකෘත යි. 'ඝනමහය' කී කලැ එය කළු හෝ සුදු හෝ අන් කිසි පැහැ ඇත්තක් හෝ වෙයි; සුළු හෝ මහත් හෝ වට හෝ තුනැස් සිවුරැස් ආදි වූ හෝ සටහන් ඇත්තේ වෙයි. මෙකී සියල්ල ම ගුණශබ්දවාචක විශෙෂහෙයින් ඒ සියලු ගුණයන්ට විශෙෂ්‍ය වැ සිටි 'ඝනමහය' ආධාර වෙයි. එසේ ම හිඳුවීම්, ඉදිරීම්, ඉසිලීම්, ආදි ක්‍රියාවන්ට ද "ශාශඝනමහ ශිලාඝනමහ" යනාදි නාමයන්ට ද එය ම ආධාර වේ. ජාති වාචකශබ්දයන්ට ආධාර වනු කෙසේ දැයි යතහොත්? කුර, අං, නඟුට, තැල්ල ආදීන් යුත් සතර පා ඇති ශරීර පිණ්ඩය 'ගො' යන ජාතිශබ්දයෙන් වාච්‍ය වේ. ඒ ජාතිශබ්දයට එකී ශරීරපිණ්ඩ සංඛ්‍යාත ද්‍රව්‍යය තෙම ආධාර වෙයි. සුරනරාදි ජාතිශබ්දයන්ට ද මෙසේ ම ද්‍රව්‍යයාගේ ආධාරත්‍වය දතයුතු යි.

---

## ගුණශබ්දය.

(43) ප—දූව්ඇසුරු, ද්‍රව්‍යාශ්‍රිත (වැ); පෙරළෙනසුලු වී, පරිවර්තනශීලි වූයේ; ගුණ නම්, ගුණ නම්; කළු හෙළ නැඹුළු ඈ, කළු හෙළ නැඹුළු යනාදි (ශබ්ද) යි. කළු, කෘෂ්ණ ය; හෙළ, ධවල ය; නැඹුළු, මහත් ය යන අර් යි.

භා—ඝටපටාදි ද්‍රව්‍යයක් සමග ම බැඳි පවත්නා කළු සුදු ආදි වූ වර්ණ ද, ලොකු කුඩා ආදි වූ සටහන් ද, ඒ ඒ ද්‍රව්‍යය අනික් අනික් ද්‍රව්‍ය යෙන් වෙසෙසමින් අප්‍රධාන ව පවත්නාහ. එහෙයින් ඒ වර්ණසංස්ථානාදිය ප්‍රකාශ කරන ශබ්දයෝ ගුණශබ්ද නම් වෙත්.

---

## ක්‍රියාශබ්දය.

(44) ප—කිරියලකුණු, ක්‍රියාලක්‍ෂණ; වියනලද මැ යි, (යට) කියන ලද්දේ ම ය; එහි බේ, ඒ ක්‍රියාලක්‍ෂණයෙහි ප්‍රභෙදයන්; මෙතැන්හි, මේ ස්ථානයෙහි; නොසැබැහැව්නී බැවින්, අසම් භාවනීයභාවය හෙතුකොටගෙන; කිරියඅදියරැ, ක්‍රියාධිකාර යෙහි; පවස්නමෝ, ප්‍රකාශකරන්නෙමු.

භා—ක්‍රියාශබ්දයාගේ ලක්‍ෂණ පෙර විංශතිවිධ ව්‍යාකරණවිධි වර්ණනාවසර්ථායෙහි කියනලද්දේ ම ය. ඒ ක්‍රියාලක්‍ෂණයන්ගේ ප්‍රභෙද මෙතැන්හි නො දැක්වුවමනා බැවින් ක්‍රියාධිකාර නම් පරිච්ඡෙදයෙහි මතු කියන්නෙමු. ක්‍රියාධිකාරයෙහිදී විස්තර දක්වන්නෙමු යි සේයි.

**හව්කිරිය අරුත්කිරිය වී කිරියසද දෙවැදූරුම්:- නටනු ගනු වයනු නැවුලි පිරියස්ලි බොදුන් නැමඳුම් ඈ හව්කිරිය සද නම්. දෙන්නේ සේනුයේ ඈ අරුත්කිරියසදනම්.** (45)

## භාවක්‍රියා අර්ථක්‍රියා ශබ්ද.

(45) **ප—හව්කිරිය,** භාවක්‍රියා ය; **අරුත්කිරිය වී,** අර්ථ ක්‍රියා ය කියා; **කිරියසද,** ක්‍රියාශබ්දතෙමේ; **දෙවැදූරුම්,** ද්විවිධ වේ. **නටනු,** (නැටුම් යන අර්ථයෙහි) නටනු ය; **ගනු,** (ගැ‍මය යන අර්ථයෙහි) ගනු ය; **වයනු,** (වැයුම් යන අර්ථයෙහි) වයනු ය; **නැවුලි,** (නැවුම් යන අර්ථයෙහි) නැවුලි ය; **පිරියස්ලි,** (පිරියෙසුම් යන අර්ථ යෙහි) පිරියස්ලි ය; **බොදුන්,** (බොදනු යන අර්ථයෙහි) බොදුන් ය; **නැමඳුම් ඈ,** (නමඳනු හෙවත් වන්‍දනය යන අර්ථයෙහි) නැම ඳුම් ය යනාදිය; **හව්කිරියසද නම්,** භාවක්‍රියාශබ්ද නම්; **දෙන්නේ,** (දානය කරන්නේ යන අර්ථයෙහි) දෙන්නේ ය; **සේනුයේ,** (සුවපත්වන්නේ ය යන අර්ථයෙහි) සේනුයේ ය; **ඈ,** (මේ) ආදිය; **අරුත්කිරියසද නම්,** අර්ථක්‍රියාශබ්ද නම්.

**වි**—ක්‍රියාශබ්දතෙම භාවක්‍රියා ය අර්ථක්‍රියා ය යි ද්විවිධ වේ. එහි භාවක්‍රියා නම් ධාතුහුගේ අර්ථය පමණක් ම පහළ කරන ශබ්ද යි, අර්ථක්‍රියා නම් ධාත්වර්ථය හා යුක්ත වන කාරකාර්ථයක් ද ප්‍රකාශ කරන ශබ්ද යි. **නට**= නැටුම්හි; **ගා**= සදෙහි; **වය**= වැයීමෙහි; **නව**= නැවුම්හි; (පිරි පූර්) **ඉස**= පිරියෙසුම්හි; **බොද**= වැළඳීමෙහි; **නමඳ**= පිණිපාහි; යනාදි ධාතුන්ගේ නැටුම් යනාදි අර්ථයන් ප්‍රකාශ කරන **"නටනු ගනු වයනු නැවුලි පිරියස්ලි බොදුන් නැමඳුම්"** යන මේ ආදි ශබ්දයෝ භාවක්‍රියා ශබ්ද නම් වෙත්. නටනු යන්නෙන් නැටීම ප්‍රකාශ වේ. මෙය 'නට' ධාතුහුගේ අර්ථය යි. ධාතුහුගේ අර්ථය ක්‍රියාවක් ම ය. එහෙයින් ධාත්වර්ථ ප්‍රකාශකශබ්ද භාවක්‍රියාශබ්ද නමැ යි දතයුතු. සෙස්සෙහි ද මෙම නය යි.

'**දා**= දීමෙහි' '**සිව**=සුවෙහි' යන ධාතුන්ගේ අර්ථ 'දීම ය, සුව ය' යන මේ යි. මොවුන්ගේ මෙකී අර්ථයෝ භාවක්‍රියායෙහි අන්තර්ගත වෙති. යම් භාවක්‍රියාවක් කර්තෘහු විසින් කරනු ලැබේ නම් ඒ ක්‍රියාව ද කාරකයා ද එක ම ධාතුවෙන් ප්‍රකාශ කරනු කැමැති කල්හි අඞගඋපාඞගසූත්‍රසාමර්ථ්‍යයෙන් ඊට සුදුසු ප්‍රත්‍යයවක් කිරීමෙන් අර්ථ ක්‍රියා ශබ්දයක් වැ සිද්ධ වේ. ඒ මෙසේ ය : '**දා**' ධාතුහුගේ අර්ථය වූ දීම ද, එය කරන තැනැත්තේ ද '**දෙන්නේ**' යන එක ම අර්ථක්‍රියා පදයෙන් කියනු ලැබෙත්. '**සිව**'ධාතුහුගේ

**කළ පණත සන් නම්:- දෙව්දත් බඹදත් ඈ. (46)**
**හැළි සිඟුවත් දුවන- ගොන් දෙව්දත් නම් වී,**
**මේ පස් සදන් එක- පදරුත්හි විකපන සේ.**
**ඉති පස්බේ. (47)**

---

අර්ථය වූ සුවය ද, එය ලබන තැනැත්තේ හෙවත් සුවපත් වන තැනැත්තේ ද 'සේනුයේ' යන අර්ථක්‍රියාපදයෙන් කියනු ලැබෙත්. මෙසේ ධාතූන් කෙරෙන් ප්‍රත්‍යය වන පරිදි මතු පස රුත් අදියරින් විස්තර සේ දතයුතු.

---

**සංඥාශබ්දය.**

(46) **ප**—කළ පණත, කරනලද ප්‍රඥප්තිය; සන් නම්, සංඥා නම්; දෙව්දත් බඹදත් ඈ, දෙව්දත් බඹදත් යනාදිය යි.

**වි**—මොහුගේ නම මෙසේය යි පණවනලද (=ව්‍යවහාර කරන ලද) යම්කිසි නාමයෙක් සංඥාශබ්ද නම් වේ. ඒ වනාහි පැවැත්ම ය නැවැත්ම ය යන ව්‍යවහාරය සඳහා කරනු ලැබේ. නමක් නැති කලැ අන්කෙනකුන් ක්‍රියායෙහි පවත්වන්ට හෝ ක්‍රියායෙන් වළක්වන්ට හෝ නො හැකි වේ. **'දෙවදත්තය එහි යව'** **'දෙවදත්තය එහි නො යව'** යන වාක්‍ය දෙක්හි දෙවදත්ත නාමය **'යව- නො යව'** යන **'පැවතුම් නැවතුම්'** දෙකට පිටුවහල් වේ. මෙහෙකරුවාට එබඳු නාම ප්‍රඥප්තියක් නො වීනම් ක්‍රියායෙහි යොමුකරවන වාග්ව්‍යවහාරය දුෂ්කර වේ. එබැවින් සචෙතන අචෙතන වස්තූන්ට නම් සඳහා කරනලද පැණවීම් සංඥාශබ්ද නමැ යි දතයුතු. **දෙව්දත් බඹදත්** යනු දෙවදත්ත බ්‍රහ්මදත්ත යන (මාගධ සංස්කෘත භාෂා දෙක්හි සමාන වූ) ශබ්දද්වයෙන් එළුබසට තද්භව වැ ආයේ ය.

දෙවිහු විසින් දෙනලද්දේ දෙව්දත් නම්. බඹහු විසින් දෙන ලද්දේ බඹදත් නම්. මේ දක්වූ නාමයෝ මාතෘ පිතෘ ආදීන් විසින් ස්වකීය පුත්‍රාදීන්ට ප්‍රියසමාදරවශයෙන් කරනු ලබන රූඪි නාමයෝ යි*.

(47) පඤ්චවිධශබ්දයන්ගේ ප්‍රයොග දක්වන්නෝ **'හැළි සිඟුවත්'** යනාදි කව කිහු.

---

* දෙවදත්තාදි නාමයන් උදාහරණවශයෙන් දක්වීම පාණිනීයාදි සංස්කෘත වෛයාකරණයන්ට ද කච්චායනාදි මාගධ වෛයාකරණයන්ට ද අභිමත ය. එහෙයින් ප්‍රතිරාජපරිවෙණාධිපතිහු ද තමන් එළුවියරණට එය ම තද්භව කොට ගෙන දක්වූහ.

**පැන් කැසුබු මියුලැසි ඈ අරුත් ඇරබැ නිපන් බැවින් අනුරුත්සද නම්.** (48)

**සෙලු තෙල්බු මඟුල් ඈ අරුත්විලොම් බැවින් අරුණු සද නම්. ඉති දෙබේ.** (49)

---

**ප**—හැළි, ධවල වූ; සිඟුවත්, ශෘඞ්ගවත් වූ; දුවන, ධාවනය කරන්නා වූ; ගොන්, වෘෂභ තෙම; දෙව්දත් නම් වී, දෙවදත්ත නමැ යි කියා; මේ, මෙකී වාක්‍යය; පස් සදන්, පඤ්චවිධ ශබ්දයන්; එකපදරුත්හි, එකපදාර්ථයෙක්හි ලා; විකපන සේ, විකල්පනය කරන ආකාර යි. පස්බේ, (ශබ්දයන්ගේ) පඤ්චභෙදය; ඉති, මෙසේ යි.

**භා**—එකම වෘෂභසඞ්ඛ්‍යාත පදාර්ථයෙහි ජාත්‍යාදි ශබ්දපඤ්චකය යෙදෙන පරිදි මෙයින් දතයුතු යි.

**වි**—'හැළි' යනු පැහැය ප්‍රකාශ කළ හෙයින් ගුණවාචක යි. **'සිඟුවත්'** යනු අං ඇති යන අර්ථය ප්‍රකාශ කළ හෙයින් ද්‍රව්‍ය වාචක යි. **'දුවන'** යනු ශීඝ්‍රගතිය යි කියනලද ක්‍රියාවක් ප්‍රකාශ කළ හෙයින් ක්‍රියාවාචක යි. **'දෙව්දත්'** යනු පැණවීම් පමණක් හෙයින් සංඥවාචක යි. මේ සතරින් විශෙෂණය කොට දක්වන ලද **'ගොන්'** ශබ්දය ගො ජාතිය ප්‍රකාශ කළ හෙයින් ජාති වාචක යි. හේ මෙහි විශෙෂ්‍යත්වයෙන් අභිමත ය. විවක්‍ෂාවක් ඇති කලැ ද්‍රව්‍යශබ්දාදීන්ගේ ද විශෙෂ්‍යත්වය යෙදේ.

---

## අන්වර්ථාරූඪ විභෙදය.

(48) **ප**—පැන් කැසුබු මියුලැසි ඈ, පැන් කැසුබු මියුලැසි යනාදිය; අරුත් ඇරබැ, අර්ථයක් ආරම්භ කොට; නිපන් බැවින්, නිෂ්පන්න බැවින්; අනුරුත්සද නම්, අන්වර්ථශබ්ද නම්.

(49) **ප**—සෙලු තෙල්බු මඟුල් ඈ, සෙලු තෙල්බු මඟුල් යනාදිය; අරුත්විලොම් බැවින්, අර්ථයට විලොම බැවින්; අරුණු සද නම්, ආරූඪශබ්ද නම්.

**භා**—අර්ථය පවත්නා වස්තුයෙහි ම ඒ අර්ථය ප්‍රකාශ කරන ශබ්දයන් ව්‍යවහාර වේ නම් එය අන්වර්ථශබ්ද නම්, අර්ථයට අවිරුඬ වැ අනුකූල වැ පවත්නා ශබ්දය යන අර් යි.

**වි**—පැන් යනු බොන පැනට නම්. **'පානයකටයුතු'** යනු එහි අර්ථ යි. මේ අර්ථය ඇති පැන් ශබ්දය පියයුතු වූ ජලයට ව්‍යවහාර වේ. එහෙයින් මෙය අර්ථයට අවිරුද්ධ පැවතුම් ඇත්තේ ය. මේ **අන්වර්ථ ශබ්ද නමැ යි දතයුතු. ස්නානාදිය කටයුතු පරිභොග**

ජලයට ද 'පැන්' යනු අභෙදොපචාරවශයෙන් කියනු ලැබේ. එවිට පියයුතු බවක් නැති හෙයින් උපචරිත වැ ව්‍යවහාර වූ ඒ පැන් ශබ්දය අන්වර්ථ නො වේ. පැන් ශබ්දයාගේ සිද්ධිය "පියයුතු යන වාක්‍යයෙහි පා=පීමෙහි යන ධාතුහු කෙරෙන් 'දසින් නෙමෙන්' යනාදි උපාඞග සූත්‍රයෙන් ඇන් ප්‍රත්‍යය කළ කල්හි 'පැන්' යනු වෙයි" කියා පුරාතන ව්‍යාඛ්‍යානයෙහි දක්වනලදි.

'කෑසුබු' යනු කැස්බාට නම්. කච්ඡයෙන් බොනුයේ යන අර්ථ යි. "කච්ඡෙන පිබතීති කච්ඡපඃ" යි පානාර්ථපක්ෂයෙහි චිරන්තනශාබ්දිකයෝ තෘතීයායෙන් වාක්‍ය ගත්හ. සමහරු "කච්ඡෙ පිබති" යි සප්තමියෙන් ද වාක්‍ය ගනිත්. මෙහි කච්ඡ නම් මුඛසම්පුටය යි. පර්වතකච්ඡය නදීකච්ඡය යි ද්විවිධ වූ දෙණිබිමට ද නමෙකි. කච්ඡයෙන් පානය කරන්නාහට කච්ඡප නාමය අර්ථයට සුදුසු වේ. කච්ඡප ශබ්දයෙන් එළුබසට 'කෑසුබු' යි තද්භව වැ ආ කල ද එසේ ම ය.

'මියුලැසි' යනු මුවගනන්ගේ ඇස් බඳු ඇස් ඇති ස්ත්‍රීන්ට නමෙකි. දිගු ඇස් ඇති හෙයින් මාගමුන්ට මේ නාමය අර්ථානුගත වේ. මෙසේ අර්ථයට අනුකූල වූ පැවතුම් ඇති අන් සියලු නාමයනුදු අන්වර්ථශබ්දභෙදයෙහි අන්තර්ගත කොට දත්නේ ය.

'සෙලු' යනු පක්ෂිවිශෙෂයකට නමැ යි කියනලදි. සෙලු යනු නග්නභාවයට ද නම්. සෙල් ඇත්තේ (=වස්ත්‍ර ඇත්තෝ) යන අර්ථය වේ. මේ අර්ථය එනම් ඇති පක්ෂිහු කෙරෙහි හෝ නග්නයා කෙරෙහි හෝ නො පවත්නා හෙයින් මෙය අර්ථයට විලොම වූ (=විරොධ වූ) ශබ්දයෙකි. එබැවින් සෙලු යනු ආරූඪශබ්ද නම් වේ. අර්ථයක් නො සලකා ව්‍යවහාරයට නගා ගත් නාමයෙකැ යි සේයි.

'තෙල්බූ' යනු තෙල්දිනිහට නම්. තෙල්බූ යන්නෙන් තෙල් බොනුයේ යන අර්ථය ද, 'තෙල්දිනි' යන්නෙන් තෙලින් දෙන්නේ (=ජීවත්වන්නේ) යන අර්ථය ද, වාච්‍ය වෙති. එසේ ද වුවත් තෙල්බූ නම් වූ තෙල්දිනිතෙම තෙල් පීමෙන් ජීවත්වන්නෙක් නො වෙයි, තෛලස්පර්ශයෙන් නස්නාසුලු එකෙකි. එහෙයින් මේ 'තෙල්බූ' නාමය ද, මීට පර්‍යාය වූ (=සමානාර්ථ වූ) තෙල් දිනි නාමය ද, අර්ථයට විලොමත්වය ඇත්තේ ආරූඪ නම් වෙත්. තෙල්බූ යන්නට පුරාතනයන් විසින් කියනලද තෙල්දිණි නාමය මෙකල සමහරු තෙල්සින්නන්ට හෙවත් තෙල්කුහුඹුවන්ට නමෙකැ යි සලකති. ඒ වැරදි කල්පනාවකි. තෙල්බූශබ්දයට ප්‍රභව වූ මාගධ 'තෙලපායිකා' ශබ්දය ද සංස්කෘත 'තෛලපායිකා' ශබ්දය ද යන දෙක හා සම වූ 'තෛලපායී' ශබ්දය සකුණි

අදෙස් අගම්විදි- පියවිසබඳහකරන්
වෙසෙසා හැදිනැ සොදනු-උගහා නොදැහැ ඇදුරන්. (50)

---

වාචි බව පුරාතනාචාර්යයන් විසින් කියනලද්දේ ය. තෛලපායිකා ශබ්දය ද ශකුනිවිශෙෂයන් අතුරෙහි කියනලද්දේ ය. ඇතම් ආචාර්යයෙකෙනෙක් කීටවිශෙෂයෙකැයි ද කීහ. ශකුනි විශෙෂයෙක යන වචනයෙන් පියාසර කරන සත්ත්වවර්ගයක් බවත් කීටවිශෙෂයෙක යන වචනයෙන් ක්‍රිමීන්ට වඩා මහත් වූ ක්‍ෂුද්‍ර සත්ත්වවර්ගයක් බවත් ප්‍රකාශවන හෙයින් 'තෙල්බූ' යනු ද 'තෙල් දිති' යනු ද පියාපත් ඇති ක්‍ෂුද්‍ර ජන්තුවිශෙෂයකට (=කැරපොත්තන්ට) නමැ යි දතයුතු.

"පරොෂ්ණී තෛලපායිකා" යනු අමරසිංහාභිධාන යි.

'මඟුල්' යනු කුජග්‍රහයාට නම්. සංස්කෘත මාගධ දෙක්හි සමාන වූ 'මඞ්ගල' ශබ්දයෙන් 'මඟුල්' යී තද්භව වෙයි. මඞ්ගල ශබ්දය ලිඞ්ගත්‍රයෙහි නානාර්ථප්‍රකාශක ශබ්දයෙකි. පුංලිඞ්ගික වූ කලැ කුජවාචක වේ.

මෙදිනීකොෂයෙහි:

"මඞ්ගලා සිතදූර්‍වායාමුමායාං පුංසි භූමිජෙ
නපුංසකන්තු කල්‍යාණෙ සර්‍වාර්ථරක්‍ෂණෙ'පි ච" යී කීහ.

මඞ්ගලනාමය හෙළහීතණෙහි ද උමාව කෙරෙහි ද ස්ත්‍රීලිඞ්ගික ය. කුජ ග්‍රහයා කෙරෙහි පුංලිඞ්ගික ය. ශුභයෙහි ද සර්‍වාර්ථරක්‍ෂණයෙහි ද නපුංසකලිඞ්ගික ය යනු අභිප්‍රාය යි.

මඞ්ගලශබ්දය මෙසේ නානාර්ථ වුව ද 'මගි=මඞ්ගලෙ' යන ධාතුවෙන් සිද්ධ හෙයින් මුඛ්‍යවශයෙන් ශුභාර්ථවාචක ය. මඟුල් යනු ද එයින් භින්න හෙයින් මුඛ්‍යවශයෙන් ශුභාර්ථ ඇත්තේ වේ. කුජග්‍රහ තෙමේ අශුභ වූ (=පාප) ග්‍රහයෙක. අශුභයා කෙරෙහි ශුභාර්ථශබ්දයාගේ ව්‍යවහාරය අර්ථයට විරුද්ධ නු යි. කුජවාචක මඟුල්ශබ්දය ආරූඪශබ්දභෙදයෙහි ලා නිදර්ශන කළහ.

ශබ්දයන්ගේ විභෙදය නිමි.

---

## හකාරවිනිශ්චය.

(50) භාෂායෙහි කිසිශබ්දකෙනකුන් අකාර හකාර දෙදෙනාගේ සඞ්කරත්වයෙන් අශිෂ්ටොච්චාරණයට පැමිණිය හැකි බැවි පැනෙන හෙයින් මේ සංඥාධිකාරයෙහි ම එහි විනිශ්චයට උපදෙස් දක්වන්නෝ "අදෙස් අගම්විදි" යනාදි කව කීහු.

ප—අදෙස්, ආදෙශවිධි (හකාරය); අගම්විදි, ආගමවිධි (හකාරය); පියවිසබඳහකරන්, ප්‍රකෘතිසම්බන්ධහකාරය යන

**සුදු හුදු, විසද විහිද, සිඳි හිඳි, සුදී හුදී, සැමදූ හැමදූ, සැඳිනැ හැඳිනැ, සොබි හොබි, සොබ හොබ, සිඹැ හිඹැ, පිරිසිඹු පිරිහිඹු, සුණමින් හුණමින්, ලසුනු ලුහුනු, පසණ පහණ, සල් හල්, සුල් හුල්, සැල් හැල්, මුසල් මොහොල්, සුසුල් සුහුල්, සිඹුල් හිඹුල්, සැදගිලි හැදගිලි, සැලි හැලි, සතර හතර, සිගුරු, හිගුරු, සූරු හූරු, සූ හූ, සේ හේ, සෝ හෝ, සිම් හිම්, සැමි හැමි, සික්මුම් හික්මුම්, සැම හැම, සව් හව්, සවා හවා, සිවන් හිවන්, සිතු හිතු, සුළු හුළු, සගුළු හගුළු, සිවි හිවි, විසට වුහුට, සටහන් හටහන්, පසන් පහන්, සඳුන් හඳුන්, සින් හින්, සන් හන්, සිස්නා හිස්නා, සිස් හිස්, සස් හස්, සිකු හිකු, සැකි හැකි, සැති හැති, සිගු හිගු, සගු හගු, ඈ සකරම අදෙස්හකරෙන් සිදු පා.** (51)

---

මොවුන්; වෙසෙසා, විශේෂණය කොට; හැඳිනැ, සඤ්ජානනය කොට; ඇදුරන්, ආචාර්යයන්ගේ; උගහා නොදැහැ, උද්ග්‍රහණය නොහැර; යොදනු, යුක්ත කරනු.

භා—ආදේශහකාරය ආගමහකාරය ප්‍රකෘතිහකාරය යන ත්‍රිවිධ හකාරයන් වෙන් වෙන් කොට හැඳින ආචාර්යෝපදේශ උල්ලඞ්ඝනය නො කොට යොදන්නේ ය.

---

## ආදේශහකාරය.

(51) ප—සුදු යන තන්හි හුදු යනු වේ. ශුද්ධ වූ යන අර්ථ යි. විසද යන තන්හි විහිද යනු වේ. විසර්ජනය කොට යන අර්ථ යි. (විසර්ජනය යනු ප්‍රශ්නාර්ථයාගේ ප්‍රකාශකිරීමෙහි ද, දීමෙහි ද, හැරීමෙහි ද වැටේ.) සිඳි යන තන්හි හිඳි යනු වේ. ඡින්න යන අර්ථ යි; හෙවත් සිඳුණු හෝ සිඳිනලද යන අර්ථ යි. සුදී යන තන්හි හුදී යනු වේ. සුධී යන අර්ථ යි. (මනා නුවණ ඇත්තේ සුධී නම්.) සැමදූ යන තන්හි හැමදූ යනු වේ. සම්මාර්ජනය කොට හෙවත් ඇමදලා යන අර්ථ යි. සැඳිනැ යන තන්හි හැඳිනැ යනු වේ. සඤ්ජානනය කොට හෙවත් හැඳිනලා යන අර්ථ යි. සොබි යන තන්හි හොබි යනු වේ. ශොභන වෙයි යන අර්ථ යි. සොබ යන තන්හි හොබ යනු වේ. ශොභා යනාදි අර්ථ යි. සිඹැ යන තන්හි හිඹැ යනු වේ. චුම්බනය කොට හෙවත් ඉඹ යන අර්ථ යි. පිරිසිඹු යන තන්හි පිරිහිඹු යනු වේ. පරිශ්‍රම (=වෙහෙස) යන අර්ථ යි. සුණමින් යන තන්හි හුණමින් යනු වේ. ශ්‍රවණය කරමින් (=අසමින්) යන අර්ථ යි. ලසුනු යන තන්හි ලුහුනු යනු වේ. ලශුන (=ලූනු) යන අර්ථ යි. පසණ යන තන්හි පහණ යනු වේ. පාෂාණ (=කුඩාගල්) යනු යි. සල් යන තන්හි හල් යනු වේ. ශාලවෘක්ෂය, ශාලාය යනු යි. සුල් යන තන්හි හුල් යනු වේ. ශූල (=උල්) යනු යි.

සැල් යන තන්හි හැල් යනු වේ. ශාලිධාන්‍යය යි. මූසල් යන තන්හි මොහොල් යනු වේ. මූෂලය යි. සුසුල් යන තන්හි සුහුල් යනු වේ. සවසෘ (=බුහුනෑණි) යනු යි. සිඹුල් යන තන්හි හිඹුල් යනු වේ. සිම්බලී යනු යි. සැඳහිලි යන තන්හි හැඳහිලි යනු වේ. ශ්‍රද්ධා යනු යි. සැලි යන තන්හි හැලි යනු වේ. ඇලි හෙවත් පර්වතයෙන් බස්නා ජලප්‍රවාහය යනු යි. සකර යන තන්හි හකර යනු වේ. ශර්කරා යනු යි. (උක්සකුරු ද කැටගල් ද ශර්කරා නම්.) සිඟුරු යන තන්හි හිඟුරු යනු වේ. සිඞ්ගිවෙර (=අමුඉඟුරු) යනු යි. සූරු යන තන්හි හූරු යනු වේ. ශූකර යනු යි. සූ යන තන්හි හූ යනු වේ. සූත්‍ර (=හුය) යනු යි. සේ යන තන්හි හේ යනු වේ. සේතු යනු යි– සේතු නම් හේදණ්ඩ යි. සෝ යන තන්හි හෝ යනු වේ. ස්‍රෝතස යනු යි. ජලස්‍රෝතස හෙවත් බැස යන දිය පාර ස්‍රොතස් නම්. (එයින් තද්භව වූ 'හෝ' ශබ්දය කුහරාදී සඞ්ඛ්‍යාත හොයට ද ව්‍යවහාර වේ.) සිම් යන තන්හි හිම් යනුවේ. සීමා යනු යි. සැමි යන තන්හි හැමි යනු වේ. ස්වාමි යනු යි. සික්මුම් යන තන්හි හික්මුම් යනු වේ. (ශික්ෂණ ශබ්දයෙන් හෝ සික්ඛන ශබ්දයෙන් බිඳී ආ හෙයින්) හික්මීම (=ඉගනීම) යනු යි. සැම යන තන්හි හැම යනු වේ. (සර්වනාම සම ශබ්දයෙන් තද්භවහෙයින්) සියලු යනු යි. සව් යන තන්හි හව් යනු වේ. (සබ්බ ශබ්දයෙන් තද්භව හෙයින්) සියලු යනු යි. සවා යන තන්හි හවා යනු වේ. ශාපකොට (ආක්‍රොශ කොට) යන අර්ථ යි. සිවන් යන තන්හි හිවන් යනු වේ. සීවන (=මැහීම) යන අර්ථ යි. සිතු යන තන්හි හිතු යනු වේ. චින්තනය (=සිතීම) යන අර්ථ යි. සුලු යන තන්හි හුලු යනු වේ. සික්ථ යන අර්ථ යි. සික්ථ යනු භක්තපුලකයට (=බත්තුලට) නම්. සගුළු යන තන්හි හගුළු යනු වේ. සඞ්ඝාට යන අර්ථ යි. ගෘහදාරුවිශෙෂයක් වූ දෑවවළල්ල පාලිභාෂායෙන් 'සඞ්ඝාට' යයි ද එළුබසින් සගුළු (හෝ) 'සගළ' යයි ද කියනු ලැබේ. ද්‍රොණී සඞ්ඝාටයට (=අගුළට) ද මෙය නමෙක් වේ. සිටි යන තන්හි හිටි යනු වේ. සික්ථ (=මීඉටි) යන අර්ථ යි. විසට යන තන්හි වුහුට යනු වේ. විසෘෂ්ට (=හරතලද) යන අර්ථ යි. සටහන් යන තන්හි හටහන් යනු වේ. සණ්ඨාන නම් ලකුණ හෝ ආකාරය යි. පසන් යන තන්හි පහන් යනු වේ. ප්‍රසන්න (=පැහැදි) යන අර්ථ යි. සසුන් යන තන්හි හසුන් යනු වේ. ශාසන (=හස්න) යන අර්ථ යි. සින් යන තන්හි හින් යනු වේ. නිසින්න යන අර්ථ යි. උපවෙශනය කෙළේ (=හිඳගත් තැනැත්තේ) නිසින්න නම්. සන් යන තන්හි හන් යනු වේ. ඡන්න යන අර්ථ යි. වැසුණේ හෝ වසනලද්දේ ඡන්න නම්. සිස්නා යන තන්හි හිස්නා යනු වේ. සිඤ්චනය කරන්නා වූ (=දිය

**සිදුහත් ඇස්දහර සැදැහැ සදහම් රජදහන් දහන් ඉදුහු සවහන් මැදහත් අදහස් බහස්ම ඈ අගම්හකරෙන් සිදුපා** (52)

ඉස්නා වූ) යන අර්ථ යි. සිස් යන තන්හි හිස් යනු වේ. සිස (=හිස) යන අර්ථ යි. සස් යන තන්හි හස් යනු වේ. සස්‍ය යන අර්ථ යි. ගොයම සස්‍ය නම්. සිකු යන තන්හි හිකු යනු වේ. සුක්ඛ යන අර්ථ යි. ශුෂ්ක වූයේ (=වියලුණේ) සුක්ඛ නම්. සැකි යන තන්හි හැකි යනු වේ. ශක්‍ය යන අර්ථ යි. සැති යන තන්හි හැති යනු වේ. සතවක (=පොකුර) යන අර්ථ යි. සිගු යන තන්හි හිගු යනු වේ. ශීඝ්‍ර යන අර්ථ යි. සඟු යන තන්හි හඟු යනු වේ. ශෘඞ්ග යන අර්ථ යි. ඈ, මේ ආදිය; සකරට, සකාරයට; අදෙස් හකරෙන්, ආදෙශ වූ හකාරයෙන්; සිදු පා, සිද්ධ වූ පාය යි.

වි—සුදු යනාදි මෙකී උදාහරණ ශබ්දයන්ගේ ප්‍රකෘතිසකාරය ස්ථානිභූත ව සිටිකල එයට හකාරාදෙශ ව ද ව්‍යවහාර වන බැව් මෙයින් දක්වූහ. මෙහි "හැමද හැඳිත හිඹ හුල් හැල් හිඹුල් හැද හිලි හැලි හිඟුරු හුරු හේ හෝ හිම් හැම හුළු හගුළු හිටි" යනාදි කිසි ශබ්දකෙනෙක් හකාරලොපයෙන් පසු සවරාදිව ද කියනු ලැබීම ජේතප්‍රයොගයෙහි පැනේ. හේ මෙහි නො දක්වූවත් අඞ්ග සූත්‍ර සාමර්ථ්‍යයෙන් සිද්ධ විය හැකිහෙයින් 'සැමදා, හැමදා, ඇමදා' කියා තුන්පරිද්දෙකින් ද ශිෂ්ටව්‍යවහාරයෙහි යෙදෙයි දතයුතු.

---

### ආගමහකාරය.

(53) පා—සිදුහත්, සිදුඅත් යන තන්හි සිදුහත් යනු වේ. (සිද්ධත්ථ* ශබ්දයෙන් බිඳුණු හෙයින් අප ගෞතම සර්වඥයන් වහන්සේට ද සම්පයට ද නම්.) ඇස්දගර, ඇස්දර යන තන්හි ඇස්දහර යනු වේ. (අස්සුධාරා ශබ්දයෙන් බිඳුණු හෙයින් කඳුලට නම්.) සැදැහැ, සැදැ යන තන්හි සැදැහැ යනු වේ. (සද්ධා ශබ්දයෙන් බිඳුණු හෙයින් ඇදහීමට නම්.) සදහම්, සදම් යන තන්හි සදහම් යනු වේ. (සද්ධම්ම ශබ්දයෙන් බිඳුණු හෙයින් යහපත් දහමට නම්.) රජදහන්, රජදන් යන තන්හි රජදහන් යනු වේ. (රාජධානි ශබ්දයෙන් බිඳුණු හෙයින් ප්‍රධාන නගරයට නම්.) දහන්, දන් යන තන්හි දහන් යනු වේ. (ඣාන ශබ්දයෙන් හෝ ධ්‍යාන ශබ්දයෙන් බිඳුණු හෙයින් චින්තනයට ද රූපාරූපසමාපත්තිභාවනාවන්ට ද නම්.) ඉදුහු, ඉදු යන තන්හි ඉදුහු යනු වේ. (ඉද්ධි ශබ්දයෙන් බිඳුණු හෙයින් සෘද්ධියට නම්.) සවහන්,

* සිධාර්ථාදි (සංස්කෘත) ශබ්දයන්ට වඩා (මාගධ) සිඬත්ථාදි ශබ්ද බොහෝහෙයින් තද්භවප්‍රකෘතියට ආසන්න වේ.

සටන් යන තන්හි සටහන් යනු වේ. (සණ්ඨාන ශබ්දයෙන් බිඳුණු හෙයින් සංස්ථානයට හෙවත් ආකාරයට= විහනයට නමි.) මැදහත්, මැදත් යන තන්හි මැදහත් යනු වේ. (මජ්ඣත්තශබ්දයෙන් හෝ මධ්‍යස්ථ ශබ්දයෙන් බිඳුණු හෙයින් උපෙක්‍ෂකයාහට නමි.) අදහස්, අදස් යන තන්හි අදහස් යනු වේ. (අජ්ඣාසය යන්නෙන් හෝ අධ්‍යාශය යන්නෙන් බිඳුණු හෙයින් අභිප්‍රායට නමි.) බහස්ම, බස්ම යන තන්හි බහස්ම යනු වේ. (භස්මශබ්දයෙන් බිඳුණු හෙයින් හළුවට නමි.) ඈ, මේ ආදිය; අගම්හකරෙන්, ආගමවිධිහකාරයෙන්; සිදුපා, සිද්‍ධ වූ පාඨ යි.

භා—**සිදුහත්** යනාදීන් දක්වනලද මේ උදාහරණයන්ගේ ප්‍රකෘති රූප වූ සිදුඅත් යනාදියෙහි හකාරයක් නැතත් **සිදු+අත්** යන්නෙහි පරස්වරයා කෙරෙන් පූර්වයෙහි එම ස්වරාක්‍ෂරය ලොප් නො කොට ඔහු ඇසුරු කෙරෙමින් හකාරය පැමිණ **'සිදුහත්'** යි සිඛ වන හෙයින් මේ ආගමහකාර නම් වේ. **ඇස්දර** යනාදීන්ගේ මධ්‍යයෙහි ද ඉදුහු යනාදීන්ගේ අන්තයෙහි ද ස්වර සහිත හකාරාගමය කියනලදි. හකාරයාගේ ආගමයට නිමිත්තක් මෙහි නො කියන ලදුවත් මාගධ සංස්කෘත ශබ්දයන්ගේ මහාප්‍රාණ වූ වර්ග ද්විතීය චතුර්ථාක්‍ෂරයන් අල්පප්‍රාණ වූ වර්ගප්‍රථම තෘතීයාක්‍ෂරයන්ට බිඳී ආ කලැ ඒ අල්පප්‍රාණයා කෙරෙන් පර වැ බොහෝ සෙයින් (ස්වර සහිත) හකාරයක් ආගම වීම සිංහල භාෂායෙහි ද ප්‍රාකෘතානුගත රීතියකි*. ඒ මෙසේ යි- සිඛත්ථ යනු සන්ධිවිශ්ලෙෂයෙහි **'සිද්ධ+අත්ථ'** කියා වෙයි. මෙයින් සිඛ යනු සිදු කියා ද අත්ථ යනු අත් කියා ද සිංහලට බිඳෙයි. දෙක එක් වූ කලැ **'සිදුඅත්'** කියා සිටී. මෙය ස්වරලොපසන්ධියකින් නො ගළපා මහාප්‍රාණධකාරයා අල්පප්‍රාණ දකාරයට පැමිණී තැනක් බැව් හැඟවීම්වශයෙන් දු යන්නෙන් පර වැ හල් හකාරයෙක් ආගම වේ. පර වැ සිටි අකාරය ගාත්‍රාරූඪ කළ කලැ සිදුහත් කියා වෙයි. මෙය අඛහසූත්‍ර සාමර්ථ්‍යයෙන් ම සිඛ යි. සෙස්සෙහිදු මෙම නයින් දතයුතු. මෙහි හකාරාගම දක්වූ කිසි ශබ්දකෙනකුන්ගේ හකාර වියුක්ත පාඨ ද පෙනේ. මුවදෙව්දාවෙහි:-

“රුපුනාඹුවනැස්සඳකැත්- මිණින් මිම් ඇස්දරතෝ”

යන්නෙහි **'ඇස්දර'** යනු හකාරවියුක්ත පාඨ යි. මෙසේ ම ඉදුහු, බහස්ම යනුදු හකාර වියුක්ත ව ද යෙදේ. **සැඳූහැ, දහම්** යනාදි සමහර තන්හි හකාරය අප්‍රයොගවන කලැ ස්වරයාගේ දීර්ඝත්වය වේ. **සැඳූ, දූම** යනාදිවශයෙහි.

“සැඳූලෙන් වරුණදෙව්රද මුහුද විසූ”

“සිටිනා ලියන් දූකැ සිහිකැරැ බණදුම”

යන ශාරිකාසන්දෙශ, කීරසන්දෙශකාව්‍යාදිය එයට නිදශින යි.

* කිසි තැනෙක මහාප්‍රාණය අල්පප්‍රාණයට බිඳී ආ නමුත් හකාරාගම නො වේ. 'සිඛඅත්ත' යන්නෙන් 'සිදුඅත්' යි බිඳී සිදත් කියා සන්ධි වූ හෙයිනි.

**හුරු හොරු හොළු හළු හමළු හැඟි හඬ හුණු හිවි ඈ පියවිපා.** (53)

**අඳුන් ඇඳෑ එරුණු අරුණු අරු අලු අලුත් අද ඉදි ඔද එළු උළු බළු ඇලි අලු ඇවිණි අස්වස් අල එළැඹි අසි ඉක් අසිඳෑ ඈ පණකුරුපා.** (54)

---

### ප්‍රකෘතිහකාරය.

(53) **ප**—හුරු, (උචිතාදි අර්ථයෙහි) හුරු ය; හොරු, (ද්‍රොණී යන අර්ථයෙහි) හොරු ය; හොළු, (දුඃඛාර්ථයෙහි) හොළු ය; හළු, (ත්‍යක්තාර්ථයෙහි) හළු ය; හමළු, (හැමූ හෙවත් වාතාවහනය වූ යන අර්ථයෙහි) හමළු ය; හැඟි, (අභිප්‍රාය යන අර්ථයෙහි) හැඟි ය; හඬ, (ධ්වනිය යන අර්ථයෙහි) හඬ ය; හුණු, (පතිතාර්ථයෙහි) හුණු ය; හිවි, (උච්චාර්ථයෙහි) හිවි ය; ඈ, (මේ) ආදිය; පියවිපා, ප්‍රකෘති (හකාර) පාඨ යි.

**වි**—හුරු හොරු යනාදිය ආදෙශාගමලක්ෂණරහිත වැ ස්වභාවයෙන් ම හකාර සහිත පාඨ හෙයින් ප්‍රකෘතිහකාරපාඨය යි කියනලදි. මෙහිදු ඇතම් ශබ්දයෙක් හකාරය ලොප් වැ ඊට ඇසුරු වැ තුබූ ස්වරය පමණක් ශෙෂව ද කියනු ලැබේ. **හොරු** ශබ්දය **ඔරු** කියා ද හැඟි ශබ්දය **ඇඟි** කියා ද හඬ ශබ්දය **අඬ** කියා ද ව්‍යවහාර වන සේ යි.

---

මෙසේ ත්‍රිභෙද වූ හකාරය කිසිතැනෙක්හි ස්වරාක්ෂරපාඨ හා සඞ්කරත්වයට පැමිණිය හැකි බැවින් ප්‍රකෘතිස්වරාක්ෂරපාඨ යන්ට ද දිඞ්මාත්‍රඋපදෙශයක් දක්වන්නෝ **'අඳුන් ඇඳෑ'** යනාදිය කියත්.

### ප්‍රාණාක්ෂරපාඨ.

(54) **ප**—අඳුන්, අඤ්ජනාර්ථයෙහි අඳුන් යනු වේ; **ඇඳෑ,** අඤ්ජනාර්ථ (පූජාක්‍රියා) යෙහි ඇඳෑ යනු වේ; එරුණු, අවතීර්ණ (=බැස්සා වූ) යන අර්ථයෙහි එරුණු යනු වේ; අරුණු, ආරූඪ (නැංගා වූ) යන අර්ථයෙහි අරුණු යනු වේ. අරු, ආරූඪාර්ථ (පූජාක්‍රියා) යෙහි අරු යනු වේ; අලු, ආලොකාර්ථයෙහි අලු යනු වේ; අලුත්, අභිනවාර්ථයෙහි අලුත් යනු වේ; අද, අද්‍ය (මෙකල, මෙදවස) යන අර්ථයෙහි **ද** ආර්ද්‍ර (=තෙත්) යන අර්ථයෙහි **ද** අද යනු වේ; ඉදි, ඍජු (=අවඞ්ක) යන අර්ථයෙහි ඉදි යනු වේ; ඔද, ඔජස් යන අර්ථයෙහි ඔද යනු වේ; එළු, එළක යන අර්ථයෙහි **ද** සිංහලභාෂා යන අර්ථයෙහි ද එළු යනු වේ; උළු, තාරකාර්ථයෙහි

**හැරැඹැ ඇරැඹැ, හමු අමු, හසර අසර, හසළ අසළ, හැකිළැ ඇකිළැ, හැඳූරුම් ඇඳූරුම්, ඈ සකරට අදෙස් හකරෙන් ද අඋපසගෙන් ද සම වැ සිදුපා.** (55)

---

(මාගධතත්සමවශයෙන්) උළු යනු වේ*. ඔළු ශීර්ෂාර්ථයෙහි ඔළු යනු වේ; ඇලි, ආලි (=මියර, ඇල්ල) යන අර්ථයෙහි ඇලි යනු වේ; අලු, ආලි යන අර්ථයෙහි, අලු† යනු වේ; ඇවිණි, ආවිද්ධ (=අවුණන ලද) යන අර්ථයෙහි ඇවිණි යනු වේ, අස්වස්, ආශ්වාස (=පිහිට හෝ හෙළන හුස්ම) යන අර්ථයෙහි අස්වස් යනු වේ; අල, කන්‍දාර්ථ යෙහි අල යනු වේ; එළැඹි, උපස්ථිත (=උපගත) යන අර්ථයෙහි එළැඹි යනු වේ; අසි, ඛඩ්ග යන අර්ථයෙහි අසි යනු වේ; ඉක්, අතික්‍රම (=ඉක්ම පැවැත්ම) යන අර්ථයෙහි ඉක් යනු වේ; අසිඳැ, ආච්ඡේදනය කොට (=පැහැරගෙන) යන පූර්වක්‍රියා අර්ථයෙහි අසිඳැ යනු වේ; ඈ, (මේ) ආදිය; පණකුරුපා, ප්‍රාණාක්‍ෂරපාඨ යි.

මෙකී ප්‍රාණාක්‍ෂරපාඨයන් හකාරසම්බන්ධයෙන් වියුක්ත වැ ප්‍රකෘතියෙන් ස්වරාක්‍ෂරයන් ම ආදිභූත වැ නිෂ්පන්නවිසින් ද තත්සමවිසින් ද තද්භවවිසින් ද භාෂායෙහි ව්‍යවහාරයට පැමිණි සේ මීට අනුරූප සෙසු ශබ්ද ද විමසා දතයුතු.

---

## සමානපාඨ.

(55) **ප—හැරැඹැ,** සංරබ්භ යන්නෙන් හැරැඹැ යනු වේ; ඇරැඹැ, ආරබ්භ යන්නෙන් ඇරැඹැ යනු වේ; හමු, සම්මුඛශබ්ද යෙන් හමු යනු වේ; අමු, ආමුඛශබ්දයෙන් අමු යනු වේ; හසර, සඤ්චාරශබ්දයෙන් හසර යනු වේ; අසර, ආචාරශබ්දයෙන් අසර යනු වේ; හසළ, සඤ්චරිතශබ්දයෙන් හසළ යනු වේ; අසළ, ආචරිතශබ්දයෙන් අසළ යනු වේ; හැකිළැ, සඞ්කුචිත්වා යන් නෙන් හැකිළැ යනු වේ; ඇකිළැ, ආකුඤ්චිත්වා යන්නෙන් ඇකිළැ යනු වේ; හැඳූරුම්, සඤ්ඤායශබ්දයෙන් හැඳූරුම් යනු වේ; ඇඳූ රුම්, අඤ්ඤයන ශබ්දයෙන් ඇඳූරුම් යනු වේ; ඈ, (මේ) ආදිය; සකරට, සකාරයහට; අදෙස්හකරෙන් ද, ආදෙශ වූ හකාර යෙන් ද; අඋපසගෙන් ද, අ යන උපසර්ගයෙන් ද; සම වැ, සමාන වැ; සිදුපා, සිද්ධ වූ පාඨ යි.

---

* ගෘහෝපකරණවාචි 'උළු' ශබ්දය ද තද්භවවශයෙන් යෙදේ. මාගධ 'ඉට්ඨකා' ශබ්දයෙන් බිඳී ආ හෙයිනි.

† 'අලු' යි වියන දණ්ඩට ද කියත්.

"රතන දිදි ඉගිල් වසනතුරෙන් රසන්දම්
කියව කර හලලා පැහැබර දිගු නුවන් ලා" (56)

**වි**—**හැරැබෑ**, **ඇරැබෑ** යනාදීන් මේ දක්වූ උදාහරණපාඨ සකාරයට ආදෙශ වූ හකාරයෙන් ද ආ යන උපසර්ගයෙන් ද සමාන වැ සිද්ධ ය. මෙහි හැරැබෑ ඇරැබෑ යනු එකිනෙකට අසමාන වූ ස්වරූප හා අර්ථ ඇති 'සංරබ්ධ-ආරබ්ධ' යන පදද්වයෙන් අසමාන රූප ව ම සිද්ධ ය. එතෙකුදු වුවත් මෙහි අර්ථවශයෙන් කිසිවිටෙක ලැබෙන සමානත්වය සලකා සමාන ව සිද්ධ පාඨ යයි කියනලදි. හැරැබෑ යන්නට මූල ප්‍රකෘති වූ 'සංරබ්ධ' යන පූර්වක්‍රියාව කොපය, ආක්‍රොශය, උත්සාහය, වෙගය, යන මෙතෙක් අර්ථයෙහි වැටේ. එබැවින් හැරැබෑ යන පෙරකිරියෙන් කුපිත වැ, ආක්‍රොශකොට, යනාදි අර්ථයෙක් වාච්‍ය වේ*. ඇරැබෑ යන්නට මූලප්‍රකෘති වූ 'ආරබ්ධ' යන පූර්වක්‍රියාව පටන්ගැන්ම, උපක්‍රමය, දර්පය, උත්සාහය, වෙගය හෙවත් යුහුබව, යන මෙතෙක් අර්ථයෙහි වැටේ. එබැවින් ඇරැබෑ යන පෙරකිරියෙන් පටන්ගෙන, උපක්‍රමකොට, යනාදි අර්ථයෙක් වාච්‍ය වේ. **හැරැබෑ**, **ඇරැබෑ** යනාදිය මෙසේ මූලප්‍රකෘතිවිසින් විශෙෂාර්ථ ඇතත් සිංහල භාෂායෙහි බොහෝ සෙයින් සමානාර්ථ වැ යෙදීම සිද්ධාන්ත සංග්‍රහකාර ආචාර්යයන් විසින් සලකනලදි.

---

## ස්වරහකාරපාඨයන්ගේ අනියමවිධිය.

(56) **ප**—හකාරය කිවමනා තන්හි ස්වරය ද ස්වරය කිවමනා තන්හි හකාරය ද විපර්යාසයෙන් යොදනලද පුරාතන පාඨයනුදු භාෂායෙහි පැනෙනහෙයින් ඒව ද දෘෂ්ටාන්ත දක්වන්නෝ '**රතන**' යනාදි අසක්දතව හා '**කළවන්**' යනාදි මයූර සන්දෙශ තව ද නිදර්ශන කරත්.

ඉගිල්, ශිථිල වූ; වසන්අතුරෙන්, වස්ත්‍රාන්තරයෙන්; රත්අත, රක්ත (වර්ණ වූ) හස්තය; රසන්දම්, රසනාදමයට; දිදී, දුනය කොට කොට; කර, ග්‍රීවය; හලලා, ආලොලිත කොට; පැහැබර, ප්‍රභායෙන් භරිත වූ; නුවන්, නෙත්‍ර (යුග්ම) ය; ලා, යොමුකොට; කියව, කථනය කරව; (යනු අසක්දතවැ පදාර්ථ යි.)

---

* "උනුත් **හැරැබෑ** තවපරිදි" යනාදි ධම්ප්‍රදීපිකාපාඨයෙහි හැරැබෑ, යනු කුපිත වැ; ආක්‍රොශකොට; යන අර්ථයන්හි පැණෙත්.

"කළුවන් බිඟු මහත්වන හිරු හත්වන"
මෙ ඈ සේපාහි විය‍බිසරදස්නෙන් අනියම්විදි ද සලකනු. (57)

ඉති හකරවිනිස.

---

සන්අදිසර පළමුවනු.

---

(57) ප—හිරු, සූර්‍ය්‍යයා; හත්වන, අස්ත (ප්‍රාප්ත) වනකල්හි; බිඟු, භෘඞ්ග(සමූහ)යාගේ; කළුවන්, කාලවර්‍ණය; මහත්වන, මහත්වූයේ ය. (යනු මොනරසඳෙස්කවැ පදයි සි.) මෙඈ, මේ ආදි වූ; සේපාහි, ශ්ලේෂපාඨයෙහි; විය‍බිසරදස්නෙන්, ව්‍යභිචාර දර්‍ශනය හෙතුකොට ගෙන; අනියම්විදි ද, අනියමවිධිය ද; සල කනු, සංලක්‍ෂණය කරනු.

වි—මාගධ 'හත්ථ' ශබ්දයෙන් හෝ සංස්කෘත 'හස්ත' ශබ්ද යෙන් තද්භවවිසින් අතට 'හත්' යන නාමය යෙදේ. එසේ කලැ 'රත්හත' යයි හකාරාදිකොට කියයුතුවත් 'රත්+අත=රතත' කියා මේ කාව්‍යයෙහි ස්වරාදි අත්ශබ්දය යෙදූහ. මාගධ 'අත්ථ' ශබ්දයෙන් නොහොත් 'අත්ථං' යන නිපාතශබ්දයෙන් හෝ සංස්කෘත 'අස්ත' ශබ්දයෙන් නොහොත් 'අස්තම්' යන නිපාත ශබ්දයෙන් හෝ තද්භවවිසින් අවරපර්‍ව්‍යතයට 'අත්' ශබ්දය යෙදේ. එනෙකුදු වුවත් 'හිරු අත්වන' යයි ස්වරාදි කොට කියයුතුතැනැ 'හිරු හත්වන' කියා (හකාරාදි) 'හත්' ශබ්දය යෙදූහ. මේ ආදි ශ්ලේෂපාඨයන්හි කිසිතැනෙක පළමු කී ස්වර හකාර සම්බන්ධි උච්චාරණයාගේ නියමය නො යෙදේ. ව්‍යභිචාරවශයෙන් පෙරළීමට පැමිණේ. 'ව්‍යභිචාර' නම් අනෛකාන්තික ප්‍රවෘත්තිය යි. ව්‍යවස්ථා රහිත වැ අනියමින් ප්‍රවෘත්තිය ව්‍යභිචාර නමැ යි සේයි.

'හස්තවාචි අත්ශබ්දය ස්වරාදිකොට ඇත්තේ ය, හකාරාදි ප්‍රකෘතියෙන් බිඳී ආහෙයින' 'අස්තවාචි හත්ශබ්දය බ්‍යඤ්ජනාදි කොට ඇත්තේ ය ස්වරාදි ප්‍රකෘතියෙන් බිඳී ආහෙයිනැ' යි සව්‍යභිචාරයට වාක්‍ය ගත්කල්හි, ප්‍රථම වාක්‍යයෙහි හකාරාදි ප්‍රකෘතිජත්ව හෙතුව ඇත්ශබ්දාදි සපක්‍ෂයෙහි ද හස්ශබ්දාදි විපක්‍ෂ යෙහි ද සම වැ පවති. ද්විතීය වාක්‍යයෙහි ස්වරාදි ප්‍රකෘතිජත්ව හෙතුව (ආසන්නාර්ථ) හසුන්ශබ්දාදි සපක්‍ෂයෙහි ද අඳුන් ශබ්දාදි විපක්‍ෂයෙහි ද සම වැ පවති. 'පර්‍ව්‍යතො ධූමවාන්, වහ්නෙඃ' (=පර්‍ව්‍යතය දුම් ඇත්තේ ය, වහ්නියෙනි) යනු මෙනි.

**පෙර පරවණන් නිසි- විදිනි ගළපනු සඳනම්**
**වණලොප් අදෙස් ඈ එහි- ලැකිසනුසරින් දන්නේ. (1)**

---

මෙහි වර්ති හෙතුව වනාහි සපක්ෂ වූ මහානසයෙහි ද විපක්ෂ වූ තප්තායඃපිණ්ඩයෙහි ද සම වැ පවත්නේ ය. එහෙයින් සාධාරණ යි; මෙසේ යථොක්තහෙතුන්ගේ පැවැත්ම විපක්ෂ වෘත්තිත්වරූප ව්‍යභිචාරවිෂයක වේ. මේ වනාහි න්‍යායශාස්ත්‍රයෙහි කියනලද දුෂ්ට හෙතුන් අතුරෙහි '**සාධාරණ අසාධාරණ අනුපසංහාරී**' යයි ත්‍රිභෙද වූ පළමුවන අසද්ධෙතුවට ඇතුළත් **සාධාරණානෛකාන්තිකහෙත්වාභාස** නමැයි නෛයායිකතර්කශාස්ත්‍රඥයෝ සලකත්. මෙසේ සාධ්‍යයා කෙරෙන් පිටත්හි ද පවත්නා හෙයින් සපක්ෂ විපක්ෂවර්ති වූ හෙතුව සාහචර්‍ය්‍යනියමයාගේ ග්‍රහණය වළක්වන්නෙන් සාධාරණ සව්‍යභිචාරය වේ. හේ මෙහි ද ව්‍යභිචාරත්වයෙන් අභිමත යි. වෛශෙෂික තර්කශාස්ත්‍රඥයන්ගේත් මෙහි නිර්විශෙෂත්වය "**යස්මාද්විෂාණී තස්මාද් ගෞරිති චානෛකාන්තිකස්‍යොදාහරණම්**" යන්නෙන් කණාදඍෂිහු විසින් දක්වනලදි. ත්‍රිවිධ ව්‍යභිචාර විස්තරය "**අනෛකාන්තිකඃ සව්‍යභිචාරඃ**" (1. 2. 46) යන අක්ෂපාදසූත්‍රය සම්බන්ධි වූ වාත්ස්‍යායන භාෂ්‍යාදියෙන් දතයුතු.

හකාරවිනිශ්චය නිමි.

---

**සංඥාධිකාර නම් වූ ප්‍රථමාධ්‍යාය යි.**

---

(1) "**පෙරපරවණන් නිසිවිදිනි ගළපනු සඳනම්**" යනු උපාඞ්ගසූත්‍ර යි.

**ප**—පෙරපරවණන්, පූර්වපරවර්ණයන්; නිසිවිදිනි, (ලොපාදෙශාදි) නිඃශ්‍රිතවිධියෙන්; ගළපනු, ඝටනාකිරීම; සඳනම්, සන්ධිනම්; එහි, ඒ සන්ධිවිධියෙහි; වණ, වර්ණයන් සම්බන්ධි වූ; ලොප්අදෙස් ඈ, ලොපාදෙශාදිය; ලැකියනුසරින්, ලක්ෂ්‍යානුසාරයෙන්; දන්නේ, ජානනය කරන්නේ ය.

**භා**—පෙරකුර ය පරකුර ය යන අක්ෂරයන් දෙදෙනාගේ අතරක් නො තබා යම් ගැළපීමෙක් හෝ ලංකිරීමෙක්, ලෝපයෙන් හෝ ආදෙශයෙන් හෝ ආගමයෙන් හෝ, (එකී අක්ෂරයන් ඇසුරු කොට) කරනු ලැබේ ද ඒ සන්ධි නම්. එකී ලොප ආදෙශ ආගමයන්ගේ විධානය කාව්‍යලක්ෂ්‍ය ලෞකිකලක්ෂ්‍ය දෙදෙනාගේ අනුසාරයෙන් දතගන්නේ ය.

**විදුරවියේ, දිගා, දිනිසුරු, කනීල්, බමරුදුල, තොමරුල්, සඳෙව්, යළේහි, පහරොත, හඬෝනා, ඈ පෙරසරලොපා පර සර ගතට පැමිණවූබැවින් පෙරසරලොප්සඳනම්.** (2)

---

**පූර්වස්වරලොපසන්ධි.**

(2) **ප**—විදුරවියේ, විදුරු+අවියේ යන තන්හි විදුරවියේ ය; **දිගා,** දිගු+ආ යන තන්හි දිගා ය; දිනිසුරු, දින+ඉසුරු යන තන්හි දිනිසුරු ය; **කනීල්,** කනා+ඊල් යන තන්හි කනීල් ය; **බමරුදුල,** බමර+උදුල යන තන්හි බමරුදුල ය; **තොමරුල්,** තොමර+උළුල් යන තන්හි තොමරුල් ය; සඳෙව්, සඳ+එව් යන තන්හි සඳෙව් ය; යළේහි, යළ+ඒහි යන තන්හි යළේහි ය; පහරොත, පහර+ඔත යන තන්හි පහරොත ය; හඬෝනා, හඬ+ඕනා යන තන්හි හඬෝනා ය යන; ඈ, මේ ආදිය; පෙරසර ලොපා, පූර්වස්වරයා ලොප්කොට; පරසර, පරස්වරයා; ගතට, ගාත්‍රාක්ෂරයට; පැමිණවූබැවින්, ප්‍රාපිත වූ බැවින්; පෙරසර ලොප්සඳනම්, පූර්වස්වරලොපසන්ධි නම්.

**භා**—විදුරු-අවියේ, දිගු-ආ, දින-ඉසුරු, කනා-ඊල්, බමර-උදුල, තොමර-උළුල්, සඳ-එව්, යළ-ඒහි, පහර-ඔත, හඬ-ඕනා, කියා තුබූ කල්හි පූර්වභාගයෙහි සිටි විදුරු, දිගු, යනාදීන්ගේ අන්ත්‍යස්වරයන් ගාත්‍රයෙන් වෙන්කොට ඉදිරියෙහි ලියා- විදුර්උ-අවියේ දිග්උ-ආ යනාදි ක්‍රමයෙන් සිටුවා, ස්වරයා පරකලැ පූර්වස්වරයන්ට අධිගසූත්‍රය සම්බන්ධවන්නෙහි **“පෙරපරවණන් නිසිවිදිනි ගලපනු සඳනම්”** යන උපාධිගසූත්‍රයෙන් ලොප්කොට, විදුර්-අවියේ දිග්-ආ යනාදීන් සිටි කලැ, පර වැ සිටි අකාර ආකාරාදි ස්වරයන් පූර්ව වැ සිටි රකාර ගකාරාදි (හල්-) ගාත්‍රාක්ෂර යන් කරා පමුණුවා සටනා කළ කල්හි **විදුරවියේ, දිගා,** යනාදි සංහිතා කාර්‍ය්‍යයෝ සිඬ වෙත්. මේ සංහිතාකාර්‍ය්‍යයන්හි පූර්වස්වරයාගේ ලොප්කිරීම ප්‍රධානකාර්‍ය්‍යත්වයෙන් සිඬහෙයින් **‘පූර්වස්වරලොපසන්ධි’** නමැයි කියනලදි.

**වි**—ප්‍රකෘති ප්‍රත්‍යය දෙදෙනාගේ ගැළපීම නියතයෙන් කට යුතුහෙයින් එකපදයෙහි සන්ධි නිත්‍යයෙන් වේ. කර+අව්, බමණ+ඕ යනාදි තන්හි **‘කරව්, බමණෝ’** කියා සංහිතා නිත්‍ය ම ය. සමාස වූ ශබ්දයන්ගේ බොහෝසෙයින් සන්ධිකිරීම පැනේ. විදුරවියේ යනාදි උදාහරණයන්ගෙන් වැඩියක් එබඳු තැන් ය. **‘විදුර අවි වූයේ යමක්හට ද එතෙම විදුරවියේ’** යන සමාස වශ යෙන් වජ්‍රායුධ නම්ලද ශක්‍රයාහට **විදුරවි** යනු නමෙකි. විදුරවි යන ශබ්දප්‍රකෘතියෙන් පර වැ **‘ඒ’** ප්‍රත්‍යය යොදා යකාරාගමසන්ධි යෙන් ප්‍රථමෛකවචනයෙහි **‘විදුරවියේ’** යනු වේ. **‘දිගු ද එම ආ ද = දිගා’** යන විශෙෂණ සමාස වශයෙන් දීර්ඝායුෂට ද, **‘දිගු ආ ඇතියේ = දිගා’** යන අන්‍යාර්ථසමාසවිසින් දීර්ඝායුෂකයා හට ද

**ඌලේසුම්, සුස්මෙන්, තියුණු, වැටුසිපත, ඈ පරසරලොප් සඳ නම්.** (3)

---

දිගායනු නමෙකි. 'දිනට ඉසුරු = දිනිසුරු' යන විභක්තිසමාස වශයෙන් දිනෙශ නම් ලද සූර්ය්‍යාහට ද 'දින වූයේ ද එම ඉසුරු වූයේ ද = දිනිසුරු' යන විශෙෂණසමාසවශයෙන් ජිනෙන්ද්‍ර නම්ලද සර්වඥයන්වහන්සේට ද දිනිසුරු යනු නමෙකි. 'කනායෙන් කල ඊල් = කනීල්' යන විභක්තිසමාසවිසින් රත්ඹිවිලියට කනීල් යනු නමෙකි. 'බමර කරණෙන් උදුලේ = බමරුදුල' යන විභක්ති සමාසවිසින් භෘඞ්ගයන්ගෙන් උජ්ජ්වලිත (පුෂ්පාදියට) බමරුදුල යනු නමෙකි. 'නොමර ද එම ඌල් ද = නොමරුල්' යන විශෙෂණසමාසවිසින් වැලිනැති ප්‍රස්‍රවණස්ථානයට නොමරුල් යනු නමෙකි. සදෙව් යනාදිය ව්‍යස්ත (= වෙන්) පදයන්ගේ සන්ධියට උදාහරණ වේ. සදෙව් යනු චන්ද්‍රයා මෙන් යන අර්ථ යි. යලේහි යන තැන යල යනු වාරාර්ථ වූ කල්හි වාරයෙහි යන අර්ථ වේ. යල ශබ්දය නිපාත වූ කලැ 'නැවත එහි' යන අර්ථ වාච්‍ය වේ. පහර+ ඔත යනු පහර වන්කල්හි යන අර්ථ ඇත්තේ ය. හඬ+ඔනා යනු ශබ්ද ප්‍රවෙශවන්නා වූ යන අර්ථ යි.

---

## පරස්වරලොපසන්ධි.

(3) ප—ඌලේසුම්, ඌලේ + උසුම් යන තන්හි ඌලේසුම් ය; සුස්මෙන්, සු + ඌස්මෙන් යන තන්හි සුස්මෙන් ය; තියුණු, ති + අයුණු යන තන්හි තියුණු ය; වැටුසිපත, වැටු + අසිපත යන තන්හි වැටුසිපත ය; ඈ, යනාදිය; පරසරලොප්සඳ නම්, පරස්වර ලොපසන්ධි නම්.

වි—ඌලේ + උසුම්, සු+ඌස්මෙන්, ති+අයුණු, වැටු+අසිපත කියා තුබූකල්හි පූර්වභාගයෙහි සිටි ඌලේ යනාදීන්ගේ අන්ත ස්වරයෝ පූර්වස්වර නම් වෙති. පරභාගයෙහි සිටි උසුම් යනාදීන්ගේ ආදිස්වරයෝ පරස්වර නම් වෙත්. මෙකී පරස්වර යන්ට ද පෙරසේ ම අබොහාපාඩගසූත්‍රසාමර්ථ්‍යයෙන් ලොප්කොට 'ඌලේසුම්' යනාදි සංහිතා සිද්ධ කටයුතු. මෙහි පරලොපකාර්ය්‍යයෙන් ගැලපීම කළහෙයින් මේ පරස්වරලොපසන්ධි නම් වේ. ඌලේසුම්, ඌලෙහි උෂ්මය යන අර්ථ යි. ඌල් යනු උල්පත් හෝ පර්වතාදියෙන් ගලාවැටෙන ගඟුල්ගැලි යි. සුස්මෙන්, නාසාග්‍රවර්ති වූ උණුසුම් වායුවෙන් හෝ ඉතා ග්‍රීෂ්මයෙන් යන අර්ථ යි. තියුණු, අගුණ තුනෝනා යන අර්ථ යි. වැටුසිපත, හෙළන ලද කඩුපත යන අර්ථ යි.

**පසැස් ඈ සරලොප් නැත ද සර ගතට පැමිණුවූබැවින් සරසඳ නම්. (4)**

**මෙහෙසුරු මොහොර ලඹෝර ඈ අ ඉ උන් ලොපා එ ඔ ඕ අදෙස් කළබැවින් සරදෙස්සඳ නම්. (5)**

---

### ස්වර සන්ධි.

(4) **ප**—**පසැස් ඈ**, පස් + ඇස් යන තන්හි පසැස් යනාදිය; **සරලොප් නැත ද**, ස්වරලොපය නැතත්; **සර**, ස්වරාක්‍ෂරයා, **ගතට පැමිණවූබැවින්**, ගාත්‍රාක්‍ෂරයට ප්‍රාපිත බැවින්; **සරසඳ නම්**, ස්වරසන්ධි නම්.

**වි**—**පස් + ඇස්** කියා තුබූ කල්හි ලොපාදෙශාදිකාර්‍ය්‍යයක් නැති ව ම ස්වරයා ගාත්‍රාරූඪකළ පමණෙකින් '**පසැස්**' යී සිද්ධ ය. එහෙයින් මේ ස්වරසන්ධි නම් වේ. '**පස් ඇස් ඇතියේ = පසැස්**' යන අන්‍යාර්ත්‍ථසමාසවිසින් මසැස, දිවැස, පැණැස, බුදුඇස, සමතැස, යන පඤ්චචක්‍ෂුසක් ඇති සර්වඥයන්ට **පසැස්** යනු නමෙකි.

---

### ස්වරාදෙශසන්ධි.

(5) **ප**—**මෙහෙසුරු**, මහ + ඉසුරු යන තන්හි මෙහෙසුරු ය; **මොහොර**, මහ + උර යන තන්හි මොහොර ය; **ලඹෝරා**, ලඹ + උදර යන තන්හි ලඹෝරා ය යන; **ඈ**, මේ ආදිය; **අ ඉ උන්**, (පූර්ව ස්වර වූ) අකාර හා (පරස්වර වූ) ඉකාර උකාරයන්; **ලොපා**, ලොප් කොට; **එ ඔ ඕ අදෙස් කළබැවින්**, (ලුප්තස්වරයන්ගේ ස්ථානයෙහි) එ ඔ ඕ යන මොවුන් ආදෙශ කළබැවින්; **සරදෙස් සඳ නම්**, ස්වරාදෙශ සන්ධි නම්.

**වි**—**මහ + ඉසුරු, මහ + උර, ලඹ + උදර** කියා තුබූතන්හි හකාර බකාරස්ථ (අකාර। ස්වර පහකොට ඒ පූර්වස්වරයන්ට හා පරස්වර වූ ඉකාර උකාරයන්ට ද යට කී "**පෙරපරවණන්**" යනාදි උපාඞ්ගසූත්‍රයෙන් ලොපය ද ලුප්තස්වර වූ තුන් ස්ථාන යෙහි ක්‍රමයෙන් එ ඔ ඕ යන ස්වරාදෙශ ද කොට අඞ්ගසූත්‍ර සාමර්ත්‍ථ්‍යයෙන් පිළිපෙරළි හා දකාරලොපය ද* කළකල්හි **මෙහෙසුරු, මොහොර, ලඹෝර,** යනු වේ.

---

* පිළිපෙරළිය මෙහෙසුරු මොහොර යන දෙතැන්හි ය. දකාරලොපය ලඹෝර යන තැන්හි ය.

**අත්වරු, සිත්වරු, මහණුවම්, දඬුවම්, ගිනියම් ඈ පර කකරනට වයන් හා; කප්පිල්, කැසුප්පොතු, ලප්නාරඟ, හෙප් තොට, සුත්බත්, බුත්සරණ ඈ බදන් සර ලොපා පතන් හා අදෙස් කළබැවින් ගතදෙස්සඳ නම්.** (6)

---

**ගාත්‍රාදෙශසන්ධි.**

(6) **ප**—අත්වරු, අත් + කරු යන තන්හි අත්වරු ය; සිත් වරු, සිත් + කරු යන තන්හි සිත්වරු ය; මහණුවම්, මහණ + කම් යන තන්හි මහණුවම් ය; දඬුවම්, දඬු + කම් යන තන්හි දඬුවම් ය; ගිනියම්, ගිනි + කම් යන තන්හි ගිනියම් ය යන; ඈ, මේ ආදිය; පරකකරනට, පර වූ කකාරයන්ට; වයන් හා, වකාර යකාරයන් ද; කප්පිල්, කබ + පිල් යන තන්හි කප්පිල් ය; කැසුප් පොතු, කැසුබු + පොතු යන තන්හි කැසුප්පොතු ය; ලප්නාරඟ, ලබු + නාරඟ යන තන්හි ලප්නාරඟ ය; හෙප්තොට, හෙබ + තොට යන තන්හි හෙප්තොට ය; සුත්බත්, සුදු + බත් යන තන්හි සුත්බත් ය; බුත්සරණ, බුදු + සරණ යන තන්හි බුත් සරණ ය යන; ඈ, මේ ආදිය; බදන්, බකාර දකාරයන්ගේ; සරලොපා, ස්වරලොප්කොට; පතන් හා, පකාරතකාරයන් ද; අදෙස් කළබැවින්, ආදෙශ කළබැවින්; ගතදෙස්සඳ නම්, ගාත්‍රාදෙශසන්ධි නම්.

**වි**—අත් + කරු, සිත් + කරු, මහණු + කම්, දඬු + කම්, ගිනි + කම් කියා තුබූ තන්හි පරගාත්‍රාක්ෂර වූ කකාරයන්ට වකාරදෙශ ද ගිනිකම් යන්නෙහි කකාරයට යකාරාදෙශ ද කළ කල්හි අත්වරු යනාදිය සිද්ධ යි. 'මහණ+වම්' යි පද බිඳී සිටි කලැ ණකාරස්ථ ස්වරයහට විපර්‍ය්‍යාසවිධියෙන් 'මහණ' යනු 'මහණු' යි සිද්ධ වේ.

කබ + පිල්    කැසුබු + පොතු    ලබු + නාරඟ
හෙබ + තොට    සුදු + බත්    බුදු + සරණ

කියා තුබූ තන්හි පූර්වභාගයෙහි සිටි 'කබ, කැසුබු', යනාදීන්ගේ බකාර දකාරස්ථ ස්වරයන් පහකොට "පෙරපරවණන්" යනාදි උපාඞ්ගසූත්‍රයෙන් ලොප් කොට කබ් + පිල්, කැසුබ් + පොතු, ලබ් + නාරඟ, සුද් + බත්, බුද් + සරණ කියා සිටි කලැ (හල්) බකාරයන්ට පකාරාදෙශ ද (හල්) දකාරයන්ට තකාරාදෙශ ද කළ කල්හි 'කප්පිල්, කැසුප්පොතු' යනාදිය වේ.

අත්වරු, හස්තකර්ම කරන්නේ ය; සිත්වරු, චිත්‍රකර්ම කරන් නේ ය; මහණුවම්; ශ්‍රමණකර්ම ය; දඬුවම්, දණ්ඩකර්ම ය; ගිනියම්;

**අත්තම්, වත්තම්, ගෙත්තම්, පත්තම්, විස්සම් ඈ පර ඛකරනට පෙරරූ ලද්දෙන් පෙරරුසඳ නම්.** (7)

---

අග්නිකම් ය; කප්පිල්, මයුරයා හෝ සඳැස්පිල් ය; (මෙහි කබ හෙවත් 'ඛබ්' යන ප්‍රකෘතිය කලාපශබ්දයෙන් 'කලබ්' යි බිඳුණු පසු ලකාරලොපයෙන් සිද්ධ යයි ද හැගේ.) කැසුප්පොතු, කැස්බා පොතු ය; ලප්තාරහ, එනම් වෘක්‍ෂ ය; හෙප්තොට, හෙබට (=වලට) බස්නා තොට ය; සුත්බත්, සුදුපැහැ ඇති බත ය; බුත්සරණ, බුදුන් සරණය යන අර්‍ථ යි.

---

**පූර්වරූපසන්ධි.**

(7) **ප**—අත්තම්, අත්+ඛම් යන තන්හි අත්තම් ය; වත්තම්, වත්+ඛම් යන තන්හි වත්තම් ය; ගෙත්තම්, ගෙත්+ඛම් යන තන්හි ගෙත්තම් ය; පත්තම්, පත්+ඛම් යන තන්හි පත්තම් ය; විස්සම්, විස්+ඛම් යන තන්හි විස්සම් ය යන; ඈ, මේ ආදිය; පරඛකරනට, පර වූ ඛකාරයන්ට පෙරරූ ලද්දෙන්, පූර්වරූප ලත් හෙයින්; පෙරරුසඳ නම්, පූර්වරූපසන්ධි නම්.

**වි—අත්+ඛම්, වත්+ඛම්, ගෙත්+ඛම්, පත්+ඛම්, විස්+ඛම්** කියා තුබූතන්හි පරභාගයෙහි ඛකාරයන්ට පූර්වභාගයෙහි සිටි තකාර තකාර සකාරයන් ආදෙශකිරීමෙන් **අත්තම්** යනාදිය සිද්ධ යි. පූර්වරූපයාගේ ආදෙශයෙන් සිද්ධ වූ සංහිතා හෙයින් මේ **පූර්වරූපසන්ධි** නම් වේ. සිංහල ව්‍යාකරණයෙහි **පරරූපසන්ධි** අදර්ශිත ය යන න්‍යූනතාදෝෂයක් වර්තමානකාලීන සමහර කෙනෙක් සලකති. හේ **අදර්ශිත** නො වේ. සිද්ධාන්තසඞ්ග්‍රහකාර ආචාර්‍ය්‍යපාදයෝ ගාත්‍රාදෙශසන්ධිහුගේ ම එකදෙශයෙකින් (**ඛප්පිල්** යනාදින්) **පරරූපාදෙශය** ද දක්වූහ. පෘථගුපාදනය නො කරනලද්දේ එහෙයිනි. කාව්‍යලක්‍ෂ්‍ය ලෞකිකලක්‍ෂ්‍ය දෙක්හි ම කිසිතැනෙක සුවසේ උසුරුවීම සඳහා පරරූපගාත්‍රාදෙශය ද කරනු ලැබේ. හෙ ද බොහෝසෙයින් වර්ගප්‍රථමතෘතීයයන්ට ම වන බැව් පැණේ. ගකාරය හෝ පකාරය හෝ පරකල කකාරයනට පරරූපාදෙශ වේ. දකාරය පරකල තකාරයනට ද, පකාරය පරකල බකාරයනට ද පරරූපාදෙශය වේ.

ඒ මෙසේ ය :-

**ලක් + ගල = ලග්ගල    දුක් + පත් = දුප්පත්**
**සිත් + දේ = සිද්දේ    ඛබ් + පිල් = ඛප්පිල්**

මේ පසු උදාහරණය සිද්ධාන්තකර්තෘහු විසින් ගාත්‍රාදෙශසන්ධියෙහි සඞ්ග්‍රහකරනලදි. සෙස්ස ද එමනයින් සඞ්ග්‍රහකොට ගත්

**ගංරන්, වංමුතු, මුංබියලි, නෙළුම්මල්, අම්මල් ඈ ගබන් ලොපා මත්වැඩුබැවින් ගතකුරුලොප්සඳ නම්. (8)**

**පිරියත්, මියුගුණු, සිපියෙව්, දුවග, රුවාරු, තුනුවග, පුනරුත්, නිරොද ඈ පෙරසර නොලොපා සවරන් අගම් සෙලෙන් අගම්සඳ නම්. (9)**

---

කලැ පරරූපසන්ධි අනිර්දිෂ්ට ය යන න්‍යූනතාවෙක් නො පැනේ. ව්‍යාකරණයෙහි විංශතිවිධිය ම ප්‍රමාණ වේ. සකාරය පරකලැ තකාරයහට ද පරරූපගාත්‍රාදෙශය කිසිතැනෙක පැනේ.

බත්+සේ.= බස්සේ, බත් + සල් = බස්සල්, යනාදිය සි.

මේ ආදීන් තෙසුත් ගාත්‍රාදෙශසන්ධි විමසා දතයුතු.

---

### ගාත්‍රාක්ෂරලොපසන්ධි.

(8) **ප**—ගංරන්, ගඟ + රන් යන තන්හි ගංරන් ය; වංමුතු, වග + මුතු යන තන්හි වංමුතු ය; මුංබියලි, මුඟු + බියලි යන තන්හි මුංබියලි ය; නෙළුම්මල්, නෙළුඹු + මල් යන තන්හි නෙළුම්මල් ය; අම්මල්, අඹ + මල් යන තන්හි අම්මල් ය; **ඈ**, මේ ආදිය; ගබන්ලොපා, ගකාර බකාරයන් ලොප්කොට; මත්වැඩු බැවින්, මාත්‍රාවෘද්ධි කළ බැවින්; ගතකුරුලොප්සඳ නම්, ගාත්‍රාක්ෂර ලොපසන්ධි නම්.

**වි**—ගඟ + රන්, වග +මුතු, මුඟු+බියලි, නෙළුඹු + මල්, අඹ + මල් කියා තුබූ තන්හි අඝොපාඝ සූත්‍රබලයෙන් "ගඟ" යනාදීන්ගේ අන්තයෙහි සිටි සවර සහිත ගකාර බකාරයන්ගේ පූර්වභාගයෙහි සංයුක්ත වූ ඌනමාත්‍රබින්දුවට හා ඌනමාත්‍ර මකාරයටත් මාත්‍රාංශවෘද්ධි කොට (=සම්පූර්ණ බින්දුබවට හා සම්පූර්ණ මකාරබවට ද පමුණුවා) **ගංරන්, වංමුතු** යනාදි සංහිතා සිද්ධ සි*.

ගංරන්, ගංතෙර උපදනා සවර්ණ ය; වංමුතු, භද්‍රමුස්තා ය (=කලාදුරු); මුංබියලි, මුද්ගබිදල ය (=මුංපියලි); **නෙළුම්මල්,** එනම් ජලජපුෂ්ප ය; අම්මල්, අඹමල් ය යන අර්ථ සි.

---

### ආගමසන්ධි.

(9) **ප**—පිරියත්, පිරි + අත් යන තන්හි පිරියත් ය; මියුගුණු, මී + අගුණු යන තන්හි මියුගුණු ය; සිපියෙව්, සිපි + එව් යන තන්හි සිපියෙව් ය; දුවඟ, දු + අඟ යන තන්හි දුවඟ ය;

---

* වං + මුතු යි සිද්ධ වූ පසු මකාරයෙන් පෙර වැ සිටි බින්දුවට **පරරූපා** දෙශවීමෙන් වම්මුතු යි සිද්ධ වේ.

**වැල්ලවුරු, හෙළිල්ලඹු, තඹපල්ලෙන්, කුල්ලෙව් ඈ පෙර සර ලොපා ගනාට දෙරූ දූනවූ බැවින් දෙරූසඳ නම්.** (10)

**සඳඅදිසර දෙවනු.**

---

රුවාරු, රූ + අරූ යන තන්හි රුවාරූ ය; තුනුවඟ, තුනු + අඟ යන තන්හි තුනුවඟ ය; පුනරුත්, පුන+උත් යන තන්හි පුනරුත් ය; නිරොද, නි + ඔද යන තන්හි නිරෝද ය යන; ඈ, මේ ආදිය; පෙරසර නො ලොපා, පූර්‍වස්වර ලොප් නො කොට; යව රන්, යකාර වකාර රකාරයන්; අගම් කෙළෙන්, ආගමකළ හෙයින්; අගම්සඳ නම්, ආගමසන්‍ධි නම්.

**වි—** සිරි + අත් | මි + අඟුණු | සිසි + එව් | දු + අඟ
රූ + අරූ | තුනු + අඟ | පුන + උත් | නි + ඔද

කියා තුබූ තන්හි **"පෙරපරවණන්"** යනාදි උපාඞ්ගසූත්‍රයෙන් පූර්‍වස්වරයන් ලොප් නො කොට ඔවුන් වෙත ස්වරරහිත යකාර වකාර රකාරයන් ආගම කොට **සිරිය් + අත්, මිය් + අඟුණු** යනාදීන් සිටි කලැ එම යකාරාදීන් කෙරෙන් පර වැ සිටි ප්‍රාණාක්‍ෂර යන් පූර්‍ව ගාත්‍රාක්‍ෂරයන්ට පමුණුවා **'සිරියත්'** යනාදීන් සිද්‍ධ කරනු. **'මියඟුණු- රූවරූ'** කියා සිටි දෙතැන පූර්‍ව වූ මකාර රකාරයන් ස්වරයන්ට මාත්‍රාහානි ද, යකාර වකාරයන් ස්වරදෙකට ක්‍රමයෙන් පිළිපෙරළි මාත්‍රාවෘද්ධි දෙක ද, අඞ්ගසූත්‍රයෙන් කළ කල්හි **'මියුඟුණු- රූවාරූ'** යනු වේ.

පිරියත්, පර්‍ය්‍යාප්ත ය; මියුඟුණු, මහාඞ්ගණය හෙවත් බිම් තැන්න ය; සිපියෙව්, ශිල්පියකු මෙනි; දුවඟ, ධූතාඞ්ග ය; රුවාරු, රූපධර්ම හා අරූපධර්ම ය; තුනුවඟ, කෘශාඞ්ගඇත්තී ය; පුනරුත්, නැවතත් කියනලද්ද ය; නිරොද, නිරොජසක ය යන අර්‍ථ යි.

---

**විරූපසන්ධි.**

(10) ප – වැල්ලවුරු, වැලි + අවුරු යන තන්හි වැල්ලවුරු ය; හෙළිල්ලඹු, හෙළිලි + අඹු යන තන්හි හෙළිල්ලඹු ය; තඹපල් ලෙන්, තඹපලු + එන් යන තන්හි තඹපල්ලෙන් ය; කුල්ලෙව්, කුලු + එව් යන තන්හි කුල්ලෙව් ය යන; ඈ, මේ ආදිය; පෙරසර ලොපා, පූර්‍වස්වර ලොප් කොට; ගනට, ගාත්‍රාක්‍ෂරයකට; දෙරූ දූනවූ බැවින්, රූපද්වයක් ජනිතකළ බැවින්; දෙරූසඳ නම්, ද්විරූපසන්ධි නම්.

**වි—වැලි + අවුරු, හෙළිලි + අඹු, තඹපලු+එන්, කුලු+එව්** කියා තබා පූර්‍වස්වරයන් ගාත්‍රයෙන් පහකොට **වැල්ළ්+අවුරු**

**සකුසත් අනුසෙරෙන්- ඇත ද සදනට ලිඟුබේ**
**නො පැනේ වහරවෙසෙසෙක්-පුමඉතිරිලිඟුදෙක විනා (1)**

යනාදීන් සිටි කල්හි 'පෙරපරවණන්' යනාදි උපාඞ්ගසූත්‍රයෙන් පූර්වස්වරයන් ලොප් කොට ඒ ගාත්‍රාක්ෂරයන්ට රූපදෙකක් උප දවා හෙවත් ඒ ගාත්‍රයන් වෙත එවැනි ම ගාත්‍රාක්ෂර එක එක ආගම කොට-

**වැල්ල්+අවුරු, හෙළිල්ල්+අඹු, තඹපල්ල්+එන්, කුල්ල්+ එව්** කියා සිටි කලැ පරස්වරයන් ගාත්‍රාරූඪකිරීමෙන් '**වැල්ලවුරු**' යනාදිය සිද්ධ යි. මේ සංහිතායෙහි එකාගතකුර දෙකක්ව සඬි වූ හෙයින් ද්විරූපසඬි යයි කියනලදි.

වැල්ලවුරු, වාලුකාප්‍රාකාරය; හෙළිල්ලඹු, ධවලාඞ්ගනාව; තඹපල්ලෙන්, තාම්‍රපල්ලවයෙන් (=තඹවන් ළදලුයෙන්); කුල් ලෙව්, කුලුමෙන්; යන අර්ථ යි. කුලු යනු පසුරට ද කුල්ලට ද නම්.

**මිතිශ වූ සඬ්‍යධිකාරය නිමි.**

---

(1) **ප**—සකුසත් අනුසෙරෙන්, සංස්කෘත ශබ්දශාස්ත්‍රානු සාරයෙන්; සදනට, නාමයන්ට; ලිඟුබේ, ලිඞ්ගභෙදය; ඇත ද, විද්‍යමානවුවත්; පුමඉතිරිලිඟුදෙක විනා, පුංස්ත්‍රීලිඞ්ගද්වය හැර; වහරවෙසෙසෙක්, (ස්වභාෂායෙහි) ව්‍යවහාර භෙදයෙක්; නො පැනේ, අදෘශ්‍යමාන යි.

**භා** — සංස්කෘතව්‍යාකරණයට අනුව පැවැත්මෙන් සිංහල භාෂායෙහි ද නාමශබ්දයන්ට ලිඞ්ගවශයෙන් වූ භෙදය ඇතිවුවත් පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග දෙක්හි මිස පුනපුංසකලිඞ්ගවයෙහි රූප භෙදයෙක් නො ලැබේ.

**වි**—සිංහලව්‍යාකරණය සංස්කෘතව්‍යාකරණයට අනුකූල ව පවත්නාහෙයින් එහි මෙන් එළුබසෙහි ද නාමශබ්දයන්ගේ ලිඞ්ග භෙදය ඇත්තේවීනමුත් ව්‍යවහාරයෙහි පුංලිඞ්ගරූපභෙදය හා ස්ත්‍රීලිඞ්ගරූපභෙදය පමණෙක් දෘශ්‍යමාන යයි දක්වන ආචාර්‍ය්‍යපාදයෝ නපුංසකලිඞ්ගික ව්‍යවහාරවිශෙෂයක් ස්වභාෂායෙහි නො පැනෙන බැව් නිශ්චිත කළහ. එහෙයින් පුරාතන ව්‍යාඛ්‍යානයෙහි "**මේ පුරිස්, මෝ කත්, මේ දන** යයි පුරුෂ ස්ත්‍රී දෙදෙනාට මේ ය මෝ ය යන ව්‍යවහාරභෙදයක් මුත් **දන, පා, ගස්** ආදි නපුංසක ලිඟුශබ්දයන්ට ව්‍යවහාරභෙදයක් නැති ව පුල් ලිඟුව්‍යවහාරය ම පැනෙනහෙයින් නපුංසකලිඟු ද පුල්ලිඟුයෙහි

අන්තර්ගතකොට මේ **සියබසැ** ලිඞ්ගමයක් ම පෙනෙන්නේ ය" යන භාවය කියනලදි. ශාස්ත්‍රයෙහි ලිඞ්ගභෙදයට මුඛ්‍යවශයෙන් උදාහරණ දක්වීම සර්වනාමශබ්දයෙකින් ම කරනුලැබේ. එහිදු 'මේ' යන අර්ථ ඇති **එත**ශබ්දයෙන් මාගධවෛයාකරණයෝ ලිඞ්ගභෙදය දක්වත්.

"එසා එසො එතනන්ති පසිද්ධි ලොකස්ස හොති යථත්ථෙසු" යන ධර්මකීර්තිසංඝරාජවචනාදියෙන් එය පෙනේ.

එතශබ්දයෙහි **එසා** යි ස්ත්‍රීලිඞ්ගයෙහි ද, **එසො** යි පුංලිඞ්ගයෙහි ද, **එතං** යි නපුංසකලිඞ්ගයෙහි ද, ප්‍රථමෛකවචනරූප වෙන් වෙන් ව ව්‍යවහාර වෙයි. සංස්කෘතශබ්දශාස්ත්‍රයෙහි ද එතත් ශබ්දයෙහි **එෂා, එෂඃ, එතත්,** යන රූපභෙදය එසේ ම ව්‍යවහාර යි. සිංහලභාෂායෙහි මීට සමාන වූ සර්වනාමශබ්දයෙකින් වෙනස් රූප තුනෙක් නො ලැබේ. එබව එතත් ශබ්දපර්‍යාය වූ මේ ශබ්දයාගේ ප්‍රයොගනිරූපණයෙන් හැගේ. මේ (පුරිස්), මෝ (කත්), මේ (දන) යයි ත්‍රිලිඞ්ගව්‍යවහාරය ගත්කලැ ස්ත්‍රීලිඞ්ගයෙහි 'මෝ' යන රූපයාගේත් පුංලිඞ්ගයෙහි 'මේ' යන රූපයාගේත් භෙදය මිස 'මේ පුරිස්, මේ දන' යන දෙතැන්හි මේ යන ව්‍යවහාරයාගේ භෙදයෙක් (=වෙනසෙක්) නො දක්නා ලැබේ. එහෙයින් "**නො පැනේ වහරවෙසෙසෙක් පුමඉතිරිලිඟු දෙක මිනා**" යි ආචාර්‍යයන් විසින් නිර්දිෂ්ට යි. මෙයින් සිංහල භාෂායෙහිදු නාමයන්ට ලිඞ්ගත්‍රය ම අස්ඵුට ව පැනෙනබව ද පුංස්ත්‍රීලිඞ්ගද්වය පමණක් ව්‍යවහාරයෙහි ස්ඵුට ව පැනෙනබව ද කීවා නම් වෙත්. සමහරකෙනෙක් "**මේ තොමේ, මෝ තොමෝ, මේ**" යන රූපත්‍රයක් සලකත්. ඒ ප්‍රෙක්ෂාපූර්වක නො වේ. තෙමේ යනු පුන්නපුංසක දෙකට ම සාධාරණ ව ප්‍රථමාර්ථව්‍යාඛ්‍යානයෙහි විභක්තියෙන් පරකොට යොදනු ලබන්නක් හෙයිනි. ඇතම්හු විසදෘශශබ්දත්‍රයකින් ද ලිඞ්ගත්‍රයට රූපභෙදය සලකති. හෙද වෛයාකරණමතානුගත නො වේ. එක ම ලිඞ්ගයෙහි ද නොයෙක් ශබ්දයන්ගේ ප්‍රථමෛකවචනරූප නොයෙක් පරිද්දෙන් සිද්ධවනකලැ ඒ ඒ පදරූපගණනාවට ලිඞ්ග ගණනාවත් සැලකියයුතු වන හෙයිනි. මේ අතිප්‍රසඞ්ගදොෂයෙකි. හෙවත් අතිරෙක වූ බහුතරලිඞ්ගව්‍යවහාරයක් ඒ භවතුන් විසින් පිළිගත යුතුවීම යි. එහෙයින් හෙද අප්‍රමාණ යි. මෙසේ කිසිවකිනුත් දූෂ්‍ය නුවූ සිද්ධාන්තසඞ්ග්‍රහකාරමතය ම ස්වභාෂාලිඞ්ගභෙදයෙහි ප්‍රමාණත්වයෙන් දෘෂ්ටව්‍ය යි.

**පණින් හදන් යුත්- පවසනුයෙ පුමලිඟු වේ**
**සහයොන් සතුන් කියලූ- සද වේ ඉතිරිලිඟු නම්.** (2)
**බඹ සුර අසුර නර නා ගුරුළු පත් රිය ඈ පුමලිඟු.**
**දෙව්දූ නැයිනි ගුරුළුමෙමෙණෙවි*, අඹු සුහුල් ඈ ඉතිරිලිඟු.** (3)
**දිය දල ඇදුරු මේ- අඹරවි තුරු රණ හදන්**
**රෝ රා ගහ මරු දහන්- අග ගුම් සඳ රස රුවන්.**

## ප්‍රාණිවාචිශබ්දයන්ගේ ලිඞ්ගභෙදය.

(2) **ප**—හදන්යුත්, පුරුෂව්‍යඤ්ජනයෙන් යුක්ත වූ; **පණින්**, ප්‍රාණීන්; පවසනුයේ, ප්‍රකාශකරන්නා වූ (ශබ්දය) තෙම; **පුමලිඟු වේ**, පුංලිඞ්ගික වෙයි; සහයොන් සතුන්, යොනිසහිත සත්වයන්; කියලූ, කථනයකළා වූ; සද, ශබ්දතෙම; ඉතිරිලිඟු නම් වේ, ස්ත්‍රී ලිඞ්ගික නම් වේ.

(3) **ප**—බඹ, බ්‍රහ්මවාචි බඹශබ්දය; සුර, දෙවවාචි සුරශබ්දය; අසුර, දෛත්‍යවාචි අසුරශබ්දය; නර, මනුෂ්‍යවාචි නරශබ්දය; නා, නාගවාචි නාශබ්දය; ගුරුළු, ගරුඩවාචි ගුරුළුශබ්දය; පත්, පදාතිවාචි පත් ශබ්දය; රිය, රථිකවාචි රිය ශබ්දය යන; ඈ, (මේ) ආදිය; පුමලිඟු, පුංලිඞ්ගික යි.

දෙව්දූ, දෙවදුහිතෘවාචි දෙව්දූශබ්දය; නැයිනී, නාගීවාචි නැයිනීශබ්දය; ගුරුළුමෙමෙණෙවි, ගරුඩමාණවිවාචි ගුරුළුමෙමෙණෙවි ශබ්දය; අඹු, අඹිකාවාචි අඹුශබ්දය; සුහුල්, සවසෘවාචි සුහුල්ශබ්දය යන; ඈ, (මේ) ආදිය; ඉතිරිලිඟු, ස්ත්‍රීලිඞ්ගික යි.

**භා**—පුරුෂලක්ෂණයෙන් යුත් සත්වයන් ප්‍රකාශකරන්නා වූ ශබ්දය පුංලිංගික නම් වන්නේ ය. යොනිසඞ්ඛ්‍යාත ස්ත්‍රීලක්ෂණයෙන් යුත් සත්වයන් ප්‍රකාශකරන්නා වූ ශබ්දය ස්ත්‍රීලිංගික නම් වන්නේ ය.

**වි**—බඹශබ්දය ආදිකොට කියනලද පුරුෂප්‍රකාශක ශබ්ද පුංලිඞ්ගික ය. දෙව්දූශබ්දය ආදිකොට කියනලද ස්ත්‍රීප්‍රකාශක ශබ්ද ස්ත්‍රීලිඞ්ගික යි. මෙසේ ප්‍රකාශව්‍යඤ්ජනයොනි ඇත්තවුන්ට නම් වූ ශබ්දයන්ගේ ලිඞ්ගභෙදය කියා ඉක්බිති අප්‍රකාශව්‍යඤ්ජන යොනි ඇත්තවුන්ට නම් වූ ශබ්දයන් ද යථොක්ත භෙදඅවයෙහි ම සඞ්ග්‍රහ කරන්නෝ 'දියදලඇදුරු' යනාදි තුන් කව හා 'විදු ලිය වසා පෙළ' යනාදි කව ද කියත්.

## අප්‍රාණි පුංලිංගිකශබ්ද.

(4) **ප**—දිය, ජගත් ජය ජල යන අර්ථවාචි දියශබ්දය; දල, පත්‍ර ජල ජ්වාල අග්නි අඪ දන යන අර්ථවාචි දලශබ්දය; ඇදුරු, අද්‍රි

* 'ගුරුළුමමණෙවි' කියා ද පාඨ යි.

**පිරිකර පියබ මුනි- පා නිඳු කට වස් මස්**
**කෝ සර කර බණ මුළු- වත් සක් දිව් මැසි විසා.**

**පස් සස් ගුණ නගුල්- සත් සෝ බා ඇඹුල් ඈ**
**පුමලිඟුසඳන් පියසු- බුහුසු සඳනු දනුවෝ.** (4)

---

ආදර යන අර්ථවාචි ඇදුරුශබ්දය; (නොහොත්) ඈ, ආදිවාචි ඈ ශබ්දය; දුරු, ජීරක දූර යන අර්ථවාචි දුරුශබ්දය; මේ, මේෂ මෙහ මෙහන ඕදන කර්මාන්ත යන අර්ථවාචි මේ ශබ්දය; අඹර, ආකාශ වස්ත්‍ර යන අර්ථවාචි අඹරශබ්දය; අව්, ආවුධ ආතප යන අර්ථවාචි අව්ශබ්දය; තුරු, වෘක්ෂ තූර්‍ය්‍ය පක්ෂි සන්තෝෂ යන අර්ථවාචි තුරු ශබ්දය; රණ, යුද්ධ ශබ්ද යන අර්ථවාචි රණශබ්දය; හඳන්, ලිඞ්ග සඞ්කෘත යන අර්ථවාචි හඳන් ශබ්දය; රෝ, රෝග රෝෂ යන අර්ථ වාචි රෝ ශබ්දය; රා, රාග රාහු වර්ණ යන අර්ථවාචි රාශබ්දය; ගහ, ගෘහ ග්‍රහ අභිලාෂ යන අර්ථවාචි ගහ ශබ්දය; මරු, මාරුත මරණ නිර්ජලදෙශ වාලුකා යන අර්ථවාචි මරුශබ්දය; දහන්, ධ්‍යාන දහන යන අර්ථවාචි දහන් ශබ්දය; අඟ, අවයව කාරණ යන අර්ථවාචි අඟ ශබ්දය; ගුම්, ගුල්ම ග්‍රීෂ්ම ඝෝෂ යන අර්ථවාචි ගුම්ශබ්දය; සඳ, චන්ද්‍ර ඡන්ද ඡන්දස් සන්දෙහ සන්ධි යන අර්ථවාචි සඳශබ්දය; රස, මධුරාදි ශෘඞ්ගාරාදි පාරද යනාදි අර්ථවාචි රසශබ්දය; රූ, රූපවාචි රූ ශබ්දය; වන්, වර්ණවාචි වන්ශබ්දය; (නොහොත්) රුවන්, රත්නවාචි රුවන්ශබ්දය; පිරිකර, පරිෂ්කාරවාචි පිරිකර ශබ්දය; පියබ, ප්‍රගල්භවාචි පියබශබ්දය; මුනි, චින්තාවාචි මුනිශබ්දය; පා, පාද රශ්මි පාශ පාත්‍ර පාප වෘක්ෂ පාඨ ක්ෂීර යන අර්ථවාචි පාශබ්දය; නී, ඥාන නඛ නිධාන යන අර්ථවාචි නීශබ්දය; ඉඳු, චන්ද්‍ර ශ්‍රෙෂ්ඨ කර්පූර යන අර්ථවාචි ඉඳුශබ්දය; (නොහොත්) නිඳු, සමුද්‍රවාචි නිඳු ශබ්දය; කට, කණ්ඨ කාෂ්ඨ යන අර්ථවාචි කටශබ්දය; වස්, කුලවංශ වර්ෂ වර්ෂණ වෙණු යන අර්ථවාචි වස්ශබ්දය; මස්, මාංස මාස ශමශ්‍රු යන අර්ථවාචි මස්ශබ්දය; කෝ, කොශ ක්ෂෙත්‍ර කෙතක යන අර්ථ වාචි කෝශබ්දය; සර, ගමන නාද පද්ම ස්වර සරස් යන අර්ථ වාචි සර ශබ්දය; කර, හස්ත ක්‍රූර ක්ෂාර රශ්මි ශුල්ක යන අර්ථවාචි කර ශබ්දය; බණ, වචන ධර්ම බාණ යන අර්ථවාචි බණශබ්දය; මුළු, සමූහ සකල දුඃඛ යන අර්ථවාචි මුළුශබ්දය; වත්, වස්තු ප්‍රවෘත්ති වක්ත්‍ර වස්ත්‍ර මාර්ග සමර්ථ යන අර්ථවාචි වත්ශබ්දය; සක්, චක්‍ර ශඞ්ඛ සෙනා චක්ෂුස් යන අර්ථවාචි සක්ශබ්දය; දිව්, ද්වීප දීප ජීවිත යන අර්ථවාචි දිව්ශබ්දය; මැසි, මක්ෂිකා කොප යන අර්ථවාචි මැසිශබ්දය; විසා, දෙශගොචර යන අර්ථවාචි විසාශබ්දය; පස්, පාංශු පාර්ශ්ව පඤ්චසඞ්ඛ්‍යා පාශ ප්‍රත්‍යය යන අර්ථවාචි පස්ශබ්දය; සස්, සත්‍ය

**විදු ලිය වසා පෙළ- නිසා දේ ලද පැන පවස්**
**කිඩු බිම් මෙවුල් ඈ නම්-ඉතිරිලිඟු වි දන්නේ. (5)**

---

ශස්‍ය* යන අර්ථවාචි සස්ශබ්දය; ගුණ, ධර්ම අභ්‍යාස සූත්‍ර යන අර්ථවාචි ගුණශබ්දය; නගුල්, නඞ්ගලවාචි නගුල්ශබ්දය; සත්, සත්වගුණ ජීව ඡත්‍ර ශක්තු සප්තසඞ්ඛ්‍යා යන අර්ථවාචි සත්ශබ්දය; සෝ, ශ්‍රොත්‍ර ශ්‍රොතස් ශොක යන අර්ථවාචි සෝශබ්දය; බා, භාග්‍ය භාග බාහු යන අර්ථවාචි බාශබ්දය; ඇඹුල්, කඹල විශ්‍රාමශාලා ආමලකී අම්ලරස යන අර්ථවාචි ඇඹුල්ශබ්දය; ඈ, (මේ) ආදි නාමශබ්දයන්; සදතුදතුවෝ, ශබ්දවිඥයෝ; බුහුසු, භූයොවෘත්තියෙන්; පුම්ලිඟු සදන්, පුංලිඞ්ගිකශබ්දයන් (කොට); පියසු, ප්‍රකාශකළහ.

**භා**—දියශබ්දය ආදිකොට මෙහි දක්වූවන් හා ආදිශබ්දයෙන් දතයුතු සෙසු ශබ්දයනුදු බොහෝසෙයින් පුංලිඞ්ගයෙහි සංග්‍රහකොට වෛයාකරණයෝ දක්වූහ.

---

## අප්‍රාණී ස්ත්‍රීලිඞ්ගිකශබ්ද.

(5) **ප**—විදු, විද්‍යුත් විද්‍යු යන අර්ථවාචි විදුශබ්දය; ලිය, ලතා යෂ්ටි යන අර්ථවාචි ලියශබ්දය; වසා, මෙදස් මස්තෙල් රෝමරාජි යන අර්ථවාචි වසාශබ්දය; පෙළ, පාළි පීඩා පඞ්ක්ති යන අර්ථවාචි පෙළශබ්දය; නී, නීති නදී යන අර්ථවාචි නීශබ්දය; සා, ශාඛා ස්වාති ක්ෂුධා යන අර්ථවාචි සාශබ්දය; (නොහොත්) නිසා, රාත්‍රි හරිද්‍රා යන අර්ථවාචි නිසාශබ්දය; දේ, ජ්‍යොතිර්වාචි දේශබ්දය; ලද, ලජ්ජා ලබ්ධි යන අර්ථවාචි ලදශබ්දය; පැන, ප්‍රඥාවාචි පැන ශබ්දය; පවස්, පිපාසාවාචි පවස් ශබ්දය; කිඩු, ක්‍රීඩාවාචි කිඩු ශබ්දය; බිම්, භූමිවාචි බිම්ශබ්දය; මෙවුල්, මේඛලාවාචි මෙවුල් ශබ්දය යන; ඈ, නම්, (මේ) ආදි නාමතෙම; ඉතිරිලිඟුවී, ස්ත්‍රීලිඞ්ගික යයි කියා; දන්නේ, අවබොධකරන්නේ යි.

**භා**—විදුශබ්දය ප්‍රමුඛකොට මෙහි දක්වූවන් හා ආදිශබ්දයෙන් සංගෘහීත ශබ්දයනුදු ස්ත්‍රීලිංගයෙහි අන්තර්ගතකොට දතයුත්තේ ය.

**වි**—මෙහි ද 'බුහුසු' යන්නක් පෙර කවෙන් වැටෙන හෙයින් ප්‍රඥාවාචි වූ නැණශබ්දය මෙඛලාවාචි වූ කිඟුදම් ශබ්දය යනාදිය ස්ත්‍රීලිඞ්ගයෙහි නො වේ. මෙහි ඛාචිත්කව්‍යභිචාරය චිරන්තනව්‍යාඛ්‍යානකාරයන් විසින් ද සලකනලදී.

---

* පුරාතන ව්‍යාඛ්‍යායෙහි ශාපාවය ද කීහු

**අරූත්කිරියසද- ගුණසද ද වන ඉති අනූ**
**පුමසද ද ඉති පවසන- ඊ ඈ පස බුහුසු. (6)**

**තෙමන්නි මවන්නි තුස්නි මුස්නි ඈ අරූත්කිරියසදින් ඊපස, තෙමන්නෝ මවන්නෝ ඈ බුහුබසූ ඊපස ලොපා ඕවිබත් පැමිණාවූ සේ. (7)**

---

## සත්‍රීප්‍රත්‍යයවත්ශබ්ද.

(6) **ප**—අරූත්කිරියසද, අර්ථක්‍රියාවාචිශබ්ද ද; ගුණසද ද, ගුණවාචිශබ්ද ද; ඉතිඅනූ වන, සත්‍රීඅර්ථයෙහි වැටෙන්නේ වී නම්; පුමසද ද, පුංලිඞ්ගිකශබ්ද ද; ඉති පවසන, සත්‍රීඅර්ථය ප්‍රකාශ කරන්නේ වී නම්; බුහුසු, භූයොවෘත්තීන් (=බොහෝසෙයින්); ඊඈපස, ඊ ආදි ප්‍රත්‍යය (වේ.)

**භා**—යට විංශතිවිධව්‍යාකරණවිධිවර්‍ණනාවසරයෙහි දක්වූ ප්‍රකාර ඇති අර්ථක්‍රියාශබ්දයක් හෝ ගුණවාචිශබ්දයක් හෝ පුරුෂවාචිශබ්දයක් හෝ සත්‍රීලිංගවාච්‍ය කොට කිවමනා කල්හි පුරුෂලිංගික වූ ඔවුන් කෙරෙන් සත්‍රීඅර්ථයෙහි ඊ ආදි ප්‍රත්‍යය බොහෝසෙයින් කටයුතු වේ.

---

## සත්‍රීලිඞ්ගික අර්ථක්‍රියාශබ්ද.

(7) **ප**—තෙමන්නී, (ප්‍රශංසා කරන්නී ය යන අර්ථ ඇති) තෙමන්නී ය; මවන්නී, (නිර්මිතකරන්නී ය යන අර්ථ ඇති) මවන්නී ය; තුස්නී, (තුෂ්ටවන්නී ය යන අර්ථ ඇති) තුස්නී ය; මුස්නී, (මුක්තකරන්නී ය=ගලවන්නී ය යන අර්ථ ඇති) මුස්නී ය; ඈ, (මේ) ආදිය; අරූත්කිරියසදින්, අර්ථක්‍රියා ශබ්දයා කෙරෙන්; ඊපස, (සත්‍රීඅර්ථයෙහි) ඊප්‍රත්‍යය යි; තෙමන්නෝ මවන්නෝ ඈ, තෙමන්නෝ මවන්නෝ යනාදිය; බුහුබසූ, බහුවචනයෙහි; ඊපස ලොපා, ඊප්‍රත්‍යය ලොප්කොට; ඕවිබත් පැමිණාවූ සේ, ඕවිභක්තිය පැමිණවූ ආකාර යි.

**වි**— **තෙම** = පැසැස්මෙහි, **මව** = දිනීමෙහි, **තුස** = තොස්හි, **මුද** = ගැලවීමෙහි යන ධාතූන් කෙරෙන් අන්නේප්‍රත්‍යය ද නේප්‍රත්‍යය ද යුක්තස්ථානයෙහි විපර්‍යාසාදෙශවිධි ද කොට, පසවත් නම්වත් කළ කල්හි තෙමන්නේ, මවන්නේ, තුස්නේ, මුස්නේ, යන පුංලිඞ්ගික අර්ථක්‍රියා ශබ්දයන්ගේ සිද්ධිය වේ. ඉක්බිති ඔවුන් කෙරෙන් **අරූත්කිරියසද** යනාදි උපාඞ්ගසූත්‍රයෙන් සත්‍රීඅර්ථයෙහි ඊප්‍රත්‍යය කොට පූර්වස්වරලොපසන්ධියෙන් ගළපා නම්වත් කොට ප්‍රථමා විභක්ත්‍යන්තකිරීමෙන් "තෙමන්නී මවන්නී තුස්නී මුස්නී" යනු සිද්ධ යි.

**හෙළිල්ලි කොමළි ගොරි ඈ ගුණසදින් ඊපස.** (8)

**නිළි නැසිනි පැටි සැතිරි කුමරි සෙහෙළි මැහැලි ඈ ඉති අරුත් පුමසදින් ඊපස.** (9)

---

විභක්ති විසින් ස්ත්‍රීප්‍රත්‍යයාගේ අදශිතය වනපරිදි දක්වන් නාහු **තෙමන්නෝ** යනාදිය උදාහරණ කළහ. **තෙමන්නී, මවන්නී,** යන ඊකාරාන්ත ප්‍රකෘතීන් කෙරෙන් ඕ විභක්තිප්‍රත්‍යය කොට ඊකාරය ලොප්කොට ඕකාරය ශාත්‍රාක්ෂරයට පැමිණවූ කල **'තෙමන්නෝ මවන්නෝ'** යන රූපයන්ගේ සිද්ධිය වේ. මෙයින් ඔවුන්ගේ බහුවචනරූපය පුංලිඞ්ගිකරූපය හා සමාන බැව් දක්වූහ. මෙකල සමහරු **'තෙමන්නියෝ මවන්නියෝ'** යනාදීන් ද ස්ත්‍රී අව් ප්‍රථමාබහුවචන රූපයන්ගේ සිද්ධියක් සලකති. හේ නොමැනවි. ඡේකව්‍යවහාරයෙහි එබඳු ප්‍රයෝගයක් නො පැනෙන හෙයිනි.

---

### ස්ත්‍රීලිඞ්ගික ගුණශබ්ද.

(8) **ප**—හෙළිල්ලී, (එළලුස්ත්‍රිය යන අර්ථයෙහි) හෙළිල්ලී ය; කොමළී, (කොමලස්ත්‍රිය යන අර්ථයෙහි) කොමළී ය; ගොරී ඈ, (ගෞරස්ත්‍රිය යන අර්ථයෙහි) ගොරී ය යනාදිය; ගුණසදින්, ගුණශබ්දයා කෙරෙන්; ඊපස ඊප්‍රත්‍යය යි.

**භා**—**හෙළලු, කොමල, ගොර** යනාදි ශබ්දයෝ පුංලිංගික ගුණශබ්දයෝ වෙති. ඔවුන් කෙරෙන් ස්ත්‍රීඅර්ථයෙහි ඊප්‍රත්‍යය කොට සන්ධිවිධියෙහි කී නියායෙන් ගැළපීමෙන් **'හෙළිල්ලි'** යනාදිය සිද්ධ යි.

මෙහි **ගොර**ශබ්දය මාගධ (දීඝාදි) **'ගොර'** ශබ්දයෙන් බිඳී ආ ශබ්දයෙකි. කිසි පොතෙක **'ගෝරී'** යි දීඝාදි ව ද පැනේ. එසේ කලැ තත්සමශබ්දයෙකැයි සැලකියයුතු වේ.

---

### පුරුෂලිඞ්ගිකයෙන් සිද්ධ ස්ත්‍රීලිඞ්ගිකශබ්ද.

(9) **ප**—නිළී (නටන ස්ත්‍රිය යන අර්ථයෙහි) නිළි ය; නැසිනී, (නාගිනී හෙවත් සැපිනී යන අර්ථයෙහි) නැසිනී ය; පැටී,(පොතිකා යන අර්ථයෙහි) පැටී ය; සැතිරී, (සතුරු ස්ත්‍රී ය යන අර්ථයෙහි) සැතිරී ය; කුමරී; (කුමාරී යන අර්ථයෙහි) කුමරී ය; සෙහෙළී, (සහළු ස්ත්‍රිය යන අර්ථයෙහි) සෙහෙළි ය; මැහැලි ඈ (මහලු ස්ත්‍රිය යන අර්ථයෙහි) මැහැලී ය යනාදිය; **ඉතිඅරුත්,** ස්ත්‍රීඅර්ථයෙහි වූ; **පුමසදින්,** පුරුෂ වාචකශබ්දයා කෙරෙන්; **ඊපස,** ඊප්‍රත්‍යය යි.

**වි**—මාගධ සංස්කෘත දෙක්හි ම 'නට' යනු නටන පුරුෂයාහට නම්. එය එළුවට 'නළ' කියා තද්භව වේ. මෙසේ පුරුෂවාචක නළශබ්දය ස්ත්‍රීවාචක කළමනා තැන එයින් පර වැ

**ඇසඳින් කැළි වැසි මියුලැසි කළා දුනූ ඈ සිදු. බුහුසුසඳින් වහර නොලහනු රුසි.** (10)

---

ඊප්‍රත්‍යය කොට පූර්වස්වරලෝපය ද පිළිපෙරැළි ද කළ කල්හි නිළි යනු වේ. පුරුෂවාචක නාසිශබ්දයා කෙරෙන් ස්ත්‍රීඅර්ථයෙහි ඊප්‍රත්‍යය කොට ඊකාරයෙන් පූර්වයෙහි නකාරාගම කොට පූර්ව නකාරස්ථ අකාරය හට මාත්‍රාංශවෘද්ධිකිරීමෙන් 'නෑසිනි' යනුවේ.

පුරුෂවාචක **පැමි**, කුමර ශබ්දදෙකින් පර වැ ඊප්‍රත්‍යය කිරීමෙන් **පැමි, කුමරී** යනු සිද්ධ සි. ෂැකිරි යන්නෙහි සතුරුශබ්දයෙන් පර වැ ඊප්‍රත්‍යය කළකලැ මාත්‍රාංශවෘද්ධි හා ස්වරවිපර්‍යාසය වෙයි. එසේ ම සහළුශබ්දයෙන් ඊප්‍රත්‍යය කළකලැ ස්වරවිපර්‍යාසය ද, මහලුශබ්දයෙන් ඊ ප්‍රත්‍යය කළකලැ මාත්‍රාංශවෘද්ධි ද වේ.

(10) **ප**—ඇසඳින්, ('අරුෂ්කිමිසඳ' යනාදි සූත්‍රයෙහි) ඈ ශබ්දයෙන්; කැළි, කළුපැහැ ඇත්තී යන අර්ථයෙහි කැළි ය; වැසි (ගවාදීන්ගේ) ළඳරු තැනැත්තී යන අර්ථයෙහි වැසි ය; මියුලැසි, මුවගනන්ගේ (ඇස්) වැනි ඇස් ඇත්තී යන අර්ථයෙහි මියුලැසි ය; කළා, කළු තැනැත්තී යන අර්ථයෙහි කළා ය; දුනූ; ජනිත වූ තැනැත්තී යන අර්ථයෙහි දුනූ ය යන; ඈ, (මේ) ආදිය; සිදු, සිද්ධ සි. බුහුසුසඳින්, (සූත්‍රයෙහි) බුහුසු ශබ්දයෙන්, වහර නො ලහනු, ව්‍යවහාරෝල්ලඞ්ඝනය නො කිරීම; රුසි, අභිමත සි.

**වි**—කළු, වසු, මියුලැස්, යන ශබ්දයන් ස්ත්‍රීඅර්ථයෙහි වැටෙන කල්හි උපාඞ්ගසූත්‍රයෙහි කි ඈ ශබ්දයාගේ සාමර්ථ්‍යය කාරණකොට ගෙන ඔවුන් කෙරෙන් ස්ත්‍රීඅර්ථයෙහි ඉප්‍රත්‍යය කොට සුදුසු තැන මාත්‍රාංශවෘද්ධි ද කළ කල්හි **'කැළි වැසි මියුලැසි'** යනු සිද්ධ සි. **'කළා, දුනූ'** යන දෙතැන කර කිරීමෙහි, දන–දිනීමෙහි යන ධාතුන් දෙදෙනා කෙරෙන් පසරුත් අදියරෙහි දක්වන 'දයින් නෙමෙන්' යනාදි උපාඞ්ගසූත්‍රයෙන් කර්තෘකාරකයෙහි අප්‍රත්‍යය ද උප්‍රත්‍යය ද කොට ධාතු ඍකාරයහට අඞ්ගසූත්‍ර සාමර්ථ්‍යයෙන් ළිකාරාදෙශ හා දනධාතුහට පිළිපෙරැළි ද කිරීමෙන් 'කළ, දුනු' යි සිදු වූ කල්හි ස්ත්‍රීඅර්ථයෙහි වැටෙන්නා වූ මොවුන් කෙරෙන් ආප්‍රත්‍යය ද ඌප්‍රත්‍යය ද කොට 'කළා, දුනූ'යි සිද්ධකටයුතු සි. ඒ ඒ ශබ්දයන් කෙරෙන් වියයුතු ස්ත්‍රීප්‍රත්‍යයන් සඳහා ප්‍රකෘති නියමයක් මාගධ සංස්කෘතාදියෙහි මෙන් මෙහි නොදක් වූ හෙයින් ඡේකප්‍රයෝගානුසාරයෙන් ම විමසා කටයුතු බැවි සූත්‍රයෙහි කියනලද භූයොවෘත්තියෙන් සැලකිය යුතු.

ත ම එ මෙ ද රමණී--දිගු සව් තුරුණු මුදු ලොල්
හැළි ඇලැ ගුණසද ද--දෙලිඟු සම වි දන්නේ. (11)

අරුත්කිරියසද--තමරුත් වැනි ලිඟු බෙජේ
යනු එනු මැඟුම් ඈ හව්--කිරියසද වේ පුමරුත්. (12)

කිරියවෙසෙසුන් සද—නිතිනුබඳ රිසිසේ ඈ
විස්සල් ඉරා යොරයොර—පුන තුඹුවු සිණි සහසා.

සු ඉනි සළු සැර රබ—ඉඟි නිගියැ සද නිපා
අනු උ සිරි ස ප නි දු ඈ—උපසග ද වේ ලිඟුමුත්. (13)

---

## ද්විලිඞ්ගසමශබ්ද.

(11) ප—ත, යුෂ්මද්ශබ්දාර්ථ වූ ත ය; ම, අස්මද්ශබ්දාර්ථ වූ ම ය; එ, තද්ශබ්දාර්ථ වූ එ ය; මෙ ද, ඉදම්ශබ්දාර්ථ වූ මෙ යනු ද; රමණී, සිත්කලු යන අර්ථ ඇති රමණී ය; දිගු, දීර්ඝශබ්දාර්ථ වූ දිගු ය; සව්, සර්ව ශබ්දාර්ථ වූ සව් ය; තුරුණු, තරුණ ශබ්දාර්ථ වූ තුරුණු ය; මුදු, මෘදු ශබ්දාර්ථ වූ මුදු ය; ලොල්, ලොලශබ්දාර්ථ වූ ලොල් ය; හැළි, ධවල ශබ්දාර්ථවූ හැළිය; ඇල්, ශිතලාර්ථ වූ ඇල් ය; ඈ යනාදි වූ; ගුණසද ද, ගුණවාචිශබ්ද ද; දෙලිඟුසම වි, ද්විලිඞ්ගසම යයි කියා; දන්නේ, ජානතය කරන්නේ ය.

හා—ත්වාප යන අර්ථයෙහි තුශබ්දය, අප යන අර්ථයෙහි මශබ්දය, එ යන අර්ථයෙහි එ ශබ්දය, මෙ යන අර්ථයෙහි මෙශබ්දය යන මොහු ද, ගුණයක් ප්‍රකාශකරනසුලු වූ රමණී ආදි ගුණශබ්ද ද ලිඞ්ගවශයට සමාන වෙත්, ඔව්හු ස්ත්‍රීප්‍රත්‍යය නැති ව ම ස්ත්‍රීඅර්ථය ද ප්‍රකාශනකරෙති යි සේයි.

## ක්‍රියාශබ්දයන්ගේ ලිඞ්ගභෙදය.

(12) ප—අරුත්කිරියසද, අර්ථක්‍රියාවාචිශබ්දය තෙම; තමරුත් වැනි, ස්වකීය වාච්‍යයට බඳු වූ; ලිඟු, ලිඞ්ගය; බෙජේ, භජනය කෙරේ; යනු එනු මැඟුම් ඈ; (යාම්; ඊම්, බැලීම් යන අර්ථ ඇති) යනු එනු මැඟුම් යනාදි වූ; හව්කිරියසද, භාවක්‍රියාවාචි ශබ්දය තෙම; පුමරුත් වේ, පුංලිඞ්ගාර්ථ ඇත්තේ වේ.

හා—අර්ථක්‍රියාශබ්දයෝ ක්‍රියාව ද එය කරන කර්තෘහු ද ප්‍රකාශකරන්නාහු වෙත්. එහෙයින් ඔවුන්ගේ වාච්‍යයෙන් (-අර්ථයෙන්) පුරුෂයෙක් ප්‍රකාශ වී නම් ඒ අර්ථක්‍රියා ශබ්දයෝ පුරුෂලිංගික වෙති. ස්ත්‍රියක් ප්‍රකාශ වූ නම් ස්ත්‍රීලිංගික වෙත්. **'යනු එනු මැඟුම්'** යනාදි භාවක්‍රියා ශබ්දයෝ ධාත්වර්ථ මාත්‍රයක් ම (-ක්‍රියාමාත්‍රයක් ම) ප්‍රකාශ කෙරෙති. එහෙයින් ඔව්හු නිත්‍යයෙන් පුරුෂලිංගිකයෝ ම වෙත්.

සංස්කෘත, මාගධ දෙක්හි භාවක්‍රියාවන්ගේ නපුංසකත්වය දක්වූ හෙයින් මෙහි ඒ නපුංසකලිඞ්ගය ද පුංලිඞ්ගයෙහි ම සඞ්ගෘහිත යි.

## අලිඞ්ගශබ්ද.

(13) ප—නිතිනුබඳ රිසිසේ ඈ, නිති-අනුබඳ-රිසිසේ-යනාදි වූ; කිරියවෙසෙසුන් සද, ක්‍රියාවිශෙෂණ ශබ්ද ද; විස්සල් ඉරා යොර

**සුවසේ ඈ ගුණෙන් කිරිය වෙසෙසන බැවින් කිරියවෙසෙසුන්සද නම්.** (14)

---

යොර පුන තුඹුටු සිණි සහසා, විස්සල්-ඉරා-යොරයොර-පුන-තුඹුටු-සිණි-සහසා-යන (නිපාත) ශබ්ද ද; සු ඉති යළ සැර රඹ ඉහි නිහිය, සු-ඉති-යළ-සැර-රඹ-ඉහි-නිහිය-යනාදිවූ; නිපාසද, නිපාතශබ්ද ද; අනු උ පිරි ස ප නි දු ඈ, අනු-උ-පිරි-ස-ප-නි-දු යනාදි වූ; උපසග ද, උපසර්ගශබ්ද ද; ලිහුමුත් වේ, ලිඞ්ගමුක්ත වේ.

වි—නිති, අනවරත ය; අනුබඳ, නිරන්තර ය; රිසිසේ, රුචි පරිද්දෙන් ය යන අර්ථයි. මේ ආදීහු ක්‍රියාවිශෙෂණශබ්ද නම් වෙත්. ඊට හෙතු දක්වන චිරන්තන ව්‍යාඛ්‍යානකාරයෝ "නිති වැඩ දේ' යනාදියෙහි සුවසේ, නිති යන මේ ආදි ශබ්ද තෙමේ සාමාන්‍ය ක්‍රියාව ලක්‍ෂණාන්තරයෙකින් වෙසෙසානුයි ක්‍රියාවිශෙෂණශබ්ද නම් වේ. ඒ අන්‍යයන් විසින් නපුංසකලිඞ්ගෛකවචන කොට කල්පිත යැ. මෙහි වනාහි නපුංසකලිඞ්ග ව්‍යවහාර නැති හෙයින් අව්‍යක්තලිඟු නම් වෙයි'' යනු කිහු. මේ උදාහරණ කළා වූ 'නිති වැඩ දේ' යන්නෙහි නිතර වෘද්ධිදානය කෙරෙයි කියා අර්ථ ගත් කලැ නිතර යන අර්ථ ඇති නිති ශබ්දයෙන් දාන ක්‍රියාව අතරතුර නො පැවත නිත්‍යකාලයෙහි ම පවත්නා බැව් ප්‍රකාශකරනලද්දේ වේ. කලින් කල ද පැවැත්විය හැකි දාන ක්‍රියාව නිත්‍යප්‍රවෘත්ත භාවයෙන් වෙනස්කොට ගන්නාහෙයින් නිති යනු ක්‍රියාවිශෙෂණ නම් වී. මෙවැනි ක්‍රියාවිශෙෂණයන්ගේ නපුංසකලිඞ්ගික එකවචනත්වය අන්‍ය ව්‍යාකරණාචාර්යයන්ට අභිමත ය. හේ මෙහි අලිඞ්ග සඞ්ඛ්‍යාවට ගන්නාලදි.

විස්සල්, ශීඝ්‍රාර්ථ නිරන්තරාර්ථ දෙක්හි ය; ඉරා, අධිකාර්ථයෙහි ය; යොරයොර, නැවත නැවත යන අර්ථයෙහි ය; පුන, නැවත යන අර්ථයෙහි ය; තුඹුටු, ශීඝ්‍රාර්ථයෙහි ය; සිණි, අශීඝ්‍රාර්ථයෙහි ය; සහසා, ශීඝ්‍රාර්ථයෙහි ය; සු, ශොභනාද්‍යර්ථයෙහි ය; ඉති, පරිසමාප්ත්‍යාදියෙහි ය; යළ, නැවත යන අර්ථයෙහි ය; සැර, චිරකාලාර්ථයෙහි ය; රඹ, ආරම්භාර්ථයෙහි ය; ඉහි, එක් ව යන අර්ථයෙහි ය; නිහිය, පහත් යන අර්ථයෙහි යි.

(14) ප—සුවසේ ඈ, සුවසේ යනාදිය; ගුණෙන්, ගුණයෙන්; කිරිය වෙසෙසන බැවින්, ක්‍රියාව විශෙෂණය කරනබැවින්; කිරිය වෙසෙසුන්සද නම්, ක්‍රියාවිශෙෂණශබ්ද නම් වේ.

වි—'සුවසේ සිටිති' යනාදි තන්හි සිටිති යනු ක්‍රියාපද යැ. මේ ක්‍රියාපදයෙන් කියනලද සිටීම දුකසේ හෝ සුවසේ හෝ මැදහත්

**හිඟුම්, නිකුත්, ව, වැනි, වනාහි, කලි, නම්, විනා, වෙන, පු, හු, ල, ලු, ද, මැ, න, කි, කිම්, හොත, යම්සේ, එසේ, මෙසේ, සහ, අද, එදා, ඈ නිපාසද නම්.** (15)

**ප, පගා * ඈහි. පර, පැරැදූ ඈහි. අව, අවසේ ඈහි. ස, සබඳ ඈහි. අනු, අනුදුනැ ඈහි. නි, නිරෙද නිරසක් ඈහි. දු, දුලද ඈහි, වි, විලස් ඈහි. අ, අදර ඈහි. අදි, අදියර ඈහි. සු, සුබැසි ඈහි. උ, උලැඟි ඈහි. අබි, අබිසෙස් ඈහි. පිරි, පිරිබුන්**

---

සේ හෙව් වියහැකි යි. එසේ නොයෙක් ප්‍රකාරයෙන් වියහැකි ක්‍රියාර්ථය 'සුවසේ' යනාදි ශබ්දයන් විසින් අනික් ප්‍රකාරයක් විය නොදී වෙන්කොට 'සැප වූ' සිටීමෙකැයි යනාදීන් වෙසෙසනු ලැබේ. එහෙයින් සුවසේ යනාදිය ක්‍රියාවිශෙෂණශබ්ද නම් වේ.

(15) ප—හිඟුම්, ශීඝ්‍රාර්ථයෙහි හිඟුම් ය; නිකුත්, නිෂ්ක්‍රාන්තාර්ථයෙහි නිකුත් ය; ව, අසමද්ශබ්දාර්ථයෙහි ව ය; වැනි, උපමාද්‍යෝතනයෙහි වැනි ය; වනාහි, කලි, පදපූරණාදියෙහි වනාහි-කලි-දෙක ය; නම්, පරිකල්පකොපාද්‍යර්ථයෙහි† නම් ය; විනා, වර්ජනයෙහි විනා ය; වෙන, අන්‍යාර්ථයෙහි වෙන ය; පු, හු, පදපූරණාදියෙහි පු-හු දෙක ය; ල, ලු, ශ්‍රැතිසූචනයෙහි ල-ලු දෙක ය; ද, සමුච්චයෙහි ද ය; මැ, අවධාරණයෙහි මැ ය; න, නිෂෙධයෙහි න ය; කි, කිම්, ප්‍රශ්නයෙහි කි-කිම් දෙක ය; හොත, අනියමාර්ථයෙහි හොත ය; යම්සේ, යථාශබ්දාර්ථයෙහි (=යම් ප්‍රකාරයෙකින් යන අර්ථයෙහි) යම්සේ ය; එසේ, තථාශබ්දාර්ථයෙහි (=ඒ ප්‍රකාරයෙන් යන අර්ථයෙහි) එසේ ය; මෙසේ, එවම්ශබ්දාර්ථයෙහි (=මේ ආකාරයෙන් යන අර්ථයෙහි) මෙසේ ය; සහ, සහිතාර්ථයෙහි සහ ය; අද, ඉදම්කාලාර්ථයෙහි අද ය; එදා, තත්කාලාර්ථයෙහි එදා ය; ඈ, මේ ආදිය; නිපාසද නම්, නිපාතශබ්ද නම්.

---

(16) ප—ප, ප යන උපසර්ගය තෙම; පගා ඈහි (ප්‍රග්‍රහ ගැන්ම යන අර්ථ ඇති) පගා යනාදි ප්‍රයොගයෙහි ය; පර, පර යන උපසර්ගය; පැරැදූ ඈහි (පරාජිත වැ යන අර්ථ ඇති) පැරැදූ යනාදියෙහි ය; අව, අව යන උපසර්ගය; අවසේ ඈහි (අවශ්‍යාය=පිනි යන

---

* පහා යන්න අශුද්ධපාඨය යි හඟිමු. පුරාතන ව්‍යාඛ්‍යායෙහි 'ප්‍රග්‍රහ යන අර්ථ යි' කී හෙයින් ද මෙහි ශුද්ධපාඨය 'පගා' යයි ම විය යුතු බව පැනේ.

† "නාම කොපෙ'භ්‍යුපගමෙ විස්මයෙ ස්මරණෙ'පි ච
සම්භාව්‍යකුත්සාප්‍රාකාශ්‍යවිකල්පෙෂ්වපි දෘශ්‍යතෙ"-මෙදිනී.

**ඇඟි. උප, උපේ උවසර ඇඟි. අප, අපදන් පහ වැ ඇඟි. පස්, පසක් රුකක් පාසා ඇඟි. පිළි, පිළිලැබැ ඇඟි. අති, ඉතිරි ඉබොහෝ ඉකුත් ඇඟි. පි, පිහිකුළු ඇඟි. මෙවිසි උපසගසද නම්.** (16)

## ලිඟුඅදියර තුන්වනු.

---

අර්ථ ඇති) අවසේ යනාදියෙහි ය; ස, ස යන උපසර්ගය; සබඳ ඇඟි (සම්බන්ධය යන අර්ථඇති) සබඳ යනාදියෙහි ය; අනු, අනු යන උපසර්ගය; අනුදූනැ ඇඟි, (අනුඥ කොට යන අර්ථ ඇති) අනුදූනැ යනාදියෙහි ය; නි, නි යන උපසර්ගය; නිරොද, නිරසක් ඇඟි, (නිරොජස්ක, නිරාශඞ්ක යන අර්ථ ඇති) නිරොද, නිරසක් යනාදියෙහි ය; දු, දු යන උපසර්ගය; දුලද ඇඟි, (දුර්ලබධ යන අර්ථ ඇති, දුලද යනාදියෙහි ය; වි, වි යන උපසර්ගය; විලස් ඇඟි, (විලාසය යන අර්ථ ඇති) විලස් යනාදියෙහි ය; අ, අ යන උපසර්ගය; අදර ඇඟි, (ආදරය, ආධාරය යන අර්ථ ඇති) අදර යනාදියෙහි ය; අදි, අදි යන උපසර්ගය; අදියර ඇඟි, (අධිකාර යන අර්ථ ඇති) අදියර යනාදියෙහි ය; සු, සු යන උපසර්ගය; සුබැසි ඇඟි, (සුභාෂිත යන අර්ථ ඇති) සුබැසි යනාදියෙහි ය; උ, උ යන උපසර්ගය; උලැඟි ඇඟි, (උල්ලඞ්ඝිත යන අර්ථ ඇති) උලැඟි යනාදියෙහි ය; අබි, අබි යන උපසර්ගය; අබියෙස් ඇඟි, (අභ්‍යාසාදි අර්ථ ඇති) අබියෙස් යනාදියෙහි ය; පිරි, පිරි යන උපසර්ගය; පිරිබුන් ඇඟි, (පරිභග්න, පරිභුග්න යන අර්ථ ඇති) පිරිබුන් යනාදියෙහි ය; උප, උප යන උපසර්ගය; උපේ, උවසර ඇඟි, (උපෙක්ෂා, උපචාර යන අර්ථ ඇති) උපේ උවසර යනාදියෙහි ය; අප, අප යන උපසර්ගය; අපදන්, පහ වැ ඇඟි, (අපාදන ය, පහ වැ ය යන අර්ථඇති) අපදන් පහ වැ යනාදියෙහි ය; පස්, පස් යන උපසර්ගය; පසක් රුකක් පාසා ඇඟි, (ප්‍රත්‍යක්ෂ ය, වෘක්ෂයක් පාසා ය යන අර්ථ ඇති) පසක් රුකක් පාසා යනාදියෙහි ය; පිළි, පිළි යන උපසර්ගය; පිළිලැබ ඇඟි, (ප්‍රතිලාභ යන අර්ථ ඇති) පිළිලැබ යනාදියෙහි ය; අති, අති යන උපසර්ගය; ඉතිරි, ඉබොහෝ, ඉකුත් ඇඟි, (අතිරික්ත, අතිබහුල, අතික්‍රාන්ත යන අර්ථ ඇති) ඉතිරි, ඉබොහෝ, ඉකුත් යනාදියෙහි ය; පි, පි යන උපසර්ගය පිහිකුළු ඇඟි, (ප්‍රතිච්ඡන්න යන අර්ථ ඇති) පිහිකුළු යනාදියෙහි ය; මෙවිසි, මේ විංශතිවිධ වූ ශබ්දගණය තෙම; උපසගසද නම්, උපසර්ගශබ්ද නම්.

වි—මෙහි දක්වනලද උපසර්ගයන්ගේ අර්ථවිශෙෂය මීට සමාන වූ ද ප්‍රභව වූ ද සංස්කෘත මාගධ උපසර්ගයන්ගේ අර්ථ වූ නියායෙන් දතයුත්තේ ය. මොවුන් අතුරෙහි "අව, අනු, නි, වි, සු, උප, අප, අති" යන ශබ්දයෝ සංස්කෘත මාගධ උපසර්ගයන් හා සමාන හෙයින් තත්සම වෙති. ප, උ, දු, ශබ්දත්‍රය ද මාගධ උප

**සඳහු දෙවැදෑරුම්—සරඅත් හලත් වෙසෙසින්**
**බුහුසු සියලු විබතේ—ඒ දෙක සියරු නො පියා.** (1)

---

සර්ගයන් හා සාම්‍යයෙන් තත්සම ය. සෙසු නවය හෙවත් "පර ස, අ, අදි, අබි, පිරි, පස්, පිළි, පි" යනශබ්දයෝ "පරා, සං, ආ, අධි, අභි, පරි, පති (=පටි), අපි" යනශබ්දයන් ප්‍රභවකොට ඇති හෙයින් තද්භව වෙත්. පටි යනු පතිශබ්දයාගේ ම ආදෙශරූපයෙකි. පිළි යනු එයින් හෙදවී යයි සැලකිය යුතු.

සංස්කෘතාදියෙහි මෙන් ස්වභාෂායෙහි ද උපසර්ගයන්ගේ ගතිය (=පැවැත්ම) ත්‍රිවිධ වේ. උපසර්ගපදය තෙමේ නාම ආඛ්‍යාත පදයන්ගේ පූර්වභාගයෙහි ඔවුන් හා උපසෘෂ්ට ව (=හැනී වැලඳ) සිටිනේ කිසිතැනෙක්හි තත්සම්බන්ධ පදයාගේ අර්ථයට බාධක වද, කිසිතැනෙක්හි ඊට අනුවර්තක ව ද, කිසිතැනෙක්හි විශෙෂාර්ථ ද්‍යොතක ව ද සිටිනේ ය. නිපාත ශබ්දයෝ වනාහි පදයන්ගේ අතරතුර නිපතිත වැ අතික් තුන්පරිද්දෙකින් පවතිත්.

ශ්‍රීභර්තෘහරීන් විසින් වාක්‍යපදීයයෙහි:-

"නිපාතා ද්‍යොතකාඃ කෙචිත් පෘථගර්ථාභිධායකාඃ,
ආගමා ඉව කෝ'පි ස්‍යුර්නිරර්ථාඃ සමුදීරිතාඃ"

ඇතැම් නිපාතකෙනෙක් ධාත්වර්ථද්‍යොතක වෙති. ඇතම්හු අන්‍යාර්ථවාචක වෙති. ඇතම්හු ආගමජවර්ණයන් මෙන් නිරර්ථක ද වෙතැයි කියනලදි.

මේ මෙහි දිඬ්මාත්‍ර යි. විස්තර ව්‍යාකරණග්‍රන්ථාන්තරයෙන් දතයුතු.

**නාමිකාධ්‍යාය වූ ලිඞ්ගාධිකාරය යි.**

---

## විභක්ත්‍යධිකාරය.

(1) **ප**—සඳහු, ශබ්දයෝ තුමූ; සරඅත්, ස්වරාන්තයන; හලත්, හලන්තයන යන; වෙසෙසින්, විශෙෂයෙන්; දෙවැදෑරුම්, ද්විවිධ වෙති; එදෙක, ඒ (ස්වරාන්ත හලන්ත ශබ්ද) ද්වය තෙමේ; සියලු විබතේ, සකල විභක්ති විෂයෙහි; බුහුසු, භූයොවෘත්තියෙන්; සියරු, ස්වරූපය; නො පියා, නො හරී.

භා—සිංහල භාෂායෙහිදු (සංස්කෘත භාෂායෙහි මෙන්) ස්වරාන්ත හලන්ත හෙදයෙන් ශබ්දයෝ ද්විවිධවන්නාහු ය. ඒ දෙපක්ෂය ම බොහෝ හෙයින් සියලු විභක්තීයෙහි ස්වකීය ශබ්දරූපය අත්නොහැර සිටිති. විභක්ති ප්‍රත්‍යය නිසා රූපභෙදයකට නොපැමිණෙයි සේයි.

**දම්රජ දන්වා මුනි සෑසි මරරුපු බු හේ යෝ සිදුහත් ඈ පුමලිඟු, නිස වසා සිරි ගි විදු දූ ලේ ජ්‍යේ කත් ඈ ඉතිරිලිඟු. (2)**

**බජනුයෙ පෙරවිබත්-නොවෙසෙසි පදන වුතුවන**
**එකබසැ එ ආ වනුයේ-යළ ඕ හු වෙ බුහුබසැ. (3)**

---

**වි**—මාගධ සංස්කෘතාදි භාෂාවන්හි ශබ්දයෝ සියලු විභක්ති වල ම ප්‍රකෘතිරූපයෙන් නො සිටිති. ස්වභාෂායෙහි වූකලි බොහෝ සෙයින් ශබ්දයන්ගේ ප්‍රකෘතිරූපයෝ ම (ප්‍රකාරාන්තරයකට නො පැමිණ) සියලු විභක්ත්‍යර්ථයන් ප්‍රකාශකෙරෙත්. මේ වනාහි යට දැක්වූ විංශතිවිධියෙහි 'අවිදුමන්විදි' නම් වූ ව්‍යාකරණවිධිය වේ.

ඉක්බිති ස්වරාන්ත හලන්ත ද්විභෙදයෙහි ම ශබ්දයන්ට උදාහරණ දක්වන්නෝ "දම්රජ" යනාදිය කියත්.

(2) **ප—දම්රජ, ධර්මරාජවාචි වූ දම්රජ ශබ්දය; දන්වා, දානව වාචි වූ දන්වා ශබ්දය; මුනි, සර්වඥදිවාචි වූ මුනිශබ්දය; සෑසි, ශාක්‍යසිංහවාචි වූ සෑසිශබ්දය; මරරුපු, මාරශත්‍රෘ වාචි වූ මරරුපු ශබ්දය; බු, භූතවාචි වූ බු ශබ්දය; හේ, හේතුවාචි වූ හේ ශබ්දය; යෝ, යොධවාචි හෝ යොගවාචි වූ යෝශබ්දය; සිදුහත් සිද්ධාර්ථවාචි වූ සිදුහත්ශබ්දය; ඈ, (මේ) ආදිය; පුමලිඟු, පුංලිඞ්ගික වේ. නිස, රාත්‍රිවාචි වූ නිසශබ්දය; වසා, තඤ්ඤදිවාචි වූ වසා ශබ්දය; සිරි, ශ්‍රීකාන්තාදිවාචි වූ සිරි ශබ්දය; ගී, ගීතිවාචි වූ ගී ශබ්දය; විදු, විද්‍යුවාචි වූ විදුශබ්දය; දූ, දුහිතෘවාචි වූ දූ ශබ්දය; ලේ, රේඛාවාචි වූ ලේශබ්දය; ජ්‍යේ, ජ්‍යොතිජීචි වූ ජ්‍යේශබ්දය; කත්, කාන්තාවාචි වූ කත්ශබ්දය යන; ඈ, මේ ආදිය; ඉතිරිලිඟු, ස්ත්‍රීලිඞ්ගික වේ.**

භා—මෙහි **දම්රජ** ශබ්දය පටන් **යෝ** ශබ්දය දක්වා ද **නිස** ශබ්දය පටන් **ජ්‍යේ**ශබ්දය දක්වා ද ස්වරාන්ත ශබ්දයන්ට උදාහරණ යි. **සිදුහත්** ශබ්දය ද **කත්** ශබ්දය ද හලන්තයන්ට උදාහරණ යි.

(3) **ප—නොවෙසෙසි පදන, කර්මාදීන් අවිශිෂ්ටපදාර්ථය; වුතුවන, වක්තව්‍යවූයේ නම්; පෙරවිබත් බජනුයේ, ප්‍රථමාවිභක්ති සෙවුනේ ය; එකබසැ, එකවචනයෙහි; එ ආ, ඒප්‍රත්‍යය හා ආප්‍රත්‍යය; වනුයේ, වන්නේ ය; යළ,නැවත; බුහුබසැ, බහුවචනයෙහි; ඕ හු වේ, ඕප්‍රත්‍යය හා හුප්‍රත්‍යය වේ.**

භා—කර්මාදීන් අවිශිෂ්ට පදාර්ථය හෙවත් ලිඞ්ගාර්ථමාත්‍රය කියවම්නා වී නම් ඒ ලිඞ්ගාර්ථවාචිශබ්දයතෙම ප්‍රථමාවිභක්තිය ඇසුරු කෙරෙයි. '**ඒ ආ**' යන ප්‍රත්‍යයවය ප්‍රථමෙකවචනයෙහි වෙයි, '**ඕ හු**' යන ප්‍රත්‍යයවය ප්‍රථමා බහුවචනයෙහි වේ,

('බජනුසෙ පෙරවිබත්' යනාදි මේ උපාඞගසූත්‍රයෙහි අර්ථ විවරණය ඇතැම් කෙනෙක් මීට වෙනස්ලෙසිනුදු කල්පනා කෙරෙති. සමහර කෙනෙක් 'නොවෙසෙසි පදන වුතුවන පෙරවිබත් බජනුයේ' යන සම්බන්ධයෙන් 'කර්මාදීන් අවිභක්ත පදාර්ථය උක්තවස්තුය යන දෙදෙනා ප්‍රථමාවිභක්ති සෙවුනෝය' කියා ද තවත් සමහර කෙනෙක් 'කර්මාදීන් අවිශිෂ්ටපදාර්ථය ද උක්තාර්ථය ද ප්‍රථමාවිභක්තිය සෙවනය කෙරෙයි' කියා ද අර්ථ ගනිති ඒ දෙආකාරයෙහි ම වචනාර්ථ පිළිබඳ මඳ වෙනසක් මුත් සමුදායාර්ථ වශයෙන් වෙනසෙක් නො වේ. ආචාර්ය්‍ය ප්‍රතිරාජ පරිවෙණයන් විසින් මේ උපාඞගසූත්‍රයෙහි ප්‍රථමාර්ථ දෙකක් සඞ්ග්‍රහ කරන ලද්ද සි සැලකීමට හෙතු නො පැනේ. 'බජනුයේ' යන ඒකවචනාන්ත අර්ථක්‍රියා පදයෙන් එයට තුල්‍යාධිකරණ කර්තෘ පදය ද එකක් ම බැව් ප්‍රකාශිත ය. කර්තෘන් දෙදෙනකු සඳහා කියවි වී නම් ආචාර්ය්‍ය තෙමේ 'බජනුවො පෙරවිබත්' යි සූත්‍රය රචනා කෙරේ. උක්තානුක්තාධිකාරයෙහි දක්වනලද 'ඔහු දෙදෙන වුතුනම් වෙත් පලමු විබත් බජනුවෝ' යනු මීට සාධක යි තවද ප්‍රථමාවිභක්ති ප්‍රස්තාවයෙහි 'වුතුවන' යන්නෙන් උක්තාර්ථප්‍රථමාව නිර්දිෂ්ට වී නම් මතු උක්තානුක්තාධිකාරයෙහිත් එය දක්වීම නිරර්ථක ය. ප්‍රයොජනාන්තරාපෙක්ෂාවක් නැති කලැ කී යමක් නැවත කිම සූත්‍රකාරයන්ට ද උචිත නො වේ. සිද්ධාන්තසඞ්ග්‍රහකාරණයෙහි ගුරු කොට ගන්නා ලද ලක්දිව සම්භාවිත වූ පුරාතන ව්‍යාකරණයන්හි ද උක්තාර්ථප්‍රථමාව සඳහා සූත්‍රයක් වෙන ම නො හදුරන ලද්දේ ය. චාන්ද්‍ර පාණිනීයාදි ඒ චිරන්තන ශාස්ත්‍රයන්ට ප්‍රතිපක්ෂ ව මෙහි උපාඞගසූත්‍රය හදලේ ය යි ද නො සිතිය හැකි ය. 'වුතුවන' යන්නට 'උක්තාර්ථය' යනු සුදුසු පදාර්ථයෙකුත් නො වේ. 'උක්තවස්තුය' යනු අශාස්ත්‍රීය වචනයෙකි. 'උක්තවස්තු' කියා වෛයාකරණ ව්‍යවහාරමාත්‍රයකුදු ශාස්ත්‍රයෙහි නො අසනු ලැබෙන හෙයිනි. මේ ආදි කරුණු සලකන කලැ 'වුතුවන' යන්නට උක්තවස්තු යයි හෝ උක්තාර්ථ යයි හෝ අර්ථ කිරීමෙහි වෛයාකරණසම්ප්‍රදාය විරොධිත්වය ඉදුරා ම පැනෙන බැවින් ඒ නවීන මතය සිද්ධාන්ත සඞ්ග්‍රහ ව්‍යාකරණයෙහි නො යෙදේ යයි සැලකියයුතු වේ. 'නොවෙසෙසි පදන' යන්නෙන් වාච්‍ය වූ 'කර්මාදීන් අවිශිෂ්ට පදාර්ථය' නම් "කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අවධි, සම්බන්ධ, ආධාර" යන මොවුන් විසින් නොවෙසෙසන ලද අර්ථමාත්‍රය යි. මෙකී අර්ථමාත්‍රයෙහි ම ප්‍රථමාවිභක්තිවිධානය ආචාර්ය්‍ය මෞද්ගල්‍යායනාදීන්ට ද අභිමත බැව් "පඨමාත්ථමත්තෙ" යන මෞද්ගල්‍යා

යන සූත්‍රාදියෙන් පෙනේ. ජාතිගුණක්‍රියා ලක්ෂණ වූ ස්වාර්ථය ද, තන්නිඃශ්‍රිත වූ ද්‍රව්‍යය ද, ස්ත්‍රීපුන්නපුංසකලිඞ්ගයෝ ද, එකත්වාදි සඞ්ඛ්‍යා ද, කර්මාදි ෂට්කාරකයෝ ද යන පස නාමයාගේ සාමාන්‍යාර්ථ යි, හෙවත් කර්මාදීන්ට සාධාරණ වූ අවිශිෂ්ට අවස්ථාව යි. 'මේ අර්ථමාත්‍රයෙහි ප්‍රථමාවිභක්ති වෙයි' යනු මූගලන්වියරණෙහි විධාන යි. මෙසෙයින් මූගලන් ආචාර්යයන්ට ද උක්තාර්ථයෙහි ප්‍රථමා අර්ථමාත්‍රයෙන් ම සිද්ධ යි. මෙහි මෞද්ගල්‍යායනාචාර්ය වචනය ද ප්‍රතිරාජපරිවෙණාචාර්ය වචනය ද චාන්ද්‍රසූත්‍රාදි පුරාතන ආප්ත වාක්‍යයන් අවලම්බනය කොට කියන ලද බැව් පෙනේ.

චාන්ද්‍රව්‍යාකරණයෙහි '**අර්ථමාත්‍රෙ ප්‍රථමා**' යනු සූත්‍ර යි. '**අර්ථමාත්‍රයෙහි ප්‍රථමා වෙයි**' යන අර්ථ යි.

**එම වෘත්තියෙහි:-** 'අවිශිෂ්ටො'ර්ථො'ර්ථමාත්‍රමර්ථස්වරූපමිති **යාවත්' යන්නෙන්** (කර්මාදීන්) අවිශිෂ්ට වූ අර්ථයතෙම අර්ථමාත්‍ර **නමි.** අර්ථස්වරූපය යනු තාත්පර්යාර්ථය වෙයි කියනලද්දේ ය.

සර්වවර්මාදිසංස්කෘතව්‍යාකරණකර්තෘන් විසින් ද කච්චායනාදි මාගධව්‍යාකරණකර්තෘන් විසින් ද මේ අර්ථමාත්‍රසඞ්ඛ්‍යාත අවිශිෂ්ටාර්ථය ලිඞ්ගාර්ථනාමයෙන් දක්වන ලදි. '**ප්‍රථමාවිභක්තිර් ලිඞ්ගාර්ථවචනෙ,** අව්‍යතිරික්තලිඞ්ගාර්ථවචනෙ ප්‍රථමාවිභක්තිර්භවති' යනු කාතන්ත්‍රසූත්‍ර හා දෞර්ගසිංහී වෘත්ති යි. අව්‍යතිරික්ත වූ හෙවත් කර්මාදීන් අවිශිෂ්ට හෙයින් ව්‍යතිරේකරහිත වූ ලිඞ්ගාර්ථ වචනයෙහි ප්‍රථමාවිභක්තිය වෙයි යනු එහි අර්ථ යි. කාතන්ත්‍රකාර සර්වවර්මාදි ආචාර්යයන්ට ද උක්තාර්ථප්‍රථමා ලිඞ්ගාර්ථවචනයෙහි ම සිද්ධ බැව් මෙයින් ප්‍රකාශ වේ. ආචාර්ය පාණිනිහු වනාහි මේ ලිඞ්ගාර්ථය සතරප්‍රකාරයක් කොට '**ප්‍රාතිපදිකාර්ථලිඞ්ගපරිමාණවචනමාත්‍රෙ ප්‍රථමා**' යන සූත්‍රය හදාළහ. ප්‍රාතිපදිකාර්ථමාත්‍රයෙහි ද, ලිඞ්ගාර්ථයෙහි ද, පරිමාණමාත්‍රයෙහි ද, වචනමාත්‍රයෙහි ද ප්‍රථමා විභක්ති වෙයි යනු එහි අර්ථ යි. පාණිනීන් විසින් '**අනභිහිතෙ**' යි අධිකාර සූත්‍රයක් කොට අනුක්තකර්මාදියෙහි ද්විතීයාදි විභක්තීන් දක්වූ පමණ මුත් අභිහිතය සඳහා සූත්‍රයක් නො හදාළ හෙයින් ඒ ආචාර්යයන්ට ද ප්‍රාතිපදිකාර්ථාදි සූත්‍රයෙන් ම උක්තාර්ථප්‍රථමා සිද්ධ ය. මාගධ ව්‍යාකරණකර්තෘ වූ කාත්‍යායනාචාර්යපාදයෝ ද '**ලිඞ්ගත්ථෙ පඨමා**' යන්නෙන් ලිඞ්ගාර්ථසඞ්ඛ්‍යාත අවිශිෂ්ටාර්ථමාත්‍රයෙහි ම ප්‍රථමාවිධානය කළහ. උක්තාර්ථප්‍රථමාත් එයින් ම සිද්ධ බැව් දක්වන ධර්මකීර්ති මහා ස්වාමිපාදයෝ බාලාවතාරයෙහි:-

**ඒ, බෙලේ බලාම් කෙරේ. ආ, හර අරා කෙලෙස්කුළු.**
**ඕ, බමණෝ කුලදම් රකිත්. හු, තවසරහු දම් දෙසත්. (4)**

---

"වුත්තෙ කම්මාදිසාමිස්මිං ලිඞ්ගත්ථෙ පඨමා සියා" යි-

කර්මාදිෂට්කාරකය හා ස්වාමිහු (සමාසාදීන් විසින්) උක්ත කල්හි ලිඞ්ගාර්ථයෙහි ප්‍රථමා වන්නී ය යි තාත්පර්යාර්ථය ප්‍රකාශ කළහ. තිඞ්කෘත්තද්ධිතසමාසයන් විසින් උක්ත වූ කර්මාදීන් සංසෘෂ්ට වූ (=මිශ්‍ර වූ) අර්ථමාත්‍රය ද්විතීයාදි අනභිහිතවිභක්තීන්ට අවිෂය වෙයි, අවිශිෂ්ට ද වෙයි. එහි ලිඞ්ගාර්ථමාත්‍රයාගේ සම්භවය ඇති හෙයින් චිරන්තනශාබ්දිකයන් විසින් ප්‍රථමාවිධායක සූත්‍රයන්හි උක්තාර්ථයාගේ පෘථගුපාදානය නො කරන ලද්දේ ය. මුග්ධබොධ, ආශුබොධාදිකාර ඇතම් නවීන වෛයාකරණාචාර්යයෝ වනාහි උක්තාර්ථය ප්‍රථමාවිධායකසූත්‍රයෙහි ම වෙසෙසා දක්වූහ. පාරිශෙෂිකන්‍යායයෙන් කර්මාදියෙහි විහිත ද්විතීයාදීන්ගේ අනුක්ත බව හැඟවූහ. පාණිනීය, චාන්ද්‍ර, කාතන්ත්‍ර, කාත්‍යායන, මෞද්ගල්‍යායනාදි චිරන්තනමතානුයායී ආචාර්ය ප්‍රතිරාජපරිවෙණයන් විසිනුදු අවිශිෂ්ටපදාර්ථයෙහි ම ප්‍රථමාවිභක්ති දක්වීම (=නවීනමත හා නො සමවුවත්) සියලු විචක්‍ෂණයන් විසින් සම්භාව්‍ය ම ය. මෙසෙයින් "කර්මාදීන් අවිශිෂ්ටපදාර්ථය වාච්‍යවූයේ නම් ප්‍රථමාවිභක්ති සෙවුනේ ය" යි මෙහි දක්වන ලද අර්ථවිවරණය වෛයාකරණසම්ප්‍රදායානුකූල ය, නිර්මල ය යි දතයුතු.

(4) ප—ඒ, ඒ විභක්ති වේ; බෙලේ, භටතෙම; බලාම් කෙරේ, භටකර්ම කෙරේ. ආ, ආවිභක්ති වේ; හර, ඊශ්වරතෙම; කෙලෙස් කුළු, කෛලාසකූටයට; අරා, ආරූඪ වේ. ඕ, ඕවිභක්ති වේ; බමණෝ, බ්‍රාහ්මණයෝ; කුලදම්, කුලධර්මය; රකිත්, රක්‍ෂා කෙරෙත්. හු, හුවිභක්ති වේ; තවසරහු, තපස්විහු; දම්, ධර්මය; දෙසත්, දෙශනා කෙරෙත්.

මෙහි "බල, හර, බමණ, තවසර" යන ශබ්දයන් කෙරෙන් පර වූ කර්මාදීන් අවිශිෂ්ට අර්ථමාත්‍රය වක්තව්‍ය කල්හි "බජනුසෙ පෙරවිබත්" යනාදි උපාඞ්ගසූත්‍රයෙන් ක්‍රමයෙන් 'ඒ ආ ඕ හු' යන විභක්ති කොට විභක්තිස්වර පරකලැ පූර්වස්වරයහට අඞ්ගසූත්‍රය සම්බන්ධවන්නෙහි 'පෙරපරවණන්' යනාදි උපාඞ්ගසූත්‍රයෙන් ලොප් කොට විභක්ති පමුණුවා ප්‍රථමරූපයෙහි බකාරසථ අකාර යහට ස්වරවිපර්යාස ද කළ කල්හි බෙලේ, හරා, බමණෝ, තවසරහු යනු වේ.

"ස්වරාන්ත හලන්ත සියලු ශබ්දයෝ ම ස්වරූපයෙන් සිට ද විභක්ත්‍යර්ථය ප්‍රකාශ කෙරෙත්" යනු සිංහලශාබ්දිකයන්ගේ

**නිදූළියෝ පෙහෙසුන් තොපලත්, පඬුවෝ දනුම් වඩත්, මේ ඇඟි විබතට පෙර වැ යවගම් රුසි.** (5)

---

දර්ශිත හෙයින් මෙකී විභක්තිප්‍රත්‍යයක් නැතත් ප්‍රථමාවිභක්තිය වුවමනා කලැ ශබ්දාන්තයෙහි සිටි පණකුර හෝ ගතකුර ප්‍රථමා විභක්තිප්‍රත්‍යය වැනි වෙයි. මේ වනාහි කාව්‍යවිෂයෙහි බොහෝ සෙයින් දෘශ්‍යමාන වේ.

---

**විභක්ත්‍යාශ්‍රිත ආගමසංහිතා.**

(5) **ප**— නිදූළියෝ, අකාරුණිකයෝ තුමූ; පෙහෙසුන්, පෛශුන්‍යය; තොපලත්, කථනය කෙරෙත්. පඬුවෝ, පණ්ඩිතයෝ තුමූ; දනුම්, ජානනය; වඩත්, වර්ධනය කෙරෙත්. මෙඇඟි, මේ ආදියෙහි; විබතට පෙර වැ, විභක්තියට පූර්ව වැ, යවගම් රුසී, යකාර වකාරාගම රුචි යි.

**වි**—නිදූළියෝ, පඬුවෝ, යනාදි තන්හි **යෝ, වෝ,** යනු කෙසේ වී ද යන ශඞ්කානිරාකරණය පිණිස මේ දක්වන ලදි. **නිදූළි, පඬු,** යන ශබ්දයන් කෙරෙන් ප්‍රථමාබහුවචන ඕවික්ති කොට විභක්තිස්වරයා පරකලැ අඞ්ගසූත්‍රසාමර්ථ්‍යයෙන් ප්‍රකෘති ප්‍රත්‍යය මධ්‍යයෙහි (ස්වර රහිත) **ය**කාර**ව**කාරාගම කොට පැමිණ වූ කල්හි **නිදූළියෝ, පඬුවෝ,** යනු වේ. **ය**කාරාගමය ඉවර්ණාන්තයා කෙරෙන් ද, **ව**කාරාගමය උවර්ණාන්තයා කෙරෙන් ද ස්ථානසාම්‍යයෙන් කටයුතු යි. යකාරය හා ඉවර්ණය තාලව්‍ය බව ද වකාරය හා උවර්ණය ඕෂ්ඨ්‍ය බව ද මෙහි ස්ථානසාම්‍යය යි. ආදි ශබ්දයෙන් **උකටලියට, සදියාට** යනාදි තන්හි **'උකටලි, සදි'** ආදීන් කෙරෙන් **ය**කාරාගම ද, **කඩුව, රදුව,** දරුවන් යනාදි තන්හි **කඩු, රදු, දරු** ආදින් කෙරෙන් **ව**කාරාගම ද මිශ්‍ර සිංහල ව්‍යවහාරයෙහි **ශාස්ත්‍රය** භාෂාව, **වහ්නිය, රාත්‍රිය, නදිය,** ධෙනුව, **පුරුෂයෝ** යනාදියෙහි **ශාස්ත්‍ර, භාෂා** යනාදි භාෂාන්තර ශබ්ද ප්‍රකෘතීන් සිංහල විභක්ති ස්වරයන් හා ගළපන කලැ කටයුතු වූ **ය**කාරවකාරාගම ද දතයුතු. භාෂාන්තර නාමයකින් පර ව සිංහල භාෂායෙහි ස්වරාදි වූ විභක්තිප්‍රත්‍යයක් කරන කලැ මෙකී ආගමවිධිය නිත්‍යයෙන් වේ. කිසිවිටෙක භාෂාන්තරශබ්දප්‍රකෘතිහු ද සිංහලභාෂාව්‍යවහාරයෙහි ස්වකීයරූපයෙන් සිට විභක්ත්‍යර්ථය ප්‍රකාශ කෙරෙති. එබඳු තැන විභක්තිප්‍රත්‍යය ලොප් වූ නියා යයි සලකනු. ධම්ප්‍රදීපිකායෙහි "මෙසේ **මහාසුදර්ශනා** සුවාසූදහසක් හවුරුදු කුමාරක්‍රීඩා කෙළැ" යනාදියෙහිදු "මෙසේ මහපිරිවරින් යන **පරිව්‍රාජක** දෙව්රම් දොරටුව දූක" යනාදියෙහිදු "**මහාසුදර්ශන පරිව්‍රාජක**" යනාදි ශබ්දයන් ස්වරූපයෙන්

**පුමඉතිරිලිඟුදෙක පටන් අරුත්වියකන්හි තෙම තොමෝ තුමූ යනු රූසි. (6)**

**ඉති පළමුවන විබත්.**

---

සිට ම විභක්ත්‍යර්ථය පහළකිරීම ඊට නිදර්ශන යි. බහුවචන හුවිභක්තිය භාෂාන්තර ශබ්දයන් හා යෙදීමෙහි ද විශෙෂයෙක් පැනේ. ඉකාරාන්ත, උකාරාන්ත ප්‍රකෘතීන්ගේ අන්ත්‍යස්වරය බහුවචන හුවිභක්තිය පර කල දීර්ඝවෙ යි. ධම්ප්‍රදීපිකාදි ජෙක ප්‍රයොගයන්හි නරපතීහු, ධාතූහු යනාදි යෙදුම් ඊට නිදර්ශන යි. මේ ක්‍රමයෙන් මෙහි නො දක්වන ලද විශෙෂ ද පරීක්ෂණය කරනු.

---

**විභක්තිපරනිපාත.**

(6) ප— පුමඉතිරිලිඟුදෙක, පුංස්ත්‍රීලිඞ්ගද්වයෙහි; පටන් අරුත්වියකන්හි, ප්‍රථමාර්ථව්‍යාඛ්‍යානයෙහි; තෙම තොමෝ තුමූ යනු, (එකත්වයෙහි) තෙම තොමෝ යනු හා (බහුත්වයෙහි) තුමූ යනු ද; රූසි, අභිමත යි.

වි—පුංලිඞ්ගයෙහි ප්‍රථමෛකවචනයාගේ අර්ථ කියන කල විභක්තිය කෙරෙන් 'තෙම' යන්නක් පර නිපාත වශයෙන් යෙදේ. ස්ත්‍රීලිඞ්ගඑකත්වයෙහි 'තොමෝ' යනු ද ලිඞ්ගද්වයෙහි ම බහුවචනයෙහි 'තුමූ' යනු ද යෙදෙත්. මේ විධානය ද අඞ්ග සූත්‍රානුගතනිපාතනවිධියෙහි ලා දතයුතු. ඇතම් පුරාතන ලිපි වල 'තෙමෙහෙ–තොමොහො– තුමුහු'යි ද දක්නා ලැබෙන හෙයින් හකාරයාගේ ලොපයෙන් ඉක්බිති පූර්වපර සවර්ණස්වර යන්ගේ දීර්ඝත්වයෙන් 'තෙමේ තොමෝ තුමූ' යනු සිද්ධ යයි හැගේ. එසේ ම මෙහි දැක් වූ 'තෙම' යන්න බොහෝ තන්හි 'තෙමේ' යි ඒකාරාන්තව ද යොදනු ලැබේ. මෙකී රූපත්‍රය ම මාගධභාෂායෙහි 'තුම' ශබ්දය හෝ 'ආතුම' ශබ්දය හෝ ප්‍රභව කොට එයින් බිදී ආයේ ය. එහෙයින් මෙකියන ලද ප්‍රභවශබ්ද යන්ගේ අර්ථ වශයෙන් 'තෙම–තොමෝ' යනාදි වශයෙන් රූප ත්‍රය ස්වාර්ථවාචක යයි සැලකිය යුතු යි. 'රජතෙම' යයි කීකල්හි 'තෙම' යන රූපය රජ යන ලිඞ්ගසඞ්ඛ්‍යාත ශබ්දප්‍රකෘතිහුගේ අර්ථය පමණක් ම ප්‍රකාශ කෙරෙයි. හෙවත් 'තෙම' යනාදි පර රූපත්‍රය පූර්ව වූ 'රජ' යනාදින් සෙසු විභක්ත්‍යන්තයන් කෙරෙන් වෙසෙස්‍ ප්‍රථමාන්තයක යි ම සුප්‍රකාශ කෙරෙයි. එහෙයින් ප්‍රථමාවිභක්තියෙන් පර ව මෙකී රූපත්‍රය යෙදීම ස්වභාෂා ෂෙවයාකරණයන්ට අභිමත විය. මේ අනිත්‍යවිධි හෙයින් වක්තෘ

**සුතු කතු කිරිය හා-පදරුත් බෙජේ කම්නම**
**එකතැ අ උ ආ හු ව උන්-නානන් නවන් බුහුබසැ. (7)**

---

හුගේ විවක්‍ෂානුකූල වැ කිසිතැනෙක 'කොම' යනාදීන්ගේ නොයෙදීම ද අභිමත වේ.

**ප්‍රථමාවිභක්තිය නිමි.**

---

(7) **ප**—කතු, කර්තෘහුගේ; කිරිය හා, ක්‍රියාව හා සමඟ; සුතු, යුක්ත වූ; පදරුත්, පදාර්ථය තෙම; කම්නම්, කර්මසංඥාව; බෙජේ, භජනය කෙරේ; එකතැ, එකවචනයෙහි; අඋආහුව, අ උ ආ හු ව (යන විභක්ති පස) වේ; බුහුබසැ, බහුවචනයෙහි; උන්නානන් නවන්, උන් න ආන න් නව අන් (යන විභක්ති සය) වේ.

**හා** – කර්තෘහුගේ ක්‍රියාව හා යෙදුණු (=බැඳුණු) පදාර්ථය '**කර්ම**' නම් වේ. *කර්මකාරකඑකවචනයෙහි අප්‍රත්‍යයාදි පස ද බහුවචනයෙහි උන්ප්‍රත්‍යයාදි සය ද වෙතැ යි සේයි.

**වි**—ෂඩ්විධකාරකයන් අතුරෙහි කර්තෘහුගේ ක්‍රියාඵලයෙන් පැමිණෙනු කැමැති අතිශයෙන් අභිමත වූ කාරකය කර්ම නම්. ඒ වනාහි කර්තෲහුගේ ක්‍රියාඵලය පිළිබඳ විශේෂත්වය හේතුකොට ගෙන ප්‍රභේදයට පැමිණේ. ආචාර්ය භර්තෘහරි ආදි සංස්කෘත වෛයාකරණයෝ '**නිර්වර්ත්‍ය**' කර්මාදී වශයෙන් කර්මයාගේ ත්‍රිභේදය ද අන්‍ය වූ සතර ප්‍රකාරයක් ද දැක්වූහ. එහි විභාග විස්තර හෙයින් ප්‍රතිරාජපරිවෙණස්වාමීන් විසින් නො දැක්වුව ද සංස්කෘත ශාස්ත්‍රානුසාරයෙන් දතයුත්තේ ය. **නිර්වර්ත්‍ය ය, විකාර්ය ය, ප්‍රාප්‍ය ය** යන ඊප්සිතතම කර්මයාගේ ත්‍රිභේදය සියලු ආචාර්යයන්ට ම ඉෂ්ට ය. මෙයින් අන්‍ය වූ '**උදාසීන, ද්වේෂ්‍ය, අකථිත, අන්‍යපූර්වක**' යන අනීප්සිත කර්ම හා සමඟ කර්මකාරකය සත්වැදෑරුම් යයි ද පාණිනීය ග්‍රන්ථකාරයෝ කියත්.

කර්තෘහුගේ ක්‍රියායෙන් ජන්‍ය වූ උත්පත්තිස්වරූප ඵලය ඇත්තේ '**නිර්වර්ත්‍ය**' නම්. ක්‍රියාව හේතුකොට උපදනා කර්ම යයි සේයි. "**ඝටං කරොති=ඝටය කෙරේ**" මෙහි පෙර නො පැවති ඝටය කර්තෘහුගේ ක්‍රියායෙන් උපදනා හෙයින් නිර්වර්ත්‍යකර්ම යි. පෙර ඇති ම යමක් හෝ කර්තෘහුගේ ක්‍රියායෙන් ප්‍රකාශ වේ නම්

---

*"කත්තු ක්‍රියාභිසම්බන්ධං කාරකං කම්මමුච්චතෙ"

යන මුගලන්වියරණවචනය ආශ්‍රය කොට මේ උපාධ්‍යසූත්‍රය රචිත යි. "කත්තු, කර්තෘහුගේ; ක්‍රියා, ගමනාදි ක්‍රියායෙන්; අභිසම්බන්ධං, සම්බන්ධකරන ලද; කාරකං, කාරකය තෙම; කම්මං, කම්ම යයි; වුච්චතෙ, කියනු ලැබේ" යනු අර්ථ යි.

හෙ ද නිර්වර්ත්‍ය යි. “පුත්‍රං ප්‍රසූතෙ=පුතකු වදයි” මෙහි ප්‍රසවන ක්‍රියායෙන් පෙරත් පුත්‍රතෙමේ විද්‍යමාන ය, එතකුදු වුවත් ප්‍රසවන ක්‍රියායෙන් ප්‍රකාශවන්නෙන් 'නිර්වර්ත්‍ය' නම් වේ.

කර්තෘහුගේ ක්‍රියායෙන් පෙර තුබූ යමක් ඒ ප්‍රකෘති අවස්ථාව හැර පෙර නො තුබූ විකෘතිසඞ්ඛ්‍යාත අවස්ථාන්තරයකට පැමිණේ ද හෙවත් ක්‍රියා ව හෙතුකොටගෙන වෙනස් බවට පැමිණේ ද හේ 'විකාර්‍ය' නම්. 'කාෂ්ඨං භස්ම කරොති=කාෂ්ඨය හළු කෙරෙයි' 'සුවර්ණං කුණ්ඩලං කරොති=සුවර්ණය කුණ්ඩලාභරණයක් කෙරෙයි' යන උදාහරණ දෙක්හි කාෂ්ඨ ය, සුවර්ණ ය යන මොහු ප්‍රකෘතීහු වෙති. භස්ම ය, කුණ්ඩල ය යන මොහු විකෘතීහු වෙත්. මෙයින් කාෂ්ඨ ප්‍රකෘතිය නැසීමෙන් ම විකෘති වූ හළු බවට පැමිණි හෙයින් කාෂ්ඨ භස්ම දෙක ප්‍රකෘත්‍යුච්ඡෙදයෙන් වූ විකාර්‍ය කර්ම යයි ද, සුවර්ණ ප්‍රකෘතිය නො නැසී පූර්වරූපයෙන් වෙනස් ව කුණ්ඩල සංස්ථාන අන්‍යස්වරූප ඵලවත් වූ බැවින් සුවර්ණ, කුණ්ඩල යන දෙක ගුණාන්තරාධානයෙන් වූ විකාර්‍ය කර්ම යයි ද විකාර්‍යය දෙපරිද්දක් කොට කියත්.

“ඔදනං පචති=බත පිසෙයි” කී කල ද තණ්ඩුලප්‍රකෘතිය අවස්ථාන්තරයකට පැමිණ ඔදනත්වයට පැමිණෙන හෙයින් 'බත' විකෘතිකර්ම වෙයි. තණ්ඩුලවික්ලෙදයෙන් බත නිපදනා හෙයිනි. එබැවින් ඍෂිපතඤ්ජලිහු විසින් භාෂ්‍යයෙහි 'තණ්ඩුලාන් වික්ලෙදයන්නොදනං නිර්වර්තයති'යි පර්‍යායවිවරණය කරන ලදි. තුන්වැදෑරුම් ප්‍රවෘත්තිවිෂය* අතුරෙනුදු පචනක්‍රියායෙහි තණ්ඩුලාදීහුගේ ගැන්ම සිද්ධවිෂය වෙයි. පාකක්‍රියාව සාධ්‍යවිෂය වෙයි. යනු මීමාංසක තාර්කිකයන්ගේ මත යි. මීමාංසා මහාර්ණවයෙහි 'පාකකෘතෞ තණ්ඩුලාදෙරුපාදානවිධයෙව ඵලවිධයෞදනාදෙරපි විෂයත්වම්' යන්නෙන් එය දක්වන ලදි. මෙසේ තණ්ඩුලයන්ගේ උපාදාන ස්වරූප විෂයත්වය හා කර්තෘහුගේ ක්‍රියාස්වරූප සාධ්‍ය විෂයත්වය ද තාර්කිකයන් විසින් සිද්ධාන්තිත හෙයිනුදු විද්‍යමාන වූ තණ්ඩුලයන් පාකක්‍රියායෙන් වික්ලෙදන ලක්ෂණ වූ අන්‍යාකාරයට පැමිණවීම ඔදනයාගේ පිසීමනු යි ඔදනය විකෘතිකර්ම නම් වේ.

යම් කර්මයෙක් නිර්වර්ත්‍ය විකාර්‍ය දෙකට ඇතුළත් නුවූයේ හුදෙක් කර්තෘහුගේ ක්‍රියායෙන් සම්බන්ධ කරනු ලැබේ ද ඒ 'ප්‍රාප්‍ය කර්ම' නම්. ක්‍රියායෙන් සම්පාදිත විශෙෂයන්ගේ සිද්ධියක් යම්

*“සිද්ධං සාධ්‍යං ඵලඤ්චෙති ප්‍රවෘත්තෙර්විෂයස්ත්‍රිධා
තත්‍ර සිද්ධමුපාදානං ක්‍රියාසාධ්‍යං ඵලං සුඛම්”-වක්ෂ්‍යශෙඛර.

කර්මයෙක්හි ප්‍රත්‍යක්ෂයෙන් හෝ අනුමානයෙන් (=කාරණදර්ශනයෙන්) හෝ නො දන්නා ලැබේ ද හේ 'ප්‍රාප්‍ය' නමැයි දේසි. 'ආදිත්‍යම් පශ්‍යති =හිරු බලයි. ග්‍රාමං ගච්ඡති =ගමට යෙයි' යනාදිය යි. 'හිරු බලයි' යන්නෙහි කර්තෘහුගේ දර්ශනක්‍රියායෙන් හිරුගේ විශෙෂ සිද්ධියක් නො දන්නා ලැබෙයි. 'ගමට යෙයි' යන්නෙහිදු ගමන ක්‍රියායෙන් ග්‍රාමයාගේ විශෙෂ සිද්ධියක් නො දන්නා ලැබේ. එහෙයින් ප්‍රාප්‍ය වෙයි, නිර්වර්ත්‍ය හෝ විකාර්‍ය හෝ නො වේ. ප්‍රාප්‍යකර්මයෙහි ක්‍රියායෙන් වූ විශෙෂ සිද්ධියක් නැතිකලැ අකිඤ්චිත්කර වූ (=කිසිවක් නො කරන්නා වූ) හෙතෙම කෙසේ නම් කාරකත්වමය භජනය කෙරේ දැයි මෙහි චෝදනායෙක් වේ. එයට පරිහාර දක්වන ආචාර්‍යවරයෝ මෙසේ කියත්:—

"ආභාසොපගමො ව්‍යක්තිඃ සොඃයමිති කර්මණඃ,
විශෙෂාඃ ප්‍රාප්‍යමාණස්‍ය ක්‍රියාසිද්ධෞ විවක්ෂිතාඃ"

චක්ෂුරාදි ඉන්ද්‍රියයන්ගේ විෂය බවට පැමිණීම ද, අවබොධ වශයෙන් ප්‍රකාශවීම ද, දර්ශනාදි ක්‍රියා ඉවසන බව ද, හෙවත් දර්ශනාදිය කරන්ට පිළිවන් බව ද යන මෙකී විශෙෂයෝ ප්‍රාප්‍ය කර්මයාගේ ක්‍රියානිෂ්පත්තිසඞ්ඛ්‍යාත කාරක බැව්හි කැමැති වන ලදහ.

'හිරු බලයි' යන්නෙහි කර්මත්වයෙන් කියනලද හිරු චක්ෂුර් විෂය හෙයිනුදු, බලන්නාහට මේ හිරු යයි අවබොධයෙන් ප්‍රකාශ වන හෙයිනුදු, ක්‍රියානිෂ්පත්තියට කාරණ වේ නු යි කාරක සංඥ ලබයි. මේ දක්වන ලද්දේ සර්වාචාර්‍යසම්මත "ඊප්සිතතම" කර්මයාගේ ත්‍රෛවිධ්‍යය යි. මෙය සිංහල ව්‍යාකරණයෙහි ද යෙදේ.

(අන්‍යචාතුර්විධ්‍යයෙහි) කර්තෘහුගේ නො උදෙසනලද බව ඇති කල්හි ක්‍රියායෙන් ජන්‍ය වූ ඵලඇත්තේ 'උදාසීනකර්ම' නම්. 'ග්‍රාමං ගච්ඡංස්තෘණං ස්පෘශති =ගමට යන්නේ තෘණය අල්වයි' යන මෙහි කර්තෘහු විසින් උදෙසනලද්දේ ගමට යාම මුත් තෘණ ස්පර්ශනය නො වේ. එහෙයින් තෘණස්පර්ශනය (=තණකොළ ඇල් වීම) නො උදෙසනලද්දකි. ඉතා නො කැමැත්තෙන් කරන ලද්දක් ද නො වේ. හේ එබැවින් 'උදාසීනකර්ම' නම්.

නො කැමැති බව ඇති කල්හි කර්තෘහුගේ ක්‍රියායෙන් ජන්‍ය වූ ඵල ඇත්තේ 'ද්වෙෂ්‍යකර්ම' නම්. 'අන්නං බුභුක්ෂමාණො විෂං භුඞ්ක්තෙ =අහර වළඳනු කැමැත්තේ විෂ අනුභව කෙරේ' යන මෙහි කර්තෘහු විසින් විෂ කැමැතිවන ලද්දේ නො වේ. එතකුදු වුවත් ක්‍රියාව හා සම්බන්ධවූයෙන් හේ 'ද්වෙෂ්‍යකර්ම' යයි කියනු ලැබේ.

**අ, රජ දම්නියෙන් මිය පුස්නේ. උ, සිදුහත්කුමරු සුද වැසියෝ පළමු පිළිගත්හු. ආ, රවුලා මැරි රම්රජ. හු, සුරගුරෙණෙහි විමසනු. ට, රජගෙට පිවිසි මැතිගෙණේ.** (8)

---

**අකථිතකර්ම** නම් සූත්‍රකාරයන් විසින් කිසි සූත්‍රයෙකිනුදු කාරක විශෙෂ සංඥාන්තරයෙකින් නො කියනලද ද්විකර්මකධාතු යොගයෙහි දෘශ්‍යමාන වූ **ගෞණකර්මය** යි, '**ගොපො ගාං පයො දොග්ධි**– ගොපලුතෙම දෙන කිරි දෙවි' යන මෙහි දෙහනක්‍රියාවට **දෙන** ද **කිර** ද කර්මත්වයෙන් විවක්ෂිත යි. **එයින් කිර** කාරක සංඥාවිධායක සූත්‍රයෙන් කියනලද **ඊප්සිතතම** කර්මය යි. **දෙන** එසේ නො කියන ලද්දෙන් '**අකථිතකර්ම**' නමැ යි කියත්. මෙය **එළුවියරණෙහි අවදිව්බතින් සිටී.**

'**අන්‍යපූර්වක**' නම් සංස්කෘත මාගධ ශබ්දශාස්ත්‍රයන්හි කාරකාන්තරයක්හට කර්මසංඥා කිරීමෙන් සිද්ධ වූ ද්විතියාන්තපද යි. '**ජලධිම් අධිශෙතෙ-සයුරෙහි හොවී**' යන මෙහි ශයනයට සයුර **ආධාර වුවත් 'අධිශෙතෙ' යන අධිශබ්දයා** හා **ශීඞ් ධාතුහුගේ** යොගය ඇති බැවින් ආධාර වූ ජලධිහට කර්මසංඥා වේ. එහෙයින් '**ජලධිම්**' යනු '**අන්‍යපූර්වකකර්ම**' නමැ යි කියනලදි. මෙකී චාතුර්විධ්‍යය පුරාතනයන් අතුරෙහිදු සමහර ආචාර්යයන්ට **අභිමත** නො වන හෙයින් සර්වසම්මත වූ '**නිර්වර්ත්‍ය, විකාර්‍ය, ප්‍රාප්‍ය**' යන ත්‍රිභෙදය ස්වභාෂායෙහි ද කර්මවිශෙෂ දත ගැන්ම සඳහා ප්‍රධානත්වයෙන් සැලකියයුතු.

(8) **ප—අ**, අවිභක්ති වේ; රජ, රාජතෙම; දම්නියෙන්, ධර්මයෙන් හා නීතියෙන්; මිය, පෘථිවිය; පුස්නේ, පොෂණය කරන්නේ ය.

මෙහි 'මි' ශබ්දයෙන් පර ව අවිභක්ති කොට සන්ධි කිරීමෙන් '**මිය**' යි කර්මය සිද්ධ යි. මේ වනාහි නිර්වර්ත්‍යාදි ප්‍රභෙදයෙහි '**ප්‍රාප්‍යකර්ම**' නම් වේ.

**උ**, උවිභක්ති වේ; සිදුහත්කුමරු, සිද්ධාර්ථකුමාරයා; සුද වැසියෝ, ශුද්ධාවාසික (බ්‍රහ්ම)යෝ; පළමු, ප්‍රථමකොට; පිළිගත්හු, ප්‍රතිග්‍රහණය කළෝ.

මෙහි උවිභක්තිය **සිදුහත්කුමර** ශබ්දයෙන් පර ව යොදා සන්ධි කිරීමෙන් '**සිදුහත්කුමරු**'යි කර්මය සිද්ධ යි. මෙ ද ප්‍රාප්‍ය කර්ම යි.

**ආ, ආවිභක්ති වේ; රම්රජ, රාමරජතෙම; රවුලා, රාවණයා; මැරී, මැරූයේ ය.** රවුලා යනු විකාර්‍යකර්ම යි.

**උන්, මහණුන් නමඳනේ. න, පිළිමල්න දනන්නෑ. ආන, නරඹන්නෑ මොනරාන නස්නා. න්, දනන් මහලුපා දෙළේ යොද වෑකරෙව් සරූපා. නට, රුක්නට නැඟෙත් සාමුවෝ. අන්, දරුවන් බලන්නහු ළ සැනැහේ.** (9)

**"සේනන් බුහුමනන්නේ" ඈ හුණා බැවින් නන්විබතින් සිදු පා.** (10)

---

හු, හුවිභක්ති වේ; සුරහු, ශූරයා; රෙණෙහි, යුද්ධයෙහි; විමසනු, විමංසනය කරනු. ප්‍රාප්‍යකර්ම යි. මතු උදාහරණ පසෙහි ද මෙසේ මැ යි.

ම, මවිභක්ති වේ; මැතිගෙණේ, මන්ත්‍රිගණතෙමේ; රජගෙට, රාජගෘහයට; පිවිසි, ප්‍රවිෂ්ට වී.

(9) ප—උන්, උන්විභක්ති වේ; මහණුන්, ශ්‍රමණයන්; නමඳනේ, වඳනේ ය;

න, නවිභක්ති වේ; පිළිමල්න, ප්‍රතිමල්ලයන් (=විරුද්ධ ව පොරට එන්නන්); දනන්නෑ, ජයගන්නෑ; මෙ ද ව්‍යාකාර්‍යකර්ම යි.

ආන, ආනවිභක්ති වේ; නස්නා, නෘත්‍ය කරන්නා වූ; මොන රාන, මයූරයන්; නරඹන්නෑ, නිරීක්ෂණය කරන්නෑ.

න්, න්විභක්ති වේ; මහලුපාදනන්, මහත් වූ ද අල්ප වූ ද ජනයන්; වෑකරෙව්, වාසික්ෂුරයන් මෙන්; සරූපා, සවරූප වූ (=සුදුසු වූ); දෙළේ, ධුරයෙහි (=කෘත්‍යභාරයෙහි); යොදා, යුක්ත කරවි.

නට, නටවිභක්ති වේ; සාමුවෝ, ශාඛාමෘගයෝ; රුක්නට, වෘක්ෂයන්ට; නැඟෙත්, ආරූඪ වෙත්.

අන්, අන්විභක්ති වේ; දරුවන්, දාරකයන්; බලන්නහු, අවලොකනය කරන්නහුගේ; ළ, හෘදය; සැනැහේ, ස්නිග්ධ වේ.

මහණ + උන්, පිළිමල්+න, මොනර + ආන, දන+න්, රුක් + නට, දරු + අන් කියා ශබ්ද ප්‍රකෘති හා විභක්තිප්‍රත්‍යය තබා සවර පර තැන සංහිතාකාර්‍ය ද කිරීමෙන් 'මහණුන්' යනාදි බහු වචන රූපයන්ගේ සිද්ධිය වෙයි. ප්‍රකෘත්‍යාදිකර්මභෙද යටකී නයින් දතයුතු.

(10) ප—සේනන්, ජේතයන්; බුහුමනන්නේ, බහුමාන කරන්නේ ය; ඈ, මෙ ආදි ප්‍රයොගතෙම; හුණා බැවින්, (සූත්‍රයෙහි) ශ්‍රූයමාණත්වයෙන්; නන්විබතින්, නන්විභක්තියෙන්; සිදු පා, සිද්ධ වූ පාඨ යි.

**තිලෝගුරු තෙමස් මුරුනට අබිදම් දෙසී මෙඈ අසත්යෝහි ද, දෙව්දත් මවට මැනැවි ඈ ඉතිබූඅරුත්හි ද, ඉසිවතුන් විනා මෙගත් කහට නො රිසි ද? මෙඈ විනායෝහි ද, කම්විබත් රුසී. (11)**

---

වි—සේනන් බුහුමනන්නේ යන තැන්හි සේනන් යනු 'නන්' යන විභක්තියකින් සිද්ධ වූ බැව් පැහෙතත් එවැනි ප්‍රත්‍යයක් සූත්‍රයෙහි නො කියන ලද්දේ ය. එතකුදු වුවත් සූත්‍රයෙහි 'නානන් නමන් බුහුබසැ' යි කියනු ලබන කල්හි 'නාන්' යන්නක් ඇසෙන බැවින් හෙද මෙහි ඇතුළත් සේ සලකනලදි. මෙසේ ශ්‍රූයමාණත්වයෙන් ප්‍රත්‍යයග්‍රහණය මාගධ සංස්කෘත ශබ්දශාස්ත්‍රයන්හි නො කියන ලද්දේ ය. පුරාතන සන්නයෙහි මෙය ද්‍රාවිඩ ව්‍යාකරණානුගත බැව් දක්වන්නෝ 'සූත්‍රෝච්චාරණයෙහි ශ්‍රූයමාණ වූ විභක්තියගේ ග්‍රහණය වීරසෝළියම් ආදි ද්‍රාවිඩ ව්‍යාකරණකාරයන් විසින් ආචරිත නු යි' යනු කීහු.

(11) ප— තිලෝගුරු, ත්‍රෛලෝක්‍යාචාර්‍ය්‍යතෙම; මුරුනට, දෙවියන්ට; තෙමස්, මාසත්‍රයක් මුළුල්ලෙහි; අබිදම්, අභිධර්මය; දෙසී, දෙසනා කෙළේ; මෙඈ, මේ ආදි වූ; අසත්යෝහි ද, අත්‍යන්තසංයොගයෙහි ද; දෙව්දත්, දෙවදත්තතෙම; මවට, මාතෘවට; මැනැවි, මනොඥ ය; ඈ, මේ ආදි වූ; ඉතිබූඅරුත්හි ද, ඉත්ථම්භූතාර්ථයෙහි ද; මෙගත්, මේ ග්‍රන්ථය තෙම; ඉසිවතුන් විනා, ඍෂීංවතුන් හැර; කහට, කවරක්හට; නො රිසි ද? රුචි නො වේ ද? මෙඈ, මේ ආදි වූ; විනායෝහි ද, විනාශබ්ද යොගයෙහි ද; කම්විබත් රුසී, කර්මවිභක්ති අභිමත යි.

වි—අත්‍යන්තසංයොගය යනු ක්‍රියාව හා සමග හෝ ගුණය හා සමග හෝ ද්‍රව්‍යය හා සමග හෝ කාලයාගේ ද, මාර්ගයාගේ ද නිරන්තර සම්බන්ධය යි. "ක්‍රියාගුණද්‍රව්‍යෛඃ කාත්ස්න්‍යෙන කාලාධ්වනොඃ සම්බන්ධො'ත්‍යන්තසංයොගඃ" යනු මේ සඳහා ආචාර්‍ය්‍ය ජයාදිත්‍යයන්ගේ වර්ණනා යි-'තිලෝගුරු තෙමස් මුරුනට අබිදම් දෙසී' යන්නෙහි 'දෙසී' යන ක්‍රියාවගේ 'තෙමස්' යන කාලය හා නිරන්තර සම්බන්ධය, හෙවත් අතරක් නැති ව නො කඩ ව තුන් මසක් මුළුල්ලෙහි දෙශනා ක්‍රියාවගේ පැවැත්ම, අත්‍යන්තසංයොග නම් වේ. මේ දක්වන ලද්දේ ක්‍රියා, කාල දෙදෙනාගේ සම්බන්ධයෙන් වූ අත්‍යන්තසංයොගය යි.

**'මසක් ශීතය'**යි කී කල්හි ගුණ කාල දෙදෙනාගේ සම්බන්ධය වේ. **'මසක් මාංසාහාර ඇත්තේ ය'**යි කීකල්හි ද්‍රව්‍ය කාල දෙදෙනාගේ සම්බන්ධය වේ. මාර්ගය නම් ක්‍රොශගව්‍යූති ආදි මාර්ග

“එළැඹැ බුදුන් කරා”යි මෙඇසි වෙත් අරුත්සදින් වේ. (12)

ඉති කම්විබත්.

---

ප්‍රමාණ සි. ක්‍රොශයක් හඳුරසි, ක්‍රොශයක් කුටිල වූ නදිය සි, ක්‍රොශයක් පර්වතය සි; යන මෙහි හැදූරීම් ක්‍රියාව ද, කුටිලගුණය ද, පර්වතාඛ්‍ය ද්‍රව්‍යය ද යන මොවුන් හා ක්‍රොශ සඞ්ඛ්‍යාත මාර්ගයාගේ නිරන්තර සම්බන්ධය වේ. මෙහි වූ කර්මවිභක්තිය ඔවුන්ගේ නිත්‍යසම්බන්ධත්වය ප්‍රකාශ කරන්නී ය. එහෙයින් අර්ථ කියනකලැ අත්‍යන්තසංයොගය ප්‍රකාශවන පිණිස මසක්, ක්‍රොශයක් යනාදියට මසක් මුළුල්ලෙහි; ක්‍රොශයක් මුළුල්ලෙහි; යනාදීන් අර්ථ කියයුතු ය. මසෙක්හි; ක්‍රොශයෙක්හි; කියා ආධාර විභක්ති කළ හොත් ක්‍රියාදීන් හා කාලාධ්වයන්ගේ නිරන්තර සම්බන්ධය ප්‍රකාශ නො වේ. අතරතුර විච්ඡේදයක් හැඟෙන හෙයිනි. මසකට දෙවරක් හඳුරයි, මසෙක්හි දෙවරක් හඳුරයි යනාදීන් සම්බන්ධාධාර විභක්තීන්ගේ යෙදීමෙහි අත්‍යන්තසංයොගයාගේ අභාවය සලකනු. 'ඉත්ථම්භූත' නම් කිසි ප්‍රකාරාන්තරයක්හුගේ පැමිණීම ය හෙවත් පළමු තුබූ ප්‍රකාරය හැර අනික් ප්‍රකාරයකට පැමිණීම සි. 'දෙව්දත් මවට මැනැවි' යන්නෙන් දෙව්දත්තෙමේ මාතෘවට පළමු අමනොඥ වැ සිට පසු ව මනොඥ විය (=යහපත් විය) යන අර්ථය ප්‍රකාශ වෙයි. මේ පසු ව වූ ප්‍රකාරය ඉත්ථම්භාව නම්. මෙය හැඟවීමෙහි කර්මවිභක්තිය ආචාර්‍ය්‍යයන්ට අභිමත සි. විනායොගය යනු විනා යන නිපාතයාගේ යෙදීම ය. වර්ජනාර්ථ වූ විනාශබ්දයාගේ මෙන් එම අර්ථ ඇති අන්‍ය ශබ්දයන්ගේ ද යොගය විනායොගයෙහි ලා දතයුතු වේ. එහෙයින් 'ඉසිවතුන් මුත්' ඉසිවතුන් මිස යනාදියෙහි ද කර්මහක්තිය ඉෂ්ට සි.

(12) ප—බුදුන් කරා, සර්වඥයන් වහන්සේ සමීපයට; එළැඹැ සි, උපස්ථිත වැ යන; මෙඇහි, මේ ආදියෙහි; වෙත්අරුත්සදින්, සමීපාර්ථ (කරා) ශබ්දයා කෙරෙන්; වේ, (කර්මවිභක්ති) වේ.

වි—මෙහි 'බුදුන්' යන ෂෂ්ඨ්‍යන්තපදයෙන් පර ව 'කරා' ශබ්දය යොදා එයින් පර ව කර්මවිභක්ති යොදන ලදී. මේ ආදි තන්හි ෂෂ්ඨ්‍යන්තශබ්ද ප්‍රකෘතිහු කෙරෙන් සමීපාර්ථ කරා ශබ්දය යොදා කර්මවිභක්ති කිරීම සිංහල භාෂායෙහි විකල්පවිධානයෙකි. අවධි ආධාර විභක්තීහු ද මෙසේ කරා ශබ්දයෙන් පර ව බොහෝ සෙයින් යොදනු ලැබෙත්. බුදුන් කෙරෙන්, බුදුන් කෙරෙහි; යනාදිය නිදර්ශන සි. 'බුදුන්'යී ෂෂ්ඨී බහුවචනය ගරු වශයෙන්

මෙහෙයුම් ලද නො ලද—කිරිය කරනුයේ කතු නම්
දෙබසෙහි යොදු සමසේ—ට නට විනා කම්විබත්. (13)

අ, සරණතඹර වරලස—සෙවෙලවල කැරැ අරියන
රදුව පෙර කළවමන්—කුසනිරිඳු නො සෙමෙළේ. (14)

---

ව්‍යවහාර යි. සංස්කෘත මාගධ භාෂාවන්හිදු තමා සඳහාත්, ගරු කටයුත්තන් සඳහාත් එකක්හු කෙරෙහිදු බහුවචනප්‍රයෝගය නිරූඪ ය. සිංහල වෛයාකරණයන්ට ද ඒ එසේ ම අභිමත වේ.

**කම්විභක්ති නිමි.**

---

(13) ප—මෙහෙයුම්, ප්‍රේරණය; ලද, ලැබ හෝ; නො ලද, නො ලැබ හෝ; කිරිය කරනුයේ, ක්‍රියාව කරන්නේ; කතු නම්, කර්තෘ නම්; දෙබසෙහි, වචනද්වයෙහි; ට නට විනා, ට-නට (යන විභක්තිද්වය) හැර; කම්විබත්, (සෙසු) කම්විභක්ති; සමසේ, සමානපරිද්දෙන්; යොදු, යුක්ත කරව්.

භා—අන්‍යයක්හු විසින් නියෝග කරන ලදින් හෝ නො කරන ලදින් හෝ ක්‍රියාව කරන තැනැත්තේ කර්තෘ නම්. මේ කාරකයෙහි ට, නට යන විභක්ති හැර අවශෙෂ වූ කර්මවිභක්ති ප්‍රත්‍යය එකවචන, බහුවචන දෙක්හි ම කර්මකාරකයෙහි මෙන් යුක්ත කරනු.

වි—'මෙහෙයුම්' යනාදි මේ උපාඞ්ගසූත්‍රය කාතන්ත්‍රවෘත්ති කාර ආචාර්ය්‍ය දුර්ගසිංහයන් විසින් දක්වන ලද :-

"යඃ ක්‍රියාං කර්තෘකර්මස්ථාං කුරුතෙ මුඛ්‍යභාවතඃ
අප්‍රයුක්තඃ ප්‍රයුක්තො වා ස කර්තා නාම කාරකම්"

යන ශ්ලෝකය ඇසුරු කොට රචිත බැව් පෙනේ.

යඃ, යමෙක්තෙම; අප්‍රයුක්තඃ, නො මෙහෙයන ලදු ව හෝ; ප්‍රයුක්තඃ වා, මෙහෙයන ලදු ව හෝ; මුඛ්‍යභාවතඃ, ප්‍රධානභාවයෙන්; කර්තෘකර්මස්ථාම් ක්‍රියාම්, කර්තෘ කර්ම දෙදෙනා කෙරෙහි පිහිටි ක්‍රියාව; කුරුතෙ, කෙරේ ද; සඃ, හෙතෙම; කර්තා නාම කාරකම්, කර්තෘකාරක නම්; යනු ශ්ලෝකාර්ථ යි.

(14) අ, අවිභක්ති වේ; සරණතඹර, චරණ නමැති තාම රසය; වරලස සෙවෙල්, ධම්මිල්ල නමැති ශෛවාලයෙන්; අවල කැරැ, ආකුල කොට; අරියන, ආරබ්ධතාකරන්නා වූ; රදුව, රාජ දුහිතෘව විසින්; පෙර, පූර්වයෙහි; කළ, කරනලද; අවමන්, අවමානය; කුසනිරිඳු, කුශනරෙන්ද්‍රතෙම; නො සෙමෙළේ, සමරණය නො කෙළේ ය.

**උ, රජු අනුදත්තේ කුලදම්. ආ, මුනිඳු වැළඳූ පාද. හු, පින්සිපිහු කළ අත්කම්. උන්, කමන්නෑ දදුන් කළ වරද. න, මීපල්න ගත් වෙස් රුස්නේ. ආන, නරාන කළ කමට ඉඳුරෝ දෙස්. න්, කිවින් නුදුටුයේ කෙ උවම්. අන්, අඟනන් වුහුවු නුවන්නරද දිරියඇදුරු දදුරුකෙළේ. (15)**

---

මෙහි 'කළ' යන ප්‍රත්‍යයාන්ත (කෘදන්ත) ක්‍රියාව විසින් අනුක්ත වැ කර්තෘකාරක වැ සිටි 'රදු' ශබ්දයා කෙරෙන් අප්‍රත්‍යය හා වකාරාගම ද, උකාරයහට මත් අඩු ද කිරීමෙන් 'රදුව' යනු සිද්ධ සි.

(15) උ, උවිභක්ති වේ; රජු, රජහු විසින්; අනුදත්තේ, අනුඥකරන ලද්දේ; කුලදම්, කුලධර්මය යි–'රජ + උ' යන ප්‍රකෘති ප්‍රත්‍යයන්ගේ සංහිතායෙන් 'රජු' යනු සිද්ධ සි.

ආ, ආවිභක්ති වේ; මුනිඳු, මුනීන්ද්‍රයා විසින්; වැළඳූ, වළඳන්ජිත වූ; පාද, පාත්‍රධාතුව යි. "මුනිඳු+ආ" යන ප්‍රකෘති ප්‍රත්‍යයන්ගේ ගැළපීමෙන් 'මුනිඳු' යනු සිද්ධ සි.

හු, හුවිභක්ති වේ; පින්සිපිහු, පුණ්‍යනමැති ශිල්පිහු විසින්; කළ, කරනලද; අත්කම්, හස්තකර්මය යි– පින්සිපි ශබ්දයා කෙරෙන් හුවිභක්ති කළ කලැ 'පින්සිපිහු'යි සිද්ධ සි.

උන්, උන්විභක්ති වේ; දදුන්, මූඪයන් විසින්; කළ, කරන ලද; වරද, අපරාධය; කමන්නෑ, ක්ෂමාකරන්නෑ. දද+උන් 'දදුන්' යි සංහිතා සි.

න, නවිභක්ති වේ; මීපල්න, මහීපාලයන් විසින්; ගත් ගෘහිත වූ; වෙස්, වෙශයතෙම; රුස්නේ, රුචිවන්නේ ය- 'මීපල්+න යන ප්‍රකෘතිප්‍රත්‍යය යොග මාත්‍රයෙන් සිද්ධ සි.

ආන, ආනවිභක්ති වේ; නරාන, මනුෂ්‍යයන් විසින්; කළ, කරනලද; කමට, කර්මයට; ඉඳුරෝ, ඉන්ද්‍රියයෝ; දෙස්, සාක්ෂිහු ය- මෙහි 'නර + ආන' 'නරාන'යි සංහිතා සි.

න්, න්විභක්ති වේ; කිවින්, කවීන් විසින්; නුදුටුයේ, නො දක්නා ලද්දේ; කෙ උවම්, කවර උපමායෙක් ද? 'කිවි+න්' යන ප්‍රකෘතිප්‍රත්‍යයයොගමාත්‍රයෙන් සිද්ධ සි.

අන්, අන්විභක්ති වේ; අඟනන්, අඞ්ගනාවන් විසින්; වුහුවු, හරනලද; නුවන්නරද, නයන නමැති නාරාචයතෙම; දිරිය

**අරුත්වියසන්හි විසින් විබතින් පර වැ රුසි, තෙනෙත්හු විසින් කම් දම්.** (16)

---

ඇදුරු, ධෛර්‍ය නමැති අද්‍රිය (=පර්වතය); දුදුරුකෙළේ, ජර්ජර කෙළේ සි- 'අගන + අන්' 'අගනන්' යි සංහිතා සි.

(16) ප — අරුත්වියසන්හි, (කර්තෘවිභක්ති) අර්ථව්‍යාඛ්‍යාන යෙහි; විබතින් පර වැ, විභක්තියෙන් පරනිපාත වැ; විසින් රුසි, විසින් යන්නක් රුචි සි; තෙනෙත්හු විසින්, ත්‍රිනෙත්‍රයා විසින්; කම්, කාමතෙම; දම්, දග්ධ සි.

භා—කර්තෘවිභක්තියට අර්ථ කියන කල්හි කර්තෘකාරකය සුප්‍රකාශ වනු පිණිස 'විසින්' යන්නක් විභක්තියෙන් පර වැ නිපාතනය කිරීම ද අභිමත ය.

වි—මෙහි 'විසින්' යනු චතුර්විධ පදයන් අතුරෙන් කවර පදයෙක් ද යතහොත් මාගධ 'වස' ශබ්දයෙන් බිඳුණු 'විසි' යන තද්භව ශබ්දයා කෙරෙන් 'න්' ප්‍රත්‍යය ව සිද්ධ වූ නාමපදයෙකැ යි සැලකිය යුතු සි. කර්තෘකාරකතෙමේ කර්මාදි සෙසුකාරකයනුදු තමන් තමන් පිළිබඳ ක්‍රියාහි යොදවමින්,

"නිෂ්පත්තිමාත්‍රෙ කර්තෘත්වං සර්වත්‍රෛවාස්ති කාරකෙ
ව්‍යාපාරභෙදාපෙක්‍ෂායාං කරණත්වාදිසම්භවඃ"

යනු හරියුක්ති හෙයින් අපාදන සම්ප්‍රදානාදි සියලු කාරක යන්හි පිහිටි ක්‍රියානිෂ්පාදක කර්තෘත්වය තමා වසෙහි පවත්වමින් තමා විසියෙන් ම ක්‍රියාව නිපදවා ද, එහෙයින් ඒ වශීභාවය කර්තෘහු කෙරෙහි ම පිහිටි බැවි හඟවමින් කර්තෘත්වය සුප්‍රකාශ කැරනු පිණිස සිංහල වෛයාකරණයෝ 'විසින්' යන කරණ විභක්ත්‍යන්තපදයාගේ පරනිපාතය ද දක්වූහ.

වාක්‍යපදීයයෙහි :-

"ක්‍රියායාඃ පරිනිෂ්පත්තිර්‍යද්ව්‍යාපාරාදනන්තරම්
විවක්‍ෂ්‍යතෙ යදා යත්‍ර කරණං තත්තදා සමෘතම්"

යූ බැවින් කර්තෘකාරකය හැර අවශෙෂයන් කෙරෙහි කරණ කාරකය ද බලීවෙයි. එහෙයින් පුරාතනයෝ 'සංක්‍ෂෙප විසින්, විස්තර විසින්' යනාදීන් කරණකාරකයෙහිදු 'විසින්' යන්නහුගේ ප්‍රයොගය කළහ. හේ මෙහි ප්‍රතිරාජ පරිවෙණයන් විසින් නො කියනලදී.

**සුගතිඳු හා කා ගි සම? වාරේවරැ වනන් හා සමර සමර කෙරෙයි මෙඇැගි හා සබඳෙගි කතුවිබත් රුැසි.** (17)

**ඉති කතුවිබත්.**

---

**කිරිය සැපයීමෙහි—ඉවහල් කතු කරණ නම්**
**ඉන් එන් නෙන් ඉයුතු—වියුතු දෙබසෙහි සම නි ද.** (18)

**ඉන්, වතින් ගුරුැන් අරියනු. එන්, ගුණෙන් දනා සඟන් නේ. නෙන්, මෙත්නෙන් වෙන් පරයනු. ඉයුතු: ඉනි, සිතිනි වේ දුසිරි සුසිරි. එනි, නිසෙනි පළට වනු. නෙනි, නැත්නෙනි බව පියවි. නි, නමව් ගිසමගනි නිවන් වන්.** (19)

---

(17) ප—සුගතිඳු හා, සුගතෙන්ද්‍රයා හා; කා ගි, කවරෙක් වන්නාහි; සම, සමාන ද? වාරේවරැ, වර්‍ෂා කාලයෙහි; වනන් හා, විරහීන් හා; සමර, සමරතෙම; සමර කෙරෙයි, යුද්ධ කෙරෙයි. මෙ ඇැගි, මේ ආදියෙහි; හා සබඳෙහි, **'හා'** යන නිපාතසම්බන්ධය ඇති කල්හි; කතුවිබත්, කර්තෘවිභක්තිය රුැසි, අභිමත යි. **'හා'** යන නිපාතය සමඟ යෙදීමක් ඇති කල්හි කර්තෘවිභක්තිය අභිමතය යි සේයි.

**කර්තෘවිභක්ති නිමි.**

---

(18) කතු, කර්තෘහට; **කිරිය සැපයීමෙහි,** ක්‍රියාසම්පාදන යෙහි ලා; ඉවහල්, ඉතා උපකාර වූයේ; කරණ නම්, කරණ (කාරක) නම්; ඉයුතු, ඉකාරයුක්ත වූත්; වියුතු, (ඉකාර) වියුක්ත වූත්; ඉන් එන් නෙන්, ඉන් ප්‍රත්‍යය, එන්ප්‍රත්‍යය, නෙන්ප්‍රත්‍යය යන මේ ද; නි ද, නිප්‍රත්‍යය ද; දෙබසෙහි, වචනද්වයෙහි; සම, සමාන වේ.

**භා**—ක්‍රියාසම්පාදනය පිණිස කර්තෘහට ඉතා උපස්තම්භ ව (=උපකාර ව) පවත්නා කාරකය කරණ නම් වේ. එහි එකවචන බහුවචන දෙක්හි ම නො වෙනස් වූ; **ඉන්, එන්, නෙන්, ඉනි, එනි, නෙනි, නි** යන විභක්ති සප්තකය වේ.

(19) **ඉන්, ඉන්විභක්ති** වේ; වතින්, වෘත්තය (=පැවැත්ම) කරණකොට ගෙන; ගුරුැන්, ආචාර්‍යයන්; අරියනු, ආරාධනය කරනු.

**වත්+ඉන්** යන ප්‍රකෘතිප්‍රත්‍යයන්ගේ සංහිතායෙහි වතින් යනු සිද්ධ යි. වත් යනු වත්‍රාවත යි, මෙහි ගුරුැන් පිළිබඳ ආරාධනක්‍රියාව (=සිත්ගැනුම් ක්‍රියාව) සිදුකරන්නාහට ගුරුැන්ට කළ යුතු වත ඉතා උපකාර වන හෙයින් **'වත්'** ශබ්දය කරණවිභක්ති ඇසුරුැ කෙරේ. සෙසු ක්‍රියාහි ද කරණය හැදිනීම මේ ක්‍රමයෙන් වේ.

**"සැරදේ නුවන් මිණිපබුරෙන්" ඈ උපලකුණුඅරුත්හි ද මෙවිබත් රුසි.** (20)

**ඉති කරණවිබත්.**

---

**එන්**, එන්විභක්ති වේ; ගුණෙන්, ගුණය කරණකොටගෙන; දනා, ජනයා; සගන්නේ, සඞ්ග්‍රහකරන්නේ ය. ගුණ+එන් යනු යි.

**නෙන්**, නෙන්විභක්ති වේ; මෙත්නෙන්, මෛත්‍රිය කරණකොටගෙන; වෙර, වෛරය; පරයනු, පරාජය කරනු. **මෙත්** ශබ්දය හා 'නෙන්' විභක්තියගේ යොගය යි.

ඉසුතු, ඉකාරයුක්ත වේ; **ඉනි**, ඉනිවිභක්ති වේ; **සිතිනි**, චිත්තය කරණකොටගෙන; දුසිරි සුසිරි, දුශ්චරිතය හා සුචරිතය; වේ, වන්නේ ය. **සිත්**ශබ්දය හා **ඉනි**විභක්තියගේ සංහිතා යි.

**එනි**, එනිවිභක්ති වේ; නියෙනි, ඥානය කරණකොටගෙන; පළට වනු, ප්‍රකට වනු. **නී**ශබ්දයා කෙරෙන් **එනි**විභක්ති යි. යකාරාගම හා ඊකාරයහට මාත්‍රාහානි ද කිරීමෙන් **'නියෙනි'**යි සිද්ධ යි.

**නෙනි**, නෙනිවිභක්ති වේ; තැත්නෙනි, උත්සාහය කරණකොටගෙන; බව, භවය; පියවි, දුරුකරවි. **තැත්**ශබ්දය හා **නෙනි** විභක්තියගේ යෙදීම යි.

**නි**, නිවිභක්ති වේ; හියමගනි, හිය වූ මාර්ගය කරණකොටගෙන; නිවන්වන්, නිර්වාණප්‍රවිෂ්ටවූවහු; නමවි, නමදිවි.

**හියමග**ශබ්දය හා **නි**විභක්තියගේ යොගයෙන් **'හියමගනි'**යි සිද්ධ යි. මේ සුතුරෙහි **ඉනි** ප්‍රත්‍යයහට උදාහරණ වෙන ම කියන ලද හෙයින් මෙතැන්හි **'හියමගිනි'**යි තුබූ පාඨය අශුද්ධ ය; අනුචිත ය. **'හියමග+නි'** කියා ප්‍රකෘතිප්‍රත්‍යයයොග මාත්‍රයෙන් ම පදසිද්ධිය සැලකීම සුදුසු වේ.

(20) **ප**—නුවන්, නයන නමැති; මිණිපබුරෙන්, මණිප්‍රාභෘතයෙන් (උපලක්ෂිත වැ); සැරදේ, චිරජීවනය කෙරෙහි; ඈ, මේ ආදි වූ; උපලකුණු අරුත්හි ද, උපලක්ෂණාර්ථයෙහි ද; මෙවිබත්, මේ (කරණ) විභක්ති; රුසි, අභිමත යි.

**වි**—උපලක්ෂණ නම් සමීපසංලක්ෂණය යි. මෙහි චිරජීවන ක්‍රියාවට කර්තෘවූවාහට (අනුන්ගෙන් ලැබෙන්නා වූ) නුවන්මිණි පඬුර උපලක්ෂණ යි. ජීවනක්‍රියා කර්තෘ තෙමේ එයින් උපලක්ෂිත යි. යුක්ත යි.

**කරණවිභක්ති නිමි.**

---

**දන් ඈ ලබනුයේ—පිණිසනිසි හා සපදන්**
**හටෙකනැ අනට බුහුබසැ—ට නැත ට යෙදු කම්විබත්. (21)**

**හට, ජරඬවින්ා වියමුවෙන් සිපා රැහැ උරා නිරොද තුනුකෙහට මරහට නො දෙන නෙක් තුන්දෙරින් සුසිරි පිරැව සෙයේ. (22)**

**අට, උකටලියට දලැදිලි දෙනු පියසමාමිහි. උට, පෙරෙවි රජුට ආසි දේ. ආට, සදියාට දන් දෙනු. හුට, වෙළඳහුට බඩු දේ. ට, මෙගෙට සෙත් වඩමි. (23)**

---

(21) **ප**—දන් ඈ, දානාදිය; ලබනුයේ, ලබන තැනැත්තේ **ද**; පිණිසනිසි හා, පිණිස යන්නට නිඃශ්‍රයවූයේ ද; සපදන්, සම්ප්‍රදාන නම් වේ; එකතැ, එකාර්ථයෙහි; හට, හට විභක්ති (වේ); බුහුබසැ, බහුවචනයෙහි; අනට, අනට විභක්ති වේ; ට නැත, ටකාරය නැතහොත්; ට යෙදු, ටකාරය යුක්ත කළා වූ; කම්විබත්, කර්ම විභක්ති **ද** (වේ);

**භා**—දානාදිය ලබන ප්‍රතිග්‍රාහක තෙමේ සම්ප්‍රදාන නම් වෙයි. **පිණිස** යන නිපාතය ඇසුරු කළා වූ කාරකය ද සම්ප්‍රදාන නම් වේ. ආදිශබ්දයෙන් කර්තෘතෙම යමක්හු උදෙසා ක්‍රියාව කෙරේ නම් ඒ ක්‍රියොද්දේශ්‍ය තැනැත්තේ ද නොහොත් ක්‍රියායෙන් උදෙසනු ලබන තැනැත්තේ ද සම්ප්‍රදාන නම් වේ. එකවචනයෙහි '**හට**' විභක්ති හා බහුවචනයෙහි '**අනට**' විභක්ති **ද** වේ. කර්මවිභක්තීන් අතුරෙහි ටවිභක්තිය ද, ටකාරය නැති විභක්තීන් ටකාර යුක්ත කොට ද සම්ප්‍රදානකාරකයාගේ එකත්ව, බහුත්ව දෙක්හි යොදත්තේ ය.

(22) **ප**—හට, හටවිභක්ති වේ; ජරඬවින්න, ජරා නමැති ඩාකිනිය විසින්; වියමුවෙන්, ව්‍යාධි නමැති මූඛයෙන්; සිපා, චර්වණය කොට; රැහැ, රසය; උරා, චූෂණය කොට; නිරොද, නිරොජස්ක වූ; තුනුකෙහට, ශරීර නමැති චර්විතය (=සපය); මරහට, මාරයාහට; නො දෙන නෙක්, දානය නො කරන නෙක්; තුන්දෙරින්, ද්වාරත්‍රයෙන්; සුසිරි, සුචරිතය; පිරැව, පූරණය කළ මැනවි; [illegible] සුභ සි. 'මර' ශබ්දය හා 'හට' විභක්තියගේ සන්ධියෙන් 'මරහට' යනු සිද්ධ සි.

(23) **ප**—අට, [illegible]විභක්ති වේ; උකටලියට, උත්කණ්ඨිතාවට; පියසමාමිහි, ප්‍රියසමාගමයෙහි; දලැදිලි, ජලාඤ්ජලියක්; දෙනු, [illegible]නු.

'උකටලී' ශබ්දයා කෙරෙන් අටවිභක්ති කොට යකාරාගම ද ඊකාරයාහට මාත්‍රාහානි [illegible] කිරීමෙන් 'උකටලියට' යනු සිද්ධ යි.*

---

* මෙහි 'ලිය' ශබ්දය යි. සලකත්හොත් 'අට'විභක්ති නො කිය යුතු ය. එසේ [illegible] 'ට' විභක්ති කිය යුතු හෙයිනි.

**උන්ට, මහතුන්ට කර පිණිපා. නට, දුබුලෝ පරනට පිටු දෙත්. ආනට, තළාකෙළියෙහි තරඟ දෙබේරා බට පබවත වත තඹරානට නිගා දින්. න්ට, මහත්මෝ පරඟනන්ට උර, රුපුන්ට පිටු ද නො දෙත්. අන්ට, මෙහෙළියන්ට නිසෙනි හැඟි නො පවසනු. අනට, සරසවිය පුදනුවනට නිස දේ.** (24)

---

**උට**, උටවිභක්ති වේ; පෙරෙවි, පුරොහිතතෙම; රජුට, රජහට; ආසි දේ, ආශීර්වාද දානය කෙරේ. රජශබ්දය හා උටවිභක්තියගේ ගැළපීමෙන් 'රජුට' යනු වී.

**ආට**, ආටවිභක්ති වේ; යදියාට, යාචකයාහට; දත්, දාතව්‍ය වස්තුව; දෙනු, දානය කරනු. යදිශබ්දයා හා ආටවිභත්තියගේ යොගයෙහි යකාරාගම සංහිතායෙන් 'යදියාට' යනු වී.

**හුට**, හුටවිභක්ති වේ; වෙළඳහුට, වණික්හට; බඩු දේ, භාණ්ඩ දානය කෙරේ. වෙළඳශබ්දයා හා හුටවිභක්තියගේ යොගයෙන් 'වෙළඳහුට' යනු වී. මෙකී සියල්ල දානප්‍රතිග්‍රාහක සම්ප්‍රදාන යි.

**ට**, ටවිභක්ති වේ; මෙගෙට, මේ ගෘහයට; සෙත්, ශාන්තිය, වඩම්, වර්ධනය කෙරෙමි. ගෙශබ්දය හා ටවිභක්තියගේ යොගයෙහි; 'ගෙට' යනු වී. මේ ක්‍රියොද්දෙශ්‍ය සම්ප්‍රදාන යි.

(24) ප—**උන්ට**, උන්ටවිභක්ති වේ; මහතුන්ට, මහාත්මයන්ට; පිණිපා කරා, ප්‍රණිපාත කරව්. මහත්ශබ්දයා කෙරෙන් 'උන්ට' විභක්ති කොට සවරසංහිතායෙන් 'මහතුන්ට' යනු වී.

**නට**, නටවිභක්ති වේ; දුබුලෝ, දුර්වලයෝ; පරනට, ශත්‍රූන්ට; පිටු දෙත්, පෘෂ්ඨදානය කෙරෙත්. පරශබ්දයා කෙරෙන් 'නට' විභක්ති වැ 'පරනට' යනු වී. මෙහි සම්ප්‍රදානත්වය ගෞණ වශයෙනි.

**ආනට**, ආනටවිභක්ති වේ; තළාකෙළියෙහි, තඩාගක්‍රීඩායෙහි; තරඟ, තරඞ්ගයන්; දෙබේරා, ද්විභාග කොට; බට, අවතීර්ණ වූ; පබවත, ප්‍රභාවතියගේ; වත, වක්ත්‍රයතෙම; තඹරානට, තාමරසයන්ට; නිගා දින්, නිග්‍රහදානය කෙළේ. තඹරශබ්දය හා 'ආනට' විභක්තියගේ යොගයෙන් 'තඹරානට' යනු වී.

**න්ට**, න්ටවිභක්ති වේ; මහත්මෝ, මහාත්මයෝ; පරඟනන්ට, පරාඞ්ගනාවන්ට; උර, වක්ෂස ද; රුපුන්ට, ශත්‍රූන්ට; පිටු ද, පෘෂ්ඨය ද; නො දෙත්, දානය නො කෙරෙත්. අඟනශබ්දය හා ද රුපුශබ්දය හා ද 'න්ට' විභක්තියගේ යොගයෙන් 'අඟනන්ට, රුපුන්ට' යනු වී.

**පිණිස නිසිතැනැ අට, සටනට නික්මිණ්, මඟුලට සැරැ සිණ්, බුජ නම් මැවිණ් දෙන්නට ද, කොටන්නට ද.** (25)

---

**අන්ට,** අන්ටවිභක්ති වේ; මෙහෙලියන්ට, මහිලාවන්ට (=ස්ත්‍රීන්ට); නිසෙති, නිඃශෙෂයෙන්; හැඟි, ඉඞ්ගිතය; නො පව සනු, ප්‍රකාශ නො කරනු. මෙහෙලිශබ්දය හා 'අන්ට' විභක්ති යගේ යොගයෙහි යකාරාගම සන්ධියෙන් 'මෙහෙලියන්ට' යනු වී.

**අනට,** අනට විභක්ති වේ; සරසවිය, සරස්වතීතොමෝ; පුදනු වනට, (තමා) පුදන්නවුන්ට; නිය, ඥානය; දේ, දෙන්නී ය. පුදනුශබ්දය හා අනටවිභක්තියගේ යොගයෙහි වකාරාගම සන්ධියෙන් 'පුදනුවනට' යනු වී.

(25) **ප**—පිණිස නිසිතැනැ, පිණිස (යන පදාර්ථය) ආශ්‍රිත වූ තන්හි; අට, අටවිභක්ති වේ; සටනට, සටන් පිණිස; නික්මිණි, නිෂ්ක්‍රාන්ත වී; මඟුලට, මඟුල් පිණිස; සැරැසිණි, සජ්ජිත වී.

**වි**—'**පිණිස**' යන්නෙහි අර්ථය මාගධ සංස්කෘත ව්‍යාකරණ යන්හි තාදර්ථ්‍යනාමයෙන් කියන ලද්දේ ය. පිණිස යනු මාගධ අව්‍යය පදයක් වූ 'පටිච්ච' යන පූර්වක්‍රියාගෙන් බිඳුණු හෙයින් නිපාතයෙක් වේ. මේ නිපාතය තමා හා යෙදුණු ශබ්දයාගේ අර්ථය ප්‍රයෝජන කොට ගෙන කර්තෘහුගේ ක්‍රියාව පවත්නා බැව් ප්‍රකාශ කෙරෙයි. හෙවත් ක්‍රියාවේ ප්‍රයෝජනය 'පිණිස' යන්න හා යෙදුණු අර්ථය මැයි ප්‍රකාශ කෙරෙ යි. '**සටන් පිණිස නික්මිණ්**' යි කි කලැ නිෂ්ක්‍රමණ ක්‍රියාවගේ ඵලය සටනය යි '**පිණිස**' යන නිපාතයා විසින් ප්‍රකාශ කරනු ලැබේ. පිණිස යන්න නො යොදා එහි අර්ථය කිවමනා කල්හි (=පිණිස යන නිපාතයාගේ සිලව්වට) අටවිභක්ති වන බැව් මෙයින් දක්වූහ.

'මඟුලට **සැරැසිණ්**' යන තන්හි ද සැරැහුම් ක්‍රියාවේ ප්‍රයොජනය වූ මඟුල් ශබ්දයෙන් පර වැ එය ප්‍රයොජන කොට ඇති බව හඟවන්නා වූ '**පිණිස**' යන්න නො වැ ඔහුගේ සිලව්වට '**අට**' විභක්ති වේ.

**ප**—බුජ නම්, බාහුව නම්; දෙන්නට ද, දානය කරනු පිණිස ද; කොටන්නට ද, (ශත්‍රූන්) ඛණ්ඩනය කරනු පිණිස ද; මැවිණි, නිර්මිත වී.

**වි**—මෙහි ද '**පිණිස**' යන නිපාතයාගේ අර්ථය කිවමනා තන්හි 'දෙනු, කොටනු' යන භාවක්‍රියාශබ්දයන් කෙරෙන් පර වැ අටවිභක්ති වී. 'දෙනු+අට' යන තන්හි පූර්වස්වරලොපය හා නකාර ද්විත්වය ද කොට, ස්වරයා ගාත්‍රාරූඪ කිරීමෙන් 'දෙන්නට'

**මෙඅරුත්හි වස් යනු ද රුසි, බුදුවන්නවස් ඇගී. (26)**
**ඉති සපදන් විබත්.**

---

යනු සිද්ධ යි. 'බොමන්නට' යනුදු මෙසේ මැයි. මෙලෙස ද්විරූප සන්ධියෙන් යෙදීම භාවයෙහි වූ නු ප්‍රත්‍යයා කෙරෙන් ම සිද්ධ යි. 'යනු, එනු' යනාදි භාවක්‍රියා ශබ්දයන් කෙරෙන් පමණක් ම 'අට' විභක්ති යොගයෙහි 'යන්නට, එන්නට' යනාදීන් ද්විරූපය පැනෙන හෙයිනි.

තාදර්ථ්‍යයෙහි අටවිභක්ති පමණෙක් ම දක්වන ලද්දේ පුරාතන ජේකප්‍රයොගයන්හි එය ම බහුල හෙයින් උපලක්ෂණ වශයෙනි.

මූවදෙව්දාවතෙහි :-

"හගිම් දූ මමෙනෙන්-ගුණහිමියා කියන්නට"
"සඳැ පුදන්නට-විහිරූ දිවඉසිගණා"
"වැද යෙහෙන් දර-රදහු යෝනා දනන්නට"
"මා නවතන්නට-පියෝ පියා ඇමැත්තෙති"

යනාදීන් ද අටවිභක්ති ප්‍රයොගයාගේ ප්‍රාසිකත්වය සැලකිය යුතු. එසේ ද වුවත් පිණිස යන්නහුගේ අර්ථය වැති තුමර්ථයෙහි 'න්ට' 'නට' විභක්ති ද ජේකප්‍රයොගයෙහි පැනේ.

කව්සේකරයෙහි:-

"තුවෙන් අප අයැ ති "බැඳ ගේ වටා වැ ට
පසු පෙය දෙන්ට මං නැ ති යළි බත බුලත සරිකො ට
ණය කවුරු දන් දෙ ති තබා තම අඹුව ට
සිලව්වට ඒ යළි එකෙක් ඇ ති" යන්ට සැරසීලා බමුණු සිට"

තස්නට, වඳනට, විදිනට යනාදිය ද සිද්ධ යි.

(26) ප—මෙඅරුත්හි, (පිණිස යන) මේ අර්ථයෙහි; වස් යනු ද, වස් යන ප්‍රත්‍යය ද; රුසි, රුචි යි; බුදුවන්නවස් ඇගී, බුදුවන්නවස් යනාදි ආකාර ඇත්තේ යි; බුදුවනු පිණිස ය යන අර්ථ යි.

භා—පිණිස යයි කියමනා තැන භාවක්‍රියා ශබ්දාදියෙන් පර ව 'වස්' ප්‍රත්‍යය ද අභිමත ය. 'බුදුවනු' යන්නෙන් පර වැ 'වස්' ප්‍රත්‍යය කොට, ප්‍රකෘති ප්‍රත්‍යය දෙදෙනා මැද අකාරාගම කොට, පූර්වස්වරලොප ද්විරූපාදි කරණයෙන් 'බුදුවන්නවස්' යනු සිද්ධ යි. 'බුදුවනුවස්' කිව ද යෙදේ. 'පළ කරනුවස්' යි අලඞ්කාරාධිකාරයෙහි ආචාර්‍ය්‍යයන් විසින් ම මේ දක්වනලදි.

**පදඅත් පැවැත්මට-හිම්වූයේ අවදි නම්**
**කරණවිබත් ද ගෙන්යුත්-ව නට විනා කම්විබත්.** (27)

**ඉන්, කනක් මහසතු සෙලින් හෙළු. එන්, දෙව්දත් දූහැ නෙන් පිරිහිණි. නෙන්, රුක්නෙන් හිණි විලිමුවා. අගෙන්, හිරියගෙන් තොර නිවට. උගෙන්, සොරුයෙන් බිය වේ. ආගෙන්, නොකහවුරු පරාගෙන් ගතු. හුගෙන්, සවනක් සාදුඹු මුනිඳුහුගෙන් දිවේ. මෙඈ සොදනු.** (28)

---

භාවක්‍රියාශබ්දයෙන් පිටත් නාමයන් කෙරෙන් ද කිසිතැනෙක්හි වස්ප්‍රත්‍යය යෙදේ. **'තුබුපද නොලා සඳවස්'** යන්නෙහි සඳශබ්දයා කෙරෙන් වූ වස්ප්‍රත්‍යය මෙහි.

## සම්ප්‍රදානවිභක්ති නිමි.

---

(27) **ප**—පදඅත්, පදාර්ථයාගේ; පැවැත්මට, ප්‍රවෘත්තියට; හිම්වූයේ සීමා වූ (කාරකය) තෙම; අවදි නම්, අවධි නම් (වේ); කරණවිබත් ද, කරණවිභක්තිය ද; ගෙන්යුත්, ගෙන් (යන්න කින්) යුක්ත වූ; ව නට විනා, ව නට (විභක්තිද්වය) වර්ජිත වූ; කම්විබත්, කර්මවිභක්ති ද වේ.

**භා**—වෘක්ෂාදි යම්කිසිවකින් ඵලාදි කිසිවස්තුවෙක් පතනාදි ක්‍රියාවක් පූර්වඞ්ගම කොට වෙන්කරනු ලැබේ ද, ඒ වෘක්ෂාදි තෙම ඒ ඵලාදීහුගේ වෙන් ව පැවැත්මට සීමාභූත නු යි අවධි නම් වේ. හෙද චක්ෂවල, නිශ්චල වශයෙන් චලාවධිය, අචලාවධිය යි දෙවැදෑරුම් කොට කියනු ලැබේ.

මෙම කීහ සංස්කෘතශාබ්දිකයෝ :-

"යතො'පධීයතෙ කිඤ්චිත් ක්‍රියාපූර්වං කුතශ්චන
විශ්ලිෂ්‍යතෙ චලඤ්වාන්‍යමවධිං තං ප්‍රචක්ෂතෙ"යි.

මෙසේ අවධි නම් ලද අපාදානකාරකය කිවමනා කල්හි 'ගෙන්' යන්නකින් යුත් කරණවිභක්තිහු ද 'ව, නට' දෙක හැර සෙසු කර්මවිභක්තිහු ද වෙත්.

(28) **ප**—ඉන්, ඉන්විභක්ති වේ; කනක්, කානනාවක් තොමෝ; මහසතු, මහාසත්වයා; සෙලින්, ශෛලයෙන්; හෙළු, පතිත කළා. මෙහි මහාසත්වයාගේ පතනක්‍රියා ප්‍රවෘත්තියට ශෛලය සීමා නු යි. 'සෙල්' ශබ්දයා කෙරෙන් 'ඉන්' යන අවධි ප්‍රත්‍යය වී. සෙල් යන අවධිය නිශ්චලත්වයෙන් සිට සීමා වූ හෙයින් අචලාවධි යි.

**මෙඅරුත්හි තෙක්, දක්වා යනු ද රුසි. දිය තෙක් සෙවණ බඳනා, පැළලුප්නුවර දක්වා වහරේ වටී ඇගී.** (29)

---

**එන්,** එන්විභක්ති වේ; **දෙව්දත්,** දෙවදත්තතෙම; **දුහැනෙන්,** ධ්‍යානයෙන්; **පිරිහිණි,** පරිහීණ වී. **දුහැන්** ශබ්දයා කෙරෙන් එන්විභක්ති යි. මෙ ද අවලාවටි යි. මතු උදහරණ දෙක්හි ද මෙසේ මැ යි.

**නෙන්,** නෙන්විභක්ති වේ; විලිමුවා, වලීමුඛතෙම; රුක්නෙන්, වෘක්ෂයෙන්; හිණි, පතිත වී. රුක්ශබ්දයෙන් නෙන්විභක්ති යි.

**අඟෙන්,** අඟෙන්විභක්ති වේ; තිවට, තිගණ්ඩතෙම; හිරියඟෙන්, ලජ්ජායෙන්; තොරි, වර්ජිත යි. **හිරි**ශබ්දයෙන් පර වැ අඟෙන්විභක්ති යි.

**උඟෙන්,** උඟෙන්විභක්ති වේ; සොරුඟෙන්, චෞරයාඟෙන්; බිය වේ, භීතිය වෙයි. **සොර**ශබ්දයෙන් පර ව උඟෙන්විභක්ති යි. මේ වලාවටි යි.

**ආඟෙන්,** ආඟෙන්විභක්ති වේ; පරාඟෙන්, අන්‍යයාඟෙන්; ගතු, ගන්නා ලද්ද; නො තහවුරු, අස්ථාවර යි. **පර**ශබ්දයා කෙරෙන් ආඟෙන්විභක්ති යි. මෙ ද වලාවටි යි. මතු උදහරණය ද මෙසේ මැ යි.

**හුඟෙන්,** හුඟෙන්විභක්ති වේ; මුනිඳුහුඟෙන්, මුනීන්ද්‍රයා කෙරෙන්; සවනක් කදුඹු, ෂඩ්වර්ණයක් රශ්මි; දිවේ, ධාවනය කෙරේ; මෙ ඇ, මේ ආදිය; යොදනු, යුක්ත කරනු. මුනිඳුශබ්දයා කෙරෙන් පර වැ හුඟෙන්විභක්ති යි.

(29) **ප—** මෙඅරුත්හි, මේ (අවධි) අර්ථයෙහි; තෙක් දක්වා යනු ද, තෙක් යන්න හා දක්වා යන්න ද; රුසි, රුචි යි; දියතෙක්, ජගත් අභිවිධි කොට (=මුළු ලොකය ප්‍රමාණ කොට); සෙවණ, ඡායාව; බඳනා, බන්ධනය කරන්නා වූ; පැළලුප්නුවර දක්වා, පාටලිපුත්‍ර නගරය මර්‍යාද කොට; වහරේ, වර්‍ෂාව; වටී, වැස්සේ ය; ඇගී, යනාදි ආකාර ඇත්තේ යි.

**වි—** මෙහි **'තෙක්, දක්වා'** යන දෙක එයින් පූර්‍ව වූ පදාර්ථයන් බන්ධන, වර්‍ෂණ ක්‍රියාවන්ට සීමා බැව් ප්‍රකාශ කරන හෙයින් අවධි අර්ථයෙහි කරන ලද්දේ වේ. ලෝකය අභිවිධි හෙයින් එය මුළුල්ලෙහි ඡායා පැවැත්ම ද, පාටලිපුත්‍රය මර්‍යාද හෙයින් එ නගරය හැර වැසි වට බැව් ද දක්වයි. මර්‍යාද යනු හරිනු ලබන සීමාව යි, අභිවිධි යනු ගන්නා ලබන සීමාව යි.

**වරින් වර රිවිහු කොරෙන් සිසි දුරුවෙයි; මෙඈ වෙත් අරුත් සදින් වේ. (30)**

**නරන් කොරෙන් කැත් උකට; රුවනතුරෙන් මහගු රත්මැණ; යන්නන්ගෙන් දුවා සෙදහල්; මෙඈ නිදරණරුතැ අවදිවිබත් රුසි. (31)**

**දෑගුණකිරියලකුණින් සමුදයින් එක්දෙසක්හු වෙන්කිරිම් නිදරණ නම්. (32)**

---

(30) වරින් වර, වාරයෙන් වාරයෙහි; රිවිහු කොරෙන්, සූර්‍ය්‍යයා කෙරෙන්; සිසි, චන්ද්‍රතෙම; දුරුවෙයි, දූරස්ථ වෙයි යන; මෙඈ, මේ ආදිය; වෙත්අරුත් සදින් වේ, සමීපාර්‍ථ (කර) ශබ්ද යෙන් වේ. රිවිහු යන ෂෂ්ඨ්‍යන්තයෙන් පර වැ සමීපාර්‍ථ කර ශබ්දය යොදා එයින් පර වැ අවධිවිභක්ති 'එන්' ප්‍රත්‍යය කිරීමෙන් 'රිවිහු කොරෙන්' යනු සිද්ධ යි.

(31) නරන් කෙරෙන්, මනුෂ්‍යයන් කෙරෙන්; කැත්, ක්‍ෂත්‍රියතෙම; උකට, උත්කෘෂ්ට යි; රුවන් අතුරෙන්, රත්නයන් අතුරෙන්; රත්මැණ, රක්තමාණික්‍යතෙම; මහගු, මහාර්‍ඝ යි; යන්නන්ගෙන්, ගමනය කරන්නවුන් අතුරෙන්; දුවා, ධාවන කර්‍තෘතෙම; සෙදහල්, ශීඝ්‍ර යි; මෙඈ, මේ ආදි වූ; නිදරණරුතැ, නිර්‍ධාරණාර්‍ථයෙහි; අවදිවිබත්, අවධිවිභක්ති; රුසී, රුචි යි.

භා – නරන් කෙරෙන්, රුවනතුරෙන්, යන්නන්ගෙන් යන තුන්තැනැ අවධිවිභක්තිය නිර්‍ධාරණාර්‍ථයෙහි සිද්ධ යි.

## නිර්‍ධාරණ නම් කිම යත් ?

(32) ප – දෑගුණකිරිය, ජාති ය ගුණ ය ක්‍රියා ය යන; ලකුණින්, ලක්‍ෂණයෙන්; සමුදයින්, සමුදායයා කෙරෙන්; එක් දෙසක්හු, එකදෙශයක්හුගේ; වෙන්කිරීම්, පෘථක්කරණය; නිදරණ නම්, නිර්‍ධාරණ නම්.

භා – ජාතියකින් හෝ ගුණයෙකින් හෝ ක්‍රියාවකින් හෝ සමූහයක්හු කෙරෙන් එකදෙශයක්හුගේ (=අවයවමාත්‍රයක්හුගේ) වෙන්කිරීම නිර්‍ධාරණ නම්. එහි සමූහය ප්‍රකාශ කරන ශබ්දයා කෙරෙන් අවධිවිභක්ති අභිමත යි. ඕ එනාගි නිර්‍ධාරණාර්‍ථයෙහි අවධි යි. මෙහි නරශබ්දවාච්‍ය වූ මනුෂ්‍ය සමුදායයෙහි ඇතුළත් ක්‍ෂත්‍රියතෙම ක්‍ෂත්‍රියාඛ්‍ය ජාතියෙන් වෙන්කොට දක්වන ලද්දේ ය. මේ ජාතිනිර්‍ධාරණ යි. රුවන් ශබ්දයෙන් වාච්‍ය වූ රත්නසමුදායයෙහි ඇතුළත් රක්තමාණික්‍යය මහාර්‍ඝතා සඞ්ඛ්‍යාත ගුණයෙන් වෙන්කොට දක්වන ලද්දේ ය. මේ ගුණනිර්‍ධාරණ යි. යන්නවුන්ගේ

**බමුණු බරණැසැ සිට එයි, මෙඅැ හිම් වුව ද පදතුරැ සසගින් අන් විබත් ගනි.** (33)

**ඉති අවදිවිබත්.**

---

**සබඳ වෙසෙසන වත—උනුන් පිළිබඳ වත්නෙන්**
**සපදන් සාමිවිබත් සවි—ගෙයුතු වියුතු ද සම වේ.** (34)

---

සමුදයයෙහි ඇතුළත් ධාවනකතෘතෙම ධාවනක්‍රියායෙන් වෙන්කොට දක්වන ලද්දේ ය. මේ **ක්‍රියානිර්ධාරණ** යි—"**ජාතිගුණක්‍රියාණාමුන්නමේකදේශාපකර්ෂණ වා සජාතීයාත් පෘථක්කරණං නිර්ධාරඃ**" යි ඇතම් සංස්කෘතශාබ්දික කෙනෙක් ද ප්‍රතිරාජපරිවෙණාධිපතිහු මෙන් ජාතිනිර්ධාරණාදි තුනක් ම දක්වූහ. පාණිනීයයෝ වනාහි "**ජාතිගුණක්‍රියාසංඥාභිඃ සමුදායාදේකදේශස්‍ය පෘථක්කරණම්**" යි සතරවැනි **සංඥානිර්ධාරණ**යකුදු කීහ. "**ඡාත්‍රාණාං ඡාත්‍රේෂු වා මෛත්‍රඃ පටුඃ**" යනු එය උදාහරණ යි. ශිෂ්‍යයන් අතුරෙහි මෛත්‍රතෙමේ දක්ෂ යි, කී කල ශිෂ්‍යසමූහයෙහි ඇතුළත් මෛත්‍රයා නාමයෙන් වෙන් කරන ලද හෙයින් මේ **සංඥානිර්ධාරණ** නම්.

(33) **ප**—බමුණු, බ්‍රාහමණතෙම; බරණැසැ සිට, බාරාණසියෙහි සිට; එයි, ආගමනය කෙරෙයි; මෙඅැ, මේ ආදිය; හිම් වුව ද, සීමා වුවත්; පදතුරැසසගින්, පදාන්තරසංසර්ගයෙන්; අන්විබත්, අන්‍යවිභක්තියක්; ගනී, ග්‍රහණය කෙරේ.

**භා**—'**බමුණු බරණැසැ සිට එයි**' යන මෙහි බාරාණසිපුරය බමුණුහුගේ ආගමනක්‍රියාවට සීමා වූ හෙයින් අවධිකාරක වියයුතුවත් ස්ථිතික්‍රියා සඞ්ඛ්‍යාත අන්‍යපදයක්හුගේ සංසර්ගය ඇති වූ හෙයින් ඒ ස්ථිතික්‍රියාව බලා බාරාණසිය ආධාරකාරක වී.

**අවධිවිභක්ති නිමි.**

---

(34) **ප**—උනුන් පිළිබඳ, අන්‍යොන්‍යප්‍රතිබද්ධ වූ; වත්නෙන්, වස්තුයෙන්; වෙසෙසන, විශෙෂණය කරන්නා වූ; වත, වස්තු තෙමේ; සබඳ, සම්බන්ධ නම්; සවිසපදන්, සියලු සම්ප්‍රදානවිභක්ති හා; සාමිවිබත්, (සියලු) සාමිවිභක්ති; ගෙයුතු, ගේයන්තකින් යුක්තව ද; වියුතු ද, වියුක්ත ව ද; සම වේ; සමාන වේ.

**භා**— අන්‍යොන්‍යයන් පිළිබඳ වස්තූන් කෙරෙන් වෙනස් කරන්නා වූ වස්තුව සම්බන්ධ නම් වේ. '**රජහුගේ පුරුෂයා**' යි කී කල්හි විශෙෂ්‍ය වූ පුරුෂ පදාර්ථයා අමාත්‍යාදි අන්‍යයන්ගේ ප්‍රතිබද්ධත්වයෙන් වෙනස් කරන්නා වූ '**රජ**' යන පදාර්ථයතෙම සම්බන්ධ නම් වේ.

වි—රජහුගේ ද, පුරුෂයාගේ ද පවත්නා සේව්‍යසේවකරූප සම්බන්ධය දෙදෙනා කෙරෙහි ම ඇතත් සම්බන්ධවිභක්තිය අප්‍රධානයා කෙරෙන් (=විශේෂණයා කෙරෙන්) වියයුතු බැවින් මෙහි රජ ශබ්දය ම සම්බන්ධවිභක්තිය ලබන්නේ ය.* රජශබ්දයතෙම අමාත්‍යාදි අන්‍යස්වාමීන් කෙරෙන් පුරුෂයා වෙසෙසන හෙයින් (=අනුන්ගේ අයතිය වළක්වා වෙන් කරන හෙයින්) විශේෂණ වේ. පුරුෂතෙම ඒ රජහු විසින් වෙසෙසනු ලැබේ නු යි හෙවත් අන්හිමියන් කෙරෙන් වළක්වා වෙන් කරනු ලැබේ නු යි විශේෂ්‍ය නම් වේ. මෙසේ විශේෂ්‍යපදයා අන්‍යයන් පිළිබඳ විය නො දී වෙන්කරන්නා වූ විශේෂණපදාර්ථයතෙම සම්බන්ධ නම් වේ. සම්බන්ධය අනෙකවිධ කොට සංස්කෘත මාගධ වෛයාකරණයන් විසින් සලකනලද්දේ ය.

සේව්‍යසේවකරූප සම්බන්ධය–රජහුගේ පුරුෂ ය; යනාදිය යි.
පිතාපුත්‍රරූප සම්බන්ධය–රජහුගේ පුත්‍ර ය; යනාදිය යි–
'ජන්‍යජනකරූප සම්බන්ධය' යනු ද මීට ම නම්.
අවයවාවයවිරූප සම්බන්ධය–තන්තුන්ගේ පටය; යනාදිය යි.
සමූහසමූහිරූප සම්බන්ධය–ධාන්‍යයන්ගේ රාශිය; යනාදිය යි.
පාල්‍යපාලකරූප සම්බන්ධය–කුරුන්ගේ රජ ය; යනාදිය යි.
වාහ්‍යවාහකරූප සම්න්ධය-චෛත්‍රයාගේ වාහනය; යනාදිය යි.
බොධ්‍යබොධකරූප සම්බන්ධය-ශබ්දයාගේ අර්ථය; යනාදිය යි.
ව්‍යාප්‍යව්‍යාපකරූප සම්බන්ධය–අග්නිහුගේ ධූමය; යනාදිය යි.
ප්‍රතියොග්‍යනුයොගිරූප සම්බන්ධය–වස්ත්‍රයාගේ අභාවය;
යනාදිය යි.
අපත්‍යාපත්‍යවද්රූප සම්බන්ධය–උපගුහුගේ දරු ය; යනාදිය යි.
ආධාරාධෙයරූප සම්බන්ධය–කුශූලයාගේ බත ය; යනාදිය යි.
විකාරවිකාරීරූප සම්බන්ධය–ක්ෂීරයාගේ විකාර වූ දධි ය;
යනාදිය යි.
පරිමාණපරිමෙයරූප සම්බන්ධය–තිලයන්ගේ මිට ය;
යනාදිය යි.
පූරණපූරයිතව්‍යරූප සම්බන්ධය–වස්සානයාගේ තුන්වන
මස ය; යනාදිය යි.

---

*"පරාර්ථෙ ස්වාර්ථනිරපෙක්ෂපාදප්‍රධානං විශෙෂණම්
විශෙෂ්‍යන්තු ප්‍රධානං ස්‍යාත් ස්වාර්ථස්‍යෙව ප්‍රකාශනාත්"

තමාගේ අර්ථය විශෙෂ්‍ය වූ අනිකකු කෙරෙහි තැබීම හේතු කොට ගෙන විශෙෂණය අප්‍රධාන වේ. විශෙෂ්‍යය වනාහි ස්වකීයාර්ථය ම පහළ කරන හෙයින් ප්‍රධාන වේ.

**හට, ඝනද්‍රෙකිම් තමහට කිස තබා අඹරෝරව නැගේ. අට, තිලොවට ගුරු. උට, මුනිහිරුට විනේනඹරහු සුපක්හු. ආට, කුලුණැතියාට සෙ පරහු. අගේ, ගිරිදූවගේ හිමි නිල්ගෙලේ. උගේ, සඳුගේ පින් සොමි. ආගේ, තුනුවහාගේ පසසරා සරා සඳ, මඳමරු, වසන්වන ඈ. හුගේ, සැසිහුගේ සාහවෙස් දූරිමෙහි තිවට හන්සළු පිළිගත්. ගෙවියුන් අ, සිරිවම්ය පියතම උවිඳු. ගෙවියුන් ආ, හුණමින් ගුම් දුම්සොනා මියුරු රහ ගත්. ගෙවියුන් හු, රජහු අණ නොලගු මෙඈ සොදනු.** (35)

---

මේ ආදි වූ සම්බන්ධයක් කිවමනා කල්හි සම්බන්ධාර්ථයෙහි පවත්නා ශබ්දයා කෙරෙන් සියලු සම්ප්‍රදානවිභක්තිහු ද, ශේෂයන් තකින් යුක්ත වූත්, යුක්ත නුවූත්, කර්මවිභක්තිහු ද සමාන වැ යෙදෙත්. සමාන බව නම් එකී විභක්ති දෙක්හි ඇත්තා වූ එකත්වබහුත්වරූප මෙහි ද එසේ ම වනසුලු බව යි. ශේෂයන්ත කින් යුක්තවනසුලුවීම 'ට'කාර යුක්ත විභක්තීන් හැර සෙස් සෙහි ම ය.

(35) **ප—හට,** හටවිභක්ති වේ; ඝනද්‍රෙකිම්, ඝනද්‍රෙතක්‍රිම් තෙම්; තමහට, තමාගේ; කිස, කෘත්‍යය; තබා, ස්ථාපනය කොට; අඹරෝරව, අම්බරොදරයට (=ආකාශකුහරයට); නැගේ, ආරූඪ වේ. මෙහි 'තම'ශබ්දයෙන් පර වැ සම්බන්ධයෙහි **හට**විභක්ති යි.

**අට,** අටවිභක්ති වේ; තිලොවට, ත්‍රෛලොක්‍යයට (=තුන්ලෝ වැස්සාහට); ගුරු, ආචාර්‍ය්‍ය යි. **තිලෝ**ශබ්දයා කෙරෙන් අට විභක්ති කොට වකාරාගම ද, මාත්‍රාහානි ද කිරීමෙන් '**තිලොවට**' යි සිද්ධ යි.

**උට,** උටවිභක්ති වේ; මුනිහිරුට, මුනිසූර්‍ය්‍යයාහට; විනේ නඹරහු, වෛනෙයතාමරසයෝ; සුපක්හු, සුපක්ෂයෝ යි. මුනි හිර ශබ්දයෙන් පර ව **උට**විභක්ති කොට පූර්වස්වරලොපසන්ධි යෙන් සිද්ධ යි.

**ආට,** ආටවිභක්ති වේ; කුලුණැතියාට, කරුණාන්විතයාහට; සෙ පරහු, ශත්‍රැහු කවුරු ද; මෙඈ, මේ ආදිය; යොදනු, යුක්ත කරනු. **කුලුණැති**ශබ්දයෙන් පර ව **ආට**විභක්ති කොට යකාරාගම සන්ධියෙන් සිද්ධ යි. ආදිශබ්දයෙන් සෙසු සම්ප්‍රදාන විභක්ති ද ගන්නේ ය.

**අගේ,** **අගේ**විභක්ති වේ; ගිරිදූවගේ, පාර්වතියගේ, හිමි, ස්වාමිතෙම; නිල්ගෙලේ, නීලකණ්ඨයා යි. **ගිරිදූ**ශබ්දයෙන් පර ව **අගේ**විභක්ති කොට වකාරාගම හා මාත්‍රාහානි ද කිරීමෙන් **ගිරිදුවගේ** යනු සිද්ධ යි.

සියපානට වඩා සේගමනපා සපු මෙන්, පැළලුප්නුවරට රජගහානුවර සත්යොත්නෙක්, මහබෝමඩට ඉසාන කොන්හි රුවන්සක්මන. මෙඇහි අවදිඅරුත්හි සබඳවිබත් රුසි. (36)

ඉති සබඳවිබත්.

---

**උගේ**, උගේවිභක්ති වේ; සඳුගේ, චන්ද්‍රයාගේ; පිත්, පුත්‍ර තෙම; සොමි, සෞම්‍යයා යි. **සඳ**ශබ්දයෙන් පර ව **උ**ගේවිභක්ති කොට පූර්වස්වරලොපසන්ධියෙන් සිද්ධ යි.

**ආගේ**, ආගේවිභක්ති වේ; සරාසඳ, ශරච්චන්ද්‍ර ය; මඳමරු, මන්දමාරුත ය; වසත්වන අෑ, වසන්තවනය යනාදිය; තුනු වහාගේ, අනඞ්ගයාගේ; පසසරා, පඤ්චශර ය (=සේනාව ය). **තුනුවහ**ශබ්දයෙන් පර ව ආගේවිභක්ති කොට පූර්වස්වරලොප සන්ධියෙන් සිද්ධ යි.

**හුගේ**, හුගේවිභක්ති වේ; සෑසිහුගේ; ශාක්‍යසිංහයාගේ; කහවෙස් දැරිමෙහි, කාෂායවේශධාරණයෙහි; නිවට, බ්‍රහ්මතෙම; හත්සළු, අච්ඡාදිතශාටක; පිළිගත්, ප්‍රතිග්‍රහණය කෙළේ. **සෑසි** ශබ්දයෙන් පර ව 'හුගේ'විභක්ති යි.

**ගෙවියුත්**, ගේයන්නෙන් වියුක්ත වූ; **අ**, අවිභක්ති වේ; සිරිවමිය, ශ්‍රීකාන්තාවගේ; පියතම, ප්‍රියතම (=වල්ලභ) තෙම; උවිඳු; උපෙන්ද්‍රයා යි. **සිරිවමි**ශබ්දයෙන් පර ව අවිභක්ති හා යකාරාගමසන්ධි යි.

**ගෙවියුත්**, ගේයන්නෙන් වියුක්ත වූ; **ආ**, ආවිභක්ති වේ; මියුරු, මයූරතෙම; දුම්යොනා, ධූමයොනිහුගේ; ගුම්, ඝොෂය; හුණමින්, ශ්‍රවණයකරමින්; රඟ ගත්, රඞ්ගග්‍රහණය කෙළේ (=නැටුම් ගති). **දුම්යොන්** ශබ්දයෙන් පර ආවිභක්ති හා ස්වර සන්ධි යි.

**ගෙවියුත්**, ගේයන්නෙන් වියුක්ත වූ; **හු**, හුවිභක්ති වේ; රජහු, රාජයාගේ; අණ, ආඥව; නොලඟු, ලඞ්ඝනය නො කර (=නො ඉක්මව); මෙඇ, මේ ආදිය; යොදනු, යුක්ත කරනු. **රජ** ශබ්දයෙන් පර ව 'හු'විභක්ති යි. **ආදි**ශබ්දයෙන් අවශෙෂ නාමි විභක්තීන්ගේ ද ග්‍රහණය වේ.

(36) **ප**—සියපානට වඩා, ශතපදීන් කෙරෙන් අධික ව; සේ ගමන්, ජෙක වූ ගමන් ඇති; අපා සපු මෙන්, අපාදක වූ සපියා මෙනි; පැළලුප්නුවරට, පාටලිපුත්‍ර නගරයෙන්; රජගහා නුවර, රාජගෘහනගරය; සත්යොත්නෙක්, සප්තයොජනයෙකි. මෙකී දෙනුවර අතර මාර්ගය සත්යොදනෙකැ යි සේ යි. මහබෝ මඩට, මහාබොධිමණ්ඩයෙන්; ඉසානකොන්හි, ඓශානීකොණයෙහි; රුවන්සක්මන, රත්නචඞ්ක්‍රමණය යි; මෙඇහි, මේ ආදි

**කතුකම්බැරි කිරිය-දරනුයෙ අදර නම් වේ**
**එකතැ එහි ඒ හි ඇ වේ-බුහුඅත්බසැ අන්හි වේ.** (37)

---

තන්හි; අවදිඅරුත්හි, අවධිකාරකාර්‍ථයෙහි; සබඳවිබත්, සම්බන්ධ විභක්ති; රුසී, රුචි යි. **සියපාශබ්දයෙන්** පර ව නටවිභක්ති කරණයෙන් '**සියපානට**' යනු වේ. '**පැළිලුප්නුවරට, මහබෝ මඩට**' යන දෙතැන්හි ටවිභක්ති යි.

ජේතගමනත්‍වයට ශතපදීන් සීමා කොට ගත් හෙයින් ද, සප්තයොජන මාගීප්‍රමාණයට පාටලීපුත්‍රනගරය සීමා කොට ගත් හෙයින් ද, ඓශානීදිශානියමයට මහාබොධිමණ්ඩය සීමා කොට ගත් හෙයින් ද මේ තුන්තන්හි ම අවධි අර්‍ථය වේ. මෙහි අවධි විභක්ති නො කොට සම්බන්ධ විභක්ති කිරීම අඞ්ගසූත්‍රසාමර්‍ථ්‍ය යෙන් සිද්ධ යි.

**සම්බන්ධවිභක්ති නිමි.**

---

(37) **ප**—කතුකම්, කර්‍තෘකර්‍ම දෙදෙනාහට; බැරි, භාර වූ; කිරිය, ක්‍රියාව; දරනුයේ, ධරන තැනැත්තේ; අදර නම් වේ, ආධාර නම් වේ; එකතැ, එකවචනයෙහි; එහි ඒ හි ඇ වේ, **එහි, ඒ, හි, ඇ** යන විභක්ති වෙයි; බුහුඅත්බසැ, බහ්වර්‍ථවචනයෙහි; අන්හි වේ, **අන්හි** විභක්ති වේ.

**භා**—කර්‍තෘහට හෝ කර්‍මයට හෝ භාර වැ පවත්නා ක්‍රියාව උසුලන කාරකය ආධාර නම් වේ. ඒ කාරකයාගේ එකත්‍වය කියවෙනා කල්හි **එහි, ඒ, හි, ඇ** යන විභක්ති චතුෂ්කය **වන්නේ** ය. බහ්වර්‍ථය කියවෙනා කල්හි '**අන්හි**' විභක්තිය වේ.

**වි**—මෙහි කර්‍තෘ, කර්‍ම දෙදෙනාහට භාර වූ ක්‍රියාවය යි කීමෙන් ක්‍රියාධාරකත්‍වය කර්‍තෘ කර්‍ම දෙදෙනා කෙරෙහි ම මුඛ්‍ය වශයෙන් පවත්නා බැව් දක්වූහ. ඒ එසේ මැ යි. ආධාරකාරකයාගේ ක්‍රියාධැරීම කර්‍තෘකර්‍ම දෙදෙනාගේ ද්‍වාරයෙන් ම වේ. ඉදිරියෙහි සිට ක්‍රියාව ධරන්නෝ කර්‍තෘකර්‍මකාරකයෝ ම ය. '**මහලුතෙම ඇඳෙහි නිදයි**' කී කලැ නිද්‍රාක්‍රියාව සෘජු ව ම ධරන තැනැත්තේ කර්‍තෘ වූ මහලු තෙමේ ය. ඇඳ නිද්‍රාවක් සෘජු ව නො ධරයි. නිද්‍රාක්‍රියාව ධරන කර්‍තෘ වූ මහලුහට ඇඳ පිහිට ව සිටි හෙයින් ඇඳ ද කර්‍තෘහුගේ ද්‍වාරයෙන් (=කර්‍තෘහුගේ මුවහ යෙන්) ක්‍රියාව ධරන්නෙක් වෙයි. මේ කර්‍තෘසථක්‍රියායෙහි ආධාරත්‍වය යි. කර්‍මසථක්‍රියායෙහි ද '**අරක්කැමිතෙම සැළෙහි බත පිසෙයි**' කී කල්හි පචනය (=ඉදීම) කර්‍ම වූ බතෙහි ම පිහිටියේ ය. සැළෙහි පිහිටියේ නො වේ. එහෙයින් පචනයට සෘජු ව ම ආධාර වන්නේ බත ය. සැළ වනාහි කර්‍මසඞ්ඛ්‍යාත වූ බතට

ආධාර වැ සිටි හෙයින් ක්‍රියාවට ආධාරය යි සලකනු ලැබේ. මේ කර්මස්ථක්‍රියායෙහි ආධාරත්වය යි. මෙසේ ක්‍රියාධාරය ප්‍රත්‍යක්‍ෂ වැ උපලක කර්තෘ කර්මයන්ට පිහිට වැ සිටියා වූ කාරකය ආධාර නමින් දක්වන ලදැයි මෙහි තාත්පර්‍ය්‍යාර්ථය දතයුතු.

කියනලද මැ යි වාක්‍යපදීයයෙහි :-

"කර්තෘකර්මව්‍යවහිතාමසාක්‍ෂාද්ධාරයත් ක්‍රියාම්
උපකුර්වත් ක්‍රියාසිද්ධෞ ශාස්ත්‍රෙ'ධිකරණං ස්මෘතම්" යි.

කර්තෘකර්මව්‍යවහිතාම්, කර්තෘ කර්ම දෙකින් ව්‍යවහිත වූ (=මුවහ වූ); ක්‍රියාම්, ක්‍රියාව; අසාක්‍ෂාත්, අප්‍රත්‍යක්‍ෂ වැ; ධාරයත්, ධරන්නා වූ; ක්‍රියාසිද්ධෞ, ක්‍රියාසිද්ධියෙහි ලා; උපකුර්වත්, උපකාර කරන්නා වූ (කාරකය) තෙම; ශාස්ත්‍රෙ, පාණිනීයශාස්ත්‍රයෙහි; අධිකරණම්, අධිකරණ නමැ යි; ස්මෘතම්, දන්නාලදී.

මේ ආධාරකාරකය ත්‍රිවිධය යි පාණිනීයාගමයෙහි දක්වන ලද්දේ ය. සෙසු වෛයාකරණයෝ චතුර්විධය යි ද යෙති. **ඖපශ්ලෙෂිකාධාර** යැ, **වෛෂයිකාධාර** යැ, **අභිව්‍යාපකාධාර** යැ යනු ත්‍රෛවිධ්‍යය යි. චාතුර්විධ්‍යයෙහි **සාමීප්‍යාධාර** නමින් තවත් ආධාරයෙක් කියනු ලැබේ. ඔවුන් අතුරෙහි එකදෙශයෙකින් සම්බන්ධ වැ වැළඳගත් ආධාරය 'ඖපශ්ලෙෂිකාධාර' නම්. '**ඇඳෙහි නිදයි**' යන තන්හි මෙනි. මෙහි නිද්‍රාක්‍රියාව කරන කර්තෘහට ඇඳ මුළුල්ල ම වැළඳගත් ආධාරය නො වෙයි. ඇඳෙන් එක් ප්‍රදෙශයෙක් ම ආධාර වේ. සකලාවයවයෙහි පැතිර සිටි ආධාරය '**අභිව්‍යාපකාධාර**' නම්. '**තලෙහි තෙල් ඇති**' යන තන්හි මෙනි. මෙහි තෙල් යනු කර්තෘකාරක යැ. තලඇටය ඊට ආධාර යි. තලඇටෙහි මුළු අවයව ම තෙලට ආධාර ව සිටී. මේ ආධාර දෙකින් අන්‍ය වූ සියලු ආධාර ම '**වෛෂයිකාධාර**' නම්. '**නිවනෙහි පැතිම වේ**' යන තන්හි මෙනි. මෙහි කර්තෘකාරක වූ පැතීමට නිවන විෂය යැ හෙවත් ගොචරස්ථානය යි. **සාමීප්‍යාධාර** නම් සමීපත්වයෙන් වන්නා වූ ආධාරය යි. '**බුදුහු සැවැත්නුවර වෙසෙති**' යන තන්හි මෙනි. බුදුවරයෝ නුවරෙක වාසය නො කෙරෙති. එහෙයින් නුවර සමීපයෙහිය යි මෙයින් ප්‍රකාශ වේ. මෙහි සමීපත්වාවබොධය උපචාරයෙන් මුත් විභක්ත්‍යර්ථයෙන් නො වෙයි සලකන පාණිනීයයෝ සාමීප්‍යාධාරය නො දැක්වූහ. කාලාපිකාදි වෛයාකරණයෝ වනාහි යථොක්ත සතර පරිද්ද ම ප්‍රකාශ කළහ.

"ආධාරයති යඃ කර්තෘව්‍යාපෙ‍්‍ය ව්‍යාපාරසද්මනි
ආධාරං කාරකං ප්‍රාහුස්තච්චතුර්විධමෙව ච".

**එහි, කුලෙහි නො ලැගි මුනිපිත්. ඒ, එපුරේ නිරිඳෙක් වි. හි, සිත්හි තබා ඇදුරු උගහා. ඇ, මුනිබසැ කරා හැදහිලි. අන්හි, පහනැ තඹරන්හි බමන බමරමුළු තමඹ පිරියෙසැ සරන තිමිරබලල් වලා.** (38)

---

යම් අර්ථයෙක් ක්‍රියාවට ආශ්‍රය වූ කර්තෘකර්ම දෙදෙනා ධරා ද ඒ පදාර්ථය ආධාරකාරකය යි කියති. හෙද සිවුවැදෑරුම් වෙයි. යනු භාව යි.

(38) **ප**—**එහි**, **එහි** විභක්ති වේ; මුනිපිත්, මුනිපුත්‍රතෙම; කුලෙහි, කුලයෙහි; නො ලැගි, ලග්න නො වී.

**වි**—මෙහි ලග්නක්‍රියාවට කර්තෘ වූ මුනිපුත්‍රයාහට; කුලය ආධාර වැ, කර්තෘහුගේ ද්වාරයෙන් ක්‍රියාව ධරන්නේ වේ. චතුර් විධාධාරයන් අතුරෙහි මේ වෛෂයිකාධාර යි. **කුල**ශබ්දයා කෙරෙන් **එහි** විභක්තිකොට පූර්වස්වරලොපසන්ධි කිරීමෙන් **'කුලෙහි'** යනු වී.

**ප**—**ඒ**, **ඒ** විභක්ති වේ; එපුරේ, ඒ පුරයෙහි; නිරිඳෙක්, නරෙන්ද්‍රයෙක්; වි, පහළ වී. භවන ක්‍රියාවට කර්තෘ වූ නරෙන්ද්‍රයාහට පුරය ඖපශ්ලෙෂිකාධාර යි. **පුර**ශබ්දයා කෙරෙන් **ඒ** විභක්ති යි.

**ප**—**හි**, **හි** විභක්ති වේ; ඇදුරු උගහා, ආචාර්යයන්ගෙන් ලද උද්ග්‍රහණය; සිත්හි, චිත්තයෙහි; තබා, ස්ථාපනය කරවී. මෙ ද වෛෂයිකාධාර යි. **සිත්**ශබ්දයා කෙරෙන් **හි**විභක්ති යි.

**ප**—**ඇ**, **ඇ**විභක්ති වේ; මුනිබසැ, බුද්ධවචනයෙහි; හැදහිලි, ශ්‍රද්ධාව; කරා, කරවී. වෛෂයිකාධාර යි. **මුනිබස්**ශබ්දයා කෙරෙන් **ඇ**විභක්ති යි.

**ප**—**අන්හි**, **අන්හි**විභක්ති වේ; පහනැ, ප්‍රභාත කාලයෙහි; තඹරන්හි, තාමරසයන්හි; බමන, භ්‍රමණය කරන්නා වූ; බමර මුළු, භ්‍රමර සමූහතෙම; තමඹ, තමස් නමැති අම්බිකාව; පිරියෙසැ, පර්යෙෂණය කොට; සරන, සඤ්චාරය කරන්නා වූ; තිමිරබලල් වලා, අන්ධකාර පොතකයන් මෙනි.

**වි**—තඹරන්හි යනු ඖපශ්ලෙෂිකාධාර යි. **තඹර**ශබ්දයා කෙරෙන් **අන්හි**විභක්තිකොට පූර්වස්වරලොප සන්ධියෙන් සිද්ධ යි. **අන්හි** ප්‍රත්‍යය පමණක් මෙහි ආධාර බහුවචන ප්‍රත්‍යය වශයෙන් කියන ලදුවත් පුරාතන සිංහලාර්ථ ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයන්හි **'එහි'** ප්‍රත්‍යයාදීන්ගේ ද බහ්වර්ථයෙහි යෙදීම දක්නා ලැබේ. බහ්වර්ථයෙහි ඇවිභක්තියට මුලින් යුක්ත වන **වල්**ප්‍රත්‍යය ද **'ගම්වල, රටවල'** යනාදීන් ජේතප්‍රයොගයෙහි පැනේ.

"සෝනන් කෙරෙහි කහි ගුණ එකයුරැ" මෙඈ වෙත් අරුත් සදින් වේ. (39)

"මදුරදුන් රන් යාදී වෙසතුරු තනන් දිනි" ඈහි පෙර කිරිය කරන්නහුට අදරඅරුතැ කම්විබත් හා එම කිරියට දීපස හා රුසි. (40)

බලාවැළදළයුතු-විදුදිවි දහරලඹකෙස්
මහමේරකුසු හමුවන-පියනම්මතුරු දප වන.

මෙඈ කල්අරුත්කිරියවියාහි අදරඅරුතැ කම්විබත් රුසි. (41)

ඉති අදරවිබත්.

---

(39) ප - සෝනන් කෙරෙහි, සුවතීන් කෙරෙහි; කහි ගුණ, කවර නම් ගුණයෙක්; එකයුරු, එකාකාර ද? මෙඈ, මේ ආදිය; වෙත්අරුත්සදින් වේ, සමීපාර්ථ (කර) ශබ්දයා කෙරෙන් වේ.

'සෝනන් කෙරෙහි' යන තැන 'සෝනන්' යන සම්බන්ධ බහුවචනාන්තපදයෙන් පර වැ සමීපාර්ථ කරශබ්දය යොදා එයින් පර ව එහිවිභක්ති කළ හෙයින් මෙය ආධාර බහුවචන ලෙසින් සලකනු ලැබේ.

(40) ප—මදුරදුන්, මද්‍රීරාජ දුහිතෘන්; රන් යාදී, ආරණ්‍ය යට ගිය කල්හි; වෙසතුරු, විශ්වන්තර (මහරජ) තෙම; තනන්, තනයයන් (=දරුවන්); දිනි, දුන්නේ ය යන; ඈහි, මේ ආදියෙහි; පෙරකිරිය කරන්නහුට, පූර්වක්‍රියාකර්තෲහට; අදරඅරුතැ, ආධාරාර්ථයෙහි; කම්විබත් හා, කර්මවිභක්ති ද; එම කිරියට, ඒ (පූර්ව වූ) ක්‍රියාවට ම; දීපස හා, දීප්‍රත්‍යය ද; රුසි, රුචි යි.

හා—"මද්‍රීදේවීන් වනයට ගිය කල්හි විශ්වන්තර රජතෙම දරුවන් දුන්නේ ය" යන මේ වාක්‍යයෙහි මද්‍රීදේවියගේ ගමනක්‍රියා තොමෝ රජුගේ දාන ක්‍රියාකාලය අවබෝධ කරවයි. එහෙයින් ඒ ක්‍රියා දෙකින් පළමු ක්‍රියාව දෙවැනි ක්‍රියාවට ආධාර වශයෙන් සලකනු ලැබේ. පූර්ව වූ ගමනක්‍රියාවට ආධාරාර්ථයෙහි දී ප්‍රත්‍යය කටයුතු ය. එම පූර්වක්‍රියාවගේ කර්තෘපදයත් ආධාරයට විශෙෂණ වියයුතු හෙයින් ආධාරාර්ථයෙහි කර්මවිභක්තීන් යුක්ත වියයුතු ය. 'මදුරදුන්' යනු ආධාරාර්ථ කර්මවිභක්ති යි. 'යාදී' යනු ආධාරාර්ථ දී ප්‍රත්‍යය යුක්ත වූ ක්‍රියාපදය යි. මෙය සංස්කෘත, මාගධ වෛයාකරණයෝ 'භාවසප්තමී' නාමයෙන් දක්වූහ.

(41) ප—බලාවැළ, බලාකාවලී නමැති; දළයුතු, දංෂ්ට්‍රායෙන් යුක්ත වූ; විදුදිවි, විද්‍යුත් නමැති ජිහ්වා ඇති; දහර, ධාරා නමැති; ලඹකෙස්, ලම්බකෙශ ඇති; මහමේරකුසු, මහාමේඝ නමැති

**එ විශූ අලප් නම්—ඇමතුම් තමා අමුතැරැ**
**ඈ ඇ ආ එකතැ බුහුබසැ—ඉන් එන් නෙන් ඉපුතු ද නි. (42)**

**ඈ, පුතැ තෙමියසිරෙනි ඉති පුවල තෙප් නලදහව් කිම පලකලා. ඇ, සැරදේ මහරජ. ආ, හෙ සඳ වනන් නුදුලුස. (43)**

---

රාක්ෂසයා; හමුවන, සම්මුඛ වූ කල්හි; වන, විරහිණිය; පියනම්, ප්‍රියයාගේ (=වල්ලභයාගේ) නාම නමැති; මතුරැ, මන්ත්‍රය; දප, ජල්පනය කර; මෙඈ, මේ ආදි වූ; කල්අරැත්කිරියවිසාහි, කාලාතික්‍රියාවිෂයෙහි; අදරඅරැතැ, ආධාරාර්ථයෙහි; කම්විබත්, කම්විභක්ති; රුසී, රුචි යි. මෙහි '**කාලාතික්‍රියා**' නම් '**හමුවන**' යන අසම්භාවන ක්‍රියාව යි.

කාලාර්ථයෙහි **න** ප්‍රත්‍යය කිරීමෙන් සිද්ධ වූ මේ අසම්භාවන ක්‍රියාපදය නිත්‍යයෙන් ආධාරාර්ථයෙහි වේ. මේ ක්‍රියාවට කර්තෘ වූයේ '**මහමෙරකුසු**' යන පදය යි. මෙ ද ආධාරාර්ථ වියුතු හෙයින් ආධාරාර්ථයෙහි කම්විභක්තිය යි කියන ලදී. සංස්කෘත, මාගධ වෛයාකරණයෝ මෙය 'භාවසප්තමී' යයි කියමින් ආධාරවිභක්තිය ම දක්වත්.

**ආධාරවිභක්ති නිමි.**

---

(42) **ප**—තමා අමුතැරැ, තමහට (අනභිමුඛයා) අභිමුඛ කොට; ඇමතුම්, ආමන්ත්‍රණය (යන යමක් ඇද්ද); එ, එය; අලප් නම් විශූ, ආලපන නමැයි කීහු; එකතැ, එකවචනයෙහි; ඈ ඇ ආ, ඈ, ඇ, ආ (යන විභක්ති) වේ; බුහුබසැ, බහුවචනයෙහි; ඉන් එන් නෙන්, ඉන්, එන්, නෙන් (යන විභක්ති) ද; ඉපුතු ද, ඉකාර යුක්ත වූ ඔහු ද; නි, නිවිභක්ති ද (වෙත්).

**භා**—තමහට අභිමුඛ නු වූ විද්‍යමාන වූ පුරුෂාදි යමක්හු වචනයෙන් අභිමුඛ කිරීම (=කැඳවීම) ආලපන නම්. එකවචනයෙහි '**ඈ, ඇ, ආ**' යන විභක්ති තුන ද, බහුවචනයෙහි **ඉන්, එන්, නෙන්, ඉනි, එනි, නෙනි, නි** යන විභක්ති සත ද වෙයි.

(43) **ප—ඈ, ඈ**විභක්ති වේ; පුතැ, පුත්‍රය; තෙමියසිරෙනි, තෙමියකුමාරයෙනි; ඉති, මෙසේ; පුවල, ප්‍රෞඪ වූ; තෙප්, තෙපි; නලදහව්, වඤ්චකභාවය; කිම, කුමක් හෙයින්; පලකලා, ප්‍රකාශ කළහු ද.

**වි**—මෙහි '**පුතැ**' යනු එකත්වයෙන් ද, '**තෙමියසිරෙනි**' යනු බහුත්වයෙන් ද වක්තෘහුගේ විවක්ෂා වශයෙන් යෙදේ. **පලකලා** යන ක්‍රියාපදය හා ආලපනයාගේ සම්බන්ධයක් නො වන හෙයින්

**ඉන්, සවනින් සැනැහේ සඳහමින්. එන්, සජනෙන් මගා පරලෙව්. නෙන්, සත්නෙන් දුලද නො බජව්. ඉයුතු, නෙතිනි නරඹා මුනිරූ—මහණෙනි බවුන් නො පිරිරව්—වත්නෙනි නො වව් ඉසුරුමත්. නි, බිගුනි මිලොලින් සාල් ඉක් නඹුරෝරේ දග නො වා-නිසවත්නි නණ වනසා.** (44)

**ඉති අලප්විබත්.**

---

එකත්ව බහුත්ව දෙකින් මෙතැන්හි විරොධයෙක් නො වේ. ආමන්ත්‍රණය කරන ලද්දහුගේ ක්‍රියායෙහි යෙදීමෙක් ආමන්ත්‍රණය සමයෙහි නො ලැබේ. එහෙයින් ආමන්ත්‍රණයාගේ කාරකත්වයෙක් ද නො වෙයි යනු ආචාර්‍යසම්ප්‍රදාය යි. පුත්ශබ්දයා කෙරෙන් ඈවිභක්ති කොට ස්වරසන්ධියෙන් 'පුතෑ' යී සිද්ධ යි.

අ, අවිභක්ති වේ; මහරජ, මහාරාජය (යුෂ්මත් තෙම); සැරදේ, චිරකාලයක් ජීවත් වෙහි. මහරජශබ්දයා කෙරෙන් අවිභක්ති කොට; පූර්වස්වරලොපසන්ධියෙන් සිද්ධ යි.

ආ, ආවිභක්ති වේ; හෙ සඳා, පින්වත් චන්ද්‍රය; වනන්, විරගීන්; නුපුළුස, ප්ලුෂ්ට නො කර. සඳශබ්දයා කෙරෙන් ආවිභක්ති කොට පූර්වස්වරලොපසන්ධියෙන් සිද්ධ යි.

(45) ප – ඉන්, ඉන්විභක්ති වේ; සවනින්, ශ්‍රවණයෙනි; සඳහමින්, සද්ධර්මයෙන්; සැනැහේ, ප්‍රීණ වව්. සවන්ශබ්දයා කෙරෙන් ඉන්විභක්ති කොට ස්වරසන්ධියෙන් සිද්ධ යි.

එන්, එන්විභක්ති වේ; සජනෙන්, සජ්ජනයෙනි; පරලෙව්, පරලොකය; මගා, මාර්ගණය කරව්. සජනශබ්දයා කෙරෙන් එන්විභක්ති හා ස්වරසන්ධි යි.

නෙන්, නෙන්විභක්ති වේ; සත්නෙන්, සත්වයෙනි; දුලද, දුර්ලබ්ධිය; නො බජව්, භජනය නො කරව්. සත්ශබ්දයා හා නෙන්විභක්ති යි.

ඉයුතු, ඉකාරයුක්ත වේ; නෙතිනි, නෙත්‍රයෙනි; මුනිරූ, මුනිහුගේ රූපය; නරඹා, නිරීක්ෂණය කරව්. නෙත්+ඉනි යන ප්‍රකෘතිප්‍රත්‍යය දෙදෙනාගේ ස්වරසන්ධි යි.

මහණෙනි, ශ්‍රමණයෙනි; බවුන්, භාවනාව; නො පිරිරව්, පරිවර්ජනය නො කරව්. මහණ+එනි යන ප්‍රකෘතිප්‍රත්‍යය දෙදෙනාගේ යොගයෙහි පූර්වස්වරලොපසන්ධි යි.

වත්නෙනි, ප්‍රභූති; ඉසුරුමත් නො වව්, ඓශ්වර්‍ය (මදයෙන්) මත්ත නො වව්. වත්ශබ්දයා හා නෙනි ප්‍රත්‍යය යි.

**නො වියු මෙහි විබත්—අකරක් ඇත ඔහු යෙදුම්**
**ආණෑපස ද* යුතුබස්—ලැකියනුසරින් දන්නේ. (45)**

**ණි**, ණිවිභක්ති වේ; බිහුනි, භෘඞ්ගයෙනි; මිලොලින්, මධු ලෞල්‍යයෙන්; කල් ඉක්, කාලාතික්‍රමණය කොට; තඹරෝරේ, තාමරසොදරයෙහි; දඟ නො වා, බඬ නො වව්. බිහු යන (ස්වරාන්ත) ශබ්දයා හා ණිවිභක්තියට උදහරණ යි.

† නියවත්නි, ඥනවත්නී; තණ, තෘෂ්ණාව; වනසා, විනාශ කරවී. ණිඝමක් යන (හලන්ත) ශබ්දයා හා ණිවිභක්තියට උදහරණ යි.

ආලපනවිභක්ති නිමි.

---

(46) **ප**—මෙහි, මේ විභක්ත්‍යධිකාරයෙහි; නො වියු, නො කියනලද; විබත්අකරක්, විභක්ත්‍යක්ෂරයක්; ඇත, විද්‍යමාන වුවහොත්; ඔහු යෙදුම්, ඔහුගේ ප්‍රයෝගය ද; ආණෑපස, ආණ ප්‍රත්‍යයාදියෙන්; යුතුබස් ද, යුක්ත වූ වචන ද; ලැකියනුසරින්, ලක්ෂ්‍යානුසාරයෙන්; දන්නේ, ජානනය කරන්නේ ය.

**භා**— මේ විභක්ත්‍යධිකාරයෙහි ප්‍රකාශිත නුවූ යම් විභක්ත්‍යක්ෂරයෙක් ඡේකප්‍රයොගයෙහි විද්‍යමාන වේ නම් ඒ විභක්ත්‍යක්ෂරයාගේ යෙදීම ද, ආණ ප්‍රත්‍යයාදියෙන් යුක්ත වචන ද ඡේකප්‍රයොගානුසාරයෙන් දතයුත්තේ ය.

**වි**—නො කියන ලද විභක්ත්‍යක්ෂර ප්‍රයොගයන්ගේ පරීක්ෂණය ද ආප්තවාක්‍ය නම් වූ යථාවාදී පුරාතන පණ්ඩිතයන්ගේ ව්‍යවහාරයෙන් කටයුතු වේ. ග්‍රාමීණ වූ හෝ නවීන වූ හෝ ව්‍යවහාරයෙන් නො කටයුතු වේ.

පෙරවිබත් එකබසෙහි අ, උ දෙක ද වේ.

'කල පතන සත් නම්' 'ඇසෙයින මෙහි පලකර'

'කුමරු සව්සත ගෙවා දුනගති' 'මෙඅෑ සව්සිරි දෙවී මහසතු'

මෙහි **පනත්**, **සෙසින්**, **කුමර**, **මහසත්**, යන ප්‍රකෘතීන් කෙරෙන් අ, උ යන විභක්තීහු පැනෙත්.

පෙරවිබත් බුහුබසෙහි උවිභක්ති වේ.

---

* මෙහි 'අත්නෑපස ද' 'අතපස ද' යනාදීත් වැඩිදෙනා ව්‍යවහාරකර ගෙන එන නමුත් හේ මෑතකදී ලිපිභ්‍රමයෙන් හටගත් දෙසෙකි. භාෂාවේ ප්‍රත්‍යය කොටසක් වැලහෙනතරම් බලවත් වූ ඒ දෝෂය මෙයින් බැහැර කෙළෙමු.

† මෙහි ද-'නි, නියවත්නි'යි පොත්හි පැනේ. හේ ලෙඛක ප්‍රමාදජන්‍ය යි.

'ණය කවුරු දුන් දෙති' 'පෙලරුත් අසති සමහරු'

යන මෙහි කවර, සමහර යන ප්‍රකෘතීන් කෙරෙන් උ විභක්ති සි. කිසිතැනෙක න, අන්, උන් යන විභක්තීහු ද ප්‍රථමා බහුවචනාර්‍ථයෙහි යෙදෙත්.

කව්සේකර, ගුත්තිලද, ලෝවැඩසඟරා කවිහි:-

'දූත් මේ මහසඟන මතුවණ වනති' 'කති වෙණ මියන' 'පර සතුරන් එති' 'වෙසෙති ගැහැනුන් නොතිත්විමෙන්' යන මෙහි මහසඟන, මීයන, පරසතුරන්, ගැහැනුන් යන පද්රූපයෝ උක්තකර්‍තෘභාවයෙන් ප්‍රථමාර්‍ථය භජනය කෙරෙත්. මෙකී විභක්ති විධිය භාෂායෙහි ඉතා විරල වැ පවතී. එහෙයින් ම මෙ කල සමහරු මූලාවට පත් ව පුරාතනයන්ගේ මෙ බඳු යෙදුම් දුටු තැන වෙනස් කෙරෙති. හේ නො මැනවි.

හුවිභක්තිය හලන්තයන් කෙරෙන් පර වැ යෙදෙන කල කිසිවිටෙක හකාරයට පූර්‍වරූපාදෙශ ද වේ. එයින් මිනිස්හු-මිනිස්සු, ඇත්හු-ඇත්තු යනාදීන් හුවිභක්තියෙන් ම පදරූප දෙක දෙක සිද්ධ වේ. එහෙයින් ඒ සිදතෙහි කියනලද හුවිභක්ත්‍යක්‍ෂරය ම වේ. ඇමැත්තෝ (ඇමැතියෝ), නුවණැත්තෝ (නුවණැතියෝ) යනාදිය ද කියනලද ඕවිභක්තියෙන් ම සිද්ධ වන වෛකල්පිකරූප වේ.

කරණවිබතෙහි ගෙන්, උගෙන් යනාදි එකවචන හා න්ගෙන්, උන්ගෙන් යනාදි බහුවචන ද ව්‍යවහාර වේ.

බුදුගුණ අලඞ්කාරයෙහි :-

'පවර නිම්නිරිඳුගෙන් සුපිහිටි' 'එරම්රජුගෙන් සසිරිමත් වූ'

'උතුම් නිරිඳුන්ගෙන් සැදුම්ලද' 'මහාසුදසුන් රජුන්ගෙන් හෙබි' යනාදිය යි.

සපදන් සබඳවිබත් බුහුබස්හි 'හට' යන්නහුගේ ද, න්ගේ, අන්ගේ, උන්ගේ යන විභක්තිවිෂයෙහි- න්නේ, අන්නේ, උන්නේ යන මොවුන්ගේ ද ප්‍රයොග පැනේ.

"වරද කලවුන්හට—උඹහු තද ගුණන්හට"

"මුනිඳුන්නේ, දුමුදුමුවන්නේ, නාරදුන්නේ"

යනාදිය උදාහරණ යි. අදරවිබත් ඇවිභක්තිය හෝ අවිභක්තිය බහුත්වවිවක්‍ෂායෙන් යොදන තැන කිසිවිටෙක ප්‍රකෘති ප්‍රත්‍යය මධ්‍යයෙහි වල්ප්‍රත්‍යය ද යොදනු ලැබේ.

'තියම්ගම්රටවල—ඇවිද සිඟමින් පුරවල' යනු උදාහරණ යි.

ව්‍යවහාරයෙහි කරණ, අවධිවිබත්හි ද බහුත්වවිවක්‍ෂායෙන් වල් ප්‍රත්‍යය යොදත්. 'පොත්පත්වලින්' යනාදි අචිරප්‍රවෘත්ත ව්‍යවහාර උදාහරණ යි. මේ ආදි වශයෙන් නො කියන ලද විභක්ත්‍යක්‍ෂර ප්‍රයොග ද සොයා දතයුතු.

ආණප්‍රත්‍යය යුක්ත වූ වචන පොත්පත්හි ද, කථාව්‍යවහාර යෙහි ද නොයෙක් තන්හි විද්‍යමාන වේ.

ලෝවැඩ සඟරායෙහි :-

"සෙත්සිරිදෙන මහගුණමුහුදාණ           න්"

යනාදීන් කාව්‍යලක්‍ෂ්‍ය, ලෞකිකලක්‍ෂ්‍ය දෙක්හි ම මුහුදු, වෙද, දිනිඳු, මුනිඳු, සිවු, රජ ආදි වූ ශබ්දයන් කෙරෙන් ආණප්‍රත්‍යය වැ සිද්ධ වූ මුහුදාණ, වෙදාණ, දිනිඳාණ, මුනිඳාණ, සිවාණ, රජාණ යනාදි ප්‍රකෘතීහු ආණප්‍රත්‍යයයුක්ත ශබ්දයහ යි දතයුත්තාහු ය. ආණප්‍රත්‍යය පුංලිඞ්ගිකශබ්දයන් කෙරෙන් සම්භාවනාර්ථයෙහි කරනු ලැබේ. එයින් පර ව බහුවචන ප්‍රත්‍යය ම වෙයි එකවචන ප්‍රත්‍යය නො වේ. 'ආණෑපස' යන්නෙහි ඈශබ්දයෙන් ඈණි ප්‍රත්‍යය, ණුප්‍රත්‍යය ආදිය ද සලකනු.

ස්ත්‍රීලිඞ්ගිකශබ්දයන් කෙරෙන් 'ඇණි' ප්‍රත්‍යය වේ. මැණියෝ, දුවණියෝ, බුහුනැණියෝ, බැදෑණියෝ, නැන්දණියෝ යනාදි වූ ජේකප්‍රයොගාගත පදරූපයන්හි මා, දූ, බුහුන්, බඳ, නැඳි යනාදි ප්‍රකෘතීන් කෙරෙන් සම්භාවනාර්ථයෙහි 'ඇණි' ප්‍රත්‍යය දතයුතු. දුවණියෝ යනාදි කිසිතැනෙක 'ඇණි' ප්‍රත්‍යයාගේ මාත්‍රාංශහානිය වේ. ඇණිප්‍රත්‍යයාන්තයන් කෙරෙන් ද බහුවචන ප්‍රත්‍යය ම යෙදේ. පුංලිඞ්ගිකශබ්දයන් කෙරෙන් (ආණප්‍රත්‍යය පරිද්දෙන්)සම්භාවනාර්ථයෙහි 'ණු'ප්‍රත්‍යය ද අභිමත යි. පුතණුවෝ, නෙරණුවෝ, මසිලණුවෝ යනාදි තන්හි ඒ සලකනු. මෙ ද බහුවචනවිෂයක බැව් පැනේ. සිද්ධාන්තපුරාතන ව්‍යාඛ්‍යානාදියෙහි ද ව්‍යාකූල ව අප්‍රකාශ ව තුබූ මේ ස්ථානය ශිෂ්ට ප්‍රයොග පරීක්‍ෂණයෙන් සකස්කොට මෙසේ වර්ණිත කෙළෙමු. සිංහල ව්‍යාකරණයෙහි අනුබන්ධ ණකාර නැති හෙයින් ප්‍රත්‍යය ණකාරයහට ලොපයෙක් නො වේ. ප්‍රත්‍යයසම්බන්ධි නකාර ණකාර දෙදෙනාගේ ආදෙශ වශයෙන් වෙනසෙක් ද එළුවියරණෙහි අභිමත නො වේ. එහෙයින් ආණ, ඇණි, ණු යනාදි ප්‍රත්‍යයන්ගේ මූර්ධන්‍යත්වය නිසර්ගසිද්ධ ය. සියලු තැන ම ප්‍රත්‍යය ස්වරූපය යෙදේ. පුරාතන සම්භාව්‍යලිපි ක්‍රමයෙන් ද ප්‍රතීයමාන වූ මෙකී ණත්වය ප්‍රාඥයන් විසින් වෙසෙසින් සැලකියයුතු.

ඉතිරිපුමලිහුදෙක-එ මෙ ඇ සද විබත්බස්
තම සද දෙක ද නිතැතින්-වහරෙනි ලොවැ පළට වේ.(46)

දෙනෙ දැනැ මෙසිදත පතිරජ පි රුවත
සැකෙවිනි පළකළ දැනුමට ස රුවත
දඳබැවිනිවර වැ මහගතුසා රුවත
සෙබෙ වති වැජඹෙන සජනෙනි වැ රුවත (47)

විබත්අදියර සතරවනු.

---

(46) ප—ඉතිරිපුමලිහුදෙක, ස්ත්‍රීලිඞ්ග පුංලිඞ්ගද්වයෙහි; එ මෙ ඇ සද, එශබ්ද මෙශබ්ද ආදීන්ගේ; විබත්බස්, විභක්තිවචන ද; තම සද දෙක ද, තශබ්ද මශබ්ද දෙක්හි (ලිඞ්ගභෙදයෙන් වූ විභක්තිවචන) ද; නිතැතින්, නිරුත්සාහයෙන්; ලොවැ, ලොකයෙහි; වහරෙනි, ව්‍යවහාරයෙන්; පළට වේ, ප්‍රකට වේ.

භා—ස්ත්‍රීලිංග, පුංලිඞ්ග දෙක්හි එශබ්ද, මෙශබ්ද දෙකින් සිඬවන විභක්තිවචන ද, තශබ්ද, මශබ්ද දෙක්හි විභක්තිවචන ද, ලොකව්‍යවහාරයෙන් නිරුත්සාහයෙන් ම දතහැකිවන හෙයින් මෙහි නො කියනලදි.

වි—එශබ්දයාගේ පුංලිඞ්ග ප්‍රථමෛකවචනයෙහි ‘ඒ’ යන රූපය ද, ස්ත්‍රීලිඞ්ග ප්‍රථමෛකවචනයෙහි ‘ඕ’ යන රූපය ද එකිනෙක වෙනස්වූවෝ වෙත්. ලිඞ්ගද්වයෙහි ම ප්‍රථමා බහුවචනයෙහි ඔහු, ඔව්හු යන රූප එකලෙසින් සිද්ධ යි. මෙශබ්දයෙහිද පුංලිඞ්ගයෙහි මේ. මොහු, මොව්හු යනාදීන් ද ස්ත්‍රීලිඞ්ගයෙහි මෝ. මොහු, මොව්හු යනාදීන් ද වරනැඟීම වේ. තශබ්දයෙහි තෝ. තෙප්, තෙපි යනාදීන් පුංලිඞ්ගයෙහි ද, තෝ, ති. තෙප්, තෙපි යනාදීන් ස්ත්‍රීලිඞ්ගයෙහි ද ව්‍යවහාර වේ.

මශබ්දයෙහි ලිඞ්ගද්වයෙහි : මම, මම්. අපි, ඇප් යනාදීන් එකලෙස ම ව්‍යවහාරසිද්ධිය වේ. මෙසේ මෙකී ශබ්දයන් සම්බන්ධි වූ පදරූපයන්ගේ විශෙෂය ලොකව්‍යවහාරයෙන් සුවසේ දතහැකි බැවින් සිදතෙහි විස්තර නො කරනලදි.

ඉක්බිති ප්‍රථමාදි සියලු විභක්තීන්ගේ ම යෙදුම් එක කවෙක්හි ලා දක්වන්නෝ දෙනෙ දැනැ යනාදි කව කීහු.

(47) ප—සජනෙනි, සජ්ජනයෙනි; දෙනෙ, ජනතෙම; පතිරජ පිරුවත, ප්‍රතිරාජපරිවෙණාධිපතිහු විසින්; සැකෙවිනි, සංක්ෂෙපයෙන්; පළකළ, ප්‍රකාශකරන ලද්දා වූ; දැනුමට, ජානනයට; සරුවත, සාර වූ; මෙසිදත, මේ සිද්ධාන්තය; දැනැ, අවබොධ

## සමාසාධිකාරය.

**කියලන එකඅරුත—සබඳ වැ සදන් නනරුත්**
**එ වියූ සමස්විදි නම්—එහි බේ දූන් පවස්මෝ.** (1)

---

කොට; දදබැවින්, දන්ධභාවයෙන්; ඉවර වැ, ඉතර වැ හෙවත් වෙන් වැ; මහගතුකරුවන, මහාග්‍රන්ථකාරයන්ගේ; සෙබෙ, සභායෙහි; රුවන වැ, රත්නයක් වැ; වැජඹෙන, විජෘම්භණය කරත්හොත්; වනි, ශකත යි.

මෙහි **දෙනෙ** යනු උක්තකර්තෘසඞ්ඛ්‍යාත අවිශිෂ්ටපදාර්ථයෙහි පෙරවිබත් එකබස යැ. දූනැ යනු පූර්වක්‍රියා යැ. **සිදනා** යනු අනුක්තකර්මයෙහි කම්විබත් එකබස යැ. **මෙ** යනු එයට තුල්‍යාධිකරණ විශෙෂණ යැ. **පතිරජපිරුවනා** යනු අනුක්තකර්තෘයෙහි කතුවිබත් එකබස යැ. **සැකෙවිනි** යනු අනුක්තකරණයෙහි කරණවිබත් එකබස යැ. **පලකල** යනු කර්මවිශෙෂණ යැ. **දූනුමට** යනු අනුක්තසම්ප්‍රදානයෙහි (පිණිසනිසිතැන) සපදන්විබත් එකබස යැ. **සරුවනා** යනු කර්මවිශෙෂණ යැ. **දදබැවින්** යනු අනුක්ත අපාදානයෙහි අවදිවිබත් එකබස යැ. **ඉවර** යනු පෙරවිබත් එකබස යැ. **වැ** යනු පූර්වක්‍රියා යැ. **මහගතුකරුවන** යනු අනුක්ත සම්බන්ධයෙහි සබඳවිබත් එකබස යැ. **සෙබෙ** යනු අනුක්තාධාරයෙහි අදරවිබත් එකබස යැ. **වනි** යනු පෙරවිබත් එකබස යැ. **වැජඹෙනා** යනු අසම්භාව්‍යක්‍රියා යැ. **සජනෙනි** යනු අලප්විබත් බහුබස යැ. **වැ** යනු පූර්වක්‍රියා යැ. **රුවනා** යනු පෙරවිබත් එකබස යි. වාක්‍යයෙක්හි ඒ ඒ තැනට නිසි සේ විභක්ත්‍යන්තයන් යොදන අයුරු මෙයින් සැලකියයුතු.

**චතුර්ථ වූ විභක්ත්‍යධිකාරය යි.**

---

## සමාසාධිකාරය.

---

(1) **ප**—නනරුත්, නානාර්ථ ඇති හෙවත් වෙන් වෙන් අර්ථ ඇති; සදන්, ශබ්දයන්; සබඳ වැ, සම්බන්ධ වැ; එකඅරුත, එකාර්ථයක්; කියලන, කථනය කරන කල්හි; එ, එය; සමස්විදි නම්, සමාසවිධි නමැයි; වියූ, කීහු; එහි බේ, ඒ (සමාසවිධියෙහි) භෙදය; දූන්, මෙකල්හි; පවස්මෝ, ප්‍රකාශකරමු.

භා—වෙන් වෙන් අර්ථ ඇති ශබ්දයන් එකශබ්දයක් මෙන් ගැලපී එක් අර්ථයක් ප්‍රකාශකරත්හොත් ඒ **සමාස** නම් වෙයි. එහි විශෙෂ විභාග මේ අධිකාරයෙහි දක්වම්හ.

වි—පදයන්ගේ සංක්ෂෙපකිරීම සමාස නම්. හෙ ද නාම යන්ගේ යුක්තාර්ථය ඇති කල්හි ම වේ. ඒ බව ආචාර්යී සඳීවම්

**අවියසමස්, විබත්සමස්, වෙසෙසුන්සමස්, අන්අරුත්සමස්, දඅරුත්සමස් යි සමස් පස්වැදෑරුම්.** (2)

---

යන් විසින් කාතන්ත්‍රයෙහි "නාම්නාං සමාසො යුක්තාර්ථඃ" යන සූත්‍රයෙන් කියනලදි. නාම්නාම්, (වෙන් වෙන් වූ අර්ථ ඇති) නාමයන්ගේ; යුක්තාර්ථඃ, අන්‍යොන්‍ය සම්බන්ධාර්ථය තෙම; සමාසඃ, සමාස නම් වේ. මෙහි යුක්තාර්ථ ඇත්තේ සමාසය යි කී හෙයින් යුක්ත වූ සම්බන්ධ වූ ඔවුනොවුන් අපෙක්‍ෂාකිරීම හා යොග්‍යතාව ද ඇති පදයන් දෙදෙනකුන්ගේ හෝ බොහෝ දෙනකුන්ගේ එකපද බව **'සමාස'** නම් වෙයි දතයුතු.

"**දරින් සැලෙහි බත පිසෙයි**" යන මෙහි 'දර' යනු පචන ක්‍රියාවට කරණකාරක යැ. **'සැලි'** යනු පචනක්‍රියාවට ආධාර යැ. **'බත'** යනු පචනක්‍රියාවට කර්ම යැ. එහෙයින් වෙන් වෙන් වූ අර්ථ ඇති දර, **සැලි**, **බත** යන මේ තුන්පදයන්ගේ ඔවුනොවුන් අපෙක්‍ෂාකිරීම හා යොග්‍යතාව ද ලක්‍ෂණකොට ඇති යුක්තාර්ථ බවක් නැති හෙයින් **'දරසැලිබත්'** කියා සමාසයෙක් නො වේ. **'දෙව්බඹහු නමදිත්'** යන්නෙහි දෙව්හු ද, බඹහු ද, දෙව්බඹහු යි සමාස වෙයි. මෙහි **දෙව්**, බඹ ශබ්දයන්ගේ නමස්ක්‍රියාසඞ්ඛ්‍යාත එක ම ක්‍රියායෙක්හි සම්බන්ධත්වය ඇති හෙයින් යුක්තාර්ථ බව ඇත්තේ ය. 'බුදුගුණ **කියමි**' යන්නෙහි 'බුදුන්ගේ ගුණ' යන දෙපදයන්ගේ පරස්පරාපෙක්‍ෂායොග්‍යතාලක්‍ෂණ යුක්තාර්ථය ඇත්තෙන් 'බුදුගුණ' යි සමාස වී.

(2) **ප**—අවියසමස්, අව්‍යයසමාසය; විබත්සමස්, විභක්ති සමාසය; වෙසෙසුන්සමස්, විශෙෂණසමාසය; අන්අරුත්සමස්, අන්‍යාර්ථසමාසය; දඅරුත්සමස් යි, දකාරාර්ථසමාසය යි කියා; සමස්, සමාසය තෙම; පස්වැදෑරුම්, පඤ්චවිධ වේ.

**වි**—සංස්කෘත, මාගධ ශබ්දශාස්ත්‍රයන්හි දක්වනලද සමාස සංඥාවන්ට අනුරූපකොට (බොහෝ සෙයින්) මූගලන්වියරණ ඇසුරුකොට මෙකී සමාසනාමයෝ දක්වනලදහ. එතකුදු වුවත් සංස්කෘතශාබ්දිකයන්ගේ සංඥාව්‍යවහාරයන් හා මෙකී නාම යන්ගේ මඳ වෙනසෙක් ද පැනේ. හේ මෙසේ යි:-

මෙහි අවියසමස් යනු අව්‍යයීභාවසමාසය යි ද,* විබත්සමස් යනු තත්පුරුෂසමාසයයි ද, වෙසෙසුන්සමස් යනු කර්මධාරයසමාස

---

* අව්‍යයපූර්වපද කර්මධාරයසමාසය ද මෙහි ම ඇතුළත් කළ හෙයින් කර්මධාරයසමාසයාගේ ද කොටසක් මෙහි අව්‍යයසමාස නම් වෙයි. මෙය සංස්කෘත මාගධ ශබ්දශාස්ත්‍රයන් හා සම නො වේ.

**පෙරඛඩ උසුරුවන—යව් කු ප න ඈ අවියන්**
**පරපදසබඳ ලදහොත්—අවියසමස් එ විසූ.** (3)

**"සක්ඛැබිලි සියො අගිනි එක්පසක් යව්දිව්" ඇගි දිව්හිම්= යව්දිව්. යව්අමන් බමණන් අමන.** (4)

---

යයි ද, අන්අරුත්සමස් යනු බහුව්‍රීහිසමාස යයි ද, දඅරුත් සමස් යනු ද්වන්ද්වසමාස ය යි ද පාණින්‍යාදීන්ට අභිමත ය. මෙකී පඤ්චවිධසමාසයන්ගේ විධිය උද්දිෂ්ට ක්‍රමයෙන් නිර්දෙශ කරන්නෝ 'පෙරඛඩ' යනාදිය කීහු.

(3) **ප**—පෙරකඩ, පූර්වඛණ්ඩයෙහි; උසුරුවන, උච්චාරණය කරනුලබන්නා වූ; යව් කු ප න ඈ, යව් කු ප න යනාදි වූ; **අවියන්**, අව්‍යයන්; **පරපදසබඳ**, පරපදයන් හා සම්බන්ධය; **ලදහොත්**, ලබ්ධ වුවහොත්; **එ**, ඒ (සමාසය) තෙම; **අවියසමස්**, **අව්‍යයසමාස** ය යි; විසූ, කීහු.

**භා**—යම් සමාසයෙක්හි පූර්වපද වැ සිටි **යව්**, **කු**, **ප**, න යනාදි අව්‍යය ශබ්දයෙක් පසුපදය හා එකපදත්වයෙන් සම්බන්ධ වී නම් එය අව්‍යයසමාස නම් වෙයි. අව්‍යයශබ්දයක් හා නාමයක්හුගේ සම්බන්ධ බව පමණෙක් ම මෙහි අව්‍යයසමාස බවට ලක්‍ෂණ වශයෙන් ගත්තා ලදි.

(4) **ප**—'සක්කැබිලි සියො අගිනි එක්පසක් යව්දිව්' ඇගි, සක්කැබිලි සියො අගිනි එක්පසක් යව්දිව් යනාදි අසක්දාකවෙහි; **දිව්හිම්**, ජීවිතය සීමාකොට (යන අර්ථයෙහි); යව්දිව්, යව්දිව් යනු වේ. අගිනි, ශරීරයෙන්; එක්පසක්, එක්පාශ්වයෙක්; යව්දිව්, **ජීවිතය** හිම්කොට; සක්කැබිලි, ශඞ්ඛකුණ්ඩයෙන්; **සියො**, සඞ්ගත ය (යන අර්ථ යි); යව්අමන්, අමත්‍රපරිච්ඡේදයෙන් (=භොජනපාත්‍ර පමණින්); බමණන්, බ්‍රාහ්මණයන්; **අමන**, **ආමන්ත්‍රණය** කර.

**වි**—**යව්දිව්**, **යව්අමන්** යන දෙතැන **යව්** යන අව්‍යය ශබ්දය **පූර්වපද** වූ හෙයින් අව්‍යයසමාස වේ. මෙහි **'යව්'** ශබ්දය අවධාරණාර්ථයෙ වූ (මාගධ) **'යාව'** ශබ්දයෙන් හෝ (සංස්කෘත) **'යාවත්'** ශබ්දයෙන් හෝ තද්භව හෙයින් මෙහි ද අවධාරණාර්ථය ඇත්තේ වේ. අවධාරණය නම් මෙතෙකැ යි පිරිසිඳීම යැ. **'අවධාරණ මියත්තා පරිච්ඡේදඃ'** යන ආචාර්ය ජයාදිත්‍යවචනයෙන් ඒ ප්‍රකාශිත යි. අව්‍යය සමාසයෙහි අව්‍යයපදය පූර්වපද වියයුතු ය. එහෙයින් **'දිව්හිම්'** යන වාක්‍යයෙහි **'හිම්'** යන අවධාරණාර්ථය ප්‍රකාශ කරන **'යව්'** ශබ්දය පූර්වපදය වේ. මෙය නිත්‍යසමාස බැවින් කිසිතැනෙකත් **'දිව් යව්'** කියා අසමාස වැ නො සිටී,

**"තුනුහොළවට හල, යතලබ සතොස්සින් හල" ඈහි යම් යම් ලබ = යතලබ. විදිය නො ඉක්ම = යතවිදි. පැසුළු බල = අනුබල. මෙඈ යව්ඈසමස් නම්.** (5)

---

යම් හෙයකින් එසේ සිට අවධාරණය (=පරිච්ඡෙදාර්ථය) ප්‍රකාශ නො කළ හෙන්නේ ද එහෙයිනැ යි දතයුතු. සංස්කෘත භාෂායෙහි **'යාවජ්ජීවම්'** යනු හා පාලි භාෂායෙහි **'යාවජීවං'** යනුත් මීට සමානාර්ථ අව්‍යයීභාවසමාසපද යි. **'යව්අමත්'** යනු ද මෙසේ ම අවධාරණාර්ථ යව්ශබ්දයා හා අමත්ශබ්දයාගේ සමාසය යි. මාගධ වෛයාකරණයන් විසින් **'යාවාමත්තං'** යී ද සංස්කෘත වෛයාකරණයන් විසින් **"යාවදමත්‍රම්"** යී ද මෙය ම දක්වනලදි. යව් අමත් යනු කෙබදු තැනෙක යෙදුවමනා ද යනු මතු කියන පාණිනීයවෘත්තිකාර ජයාදිත්‍යයන්ගේ වාක්‍යයෙන් හැගේ. ප්‍රතිරූප පරිවෙණස්වාමීන් විසින් මෙහි උදාහරණ කරනලද්දේත් මේ ජයාදිත්‍ය වාක්‍යයේ අදහස මැ යි. 'යාවදමත්‍රං බ්‍රාහ්මණානාමන්ත්‍රයස්ව, යාවන්ත්‍යමත්‍රාණි සම්භවන්ති පඤ්ච ෂඩ් වා තාවන්ත ආමන්ත්‍රයස්ව' යනු ජයාදිත්‍ය වචන යි. **'යව්අමත් බමුණන් අමත**, යම් පමණ අමත්‍රයෝ (=භොජනපාත්‍රයෝ) ලැබෙත් ද පසක් හෝ සයක් හෝ (වෙත්වා) එපමණවූවන් කැඳවව' යනු අර්ථ යි.

(5) **ප**—තුනුහොළවට -පෙ- ඈහි, (මේ) ආදි (අසක්ද) කාවෙහි; යම් යම් ලබ, යම් යම් ලාභයෙක යන අර්ථයෙහි; යතලබ, යතලබ යනු වේ. තුනු, ශරීරයාගේ; හොළවට, දුඃඛවෘත්තය; හල, හැරියේ ය; යතලබ, යථාලාභයෙන්; සතොස්සිත්, සන්තොෂ චිත්තය; හල, හැරියේ ය යන අර්ථ යි; විදිය නො ඉක්ම, විධානාති ක්‍රමණය නො කොට යන අර්ථයෙහි; යතවිදි, යතවිදි යනු වේ. පැසුළු බල, පශ්චාත්භූත වූ බලය තෙම; අනුබල, අනුබල නම්; මෙඈ, මේ ආදිය; යව්ඈසමස් නම්, යවාදිසමාස නම් වේ.

**වි—යතලබ යතවිදි** යන දෙතැන ම **'යත'** යනු යථාශබ්දයා හා සමාන වූ අර්ථ ඇති අව්‍යයපදයෙකි. මෙහි **'යත'** යන අව්‍යය වීප්සාර්ථ යි. පදාර්ථයන් සම්බන්ධ කරනු කැමැත්ත වීප්සා නම්. යමක් යමක් ලැබේ ද ඒ ලද ලද දෙයින් යන අර්ථය මේ සමාස පදයෙන් වාච්‍ය හෙයින් මෙහිදු වීප්සාර්ථය පැනේ. අව්‍යයීභාව සමාසස්වරූප වූ අව්‍යයසමාසය අවිභක්තික වුවත් කිසිතැනෙක විභක්ත්‍යන්ත ද වේ. එහෙයින් **'යතලබින්'** යී කරණවිභක්ති ප්‍රයොග ද දක්නාලැබේ.

**යවදිව, යතලබ,** අනුබල යනාදි මේ සමාසයෝ **යවාදි සමාස** නම් වෙත්. යව්ආදි අව්‍යයපදයක් පූර්වකොට ඇති හෙයිනි.

**ගැරහුම් ලද පුරිස් = කුපුරිස්. නිඳි ලද ලද = දුලද. මනා ගඳ = සුවඳ. මෙඈ කුඈසමස් නම්. (6)**

**උසාවින් හොබනේ = පබ. වෙනැ වන = උපවන. මෙඈ පඈසමස් නම්. (7)**

---

මෙයින් 'අනුබල' යන්නෙහි පූර්වපදයාගේ ප්‍රධානත්වයෙන් වාක්‍ය නො ගෙන පරපදප්‍රධාන වශයෙන් 'පැසුළු බල = අනුබල' කියා වාක්‍ය ගත්හෙයින් මෙය කර්මධාරයසමාසස්වරූප වූ අව්‍යයසමාස යෙකි. මෙහි අනුශබ්දය පශ්චාදර්ථ යි.

**ක්වාදිසමාස යි.**

(6) **ප**—ගැරහුම් ලද, ගර්හා ලද්දා වූ; පුරිස්, පුරුෂ තෙම; කුපුරිස්, කුපුරිස් නම් වෙයි; නිඳි ලද, නින්දා ලද්දා වූ; ලද, ලබ්ධිය; දුලද, දුලද නම් වෙයි; මනා ගඳ, මනොඥ වූ ගන්ධය; සුවඳ, සුවඳ නම් වෙයි; මෙඈ, මේ ආදිය; කුඈසමස් නම්, ක්වාදි (= කු ආදි) සමාස නම් වේ.

**වි**—**කුපුරිස්, දුලද, සුවඳ** යන මේ සමාසයන්ගේ පූර්වපදත්ව යෙන් සිටි **කු, දු, සු** යන අව්‍යයයෝ පරපදත්වයෙන් සිටි **පුරිස්, ලද, ගඳ** යන ශබ්දයන්ගේ අර්ථයන් වෙසෙසමින් (= විශෙෂණ වැ) සිටියෝ ය. එහෙයින් මොව්හු ද කර්මධාරයස්වරූප අව්‍යය-සමාසයෝ වෙත්.

ගැරහුම් ලද යන අර්ථ ඇති **කු**ශබ්දය **පුරිස්**ශබ්දයහට විශෙෂණ වැ සිටියෙන් කුපුරිස් යනු වෙසෙසුන්සමස්හි ඇතුළත් වුවත් අව්‍යය පූර්වපද හෙයින් අවියසමස් නම් වි. **නිඳි ලද** යන අර්ථ ඇති **දු**ශබ්දය හා ද, **මනා** යන අර්ථ ඇති **සු**ශබ්දය හා ද සමාස වීම මේ නයින් දතයුතු.

**ක්වාදිසමාස යි.**

(7) **ප**–උසාවින්, උත්කෘෂ්ට (ගුණ) යෙන්; හොබනේ; ශොභමාන වන්නේ; පබ, පබ නම්. වෙනැ, සමීපයෙහි; වන, අරණ්‍යය; උපවන, උපවන නම්. මෙඈ, මේ ආදිය; පඈසමස් නම්, පාදිසමාස නම් වේ.

**වි**—මෙහි '**පබ**' යනු **ප**ශබ්දපූර්ව "**බා = දිලිමෙහි**" යන ධාතු වෙන් සිද්ධ වූ ප්‍රත්‍යයාර්ථශබ්දයෙකි. උපසර්ගයා හා ධාතුහුගේ සම්බන්ධාර්ථය ද අව්‍යයසමාසය යි මෙයින් දක්වූහ. '**උසාවින් හොබනේ**' යනු **ප** යන උපසර්ගවත් **බා** ධාතුහට අස්වපදවිග්‍රහය යි. උපවන යන්නෙහි **උප** යනු සමීපාර්ථයෙහි උපසර්ගයෙකි. '**වෙනැ**'යි ඊට වාක්‍ය ගත්හු. මේ ආදිය **පාදිසමාස** නම් වූ අව්‍යසමාසය වේ.

**පාදිසමාස යි.**

**සුර නො වන්නේ = අසුර. නො දෙනලද්දේ = අසින්. කුසල් නො වන්නේ = අකුසල්. මෙඈ නඅරුත්හි කෙළෙන් නඅරුත් සමස් නම්.** (8)

**මෙහි පෙරකුරු පණකුරු වුව ඔහු වෙත නඅගම් කැරැ එකෙක් නො වනුයේ = අනේ, අදර නො වන්නේ = අනදර, මෙඈ විමසනු.** (9) **ඉති අවියසමස්.**

---

(8) **ප**—සුර නො වන්නේ, සුර නො වන තැනැත්තේ; අසුර, අසුර නම්; නො දෙනලද්දේ, දානය නො කරනලද්දේ; අසින්, අසින් නම්; කුසල් නො වන්නේ, කුශලය නො වන්නේ; අකුසල්, අකුසල් නම්; මෙඈ, මේ ආදිය; නඅරුත්හි කෙළෙන්, නකාරාර්ථයෙහි කළ හෙයින්; නඅරුත්සමස් නම්, නකාරාර්ථසමාස නම්.

**වි**—අසුර යන්නෙහි 'න+සුර' යනු පූර්වෝත්තර පද යි. පූර්ව පද වැ සිටියා වූ ප්‍රතිෂේධවාචි න යන නිපාතය '**තදන්‍යතද් විරුද්ධතදභාවේෂු නඤ් වර්තතෙ**' යනු අනුභූතිස්වරූපවචන හෙයින් ත්‍රිවිධ නඤර්ථයන් අතුරෙන් තදන්‍යාර්ථයෙහි වේ. ප්‍රසජ්‍ය ප්‍රතිෂේධ, පර්යුදාසප්‍රතිෂේධයන් අතුරෙහි පර්යුදාසප්‍රතිෂේධ යි. හෙවත් පරපද වැ සිටි සුරශබ්දයාගේ දෙවතාර්ථය වළක්වමින් ක්‍රියාගුණාදියෙන් ඒ හා සමාන අනිකක්හු හඟවයි*. සුරසදෘශ වූ දෛත්‍යයකු ප්‍රකාශ කෙරෙයි යනු අභිප්‍රාය යි. එසේ මුත් සුර නො වන කිසියම් තිර්යග් මනුෂ්‍යාදි විසදෘශ සත්ත්වයකු ප්‍රකාශ නො කෙරේ. නශබ්දයහට අඩගසූත්‍රයෙන් අකාරාදෙශ ව අසුර යනු වේ. අසින් යන තැන 'න+දින්' යනු පූර්වපර පද යි. මෙහි නකාරය තදභාවය හෙවත් පරපදාර්ථයාගේ නො වීම (= නැති බව) ප්‍රකාශ කෙරෙයි. එහෙයින් නයන්නෙන් දින්ශබ්දවාච්‍ය වූ දෙනලද යන අර්ථයාගේ අභාවය (= නො දෙනලද යන අර්ථය) පහළ වෙයි. දින් යනු '**දින්න**' යන මාගධ ශබ්දයෙන් තද්භව යි. නකාරයහට අකාරාදෙශ වැ දකාරයහට සකාරාදෙශ වැ '**අසින්**' යනු වේ. අකුසල් යන තැන 'න+**කුසල්**' යනු පූර්වපර පද යි. මෙහි නකාරය පරපදයහට විරුද්ධ වූ අර්ථය දක්වන හෙයින් තද් විරුද්ධාර්ථය ප්‍රකාශ කෙරෙයි. කුශලයට විරුද්ධ දෙය යන අර්ථ යි. නකාරයහට අකාරාදෙශ වැ අකුසල් යනු වේ. කුශලයට ප්‍රතිපක්ෂ (= සතුරු) දෙය අකුසල් නම්. මේ ආදිය නකාරයාගේ අර්ථයෙහි කළ හෙයින් **නඅරුත්සමස්** නම් වේ.

(9) **ප**—මෙහි, මේ (නකාරාර්ථ) සමාසයෙහි; පෙරකුරු, පූර්වාක්ෂරය; පණකුරු වුව, ප්‍රාණාක්ෂර වුවහොත්; ඔහු වෙත, ඒ

---

* "පර්යුදාසඃ සදෘග්ග්‍රාහී ප්‍රසජ්‍යස්තු නිෂේධකෘත්"

**පෙරපසුවිබත් හැර—සෙසු* සත්විබත්අත්පද**
**පරපද හා සමස්වන—එ විබත්සමස් නම් වේ.** (10)

**ගත කරනුයේ = ගත්කරු, කිවි. කිඩි කරනුයේ = කිඩිසර, ඉඳුරුදලි. මිය පල්නේ = මිපල්, සැත්. මී බොනුයේ = මීපා, සසු. පන බොනුයේ = පිනිපා, කිරි. ගිර අවුරනුයේ = ගිරවරණ, සත්.** මෙඅැ සාමිවිබත් සමස්. (11)

---

(පූර්වාක්ෂරයාගේ) සමීපයෙහි; නඅගම් කැරැ, නකාරාගම කොට; එනෙක් නො වනුයේ, ඒකසඞ්ඛ්‍යක නො වන්නේ (යන වාක්‍ය යෙහි); අනේ, අනේ ය යි ද; අදර නො වන්නේ, ආදරය නො වන්නේ (යන වාක්‍යයෙහි); අනදර, අනදර යයි ද (සිද්ධ කරනු).

**වි-නඤාරාඞ්සමාස**යෙහි පරපදයාගේ පූර්වාක්ෂරය ප්‍රාණාක්ෂර යෙක් වී නම් ඔහු කෙරෙන් පෙරටු ව නකාරාගම කරනු ලැබේ. ඒ මෙසේ යː– 'න-එක්' යන්නෙහි ද 'න-අදර' යන්නෙහි ද පරපද වූ එක්, අදර යන ශබ්දයන්ගේ පූර්වාක්ෂර පණකුරු බැවින් ඔවුන්ගෙන් පූර්වයෙහි නකාරයක් ආගම කොට හෙවත් මිතුරකු මෙන් ලගා කොට පූර්වපද වූ නකාරයහට අකාරාදෙශ කොට සංහිතාකායර්‍ය කළ කල්හි 'අනෙක්, අනදර' යි සිද්ධ වෙයි. අනෙක් යන්නෙහි සකාරලොපය ද නකාරසථ එයන්නට මාත්‍රා වෘද්ධි ද කළ කල්හි අනේ යනු වේ. මෙඅැ, මේ ආදි (උදාහරණ); විමසනු, විමංසනය කරනු.

**අව්‍යයසමාස නිමි.**

---

(10) **ප**—පෙරපසුවිබත්, පූර්වපශ්චිම විභක්ති (ඇය); හැර, වර්ජිත කොට; සෙසු, අවශෙෂ වූ; සත්විබත්අත්පද, සප්ත විභක්ත්‍යන්ත පදයන්; පරපද හා, පර වූ පදයක් හා; සමස්වන, සමාස වූ කල්හි; එ, ඒ (සමාසය තෙම); විබත්සමස් නම් වේ, විභක්තිසමාස නම් වේ.

**භා**—විභක්ත්‍යධිකාරයෙහි කියනලද විභක්තිපරිපාටියෙන් පූර්ව වූ (ප්‍රථමා) විභක්තිය ද, පශ්චිම වූ (ආලපන) විභක්තිය ද යන විභක්ති දෙක හැර ශෙෂ වූ **කම්, කතු, කරණ, සපදන්, අවදි, සබඳ, අදර** යන සප්ත විභක්තීන් අන්තකොට ඇති පූර්වපදයන් හා පරපදයක්හුගේ සමාසයක් වූවහොත් ඒ **විභක්තිසමාස** නම් වේ.

**සාමිවිභක්තිසමාසය.**

(11) **ප**—ගත කරනුයේ, ග්‍රන්ථය කරන තැනැත්තේ, ගත් කරු, ගත්කරු නම්; කිවි, කවි තෙමේ යි. කිඩි කරනුයේ, ක්‍රීඩා

---

* 'තෙසු' යිත් පාඨ යි.

**පරා විසින් පුටුවූයේ = පරපුටු, සමත්. යදි හෝ. බඹහු විසින් දෙනලද්දේ = බඹදත්, සිවුරු. දෙව්හු විසින් දෙනලද්දේ = දෙව්දත්, බොජුන්. මෙඈ කතුවිබත්සමස්.** (12)

---

කරන තැනැත්තේ; කිඩියර, කිඩියර නම්; ඉඳුරුදලී, ඉන්ද්‍රජාලික තෙමේ යි. මිය පල්නේ, මහිය පාලනය කරන තැනැත්තේ; මීපල්, මීපල් නම්; කැත්, ක්‍ෂත්‍රිය තෙමේ යි. මී බොනුයේ, මධු පානය කරන තැනැත්තේ; මීපා, මීපා නම්; සපු, ෂට්පද තෙමේ යි. පන බොනුයේ, නැවත පානය කරන තැනැත්තේ; පිනිපා, පිනිපා නම්; කිරි, හස්ති තෙමේ යි. හිර අවුරනුයේ, සූර්‍ය්‍යා ආවරණය කරන තැනැත්තේ; හිරවරණ, හිරවරණ නම්; සත්, ඡත්‍රය යි. මෙඈ, මේ ආදිය; කම්විබත්සමස්, කර්‍මවිභක්තිසමාස නම් වේ.

වි—මෙහි **'ගත්කරු'** යන ප්‍රත්‍යයාර්ථශබ්දය සිද්ධකරනවිට **'ගත්'** යන කර්‍මවිභක්ත්‍යන්තයා උපපද කොට ඔහු කෙරෙන් පර වූ **කර** ධාතුව තබා කර්තෘකාරකයෙහි **උ** ප්‍රත්‍යය කිරීමෙන් **කරු** යි සිද්ධ කොට පූර්‍වපදසර් කර්‍මවිභක්තිය සමාසවිධියෙන් ලොප් කළ කල්හි **ගත්කරු** යනු වේ. මෙය ද්විතීයාන්තයා හා සිද්ධකටයුතු උපපදසමාසයෙකි. මේ සමාසයෙහි කර්‍මවිභක්තිය ලොප් වූ හෙයින් **'කම්විබත්සමස්'** යයි කියනුලැබේ. විභක්තිසමාස නමින් මෙහි කියනුලබන්නේ බාහිරව්‍යාකරණප්‍රසිද්ධ තත්පුරුෂ සමාසය යි. එහෙයින් **'ද්විතීයාතත්පුරුෂසමාස'**යයි කිව ද යෙදේ.

**කිඩියර** යන්නෙහි **කිඩි** යන උපපදයා කෙරෙන් **කර**ධාතුව ද, **මිපල්** යන්නෙහි **මිය**යන උපපදයා කෙරෙන් **පල්**ධාතුව ද, **මීපා** යන්නෙහි මී යන උපපදයා කෙරෙන් **පා**ධාතුව ද, **පිනිපා** යන්නෙහි **පන** යන උපපදයා කෙරෙන් **පා**ධාතුව ද, **නිසයුරු** යන්නෙහි **නිස** යන උපපදයා කෙරෙන් **කර**ධාතුව ද, **හිරවරණ** යන්නෙහි **හිර** යන උපපදයා කෙරෙන් **වර**ධාතුව ද තබා ප්‍රත්‍යය වත් කොට සමාස විධියෙන් උපපදයන්ගේ විභක්තිලොපය කිරීමෙන් පදසිද්ධි සලකනු.

**කර්තෘවිභක්තිසමාසය.**

(12) **ප**—පරා විසින්, අන්‍යයා විසින්; පුටුවූයේ, පුෂ්ටවූයේ; පරපුටු, පරපුටු නම්; සමත්, කොකිල තෙමේ යි; යදි හෝ, යාචක හෝ යි. බඹහු විසින්, බ්‍රහ්මයා විසින්; දෙනලද්දේ, දානයකරන ලද්දේ; බඹදත්, බඹදත් නම්; සිවුරු, චීවර යි; දෙව්හු විසින්, දෙවියන් විසින්; දෙනලද්දේ, දානය කරනලද්දේ; දෙව්දත්, දෙව්දත් නම්; බොජුන්, භොජන යි. මෙඈ, මේ ආදිය; කතුවිබත්සමස්, කර්තෘවිභක්තිසමාස නම් වේ.

**බමර කරණෙන් උදුලේ බමරුදුල = හැති. අත් කරණෙන් වන කම් = අත්නම්. බා කරණෙන් සුරු වූයේ = බාසුරු, කෙසර. කැසින් බොනුයේ = කැසුබු. දියෙන් හැනූ බත් = දිබත්. කිරින් පිසූ බත් = කිරිබත්. මෙඈ කරණවිබත්සමස්.** (13)

---

වි — මෙහි පුවු යනු පොෂිත ය යන අර්ථයෙහි පුසධාතුවෙන් සිද්ධ ප්‍රත්‍යයාර්ථශබ්දයෙකි. **'පරා විසින් පුවු, බඹහු විසින් දත්'** යනාදීන් තබා කර්තෘවිභක්තිලොපය කිරීමෙන් **පරපුවු**, **බඹදත්** යනාදිය සිද්ධ කරනු.

**පරපුවු** යනු අන්‍යයන් විසින් පොෂිතය යන අර්ථයෙන් කොවුලන්ට ද යාචකයන්ට ද නම්. බඹදත් යනු බ්‍රහ්මයා විසින් දුන් කිසියම් දෙයකට නම් වේ. **විවරණ** හි අර්ථ කියනලද්දේ සිදුහත් කුමරුන්ට බඹහු දුන් සිවුරු සඳහා යි. බුදු වූ පසු දෙන ලද භොජනය දෙවියන් විසින් දෙනලද හෙයින් **දෙව්දත්** යන්නට **බොජුන්** යයි අර්ථ කියනලදි. ප්‍රසිද්ධකාරණ වශයෙන් මෙසේ කියන ලදුවත් අන්කිසි දැයක් නමුදු ඔවුන් විසින් දෙන ලද්දේ වී නම් හෙ ද මේ නමින් වාච්‍ය වෙයි. එහෙයින් ම කුමාරාදීන්ට නම් තබන්නෝ ද මෙකී අර්ථ සලකා බ්‍රහ්මදත්ත කුමාරය, දෙවදත්ත කුමාරය, යනාදි නම් කළහ.

## කරණවිභක්තිසමාසය.

(13) **ප** — බමර කරණෙන්, භ්‍රමරයන් කරණකොට ගෙන; උදුලේ, උජ්ජ්වලිත වූයේ; බමරුදුල, බමරුදුල නම්; හැති, සතබක ය යි; අත් කරණෙන්, හස්තය කරණකොටගෙන වන, වන්නා වූ; කම්, කර්මය; අත්නම්, අත්නම් නම්. බා කරණෙන්, බාහුව කරණකොට ගෙන; සුරු වූයේ; ශූර වූයේ; බාසුරු, බාසුරු නම්; කෙසර, කෙශර (= සිංහ) යි. කැසින්, කවඡයෙන් (= මුඛසම්පුටයෙන්); බොනුයේ, පානය කරන තැනැත්තේ; කැසුබු, කැසුබු නම්. දියෙන්, දධියෙන්; හැනූ, උපසික්ත වූ; බත්, භක්තය; දීබත්, දීබත් නම්; කිරින්, ක්ෂීරයෙන්; පිසූ, පචිත වූ; බත්, භක්තය; කිරිබත්, කිරිබත් නම්; මෙඈ, මේ ආදිය; කරණවිබත්සමස්, කරණවිභක්තිසමාස නම් වේ.

වි — **'බමර කරණෙන් උදුලේ'** යනාදි තන්හි විභක්ති ලොප් කරන කලැ **'කරණෙන්'** යන විභක්ත්‍යන්තපදය ම විභක්ති වශයෙන් සලකා ලොප් කළයුතු යි. බොහෝ සෙයින් කරණ විභක්තිප්‍රත්‍යය ප්‍රාණිවාචිශබ්දයන් කෙරෙන් යොදනවිට **'කරණ'** ශබ්දයෙන් පර ව විභක්ති කිරීම උචිත යි. ප්‍රාණ්‍යඞ්ග ශබ්දයන් කෙරෙන් ද, අප්‍රාණිවාචීන් කෙරෙන් ද **කරණශබ්දය**

**බමුණන්ට දියයුතු දන් = බමුණුදන්. සිවුරැ පිණිස පිරිණැමූ පිළි = සිවුරැපිළි. මෙඈ සපදන්විබත්සමස්.** (14)

**සොරැගෙන් බිය = සොරබිය. මිණියෙන් මුතු = මිණිමුතු. රහු කෙරෙන් මුත් = රහුමුත්. මෙඈ අවදිවිබත්සමස්.** (15)

**රජුගේ පිරිස් = රජපිරිස්. බුදුන්ගේ ගුණ = බුදුගුණ. රියගේ හිමි = රියහිමි. සුරනට සතුරැ = සුරසතුරැ. මෙඈ සබඳවිබත්සමස්.** (16)

---

හා යුක්තවත්, වියුක්තවත් විභක්ති යොදනුලැබේ. **'අත්කර ණෙන්'** සී කිව **ද** **'අතින්'** සී කිව **ද** නො වෙනස් අර්ථය වේ. කරණවිභක්ති ලොපයෙන් කරනලද සමාසය හෙයින් **මේ කරණවිභක්තිසමාස** නම්. මතු සම්ප්‍රදානවිභක්ත්‍යාදියෙහිදු **විභක්ති ලොප් වූ කලැ ඒ ඒ විභක්තියගේ වශයෙන් නාමව්‍යව හාරය දතයුතු.**

### සම්ප්‍රදානවිභක්තිසමාසය.

**(14)** **ප**—බමුණන්ට, බ්‍රාහමණයන්ට; දියයුතු, දාතව්‍ය වූ; **දන්**, දානය; බමුණුදන්, බමුණුදන් නම්. සිවුරැ පිණිස, චීවර පිණිස; **පිරිණැමූ**, පරිණාමිත වූ; පිළී, වස්ත්‍ර; සිවුරැපිළී, සිවුරැපිළී නම්. මෙඈ**,** මේ ආදිය; සපදන්විබත්සමස්, සම්ප්‍රදානවිභක්ති සමාස සි.

**වි**—මෙහි **දියයුතු** යනු **ද**, **පිරිණැමූ** යනු **ද** අවශ්‍යයෙන් හැඟෙන හෙයින් අධ්‍යාහෘත වූ වාක්‍යපද සි. හෙ **ද** විභක්ති මෙන් ම ලොප් කටයුතු වේ.

### අවධිවිභක්තිසමාසය.

(16) **ප** සොරැගෙන්, චෞරයාගෙන් (වූ); බිය, භීතිය; සොරබිය, සොරබිය නම්. මිණියෙන්, කොෂයෙන්; මුතු, මුක්ත වූයේ; මිණිමුතු, මිණිමුතු නම්. රහුකෙරෙන්, රාහුග්‍රහයා කෙරෙන්; මුත්, මුක්ත වූයේ; රහුමුත්, රහුමුත් නම්. මෙඈ**,** මේ ආදිය; අවදිවිබත්සමස්, අවධිවිභක්තිසමාස සි.

### සම්බන්ධවිභක්තිසමාසය.

(16) **ප**—රජුගේ, රාජයාගේ; පිරිස්, පර්ෂද් තොමෝ; **රජ පිරිස්, රජපිරිස්** නම්. බුදුන්ගේ**,** සම්‍යක්සම්බුද්ධයන්ගේ; **ගුණ,** ගුණය තෙම; බුදුගුණ, බුදුගුණ නම්. රියගේ, රතියගේ; **හිමි,** **ස්වාමි** තෙම; රියහිමි, රියහිමි නම්. සුරනට, දෙවතාවන්ට; **සතුරැ,** ශත්‍රු තෙම; සුරසතුරැ, සුරසතුරැ නම්. මෙඈ**,** **මේ ආදිය; සබඳවිබත්සමස්, සම්බන්ධවිභක්තිසමාස සි.**

**උරෙහි දා = උරදා. දහම්හි සොඬ = දහම්සොඬ. නෙරළුයේ තෙල් = නැළිතෙල්. නැඹිලියේ තෙල් = නැලිතෙල්. සරාකල්හි සඳ = සරාසඳ. මෙඈ අදරවිබත්සමස්.** (17)

**අතැ වසනුයේ = අතැවැසි. මෙඈහි විබත් නො ලොපා නිපදවනු.** (18)

**ඉති විබත්සමස්.**

---

**විදූවතින් තොර—සියදූවතට සම වත**
**වෙසෙසා සබඳ සද වන—වෙසෙසුන්සමස් එ වියූ.** (19)

---

**ආධාරවිභක්තිසමාසය.**

(17) **ප**—උරෙහි, වක්‍ෂසෙහි; දා, ජාත වූයේ; උරදා, උරදා නම්. දහම්හි, ධර්මයෙහි; සොඬ, ශෞණ්ඩ වූයේ; දහම්සොඬ, දහම්සොඬ නම්. (ශෞණ්ඩ යනු ලොල් තැනැත්තේ යි.) නෙරළුයේ, නාරිකෙලයෙහි; තෙල්, තෛලය; නැළිතෙල්, නැළිතෙල් නම්; (නෙරළු ශබ්දයහට නැළි යන ආදෙශ යි.) නැඹිලියේ, සන්නිරයෙහි; තෙල්, තෛලය; නැලිතෙල්, නැලිතෙල් නම්. (නැඹිලි ශබ්දයහට නැලි යන ආදෙශ යි.) සරාකල්හි, ශරත්කාලයෙහි; සඳ, චන්‍ද්‍රතෙම; සරාසඳ, සරාසඳ නම්. (කල්හි යනු වාක්‍යලෙසින් ලොප් වේ.) මෙඈ, මේ ආදිය; අදරවිබත්සමස්, ආධාරවිභක්තිසමාස යි.

(18) **ප**—අතැ වසනුයේ, අන්තයෙහි (= සමීපයෙහි) වසන තැනැත්තේ; අතැවැසි, එනම් වේ. මෙඈහි, මේ ආදියෙහි; විබත් නො ලොපා, විභක්තිලොපය නො කොට; නිපදවනු, නිෂ්පාදනය කරනු. (අතැවැසි යනාදි කිසිතැනෙක විභක්ති ලොප් නො කොට ම සමාසසංඥා කටයුතුය යී සේ යි.)

**විභක්තිසමාස නිමි.**

---

(19) **ප**—විදූවතින්, විජාතීය වස්තුයෙන්; තොර, පෘථග්භූත වූ (=වෙන් වූ); සියදූවතට, සවජාතීය වස්තුවට; සම වත, සමාන වූ වස්තුව; වෙසෙසා, විශෙෂණය කොට; සද, ශබ්දය; සබඳවත, සම්බන්ධ වන කල්හි; එ, එය; වෙසෙසුන්සමස්, විශෙෂණසමාස (නමැ යි); වියූ, කිහු.

**භා**—විශෙෂණය ද විශෙෂ්‍යය ද ඔවුනොවුන් සවජාතීය හෙයින් එයින් පිටත් වස්තු විජාතීය නම් වේ. උපුල් ආදි සාමාන්‍යාකාරයෙන් පවත්නා වස්තුවක් රක්තාදි අනික් ප්‍රකාරයෙන් වළකා නීලාදි එක්ප්‍රකාරයෙක්හි පිහිටුවා ද ඒ නීලාදි ප්‍රකාරය විශෙෂණ නම් වෙයි. ශ්වෙතරක්තාදි අනෙක ප්‍රකාරයන්ට සාමාන්‍ය වූ උපුල් ආදි වස්තුව නීලාදි ප්‍රකාරයෙන් අන්‍යප්‍රකාර

නිල් වූයේ ද එ මැ උපුල් වූයේ ද = නිලුපුල්. හෙළිලි වින් ඔ මැ අඹු වින් = හෙළිල්ලඹු. (20)

සිහ එව් සිහ, නර වූයේ ද එ ම සිහ වූයේ ද = නරසී. (21)

ලිය එව් කොමළ = ලියකොමළ. සරා එව් සරා, සරණ මැ සරා = සරණසරා. (22)

---

ශකට යා නා දී වෙන් කරනුලැබේ නු යි උපුල්ශබ්දය විශෙෂ්‍ය නම්. මෙහි විශෙෂ්‍ය වූ උපුල ද එයට විශෙෂණ වූ නිල ද එක ම වස්තුයෙහි පවත්නා හෙයින් සමානාධිකරණ යි. එකිනෙකට සවජාතික යි. උපුලට පියුම් ආදිය විජාතික යි. එහෙයින් පියුම් ආදි විජාතික වස්තුවෙන් පිටත් උපුල් ආදි සවජාතික වස්තුවක් ඔහුගේ විශෙෂණ වූ සුදු රත් ආදි ප්‍රකාරාන්තරයෙන් වලකා සවජාතික වූ නිල් ආදි ප්‍රකාරවාචී සමානාධිකරණශබ්දයක් (ඒ උපුල් ආදි ශබ්දයක් හා) සම්බන්ධවන කල්හි ඒ විශෙෂණසමාස නම් වේ.

(20) ප—නිල් වූයේ ද, නීලවර්ණ වූයේත්; එ මැ, හෙ තෙමේ ම යැ; උපුල් වූයේ ද, උත්පල වූයේත් (හෙ තෙමේ නු යි); නිලුපුල්, නිලුපුල් නම්. හෙළිලි වීත්, ගෞරී ( = එළලු පැහැ ඇත්තී) වීත්; ඔ මැ, ඕ තොමෝ ම ය; අඹු වීත්, අම්බා වීත් (ඕ තොමෝ නු යි); හෙළිල්ලඹු, හෙළිල්ලඹු නම. මේ දෙතැන්හි එකිනෙකට සවජාතීය වූ නිල්, උපුල් යන විශෙෂණ විශෙෂ්‍ය දෙදෙනා ද හෙළිලි, අඹු යන විශෙෂණ විශෙෂ්‍ය දෙදෙනා ද විශෙෂණ පූර්වපද කර්මධාරයසමාස වූයෙන් විශෙෂණසමාස නම් වේ. සිහ එව්, සිංහයකු වැනි නු යි; සිහ, සිහ නම්. මේ උපචාරත්වය දක්වීමෙන් මතු දක්වන සමාසයෙහි සිහශබ්දය සිංහ නම් ලද චණ්ඩමෘගයා කෙරෙහි නො පැවත එවැනි වික්‍රමාතිශය ඇත්තකු කෙරේ වැටෙන බැව් ප්‍රකාශ කරත්.

(21) ප—නර වූයේ ද, මනුෂ්‍ය වූයේත්; එ මැ, හෙ තෙමේ ම ය; සිහ වූයේ ද, සිංහ (සදෘශ) වූයේත් (හෙ තෙමේ) නු යි; නරසී, නරසී නම්.

(22) ප—ලිය එව්, ලතාවක මෙන්; කොමළ, කොමල නු යි; ලියකොමළ, ලියකොමළ නම්. සරා එව්, පද්මයක් වැනි වූයේ, සරා, සරා නම්; සරණ මැ, චරණය මැ; සරා, පද්ම (සදෘශ) වූයේ; සරණසරා, සරණසරා නම්.

වි—මෙහි නරසී, සරණසරා යන දෙතැන උපමානොත්තර පද විශෙෂණසමාස යි. සිහ, සරා යන උපමානයන් විශෙෂණ වුවත් සිංහසරොජසදෘශයන් කෙරෙහි ලාක්ෂණික හෙයින්

**එක ද ඒ මැ විරු ද = එකවිරු, ලෙව්හු දෙදෙනෙක් එක් කොට සලකනලද්හු = දෙලෝ නම්. තෙසරණ, සිවුසයුරු, පස් මහගඟ, සරස, සත්කුලපව්, අටනාකුල, නවදෙර, දසරජදම් ඈ මෙ මැ ගී. (23)**

**ඉති වෙසෙසුන්සමස්.**

---

ඔවුන්ගේ පරතිපාතය සමාස ශාස්ත්‍රයෙහි පාණින්‍යාදීන්ට අභිමත ය. සිංහල ව්‍යාකරණයෙහි ද ඒ එසේ ම බැව් මේ සමාස කරණයෙන් ආචාර්‍ය්‍ය තෙමේ හැඟවී. ලියකොමළ යනු උපමාන පූර්වපද විශෙෂණසමාස යි. එහි ලියශබ්දය තත්සදෘශයා කෙරෙහි ලාක්ෂණික බැව් එව් යන අව්‍යයපදයෙන් ප්‍රකාශ වේ. විග්‍රහවාක්‍ය යෙහි වූ (ඉව යන මාගධ සංස්කෘත අව්‍යයපදයෙන් තද්භව වූ) එව් ශබ්දයාගේ සමාසකාලයෙහි අප්‍රයොගය වේ. එව් යන්නෙන් ප්‍රකාශ කරන උපමානය පූර්වපදත්වයෙන් සිටියි යනු මෙයින් හඟව යි; අන්‍ය වෛයාකරණයන්ට ද මේ මෙසේ ම ඉෂ්ට බැව් "ඝන ඉව ශ්‍යාමඃ = ඝනශ්‍යාමඃ, සමුද්‍ර ඉව ගම්භීරඃ = සමුද්‍ර ගම්භීරඃ, අචල ඉව ස්ථිරඃ = අචලස්ථිරඃ" යනාදීන් දතයුතු.

(23) ප—එක ද, එකසඞ්ඛ්‍යක වූයේත්; ඒ මැ, හෙ තෙමේ ම ය; විරු ද, වීර වූයේත් (හෙ තෙමේ නු යි); එකවිරු, එකවිරු නම්. ලෙව්හු දෙදෙනෙක්, ලෝකයෝ දෙදෙනෙක්; එක්කොට, එකීභූත කොට; සලකනලද්හු, සංලක්ෂණය කරනලද්දහු; දෙලෝ නම්, දෙලෝ නම්. තෙසරණ, ත්‍රිශරණය යන අර්ථයෙහි තෙසරණ යැ; සිවුසයුරු, චතුස්සාගරය යන අර්ථයෙහි සිවුසයුරු ය; පස්මහගඟ, පඤ්චමහානදී යන අර්ථයෙහි පස්මහගඟ යැ; සරස, ෂඩ්රස යන අර්ථයෙහි සරස ය; සත්කුලපව්, සප්තකුලපර්වත යන අර්ථයෙහි සත්කුලපව් ය; අටනාකුල, අෂ්ටනාගකුල යන අර්ථයෙහි අටනාකුල ය; නවදෙර, නවද්වාර යන අර්ථයෙහි නව දෙර ය; දසරජදම් ඈ, දශරාජධර්ම යන අර්ථයෙහි දසරජදම් ය යනාදිය; මෙ මැ ගී, මෙ ම ආකාර ඇත්තේ යි.

වි—දෙලෝ, තෙසරණ යනාදි සඞ්ඛ්‍යාපූර්වපද විශෙෂණ සමාසයෝ සංස්කෘත මාගධ වෛයාකරණයන්ට ද්විගුසමාසනාම යෙන් ඉෂ්ටයහ. ද්විගුසමාසයාගේ නපුංසකලිංගත්වය හා එක වචනත්වය ඒ ව්‍යාකරණයන්හි නියමිත ය. මෙහි වූ කලි එවැනි විශෙෂයක් නො කොට විශෙෂණසමාස නාමයෙන් ම සඞ්ගෘහීත යි.

**විශෙෂණසමාසය නිමි.**

**කියලත අන්අරුත්—පදනත් අනේ වැ සියෝ**
**එසමස් අන්අරුත් නම්—එහි බේ සත්විබතැ වේ. (24)**

**හස් එරුණෙණි යමකට ද එ තෙම = එරුණුහස් නම්, තළා.**
**දමනලද ඉඳුරෝ යමක්හු විසින් ද එ තෙම = දැමිඳුරු නම්, මුනි. (25)**

---

## අන්‍යාර්ථසමාසය.

(24) ප – අනත්, අනන්‍යාර්ථ වූ හෙවත් වෙන්වෙන් අර්ථ ඇති; අනේපද, අනේකපදයන්; සියෝ වැ, සඹගත වැ; අන්අරුත්, (සමස්‍යමාන පදයන් කෙරෙන්) අන්‍ය වූ අර්ථයක්; කියලත, කථනය කරන කල්හි; එසමස්, ඒ සමාසය තෙම; අන්අරුත් නම්, අන්‍යාර්ථ නම්; එහි, ඒ සමාසයෙහි; බේ, භේදය; සත්විබතැ වේ, සප්තවිභක්තියෙහි වේ.

භා—එකිනෙකට වෙනස් අර්ථ ඇති නොයෙක් පදයන් සමාස වශයෙන් එක් ව (සමාසවන පදයන්ගෙන්) පිටත් පදයක්හුගේ අර්ථය ප්‍රකාශ කරන කල්හි ඒ සමාසය අන්‍යාර්ථසමාස නම් වේ. එහි භේදය කර්මවිභක්තිය ආදි කොට ඇති විභක්ති සතෙහි වේ.

(25) ප—හස්, හංසතෙම; එරුණේ, අවතීර්ණ වූයේ; යමකට ද, (කර්ම වූ) යම් ස්ථානයකට ද; එ තෙම, ඒ (කර්මය)තෙම; එරුණුහස් නම්, එරුණුහස් නම් වේ; තළා, තඩාගය යි. මෙහි ක්‍රියාපදය වූ එරුණුශබ්දය ද කර්තෘ වූ හස්ශබ්දය ද එක් ව ඊට කර්ම වූ තළා යන අන්‍යපදාර්ථයක් ප්‍රකාශ කෙරෙති. එහෙයින් සමාසයෙන් අන්‍ය වූ **'තළා'** යන උක්තකර්මය **'එරුණුහස්'** යන මේ සමාසයෙන් වර්ණනා කරනලද පදාර්ථය වේ. තළාශබ්දය විශෙෂ්‍යභාවයෙන් ප්‍රධාන වැ එරුණුහස් ශබ්දය අප්‍රධාන වැ විශෙෂණ වැ සිටි හෙයින් මේ අන්‍යාර්ථසමාස නමැ යි දතයුතු. **කර්මයෙහි අන්‍යාර්ථසමාස යි.**

ප – දමනලද, දමිත වූ; ඉඳුරෝ, ඉන්ද්‍රියයෝ; යමක්හු විසින් ද, යම් (කර්තෘ) කෙනකුන් විසින් ද; එ තෙම, ඒ (කර්තෘ) තෙම; දැමිඳුරු නම්; දැමිඳුරු නම්; මුනි, සර්වඥ තෙමේ යි. මෙහි ක්‍රියාපදය වූ දැමුශබ්දය ද කර්ම වූ ඉඳුරුශබ්දය ද එක් ව ඊට කර්තෘ වූ මුනි යන අන්‍යපදයක් ප්‍රකාශ කෙරෙති. එහෙයින් සමාසයෙන් අන්‍ය වූ 'මුනි' යන උක්ත කර්තෘතෙම දැමිඳුරු යන මේ සමාසයාගේ අර්ථය වේ. මුනිශබ්දය විශෙෂ්‍යත්වයෙන් ප්‍රධාන වැ දැමිඳුරු ශබ්දය ඊට විශෙෂණත්වයෙන් අප්‍රධාන වැ සිටි හෙයින් මෙ ද අන්‍යාර්ථසමාස නම් වේ. **මේ කර්තෘයෙහි අන්‍යාර්ථසමාස යි.** සෙසු කරණ ආදි පස්විබත්හි ද අන්‍යපදයාගේ ප්‍රධානත්වය මෙහි පරිද්දෙන් දතයුතු.

යම්කරණෙන් බත් සුන් එ තෙම = සුන්බත්, අට. යම් කරණෙන් තුරු සුන් එ තෙම = සුන්තුරු, පරසු. දෙනලද වත් යමක්හට එ තෙම = දුන්වත් නම්, බමුණු. ගිළිහුණු ගොනඟුල් යමෙකින් එ තෙම = ගුළුගොනඟුල් නම්, රුක්. සඳවන් වත් සිඟුවලඟ ඇත්නි එනම්. දසබල පස්ඇස් ඇතියේ එනම්. මත් නේ ගජන් ඇතියේ එනම් = රත්. නන් සුරු විරු බලත් ඇතියේ එනම්. එබඳු රණගණ. (26)

---

(26) **ප**—යම්කරණෙන්, යමක් කරණකොටගෙන; බත්, භක්තය තෙම; සුන්, ජීර්ණ ද; එ තෙම, ඒ (කරණය) තෙම; සුන්බත්, සුන්බත් නම්; අට, කලහය යි. යම්කරණෙන්, යමක් කරණකොටගෙන; තුරු, වෘක්ෂය තෙම; සුන්, ජීර්ණ ද; එ තෙම, ඒ (කරණය) තෙම; සුන්තුරු, සුන්තුරු නම්; පරසු, පොරොව යි. **මේ කරණයෙහි අන්‍යාර්ථසමාස** යි.

දෙනලද, දානයකරනලද; වත්, වස්ත්‍ර තෙම; යමක්හට, යම් (සම්ප්‍රදානයක්) හට ද; එ තෙම, ඒ (සම්ප්‍රදානය) තෙම; දුන්වත් නම්, දුන්වත් නම් වේ; බමුණු, බ්‍රාහ්මණ යි. **සම්ප්‍රදානයෙහි අන්‍යාර්ථසමාස** යි.

ගිළිහුණු, ගලිත වූ; ගොනඟුල්, ගොලාඞ්ගූල තෙම ( = වඳුරු තෙම); යමෙකින්, (අපාදාන වූ) යම් තැනෙකින් ද; එතෙම, ඒ (අපාදානය) තෙම; ගුළුගොනඟුල් නම්, ගුළුගොනඟුල් නම් වේ; රුක්, වෘක්ෂය යි. **අපාදානයෙහි අන්‍යාර්ථසමාස** යි.

සඳවන් වත්, චන්ද්‍රයාට බඳු මූහුණ ද; සිඟු වලඟ ඇත්නි, කෘශ වූ මධ්‍යප්‍රදෙශය ද ඇත්තී; එනම්, එකී නම් ඇත්තී වෙයි හෙවත් '**සඳවත්**' නමුදු 'සිඟුවලඟ' නමුදු වෙයි. මෙහි සම්බන්ධ විභක්තිරූප දක්වා වාක්‍ය නො යෙදීම සංක්‍ෂෙපත්වය පිණිස කරනලදි. '**සඳවන් වත් ඇත්නි = සඳවත්**' කියා (**යශබ්ද තශබ්ද** රූප වශයෙන් අන්‍යපදාර්ථය නො පෙන්වා) වාක්‍ය ගතහැකි බැව් ද මෙයින් ප්‍රකාශ කෙරෙත්. **යශබ්දතශබ්ද**රූප හා සමඟ වාක්‍යගන්නා කලැ '**සඳවන්වත් යමකගේ ද ඕ තොමෝ = සඳවත්**; සිඟු වූ වලඟ **යමකගේ ද ඕ තොමෝ** = සිඟුවලඟ' කියා **ෂෂ්ඨීන්** වාක්‍ය යෙදුව මනා වේ.

දසබල, දසයක් බල ඇත්තෝ ද; පස්ඇස් ඇතියේ, පසක් ඇස් ඇත්තෝ ද; එනම්, එකී නම් ඇති වේ; දසබල නමුදු පසැස් නමුදු වෙයි සේයි. දසයක් බල යමක්හුගේ ද එ තෙම දසබල නම්, පසක් ඇස් යමක්හුගේ ද එ තෙම පසැස් නම් යී ද, වාක්‍ය ගතහැකි වේ. **සම්බන්ධයෙහි අන්‍යාර්ථසමාස** යි.

**තරුවැල සහ වූයේ = සහතරුවැල නම්, අඹර. සම උදර ඇතියේ = සොහොවුරු.** (27)

**ලඹසවන් ඇ තගුණ නම්. ඉකුත්සයුරු ඇ අතගුණ නම්.** (28)

---

මත්, මත්ත වූ; නේ, අනේක වූ; ගජන්, හස්තීන්; ඇතියේ, ඇත්තේ; මත්නේගජ, මත්නේගජ නම් වේ; රන්, අරණ්‍යය යි. නන්, නානා (ප්‍රකාර) වූ; සුරු, ශූර වූ; විරු, වීර වූ; බලන්, භටයන්; ඇතියේ, ඇත්තේ; එනම්, එකී නම් වේ හෙවත් නන් සුරුවිරුබල නම් වේ; එබඳු, එසේ වූ; රණහණ, යුද්ධාඞ්ගණය යි.

**භා**—මෙහි **ද** ආධාරවිභක්තිය මුවහ කොට ආධාරාර්ථය හැඟෙනසේ වාක්‍ය ගන්නාලදි. ආධාරය දක්වා වාක්‍ය ගන්නා කලැ '**මත්නේගජහු** යමෙක්හි ද එ තෙම **මත්නේගජ** නම්. **නන් සුරු විරු බලෝ** යමෙක්හි ද එ තෙම **නන්සුරුවිරුබල** නම්'යි වාක්‍ය ගතයුතු.

මෙසේ කර්ම කර්තෘ කරණ සම්ප්‍රදාන අවධි සම්බන්ධ ආධාර යන සප්තවිභක්තියෙහි වූ අන්‍යාර්ථසමාස දක්වා අඞ්ගසූත්‍රසාමර්ථ්‍යයෙන් ප්‍රථමාර්ථයෙහි වන **සහ පූර්වපද අන්‍යාර්ථසමාසය** ද, සමානාර්ථ **සහ** ශබ්ද පූර්ව වූ **ෂෂ්ඨීඅන්‍යාර්ථසමාසය** ද, **තද්ගුණ අතද්ගුණ** ද්විභෙදය ද දක්වන්නෝ '**තරුවැල සහ**' යනාදි කීහු.

(27) **ප**—තරුවැල සහ වූයේ, තාරකාවලිය හා සහිත වූයේ; **සහ**තරුවැල, **සහ**තරුවැල නම්; අඹර, ආකාශය යි; මෙහි '**තරුවැල සහ** වූයේ යමෙක් ද එතෙම=**සහතරුවැල** නම්'යි වාක්‍ය ගත්කලැ ප්‍රථමාර්ථය සුප්‍රකාශ වේ. සම උදර ඇතියේ, සමාන වූ උදරය (= මාතෘකුක්ෂිය) ඇත්තේ; සොහොවුරු, සොහොවුරු නම්. මේ වාක්‍යයෙහි **සම**ශබ්දය **සහ** ශබ්දයාගේ අර්ථයෙහි ය, '**සමඋදර** යමක්හුගේ ද එ තෙම = **සොහොවුරු** නම්'යි වාක්‍ය ගත්කලැ සම්බන්ධාර්ථය සුප්‍රකාශ වේ. '**සහසමානමුදරං යස්‍යසෞ=සොදරඃ**' යන සංස්කෘතශාබ්දිකයන්ගේ වාක්‍ය නයින් මේ දතයුතු.

(28) **ප**—ලඹසවන් ඇ, ලඹසවන් යනාදිය; තගුණ නම්, තද්ගුණ නම් වේ; ඉකුත්සයුරු ඇ, ඉකුත්සයුරු යනාදිය; අතගුණ නම්, අතද්ගුණ නම් වේ.

**වි**—**ලඹසවන්, ඉකුත්සයුරු** යන සමාස පදදෙකින් මේ අන්‍යාර්ථසමාසයාගේ භෙද දෙකක් හැඟවූහ. **තද්ගුණ අතද්ගුණ** වශයෙනි. 'තද්ගුණසංවිඥාන අතද්ගුණසංවිඥාන'යි ද මීට ම සංස්කෘත වෛයාකරණයන්ගේ ව්‍යවහාර යි.

අන්‍යපදාර්ථයහට ගුණ වූ යම් අන්‍යාර්ථසමාසයෙක්හි සමුදය යාගේ අර්ථයෙන් ගුණීහුගේ යුක්ත බව අවබොධ වේ ද, ඒ **'තද්ගුණසංවිඥාන'** නම්; හෙවත් සමාස කරනුලබන පදාර්ථය සමාසයෙන් වාච්‍ය වූ අන්‍යපදයා කෙරෙහි විද්‍යමාන වේ නම් ඒ සමාසය **'තද්ගුණසංවිඥාන'** නම් වෙයි. ඒ මෙසේ ය: **'ලඹසවන්'** යන පදසමුදය ක්ෂත්‍රියාදි කිසිවක්හුගේ ගුණයෙකි. ක්ෂත්‍රියාදි කිසිවෙක් ඒ ගුණය ලබන හෙයින් ගුණී වෙයි. **'ලඹසවන් කැතක්හු ගෙනෙව'**යි කී කල ගුණී වූ කැත්හුගේ ගෙන ඊමෙන් **'ලඹසවන්'** යන ගුණය ද ගෙනෙනු ලැබේ. එහෙයින් සමාස වාච්‍ය වූ ක්ෂත්‍රියයා කෙරෙහි සමස්‍යමාන වූ ලම්බකණ්ණපදාර්ථය විද්‍යමානය යි ප්‍රකාශ වේ. මේ **'තද්ගුණසංවිඥාන'** අන්‍යාර්ථ සමාස යි. **'ඉකුත්සයුරු මිනිසකු ගෙනෙව'**යි කී කල පදසමුදයාර්ථය හෙවත් සමාස කරනලද ගුණය වූ අතික්‍රාන්ත සාගරය නො ගෙනෙනුලැබේ ද, ගුණී වූ මිනිසා පමණක් ම ගෙනෙනු ලැබේ ද, එහෙයින් මේ **'අතද්ගුණසංවිඥාන'** අන්‍යාර්ථසමාසය වේ. මීට උදාහරණ දක්වන පුරාතනාචාර්‍ය්‍යයෝ **'ලම්බකණ්ණ මානය, දෘෂ්ටසාගරමානය'** යනාදිය දක්වූහ. හෙද මෙකියන ලද ප්‍රතිරාජපරිවෙණාධිපතීන්ගේ උදාහරණ හා නො වෙනස් මැයි.

සංස්කෘත මාගධ ශාබ්දිකයෝ මේ අන්‍යාර්ථසමාසයාගේ අතිකුදු ද්විභෙදයක් සලකති: **සමානාධිකරණ, ව්‍යධිකරණ** යන දෙපරිද්දෙනි. එහි සමානාර්ථපදයන්ගේ ගැළපීමෙන් වූ අන්‍යාර්ථ සමාසය සමානාධිකරණ නම්. **'එරුණුහස්'** යනු මෙහි, **එරුණු** ශබ්දයෙන් ද හස්ශබ්දයෙන් ද එක ම හංසාඛ්‍යපක්ෂි තෙමේ කියනු ලැබෙයි හෙවත් එරුණු යනු ද හස් යනු ද එක ම වස්තුවක් ප්‍රකාශ කෙරෙති. එහෙයින් **සමානාධිකරණ** යි. දුම්බුරු යනාදිය ද සමානාධිකරණපද සහිත හෙයින් මෙබඳු ම ය. අසමානාර්ථපදයන්ගේ ගැළපීමෙන් වූ අන්‍යාර්ථසමාසය **ව්‍යධිකරණ** නම් වේ. **විදුරත්, මුසලත්** යනාදිය මෙහි. **"විදුරක් අත්හි සමක්හුගේ ද ඒ තෙම = විදුරත්; මුසලක් අත්හි සමක්හුගේ ද ඒ තෙම=මුසලත්"** යන වාක්‍ය වශයෙන් විදුරත් මුසලත් යනාදිය ද අන්‍යාර්ථසමාසයෙහි අභිමත ය. එතකුදු වුවත් විදුරුශබ්දයෙන් වජ්‍රාඛ්‍ය වූ වස්තුවක් ද අත්ශබ්දයෙන් පාණ්‍යාඛ්‍ය වූ වස්තුවක් ද ප්‍රකාශ වන හෙයින් මේ පදයන්ගේ අසමානාර්ථ බව වේ. මුසලත් යන්නෙහි ද මෙසේ ම ය. එහෙයින් අසමානාර්ථපද සහිත වූ මෙවැනි අන්‍යාර්ථසමාසයෝ ව්‍යධිකරණ නම් වෙත්. මෙකී **සමානාධිකරණය තුල්‍යාධිකරණ** නාමයෙන් ද, **ව්‍යධිකරණය**

**අඟපාමොක් වත—සමුදු මැ හෝ එපදන්**
**දඅරුතැ වූ පදසමාම්—දඅරුත්සමස් නම් වේ. (29)**

---

භින්නාධිකරණ නාමයෙන් ද පර්‍ය්‍යාය වශයෙන් ව්‍යවහාරකරනු ලැබේ. මේ ද්විභේදය ප්‍රතිරාජපරිවෙණස්වාමීන් විසින් ග්‍රන්‍ථලාඝවය සඳහා අවිවක්‍ෂිත නමුදු පාණිනීයාදි සියලු ශාබ්දික යන්ට ම අභිමත හෙයින් මෙහිදු යොග්‍ය වේ. මෙයින් සමානාධිකරණය සියලු තන්හි ම යහපත් වේ. ව්‍යධිකරණය කිසියම් තැනෙක්හි ම යහපත් වේ. ඒ වනාහි "ප්‍රහරණාර්ථෙභ්‍යො නිෂ්ඨාසප්තම්‍යෞ" යනාදි වෛයාකරණවිධානය ඇති කල්හි ම යහපත් වෙයි යනු ආකාරයෙහි ප්‍රකාශිත යි.

**අන්‍යාර්ථසමාස සංඛ්‍යාත බහුව්‍රීහිසමාසය නිමි.**

---

## දකාරාර්ථසමාසය.

**(29) ප—එපදන්, ඒ සමාසපදයන්ගේ; අඟ පාමොක්වත, අවයවයන් ප්‍රමුඛ කල්හි ද; සමුදු මැ හෝ, සමුදය ම ප්‍රමුඛ කල්හි ද; දඅරුතැ වූ, දකාරාර්ථයෙහි වූ; පදසමාම්, පදසමාගමය තෙම; දඅරුත්සමස් නම් වේ, දකාරාර්ථසමාස නම් වේ.**

**භා**—සමාස කරනු ලබන පදයන්ගේ අවයව වූ පදාර්ථයන් වෙන වෙන ම ප්‍රධාන වැ පවත්නා කල්හි ද ඒ අවයවයන් එක් සමූහයක් වශයෙන් බුද්ධියෙන් ප්‍රධානකොට ගත් කල්හි ද දකාරයාගේ (='ද' යන නිපාතයාගේ) අර්ථයෙහි පදයන්ගේ යම් ගැළපීමෙක් වේ නම් එය දකාරාර්ථසමාසය වේ. දකාරාර්ථ සමාසය යන මේ නාමය **'චාර්ථසමාස'** යන සංස්කෘතශාබ්දික ව්‍යවහාරය සලකා **'චත්ථසමාස'** යන මාගධ ශාබ්දික ව්‍යවහාරය වැනි කොට කියන ලද්දේ ය. මීට පාණිනීයාදියෙහි ප්‍රකාශ වූ නාමය **'ද්වන්ද්වසමාස'** යනු යි. මෙය මාගධිකයෝ **'ද්වන්දසමාස'** යයි කියත්. විශෙෂණ විශෙෂ්‍ය සම්බන්ධයක් නැති පදයන් දෙදෙනකුන්ගේ හෝ බොහෝ දෙනකුන්ගේ හෝ ගැළපීම මේ දකාරාර්ථසමාසයෙහි ලැබේ. එහෙයින් බාහුල්‍ය ව්‍යවහාර වශයෙන් චත්ථ යයි කියනලදි. දකාරයෙන් සම්පිණ්ඩනය කිරීම ඇති හෙයින් **'දඅරුත්සමස්'** යනු ද යෙදේ. **චාර්ථ, චත්ථ, ද්වන්ද්ව, ද්වන්ද** යන සතර මීට සංස්කෘත මාගධ ව්‍යාකරණාචාර්‍ය්‍යයන් කී පර්‍ය්‍යාය නාමයෝ ය.

සියලු සමාසවිෂයෙහි ම සාමාන්‍යයෙන් ද්විපදසංඝාතත්වය (= දෙපදයක්හුගේ ගැළපීම) දක්නා ලැබේ. ද්වන්ද්වබහුව්‍රීහි දෙක්හි වනාහි බහුපදසංඝාතත්වය ද (= බොහෝ පදයන්ගේ ගැළපීම ද) දක්නා ලැබේ. මේ විධානය 'අනෙකමන්‍යපදාර්ථෙ' යන පාණිනිසූත්‍රය මුල් කොට භාෂ්‍යාදියෙහි ප්‍රකාශිත යි.

**හිර ද සඳ ද = හිරසඳ. සැරියුත් ද මහමුගලන් ද = සැරියුත් මහමුගලන්. ඇත්හු ද අස්හු ද රිය ද පද ද = ඇත්අස්රියපද. මෙහි අඟපාමොක් තැනැ බුහුබස ද රුසි—බඹසුරනරෝ නමදිත්. සමුදපාමොක් තැනැ එකබස රුසි—ගිනැවුම්. දඅරුත්සමස්.** (30)

**සමස්අදියර පස්වනු.**

---

**දකාරාර්ථසමාසයට උදාහරණ:-**

(30) **ප**—හිර **ද**, සූර්‍ය්‍ය ද; සඳ ද, චන්‍ද්‍ර ද; හිරසඳ, හිරසඳ නම් **වෙත්.** සැරියුත් **ද**, ශාරීපුත්‍ර (ස්ථවිර) ද; මහමුගලන් **ද**, මහාමෞද්ගල්‍යායන (ස්ථවිර) ද; සැරියුත්මහමුගලන්, සැරියුත්මහමුගලන් නම් වෙත්. ඇත්හු ද, හස්තීහු ද; අස්හු ද, අශ්වයෝ **ද**; රිය **ද**, රථ **ද**; පද ද, පදාතීහු **ද**; ඇත්අස්රියපද, ඇත්අස්රියපද නම් වෙත්. මෙහි, මේ සමාසයෙහි; අඟපාමොක් තැනැ, අවයවප්‍රමුඛ වූ ස්ථානයෙහි; බුහුබස **ද**, බහුවචනය **ද**; රුසී, අභිමත යි; බඹසුරනරෝ, බ්‍රහ්මදෙවමනුෂ්‍යයෝ; නමදිත්, නමස්කාර කෙරෙත්. සමුදපාමොක් තැනැ, සමුදාය ප්‍රමුඛ වූ ස්ථානයෙහි; එකබස, එකවචනය; රුසී, අභිමත යි; ගීනැවුම්, ගීතනෘත්‍යය යි. දඅරුත් සමස්, දකාරාර්ථසමාස යි.

**වි**—දකාරයෙන් එක් කොට ගලපනලද හිරශබ්දයාගේ ද සඳශබ්දයාගේ ද සමාසය '**හිරසඳ**' යනු වේ. මෙහි "**කිසලන එකඅරුත සබඳ වැ සඳන් නනරුත්**' යන්නෙන් කියන ලද පරිච්ඡෙදන් සාමාසයෙක්හි වියයුතු ඒකාර්ථ බව ශබ්දද්වයෙහි අර්ථයන්ගේ වශයෙන් නො පැනේ. හිරශබ්දය සඳශබ්දයා හා කිසිසේත් ඒකාර්ථ නො වන හෙයිනි. එසේ ද වුවත් මෙහි ඒකාර්ථ බවක් නැතහොත් කිසිලෙසකිනුත් සමාසසංඥවක් නො වේ. එහෙයින් ඒකාර්ථ වියයුතු ම ය. '**හිරසඳ දිලෙත්**' යනාදින් එක ක්‍රියාවකින් සම්බන්ධත්‍වය පමණෙක් ම දකාරාර්ථ (ද්වන්ද්ව) සමාසයෙහි ඒකාර්ථවත් බව වේ. හිරසඳ දෙදෙනා එක ම ජ්වලනක්‍රියාව කරන හෙයින් මේ ක්‍රියාසම්බන්ධය දෙදෙනාට ම සාධාරණ ය, දෙදෙනා ම ජ්වලනක්‍රියායෙහි එකලෙසින් පවතිත් නු යි ඒකාර්ථ ඇත්තාහු වෙත්. '**සැරියුත්මහමුගලන්**' යනු ද මෙසේ මැ යි. මේ සමාසපද දෙක ම අවයව ප්‍රමුඛ හෙයින් හෙවත් සමාස වූ නාමයන් වෙන වෙන ම ප්‍රධාන වැ පවත්නා හෙයින් බහුවචනාන්ත වේ. **ඉතරෙතරයොගද්වන්ද්වසමාස** යනු බහුවචනාන්තදකාරාර්ථ සමාසයහට සංස්කෘතවෛයාකරණයන්ගේ සංඥ යි. '**ඇත් අස්රියපද**' යන්න සෙනාඞ්ගයන්ගේ සෙනාඞ්ගයන් හා සමග ම

**පාමොක් අත වෙසෙස්—වනනපද වෙසෙසුන් නම්**
**වෙසෙසැ යෙදූ ලිඟුවිබත්—වෙසෙසුන්පෙදේ සම වේ.** (30)

---

සිදු වූ සමාසයක් හෙයින් එකවචනාන්තය යි සලකනු ලැබේ. ප්‍රාණීන්ගේ අවයව හෝ තූර්‍ය්‍යයන්ගේ අවයව හෝ සේනාවගේ අවයව හෝ ප්‍රකාශ කරන ශබ්දයන් සමාසවන කල එකවචනාන්ත වියයුතු බැව් "ද්වන්ද්වශ්ච ප්‍රාණිතූර්‍ය්‍යසේනාඞ්ගානාම්" (2. 4. 2.) යන සූත්‍රයෙන් පාණිනීයයන්ට අභිමත ය. මෙවැනි සමාසපදයන්ගේ සමුදායප්‍රමුඛත්වය හෙවත් සමාසවන නාමයන් එක් සමූහයක් වශයෙන් ප්‍රධාන කොට සැලකීම අභිමත ය. එහෙයින් සමුදායප්‍රමුඛ දකාරාර්ථසමාසය එකවචනාන්ත වේ. මෙවැනි සමාසයට "සමාහාරද්වන්ද්වසමාස" යන නාමය සංස්කෘතවෛයාකරණයන් විසින් කියනු ලැබේ. මෙසේ ඉතරේතරයොග-සමාහාර වශයෙන් ද්විවිධ වූ දකාරාර්ථසමාසය උදාහරණද්වයකින් ස්ඵුට කරන්නාහු බඹසුරනරෝ, ගිනැවුම්, යන උදාහරණ දෙක දැක්වූහ. මෙහි බහුත්වය ද එකත්වය ද පූර්වෝක්තක්‍රමයෙන් දතයුතු.

**පඤ්චම වූ සමාසාධිකාරය යි.**

---

**විශේෂණවිශේෂ්‍යාධිකාරය.**

(1) **ප**—පාමොක්අත, ප්‍රමුඛ වූ අර්ථය; වෙසෙස්, විශේෂ්‍ය නම් (වෙයි); වනනපද, වර්ණනාකරන පදය තෙම; වෙසෙසුන් නම්, විශේෂණ නම් (වෙයි); වෙසෙසැ, විශේෂ්‍යයා කෙරෙහි; යෙදූ, යුක්තකරනලද; ලිඟුවිබත්, ලිඞ්ගවිභක්ති; වෙසෙසුන් පෙදේ, විශේෂණපදයෙහි; සම වේ, සමාන වේ.

**භා**—වක්තෘහුගේ විවක්ෂා වශයෙන් වර්ණනා කටයුතු වූ (තිලාදි) ප්‍රධානාර්ථය '**විශේෂ්‍ය**' නම් වේ. එය වර්ණනා කරනු පිණිස ගන්නා (කෘෂ්ණාදි) අප්‍රධානාර්ථය '**විශේෂණ**' නම් වේ. එයින් විශේෂ්‍යයා කෙරෙහි යොදනලද ලිඞ්ග විභක්ති වචන විශේෂණයා කෙරෙහි ද එලෙස ම යොදන්නේ ය.

**වි**—"**විශේෂ්‍යතෙ ස්වේතරව්‍යාවෘත්තතයා ප්‍රතිපාද්‍යතෙ'නෙනෙති විශේෂණම්**" යනු නිර්වචන හෙයින් මේ කරණකොට වෙසෙසනු ලැබෙයි, තමා කෙරෙන් අන්‍ය වූවන්ගේ වැළැක්වීම් වශයෙන් පිළියෙළ කරනු ලැබේ (= වෙනස් කරනු ලැබේ) නු යි **විශේෂණ** නමි. වාක්‍යයෙක්හි වර්ණනා කරනු කැමැත්තෙන් ප්‍රධාන කොට සලකනලද වස්තුවක් ජාති ය, ද්‍රව්‍ය ය, ගුණ ය, ක්‍රියා ය, නාම ය, සඞ්ඛ්‍යා ය, යන යම් කිසිවකින් අන්‍ය වස්තූන් කෙරෙන් වෙනස් කොට කියනු ලැබේ නම් ඒ වෙනස දක්වන්නා වූ එහෙයින් අප්‍රධාන වූ ජාත්‍යාදිවාචක පදාර්ථයෝ **විශේෂණ** නම් වෙත්. **ව්‍යාවර්ත්තක** ය, **භේදක** ය යනු ද විශේෂණයට ම නමි.

**"විශෙෂ්‍යතෙ භිද්‍යතෙ යත් තවිශෙෂ්‍යම්"** යමෙක් වෙසෙසනු ලැබේ ද-වෙන් කරනු ලැබේ ද හේ විශෙෂ්‍ය නම්. විශෙෂණ විශෙෂ්‍ය දෙදෙනා ඔවුනොවුන්ට විශෙෂණ ද වෙති. විශෙෂ්‍ය ද වෙතැයි ව්‍යාකරණමහාභාෂ්‍යකාර පතඤ්ජලිහු විසින් කියන ලද්දේ ය. **"කෘෂ්ණතිලා ඉති කෘෂ්ණශබ්දෝ'යං තිලශබ්දේනාභිසම්බධ්‍යමානො විශෙෂණවචනඃ සම්පද්‍යතෙ, තථා තිලශබ්දඃ කෘෂ්ණශබ්දේනාභිසම්බධ්‍යමානො විශෙෂණවචනඃ සම්පද්‍යතෙ, තදුභයං විශෙෂණං භවත්‍යුභයඤ්ච විශෙෂ්‍යම්"** යනු භාෂ්‍යොක්ති යි. **"කළුතල"** යි කී කල්හි මේ '**කළු**' ශබ්දය තෙම '**තල**' ශබ්දය හා සම්බන්ධ කරනුලබන්නේ (තලශබ්දයහට) විශෙෂණවචන වැ සිද්ධ වේ. එසේ ම '**තල**' ශබ්දය තෙම '**කළු**' ශබ්දය හා සම්බන්ධ කරනුලබන්නේ (කළු ශබ්දයහට) විශෙෂණවචන වැ සිද්ධ වේ. එහෙයින් දෙක ම විශෙෂණ වෙයි. දෙක ම විශෙෂ්‍ය ද වෙයි. යනු භාව යි. මෙයින් විශෙෂණ විශෙෂ්‍ය දෙදෙනාගේ වෙන් කිරීම කාමචාරයෙන් ( = කියන්නහුගේ කැමැත්ත ලෙස පැවැත් මෙන්) සිද්ධ වියයුතු බව කියනලද්දේ ය. **තල** ශබ්දය ප්‍රධාන කොට කියනු කැමැති විට **කළු**ශබ්දය විශෙෂණ වෙයි. **තල** ශබ්දය විශෙෂ්‍ය වෙයි. **කළු**ශබ්දය ප්‍රධාන කොට කියනු කැමැති කල්හි **තල**ශබ්දය විශෙෂණ වෙයි. **කළු**ශබ්දය විශෙෂ්‍ය වෙයි යනු භාෂ්‍යමතයෙහි තාත්පර්‍ය්‍යාර්ථය වේ. මෙහි **කළු**ශබ්දයාගේ විශෙෂණත්වපක්ෂය සමානාධිකරණ විශෙෂණය වේ හෙවත් එක ම අර්ථයෙහි සමානලිඞ්ගවිභක්තිවචනයෙන් සිටිනා විශෙෂණය වේ. "**කළු** වූ **තල** = **කළුතල**" යි එහි ප්‍රතීතිය ( = අවබොධය) වේ. **කළු**ශබ්දය තෙම කියනලද්දේ කාලවර්ණ වූ බමර කොවුල් ආදි කිසි ද්‍රව්‍යමාත්‍රයක් ප්‍රතිපාදනය කෙරෙයි. තල ශබ්දය හා සම්බන්ධ කරනු ලබන්නේ වනාහි තිලයන් කෙරෙහි ම නියමිත වේ.

මෙ ම කියත් භාෂ්‍යප්‍රදීපයෙහි ශ්‍රීකාය්‍යටාචාර්‍ය්‍යයෝ :—

"කෘෂ්ණශබ්ද උච්චරිතො භ්‍රමරකොකිලාදිද්‍රව්‍යමාත්‍රං ප්‍රතිපාදයති, තිලශබ්දෙන ත්වභිසම්බධ්‍යමානස්තිලෙෂ්වෙව නියම්‍යතෙ; ඉති කෘෂ්ණශබ්දො විශෙෂ්‍යස්තිලශබ්දො විශෙෂණම්" යි මෙහි අර්‍ථ පෙර කී අභිප්‍රාය මැ යි.

### සමානාධිකරණවිශෙෂණඃ:-

මේ කියනලද සාමානාධිකරණවිශෙෂණය ද ජාත්‍යාදිභෙද යෙන් නොයෙක් ප්‍රකාර වේ. හේ මෙසේ යි:—

1 ජාතිප්‍රයුක්ත විශෙෂණය—ක්ෂත්‍රිය ශබ්දාදිය යි.

2 ද්‍රව්‍යප්‍රයුක්ත විශෙෂණය—ධනවත් යනාදිය යි.

**යොදන වෙසෙස් සම වේ—වෙසෙසුනැ ලිඟුවිබත්බස්**
**නො යොදන තබ අනියමෙන්—කිවිකමිහි තොරපතුයේ. (2)**

---

3 ගුණප්‍රයුක්ත විශෙෂණය—කළු යනාදිය යි.
4 ක්‍රියාප්‍රයුක්ත විශෙෂණය—යන්නා වූ යනාදිය යි.
5 සංඥප්‍රයුක්ත විශෙෂණය—දෙව්දත් යනාදිය යි.
6 සඞ්ඛ්‍යාප්‍රයුක්ත විශෙෂණය—එක් යනාදිය යි.

“එක්, දෙව්දත් (නම්), යන්නා වූ, කළු, ධනවත්, ක්‍ෂත්‍රිය පුරුෂයකු දිටිමි” යන මේ වාක්‍යයෙහි ‘පුරුෂයකු’ යන විශෙෂ්‍යයා බලා විශෙෂණ ෂට්කය ම (ප්‍රතිලොම ක්‍රමයෙන්) සමානාධිකරණ වැ යෙදුණු බැව් සැලකියයුතු.

විශෙෂණත්වයෙන් නියමිත වූ ජාත්‍යාදීහු ද ඔවුන්ගේ වෙනස හඟවන විශෙෂණයෙකින් යුක්ත වූ කලැ විශෙෂ්‍යත්වයට පැමිණෙති. මහාක්‍ෂත්‍රියයෙක්, මහාධනවතෙක් යනාදි වශයෙනි.

### භින්නාධිකරණවිශෙෂණ:-

ප්‍රමුඛාර්ථයාගේ හෙවත් විශෙෂ්‍යයාගේ වෙනස හඟවන යම් විශෙෂණයෙක් ඒ ප්‍රමුඛාර්ථපදයට සම නො වන ලිඞ්ගවිභක්ති වචන ඇසුරු කෙරෙමින් අන්‍යවස්තුවාචක වැ අප්‍රධාන වැ සිටී ද හේ **භින්නාධිකරණවිශෙෂණ** නමි. “**රජුන්ගේ සභාව**” යනු මෙති. මෙහි සභාව ප්‍රමුඛාර්ථ වූ විශෙෂ්‍යය යි. එහි වෙනස හඟවන (බ්‍රාහ්මණාදිසම්බන්ධයෙන් වෙන් කරන) “**රජුන්ගේ**” යන්න විශෙෂණ යි එතකුදු වුවත් ප්‍රමුඛ වූ සභාශබ්දයාගේ ලිඞ්ගවිභක්ති විශෙෂණයා කෙරෙහි නො පිහිටි හෙයිනුත්, රාජවාචි වූ ද සමිතිවාචි වූ ද විශෙෂණවිශෙෂ්‍ය පදද්වය එක ම වස්තුවක් අර්ථ කොට නැති හෙයිනුත් මෙහි විශෙෂණය භින්නාධිකරණ වේ. **ව්‍යධිකරණ**, **අසමානාධිකරණ** යනු ද මීට ම පර්‍යායනාම යි.

(2) **ප**—යොදන, (තුල්‍යාධිකරණ කොට) යොජනය කරත් හොත්; වෙසෙසුනැ, විශෙෂණයෙහි; ලිඟුවිබත්බස්, ලිඞ්ගවිභක්ති වචන; වෙසෙස් සම වේ, විශෙෂ්‍යයෙහි (ලිඞ්ගවිභක්තිවචන හා) සමාන වේ. නො යොදන, (තුල්‍යාධිකරණ කොට) යොජනය නො කරත්හොත්; කිවිකම්හි, කවිකර්මයෙහි; තොරපතුයේ, තීරප්‍රාප්ත තැනැත්තේ; අනියමෙන්, අනියමයෙන්; තබ, ස්ථාපනය කරන්නේ ය.

**භා**—විශෙෂණය විශෙෂ්‍යයා හා සමානාධිකරණ වශයෙන් යොදත් හොත් විශෙෂ්‍යයා කෙරෙහි පැනෙන ලිඞ්ගවිභක්තිවචන විශෙෂණයා කෙරෙහි ද සමාන කොට යොදන්නේ ය. වක්තෘ තෙම එසේ යොදන්ට

**නමවී මුනිඳුතුමා—තුමා සිරින් පබසරා**
**සරාසිසිකල්දසනා—සනාරෙසෙනදහු දියේ.** (3)

**ඉති වෙසෙසුන්වෙසෙස් සමලිඟුවිබත්බස්පියෝ.**

**නමවී පිරිසිඳ සැබ—වියුඅනාවත්මන්**
**පදඅතුනෙකකොණේ දත්—පවරමුනිරජහු සරණ.** (4)

**ඉති අනියමින් තුබූ වෙසෙසුන්පියෝ.**

---

නො කැමැත්තේ 'වී නම් හෙවත් භින්නාධිකරණ වශයෙන් යොදනු කැමැත්තේ වී නම් විශෙෂණයෙහි ලිඞ්ගවිභක්තිවචන අනියමයෙන් තබත්තේ ය-අසමාන කොට යොදත්තේය යි සේයි.

### සමානාධිකරණවිශෙෂණයට උදාහරණ:—

(3) ප—තුමා සිරින්, තමාගේ (දෙහ)ශ්‍රියෙන්; පබසරා, ප්‍රභාස්වර වූ; සරාසිසිකල්දසනා—සරාසිසි, ශරච්චන්ද්‍රයා සෙයින්; කල්දසනා, කල්‍යාණදශන ඇති; දියේ, ජගත්හි (= ලෝවැස්සා කෙරෙහි); සනාරෙසෙන්, සෙනහ නමැති රසයෙන්; අදහු, ආර්ද්‍ර වූ; මුනිඳුතුමා, මුනීන්ද්‍රාත්ත්මයා; නමවී, නමස්කාර කරවී.

වි—මෙහි 'නමවී' යන කර්තෘකාරක ක්‍රියාපදයට 'මුනිඳුතුමා' යනු අනුක්තකර්ම වැ සිටියේ ය. විශෙෂ්‍ය වූ මේ කර්මපදය පුම්ලිඟු කම්විබත් එකබස ය. මීට විශෙෂණ වැ සිටි "**පබසරා, සරාසිසි කල්දසනා, අදහු**" යන පදත්‍රය ද පුම්ලිඟුකම්විබත් එකබසින් යෙදූ හෙයින් සමානාධිකරණවිශෙෂණ වේ. ඉතිරිය මීට උදාහරණ නො වූ භින්නාධිකරණපද යි. එහි '**තුමා**' යන සබඳ විබත් එකබස '**සිරින්**' යන කරණකාරකයට භින්නාධිකරණ විශෙෂණ වේ. සිරින් යනු එයට විශෙෂ්‍ය යි. නැවත '**සිරින්**' යනු '**පබසරා**' යන්නට භින්නාධිකරණ විශෙෂණ වේ. '**දියේ**' යන ආධාරකාරකය '**සනාරෙසෙන්**' යන කරණයට භින්නාධි කරණ විශෙෂණ ය. '**සනාරෙසෙන්**' යන කරණකාරකය '**අදහු**' යන්නට භින්නාධිකරණ විශෙෂණ යි.

වෙසෙසුන් වෙසෙස්, විශෙෂණවිශෙෂ්‍යයන්හි; සමලිඟුවිබත් බස් පියෝ, සමානලිඞ්ග සමානවිභක්ති සමානවචනයන්ගේ ප්‍රයොගය; ඉති, මෙසේ යි.

### භින්නාධිකරණවිශෙෂණයට උදාහරණ:—

(4) ප—අයුඅනාවත්මන්, අතීත අනාගත වර්තමාන යන කාලත්‍රයෙහි වූ; පදඅතුන්, පදාර්ථයන්; සැබවින්, ස්වභාවයෙන්; හෙවත් තත්වූපරිද්දෙන්; පිරිසිඳ, පරිච්ඡින්නකොට; එකකොණේ

**වෙසෙසුන්වෙසෙස්විදි—කිවිකමසරින් වනුයේ**
**අරුත්විසතනවරෙහි—වෙසෙසුනැ යොදු වූ දු. (5)**

**තෙලෙ යන මහවැහැප් රුවන් නම්. සඳනම් හෙළිල්ලඹු එන්නි. ඉති කමසරින් වෙසෙසුන් වෙසෙස් විනිස. (6)**

**වෙසෙසුන්වෙසෙස්අදියර සවනු.**

---

එකක්ෂණයෙහි; දත්, ජානනය කළා වූ; පවරමුනිරජහු, ප්‍රවර වූ මුනීන්ද්‍රයාගේ; සරණ, චරණය; නමවි, නමස්කාර කරවි.

අනියමෙන් තුබූ, අනියමයෙන් ස්ථාපිත වූ; වෙසෙසුන්පියෝ, විශෙෂණප්‍රයොග; ඉති, මෙසේ යි.

**වි**—මෙහි කවෙහි '**නමවි**' යන කත්‍රීකාරකක්‍රියාවට අනුකත කම් වැ සිටි '**සරණ**' යන කම්විබත් එකබසට සමාන වැ යෙදුණු විශෙෂණපද එකකුත් මෙහි නො පැනේ. එසේ ද වුවත් "**චරණය කවරකහුගේ ද**" යන විශෙෂාපෙක්ෂායෙහිදී '**මුනිරජහු**' යන ෂෂ්ඨ්‍යන්තපදය අන්‍යවිභක්තියකින් සිට සෙසු දෙව්මිනිසුන් ගෙන් වෙන් කොට චරණයාගේ විශෙෂය ප්‍රකාශ කෙරේ. එහෙයින් එම ෂෂ්ඨ්‍යන්තපදය භින්නාධිකරණ නමුදු විශෙෂණ නමුදු වේ.

**කාමචාරවිශෙෂණවිශෙෂ්‍ය විනිශචය:-**

(5) **ප**—වෙසෙසුන්වෙසෙස්විදි, විශෙෂණවිශෙෂ්‍යවිධි තෙම; කිවිකමසරින්, කවිහුගේ කාමචාරයෙන්; වනුයේ, වන්නේ ය; අරුත්වියකත වරෙහි, අර්ථව්‍යාඛ්‍යාන කාලයෙහි; වෙසෙසුනැ, විශෙෂණයෙහි; වූදු, වූ යන ධාතුව; යොදු, යුක්ත කරවි.

**වි**—විශෙෂණවිශෙෂ්‍යවිධිය යනු පද දෙදෙනකුන්ගෙන් එකක් අප්‍රධාන කොට ද එකක් ප්‍රධාන කොට ද යෙදීම වේ එහෙයින් එසේ ප්‍රධානාප්‍රධානත්වයෙන් පදයන් පූර්වපර කොට යෙදීම ඒ යොදන්නා වූ කිවිහුගේ කාමචාරයෙන් ( = කැමැත්ත පරිද්දෙන්) වන්නේ ය. අර්ථ කියන කල්හි විශෙෂණවිශෙෂ්‍ය දෙක හැඳින තුල්‍යාධිකරණවිශෙෂණයාගේ අන්තයෙහි 'වූ' යන ධාතුව හෙවත් 'වූ' ශබ්දය යෙදිය යුතු යි. එයින් විශෙෂණය සුප්‍රකාශවන හෙයිනි.

(6) **ප**—තෙලෙ, දෘශ්‍යමාන දූරස්ථානයෙහි; යන, ගමනය කරන්නා වූ; මහවැහැප්, මහාවෘෂභතෙම; රුවන් නම්, රත්න නමැත්තේ ය; නොහොත්-මහවැහැප්, මහාවෘෂභ වූ; රුවන් නම්, රත්න නමැත්තේ ය. සඳනම්, චන්ද්‍රානම් වූ; හෙළිල්ලඹු, ගෞරාඞ්ගනා තොමෝ; නොහොත්-හෙළිල්ලඹු, ගෞරාඞ්ගනා වූ;

**ඇති සිටි ගිලි රෙදුම්—නිදි රැඳි බිය වැසි සිනා**
**තුටු හැඬි තිනුම් පැකුළුම්—දිවි ඈ ද කම්විමුත්. (1)**

---

සඳනම්, චන්‍ද්‍රා නමැත්තී; එන්නී, ආගමනය කරන්නී ය. කාම සරින්, කාමචාරයෙන් (වූ); වෙසෙසුන්වෙසෙස්විනිස, විශෙෂණ විශෙෂ්‍යවිනිශ්චය; ඉති, මෙසේ යි.

වි—'තෙලෙ' යනාදි වාක්‍යයෙහි මහවැහැප් ශබ්දය රුවන් නම් ශබ්දය යන දෙකින් කැමැති පදයක් විශෙෂ්‍ය වියහැකි ය. එයින් ඉතිරිපදය විශෙෂණ වේ. 'ඝන' යනු ඒ විශෙෂ්‍ය වූ කවරක්හට නමුත් විශෙෂණ වේ. තෙලෙ යනු ආධාර යි. 'සඳනම්' යනාදි වාක්‍යයෙහි ද "සඳනම්, හෙළිල්ලඹු" යන දෙකින් කැමැති පදයක් විශෙෂ්‍ය කොට ඉතිරිපදය විශෙෂණ කළහැකි වේ. එයින් කවරක් විශෙෂ්‍ය වුවත් 'එන්නී' යනු ඊට විශෙෂණ වේ.

**කාමචාරවිශෙෂණවිශෙෂ්‍යවිනිශ්චය යි.**

---

**ෂෂ්ඨ වූ විශෙෂණවිශෙෂ්‍යාධිකාරය නිමි.**

---

## ක්‍රියාධිකාරය.

ඉක්බිති ක්‍රියාධිකාරය ආරම්භකරන්නාහු ක්‍රියාපදයන් ධාතුමය හෙයින් ඒ ධාතුන්ගේ අකර්මකසකර්මකභෙදය සංක්‍ෂෙප යෙන් දක්වනු සඳහා "ඇති සිටි ගිලි" යනාදිය කීහු.

(1) ප—ඇති, අසත්‍යාර්ථධාතු ය; සිටි, ස්ථානාර්ථධාතු ය; ගිලි, ගලනාර්ථධාතු ය; රෙදුම්, රුජාර්ථධාතු ය; නිදි, නිද්‍රාර්ථධාතු ය; රැඳි, රඤ්ජනාර්ථධාතු ය; බිය, භීත්‍යර්ථධාතු ය; වැසි, වර්ෂණාර්ථ ධාතු ය; සිනා, හාස්‍යාර්ථධාතු ය; තුටු, තුෂ්ට්‍යර්ථධාතු ය; හැඬි, ශබ්දාර්ථධාතු ය; තිනුම්, කම්පාර්ථධාතු ය; පැකුළුම්, ප්‍රස්ඛලනාර්ථ ධාතු ය; දිවි, ප්‍රාණධාරණාර්ථධාතු ය යන; ඈ ද, මේ ආදි ධාතු, කම්විමුත්, කර්මවිමුක්ත වේ; හෙවත් අකර්මක වේ.

භා—වීම ය, සිටීම ය, (ජලාදිගෙහි) ගැලීම ය, රිදීම ය, නිදීම ය, රැඳීම ය, බියවීම ය, (වැසි) වැසීම ය, සිනාසීම ය, සතුටුවීම ය, හැඬීම ය, කම්පාවීම ය, පැකිලීම ය, ජීවත්වීම ය යනා මේ ආදි කර්මාපෙක්‍ෂක නො වන ධාතු සියල්ල ම අකර්මකධාතු නමි.

වි—යම් ධාතුවකින් කර්තෘකාරක ක්‍රියාවක් යෙදූ කල්හි කර්ම යෙක් වුවමනා නො වේ නම් ඒ ධාතුව අකර්මක නමි. 'නිදයි' යනු නිදිධාතුවෙන් සිදු වූ කර්තෘකාරක ක්‍රියාවකි. මේ ක්‍රියායෙන් නිදන්නා වූ බාලවෘද්ධාදි යම්කිසි කර්තෘකාරකයෙක් උක්ත වේ,

දිස් ලබ සිඳි දැනුම් —යා රක් වද බඳ බොජුන්
කර පිසිසි වැඟි හර දා—නම් ඈ දා සකම් නම්. (2)

දාපද අකම්වන—කතුහව්පියෝ වනුයේ
කතුකම් යි සව්පියෝ—සහකම්ගෙණෙහි වනුයේ. (3)

---

ආධාරාදියක් මුත් (ඒ ක්‍රියාව හා යුක්ත වන) කර්මයෙක් වාච්‍ය නො වේ. එහෙයින් නිදිධාතුව අකර්මක යි. සෙස්සෙහි ද මේ නයින් අකර්මකත්වය සලකනු.

(2) **ප**—**දිස්**, දශිතාර්ථධාතු ය; **ලබ**, ලාභාර්ථධාතු ය; **සිඳි**, ඡේදනාර්ථධාතු ය; **දැනුම්**, ජානනාර්ථධාතු ය; **යා**, ගමනාර්ථ ධාතු ය; **රක්**, රක්‍ෂණාර්ථධාතු ය; **වද**, වචනාර්ථධාතු ය; **බඳ**, බන්ධනාර්ථධාතු ය; **බොජුන්**, භොජනාර්ථධාතු ය; **කර**, කරණාර්ථ ධාතු ය; **පිසි**, පචනාර්ථධාතු ය; **ඉසි**, ඉච්ඡාර්ථධාතු ය; **වැඟි**, වහනාර්ථධාතු ය; **හර**, හරණාර්ථධාතු ය; **දා**, දානාර්ථධාතු ය; **නම්**, නමනාර්ථධාතු ය යන; **ඈ දා**, මේ ආදි ධාතු; **සකම් නම්**, සකර්මක නම් වේ.

**භා**—දැකීම ය, ලැබීම ය, සිඳීම ය, දැනීම ය, යාම ය, රැකීම ය, කීම ය, බැඳීම ය, (ආහාර) වැළඳීම ය, කිරීම ය, පිසීම ය, කැමැතිවීම ය, එළවීම ය, ගැනීම ය, දීම ය, නැමීම ය යනාදි අර්ථ ඇති ධාතු සියල්ල ම කර්මයක් අපෙක්‍ෂාකරනසුලු හෙයින් සකර්මකධාතු නම්.

**වි**—යම් ධාතුවකින් කර්තෘකාරක ක්‍රියාපදයක් යෙදූ කල්හි කර්මයෙක් වුවමනා වේ නම් ඒ ධාතුව සකර්මක නම්. '**පිසයි**' යනු පිසධාතුවෙන් සිදු වූ කර්තෘකාරකක්‍රියාපදයෙකි. මේ ක්‍රියායෙන් පිසන්නා වූ අරක්කැමි ආදි යම්කිසි කර්තෘකාරකයෙක් උක්ත වේ. එවිට '**අරක්කැමි තෙම පිසයි**' යනු සිද්ධ වේ. ඉක්බිති කුමක් පිසා දැයි කර්මාපෙක්‍ෂාව හටගත් කල්හි '**ආහාරය**' යනාදි ක්‍රියාව හා යුක්ත වන කර්මපදාර්ථයෙක් වාච්‍ය වේ. එහෙයින් '**පිස**' ධාතුව සකර්මක වේ. සෙස්සෙහි ද මේ නයින් සකර්මකත්වය සලකනු.

(3) **ප**—**දාපද**, ධාතුපදය; **අකම්වන**, අකර්මක වූ කල්හි; **කතු හව්පියෝ**, කර්තෘභාවප්‍රයොග; **වනුයේ**, වන්නේ ය; **කතුකම් යි**, කර්තෘ ය කර්ම ය යන; **සව්පියෝ**, සකලප්‍රයොග; **සහකම්ගෙණෙහි**, සකර්මකධාතුගණයෙහි; **වනුයේ**, වන්නේ යි.

**භා**—ධාතුව අකර්මක වී නම් එයින් කර්තෘකාරකක්‍රියා ද භාවකාරක ක්‍රියා ද යන ක්‍රියා දෙකොටස සිද්ධ වේ. සකර්මකධාතුවෙන් කර්තෘකාරක කර්මකාරක ක්‍රියා සියල්ල ම සිද්ධ වේ.

**අන්තමසඳන්බඳ—කිරිය දනු තෙකලේහි**
**නිමියේ අසු නො නිමියේ - වත්මන් නො පැවියේ අනා. (4)**

---

**වි**—සකර්මකධාතුවෙන් භාවයෙහි ක්‍රියා සිද්ධවිය නො හැකි වුවත් කර්මය නො කියවි කල්හි සකර්මකධාතුවෙන් ද භාවක්‍රියා සිද්ධකිරීම වෛයාකරණයන්ට අභිමත වේ, "**අරක්කැමියු විසින් ගෙහි පිසීම ය**" යනු උදාහරණ යි

කියනලදමැ යි ආචාර්ය්‍ය භර්තෘහරිහු විසින් :—

"ධාතොරර්ථාන්තරෙ වෘත්තෙර්ධාත්වර්ථෙනොපසඞ්ග්‍රහාත්
ප්‍රසිද්ධෙරවිවක්ෂාතඃ කර්මණො'කර්මිකා ක්‍රියා" යි.

ධාතොඃ, ධාතුහු; අර්ථාන්තරෙ, (ස්වජාතීය භින්න වූ) අර්ථාන්තරයෙක්හි; වෘත්තෙඃ, පැවැත්ම හෙතුකොට ද; ධාත්වර්ථෙන, ධාත්වර්ථය විසින්; උපසඞ්ග්‍රහාත්, (කර්මය තමා කෙරෙහි) ඇතුළත් කොට ගැන් ම හෙතුකොට ද; ප්‍රසිද්ධෙඃ, (අකර්මකත්වයෙන් ශාස්ත්‍රයෙහි) ප්‍රසිද්ධිය හෙතුකොට ද; කර්මණඃ අවිවක්ෂාතඃ, (විද්‍යමාන වූත්) කර්මයාගේ නො කියවි වීම හෙතුකොට ද; අකර්මිකා ක්‍රියා, කර්ම රහිත වූ ක්‍රියාව (වේ).

මෙහි කී අකර්මකහෙතු චතුෂ්ටයෙන් ප්‍රථමහෙතුව එක ම ධාතුව සකර්මක අකර්මක අර්ථ දෙකක් ප්‍රකාශකරන කල්හි එක් අර්ථපක්ෂයෙක්හි අකර්මක වන්නා වූ 'ඤා' ධාත්වාදීන් සඳහා කියන ලද්දේ ය. ද්විතීය හෙතුව කර්මය ද ධාත්වර්ථය තුළ සංග්‍රහවන්නා වූ "**ජීව-ප්‍රාණධාරණෙ**" (= දිවි-පණදැරීමෙහි) යනාදි ධාතූන් සඳහා ය. තෘතීය හෙතුව :-

"සත්තාලජ්ජාස්ථිතිජාගරණං වෘද්ධික්ෂයභයජීවිතමරණම්,
ශයනක්‍රීඩාරුචිදීප්ත්‍යර්ථං ධාතුගණන්තමකර්මකමාහුඃ"

යනාදීන් අකර්මකත්වයෙන් ප්‍රසිද්ධ වූ ධාතූන් සඳහා ය; චතුර්ථ හෙතුව සකර්මකයන්ගේ කර්මස්වරූප ඵලය නො සලකා භාවකාරකක්‍රියාසාධනය සඳහා යි.

(4) **ප** - අන්තමසඳන්බඳ, අන්‍යශබ්ද තශබ්ද මශබ්දයන් හා බද්ධ වූ; තෙකලේහි, කාලත්‍රයෙහි වූ; කිරිය, ක්‍රියාව; දනු, ජානනය කරව; නිමියේ, නිෂ්ඨා වූයේ; අසු, අතීත නම් වේ; නො නිමියේ, නිෂ්ඨා නො වූයේ; වත්මන්, වර්තමාන නම්; නො පැවියේ, ආරබ්ධ නුවූයේ; අනා, අනාගත නම් වේ.

**වි**—තශබ්ද මශබ්ද දෙකින් පිටත් සියලු ශබ්ද මෙහි අන්‍ය ශබ්ද නම් වේ. අන්‍යශබ්ද ද, තශබ්දය ද, මශබ්දය ද යන කාරක ශබ්දත්‍රය සමග බැඳුණා වූ කාලත්‍රයෙහි ක්‍රියා මේ අධිකාරයෙන්

**ඒ ඉ ඊ උ ද අයු—වත්මන් ඉ ඔ ඒ ආ**
**නේ යුත් අන් එනොන් නේ—අන්කරු එකතැනායේ.** (5)

**හහුයුතු වියුතු ඌ—බුහුබසැ ඔ උ උන් හා**
**යළ අතිතෙතොත් අන්නෝ—අන්නාහු නාහු ද වෙත්.** (6)

---

දතයුතු වේ. අන්‍යශබ්දකාරකය ප්‍රථමපුරුෂ යයි ද, තශබ්ද කාරකය මධ්‍යමපුරුෂ යයි ද, මශබ්දකාරකය උත්තමපුරුෂ යයි ද පාණිනීයාදීන්ට අභිමත ය. ප්‍රතිරාජපරිවෙණස්වාමීහු වනාහි ග්‍රන්ථලාඝවය සඳහා පුරුෂසංඥා නො කොට ඒ සංඥාවන්ට උපලක්ෂණ වූ ශබ්දයන්ගේ ආධාරයෙන් ම පුරුෂත්‍රය දක්වූහ. කාලත්‍රය විභාගයෙහි කාලය යනු අතීත වර්තමාන අනාගත ක්‍රියාවෝ ම ය. එහෙයින් ක්‍රියාලක්ෂණයෙන් කාලය දතයුත්තේ ය. ක්‍රියාව නිමවී නම් ඒ අතීතකාලය වේ. ක්‍රියාව පටන් ගන්නාලදු ව නිම නො ව පවතී නම් ඒ වර්තමාන කාලය වේ. ක්‍රියාව පටන් නො ගන්නා ලද්දී නම් ඒ අනාගතකාලය වේ. සන්අදියරෙහි දක් වූ "දිනී වැජඹෙයි දෙන්නෙමි" යන ක්‍රියා පද තුන මෙකී කාලත්‍රයට ද, කාරකත්‍රයට ද ක්‍රමයෙන් උදාහරණ ය යි සැලකියයුතු.

ඉක්බිති කාලකාරකයන්ට ක්‍රමයෙන් එකවචන බහුවචන ප්‍රත්‍යයවිධානය කරන්නාහු "ඒ ඉ ඊ උ ද" යනාදි වූ ද, "හහුයුතු වියුතු" යනාදි වූ ද උපාඛගසූත්‍ර දෙක දක්වූහ.

(5) **ප**—අන්කරු එකතැ, අන්‍යකාරක එකවචනයෙහි; අයු, අතීතකාලයෙහි; ඒ ඉ ඊ උ ද, ඒ ඉ ඊ උ යන ප්‍රත්‍යය චතුෂ්ටය ද; වත්මන්, වර්තමාන කාලයෙහි; ඉ ඔ ඒ ආ, ඉ ඔ ඒ ආ යන ප්‍රත්‍යය චතුෂ්ටය ද; අනායේ, අනාගත කාලයෙහි; නේයුත්, නේයන්නකින් යුක්ත වූ; අන් එනොන්, අන් එන් ඔන් යනු හා හෙවත් අන්නේ එන්නේ ඔන්නේ යන ප්‍රත්‍යයත්‍රය හා; නේ, නේප්‍රත්‍යය ද (වෙත්.)

(6) **ප**—බුහුබසැ, (අන්‍යකාරක අතීත) බහුවචනයෙහි; හහුයුතු වියුතු, හයනු හුයනු යුක්ත වූත් වියුක්ත වූත්; ඌ, ඌප්‍රත්‍යය ද; හෙවත් ඌහ ඌහු ඌ යන ප්‍රත්‍යය ද; ඔඋඋන් හා, ඔ උ උන් යන ප්‍රත්‍යය ද (වෙත්); යළ, නැවත (වර්තමාන බහුවචනයෙහි); අතිතෙතොත්, අත් ඉත් එත් ඔත් යන ප්‍රත්‍යය ද; (අනාගත බහුවචනයෙහි); අන්නෝ, අන්නෝ ප්‍රත්‍යය ද; අන්නාහු, අන්නාහු ප්‍රත්‍යය ද; නාහු ද වෙත්, නාහුප්‍රත්‍යය ද (යන මොහු) වෙත්.

**ඒ, දිවකුරුමුනි යමාඉදුහ කෙළේ. (7)**
**ඉ, සව්ලෝද එ නරඹා තිටි. (8)**
**ඊ, මහදෙනේ කෙලෙසුන් වැනහී. (9)**
**උ, එතැනැ බුදුසිරිසයුරෝරේ කුමුවු. (10)**

**ඉති අන්කරුහි එකරුනැ අයුපස.**

---

**වි**—මෙහි සූත්‍රද්වයෙන් අන්‍යකාරකය සම්බන්ධි වූ කාලත්‍රයෙහි ම එකවචන බහුවචන විභක්තිරූප දක්වනලද්දේ ය. ඒ මෙසේ යි :—

අන්‍යකාරකයෙහි :—

| | | | |
|---|---|---|---|
| අතීත | එකවචන | ඒ, ඉ, ඊ, උ | 4 |
| ,, | බහුවචන | උහ, උහු, උ, හි, උ, උන් | 6 |
| වර්තමාන | එකවචන | ඉ, හි, ඒ, ආ | 4 |
| ,, | බහුවචන | අත්, ඉත්, එත්, ඔත් | 4 |
| අනාගත | එකවචන | අන්නේ, එන්නේ, ඔන්නේ, නේ | 4 |
| ,, | බහුවචන | අන්නෝ, අන්නාහු, නාහු | 3 |

සූත්‍රාගතක්‍රමයෙන් උදාහරණ :—

(7) **ප—ඒ, ඒප්‍රත්‍යය** වේ; දිවකුරුමුනි, දීපඞ්කර සර්වඥ තෙම; යමාඉදුහ කෙළේ, යමකඍද්ධිය කෙළේ යි.

**වි**—"**කර = කිරීමෙහි**" යන ධාතු '**කර**'යි තබා ඔහු කෙරෙන් පර ව අතීතකාලික අන්‍යකාරක එකවචනාන්ත කතෘකිරියක් කිවමනා කල්හි '**ඒ ඉ ඊ උ ද**' යනාදි උපාඞ්ගසූත්‍රයෙන් **ඒප්‍රත්‍යය** කොට '**කර+ඒ**' කියා සිටි කලැ රකාරයහට අඞ්ගසූත්‍රයෙන් ළකාරාදෙශ හා කකාරස්ථ ස්වරයහට පිළිපෙරැළි එකාරාදෙශ ද කොට පූර්වස්වරලොපසන්ධියෙන් ප්‍රකෘතිප්‍රත්‍යය ගැළපීමෙන් '**කෙළේ**' යන ක්‍රියාපදයාගේ සිද්ධිය වේ.

(8) **ප—ඉ, ඉප්‍රත්‍යය** වේ; සව්ලෝද, සකලලොකධාතු තොමෝ; එ, ඒ (යමකප්‍රාතිහාර්යය); නරඹා, නිරීක්ෂණය කොට; තිටි, තුෂ්ට වූ. '**තුස = තුටුවෙහි**' යන ධාතු '**තුස**'යි තබා පෙර කී සෙයින් **ඉප්‍රත්‍යය** කොට සකාරයහට ටකාරාදෙශ ද, පිළිපෙරැළි ද කිරීමෙන් '**තිටි**' යනු සිද්ධ යි.

(9) **ප—ඊ, ඊප්‍රත්‍යය** වේ; මහදෙනේ, මහාජන තෙමේ; කෙලෙසුන්, කෙලශයන්; වැනහී, විනාශ කෙළේ. විපූර්ව '**නස = නො දිස්මෙහි**' යන ධාතු '**විනස**'යි තබා **ඊප්‍රත්‍යය** කොට '**විනසී**' කියා සිද්ධ වූ පසු, විශබ්දස්ථ **ඉකාරයහට** පිළිපෙරැළි **අකාරාදෙශ** හා අකාරයහට මාත්‍රාංශවෘද්ධි ද, සකාරයහට හකාරාදෙශ ද කළ කල්හි '**වැනහී**' යනු සිද්ධ යි.

ඉ, අප සෑසිහු නවගසසුන් පවති. (11)
ඕ, මුළුලෙව් ඔබ දහමොද බෝ. (12)
ඒ, ඔබ අරිසඟ* තොටුවන් දෙනේ. (13)
ආ, එතුනුරුවන් නියවත් පුදා. (14)
ඉති අන්කරුහි එකරුනැ වත්මන්පස.

---

(10) ප—උ, උප්‍රත්‍යය වේ; එතැනැ, ඒ (යමකප්‍රාතිහාර්‍ය්‍ය) ස්ථානයෙහි; බුදුසිරිසයුරෝරේ, බුද්ධශ්‍රී නමැති සාගරෝදරයෙහි; කුමුවු, නිමග්න වී. 'කුමුදු = ගැලීමෙහි' යන ධාතු 'කුමුදු'යි තබා උප්‍රත්‍යය කොට දකාරයහට වකාරාදෙශ හා පූර්වස්වරලොපසන්ධිය ද කිරීමෙන් 'කුමුවු' යනු සිද්ධ යි.

අන්කරුහි, අන්‍යකාරකයෙහි හෙවත් ප්‍රථමපුරුෂයෙහි; එකරුනැ, එකාර්ථයෙහි; අයුපස, අතීතප්‍රත්‍යය; ඉති, මෙසේ යි.

(11) ප—ඉ, ඉප්‍රත්‍යය වේ; අප සෑසිහු, අප ශාක්‍යසිංහයාගේ; නවගසසුන්, නවාඞ්ගශාසනය තෙම; පවති, ප්‍රවෘත්ත වේ. පපූර්ව 'වත = වැඩුම්හි' යන ධාතු 'පවත' යි තබා ඉප්‍රත්‍යය කොට පූර්වස්වරලොපසන්ධියෙන් 'පවති' යනු සිද්ධ යි.

(12) ප - ඕ, ඕප්‍රත්‍යය වේ; මුළුලෙව්, සකලලොකය තෙම; ඔබ, උන්වහන්සේගේ; දහමොද, ධර්ම නමැති ඕජස හෙවත් ධර්මාමෘතය; බෝ, පානය කෙරේ. 'පා = පීමෙහි' යන ධාතු 'පා' යි තබා ඕප්‍රත්‍යය කොට පකාරයහට බකාරාදෙශ කළ කල්හි පූර්වස්වරලොපසන්ධි විධියෙන් ගැළපීමෙන් 'බෝ' යනු සිද්ධ යි.

(13) ප—ඒ, ඒප්‍රත්‍යය වේ; ඔබ, උන්වහන්සේගේ; අරිසඟ, ආර්‍ය්‍යසඞ්ඝ තෙම; තොටුවන්, තීර්ථකයන්; දෙනේ, ජයගනී. 'දන = දිනීමෙහි' යන ධාතු 'දන'යි තබා ඒප්‍රත්‍යය කොට දකාරස්ථ අකාරයහට පිළිපෙරළි (හ්‍රස්ව) එකාරාදෙශ කළ පසු පූර්වස්වරලොපසන්ධියෙන් 'දෙනේ' යනු සිද්ධ යි.

(14) ප—ආ, ආප්‍රත්‍යය වේ; නියවත්, ප්‍රාඥතෙම; එතුනුරුවන්, ඒ රත්නත්‍රය; පුදා, පූජනය කෙරේ. 'පුද = පිදීමෙහි' යන ධාතු 'පුද'යි තබා ආප්‍රත්‍යය කොට පූර්වස්වරලොපසන්ධිය කිරීමෙන් 'පුදා' යනු සිද්ධ යි.

අන්කරුහි, අන්‍යකාරකයෙහි (=ප්‍රථමපුරුෂයෙහි); එකරුනැ, එකාර්ථයෙහි; වත්මන්පස, වර්තමානප්‍රත්‍යය; ඉති, මෙසේ යි.

---

* 'අරිසහගණ'යිත් පාඨ යි.

අන්නේ, මෙතේදිනිඳු පස්මරුන් දනන්නේ. (15)
එන්නේ, අපවගඅමා දෙන්නේ. (16)
ඔන්නේ, එ මහදෙනෝ බොන්නේ. (17)
නේ, එළලෙලැ පොසොන්වැසි වස්නේ. (18)

ඉති අන්කරුහි එකරුතැ අනාපස.

---

ඌ, රුසිහු මහගත් ගෙතූ, ගෙතූහ, ගෙතූහු. (19)

---

(15) ප—අන්නේ, අන්නේප්‍රත්‍යය වේ; මෙතේදිනිඳු, මෛත්‍රෙය ජිනෙන්ද්‍ර තෙම; පස්මරුන්, පඤ්චමාරයන්; දනන්නේ, ජයගන්නේ ය. 'දන = දිනීමෙහි' යන ධාතු 'දන'යි තබා අන්නේ ප්‍රත්‍යය කොට පූර්වස්වරලොපසන්ධියෙන් 'දනන්නේ' යනු සිද්ධ යි.

(16) ප—එන්නේ, එන්නේප්‍රත්‍යය වේ; අපවගඅමා, අපවර්ග (= නිර්වාණ) නමැති අමෘතය; දෙන්නේ, දානය කරන්නේ ය. 'දා = දීමෙහි' යන ධාතු 'දා'යි තබා එන්නේප්‍රත්‍යය කොට පූර්වස්වර ලොපසන්ධියෙන් 'දෙන්නේ' යනු සිද්ධ යි.

(17) ප—ඔන්නේ, ඔන්නේප්‍රත්‍යය වේ; එ, ඒ (= නිර්වාණා මෘතය); මහදෙනෝ, මහාජන තෙම; බොන්නේ, පානය කරන් නේ ය. 'පා = පීමෙහි' යන ධාතු 'පා' යි තබා ඔන්නේප්‍රත්‍යය කොට පකාරයහට බකාරාදෙශ කොට පූර්වස්වරලොපසන්ධියෙන් 'බොන්නේ' යනු සිද්ධ යි.

(18) ප—නේ, නේප්‍රත්‍යය වේ; එළලෙලැ, ඒ උත්සවයෙහි; පොසොන්වැසි, ප්‍රසූනවර්ෂය (= මල්වැසි); වස්නේ, වර්ෂණය කරන් නේ ය. 'වස = වැසීමෙහි' යන ධාතු 'වස'යි තබා නේප්‍රත්‍යය කොට ධාත්වන්තස්වරලොපයෙන් 'වස්නේ' යනු සිද්ධ යි.

අන්කරුහි, අන්‍යකාරකයෙහි (= ප්‍රථමපුරුෂයෙහි); එක රුතැ, එකාර්ථයෙහි; අනාපස, අනාගතප්‍රත්‍යය, ඉති, මෙසේ යි.

(19) ප—ඌ, ඌප්‍රත්‍යය වේ; රුසිහු, ඍෂිහු; මහගත්, මහා ග්‍රන්ථයන්; ගෙතූ, ග්‍රථනය කළෝ; ගෙතූහ ගෙතූහු, (මෙම අර්ථයෙහි) ගෙතූහ ගෙතූහු (යන රූපද්වය ද වේ). 'ගොත = ගෙතීමෙහි' යන ධාතු 'ගොත'යි තුන්තැනෙක තබා ඌ, ඌහ, ඌහු යන ප්‍රත්‍යය කොට ගකාරස්ථ (හ්‍රස්ව) ඔකාරයහට පිළිපෙරළ (හ්‍රස්ව) එකාරාදෙශ කළ පසු පූර්වස්වරලොපසන්ධි කිරීමෙන් 'ගෙතූ, ගෙතූහ, ගෙතූහු' යනු සිද්ධ යි.

**භාකරෙන් පස නැති ව ද හඟු වේ.**

**ඕ, පඬිහු අරුත් පළ කළෝ, කළහ, කළහු.** (20)

**උ, එ නිසවත්හු උගත්තු, උගත්හ, උගත්හු.** (21)

**උන්, මරසෙන්හු බින්, බින්හ, බින්හු.** (22)

**ඉති අන්කරුහි බහුබසැ අයුපස.**

---

(20) **ප—භාකරෙන්,** (සූත්‍රයෙහි) **භා**ශබ්දයෙන්; **පස නැති ව ද,** ප්‍රත්‍යය රහිත ව ද; **හඟු වේ;** හයනු හුයනු දෙක වේ. **ඕ,** ඕප්‍රත්‍යය වේ; **පඬිහු,** පණ්ඩිතයෝ; **අරුත්,** අර්ථය; **පළ කළෝ,** ප්‍රකාශ කළෝ; **කළහ කළහු,** (මේ අර්ථයෙහි) කළහ කළහු (යන රූප ද වේ).

**වි—භා**ශබ්දයාගේ සාමර්ථ්‍යයෙන් සූත්‍රයෙහි නො කී **හ, හු** යන ප්‍රත්‍යය දෙකෙක් ද මෙහි අභිමත සි. '**කර = කිරීමෙහි**' යන ධාතු '**කර**'යි තබා ඕප්‍රත්‍යය කොට රකාරයහට ළකාරාදෙශ කළ පසු පූර්වස්වරලොපසන්ධියෙන් '**කළෝ**' යනු සිද්ධ සි* කළහ, කළහු, යනු ධාතුරකාරයහට ළකාරාදෙශ කළ පමණින් **හඟු** ප්‍රත්‍යයවත් ව සිද්ධ සි.

(21) **ප—උ,** උප්‍රත්‍යය වේ; **එ,** ඒ (අර්ථය); **නිසවත්හු,** ඥානවත්හු; **උගත්තු,** උද්ග්‍රහණය කළෝ; **උගත්හ උගත්හු,** (මේ අර්ථයෙහි) උගත්හ උගත්හු (යන රූපද්වය ද වේ). **උ**පූර්ව වූ '**ගන් = ගහණෙහි**' යන ධාතු '**ගන්**' යි තබා අඩගසූත්‍රයෙන් නකාරයහට තකාරාදෙශ කොට තකාර උකාර දෙක ද්විරූපසන්ධියෙන් ගැළපූ කල්හි '**උගත්තු**' යනු සිද්ධ සි. **උගත්හ, උගත්හු** යනු නකාරයහට තකාරාදෙශ පමණින් හඟුප්‍රත්‍යයවත් ව සිද්ධ සි.

(22) **ප—උන්, උන්**ප්‍රත්‍යය වේ; **මරසෙන්හු,** මාරසේනාවෝ; **බින්,** භින්න වූහ; **බින්හ බින්හු,** (මේ අර්ථයෙහි) **බින්හ බින්හු** (යන රූපද්වය ද වේ). '**බිඳ = බිඳිමෙහි**' යන ධාතු '**බිඳ**' යි තබා **උන්** විභක්ති කොට ධාත්වන්ත දකාරයහට ලොප් කොට පූර්වස්වරලොපසන්ධිය කිරීමෙන් '**බින්**' යි සිද්ධ සි. **උන්හ, උන්හු** යන ප්‍රත්‍යය කිරීමෙන් සෙසු රූපද්වය ද වේ.

**අන්කරුහි,** අන්‍යකාරකයෙහි (=ප්‍රථමපුරුෂයෙහි); **බහුබසැ,** බහුවචනයෙහි; **අයුපස,** අතීත ප්‍රත්‍යය; **ඉති,** මෙසේ සි.

---

* '**කළෝ**' යනු ම පිළිපෙරළි විදියෙන් '**කොළෝ**' කියාත් සිඩ වේ. '**කෙළේ**' යන්නෙහි පිළිපෙරළිය ඊට නිදසුන සි.

**අන්, වත්වත්හු මුනිගුණ වනන්.** (23)
**ඉන්, ළඇතියෝ එ විඳින්.** (24)
**එන්, දනැතියෝ දන් දෙන්.** (25)
**ඔන්, උඩඟුවෝ මෙර බොන්.** (26)
**යළ යනුවෙන් ඉයුතු ද රුසි.** (27)

**ඉති අන්කරුහි බුහුබසැ වත්මන්පස.**

---

**අන්නෝ, සුසිරි කළහු මෙතේදිනිඳු පුදන්නෝ.** (28)

---

(23) **ප—අන්,** අන්ප්‍රත්‍යය වේ; වත්වත්හු, වක්ත්‍ර, ( = මුව) ඇත්තාහු; මුනිගුණ, බුද්ධගුණය; වනත්, වර්ණනා කෙරෙත්. **'වන් = වැනීමෙහි'** යන ධාතු 'වන්' සී තබා ඔහු කෙරෙන් අන් ප්‍රත්‍යය කොට ස්වරසන්ධිකිරීමෙන් **'වනන්'** යනු සිද්ධ යි.

(24) **ප – ඉන්,** ඉන්ප්‍රත්‍යය වේ; ළඇතියෝ,හෘදයාන්විතයෝ; ( = සිත් ඇත්තෝ); එ, ඒ වර්ණනාව; විඳිත්, විඳනය කෙරෙත්. **'විඳ = විඳීමෙහි'** යන ධාතු 'විඳ' සී තබා **ඉන්**ප්‍රත්‍යය කොට පූර්වස්වරලොපසන්ධියෙන් **'විඳින්'** යනු සිද්ධ යි.

(25) **ප – එන්,** එන්ප්‍රත්‍යය වේ; දනැතියෝ, ධනාන්විතයෝ; දන්, දානවස්තු; දෙත්, දානය කෙරෙත්. **'දා = දීමෙහි'** යන ධාතු **'දා'** සී තබා **එන්**ප්‍රත්‍යය කොට පූර්වස්වරලොපසන්ධියෙන් **'දෙන්'** යනු සිද්ධ යි.

(26) **ප—ඔන්,** ඔන්ප්‍රත්‍යය වේ; උඩඟුවෝ, උද්ධතයෝ තුමූ; මෙර, මෛරෙය ය; බොත්, පානය කෙරෙත්. **'පා = පිමෙහි'** යන ධාතු **'පා'** සී තබා **ඔන්**ප්‍රත්‍යය කොට **ප**කාරයහට බකාරාදෙශ කොට පූර්වස්වරලොප්සන්ධිය කිරීමෙන් **'බොන්'** යනු සිද්ධ යි.

(27) **ප—යළ** යනුවෙන්, (සූත්‍රයෙහි) **යළ**ශබ්දයෙන්; ඉයුතු ද, ඉකාරයුක්ත වූ (පූර්වොක්ත ප්‍රත්‍යය) ද; රුසි, අභිමත යි. **'අන් ඉන් එන් ඔන්'** යන ප්‍රත්‍යය සතරෙන් සූත්‍රයෙහි **යළ**ශබ්දය හෙතු කොටගෙන ඉකාරයුක්ත වූ **'අති ඉති එති ඔති'** යන අතික් ප්‍රත්‍යය සතරක් ද වන බව මෙයින් දක්වූහ. එහෙයින් පෙර සිදු වූ රූප ම **'වනති, විඳිති, දෙති, බොති'** කියා උදාහරණ කටයුතු යි.

අන්කරුහි, අන්‍යකාරකයෙහි (= ප්‍රථමපුරුෂයෙහි); **බුහුබසැ,** බහුවචනයෙහි; **වත්මන්පස,** වර්තමාන ප්‍රත්‍යය; ඉති, මෙසේ යි.

(28) **ප—අන්නෝ,** අන්නෝප්‍රත්‍යය වේ; **සුසිරි කළහු,** සුචරිතය කළාහු; **මෙතේදිනිඳු,** මෛත්‍රෙය ජිනෙන්ද්‍රයන්; **පුදන්නෝ,**

අන්නාහු, එසස්නෙහි පැවිදි වන්නාහු. (29)
නාහු, අනතිරියපා කළහු ඔබ නො දක්නාහු. (30)
දකරෙන් උවියුතු ද වෙ. (31)

ඉති අන්කරුහි බුහුබසැ අනාපස.

---

තසදකරු අරුතැ—මෙම පසැ හිහු සියෝ වෙ
මසබඳැ ඉයුතු උයුතු— වියුතෝයුතු මකර හා. (32)

---

පූජනය කරන්නෝ ය. 'පූද = පිදීමෙහි' යන ධාතු 'පූද' කියා තබා අන්නෝප්‍රත්‍යය කොට පූර්වස්වරලොපසන්ධිය කිරීමෙන් 'පූදන්නෝ' යනු සිද්ධ යි.

(29) **ප**—**අන්නාහු**, අන්නාහුප්‍රත්‍යය වේ; **එසස්නෙහි**, ඒ ශාසනයෙහි; පැවිදිවන්නාහු, ප්‍රව්‍රජිතවන්නාහු ය. 'වූ = වීමෙහි' යන ධාතු 'වූ' යි තබා අන්නාහුප්‍රත්‍යය කොට පූර්වස්වරලොපසන්ධියෙන් 'වන්නාහු'යි සිද්ධ යි.

(30) **ප**—**නාහු**, නාහුප්‍රත්‍යය වේ; අනතිරියපා කළහු, ආනන්තර්‍ය්‍යපාපය කළ තැනැත්තෝ; ඔබ, ඒ(මෛත්‍රෙය සර්වඥයන් වහන්සේ); නොදක්නාහු, දර්ශනය නොකරන්නාහු ය. ප්‍රතිෂෙධවාචී 'නො' යන අව්‍යය පූර්වකොට ඇති 'දස් = දැකුම්හි' යන ධාතු 'නොදස්'යි තබා නාහුප්‍රත්‍යය කොට සකාරයහට අඞ්ගසූත්‍රබලයෙන් කකාරාදෙශ කිරීමෙන් 'නොදක්නාහු' යනු සිද්ධ යි.

(31) **ප**—**ද**කරෙන්, සූත්‍රයෙහි **ද**කාරය හෙතුකොටගෙන; උවියුතු ද වේ, (**අන්නාහු, නාහු** දෙක) **උ**කාර වියුක්ත **ද** වේ. **අන්නාහ, නාහ** යන ප්‍රත්‍යය දෙකක් ද දකාරයාගේ සාමර්ථ්‍යයෙන් ගැනේ. එවිට වන්නාහ, දක්නාහ ක්‍රියා ද පදරූපයන්ගේ සිද්ධිය වේ.

අන්කරුහි, අන්‍යකාරකයෙහි (=ප්‍රථමපුරුෂයෙහි); බුහුබසැ, බහුවචනයෙහි; අනාපස, අනාගත ප්‍රත්‍යය; ඉති, මෙසේ යි.

(32) **ප**—තසදකරුඅරුතැ, තශබ්දකාරකාර්ථයෙහි; හෙවත් මධ්‍යමපුරුෂයෙහි; මෙම පසැ, මෙකී ප්‍රත්‍යයෙහි ම; හිහුසියෝ වේ, හියනු හුයනු සඞ්ගත වේ; මසබඳැ, මශබ්දකාරකයෙහි (=උත්තමපුරුෂයෙහි); ඉයුතු, ඉකාරයුක්ත වූත්; උයුතු, උකාරයුක්ත වූත්; වියුතු, (ඉකාර උකාර දෙකින්) වියුක්ත වූත්; ඕයුතු, ඕකාරයුක්ත වූත්; මකර හා, මකාරයෙක් ද (වේ).

**වි–තශබ්දකාරකයෙහි පළමු අන්‍යකාරකයට කී ප්‍රත්‍යය ම එක වචනයෙහි හියන්නක් අන්තකොට ද බහුවචනයෙහි හුයන්නක් අන්තකොට ද කාලත්‍රයෙහි දතයුත්තේ ය. මශබ්දකාරකයෙහි**

තෝ, තෙප්, පෙර සුසිරි කෙළෙහි, කළහු. දැන් රජ කෙරෙහි, කරහු. මතු සෙත්පුර අත්පත් කරන්නෙහි, කරන්නහු. (33)

ඉති තසබඳ තෙකල්කිරිය.

මම්, ඇප්, පෙර සපුරිසන් බිජිම්, බිජිමි, බිජුමු, බිජුමෝ, බිජුම්හ, බිජුම්හු. දැන් දුලබ මුනිපුත්නනතුරැ බෙජෙම්, බෙජෙමි, බජමු, බජමෝ, බජම්හ, බජම්හු. මතු ලොවුතුරා දහම් බජන්නෙම්, බජන්නෙමි, බජන්නමු, බජන්නමෝ. වහර සෙදෙන සේ පස යොදනු. (34)

ඉති මසබඳ තෙකල්කිරිය.

---

ඉ උ දෙකින් යුක්ත වූත් වියුක්ත වූත්, ඕකාරයුක්ත වූත් මකාරය වේ. හෙවත් මි, මු, ම්, මෝ යන සතර ද ම්හ, ම්හු යන රූප ද පෙර කී ත්‍රෛකාලික අන්‍යකාරක ප්‍රත්‍යයන්ගේ අන්තයෙහි යෙදෙත්. කිසිතැනෙක මොහු ම ප්‍රත්‍යය වද සිටිති. මෙහි වචනභෙදය මෙසේ ය :-

මශබ්දකාරක එකවචන-ම්, මි. බහුවචන-මු, මෝ, ම්හ, ම්හු.

මෙයින් ම්හ, ම්හු දෙදෙන සූත්‍රයෙහි නො පැනෙන නමුත් භාශබ්දබලයෙන් ගන්නාලදහ.

(33) ප—තෝ, යුෂ්මත් තෙම; පෙර, පූර්වයෙහි; සුසිරි, සුචරිතය; කෙළෙහි, කෙළෙහි ය; තෙප්, යුෂ්මත්හු; (පෙර, පූර්වයෙහි; සුසිරි, සුචරිතය); කළහු, කළහු ය; දැන්, වර්තමානයෙහි; රජ කෙරෙහි, (තෝ) රාජ්‍යය කෙරෙහි ය; කරහු, (තෙපි රාජ්‍යය) කරහු ය; මතු, අනාගතයෙහි; සෙත්පුර, ශාන්තිපුරය; අත්පත් කරන්නෙහි, (තෝ) හස්තප්‍රාප්ත කරන්නෙහි ය; කරන්නහු, (තෙපි) හස්තප්‍රාප්ත කරන්නහු ය.

වි –'කර = කිරීමෙහි' යන ධාතු 'කර'යි තබා "තසදකරූ අරූනෑ" යනාදි උපාඛ්‍යසූත්‍රයෙන් හියන්තක් යුක්ත වූ එප්‍රත්‍යය හෙවත් 'එහි' ප්‍රත්‍යය කොට ධාතු රකාරයහට අඛ්‍යසූත්‍රයෙන් ළකාරාදෙශ කොට පූර්වස්වරලොපසන්ධියෙන් ගළපා 'කාළෙහි'යි සිටි කල්හි කකාරස්ථ අකාරයහට පිළිපෙරළි එකාරාදෙශ කොට 'කෙළෙහි' යි සිද්ධ යි. බහුවචනයෙහි 'කර' ධාතු කෙරෙන් හුප්‍රත්‍යය හා රකාරයහට ළකාරාදෙශ ද කිරීමෙන් 'කළහු' යනු සිද්ධ යි. කෙරෙහි, කරහු යනුදු මෙසේ මැ යි. ළකාරාදෙශ නො කිරීම පමණෙක් වෙනසි. කරන්නෙහි, කරන්නහු යන දෙපදය හිහුයුක්ත අන්නේප්‍රත්‍යය හා හෙවත් අන්නෙහි, අන්නහු යන ප්‍රත්‍යය දෙක හා කරධාතුහුගේ සන්ධානයෙන් (=ගැළපීමෙන්) සිද්ධ යි.

**දැන් සඳහම්රජ කරන්නෙන් ගොයුමා. පණෙන් වෙළෙපන්නී අවිදු. මාශා තුසිපුරෙහි වුසු. මහමුහුණු සොම්නස් නම් පසේ බුදු වනුයේ. විශාඋවැසි රහත්පල බජන්නී. ඈ සඳදහමින් අරුත්කිරිසඳ වන කල් නො ඇරැබෑ පස ලදින් ලිගුවිබන් බෙජේ. (35)**

---

තසබඳ, තශබ්දසම්බන්ධයෙහි; හෙවත් තශබ්දකාරක නම් ලද මධ්‍යමපුරුෂයෙහි; තෙකල්කිරිය, ත්‍රෛකාලික ක්‍රියා; ඉති, මෙසේ යි.

(34) ප —මම්, මම; පෙර, පූර්වයෙහි; සපුරිසන්, සත්පුරුෂයන්; බිජීම්, භජනය කෙළෙම්; බිජිම්, (මේ අර්ථයෙහි) බිජිම් (යන රූපය ද වේ). ඇප්, අපි; (පෙර, පූර්වයෙහි; සපුරිසන්, සත්පුරුෂයන්;) බිජුමු, භජනය කෙළෙමු; බිජුමෝ, බිජුම්හ, බිජුම්හු, (මේ අර්ථයෙහි) බිජුමෝ බිජුම්හ බිජුම්හු (යන රූපත්‍රය ද වේ); දැන්, වර්තමානයෙහි; දුලබ, දුර්ලභ වූ; මුනිපුත්තනතුරු, බුද්ධපුත්‍රස්ථානාන්තරය; බෙජෙම්, (මම) භජනය කෙරෙම්; බෙජෙම්, (මේ අර්ථයෙහි) බෙජෙම් (යන රූපය ද වේ); බජමු, (අපි) භජනය කරමු; බජමෝ, බජම්හ, බජම්හු, (මේ අර්ථයෙහි) බජමෝ බජම්හ, බජම්හු (යන රූපත්‍රය ද වේ). මතු, අනාගතයෙහි; ලොවුතුරා දහම්, ලොකොත්තරධර්මය; බජන්නෙම්, (මම) භජනය කරන්නෙම්; බජන්නෙම්, (මේ අර්ථයෙහි) බජන්නෙම් (යන රූපය ද වේ); බජන්නමු, (අපි) භජනය කරන්නමු; බජන්නමෝ, (මේ අර්ථයෙහි) බජන්නමෝ (යන රූපය ද වේ). වහර යෙදෙන සේ, ව්‍යවහාරයට යොග්‍යපරිද්දෙන්; පස යොදනු, ප්‍රත්‍යය යුක්ත කරනු.

වි—'බජ = සෙවිමෙහි' යන ධාතු 'බජ' යි තබා "**තසඳකරු අරුතෑ**" යනාදි උපාඞ්ගසූත්‍රයෙන් මකාරයුක්ත වූ අතීතකාලික ඉප්‍රත්‍යය (හෙවත් 'ඉම්' යන උත්තමපුරුෂෛකවචන ප්‍රත්‍යය) කොට 'බජ+ඉම්' කියා සිටි කල්හි පූර්වස්වරලොපසන්ධි කොට බකාරස්ථ අකාරයහට පිළිපෙරළි ඉකාරාදෙශ කිරීමෙන් 'බිජිම්' යනු සිද්ධ යි. 'බිජිම්' යනු ද ඉම්ප්‍රත්‍යය කිරීමෙන් එසේ ම සිද්ධ වේ. බිජුමු, බිජුමෝ, බිජුම්හ, බිජුම්හු යන බහුවචනරූප අතීත කාලික බහුවචන ඌප්‍රත්‍යය හ්‍රස්ව ව මකාරාදීන් හා යුක්ත ව සිද්ධවන්නා වූ උමු, උමෝ, උම්හ, උම්හු යන ප්‍රත්‍යය සතර හා බජ ධාතුහුගේ යොගයෙන් පූර්වස්වරලොපසන්ධි ව බකාරස්ථ අකාරයහට පිළිපෙරළි ඉකාරාදෙශ ව සිද්ධ යි. මෙසේ ම **බෙජම්, බෙජෙම් යනාදි රූපයන්ගේ ද සිද්ධි සුදුසු සේ සලකනු.**

මසබඳ, මශබ්දසම්බන්ධයෙහි; හෙවත් මශබ්දකාරක නම් ලද උත්තමපුරුෂයෙහි; තෙකල්කිරිය, ත්‍රෛකාලික ක්‍රියාව; ඉති, මෙසේ යි.

(35) ප—දූන්, වර්තමානයෙහි; සදහම්රජ කරන්නේ, සද්ධර්ම රාජ්‍යය කරන තැනැත්තේ; ගොයුම්, ගෞතම (සර්වඥ) යි. පණන්, ප්‍රාණීන්; වෙළපන්නී, විඩම්බිත කරන්නී; හෙවත් ප්‍රමාද කරන්නී; අවිදු, අවිද්‍යාව යි. මායා, මහාමායා දේවී තොමෝ; තුසීපුරෙහි, තුෂිතපුරයෙහි; වුසු, වාසය කළා. මහවුහුණු, උලූක තෙම; සොම්නස් නම් පසේබුදු වනුයේ, සෞමනස්‍ය නම් ප්‍රත්‍යෙක බුද්ධ වන්නේ ය. විසාඋවැසි, විශාඛා උපාසිකා තොමෝ; රහත් පල, අර්හත්ඵලය; බජන්නී, භජනය කරන්නී ය; ඈ, (මේ) ආදිය; සද්දගම්න්, ශබ්දධර්මයෙන්; අරුත්කිරියසද වන, අර්ථක්‍රියා ශබ්ද වූ කල්හි; කල් නො ඇරුබෑ, කාලාපෙක්ෂා නො කොට; පස ලදින්, ප්‍රත්‍යය ලත් හෙයින්; ලිඟුවිබත්, ලිඞ්ගවිභක්ති; බෙජේ, භජනය කෙරේ.

වි—'කර = කිරීමෙහි' යන ධාතු 'කර' යි තබා මෙධාතුවෙන් අර්ථක්‍රියාවාචි ශබ්දයක් කියවි කල්හි කාලයක් අපෙක්ෂා නො කොට අඞ්ගසූත්‍රසාමර්ථ්‍යයෙන් 'අන්න' ප්‍රත්‍යය කොට පූර්වස්වරලොප හා ගාත්‍රාරූඪකරණයෙන් 'කරන්න' ශබ්දය නිපදවා නාම්වත් කොට ඔහු කෙරෙන් පර ව අවිශිෂ්ට අර්ථමාත්‍ර යක් කිවමනා කල්හි; "බජනුයෙ පෙරවිබත්" යනාදි උපාඞ්ග සූත්‍රයෙන් ප්‍රථමෛකවචන ඒවිභක්තිප්‍රත්‍යය කොට පූර්වස්වර ලොපසන්ධියෙන් ගැළපීමෙන් 'කරන්නේ' යනු සිද්ධ යි. විපූර්ව 'ළප = වෙහෙසීමෙහි' යන ධාතු 'විළප' යි තබා යට කී සෙයින් අන්න ප්‍රත්‍යය කොට 'විළපන්න' ශබ්දය නිපදවා ඔහු කෙරෙන් පර ව "අරුත්කිරියසද" යනාදි උපාඞ්ගසූත්‍රයෙන් සත්‍ර්‍යර්ථයෙහි ඊප්‍රත්‍යය කොට විශබ්දයාගේ ඉකාරයහට පිළිපෙරළි එකාරයක් කොට ප්‍රකෘතිප්‍රත්‍යයන්ගේ පූර්වස්වරලොපසන්ධියෙන් 'වෙළපන්නී' ශබ්දය සිද්ධ වූ පසු නාම්වත් කොට ප්‍රථමෛකවචන ඒප්‍රත්‍යය කොට ඔහට අඞ්ගසූත්‍රයෙන් ලොප් පැමිණවීමෙන් 'වෙළපන්නී' යනු සිද්ධ යි. 'වස = විසීමෙහි' යන ධාතු 'වස' යි තබා ඔහු කෙරෙන් අර්ථක්‍රියාවාචි ශබ්දයක් කියවි කල්හි කාලාපෙක්ෂා නො කොට අඞ්ගසූත්‍රයෙන් අප්‍රත්‍යය කොට ඉක්බිති 'අරුත් කිරියසද' යනාදි උපාඞ්ගසූත්‍රයෙන් සත්‍ර්‍යර්ථයෙහි ඌප්‍රත්‍යය කොට ධාතුහුගේ වකාරසර්ථ අකාරයහට පිළිපෙරළි උකාරාදෙශ හා පූර්වස්වරලොපසන්ධියෙන් ගැළපීමත් කළ කල්හි; 'වුසූ' යන ශබ්දය නිපදී. ඉක්බිති නාම්වත් කොට ප්‍රථමෛකවචන ඒප්‍රත්‍යය යොද

පියදුකිරිය බේ—අන්තසද විදි ආසි
කමරුතැ තෙකල් කිරිය ද—දනු පද අසබහව් හා. (36)

පරාවිසින් මෙහෙයනලදහු කිරිය පියදුකිරිය නම්. මෙහි දසින් පර වැ වපස රුසි. කම්කෙලෙස් සසර පණන් බැමවී. මනයොනා යෝනන් කෙළවා. මෙතෝසුගතිඳු ලෙවන් ගළවන්නේ. නමසදදෙක්හි ද යෙදියයුතු. (37)

---

ඔහට ලොප් පැමිණවීමෙන් 'වුසු' යනු සිද්ධ යි. 'වූ = විමෙහි' යන ධාතු 'වූ' යි තබා අව්‍යක්‍රියා ශබ්දයක් කියවී කල්හි කාලාපෙක්‍ෂා නො කොට අඛගසූත්‍රයෙන් තුප්‍රත්‍යය කොට, වකාරස්ථ ඌකාරය හට පිළිපෙරැළි අකාරාදෙශ කොට 'වතු' යි සිද්ධ කල්හි නාමවත් කොට එයින් පර ව ප්‍රථමෛකවචන ඒප්‍රත්‍යය යොදා ඔහු කෙරෙන් පූර්වයෙහි සකාරාගම කොට ගාත්‍රාරූඪ කිරීමෙන් 'වතුසේ' යනු සිද්ධ යි. 'බජ = සෙවීමෙහි' යන ධාතු 'බජ'යි තබා (වෙළපන්නි යන තන්හි කී සෙයින් පිළිපෙරැළි හැර) ප්‍රත්‍යයාදි කාර්‍ය්‍ය කළ කල්හි 'බජන්නි' යනු සිද්ධ යි.

(36) ප—පියදුකිරිය, ප්‍රයොජ්‍යක්‍රියාවගේ; බේ, භෙදය ද; අන්තස ද, අන්‍යශබ්ද තශබ්ද සම්බන්ධි වූ හෙවත් ප්‍රථම මධ්‍යම පුරුෂද්වය සම්බන්ධි වූ; විදි, විධික්‍රියාව ද; ආසි, ආශිස්ක්‍රියාව ද; කමරුතැ, කමාර්ථයෙහි; තෙකල්කිරිය ද, ත්‍රෛකාලිකක්‍රියා ද; අසබහව් පද හා, අසම්භාව්‍යක්‍රියාපද ද; දනු, ජානනය කරනු.

මේ ක්‍රියාවන්ගේ විස්තර පිළිවෙළින් දක්වනු ලැබේ :-

(37) ප—පරාවිසින්, අන්‍යයා විසින්; මෙහෙයනලදහු, ප්‍රෙරිතයාගේ (= ප්‍රෙරණය කරනලද්දහුගේ); කිරිය, ක්‍රියාව; පියදුකිරිය නම්, ප්‍රයොජ්‍යක්‍රියා නම් වේ. මෙහි, මේ ක්‍රියාවිෂයෙහි; දසින් පර වැ, ධාතුවෙන් පර වැ, වපස, වප්‍රත්‍යය; රුසී, රුචි යි. කම්කෙලෙස්, කම්කෙලශ තෙම; සසර, සංසාරයෙහි; පණන්, ප්‍රාණීන්; බැමවී, භ්‍රමණය කැරැවී. මනයොනා, අනඞ්ග තෙම; යෝනන්, යුවතීන්; කෙළවා, ක්‍රීඩනය කරවයි. මෙතෝසුගතිඳු, මෛත්‍රෙය සුගතෙන්ද්‍ර තෙම; ලෙවන්, ලෝවැස්සන්; ගළවන්නේ,(භවබන්ධනයෙන්) මුදන්නේ ය. නමසද දෙක්හි ද, තශබ්ද මශබ්ද කාරක දෙක්හි ද; යෙදියයුතු, ප්‍රයොග කටයුතු.

වි—ප්‍රයොජ්‍යක්‍රියා යනු අනිකකු විසින් චොදනා (= නියොග) කරනු ලැබූ කර්තෘහුගේ ක්‍රියාව ය. මෙහි ප්‍රයොජකය ප්‍රයොජ්‍යය යි කර්තෘහු දෙදෙනෙක් වෙති. කරවන තැනැත්තේ 'ප්‍රයොජක' නම් වෙයි. කරන තැනැත්තේ 'ප්‍රයොජ්‍ය' නම් වේ. ප්‍රෙරක, ප්‍රෙරිත යන නමුදු මොවුන්ට ක්‍රමයෙන් කියනු ලැබේ. මෙහෙයීම

**අකම් සකම් වෙ—පියඳුම් ලද විසාකී**
**බිහුකම් සකම්—පියඳුම්—ලද්හට ලවා හා වෙ.** (38)

---

'ප්‍රේරණා' නමු. ප්‍රේරණාව ද නොයෙක් ප්‍රකාර වේ. පාණිනීය මතයෙහි ප්‍රෙෂණා, අධ්‍යෙෂණා, අනුමති, අනුග්‍රහ වශයෙන් මේ ප්‍රේරණාව (= මෙහෙයීම) විස්තර කරනලද්දී ය. තමහට නිකෘෂ්ට වූ (= අඩුතරම් වූ) දසාදීන් මෙහෙයීම = ඇණවීම ප්‍රෙෂණා නමු. 'ස්වාමි තෙම දසයා යවයි' යනු මෙනි. තමා හා සමානයක්හට හෝ අධිකයක්හට හෝ සත්කාරපූර්වක ප්‍රවර්තනාව (= ආරාධනාව) අධ්‍යෙෂණා නමු. 'ශිෂ්‍යතෙම ආචාර්යයා ලවා ගුරුදක්ෂිණාව ගන්වයි' යනු මෙනි. මෙහි පිළිගත මැනවැයි ශිෂ්‍යයාගේ අයදීම ප්‍රේරණාව වේ. රාජාදි උතුමකුගේ අනුඥව නැතිකලැ ක්‍රියාවගේ අනිෂ්පත්තිය (= අසිද්ධිය) වේ නම් එවැන්නෙහි අනුමතකිරීම ද ප්‍රේරණාවකි (= මෙහෙයීමකි). 'රජතෙම ප්‍රජාව ලවා යාගකරවයි' යනු මෙනි. මෙහි රජුගේ අවසර නැතහොත් ප්‍රජාවට යාග කළ නො හැකි ය. එහෙයින් මෝ තොමෝ අනුමතිප්‍රේරණාය යි සලකනු ලැබේ. උපදෙස් දීම් ආදි වශයෙන් අනුග්‍රහවචන කීම ද ප්‍රේරණාවකි. 'වෙදතෙම රෝගීහු ලවා බෙහෙත් වළඳවයි' යනු මෙනි. මෙහි අනුග්‍රාහ්‍ය සචේතන ධර්මයෙකි. අචේතනධර්ම වූ අනුග්‍රහයෙහි ද මෙසේ ම ප්‍රේරණාව උපචරිත වශයෙන් සලකනු ලැබේ. 'සිගිම දුගියා වස්වයි' යනු මෙනි. මෙහි 'සිගිම' අචේතන නමුදු දුගියාගේ වාසයකිරීමට ප්‍රයොජක කර්තෘ වේ. මෙසේ අන්‍යයාගේ මෙහෙයීමක් ලද්දා වූ කර්තෘහුගේ ක්‍රියාව ප්‍රයොජ්‍යක්‍රියා නම් වේ. 'කාරිත ක්‍රියා' යනු ද මීට ම ශබ්දවර්මාදීන්ගේ සංඥ යි. 'ණිජන්ත' යනු පාණිනීය සංඥ යි. මේ ක්‍රියායෙහි ධාතුප්‍රත්‍යය දෙදෙනා මධ්‍යයෙහි වප්‍රත්‍යය වේ.

බැමවී, කෙළවා, ගලවන්නේ යන උදාහරණත්‍රය අතීත, වර්තමාන, අනාගත යන කාලත්‍රය සම්බන්ධ අන්‍යකාරක ප්‍රත්‍යයෙන් දක්වනලදි. බම+ඊ, කෙළි+ආ, ගලි+අන්නේ යන ධාතුප්‍රත්‍යය මධ්‍යයෙහි වප්‍රත්‍යය කොට ප්‍රත්‍යයස්වරයාහට ලොප් ද, පූර්වරූපයෙහි බකාරස්ථ අකාරයහට මාත්‍රාංශවෘද්ධි ද කොට ගාත්‍රාරූඪ කළ කල්හි 'බැමවී, කෙළවා, ගලවන්නේ' යන ප්‍රයොජ්‍යක්‍රියාවන්ගේ සිද්ධිය වේ. කම්කෙලෙස්, මනයොනා, මෙහෝසුගතිඳු යනු ප්‍රයොජක කර්තෘපද යි. පණන්, යෝනන්, ලෙවන් යනු ප්‍රයොජ්‍ය යි. මධ්‍යමඋත්තමපුරුෂ දෙක්හි ද ප්‍රත්‍යයවත් කිරීමෙන් මෙසේ ම පදසිද්ධි සලකනු.

සුදෙට අනැවැසි ලවා මේ පිසවා. ඈගී.
භාකරෙන් කිසිතන්හි නො වේ. "මුවවස්නි සුතු බුලත් දිදී දෙවා දරුවන්" මෙඈගී. ඉති පියදුකිරිය. (39)

(38) ප—පියදුම් ලද විසාහි, ප්‍රෙරණය ලද්දහුගේ (ක්‍රියා) විෂයෙහි; අකම්, අකර්මකධාතු තෙම; සකම් වේ, සකර්මක වේ; සකම්, සකර්මකධාතු තෙම; බුහුකම්, බහුකර්මක (වේ); පියදුම්ලද හට, ප්‍රයොජ්‍යයාහට; ලවා හා වේ, ලවාප්‍රත්‍යය ද වේ.

(39) ප—සුදෙට, සුදජ්‍යෙෂ්ඨ තෙම; අනැවැසි ලවා, අන්තෙවාසිකයා ලවා; මේ, භක්තය; පිසවා, පචනය කරවයි; ඈගී, මේ ආදි ආකාර ඇත්තේ යි. භාකරෙන්, (කාවෙහි) භාශබ්දයෙන්; කිසිතන්හි, සමහර තැනෙක්හි; නො වේ, ලවාප්‍රත්‍යය නො වන්නේ යි. මුවවස්නි සුතු, මුඛවාසයෙන් යුක්ත වූ; බුලත්, තාම්බූලය; දිදී, දානය කොට කොට; දරුවන්, දාරකයන් ලවා; දෙවා, දානයකරවයි; මෙඈගී, මේ ආදි ආකාර ඇත්තේ යි. පියදුකිරිය, ප්‍රයොජ්‍යක්‍රියාව; ඉති, මෙසේ යි.

වි—ක්‍රියාව කරන තැනැත්තේ ශුද්ධකර්තෘ ය. ඔහු අනිකක්හුගේ යෙදවීමෙකින් ක්‍රියාව කෙරේ නම් 'ප්‍රයොජ්‍යකර්තෘ' නම් වේ. අනිකකු ලවා ක්‍රියාව කරවන තැනැත්තේ ද ක්‍රියායෙහි උත්සාහවත් හෙයින් හෙතුකර්තෘ ය. 'ප්‍රයොජකකර්තෘ' යනුදු ඔහුට ම නමෙකි. අකර්මකධාතුවකින් යම් ප්‍රයොජ්‍ය ක්‍රියාවක් සිද්ධ වී නම් ඒ ක්‍රියායෙහිදී එය සකර්මකධාතුවක් මෙන් සලකනු ලැබේ. කුමක් හෙයින් ද? ප්‍රයොජ්‍යක්‍රියායෙහි බොහෝ සෙයින් ශුද්ධකර්තෘහට කර්මසංඥව ලැබෙන හෙයිනි. හෙවත් ප්‍රයොජ්‍ය වූ ශුද්ධකර්තෘ කර්ම ව ද, හෙතුකර්තෘ වූ ප්‍රයොජකයා කර්තෘව ද සිටීම ප්‍රයොජ්‍ය ක්‍රියායෙහි ධර්මතා හෙයිනි. මේ නයින් අකර්මකධාතු සකර්මක වීම ද, සකර්මකධාතු ද්විකර්මක වීම ද කියනලදී. මෙසේ හෙයින් අකර්මක වූ ප්‍රයොජ්‍යක්‍රියාවෙක් නො ලැබේ. ශුද්ධකර්තෘහට කර්මත්වය ලැබුණු කල්හි ඔහු කෙරෙන් පර වැ 'ලවා' යන්නක් නිපාතනය කිරීම ද, සමහර තැනෙක්හි ඒ නො කිරීම ද සිංහල ව්‍යාකරණයෙහි විශෙෂවිධානයෙකි. "කම්කෙලෙස් සසරැ පණන් බැමවී" යන උදාහරණයෙහි අකර්මක වූ බමධාතුවෙන් 'බැමවී' යන සකර්මක ක්‍රියාව සිද්ධ යි. භ්‍රමණ ක්‍රියාව කරන ශුද්ධකර්තෘ වූ ප්‍රාණීහු 'පණන්' යී කර්මත්වයට පැමිණියෝ ය. භ්‍රමණ ක්‍රියාව තමා නො කරන නමුත් ප්‍රාණීන් ලවා කරවන කර්මක්ලෙශ තෙම කර්තෘත්වයට පැමිණියේ ප්‍රයොජකකර්තෘ නම් විය. මෙහි කර්ම වැ සිටි 'පණන්' යන ප්‍රයොජ්‍ය (= ශුද්ධ) කර්තෘහු කෙරෙන් 'ලවා' යනු නො යෙදේ. 'සුදෙට' යනාදි උදාහරණයෙහි ද ශුද්ධ

**වත්මන් අනාරූ—නො වෙන් වූ හොත අනදරින්
අදරින් හොත තඅන්—සබඳහට විදහන් විදි.** (40)

කර්තෘ වූ අනුවැසි තෙම කම් විය. ඔහු කෙරෙන් **'ලවා'** යනු යොදනලදි. 'මුවවස්නි' යනාදිය විකල්පයෙන් **'ලවා'** යන්නහුගේ නො යෙදීම පිණිස උදාහෘත යි. එහි **'දරුවන් දෙවා'** කිව ද **'දරුවන් ලවා දෙවා'** කිව ද යහපත් වේ. **ප්‍රයොජ්‍යක්‍රියාව නිමි.**

(40) **ප**—වත්මන් අනාරූ, වර්තමාන අනාගත රූපයන් **ගෙන්**; නො වෙන් වූ, පෘථග්භූත නො වූ (=වෙනසක් නො වූ); අනදරින් හොත, අනාදරයෙන් හෝ; අදරින් හොත, ආදරයෙන් හෝ; තඅන්සබඳහට, තශබ්ද අන්‍යශබ්ද සම්බන්ධයහට; විදහන්, විධානය තෙම; විදි, විධි (නම් වේ).

**වි**—වර්තමාන අනාගත කාලදෙකට ම සමානරූප වූ ක්‍රියාපද යෙකින් ආදරයෙන් හෝ අනාදරයෙන් හෝ මධ්‍යමපුරුෂ ප්‍රථම පුරුෂ දෙකට ඇතුළත් කෙනකුන් යෙදීම **විධි** නමි. ඒ විධ්‍යර්ථ යෙහි වූ ක්‍රියාව **විධික්‍රියා** නම් වේ. විධ්‍යර්ථය මහර්ෂි පාණිනි පතඤ්ජලි ආදි ආචාර්‍ය්‍යවරයන් විසින් සතරපරිද්දක් කොට දක්වනලදි. පාණිනීයපක්‍ෂයෙහි ම භට්ටොජිදීක්‍ෂිත භර්තෘහරි ආදි ආචාර්‍ය්‍යවරයෝ ද මාගධ මෞද්ගල්‍යායනාචාර්‍ය්‍යාදිහු ද ඒ සතර පරිද්ද ම අවිශෙෂයෙන් එකාර්ථකොට සැලකූහ. මෙම පක්‍ෂය ප්‍රතිරාජපරිවෙණස්වාමීන්ට ද අභිමත හෙයින් විධ්‍යර්ථමාත්‍ර යෙක් ම මෙහි දක්වනලද්දේ ය. පාණිනීය ව්‍යාකරණයෙහි කී චාතුර්විධ්‍යය (= සිවුවැදෑරුම) **විධි, නිමන්ත්‍රණ, ආමන්ත්‍රණ, අධීෂ්ට** යන සතර ය. මෙහෙකරු ආදීන් කිසියම් ක්‍රියායෙක්හි යෙදවීම **'විධි'** නමැ යි ද, දූදරු ආදීන්ට ආවශ්‍යක ක්‍රියාවන්හි නියොගකිරීම **'නිමන්ත්‍රණ'** නමැයි ද, කාමචාරානුඥව (=කැමැති නම් කරන ලෙස අනුදැනීම) **'ආමන්ත්‍රණ'** නමැයි ද, සත්කාර පූර්වක වූ ව්‍යාපාරය **'අධීෂ්ට'** නමැයි ද භාෂ්‍යවෘත්තිකාරාදීන් විසින් විස්තරකරන ලද්දේ ය.* එතකුදු වුවත් මේ සතර ම විධික්‍රියා බැව් වාක්‍යපදීයයෙහි :-

> **"අස්ති ප්‍රවර්තනාරූපමනුරූපං චතුර්ෂ්වපි
> තත්‍රෛව ලිඞ් විධාතව්‍යඃ කිං භෙදස්‍ය විවක්‍ෂයා,
> න්‍යායව්‍යුත්පාදනාර්ථං වා ප්‍රපඤ්චාර්ථමථාපි වා
> විධ්‍යාදීනාමුපාදානං චතුර්ණාමාදිතඃ කෘතම්."**

යන්නෙන් ප්‍රකාශිත යි.

* **"විධිඃ-ප්‍රෙරණම්, නිමන්ත්‍රණං-නියොගකරණම්, ආමන්ත්‍රණං-කාමචාරකරණම්, අධීෂ්ටඃ-සත්කාරපූර්වකො ව්‍යාපාරඃ"-වෛයාකරණ සර්වස්ව,**

මෙහි අ, ඒ, අන්නේ, අන්නෑ, අව්, උ, පස රූසි. (41)
අ, බමුණ පනද බොජ. (42)
ඒ, සැරදේ මහබා. (43)
අන්නේ, මේකරු මේ පිසන්නේ. (44)
අන්නෑ, හිමි නුඹ දහම් දෙසන්නෑ. (45)
අව්, ගුණෙකැත්නම් මෙයි බජව්. (46)

---

(41) ප—මෙහි, මේ (විධික්‍රියායෙහි); අ, අප්‍රත්‍යය ද; ඒ, ඒප්‍රත්‍යය ද; අන්නේ, අන්නේප්‍රත්‍යය ද; අන්නෑ, අන්නෑ ප්‍රත්‍යය ද; අව්, අව්ප්‍රත්‍යය ද; උපස, උප්‍රත්‍යය ද; රූසි, රූවි සි.

වි—මෙකී විධිප්‍රත්‍යයෂට්කය අතුරෙන්; 'අන්නේ' ප්‍රත්‍යය අන්‍යකාරක එකවචනය වේ. බහුවචනය ද මේනයින් සැලකිය යුතු හෙයින් නො කියනලදුවත් 'අන්නෝ' ප්‍රත්‍යය යි දතයුතු සි. අ, ඒ, අන්නෑ යනු තශබ්දකාරක එකවචන වේ. අව්, උ දෙක එම කාරකයෙහි බහුවචන සි.

(42) ප—අ, අප්‍රත්‍යය වේ; බමුණ, බ්‍රාහමණය; පනද, පුනර් දිනයෙහි; (=පසුදින); බොජ, භොජනය කර. 'බොජ=බොදුම්හි' යන ධාතු හා අප්‍රත්‍යයාගේ පූර්වස්වරලොපසන්ධියෙන් 'බොජ' යනු සිද්ධ සි.

(43) ප—ඒ, ඒප්‍රත්‍යය වේ; මහබා, මහත් භාග්‍ය ඇත්තව; සැරදේ, චිරකාලයක් ජීවත් වෙහි. සැර යන අව්‍යය උපපද කොට ඇති 'දිව් = පණදැරීමෙහි' යන ධාතු 'සැර+දිව්' යී තබා 'ඒ' ප්‍රත්‍යය කොට ධාත්වන්තලොප් හා පූර්වස්වරලොපසන්ධි ද කිරීමෙන් 'සැරදේ' යනු සිද්ධ සි.

(44) ප—අන්නේ, අන්නේප්‍රත්‍යය වේ; මේකරු, භක්තකාර තෙම; මේ, භක්තය; පිසන්නේ, පචනය කරන්නේ ය. 'පිස = පිසීමෙහි' යන ධාතුහු කෙරෙන් අන්නේප්‍රත්‍යය සි.

(45) ප—අන්නෑ, අන්නෑප්‍රත්‍යය වේ; හිමි, ස්වාමිය; නුඹ, යුෂ්මත් තෙම; දහම්, ධර්මය; දෙසන්නෑ, දෙශනා කරන්නෑ; දෙශනා කල මැනවැ යි සේයි. 'දෙස = දෙසීමෙහි' යන ධාතු හා අන්නෑප්‍රත්‍යයාගේ සංහිතායෙන් සිද්ධ සි.

(46) ප—අව්, අව්ප්‍රත්‍යය වේ; මෙහි, මේ ක්‍රියායෙහි; (මේ භූවදෙව්දූතව බැදුම්හි); ගුණෙක්, (යම්) ගුණයෙක්; ඇත්නම්, විද්‍යමාන නම්; බජව්, එය භජනය කරව්. 'බජ = සෙවීමෙහි' යන ධාතු හා අව්ප්‍රත්‍යයාගේ සංහිතා සි.

**ඒ, සජනෙනි සහක් දක්කු. මෙහි කිසිවිදි ආසිගැබ. (47)**

**ඉති විදිකිරිය.**

---

**ඉටු නොපත් තෙසදබඳ අනාඅරුත් පැතුම් ආසි නම්.**
**මෙහි පසින් පර වැ වාපස රුසි. (48)**
**සරසවිය මා මුවනබරැ ඉස්බෙවා. (49)**

---

(47) **ප**—**ඒ**, **ඒ** ප්‍රත්‍යය වේ; සජනෙනි, සජ්ජනයෙනි; සහක්, ශුභයක්; දක්කු, දශිනය කරව්. දිස් = බැලිමෙහි යන ධාතු 'දිස්' යි තබා ඒප්‍රත්‍යය කොට ධාත්වන්ත සකාරයහට කකාරාදෙශ ද දකාරයට ඉකාරයහට පිලිපෙරැළි අකාරාදෙශ ද ප්‍රත්‍යයස්වරය හා ද්විරූපසන්ධි ද කිරීමෙන් 'දක්කු' යනු සිද්ධ යි.

මෙහි, මේ (උදාහරණයෙහි); කිසිවිදි, සමහරවිධියෙක්; ආසි ගැබ, ආශිර්ගර්භි (වේ).

**වි**—මෙකී උදාහරණයන් අතුරෙහි සමහර විධික්‍රියාවක් ආශිර්වාද අර්ථය ගර්භිත ව (= ඇතුළත් ව) සිද්ධ බැව් කී හෙයින් ආශිස් අර්ථ යයි ද සැලකිය හැකි වූ **'සැරදේ, දක්කු'** යන ක්‍රියා දෙක ආශිර්ගර්භිවිධික්‍රියා යයි දතයුතු. සෙස්ස ශුද්ධ වූ (= අසම්මිශ්‍ර වූ) විධික්‍රියා යි.

**ඉති විදිකිරිය, විධික්‍රියාව නිමි.**

---

(48) **ප**—ඉටු, ඉෂ්ට වූ (= කැමැති වූ); නොපත්, අප්‍රාප්ත වූ; තෙසදබඳ, (ශෙෂකාරක යුෂ්මත්කාරක අස්මත්කාරක යන) ශබ්දත්‍රය ප්‍රතිබද්ධ වූ; අනාඅරුත් පැතුම්, අනාගතාර්ථයක් ප්‍රාර්ථනා කිරීම; ආසි නම්, ආශිස් නම්. මෙහි, මේ (ක්‍රියායෙහි); පසින් පර වැ, ප්‍රත්‍යයෙන් පරවර්ති වැ; වාපස, වාප්‍රත්‍යය; රුසි, රුචි යි.

**වි**—වක්තෘහට කැමැති වූ නො පැමිණුණා වූ අනාගත කාලික වූ අර්ථයක්හුගේ පැතීම ආශිස් නම්. ආචාර්ය ජයාදිත්‍යයෝ ද මේ අර්ථය "ආශංසනමාශිඃ, අප්‍රාප්තස්‍යෙෂ්ටාර්ථස්‍ය ප්‍රාප්තුමිච්ඡා"යි මෙසේ ම විස්තර කළහ. "දෙවදත්තය, තට සැප වේවා"යි බ්‍රහ්මදත්ත නමැත්තෙක් කියා නම් බ්‍රහ්මදත්ත තෙම වක්තෘ නම් වෙයි, හෙවත් කියන තැනැත්තේ වේ. වක්තෘ තෙම මෙයින් හඟවන්නේ "දෙවදත්තයා සම්බන්ධි වූ සුඛකාර්‍ය්‍යකභවනය මාගේ ඉච්ඡාවිශෙෂයෙක" යන අදහස යි. මෙය ආශිර්වාද නම් වේ. අන්‍යකාරක, තශබ්දකාරක, මශබ්දකාරක යන ශබ්දත්‍රයෙහි ම මේ ක්‍රියාවගේ ප්‍රයොගය ලැබේ.

(49) **ප**—සරසවිය, සරස්වතී තොමෝ; මා මුවනබරැ, මාගේ මුඛ නමැති තාමරසයෙහි (= පද්මයෙහි); ඉස්බෙවා, විශ්‍රාමය

නරපවර වැජඹෙති වා. (50)
දිය හිය කිරිමෙහි වත්වෙම්වා. (51)
ඉති ආසිකිරිය.

---

මෙවියු සව්කිරිය—පෙදෙහි කිරිය කමරුත්
බැරිවැ විවැකුව කම්—පස යෙදෙන සේ කරනු. (52)

අයුහි දපසමැද ණපස පිලිපෙරළි ද අනාවත්මන්හි පිලිපෙරළි ද මත්වැඩි ද රුසි. (53)

---

කෙරේවා. 'ඉස්බ = අදන් දුරුකිරීමෙහි' යන ධාතුහු කෙරෙන් අන්කරු වත්මන් එකබස් ඒප්‍රත්‍යය හා වාප්‍රත්‍යය යි.

(50) ප—නරපවර, නරශ්‍රෙෂ්ඨය (තෝ); වැජඹෙහිවා, විජෘම්භණය කෙරෙහිවා. විශබ්දපූර්ව වූ 'ජබ = ගත්නැම්මෙහි' යන ධාතුහු කෙරෙන් තසදකරු වත්මන් එකබස් එහිප්‍රත්‍යය හා වාප්‍රත්‍යය යි.

(51) ප—දිය හිය කිරිමෙහි, ජගද්ධිතකරණයෙහි; වත්වෙම්වා, (මම) සමර්ථ වෙම්වා.

'වූ = වීමෙහි' යන ධාතුහු කෙරෙන් මසදකරු වත්මන් එකබස් මිප්‍රත්‍යය හා වාප්‍රත්‍යය යි. සෙස්සෙහි ද මේ නයින් සලකනු. ආශිස්ක්‍රියාවට නියමිත වූ වාප්‍රත්‍යය වර්තමානකාලික ප්‍රත්‍යයන් කෙරෙන් ම පර ව යෙදූව මනා බැව් වර්තමානප්‍රත්‍යය සම්බන්ධ වූ කාරකත්‍රය උදාහරණයන්ගෙන් ප්‍රකාශකරනලදී.

ආසිකිරිය, ආශිස්ක්‍රියාව; ඉති, මෙසේ යි.

---

(52) ප - මෙවියු, මේ යථොක්ත වූ; සව්කිරියපෙදෙහි, සර්ව ක්‍රියාපදයෙහි; කිරිය, ක්‍රියාව, කමරුත්බැරි වැ, කර්මාර්ථයෙහි භාර වැ; විවැකුව, විවක්ෂිත වුව හොත්; කම්පස යෙදෙන සේ, කර්මප්‍රත්‍යය යුක්ත වන පරිද්දෙන්; කරනු, පදසිද්ධිය කරනු.

භා—මේ සට දක්වනලද සියලු ක්‍රියාවන් ම කර්මය උක්තවන ලෙස යෙදූව මනා වී නම් කර්මප්‍රත්‍යය යුක්ත වන පරිද්දෙන් සිඩ කරනු. කර්මප්‍රත්‍යය යුක්ත කරන පරිදි දක්වන්නෝ "අයුහි" යනාදිය කීහු.

(53) ප—අයුහි, අතීතකාලයෙහි; දපසමැද, ධාතුප්‍රත්‍යය දෙදෙනා මධ්‍යයෙහි; ණපස, ණප්‍රත්‍යය ද; පිලිපෙරළි ද, ස්වර විපර්‍ය්‍යාසය ද; අනාවත්මන්හි, අනාගත වර්තමානකාලද්වයෙහි; පිලිපෙරළි ද, ස්වරවිපර්‍ය්‍යාසය ද; මත්වැඩි ද, මාත්‍රාවෘද්ධිය ද; රුසී, අභිමත යි.

**අගමගගිනි කෙලෙස්කැස දැවිණි.** (54)
**සුසිරිවතුරෙන් ඇණියග වැසේ.** (55)

---

**වි**—අතීතකාලික කර්මක්‍රියාවක් සිද්ධකරන කල්හි පූර්වෝක්ත විධියෙන් වෙනස්වන කාර්‍ය්‍ය නම්, ධාතුප්‍රත්‍යය දෙදෙනාගේ මධ්‍යයෙහි ණිප්‍රත්‍යය කොට පිලිපෙරළි කිරිම ද; අනාගතවර්තමානකාලික ක්‍රියාද්වය සිද්ධකරන කල්හි පිලිපෙරළි හා මාත්‍රාවෘද්ධිය ද යන මේ කිරීම පමණෙකි.

(54) **ප**—අගමගගිනි, අග්‍රමාර්ගී ( = අර්හත්මාර්ගඥත) නමැති වහ්නියෙන්, කෙලෙස්කැස; කෙලශ නමැති කචජය (ලැහැබ); දැවිණි, දවනු ලැබී.

**වි**—'**දව = දැවිමෙහි**' යන ධාතුහු කෙරෙන් අන්කරු අයුකල් එකබස් ඉ ප්‍රත්‍යය කොට '**දව+ඉ**' කියා සිටි කල්හි මේ ධාතුප්‍රත්‍යය දෙදෙන අතරෙහි අඞගසූත්‍රයෙන් ණිප්‍රත්‍යය කොට පූර්වස්වර ලොපසන්ධියෙන් '**දවණි**'යි සන්ධි වූ පසු දකාරවකාරගත ස්වර යන්ට මාත්‍රාංශවෘද්ධි හා විපර්‍ය්‍යාස වැ '**දැවිණි**'යි සිද්ධ යි. මේ ණිප්‍රත්‍යය දන්ත්‍යනකාරවත් යයි මෙකල බොහෝදෙනා විසින් වරදවා සලකනලද නමුත් මූර්ධන්‍යණකාරවත් බව ඇදහියයුතු පුරාණ ලිපිවලින් හා නොයෙක් ජෙකප්‍රයොගවලින් ද පැනේ. මේ ණිප්‍රත්‍යය ම නිරුත්සාහයෙන් සම්පාදනය වන කර්තෘකාරක ක්‍රියාවට ද නියමිත ය. ඒ සියලු තන්හි ම මූර්ධන්‍යණකාරවත් හෙයින් එ ම ණිප්‍රත්‍යයෙන් සිද්ධවන කර්මක්‍රියා ද මූර්ධන්‍යණකාරවත් මැයි නිශ්චිත වේ.

**කව්සේකරයෙහි:—**

"ලද බොලඳ එබැම් ණි
රතන ඔහදිය සෙලවි ණි
හිමි පලඹන ගිහි ණි
පැමිණි ලොමුදැහැ නුරා සරි වි ණි"

**ගුත්තිලදකාවෙහි :-**

"දි ය දි ය ගොස පල කෙරෙමින් සපැ මි ණි
ගි ය ගි ය තැන ඉස්වා රන් මුතු මි ණි
ගි ය ගි ය දියහද එනමෙන් ගෙන රැ ණි
සි ය සි ය ගුණයෙන් වෙණ තද නික් මිණි"

යනාදි නිරුත්සාහක්‍රියා ද ඊට සාධක යි.

(55) **ප**—සුසිරිවතුරෙන්, සුචරිත නමැති ප්‍රවාහයෙන්; ඇණියග, අණුමාත්‍ර වූ පාපය; වැසේ, ප්‍රච්ඡන්න වේ:– '**වස = මුවහ**

**සසුන්පිරියතැ දුණන් විසින් සතරරූ මැවෙන්නේ.**
**මෙඈ විමසනු.** (56)

**මෙහි අරුත්වියනනවරැ ලබඳු යොදනු රුසි.** (57)

**නිනැතින් සැපයෙන කතුඅරුත්හට ද මෙපස රුසි.**
**බැබළිණි ඈගි.** (58)

---

කිරීමෙහි' යන ධාතුහු කෙරෙන් අන්කරු වත්මන් එකබස් ඒප්‍රත්‍යය වූ පසු වකාරයාගේ අකාරයහට මාත්‍රාංශවෘද්ධි කිරීමෙන් පූර්වස්වරලොපසන්ධි ව '**වැසේ**' යනු සිද්ධ යි.

(56) **ප**—සසුන් පිරියතැ, ශාසනපර්‍ය්‍යන්තයෙහි; දුණන් විසින්, ධාතුන් විසින්; සතරරූ, ශාස්ත්‍රරූපය තෙම; මැවෙන්නේ, නිර්මිත කරනු ලබන්නේ ය; මෙඈ, මේ ආදිය; විමසනු, විමංසනය කරනු. '**මව = නිපදවීමෙහි**' යන ධාතු 'මව'යි තබා අන්කරු අනාකල් එකබස් '**අන්නේ**' ප්‍රත්‍යය කොට '**මවන්නේ**'යි සිදු වූ පසු කර්මකාරකාර්ථය සඳහා මකාරයාගේ අකාරයහට මාත්‍රාංශ වෘද්ධි ද වකාරයාගේ අකාරයහට පිළිපෙරළි එකාරාදෙශ ද කිරීමෙන් '**මැවෙන්නේ**' යනු සිද්ධ යි.

(57) **ප**—මෙහි, මේ (කර්මක්‍රියායෙහි); අරුත්වියනනවරැ, අර්ථව්‍යාඛ්‍යාන කාලයෙහි; ලබඳු, ලබ යන ධාතුහුගේ; යොදනු, යොජනය; රුසී, රුචි යි. කර්මකාරකක්‍රියාවට අර්ථ කියන කල්හි "**මැවෙන්නේ, මවනු ලබන්නේ**" යනාදීන් ලබධාතුව අර්ථපදය හා යුක්ත කිරීම ආචාර්‍ය්‍යවරයන්ට අභිමත යි.

කර්මක්‍රියාව හා නො වෙනස් රූපසාධනය ඇති කර්තෘකාරක නිරුත්සාහ ක්‍රියාව ද මෙහි ම දක්වන්නෝ '**නිනැතින්**' යනාදිය කීහු.

(58) **ප**—නිනැතින් සැපයෙන, නිරුත්සාහයෙන් සම්පාද්‍යමාන වූ; කතුඅරුත්හට ද, කර්ත්‍රර්ථයහට ද; **මෙපස**, මේ ප්‍රත්‍යය හෙවත් ණප්‍රත්‍යය ස්වරවිපර්‍ය්‍යාස මාත්‍රාවෘද්ධිසඞ්ඛ්‍යාත ප්‍රත්‍යය විධිය; රුසී, අභිමත යි. බැබළිණි ඈගී, බැබළිණි යනාදි ආකාර ඇත්තේ යි.

**වි**—'**සඳ බබලයි**' කී කලැ බැබළීමෙහි චන්ද්‍රයාගේ කර්තෘත්වය වේ. කර්තෘත්වය නම් උත්සාහවත් වූ ක්‍රියාසාධකත්වය යි. යම්විටෙක ක්‍රියාසාධකත්වය ඇතත් උත්සාහවත්ත්වය නො වේ නම් එකල්හි නිරුත්සාහක්‍රියාව වේ. '**සඳ බැබළේ**' යනු මෙනි, මෙහි බැබළීම කර්තෘහුගේ උත්සාහයකින් නො ව ඉබේ ම සිදුවන බව 'බැබළේ

**කුසුල් තෙම බිදේ. මෙඈ තෙමකතුතෙමකම් නම්.** (59)
**විදිවිසාහි කරනු බොජනු ඈ වේ. මෙහි නුපස රුසි.**
**හව්තැන්හි සෙදෙන සේ බුහුබස් සලසනු.** (60)

**ඉති කම්කිරිය.**

---

යන්නෙන් හැඟේ, මෙහි රූපයත් කර්මක්‍රියාරූපයත් එකසේම සිද්ධවන හෙයින් කර්මක්‍රියාවසරයෙහි ම මෙය දක්වූහ. බැබළිණි, බැබළේ, බැබළෙන්නේ යනාදීන් කාලත්‍රයෙහි ම මේ ක්‍රියාවගේ ද රූපසිද්ධිය වේ. 'බැබළිණි' යන තන්හි 'බබල = සොබනෙහි' යන ධාතුහු කෙරෙන් ඉප්‍රත්‍යය වේ. ප්‍රකෘතිප්‍රත්‍යය දෙදෙනා මධ්‍යයෙහි ණිප්‍රත්‍යය වේ. ධාත්වාදි බකාරයෙහි අකාරයහට මාත්‍රාංශවෘද්ධි හා ධාත්වන්ත අකාරයහට පිළිපෙරළි ඉකාරාදේශ ද වේ. ණකාරස්ථ ස්වරයා ලොප් කොට ප්‍රත්‍යයස්වරයා ගාත්‍රාරූඪ කළ කල්හි 'බැබළිණි' යනු වේ.

'ලහිරුසිරින් දිලිහිණි හිමි නෙත්සගල' යනාදීන් කාව්‍ය විෂයෙහි ද, බිදුණි, කැඩුණි යනාදීන් ලෞකිකව්‍යවහාරයෙහි ද මේ ක්‍රියාව බහුල වැ පවති. බිඳුණි යනාදිය සාමාන්‍ය කථාව්‍යවහාරයෙහි බොහෝසෙයින් උකාරමධ්‍ය වූ නමුත් බිදිණි, කැඩිණි යනාදීන් ඉකාරමධ්‍ය වීම මෙහි අභිමත යි. මේ කර්ම ක්‍රියාස්වරූප වූ නිරුක්සාහක්‍රියාව යි.

(59) ප—කුසුල්, කුශලය; තෙම, තෙමේ (ම); බිදේ, හෙද වෙයි; මෙඈ, මේ ආදිය; තෙමකතුතෙමකම් නම්, ස්වයංකර්තෘ ස්වයංකර්ම නම් වේ.

වි—'කොමුව බිඳෙයි' කී කල්හි බිඳීමට කර්තෘවූයේ කොටුව ම ය, කර්ම වූයේත් කොටුව ම ය, කොටුව අනිකකුගේ යෙදීමක් නැති ව තෙමේ ම බිඳවැටෙන්නේ 'බිඳේ'යයි කියයුතු වේ. කර්තෘ වූයේත් කර්ම වූයේත් තමා ම නුයි. කොටුව 'ස්වයංකර්තෘ ස්වයංකර්ම' නම් විය. ඔහුගේ ක්‍රියාව ද කර්මක්‍රියාව මෙන් සිද්ධ වේ. 'බිඳ = බිඳීමෙහි' යන ධාතු 'බිඳ'යි තබා අන්කරු වත්මන් එකබස් ඒප්‍රත්‍යය කොට ගැළපීමෙන් 'බිඳේ' යනු සිද්ධ යි. මේ ධාතුයෙහි පිළිපෙරළි හෝ මත්වැඩි හෝ නො වේ. ව්‍යවහාරානුරූප හෙයිනි. මේ කර්මක්‍රියා ස්වරූප වූ ස්වයංකර්තෘස්වයංකර්ම ක්‍රියා යි.

(60) ප–විදිවිසාහි, විධික්‍රියා විෂයෙහි; කරනු, කටයුතු ය; බොජනු, බුදියයුතු ය යන; ඈ වේ, (මේ) ආදිය වෙයි. මෙහි, මේ ක්‍රියායෙහි; නුපස, නුප්‍රත්‍යය; රුසී, අභිමත යි. කම්කිරිය, කර්මක්‍රියාව; ඉති, මෙසේ යි. හව්තැන්හි, සකලස්ථානයෙහි;

**තෙකලැ තෙසද රූ—නොවෙන් වැ හොත අනියම්**
**අරුතැ කල්අරුතැ—හොත කිරියසබහව් නම්.** (61)

---

යෙදෙන සේ, යුක්ත වන පරිද්දෙන්; බුහුබස්, බහුවචනය; සලසනු, සම්පාදනය කරනු.

**වි**—පෙර කර්තෘකාරක විධික්‍රියායෙහි කී ප්‍රකාර වූ විධ්‍යර්ථය කර්මය උක්ත වන සේ කර්මකාරක කොට කියවි කල්හි ධාතුහු කෙරෙන් පර ව නුප්‍රත්‍යය කටයුත්තේ ය. කරනු, බොජනු යනාදිය කර්ම විධික්‍රියා සි. කටයුතු ය බුදියයුතු ය යනු එහි අර්ථ වේ. ව්‍යාඛ්‍යානයෙහි ලබදු නො යෙදේ. **'යුතු'** යන්නෙන් ම කර්මාර්ථය ප්‍රකාශවන හෙයිනි. **'කර = කිරීමෙහි'** යන ධාතුහු කෙරෙනුදු **'බොජ = බොදුම්හි'** යන ධාතුහු කෙරෙනුදු නුප්‍රත්‍යය කළ පමණකින් පදසිද්ධිය වේ. එක උදාහරණයෙකින් ම අර්ථ සිද්ධිය වන කලැ දෙකක් දක්වනලද්දේ කුමට ය යත්? රකාර යෙන් පර වුවත් අන්‍යාක්ෂරයකින් පර වුවත් එළුවෙහි ප්‍රත්‍යය නකාරය ස්වරූපයෙන් ම (= දන්ත්‍ය ව ම) සිටින බැව් හඟවනු පිණිස සි. (මූර්ධන්‍ය) ප්‍රත්‍යයණකාරය ද හැමතන්හි මූර්ධන්‍යව ම යෙදේ. එහෙයින් පුරාතන ව්‍යාඛ්‍යානකාරයෝ ද රකාරාදි නිමිත්තකින් ණත්වයක් හෙළුයෙහි කිසිතැනෙකත් නො දක්වූහ. අන්‍ය ප්‍රාකෘතභාෂාවිශෙෂයන්හිදු මේ මෙසේ මැයි. මෙකල ඇතැම්හු **'රෂාභ්‍යාං නො ණඃ සමානපදෙ'** යනාදි සංස්කෘත ව්‍යාකරණවිධානය ලෙස සකුබසෙහි පැනෙන ණත්වය හෙළුබස වත් යොදා **'කරණු' 'මරණු'** යනාදීන් පරකීය ණත්වයක් ස්වකීය භාෂායෙහි ද සලකති. හේ විභ්‍රාන්තමතියකි, ඔවුන්ට ද ස්වභාෂා යෙහි **'කරවනු' 'මරවනු'** යනාදීන්ගේ සිද්ධිය යථොක්ත සංස්කෘත ව්‍යාකරණ නියමයට ප්‍රතිවිරුද්ධ ව ම සියබසෙහි ලැබෙයි. එතකුදු වුවත් ඒ පින්වත්හු තමන් කියන දෑ තමන් කරන දෑයට ම විරුද්ධ නො වේ ද යන පමණවත් දැනගත නො හෙත්.

**ඉති කම්කිරිය, කර්මක්‍රියාව නිමි.**

---

(61) **ප**—තෙකල, කාලත්‍රයෙහි; තෙසද, ශබ්දත්‍රයෙහි; රූ, රූපය; නොවෙන් වැ, පෘථග්භූත නො වැ; අනියම් අරුතැ හොත, අනියමාර්ථයෙහි හෝ; කල්අරුතැ හොත, කාලාර්ථයෙහි හෝ (සිද්ධ වූ); කිරිය, ක්‍රියා තොමෝ; අසබහව් නම්, අසම්භාව්‍ය නමු.

**මෙහි නපස රුසි. නොබැරි තැනැතියනපවග යත-වනතබැරි මුනිගුණ සියල් - උරදු කල්කරත ඔසුනි තනපා රදවන්. මෙඇගි. ලෝවිසා නො සිතිය හැකි, බව්නෙන් මොක් දැක්ක හැකි, සස් කිව යෙහෙකි, පුසිරි කල මැනැවි, මෙඇ ද අසබහව්ගි රුසි. පස යෙදෙන සේ සලසනු.** (62)

**ඉති අසබහව්කිරිය.**

---

(62) **ප**—මෙහි, මේ ක්‍රියායෙහි; නපස, නප්‍රත්‍යය; රුසි, රුචි යි; තැත් ඇතියන්, උත්සාහවතුන්; අපවග, අපවර්ගයට (= නිර්වාණයට); යත, ගමනය කරත්හොත්; නො බැරි, හැර නො වේ. සියල්මුනිගුණ, සකල බුද්ධගුණය තෙම; වනත, වර්ණනා කරත්හොත්; බැරි, හැර යි. උරද, ඖරස පුත්‍රයා; කල් කරත, කාලක්‍රියා කළ කල්හි; ඔසුනි, ඖෂධයෙන්; තනපා, ස්තන ක්ෂීරය; රදවන්, නිවර්තනය කරන්; මෙඇගී, මේ ආදි ආකාර ඇත්තේ යි.

ලෝවිසා, ලොකවිෂය; නො සිතිය, චින්තනය නො කළ හොත්; හැකි, ශක්‍ය යි. බව්නෙන්, භාවනායෙන්; මොක්, මොක්ෂය; දැක්ක, දර්ශනය කළහොත්; හැකි, ශක්‍ය යි; සස, සත්‍යය; කිව, කථනය කළහොත්; යෙහෙකි, ශුභයෙකි; පුසිරි, පුණ්‍යය; කළ, කළහොත්; මැනැවි, මනොඥ යි මෙඇ ද, මේ ආදි ප්‍රයොග ද; අසබහව්ගි, අසම්භාව්‍යයෙහි; රුසි,රුචි යි. පස,ප්‍රත්‍යය; යෙදෙන සේ, යොග්‍යවනපරිද්දෙන්; සලසනු, සම්පාදනය කරනු.

**වි**—අනියමාර්ථයෙහි හෝ කාලාර්ථයෙහි හෝ සිද්ධ වූ ක්‍රියාව '**අසම්භාව්‍ය**' නම. මෙහි ධාතුහු කෙරෙන් පර වැ **න**ප්‍රත්‍යය වේ. මේ ක්‍රියාව කාලත්‍රයට ද ශබ්දත්‍රයට **ද** වචනද්වයට **ද** ඒකාකාර රූප ඇත්තී වේ.

අනියමාර්ථය ද කාලාර්ථය **ද** එකවාක්‍යයෙහි ක්‍රියාද්වයක්හුගේ යෙදීමක් ඇති කල්හි ම ලැබේ. "**උත්සාහවතුන් නිර්වාණයට යතහොත් බැරි නො වේ**" යන අනියමාර්ථ උදාහරණයෙහි යත හොත්, බැරි නො වේ, යන දෙකින් ගමන ක්‍රියාවක් ද, (ප්‍රති ෂිද්ධ වූ) භවනක්‍රියාවක් දැයි ක්‍රියාද්වයක් ප්‍රකාශ වේ. මෙසින් පළමු ව ගමනක්‍රියාව අනියමයෙන් දක්වනලද්දී ය. සංස්කෘත මාගධ ව්‍යාකරණයන්හි දක්වනලද **පරිකල්පාර්ථ, ක්‍රියාතිපත්ති,** යන අර්ථද්වය ම මෙහි අනියමාර්ථ අසම්භාව්‍යක්‍රියාවට ඇතුළත් වේ. කාලාර්ථ අසම්භාව්‍යක්‍රියාව ඒ ව්‍යාකරණයන්හි සප්තම්‍යන්ත කෘදන්තක්‍රියා වශයෙන් භාවසප්තමී නාමයෙන් දක්වනලද්දී ය. '**ගොෂු දුහ්‍යමානාස්වාගතඃ**" '**දෙනුන් දෙවන** (= දෝනාලබන

කල්හි) **ආයේ ෂ'** යනු අවි යි. මෙහි දෙඟක්‍රියා කාලයෙන් ආගමනක්‍රියාකාලය ඟඟවන හෙයින් **'දෙවන'** යනු කාලාවී අසම්භාව්‍යක්‍රියා නම් වේ. ප්‍රධානත්‍වයෙන් නො සැලකියයුත්ත **'අසම්භාව්‍ය'** යයි කියනු ලැබේ.

**පදසිද්ධි:-**

අසම්භාව්‍යක්‍රියායෙහි **න** ප්‍රත්‍යය පමණක් මෙහි දක්දවනලදු වත් ජේතප්‍රයොගාගත අතිකුදු අසම්භාව්‍යප්‍රත්‍යය මෙහි ම සංග්‍රහ කොට දතයුත්තේ ය. **ත්**, අ යන ප්‍රත්‍යය දෙදෙනෙක් **'තපස'** යන්නහුගේ ද්විධාකරණයෙන් ලැබෙත්, **'කාල් යන් යන්' 'එනෙ කුදුවන්'** යනාදි තන්හි **'යන්, වන්'**යි **ත්**ප්‍රත්‍යය ද, "ඇසුව ලැබෙයි සුරඅැදුරන්හෙනුත් තුහි" යනාදි තන්හි **'ඇසුව'**යි **අ**ප්‍රත්‍යය ද පැනේ. සිදතෙහි ද **"සිතිය, දක්ක, කිව, කල"** යන ක්‍රියාපද මේ අප්‍රත්‍යය සලකා උදාහෘත යි. කිසිතැනෙක්හි අනියමාවී අසම්භාව්‍යය හා සමඟ **'හොත'** යන අව්‍යය **'හොත, හොත්, ඔත්'** යන තුන්පරිද්දෙකින් යෙදේ.

**'යා = ගමන්හි'** යන ධාතුහු කෙරෙන් **න**ප්‍රත්‍යය කොට ධාත්‍වන්තයහට මාත්‍රාහානි කළ කල්හි **'යත'** යනු වේ. **ත්**ප්‍රත්‍යය වී නම් **'යත්'** යනු වේ. අව්‍යයයුක්ත වැ යතහොත්, යත්හොත්, යතොත් යනු ද වේ.

**'වන = වැනීමෙහි'** යන ධාතුහු කෙරෙන් **න**ප්‍රත්‍යය කළ කල්හි **'වනත'** යනු වේ. **ත්**ප්‍රත්‍යයෙන් **'වනත්'** යනු ද 'වනත හොත්' 'වනත්හොත්' 'වනතොත්' යනු ද වේ.

**'කර = කිරීමෙහි'** යන්නෙන් කරත, කරත්, කරතහොත්, කරත්හොත්, කරතොත් යනු ද වේ.

**'සිත = සිතීමෙහි'** යන්නෙන් **අ**ප්‍රත්‍යය කොට යකාරාගම යෙන් හා පිළිපෙරැළියෙන්, **සිතිය** යනු වේ. වකාරාගමයෙන් **'සිතුව'** යනු ද වේ. සිතුව හොත, සිතුව හොත්, සිතුවොත් යනුදු පෙරසේ ම සිද්ධ යි.

**'දස = දක්මෙහි'** යන ධාතුවෙන් **අ**ප්‍රත්‍යය කොට ධාත්‍වන්ත ස්වරලොපය ද සකාරයහට කකාරාදෙශය ද ත්කාරයහට ද්විත්‍ව ද දකාරස්ථ අකාරයහට මාත්‍රාංශවෘද්ධි ද කිරීමෙන් **'දැක්ක'** යනු වේ. දැක්ක හොත, දැක්ක හොත්, දැක්කොත් යනු ද මෙයින් ම සිද්ධ වේ.

**'කී = කීමෙහි'** යන ධාතුවෙන් පර වැ **අ**ප්‍රත්‍යය කොට ධාත්‍වන්තයහට මාත්‍රාහානි ද ප්‍රකෘතිප්‍රත්‍යය මධ්‍යයෙහි වකාරාගම ද කිරීමෙන් **'කිව'** යනු වේ. කිව හොත, කිව හොත්, **කිවොත් යනුදු මෙයින් ම සිද්ධ වේ.**

**එකකතුකිරියෙනෙන් - පෙරකිරියට ඇ ආ ඊ**
**ඉන් ලායුතු ද වියුතු ද—මුසුබැවැ මින්මිනමිනි ද. (63)**

---

'කර = කිරීමෙහි' යන ධාතුවෙන් පර වැ අප්‍රත්‍යය කොට රකාරයහට අඞ්ගසූත්‍රයෙන් ළකාරාදෙශ කිරීමෙන් 'කළ' යනු වේ. කළ හොත, කළ හොත්, කළොත් යනුදු මෙසින් ම සිද්ධ වේ.

**ඉති අසබහවිකිරිය, අසම්භාව්‍යක්‍රියාව නිමි.**

---

(63) **ප—**එකකතුකිරියනෙන්, එකකර්තෘක ක්‍රියාදෙදෙන කුන් අතුරෙන්; පෙරකිරියට, පූර්ව වූ ක්‍රියාවට; ඇ ආ ඊ ඉන්, ඇ ආ ඊ ඉන් යන ප්‍රත්‍යය; ලායුතු ද, ලායන්තක් හා යුක්ත ව ද; වියුතු ද, (ලායන්නෙන්) වියුක්ත ව ද (වන්නේ ය); මුසුබැවැ, මිශ්‍රක්‍රියායෙහි; මින්මිනමිනි ද, මින් මින මිනි යන ප්‍රත්‍යය ද (වන්නේ යි).

**භා—**එක ම කර්තෘපදයක් ඇති එහෙයින් සමානකර්තෘක වූ ක්‍රියාදෙක කින් පළමු වූ ක්‍රියාව පූර්වක්‍රියා නම. ඒ පූර්වක්‍රියාර්ථය කිවමනා කල්හි ධාතුනු කෙරෙන් පර වැ **ඇ, ආ, ඊ, ඉන්, ඇලා, ආලා, ඊලා, ඉන්ලා** යන ප්‍රත්‍යය යොග්‍යපරිද්දෙන් යොදනු ලැබේ.

**වි—**සංස්කෘතශාබ්දිකයෝ ද මේ පූර්වක්‍රියාර්ථය මෙසේ ම දක්වූහ. "**සමානකර්තෘකයොඃ පූර්වකාලෙ**" යනු (පාණිනි 3. 4. 21) සූත්‍ර යි. සමානකර්තෘක වූ ධාත්වර්ථයන් දෙදෙනකුන් අතුරෙහි පූර්වකාලයෙහි විද්‍යමාන වූ ධාතුහු කෙරෙන් ක්ත්වාප්‍රත්‍යය (=පූර්ව ක්‍රියාප්‍රත්‍යය) වෙයි යනු භාව යි. එහි '**ක්ත්වා**'යි ප්‍රත්‍යයරූපයෙන් විශෙෂත්වය පමණෙකි. පූර්වක්‍රියාර්ථය එකාකාර මැයි "**භුක්ත්වා ව්‍රජති**" යනු උදාහරණ යි. "**වළඳා යෙයි**" යනු අර්ථ යි. මෙහි වැළඳීම ය යාම ය යන ධාත්වර්ථ දෙක ම එකකර්තෘක ය. වැළඳූ තැනැත්තේ ම යෙයි, යන තැනැත්තේ ම වැළඳුයේ ය, යන මේ එකකර්තෘකත්වය ඇති හෙයින් පළමු වූ වැළඳීම පූර්වක්‍රියා ය. පසු වූ ගමනක්‍රියාව අපරක්‍රියා යි. මේ අපරක්‍රියාව ද මතු අපරක්‍රියාවක් ඇතහොත් පූර්වක්‍රියා වෙයි. එවිට "**වළඳා ගොස් නිදයි**" යනාදීන් පූර්වක්‍රියා දෙකෙක් වෙයි. මේ ක්‍රමයෙන් එකකර්තෘක අපරක්‍රියා වක් බලා නොයෙක් පූර්වක්‍රියාවෝ සිදුවෙති. පූර්වක්‍රියාව වනාහි අපරක්‍රියාවට නිත්‍යයෙන් විශෙෂණ ය. අපරක්‍රියාව ඊට විශෙෂ්‍ය යි. යම්කලෙක පූර්වක්‍රියා (=විශෙෂණක්‍රියා) දෙකක් හෝ වැඩි යක් හෝ වේ නම් පළමුවිශෙෂණයට දෙවැනි විශෙෂණය විශෙෂ්‍ය වේ. දෙවැනි විශෙෂණයට තුන්වැනි විශෙෂණය

**ඇ, බවණැව් තැරැ යහ විඳින්.** (64)
**ආ, පෙරුම් පුරා බුදු වූ.** (65)
**ඊ, ගිරිනිල්මල්කැනෙකැයි සැකී.** (66)
**ඉන්, පවිටු කොබැ ගොසින් රැකේ.** (67)

විශෙෂ්‍ය වේ. ඒ තුන්වැනි ක්‍රියාව ද සතරවැනි ආදි අපර ක්‍රියාව කට විශෙෂණ වේ. මේ හයින් යෙදෙනතාක් පූර්වක්‍රියාවන්ගේ විශෙෂණත්වය වේ. මේ ක්‍රියාවෝ ද ඒ පිළිවෙළින් ම යෙදිය යුත්තාහ. "පිස, වළඳ, නිදයි" "නා, කා, බි, සෙයි" යනාදි වශයෙනි. "වළඳ, පිස, නිදයි" කියා හෝ "කා, නා, බී, සෙයි" කියා හෝ පෙර පසු කොට ක්‍රියා පිළිවෙළ වරදවා යෙදුව හොත් සදොස් වේ. කිසිවිටෙක භින්නකර්තෘක වූ ද පූර්වක්‍රියා සිද්ධ වේ. ඊට හෙත්වර්ථක්‍රියා යයි ද වෛයාකරණයෝ කියත්. "සිංහයා දැක බිය උපදී" යනු මෙනි. 'දැක' යනු 'දැකීම හෙතුකොට' යන අර්ථ සි. මෙහි දර්ශනක්‍රියාව කිසියම් සත්වයක්හුගේ ය. උත්පත්ති ක්‍රියාව භීතියගේ ය. එහෙයින් මේ ක්‍රියා දෙක භින්නකර්තෘක වේ. එතකුදු වුවත් භීතියත් ඒ සත්වයාගේ ම අන්තරඞ්ගගුණයක් හෙයින් මෙහි සමානකර්තෘකත්වයාගේ ලෙශයෙක් ද විද්‍යමාන සි.

**පූර්වක්‍රියා උදාහරණ.**

(64) ප—ඇ, ඇප්‍රත්‍යය වේ; බවණැව්, භවාර්ණවය; තැරැ, තරණය කොට; යහ, සුඛය; විඳින්, විඳනය කෙරෙත්. මෙහි තරණය, විඳනය යන එකකර්තෘක වූ ධාත්වර්ථ දෙකින් පූර්ව වූ තරණාර්ථය පූර්වක්‍රියාප්‍රත්‍යයෙන් දක්වනලදි. 'තර = පිහිනීමෙහි' යන ධාතුහු කෙරෙන් ඇප්‍රත්‍යය කොට තකාරස්ථ අකාරයහට මාත්‍රාංශවෘද්ධි ද පූර්වස්වරලොපසන්ධි ද කිරීමෙන් 'තැරැ' යනු සිද්ධ සි.

(65) ආ, ආප්‍රත්‍යය වේ; පෙරුම්, පාරමීන්; පුරා, පූරණය කොට; බුදු වූ, බුද්ධ වූහ. 'පූර = පිරීමෙහි' යන ධාතුහු කෙරෙන් ආප්‍රත්‍යය සි.

(66) ඊ, ඊප්‍රත්‍යය වේ; ගිරිනිල්මල්කැනෙකැයි, ගින්නේර පුෂ්පස්තවකයෙකැයි; සැකී, ශඞ්කිත වැ. 'සැක = සැශඞ්කාහි' යන ධාතුහු කෙරෙන් ඊප්‍රත්‍යය සි.

(67) ඉන්, ඉන්ප්‍රත්‍යය වේ; පවිටු, පාපිෂ්ඨ තෙම; කොබැ, කොතැන්හි; ගොසින්, ගමනය කොට, රැකේ, රක්ෂිතවන්නේ ද. 'ගම = ගමන්හි' යන ධාතුහු කෙරෙන් ඉන්ප්‍රත්‍යය කොට 'ගම+ ඉන්' කියා තුබූතන්හි මකාරයහට අඞ්ගසූත්‍රයෙන් සකාරාදෙශ ද ගකාරස්ථ අකාරයහට පිළිපෙරළි ඔකාරාදෙශ ද කොට පූර්වස්වර ලොපසන්ධිය කළ කල්හි 'ගොසින්' යනු වේ.

**ඇලා, දිවුමඟුල් මනඟු දකැලා නැවැත්.** (68)
**ආලා, කරණී පිරික්සාලා කරනු.** (69)
**ඊලා, බමර පොසොන්පතරැ මී බිලා යේ.** (70)
**ඉන්ලා, සගයහ ගොසින්ලා නගමව්.** (71)
**දකරින් අවුත්, අවුදු, ගොස් යනුදු රුසී.** (72)
**මුදගනි, කියාලන්නේ ඈ පෙරකිරියපසතින් වූ ගනලපස ඈ දු වූ සේ.** (73)

**ඉති පෙරකිරිය.**

---

(68) **ප—ඇලා,** ඇලාප්‍රත්‍යය වේ; දිවුමඟුල්, දෘෂ්ටමඞ්ගලිකා තොමෝ; මනඟු, මාතඞ්ග (පණ්ඩිතයා); දකැලා, දශීනය කොට; නැවැත්, නිවෘත්ත වූ. **'දස = දක්මෙහි'** යන ධාතු යි. **සකාරය** හට කකාරාදෙශ ද දකාරසථ සවරයහට මාත්‍රාංශවෘද්ධි ද වී.

(69) **ප—ආලා,** ආලාප්‍රත්‍යය වේ; කරණී, කර්තව්‍යය; පිරික් සාලා, පරීක්‍ෂා කොටලා; කරනු, සපයනු. පිරි පූර්ව **'ඉක්ඛ = බැල් මෙහි'** යන ධාතු යි.

(70) **ප-ඊලා,ඊලා**ප්‍රත්‍යය වේ; බමර, භෘඞ්ග තෙම; පොසොන් පතරැ, ප්‍රසූනපත්‍රයෙහි; මී, මධුව; බීලා, පානය කොටලා; යේ, ගමනය කෙරේ. **'පා = පීමෙහි'** යන ධාතු යි. බකාරාදෙශ යි.

(71) **ප—ඉන්ලා,** ඉන්ලාප්‍රත්‍යය වේ; සගයහ, සවර්ගසුඛය; ගොසින්ලා, ගමනය කොට; නගමව්, නිරීක්‍ෂණය කරව්. **'ගොසින්'** යන්නෙහි (67) කී පරිද්දෙන් සිද්ධිය වේ.

(72) **ප—**දකරින්, (කවෙහි කි) **දකාරය** හෙතුකොටගෙන; **අවුත්** අවුදු ගොස් යනුදු, අවුත් අවුදු ගොස් යන රූපත්‍රය ද; රුසී, රුචි යි. අවුත් අවුදු යන දෙක අඋපසර්ගපූර්ව යි. ගමධාතු වට හා පූර්වක්‍රියාප්‍රත්‍යයට **වුත්,** වුදු යනු ආදෙශ වේ. **ගොස්** යනු පෙර කී සෙයින් ගමධාතුවෙන් සිද්ධ යි.

(73) **ප**—මුදගනි, මුක්තකොට ගන්නේ ය; කියාලන්නේ, කථනය කොට ලන්නේ ය; ඈ, මේ (ආදිය); පෙරකිරියපස තින් වූ; පූර්වක්‍රියාප්‍රත්‍යයාන්තයෙන් වූ; ගනලපස ඈ, ගනප්‍රත්‍යය ලප්‍රත්‍යය ආදිය; දු වූ සේ, ධාතු වූ ආකාර යි.

**වි—මුදු, කියා** යන පූර්වක්‍රියාවන් කෙරෙන් පර වැ ගනප්‍රත්‍ය ය ද, ලප්‍රත්‍යය ද ධාතුන් මෙන් යොද ඔවුන් කෙරෙන් කාරකත්‍ර යෙහි ම ත්‍රෛකාලික අපරක්‍රියාප්‍රත්‍යය කිරීමෙන් පූර්වාපර ක්‍රියා වන්ගේ සමුදය වූ "මුදගනි, කියාලන්නේ" යනාදීන්ගේ සිද්ධිය වේ.

**ඉති පෙරකිරිය, පූර්වක්‍රියාව නිමි.**

## මින්, මරසක් තනමින් පැලා. (74)

(74) ප—මින්, මින්ප්‍රත්‍යය වේ; මරසක්, මාරසේනා තොමෝ; තනමින්, කම්පිතවෙමින්; පැලා, පලාගියා.

වි—'තන = කැළුම්හි' යන ධාතුහු කෙරෙන් මින්ප්‍රත්‍යය යි. මෙහි මිශ්‍රභාවය නම් පලායනක්‍රියාව කම්පනක්‍රියාවෙන් මුසු ව ම පැවැති බව ය. යම්තාක් පලායාම වී ද ඒතාක් කම්පාව ද පැවැත්තී යයි සේ යි. සෙස්සෙහි ද මිශ්‍රභාවය මේ නයින් සලකනු. මාගධ සංස්කෘතාදියෙහි 'මිශ්‍රක්‍රියා' නාමයෙන් ක්‍රියාසංඥාවක් නැතත් මේ අර්ථය කර්තෘකාරක කෘදන්තප්‍රත්‍යය වශයෙන් සිද්ධ යි. මාගධව්‍යාකරණයෙහි කර්තෘකාරක මාන අන්ත, යන දෙකින් හා ශේෂාර්ථ වූ ස්සං, න්තු, මාන, ආන යන ප්‍රත්‍යය සතරෙන් ද සිද්ධ වන කුරුමාන, කරොන්ත, කරිස්සං, කරොන්තු, කරාන යන ශබ්දයන්ගෙනුදු මෙකී මිශ්‍රක්‍රියාර්ථය ප්‍රකාශ වේ. පාණිනි ව්‍යාකරණයෙහි 'ලක්ෂණහෙත්වොඃ ක්‍රියායාඃ" (3. 2. 126) යනු වෙන් ක්‍රියාවිඝ්න, ක්‍රියාජනක යන දෙඅර්ථයෙහි ලට්හට ශතෘ, ශානච් ආදෙශ කිරීමෙන් මිශ්‍රක්‍රියාර්ථය සිද්ධ කෙරෙත්. "ශයානා භුඤ්ජතෙ යවනාඃ. තිෂ්ඨන්තො'නුශාසති ගණකාඃ" "යවනයෝ ශයනය කෙරෙමින් වළඳත්, ගණකාමාත්‍යයෝ සිටිමින් අනුශාසනා කෙරෙත්" යනු ක්‍රියාවිඝ්නයට උදාහරණ යි. මෙහි ශයනය භොජනක්‍රියාවට විඝ්නය වෙයි. සිටීම අනුශාසනක්‍රියාවට විඝ්නය වේ. මෙ ද මිශ්‍රක්‍රියා යි. "අර්ජයන් වසති, අධීයානො වසති"* "රැස් කෙරෙමින් වෙසෙයි, හදාරමින් වෙසෙයි" යනු ක්‍රියාජනක හෙතුවට උදාහරණ යි. මෙහි රැස්කිරිම ද, හැදෑරීම ද වාසයාගේ ඵලය කොට ඇත්තෙන් වසනක්‍රියාවට ජනකහෙතු වේ. ප්‍රාකෘතයෙහි † වර්තමාන කාලාර්ථයෙහි මෙකී "ශතෘ, ශානච්" දෙදෙනාහට න්ත, මාණ යන ආදෙශ කිරීමෙන් "හසෙංතො හසංතො හසමාණො" යනාදිය සිද්ධ කෙරෙත්. සිංහල ව්‍යාකරණයෙහි මින්, මින, මිනි යන ප්‍රත්‍යයත්‍රය මෙකී මාගධ මානප්‍රත්‍යයෙන් හෝ ප්‍රාකෘත මාණාදෙශයෙන් හෝ තද්භවරූප වේ.

* "ශයානාඃ, අධීයානාඃ" යන දෙතැන ශානච් ආදෙශයෙන් වූ ශයාන, අධීයාන යන ශබ්දයෝ ය. "තිෂ්ඨන්තඃ, අර්ජයන්" යන දෙතැන ශතෘ ආදෙශයෙන් වූ තිෂ්ඨත්, අර්ජයත් යන ශබ්දයෝ යි.

† අපභ්‍රංශව්‍යාකරණයෙහි කාලත්‍රය මිශ්‍රක්‍රියායෙහි ම ශතෘප්‍රත්‍යය වේ'

මින, සිකිනට පියමින. (75)

මිනි, මුනිරිවි උදුදෙන නිතුප්කැන් මිලිසෙමිනි අතුරු දහන් බිජී. (76)

ඉති කිරියමුසු.

කල්කිරිය අරුත් පවසනුවස් මෙහි සන්පමණෙක් වියන ලදි. විතර වහරෙන් විමසනු. (77)

කිරියඅදියර සත්වනු.

---

දසින් නෙමෙන් හොත—කැරූ අරුතට නිසි පසන්
සපයා සදන් පසරුත් –හිමි නොලැගැ ලොවැ වහරන්.(1)

---

(75 ප—මින, මිනප්‍රත්‍යය වේ; සිකිනට, ශිඛින්ට; පියමින, හරිමින්. 'පිය = පියවිමෙහි' යන ධාතු යි.

(76) ප—මිනි, මිනිප්‍රත්‍යය වේ; මුනිරිවි, සඡ්ඥ නමැති සූර්‍ය්‍යයා; උදුදෙන, උදයප්‍රාප්තවන කල්හි; නිත්උළුකැන්, නීඑක නමැති තාරකාසමූහ තෙම; මිලි සෙමිනි, ම්ලාන වෙමින්; අතුරු දහන් බිජී, අන්තර්ධාන භජනය කෙළේ. 'මල = මැලැමෙහි' යන ධාතු 'මල'යි තබා මිනිප්‍රත්‍යය කොට ධාතුප්‍රත්‍යයමධ්‍යයෙහි අඛග සූත්‍රයෙන් සවරසහිත යකාරයක් ආගම කොට 'මලයමිනි'යි සිටි කලැ මකාරලකාරයකාරසඵ සවරයන්ට පිලිපෙරළි කිරීමෙන් 'මිලිසෙමිනි'යි සිද්ධ යි.

ඉති කිරියමුසු, ක්‍රියාමිශ්‍ර නිමි.

(77) ප—කල්කිරිය අරුත්, කාලාවික්‍රියාවියන්; පවසනුවස්, ප්‍රකාශකරනු පිණිස; මෙහි, මේ අධිකාරයෙහි; සන්පමණෙක්, සංක්‍ෂෙපමාත්‍රයෙක්; වියනලදි, කියනලද්දේ ය; විතර, විස්තරය; වහරෙන්, (ශිෂ්ට)ව්‍යවහාරයෙන්; විමසනු, විමංසනය කරනු.

සපතම වූ ක්‍රියාධිකාරය නිමි.

---

ප්‍රත්‍යයාවාධිකාරය.

“දසින් නෙමෙන් හොත” යනාදිය උපාඛගසූත්‍ර යි.

(1) ප—දසින් හොත, ධාතුයෙන් (පර වැ) හෝ; නෙමෙන් හොත, නාමයෙන් (පර වැ) හෝ; අරුතට නිසි, අර්ථයට යොග්‍ය වූ;

**දසින් වන් පස සකරු අරුත්හි හව්හි ද වේ. කටයුතු = කරණී. පියයුතු = පැන්. බුදියයුතු = බොජුන්. කෑයුතු = කදු. ගොතනලද = ගත්. දෙනලද = දන් මෙඈ කම්කරු පසින් නිපන්.** (2)

---

පසන් කැරු, ප්‍රත්‍යයන් කොට; ලොවැ, ලොකයෙහි; වහරන්, (ජේක) ව්‍යවහාරයන් සම්බන්ධ වූ; හිම්, සීමාව; නො ලැඟැ, උල්ලඞ්ඝනය නො කොට; පසරුත්සදන්, ප්‍රත්‍යාර්ථශබ්දයන්; සපයා, සම්පාදනය කරවි.

**වි** — අන්‍යවෛයාකරණයන් විසින් කෘතතද්ධිත යන ප්‍රක්‍රියා ද්වයකින් සිද්ධකරනලද ද්විවිධනාමයන් ශාස්ත්‍රයාගේ සංක්ෂිප්ත භාවය සඳහා ප්‍රත්‍යයාර්ථ නමින් එක ම අධිකාරයෙක්හි ලා දක්වනු කැමැති ආචාර්‍ය්‍යපාදයෝ **'දසින් නෙමෙන් හොත'** යනාදීන් මේ උපාඞ්ගසූත්‍රය රචනා කළහ. ධාතුවකින් පර කොට හෝ නාමයකින් පර කොට හෝ ප්‍රත්‍යය කිරීමෙන් සිද්ධ වූ ලිඞ්ග විභක්ත්‍යාදිය භජනයකරන ශබ්දයෝ ප්‍රත්‍යයාර්ථශබ්ද නම් වෙති. එහිදු ධාතුයෙන් හා ප්‍රත්‍යයෙන් සිද්ධ වන ශබ්දයෝ පරසංඥ වශයෙන් **කෘදන්ත** නම් වෙති. නාමයෙන් හා ප්‍රත්‍යයෙන් සිද්ධ වන්නාහු **'තද්ධිත'** නම් වෙත්. මේ දෙවැදෑරුම් නාමයෝ ම ස්වභාෂායෙහි පණ්ඩිත ලොකයාගේ ව්‍යවහාර සීමාවන් නො ඉක්මවා සිද්ධ කටයුත්තාහු ය යනු සූත්‍රකාරයන්ගේ අභිප්‍රාය වේ.

**කෘදන්තප්‍රත්‍යයාර්ථශබ්ද.**

(2) **ප**—දසින් වන පස, ධාතුයෙන් වන්නා වූ ප්‍රත්‍යය; සකරු අරුත්හි, ෂට්කාරකාර්ථයෙහි ද; හව්හි ද, භාවයෙහි ද; වේ, වන්නේ යි. කටයුතු, කර්තව්‍යය; කරණී, කරණී නමි. **'කර = කිරීමෙහි'** යන ධාතුහු කෙරෙන් පර ව කර්මකාරකයෙහි **ණී**ප්‍රත්‍යය යි.

පියයුතු, පානය කටයුතු වූයේ; පැන්, පැන් නමි. **'පා = පීමෙහි'** යන ධාතුහු කෙරෙන් කර්මයෙහි **ඈන්**ප්‍රත්‍යය යි.

බුදියයුතු, භොජනය කටයුතු වූයේ; බොජුන්, බොජුන් නමි. **'බොජ = බොදුමෙහි'** යන ධාතුහු කෙරෙන් **උන්**ප්‍රත්‍යය යි.

කෑයුතු, ඛාදනය කටයුතු වූයේ; කදු, කදු නමි. **'කද = කෑමෙහි'** යන ධාතුහු කෙරෙන් **උ**ප්‍රත්‍යය යි.

ගොතනලද, ග්‍රථනය කරනලද්දේ; ගත්, ගත් නමි, **'ගොත= ගෙතීමෙහි'** යන ධාතුහු කෙරෙන් **අ**ප්‍රත්‍යය කොට ධාත්වන්ත සහිත අප්‍රත්‍යයහට ලොප් හා පිළිපෙරළි ද කිරීමෙන් **'ගත්'** යනු වේ.

**කරනුයේ = කතු. ගණන්නේ = ගැණි. විදිනේ = වැදි. යදනේ = යදී. දුවන්නේ = දුවා. පසින් නො යන්නේ = පන්වා. උරෙන් යනුයේ = උරා. පැන් ඉස්නේ = පැනි. සොබන, කොබන, ලොබන, ලළන, ගළන, බබළන, වස්නා, තුස්නා, මුස්නා, උදුළ, හමළ, වහළ, තිපි, සිපි, කුමුටු, කැපි, දූපි, කිපි මෙඈ කතුකරුපසින් නිපන්.** (3)

---

දෙනලද, දානයකරනලද්දේ; දන්, දන් නම්. '**දා = දීමෙහි**' යන ධාතුව හා **අන්**ප්‍රත්‍යය යි. මෙඈ, මේ ආදිය; කම්කරුපසින්, කර්මකාරකප්‍රත්‍යයෙන්; නිපන්, නිෂ්පන්න යි ( = සිද්ධ යි.)

**වි**—කරණී ආදි වූ මෙහි උදාහෘතශබ්දයෝ **ඒ ඒ** ධාතුව සම්බන්ධ වූ ක්‍රියාර්ථයට කර්මභූතවස්තුවක් අපෙක්ෂා කොට ප්‍රත්‍යය වත් වැ සිද්ධ හෙයින් කර්මකාරකප්‍රත්‍යයෙන් නිෂ්පන්න යහ යි කියනලදි. මතු කර්තෘකාරකාදීන්ගේ අපෙක්ෂා **ද** මේ නයින් සැලකිය යුතු.

(3) **ප**—කරනුයේ, (ක්‍රියාව) කරන තැනැත්තේ; කතු, කතු නම්. **කර**ධාතුහු කෙරෙන් කර්තෘකාරකයෙහි **උ**ප්‍රත්‍යය කොට **ර**කාරයහට **ත**කාරාදෙශ කිරීමෙන් '**කතු**'යි සිද්ධ යි.

ගණන්නේ, ගණනය (= ගිණීම) කරන තැනැත්තේ; ගැණි, ගැණි නම්. '**ගණ = ගිණීමෙහි**' යන ධාතුයෙන් පර වැ **ඉ**ප්‍රත්‍යය හා මාත්‍රාංශවෘද්ධිය යි.

විදිනේ, ව්‍යධනය කරන තැනැත්තේ; වැදි, වැදි නම්. '**විද** = **විදීමෙහි**' යන ධාතුහු කෙරෙන් **ඉ**ප්‍රත්‍යය හා පිළිපෙරළි යි.

යදනේ, යාච්ඤාකරන තැනැත්තේ; යදී, යදී නම්. '**යද = යැදීමෙහි**' යන ධාතුහු කෙරෙන් **ඉ**ප්‍රත්‍යය හා මාත්‍රාවෘද්ධි යි.

දුවන්නේ, ධාවනය කරන තැනැත්තේ; දුවා, දුවා නම්. '**දුව = දිවීමෙහි**' යන ධාතුහු කෙරෙන් **ආ**ප්‍රත්‍යය හා **ද**කාරස්ථ **අ**කාරයහට මාත්‍රාවෘද්ධි යි.

පසින්, පාදයෙන්; නො යන්නේ, ගමනය නො කරන තැනැත්තේ; පන්වා, පන්වා නම්. '**පසින්**'යි තෘතීයාන්තයා පූර්වපද කොට '**නො**' යන අව්‍යයා කෙරෙන් පර වැ '**වා = ගමන්හි**' යන ධාතුහු කෙරෙන් **ආ**ප්‍රත්‍යය කොට '**පසින් නො වා ආ**'යි තබා විභක්ති සමාස කොට '**පා නො වා ආ**' කියා සිටි කල්හි **පා**ශබ්දයාගේ ආකාරයහට මාත්‍රාහානි **ද** නො ශබ්දයාගේ ඔකාරයහට ලොප් **ද** ධාතුප්‍රත්‍යය දෙදෙනා ගැලපීමෙහි පූර්වස්වර ලොපසන්ධි **ද** කිරීමෙන් '**පන්වා**' යනු වේ.

උරෙන්, වක්‍ෂසින්; යනුයේ, ගමනය කරන තැනැත්තේ; උරා, උරු නම්. 'උරෙන්' යන තෘතීයාන්තයා උපපද කොට ඇති 'ගම = ගමන්හි' යන ධාතුහු කෙරෙන් අප්‍රත්‍යය කොට විභක්ති සමාස කොට 'උරගම අ' කියා සිටි කලැ අඞගසූත්‍රයෙන් ධාතුහට ලොප් වැ පූර්වස්වරලොපසන්ධි වැ අන්තස්වරයහට මාත්‍රාවෘද්ධි වැ 'උරග' යනු වේ.

පැන්, පානීයය; ඉස්නේ, කැමැති තැනැත්තේ; පැනි, පැනි නම්. පාධාතුහු කෙරෙන් ඇණිප්‍රත්‍යය යි.

සොබන, ශොභමාන වන්නේ ය—'සොබ = හෙබීමෙහි'
ඛොබන, ක්‍ෂොභ වන්නේ ය—'ඛොබ = ඇලලීමෙහි'
ලොබන, ලොභ වන්නේ ය—'ලොබ = ලොබෙහි'
ලළන, ලලිත වන්නේ ය—'ලළ = ලෙළදීමෙහි'
ගළන, ගලිත වන්නේ ය—'ගළ = ගිළිහීමෙහි'
බබළන, භ්‍රාජමාන වන්නේ ය—'බබළ = බැබිළීමෙහි'

මේ සතැනෙහි නප්‍රත්‍යය යි.

වස්නා, වර්ෂණය කරන්නේ ය—'වස = වැසීමෙහි'
තුස්නා, තුෂ්ට වන්නේ ය—තුස = තුටුයෙහි'
මුස්නා, මුක්ත කරන්නේ ය—'මුද = ගැලවීමෙහි'

මේ තුන්තන්හි නාප්‍රත්‍යය යි.

උදුළ, උජ්ජ්වලිත වූයේ ය. උපූර්ව 'දල = දිලීමෙහි' යන ධාතුහු කෙරෙන් අප්‍රත්‍යය කොට දකාරයට අකාරයහට පිලිපෙරැළි කළ කල්හි 'උදුල' කියා වේ. පක්‍ෂයෙක්හි ලකාරය හට ළකාරාදෙශ කළ කල්හි 'උදුළ' යනු වේ.

හමළ, වහනය වූයේ ය—'හම = වැහීමෙහි', ළප්‍රත්‍යය යි.

වහළ, වැරැණේ ය—'වහර = වැහැරීමෙහි', ළප්‍රත්‍යය යි, රහට ලොප යි.

තිවි, තුෂට වූයේ ය—'තුස = තුටුයෙහි' යන්නෙන් ඉප්‍රත්‍යය කොට සහට වකාරාදෙශ ද පිලිපෙරැළි ද කළ කල්හි 'තිවි' යනු වේ.

සිවි, සවිත වූයේ ය—'සිවි = සිවීමෙහි', ඉප්‍රත්‍යය යි.

කුමුවු, නිමග්න වූයේ ය—'කුමුද = කිමිදීමෙහි', උප්‍රත්‍යය යි, දකාරයහට වකාරාදෙශ වේ.

කැපි, කම්පිත වූයේ ය—'කැපි = වෙවුලුම්හි', ඉප්‍රත්‍යය යි.

දැපි, දෘප්ත වූයේ ය—'දප = එඩියෙහි', ඉප්‍රත්‍යය යි. දකාරයට අකාරයහට මාත්‍රාංශවෘද්ධි වේ.

**ඛොටු, වැටු, ගැහැටු, වුහුටු, දුටු, පිවිටු, ඛැපු, සැපු, දැපු, ලූ, බැලූ, ගැලූ, දුරු, පිරු, වැරු, සැරු, මැරු, වැළු, හෙළු, නෙළු, වෙළු, පැළු, කිසු, ලිසු, පිසු, කළු, හළු, වළු, සුන්, බුන්, හුන්, වුන්, දුන්, එන, කන, දෙන මෙඈ කම්කතුකරු දෙකට සමපසින් නිපන්.** (4)

---

**කිපි,** කුපිත වූයේ ය. '**කිප = කිපිමෙහි**' **ඉ**ප්‍රත්‍යය යි.

මෙඈ, මේ ආදිය; කතුකරුපසින්, කර්තෘකාරකප්‍රත්‍යයෙන්; නිපන්, නිෂ්පන්න යි.

(4) **ඛොටු,** ඛණ්ඩනකරන ලද්දේ හෝ ඛණ්ඩනය කළ තැනැත්තේ ය. '**ඛොට = ඛොටිමෙහි**' **උ**ප්‍රත්‍යය යි. ඔකාරයහට පිලිපෙරැළි **එ**කාරාදෙශ යි.

**වැටු**, වර්තනය කරනලද්දේ හෝ වර්තනය කළ තැනැත්තේ ය. '**වට = වැටිමෙහි**' **උ**ප්‍රත්‍යය යි. වකාරසථ අකාරයහට මාත්‍රාංශවෘද්ධි යි.

**ගැහැටු,** ඝට්ටනය කරනලද්දේ හෝ ඝට්ටනය කළ තැනැත් තේ ය. '**ගැහැට = ගැහැටුමෙහි**' **උ**ප්‍රත්‍යය යි.

**වුහුටු,** විසර්ජනය (හැරීම) කරනලද්දේ හෝ විසර්ජනය කළ තැනැත්තේ ය. විපූර්ව '**සද = හැරිමෙහි**' යන ධාතුහු කෙරෙන් **උ**ප්‍රත්‍යය කොට **ස**කාරයහට **හ**කාර ද, දකාරය හට **ට**කාර ද ආදෙශ් කොට පිලිපෙරැළි කිරීමෙන් '**වුහුටු**' යනු වේ.

**දුටු,** දර්ශනය කරනලද්දේ හෝ දර්ශනය කළ තැනැත්තේ ය. '**දස=දැකුම්හි**' යන්තෙන් **උ**ප්‍රත්‍යය යි. **ස**කාරයහට **ට**කාරා දෙශ ද පිලිපෙරැළි ද වී

**පිවිටු,** ප්‍රවෙශ කරනලද්දේ හෝ ප්‍රවෙශ කළ තැනැත්තේ ය. පපූර්ව '**විස = පිවිසිමෙහි**' යන්තෙන් **උ**ප්‍රත්‍යය යි. **ස**කාරය හට **ට**කාරාදෙශ ද උපසර්ගයහට පිලිපෙරැළි ද වී.

**ඛැපු,** ඡෙදනය කරනලද්දේ හෝ ඡෙදනය කළ තැනැත්තේ ය. '**ඛප = ඛිඳීමෙහි**' **උ**ප්‍රත්‍යය යි. මාත්‍රාංශවෘද්ධි වී.

**සැපු,** වර්ණය (= සැපීම) කරනලද්දේ හෝ වර්ණය කළ තැනැත්තේ ය. '**සප = සැපීමෙහි**' කාර්‍ය්‍ය පෙරසේ මැ යි.

**දැපු,** ජල්පනය (= කීම) කරනලද්දේ හෝ ජල්පනය කළ තැනැත්තේ ය. '**දප = දැපීමෙහි**' පෙරසේ මැ යි.

**ඕ,** ප්‍රක්‍ෂෙප (= බහාලීම) කරනලද්දේ හෝ ප්‍රක්‍ෂෙප කළ තැනැත්තේ ය. **'ලා = ලීමෙකි'** උප්‍රත්‍යය යි.

**බැලූ,** අවලොකනය කරනලද්දේ හෝ අවලොකනය කළ තැනැත්තේ ය. 'බල = බැලීමෙකි' උප්‍රත්‍යය යි. මාත්‍රාංශ වෘද්ධි වී.

**ගැලූ,** නිමග්න කරනලද්දේ හෝ නිමග්න කළ තැනැත්තේ ය. 'ගල = ගැලීමෙකි' පෙරසේ මැ යි.

**දුරු,** ධරනලද්දේ හෝ ධැරීම කළ තැනැත්තේ ය. 'දර = දූරීමෙකි' යන්නෙන් උප්‍රත්‍යය යි. පිලිපෙරැළි ද වී.

**පිරු,** පුරනලද්දේ හෝ පූරණය කළ තැනැත්තේ ය. පූර = පිරීමෙකි' පෙරසේ මැ යි.

**වැරු,** වාරණය (= වැළකීම) කරනලද්දේ හෝ වාරණය කළ තැනැත්තේ ය. 'වර = වැරීමෙකි' උප්‍රත්‍යය යි. මාත්‍රාංශ වෘද්ධි වී.

**සැරු,** සජ්ජනය (= සැරසීම) කරනලද්දේ හෝ සජ්ජනය කළ තැනැත්තේ ය. 'සර = සැරැහීමෙකි' පෙරසේ මැ යි.

**මැරු,** මාරණය කරනලද්දේ හෝ මාරණය කළ තැනැත්තේ ය. 'මර = මැරීමෙකි' පෙරසේ මැ යි.

**වැළු,** වළහනලද්දේ හෝ වැළහූ තැනැත්තේ ය. 'වළ = වැළහීමෙකි'* පෙරසේ මැ යි.

**හෙළු,** පතනය කරනලද්දේ හෝ පතනය කළ තැනැත්තේ ය. 'හෙළ = හෙළීමෙකි'

**නෙළු,** අවචිනනය (= නෙළීම) කරනලද්දේ හෝ අවචිනනය කළ තැනැත්තේ ය. 'නෙළ = නෙළීමෙකි'.

**වෙළු,** වෙෂ්ටනය කරනලද්දේ හෝ වෙෂ්ටනය කළ තැනැත්තේ ය. 'වෙළ = වෙළීමෙකි'.

**පැළු,** පාටනය කරනලද්දේ හෝ පාටනය කළ තැනැත්තේ ය. 'පළ = පැළීමෙකි' මාත්‍රාංශවෘද්ධි ද වී.

**කියු,** කථනය කරනලද්දේ හෝ කථනය කළ තැනැත්තේ ය. 'කී = කීමෙකි' යන්නෙන් උප්‍රත්‍යය වැ යකාරාගම හා ධාත්වන්තයහට මාත්‍රාහානි ද වී.

**ලියු,** ලෙඛනය කරනලද්දේ හෝ ලෙඛනය කළ තැනැත්තේ ය. 'ලී = ලීමෙකි' පෙරසේ මැ යි.

---

* ඇති දෙය නැති සේ වසා කීම වැළහීම යි. සංස්කෘත භාෂාවේ අපහ්නව, අපලාප, ආදි ශබ්දයෝ ද මේ අර්ථය ප්‍රකාශ කෙරෙත්.

**පියු**, පිධානය (= වැසීම) කරනලද්දේ හෝ පිධානය කළ තැනැත්තේ ය. '**පිය = වැසීමෙහි**'.

**කළු**, කරනලද්දේ හෝ කළා වූ තැනැත්තේ ය. '**කර = කිරීමෙහි**' යන්නෙන් පර වැ ළුප්‍රත්‍යය වැ රකාර ලොප් වී.

**හළු**, වර්‍ජනය (= හැරීම) කරනලද්දේ හෝ වර්‍ජනය කළ තැනැත්තේ ය. '**හර = හැරීමෙහි**' පෙරසේ මැ යි.

**වළු**, ආවරණය කරනලද්දේ හෝ ආවරණය කළ තැනැත්තේ ය. '**වර = වැරීමෙහි**' පෙරසේ මැ යි.

**සුන්**, ඡින්‍දනය කරනලද්දේ හෝ ඡින්‍දනය කළ තැනැත්තේ ය. '**සිඳ = සිඳීමෙහි**' යන ධාතුවෙන් පර වැ **අ**ප්‍රත්‍යය කොට අඩිනකාරයහට මාත්‍රාවෘද්ධි කොට ධාත්‍වන්‍ත දකාරය හා ප්‍රත්‍යය ද ලොප් කොට සකාරස්ථ ඉකාරයහට පිළිපෙරැළි කිරීමෙන් '**සුන්**' යනු වේ.

**බුන්**, භෙදනය කරනලද්දේ හෝ භෙදනය කළ තැනැත්තේ ය. '**බිඳ = බිඳීමෙහි**' පෙරසේ මැ යි.

**හුන්**, නිසීදනය කරනලද්දේ හෝ නිෂණ්ණ වූ තැනැත්තේ ය. '**හිඳ = හිඳීමෙහි**'.

**වුන්**, වින්‍දනය කරනලද්දේ හෝ වින්‍දනය කළ තැනැත්තේ ය. '**විඳ =විඳීමෙහි**'.

**දුන්**, දානය කරනලද්දේ හෝ දානය කළ තැනැත්තේ ය. '**දෘ = දීමෙහි**' යන ධාතුහු කෙරෙන් **උන්**ප්‍රත්‍යය යි.

**එන**, ආගමනය කරනු ලබන්නේ හෝ ආගමනය කරන තැනැත්තේ ය. '**ඉ = ගමන්හි**' යන්නහු කෙරෙන් **න**ප්‍රත්‍යය වැ පිළිපෙරැළි යි.

**කන**, ඛාදනය කරනු ලබන්නේ හෝ ඛාදනය කරන තැනැත්තේ ය. '**කා = කෑමෙහි**' **න**ප්‍රත්‍යය වැ මාත්‍රාහානි යි.

**දෙන**, දානය කරනුලබන්නේ හෝ දානය කරන තැනැත්තේ ය. '**දෘ = දීමෙහි**' යන්නහු කෙරෙන් **න**ප්‍රත්‍යය වැ පිළිපෙරැළි යි.

**මෙඇ**, මේ ආදිය; **කම්කතුකරුදෙකට**, කර්‍මකර්‍තෘකාරක ද්වයට; **සමපසින්**, සම වූ ප්‍රත්‍යයෙන්; **නිපන්**, නිෂ්පන්න යි.

**භා**—මේ ආදි ප්‍රත්‍යයාර්‍ථශබ්දයෝ කර්‍මකාරකය හෝ කර්‍තෘකාරකය හෝ උක්ත කෙරෙත්.

**එසින් යේ නුයි = යන්. එසින් වසා නුයි = වසන්. එසින් සනහා නුයි = නහනු. එසින් කොරේ නුයි කර. මෙඈ කරණ කරුපසින් නිපන්.** (5)

**ඔහට දෙනුලැබේ නුයි = දනී, බමුණු. මෙඈ සපදන් කරුපසින් නිපන්.** (6)

---

(5) **ප**—එසින්, ඒ කරණකොටගෙන; යේ නුයි, ගමනය කෙරේ නුයි; යන්, යන් නම්. රථාදි යානයට නම්. **'යා = ගමන්හි'** යන්නහු කෙරෙන් කරණකාරකයෙහි අන්ප්‍රත්‍යය යි.

එසින්, ඒ කරණකොටගෙන; වසා නුයි, ඡාදනය කෙරේ නුයි; වසන්, වසන් නම්. වස්ත්‍රයට නම්. **'වස = වැසීමෙහි'** යන ධාතු යි.

එසින්, ඒ කරණකොටගෙන; සනහා නුයි, ස්නානය කෙරේ නුයි; නහනු, නහනු නම්. ස්නානීය ද්‍රව්‍යයට නම්.

**වි**—**'නහ = නැහැමෙහි'** යන ධාතුහු කෙරෙන් නුප්‍රත්‍යය යි. **'නා'**ධාතුය යි පුරාතන ව්‍යාඛ්‍යානයෙහි පැනේ. මෙය සංස්කෘත **'ස්නා'**ධාතුව මුල්කොට ඇත්තේ ය. පාළියෙහි **'නහ'** යනු ධාතු ස්වරූපය යි. ප්‍රාකෘතයෙහි **'ණ්හා'** යනු ධාතුරූපය වේ.* මෙසින් හෙළබසට **'නහ'** යනු සම ය. **'ණ්හා'** යනු සමීපතර ය. **"ශ්න ෂ්ණ ස්න හ්න හ්ණ ක්ෂ්ණාං ණ්හඃ"** යන ප්‍රාකෘත සූත්‍රයෙන් සංස්කෘත **'ස්නා'** ධාතුහට **'ණ්හා'** යන රූපය වෙයි. මේ ණකාරාක්‍රාන්ත හකාරවත් රූපය **'නහ'**යි ස්වභාෂායෙහි ධාතු ස්වරූපයට පත් වූ බැව් ද සැලකිය හැකි යි. මෙසින් සිද්ධ වන පදයන්හි කිසිවිටෙක හකාරව්‍යඤ්ජනය ලොප් ව අකාර ශෙෂ වැ පූර්වපරස්වර්ණ දීර්ඝයෙන් **'නානු'** යනාදි පදරූප ද, ධාතුප්‍රත්‍යය දෙදෙනාගේ යොගමාත්‍රයෙන් **'නහනු'** යනාදිය ද සිද්ධ වේ.

**ප**—එසින්, ඒ කරණකොටගෙන; කෙරේ නුයි, (ක්‍රියාව) කෙරෙයි යන අර්ථයෙන්; කර, කර නම් වේ. හස්තයට ද සොඬට ද නම්. **'කර = කිරීමෙහි'** අප්‍රත්‍යය යි.

මෙඈ, මේ ආදිය; කරණකරුපසින්, කරණකාරකප්‍රත්‍යයෙන්; නිපන්, නිෂ්පන්න යි.

(6) **ප**—ඔහට, ඒ (ප්‍රතිග්‍රාහකයා)හට; දෙනුලැබේ නුයි, දානය කරනුලැබේ නුයි; දනී, දනී නම්; බමුණු, බ්‍රාහ්මණ යි. **'දා = දීමෙහි'** යන්නහු කෙරෙන් සම්ප්‍රදානාර්ථයෙහි ණීප්‍රත්‍යය යි. මෙඈ, මේ ආදිය; සපදන්කරුපසින්, සම්ප්‍රදානකාරකප්‍රත්‍යයෙන්; නිපන්, නිෂ්පන්න යි.

---

*පාලිභාෂායෙහි ද 'න්හා' යන ධාතුරූපයෙක් කිසිතැනෙක දෘශ්‍යමාන වේ.

ඔහු කෙරෙන් බන් නුසි = බෙම්, රකුසු. මෙඈ අවදිකරු පසින් නිපන්. (7)

එහි වෙන් නුයි = බිම්. එහි සැපත් පිරේ නුයි = පුර. මෙඈ අදරකරුපසින් නිපන්. (8)

කරනු, දෙනු, වළඳනු, මැඟුම්, නැඟුම්, සිඳුම්, නැමඳුම් මෙඈ හව්පසින් නිපන්. (9)

ඉති දසින් පස.

---

මනුහු පින් = මන්වා, නර. දනුව පින් = දන්වා, අසුර. සම ණාහු පින් = හෙරණ. සුගත් දෙව් මොහට = සොගත්, උවසු. වා දෙව් මෙදෙසට = වසබ. නකත් දතුයේ = නැකැති. පද නට ගිය = පදි. දනන් සුමු = දෙනෙනා. සියල් ලෙව් = ලෝනා. ගම්හි වූයේ = ගැමි. සගෙහි වූයේ = සැගි. රුවනින්, දඬුයෙන් මවනලද = රුවන්මුවා, දඬුමුවා. තුරු මෙන් = තුරුවන්. නැව් දවවනුයේ = නැවි. කොටු නියුතු වූයේ = කොටි. කුම් කෙරෙම් දූසි පිළිවිසැ කරනුයේ කිකරු. දිපැතියේ = දිමුත්. නිය ඇතියේ = නියවත්. බල, කර, අත් ඇතියේ = බිලි, කිරි, ඇත්. සබට රහ = සැබි. මෙඈ නමින් පර වැ ඒ ඒ අරුත් පසින් නිපන්. (10)

---

(7) ප—ඔහු කෙරෙන්, එ (අපාදානයා) කෙරෙන්; බන් නුසි, භීත වෙත් නුයි; බෙම්, බෙම් නම්; රකුසු, රාක්ෂස යි. 'බා = බියෙහි' යන ධාතුහු කෙරෙන් ඉම්ප්‍රත්‍යය වැ පිලිපෙරැළි වි.

(8) ප—එහි, ඒ ආධාර කොට ගෙන; වෙත් නුයි, (ජාත) වෙත් නුයි; බිම්, බිම් නම්. 'වූ = විමෙහි' යන ධාතුහු කෙරෙන් ඉම්ප්‍රත්‍යය වැ වකාරයහට බකාරාදෙශ වි.

එහි, ඒ ආධාර කොටගෙන; සැපත්, සම්පත්; පිරේ නුයි, පූරණය වේ නුයි; පුර, පුර නම්. මෙඈ, මේ ආදිය; අදරකරු පසින්, ආධාරකාරකප්‍රත්‍යයෙන්; නිපන්, නිෂ්පන්න යි. 'පූර = පිරිමෙහි' යන්නහු කෙරෙන් අප්‍රත්‍යය යි.

(9) ප—කරනු, කිරීම ය; දෙනු, දීම ය; වළඳනු, වැළඳීම ය; මැඟුම්, බැලීම ය; නැඟුම්, නැගීම ය; සිඳුම්, සිඳීම ය; නැමඳුම්, නැමඳීම ය යන; මෙඈ, මේ ආදිය; හව්පසින්, භාවප්‍රත්‍යයෙන්; නිපන්, නිෂ්පන්න යි.

දසින් පස, ධාතුයෙන් (මත) ප්‍රත්‍යය; ඉති, මෙසේ යි.

---

## තද්ධිතප්‍රත්‍යයාර්ථශබ්ද.

(10) **ෂ**—මනුහු පිත්, මනු නම් තැනැත්තහුගේ **අපත්‍ය** තෙම;* මන්වා, මන්වා නම්; නර, මනුෂ්‍ය යි.

**'මනුහු'** යන ෂෂ්ඨ්‍යන්තයා කෙරෙන් අපත්‍යාර්ථයෙහි (=ඔහුගේ දරුය යන අර්ථයෙහි) **"දිසින් නෙමෙන් හොත"** යනාදි උපාඛ්‍යසූත්‍රයෙන් **වා** ප්‍රත්‍යය කොට අඛ්‍යසූත්‍රයෙන් හුවිභක්තිය හා නකාරයේ උකාරය ද ලොප් කොට **'මන්වා'**යි සිටි කල්හි නම්වත් කොට පෙරවිබත් එකබස් **ආ** ප්‍රත්‍යය කොට ඕහට ලොප් කිරීමෙන් පදසිද්ධිය වේ.

දනුව පිත්, දනුවගේ ( = අසුරමවගේ) අපත්‍ය තෙම; **දන්වා**, දන්වා නම්; අසුර, දානව තෙමේ යි. **'දනුව'** යන ෂෂ්ඨ්‍යන්තයා කෙරෙන් අපත්‍යාර්ථයෙහි **වා** ප්‍රත්‍යයෙන් පෙරකිසෙයින් ම සිද්ධ යි.

සමණහු පිත්, (උපාධ්‍යාය) ශ්‍රමණයාගේ පුත්‍ර තෙම; **හෙරණ**, **හෙරණ** නම්. **'සමණහු'** යන ෂෂ්ඨ්‍යන්තයා කෙරෙන් අපත්‍යාර්ථ යෙහි **අ** ප්‍රත්‍යය කොට හුවිභක්ති ලොපය හා අප්‍රත්‍යය ලොපය **ද** කොට **'සමණ'** කියා සිටි කල්හි **ස**කාර මකාරයන්ට **හ**කාර රකාරාදෙශ වැ හකාරයේ අකාරයහට පිළිපෙරැළි එකාර වැ නම් වත් වැ අවිභක්ති වැ **'හෙරණ'** යනු වේ.

සුගත්, සර්වඥ තෙම; දෙව්, දෙවතා වූයේ; මොහට, මෝහට, නුසි; **සොගත්**, සොගත් නම්; උවසු, උපාසක යි. **'සුගත්'** යන ප්‍රථමාන්තයා කෙරෙන් දෙවතාර්ථයෙහි **අ** ප්‍රත්‍යය කොට ප්‍රත්‍යය ලොප විභක්තිලොප ස්වරවිපර්‍යාසයන් කළ කල්හි **'සොගත්'** යනු වේ.

වා, වාතය තෙම; දෙව්, දෙවතා වූයේ; මෙදෙසට, මේ දිශා වට නුසි; වයබ, වයබ නම්. **'වා'** යන ප්‍රථමාන්තයා කෙරෙන් දෙවතාර්ථයෙහි **ඝබ** ප්‍රත්‍යය කොට වකාරයේ අකාරයහට මාත්‍රා හානි හා නම්වත් කිරීම් ආදියෙන් **'වයබ'** යනු වේ. **'වයබ'** යන පාඨයෙහි **'ඝබ'** යන ප්‍රත්‍යය යි සැලකියයුතු.

නකත්, නක්ෂත්‍රය; දතුයේ, ජානනය කළ තැනැත්තේ; නැකැති, නැකැති නම්. **'නකත්'** යන ද්විතීයාන්තයා කෙරෙන් ජානනාර්ථ යෙහි **ඉ** ප්‍රත්‍යය කොට නකාර කකාර දෙක්හි වූ අකාරයන්ට මාත්‍රාංශවෘද්ධි හා නම්වත් කිරීම් ආදියෙන් **'නැකැති'** යනු වේ.

* 'පිත්' යනු පුත්‍රපර්‍යාය ම ය. එසේ ද වුවත් පාණිනීයාදි සියලු ව්‍යාකරණාචාර්‍යයන්ට ඉෂ්ට වූ අපත්‍යශබ්දයෙන් මෙහි අර්ථ කීම යුක්තතර වේ. 'අපත්‍ය' යනු පුත්‍රපර්‍යාය **ද** පෞත්‍රපර්‍යාය **ද** වූ හෙයිනි. "අපත්‍යං පෞත්‍රප්‍රභෘති ගොත්‍රම්" යන කාශිකා වචනයෙන් ද, "අපත්‍යාපත්‍යමප්‍යප ත්‍යමුච්‍යතෙ" යන ත්‍රිලොචනදාසපඤ්ජිකාවචනාදියෙන් ද ඒ ප්‍රකාශ වේ.

පදනම, පදයන්ට; හිය, හිත වූයේ; පදී, පදී නම්. 'පදනම' යන චතුර්‍ථ්‍යන්තයා කෙරෙන් හිතාර්‍ථයෙහි ඊප්‍රත්‍යය කිරීම් ආදි යෙන් 'පදී' යනු වේ. පඤ්ඤසඛ්‍යාත ගාථාශ්ලොකාදියට නම්. ඊකාරාන්ත යි.

දනන්, ජනයන්ගේ; සුමූ, සමූහය තෙම; දෙනෙතා, දෙනෙතා නම්. 'දනන්'යන ෂෂ්ඨ්‍යන්තයා කෙරෙන් සමූහාර්‍ථයෙහි තාප්‍රත්‍යය කොට පිලිපෙරැළි ආදිය කිරීමෙන් 'දෙනෙතා' යනු වේ.

සියල්ලෙව්, සකලලොකය; ලෝතා, ලෝතා නම්. 'ලෝ' යන ප්‍රථමාන්තයා කෙරෙන් සකලාර්‍ථයෙහි තාප්‍රත්‍යය කොට විභක්ති ලොපාදියෙන් 'ලෝතා' යනු වේ.

ගම්හි, ග්‍රාමයෙහි; වූයේ, හටගත්තේ; ගැමි, ගැමි නම්. සගෙහි, ස්වර්ගයෙහි; වූයේ, හටගත්තේ; සැගි, සැගි නම්. ගම්හි, සගෙහි, යන සප්තම්‍යන්තයන් කෙරෙන් ජාතාර්‍ථයෙහි ඉප්‍රත්‍යය යි.

රුවනින්, රත්නයෙන් ද; දඹුයෙන්, කාෂ්ඨයෙන් ද; මවන ලද, නිර්මිතකරනලද්දේ; රුවන්මුවා, දඹුමුවා, (ක්‍රමයෙන්) රුවන්මුවා, දඹුමුවා නම් වේ. රුවනින්, දඹුයෙන් යන තෘතීයාන්තයන් කෙරෙන් ප්‍රකෘතිවචනයෙහි මුවාප්‍රත්‍යය කොට විභක්තිලොපාදිය කිරීමෙන් 'රුවන්මුවා' 'දඹුමුවා' යනු වේ.

තුරු මෙන්, වෘක්ෂය මෙන් යන අර්‍ථයෙහි; තුරුවත්, තුරුවත් යනු වේ. 'තුරු' යන ද්විතීයාන්තයා කෙරෙන් උපමාර්‍ථයෙහි වත් ප්‍රත්‍යය කොට විභක්තිලොපයෙන් 'තුරුවත්' යනු වේ. මෙහි අව්‍යයාර්‍ථ වත්ප්‍රත්‍යය කළ හෙයින් 'තුරුවත්' යනු ද අව්‍යය වේ.

නැව්, නෞකාව; දවවනුයේ, ධාවනය කරවන්නේ; නැවි, නැවි නම් වේ. 'නැව්' යන ද්විතීයාන්තයා කෙරෙන් ධාවාපනාර්‍ථයෙහි ඉප්‍රත්‍යය යි.

තොටැ, තීර්‍ථයෙහි; නියුතු වූයේ, නියුක්ත වූ තැනැත්තේ; තොටි, තොටි නම්. 'තොටැ' යන සප්තම්‍යන්තයා කෙරෙන් නියුක්තාර්‍ථයෙහි ඉප්‍රත්‍යය යි.

කුම් කෙරෙම් දැයි, කුමක් කෙරෙම් ද කියා; පිළිවිසැ, ප්‍රතිපෘච්ඡනය කොට; කරනුයේ, කරන තැනැත්තේ; කිකරු, කිකරු නම්.

'කිකරු' යන තැන්හි 'කුම් කෙරෙම්' යන නාමපදය හා ක්‍රියා පදයත් තබා එයින් පර වැ පෘච්ඡාකරණාර්‍ථයෙහි උප්‍රත්‍යය කොට 'කුම්' යන්නට 'කි' යන ආදෙශ හා කෙරෙම් යන්නහුගේ විභක්ති ලොප ද කළ කල්හි 'කිකර+උ' කියා සිටී. ඉක්බිති සංහිතාකාර්‍ය වැ

**ඉඳුරු ගිනි යම ඈ දසගු නමගිමියන් නමින් ද, මල්පිලි ඈ ඒ ඒ ලියරුක් නමින් ද අබේඋවසරින් පසවත් කිරීමෙන් හොත වහර යෙදෙත්.** (11)

**පසරුත් අදියර අටවනු.**

---

නම් වත් වැ විභක්ත්‍යන්ත විමෙන් 'කිඹුරු'යි සිද්ධ වේ. තද්ධිතාවස්ථා හෙයින් ධාතුහු කෙරෙන් ප්‍රත්‍යය නො කටයුතු.

දිප ඇතියේ, දිපතිය ඇතියේ; දිමුත්, දිමුත් නම්. 'දිප' යන ප්‍රථමාන්තයා කෙරෙන් අස්ත්‍යර්ථයෙහි මත්ප්‍රත්‍යය කොට විභක්ති යට හා පකාරයහට ලොප් ද මකාරස්ථ අකාරයහට පිළිපෙළැළි උකාර ද කිරීමෙන් '**දිමුත්**' යනු වේ.

නිය ඇතියේ, ඥානය ඇත්තේ; නියවත්, නියවත් නම්. '**නිය**' යන ප්‍රථමාන්තයා කෙරෙන් අස්ත්‍යර්ථයෙහි **වත්**ප්‍රත්‍යය කොට විභක්තිලොපය කළ කල්හි '**නි+වත්**' කියා සිටියි. ඉක්බිති මාත්‍රාහානි හා යකාරාගම ද කිරීමෙන් '**නියවත්**' යනු වේ.

බල, බලය ද; කර, හස්තය ද; අත්, හස්තය ද; ඇතියේ, ඇති තැනැත්තේ; බිලි, කිරි, ඇත්; බිලි, කිරි, ඇත් නම්. මේ පදත්‍රය පෙර කී ශබ්දත්‍රයට ක්‍රමයෙන් උදාහරණ යි. බිලි, කිරි, යන දෙක්හි අස්ත්‍යර්ථ ඉප්‍රත්‍යය හා පිළිපෙළැළි යි. 'ඇත්' යන්නෙහි ප්‍රත්‍යයලොපය හා මාත්‍රාංශවෘද්ධි යි.

සබට, සභාවට; අරහ, අභී වූයේ; සැබි, සැබි නම්. අභ්‍යර්ථයෙහි ඉප්‍රත්‍යය හා මාත්‍රාංශවෘද්ධි යි. මෙඈ, මේ ආදිය; නමින් පර වැ, නාමයෙන් පරවත්ති වැ; ඒ ඒ අරුත්පසින්, ඒ ඒ අර්ථයෙහි වූ ප්‍රත්‍යයෙන්; නිපන්, නිෂ්පන්න යි.

(11) **ප**—ඉඳුරු, ඉන්ද්‍ර ය; ගිනි, අග්නි ය; යම, යාම්‍ය ය යන; ඈ දසගු, මේ ආදි දිශාවෝ; නමහිමියන් නමින් ද, ස්වකීය අධිපතින්ගේ නාමයෙන් ද; මල්පිලි ඈ, පුෂ්පඵලාදීහු; ඒ ඒ ලියරුක්නමින් ද, තත්තද්ලතාවෘක්ෂයන්ගේ නාමයෙන් ද; අබේඋවසරින් (හොත), අභේදෝපචාරයෙන් (හෝ); පසවත් කිරීමෙන් හොත, ප්‍රත්‍යයවත් කිරීමෙන් හෝ; වහර, ව්‍යවහාරයෙහි; යෙදෙත්, යුක්ත වෙත්.

වි-ඉඳුරු යනු පූර්වදිශාවට නමෙකි, ගිනි යනු පූර්වඅනුදිශාවට (=ගිනිකොනට)නමෙකි, යම යනු දක්ෂිණදිශාවටනමෙකි, ආදිශබ්දයෙන් නිරිත,වරුණ,වයඹ,සොම්,ඉසාන යන මොහු ද ගැනෙත්. නිරිත යනු දක්ෂිණ අනුදිශාවට ද, වයඹ යනු පශ්චිම අනුදිශාවට ද

ඉශාන යනු උත්තරඅනුදිශාවට ද නම් වේ. මෙහි නම් අතුරෙන් සමහරක් ඒ ඒ දිශාවන්ට අධිපති වූ දෙවතා නාමයෙන් ම අභෙදෞපචාර වශයෙන් ද, සමහරක් හෝ සියල්ල ම හෝ ප්‍රත්‍යය වත් කිරීමෙන් ද සිද්ධ වෙත්. දිශාධිපතිහු නම්—ඉන්ද්‍ර, අග්නි, යම, නෛරෘත, වරුණ, වායු, සොම, ඊශ යන මොහු යි.

අමරකොශයෙහි :–

"ඉන්ද්‍රො වහ්නිඃ පිතෘපතිර්නෛරෘතො වරුණො මරුත්
කුබෙර ඊශඃ පතයඃ පූර්වාදීනාං දිශාං ක්‍රමාත්"

යන්නෙන් ඒ දක්වනලදි. අභෙදෞපචාරය යනු වෙනස් වූ දෙයක් කිසිලෙසකින් නො වෙනස් කොට සලකාගැන්ම ය. ඉඳුරු නම් දෙවියා ද, ඔහු අයත් දිශාව ද, නාමයෙන් නො වෙනස් ලෙස සලකාගැන්මෙන් ඉඳුරු යයි එක ම නමෙකින් කියනුලැබේ. ගිනිදෙවියා ද, ඔහු අයත් දිශාව ද, නො වෙනස් ලෙස සලකාගැන්මෙන් 'ගිනි' යයි එක ම නමෙකින් කියනු ලැබේ. යම, නිරිත, වරුණ, සොම්, ඉසාන යනුදු මෙසේ ම අභෙදෞපචාරයෙන් සිද්ධ වේ. වයඹ යනු පෙර ප්‍රත්‍යයාර්ථශබ්ද යන් අතුරෙහි කියනලද්දේ ය. දිශාර්ථයෙහි ඉඳුරු ශබ්දය ප්‍රත්‍යය–වත් කිරීමෙන් සිද්ධ කරනකල්හි 'ඉඳුරුහුගේ දිග' යන වාක්‍ය යෙහි ෂෂ්ඨ්‍යන්ත ඉඳුරුශබ්දය තබා "දසින් නෙමෙන් හොත" යනාදි උපාඛ්‍යසූත්‍රයෙන් දිශාර්ථයෙහි අප්‍රත්‍යය කොට විභක්තිය ද ප්‍රත්‍යය ද ලොප් කළ කල්හි ඉඳුරු යනු වේ. ඉන්ද්‍රයා අයත් දිශාවට නම්. සෙස්ස ද මේ නයින් සලකනු. .

පුෂ්පඵලාදිය ඒ ඒ ලතාවෘක්ෂයන්ගේ නාමයෙන් උපචාර වශයෙන් කියනු ලැබේ. අඹ යනු ආම්‍රවෘක්ෂයට නාමයෙකි, එහි ඵල ද 'අඹ' යයි අභෙදෞපචාරයෙන් සලකනුලැබේ. පුසුල් යනු පුෂ්පලතාවට නාමයෙකි. එහි ඵල ද එනමින් ම අභෙදෞපචාර යෙන් කියනුලැබේ. ප්‍රත්‍යයවත් කිරීමෙන් සිද්ධ කරනකල්හි ඵලාර්ථයෙහි ප්‍රත්‍යය කොට ඕහට ලොප් කටයුතු යි.

ඉන්ද්‍රාදිශබ්දයාගේ ප්‍රවෘත්තිය මුඛ්‍ය වශයෙන් පූර්වදිශාර්ථයෙහි නො ලැබෙතත් ඒ හා නො වෙනස් කොට සැලකිම අභෙද යෙන් වූ උපචාරය යි. මේ උපචාරය ද අක්ෂපාදප්‍රණීත තර්කවිද්‍යායෙහි දසපරිච්ඡෙදකින් ප්‍රකාශිත ය. හේ මෙසේ යි :–

"සහචරණස්ථානතාදර්ථ්‍යවෘත්තමානධාරණසාමීප්‍යයොග සාධනාධිපත්‍යෙභ්‍යො බ්‍රාහ්මණමඤ්චකටරාජශක්තුචන්දන ගඞ්ගාශාටකාන්නපුරුෂෙෂ්වතද්භාවෙ'පි තදුපචාරඃ"
2. 2. 64. යනු සූත්‍ර යි.

1 සමග පැවැත්ම හෙතු කොටගෙන සහචරිතයාගේ අභෙදය සැලකීම 'සහචරණොපචාර' නම්. 'සාහචර්‍ය' යනුදු මීට ම නම්. 'යෂ්ටිකාං භොජය' (=සැරයටිය වළඳව) යනු මෙනි. මෙයින් 'සැරයටිය ගත් බමුණා වළඳව' යන අර්ථය ලැබේ.

2 ස්ථාන නාමයෙන් එහි සිටියාහු ද කියනුලැබෙත්. මේ ස්ථානොපචාර නම්. 'මඤ්චාඃ ක්‍රොශන්ති' (=මැසි හඬගාත්) යනු මෙනි. මෙහි මැසිපිට සිටි පුරුෂයෝ මැසිශබ්දයෙන් කියනු ලැබෙත්.

3 තාදර්ථ්‍යයෙන් හෙවත් යමක් ප්‍රයොජන කොට ඇත්තේ වී නම් එයින් අර්පිහු ද කියනුලැබෙත්. කළාල පිණිස බිරණ තෘණයන් යොදනු ලබන කල්හි 'කටං කරොති' (=කළාල කෙරේ) යයි කියනුලබන්නාක් මෙනි. වියන කල්හි තෘණසන්නිවෙශය මුත් කළාලක් නො පෙනේ. එතකුදු වුවත් කළාල පිණිස පැවති ක්‍රියාව හෙයින් 'කළාල කෙරෙයි' කියා උපචාරයෙන් සැලකීම වේ. මේ 'තාදර්ථ්‍යොපචාර' නම්.

4 පැවැත්ම හෙතු කොටගෙන අභෙදයෙන් සැලකීම 'වෘත්ත්‍යොපචාර' නම්. 'යමො රාජා, කුවෙරො රාජා' (=යමරජ, වෙසවුණුරජ) යනු මෙනි. යම තෙමේත් කුවෙර තෙමේත් රාජාභිෂෙකයෙන් වොටුනුපලන් රජදරුවෝ නො වෙති. ස්වකීය පක්‍ෂයට ස්වාමිත්වයෙන් පැවැත්ම හෙතු කොටගෙන රජ හයි කියනු ලැබෙත්.

5 මිනුම් වශයෙන් අභෙදයෙන් සැලකීම 'මානොපචාර' නම්. ලහසින් මිනූ හත්සුනු 'ආඪකසක්තවඃ' ( = ලහස් හත්සුනු) යයි කියනු ලැබෙත්.

6 ධාරණය හෙතු කොට ආධාර ආධෙය දෙදෙනාගේ අභෙදයෙන් සැලකීම වේ. මේ 'ධාරණොපචාර' නම්. 'තුලාචන්දනම්' (තුලායෙහි ලූ සඳුන් = තුලාචන්දන) යයි කියනුලබන්නාක් මෙනි.

7 සමීප වූ ආධාරයාගේ නාමයෙන් ආධෙයය ද අභෙදයෙන් සලකනු ලැබේ. මේ 'සාමීප්‍යොපචාර' නම්. ගංතෙර ගවයන් හැසිරෙන කලැ 'ගඞ්ගායාං ගාවශ්චරන්ති' ( = ගඟෙහි ගවයෝ හැසිරෙත්) යයි කියනු ලබන්නාක් මෙනි. මෙහි 'ගඟ' යනු ගංතෙරට නම්.

8 යොගයෙන් යුක්තයා ද අභෙදයෙන් සලකනුලැබේ. මේ 'යොගොපචාර' නම්. කළුරඳනෙන් යුත් සළුව 'කෘෂ්ණඃ ශාටකඃ' ( = කළු සළුව) යයි කියනුලබන්නාක් මෙනි. කළු යනු රඳනට ( = සංයමට) නම් වුවත් මෙහි එයින් යුක්ත (ශාටකය)හට නම් වේ.

**බජන නමවිබත්—කම්කතුරුතු අවුතුනම්**
**ඔහු දෙදෙන වුතුනම් වෙත්—පළමුවිබත් බජනුවෝ. (1)**

---

9 සාධන වශයෙන් (= කරණ වශයෙන්) පවත්නා දෙය එයින් සාධ්‍ය වූ දෙය හා අභේදයෙන් සලකනු ලැබේ. මේ **'සාධනෝපචාර'** නමි. බත ජීවනයට කරණ හෙයින් **'අන්නං ප්‍රාණාඃ'** (= බත ප්‍රාණයෝ) යයි කියනුලැබේ.

10 ස්වාමිභාවයෙන් ද ස්වකීයයාගේ අභේදයෙන් සැලකීම වේ. මේ **'ආධිපත්‍යෝපචාර'** නමි. කුලයක ගොත්‍රයක අධිපති පුරුෂයක්හට **'අයං පුරුෂඃ කුලම්, අයං ගොත්‍රම්'** (= මේ පුරුෂ තෙම කුලය, මේ තෙම ගොත්‍රය) කියා කියනු ලබන්නාක් මෙනි.

මෙසේ අතත්ස්වභාවයෙහි තත්ස්වභාවාරොපණලක්ෂණ වූ උපචාරය තාර්කිකමතයෙහි දශවිධ වූ නමුත් ශාබ්දිකයන් විසින් මෙයින් වැඩි කොට ද විස්තර කරනලද්දේ ය. එහි භේදවිභාග මෞද්ගල්‍යායන පඤ්චිකාප්‍රදීපාදියෙන් දන්නේ ය.

**අෂ්ටම වූ ප්‍රත්‍යයාර්ථාධිකාරය නිමි.**

---

## උක්තානුක්තාධිකාරය.

(1) **ප**—කම්කතුඅරුතු, කර්මකර්තෘ අර්ථයෝ; නමවිබත්, නමන්ගේ විභක්තීන්; බජන, භජනය කරන කල්හි; අවුතු නම්, අනුක්ත නම් (වෙති); ඔහු දෙදෙන, ඒ කර්මකර්තෘ අර්ථයෝ දෙදෙන; පළමුවිබත්, ප්‍රථමාවිභක්තිය; බජනුවෝ, භජනය කරන්නාහු; වුතු නම් වෙත්, උක්ත නම් වෙත්.

**භා**—යම් කලෙක්හි කර්මකර්තෘ අර්ථයෝ දෙදෙන තමතමාට අයත් වූ කම්විබත්, කතුවිබත් දෙකින් යුක්ත වූවාහු ද එකල්හි ඔහු දෙදෙන **අනුක්තකර්ම, අනුක්තකර්තෘ** නම් වන්නාහ. ඒ කර්මකර්තෘ අර්ථයෝ යම්කලෙක ප්‍රථමාවිභක්තියෙන් යුක්ත වූවාහු ද එකල්හි **උක්තකර්ම, උක්තකර්තෘ** නම් වන්නාහු ය.

**වි**—කර්මාර්ථයාගේ විභක්තිය කම්විබත ය, කර්තෘ අර්ථයාගේ විභක්තිය කතුවිබත ය. අනුක්ත කල්හි මෙසේ ස්වකීය විබතින් සිටීම ද, උක්ත කල්හි පෙරවිබතින් සිටීම ද සියලු කාරකයන්ගේ ම ධර්මතාවකි. එහෙයින් පෙරවිබතින් සිටි කර්මකර්තෘ දෙදෙන **උක්ත** නම් වෙතැයි ද, එසේ නො ව ස්වකීය විබතින් සිටියාහු **අනුක්ත** නම් වෙතැයි ද දක්වනලදි. එක වාක්‍යයෙක්හි

ලබදසුනු කමන—වුහු නම් නැත අවුතු නම්
වුතු වන කම් කතු අවුත්--කතු වුතු වන අවුත් කම්. (2)

"දහම් නරදම්සැරිහු විසින් දෙසිණි" මෙඇති කම් වුත් කතු අවුත් නම්. "එදම් අරිසඟ පිළිපදනේ"සි මෙඇති කතු වුත් කම් අවුත් නම්. (3)

ඉති හුදුකිරියපෙදෙන් වුත් අවුත්.

---

දෙදෙනා ම උක්තවීමක් හෝ අනුක්තවීමක් හෝ නො ලැබේ. යම් වාක්‍යයෙක්හි කර්මය උක්ත වී නම් එහි කර්තෘ අනුක්ත ය කර්තෘ උක්ත වී නම් එහි කර්මය අනුක්ත වේ. "ඔහු බත පිසේ. ඔහු විසින් බත පිසනු ලැබේ" යන වාක්‍ය දෙක දෘෂ්ටාන්ත යි. පළමු වාක්‍යයෙහි ඔහු යන කර්තෘ ද, දෙවැනි වාක්‍යයෙහි බත යන කර්මය ද උක්ත වැ පෙරවිබතින් සිටිති. එහෙයින් පළමු වාක්‍ය යෙහි කර්මය ද, දෙවැනි වාක්‍යයෙහි කර්තෘ ද අනුක්ත වැ සවකිය (කර්ම කර්තෘ) විභක්ති ගෙන සිටියෝ ය.

(2) ප—ලබදසුනු, ලබ යන ධාතුයෙන් යුක්ත වූ; කමන, කර්මාර්ථය තෙම; වුහු නම්, උක්ත නම් වේ; නැත, (එසේ) නො වුව හොත්; අවුතු නම්, අනුක්ත නම් වේ; කම්, කර්මය; වුතුවන, උක්ත වූ කල්හි; කතු, කර්තෘ තෙම; අවුත්, අනුක්ත වේ; කතු, කර්තෘහු; වුතු වන, උක්ත වූ කල්හි; කම්, කර්මය තෙම; අවුත්; අනුක්ත වේ.

වි—'ලබ' යන ධාතුයෙන් යුක්ත වීම නම් ලබධාතුහුගේ අර්ථ වත් ක්‍රියාපදයක්හුගේ යෙදීම ය හෙවත් කර්මප්‍රත්‍යයවත් ක්‍රියා පදයක් හා යෙදීම යි. මෙසේ කර්මකාරක ක්‍රියාපදයක් හා යුක්ත වූ කර්මාර්ථය උක්ත නම් වන්නේ ය. එවැනි ක්‍රියායොග යක් නැතහොත් අනුක්ත නම් වන්නේ යි.

(3) ප—දහම්, ධර්මය තෙම; නරදම්සැරිහු විසින්, නරදම්‍ය සාරථිහු විසින්; දෙසිණි, දේශනාකරනු ලැබී; මෙඇති, මේ ආදී යෙහි; කම් වුත්, කර්මය උක්ත වේ; කතු, කර්තෘ තෙම; අවුත් නම්, අනුක්ත නම් වේ. එදම්, ඒ ධර්මය; අරිසඟ, ආර්යසඞ්ඝ තෙම; පිළිපදනේ යි, ප්‍රතිපාදනය කෙරෙයි යන; මෙඇති, මේ ආදියෙහි, කතු වුත්, කර්තෘ උක්ත වේ; කම්, කර්මය තෙම; අවුත් නම්, අනුක්ත නම් වේ.

හුදුකිරියපෙදෙන්, ශුද්ධක්‍රියාපදයෙන්; වුත් අවුත්, උක්තා නුක්ත; ඉති, මෙසේ යි.

**ගිම්රිවිතෙදිනදන්—ගජරජ කුමුටු වනවිල්**
**එහි පිළිබිඹු ඔහු බලා—නො සැහැ වනසනමෙනෙනෙව්. (4)**

**මෙඈ අකම්කිරියනෙන් වුත්කතු.**

---

**රුදුරුබියෙනිතුන්—හදදූදුරට පිවිටු කම්**
**එහිඅඳුහට කටොල් දෙත්-වත්නට වැරැදූ කො රැකෙත්. (5)**

**මෙඈ සකම්කිරියනෙන් වුත්කතු.**

---

වි—මෙහි 'දෙසිණි' යනු ලබදපුත් කම්කිරියකි, මෙයින් 'දහම්' යන කර්මය උක්ත විය. එහෙයින් 'නරදම්සැරිහු විසින්'යි කර්තෘ අනුක්ත වී. 'පිළිපදනේ' යනු කතුකිරියකි, මෙයින් 'අරිසඟ' යන කර්තෘ උක්ත විය. එහෙයින් 'එදම්'යි කර්මය අනුක්ත වී. ක්‍රියාර්ථය පමණක් ම ප්‍රකාශකරන්නා වූ මේ උදාහෘත ආඛ්‍යාත ක්‍රියාපදයෝ ශුද්ධක්‍රියාපද නම් වෙති, සකර්මක ශුද්ධක්‍රියාපදයෙන් වන උක්තානුක්තවිධි මේ උදාහරණද්වයෙන් සිද්ධ යි.

(4) ප—ගිම්රිවිතෙදින්, ඝර්මසූර්යතේජසින්; අදන්, බින්න වූ; ගජරජ, හස්තිරාජ තෙම; වනවිල්, වනතඩාගයෙහි; කුමුටු, නිමග්න වී; (කවර සිතෙකින් මෙන් ද යත්?) ඔහු, ඒ ඝර්මසූර්යයාගේ; පිළිබිඹු, ප්‍රතිබිම්බය; එහි, ඒ වනතඩාගයෙහි; බලා, අවලෝකනය කොට; නො සැහැ, ක්ෂමා නො කොට (=ඉවසිය නොහී); වනසන මෙනෙනෙව්, (සූර්යබිම්බය) විනාශකරන සිතින් මෙනි.

මෙඈ, මේ ආදිය; අකම්කිරියනෙන්, අකර්මක (ශුද්ධ) ක්‍රියායෙන්; වුත්කතු, උක්තකර්තෘ යි.

වි—මේ උදාහරණයෙහි 'ගජරජ, කුමුටු' යනු කර්තෘපදය හා ක්‍රියාපදය යි. කුමුටු යනු 'කුමුද = ගැලීමෙහි' යන අකර්මකධාතුයෙන් කර්තෘකාරකයෙහි අන්සැරු අයුකල් එකබස් උප්‍රත්‍යය වැ සිද්ධ හෙයින් අකර්මක ක්‍රියාවකි. මේ ක්‍රියායොගයෙහි කර්මයෙක් නැත. කර්තෘකාරකක්‍රියා හෙයින් 'ගජරජ' යන කර්තෘ උක්ත වී.

(5) ප—කම්, කාම තෙම; රුදුරුබියෙන්, රුද්‍රයා (=ඊශ්වරයා) කෙරෙන් වූ භීතියෙන්; ඉතුන්, ස්ත්‍රීන්ගේ; හදදූදුරට, හෘදය නමැති ජර්ජරයට (=දිරූ රුක්සිදුරට); පිවිටු, ප්‍රවිෂ්ට වී; එහි ද, ඒ හෘදයකොටරයෙහි ද; ඔහට, ඒ අනඞ්ගයාහට; කටොල් දෙත්, කඨෝර (=දුඃඛ)දානය කෙරෙත්; (ඒ එසේ මැ යි) වත්නට, ශකන යන්ට; වැරැදූ, විරොධි වැ; කො රැකෙත්, කතරස්ථානයෙක්හි රක්ෂිත විය හෙත් ද? (නො හෙත් මැ යි).

**සලෙළු තිළි දූකැ—පියොවුරුබෙයද පියබඳ**
**වුහුමෙහි සක්නරද හිස—නැනැවි උපුරනසිනෙව්. (6)**

**මෙඈ අරුත්කිරියනෙන් වුත්කම්.**

---

මෙඈ, මේ ආදිය; සකම්කිරියනෙන්, සකර්මක (ශුද්ධ) ක්‍රියායෙන්; වුත්කතු, උක්තකර්තෘ යි.

වි—මෙහි ‘පිවිටු’ යනු ‘විස = පිවිසීමෙහි’ යන සකර්මකධාතු යෙන් කර්තෘකාරකයෙහි අන්කරු අයුකල් එකබස් උප්‍රත්‍යය වැ සිද්ධ හෙයින් සකර්මකක්‍රියාවකි. එහෙයින් මේ ක්‍රියායොගයෙහි ‘හදදූදුරට’ යනු කර්ම විය. කර්තෘකාරකප්‍රත්‍යය වූ හෙයින් කර්තෘ උක්ත ය, කර්මය අනුක්ත යි.

මෙසේ සකර්මක අකර්මක ශුද්ධක්‍රියාද්වාරයෙන් කර්ම කර්තෘ දෙදෙනාගේ උක්තානුක්තත්ව දක්වා ඉක්බිති ප්‍රත්‍යයාර්ථශබ්ද ස්වරූප වූ අර්ථක්‍රියායෙන් ද උදාහරණ දක්වන්නෝ ‘සලෙළු තිළි’ යනාදි කව කීහ.

(6) ප—සලෙළු, කාමුක තෙම; පියබඳ, ප්‍රියාඞ්ගියගේ; පියොවුරුබෙය ද, පයෝධර නමැති පර්වතය; දූකැ, දර්ශනය කොට; තිළි, තුෂ්ට වැ හෙවත් සතුටු වූයෙන්; එහි, ඒ පයෝධර පර්වතයෙහි; වුහුටු, හරනලද; සක්නරද, චක්ෂුස් නමැති නාරාචය (යතුල); උපුරන අසින් එව්, උත්පාටනය කරන අධ්‍යාශයෙන් මෙන්; හිස, ශීර්ෂය; නැනැවී, කම්පිත කෙළේ යි.

මෙඈ, මේ ආදිය; අරුත්කිරියනෙන්, අර්ථක්‍රියායෙන්; වුත් කම්, උක්තකර්ම යි.

වි—‘වුහුටු’ යන අර්ථක්‍රියාශබ්දයාගේ සිද්ධිය පසරුත්අදියරෙහි පෙර කියනලද්දේ ය. කර්මකාරකයෙහි නිපන්නා වූ මේ අර්ථ ක්‍රියාශබ්දයෙන් මෙකවෙහි ‘සක්නරද’ යන කර්මය උක්ත වේ. ‘සලෙළු (විසින්) සක්නරද වුහුටු’ යි ක්‍රියාකාරකපදසම්බන්ධය වේ. එවිට ‘සක්නරද’ යන කර්මය ප්‍රථමාවිභක්ති භජනය කෙළේ ය. ඉක්බිති ‘උපුරන’ යන කර්තෘකාරකය අර්ථක්‍රියාව හා යෙදීමෙන්; ඔහු විසින් අනුක්ත විය. එහෙයින් දෙවෙනි ක්‍රියා කාරකපදසම්බන්ධයෙහිදී “සක්නරද උපුරන අසින් එව (හෙතෙම) හිස නැනැවි” කියා යෙදීමෙන් ‘සක්නරද’ යන්න අනුක්ත කර්ම වැ ද්විතීයා විභක්ති භජනය කෙරේ.

**ඒ ඒ විබත්හි අරුත්හි සමස්පස් නමනාමවිබත්අරුත් වුතු නම් කෙරේ.** (7)

**අන්කිරියක් නැත පෙරවිබත් අත්හට වූද යොදනු.** (8)

**වුත්අවුත් අදියර නවවනු.**

---

**කම් කතු කරණ හා—සපදන් අවදි අදර ද**
**මෙවියු විබත් සයට මැ—කරුනම් වියූ පඬුවෝ.** (1)

---

(7) **ප—**ඒ ඒ විබත්හි, ඒ ඒ විභක්තියෙහි ද; අරුත්හි, ඒ ඒ අර්ථයෙහි ද වූ; සමස් පස්, (අන්‍යාර්ථ) සමාසය හා ප්‍රත්‍යය; නම නාම විබත්අරුත්, නම නාමයේ විභක්ති හා අර්ථය; වුතු නම් කෙරේ, උක්ත නම් කෙරේ.

(8) **ප—**අන්කිරියක් නැත, අන්‍ය ක්‍රියාපදයක් නැත්තේ වී නම්; පෙරවිබත් අත්හට, ප්‍රථමාවිභක්ත්‍යන්තයහට; වූද, වූ යන ධාතුව; හෙවත් වූ ධාතුයෙන් නිපන් ක්‍රියාපදය; යොදනු, යුක්ත කරනු.

**වි—**අන්‍යාර්ථසමාසයක් හෝ ප්‍රත්‍යයක් හෝ යම් යම් විභක්ති කාරක අර්ථයෙක්හි කරනු ලැබෙත් නම් සිද්ධ වූ ඒ සමාසාදීන් විසින් ඒ ඒ විභක්තිකාරක අර්ථයෝ උක්ත නම් කරනු ලැබෙත්. '**එරුණුහස්**' ආදි අන්‍යාර්ථසමාසයෝ තබාගාදි අන්‍යාර්ථපදාර්ථයන් උක්ත නම් කෙරෙත්. '**කරනුයේ = කතු**' යනාදීන් පෙර කී ප්‍රත්‍යයාර්ථශබ්දයෝ කර්තෘ ආදි අර්ථයන් උක්ත නම් කෙරෙත්. උක්ත වූ සියල්ලෝ ප්‍රථමාවිභක්තිය භජනය කෙරෙත්. යම් තැනෙක්හි ප්‍රථමාවිභක්ත්‍යන්තපදය හා යෙදෙන ක්‍රියාපදයෙක් නැත්තේ වී නම් එතන්හි වූධාතුයෙන් සිද්ධ වූ '**වේ = වෙත්**' යනාදි ක්‍රියාපදයෙක් සුදුසු සේ අධ්‍යාහාර කටයුතු.

**නවම වූ උක්තානුක්තාධිකාරය යි.**

---

**ක්‍රියාකාරකපදසම්බන්ධාධිකාරය.**

(1) **ප—**කම්, කර්මය ද; කතු, කර්තෘ ද; කරණ හා, කරණය ද; සපදන්, සම්ප්‍රදානය ද; අවදි, අවධිය ද; අදර ද, ආධාරය දැයි යන; මෙවියු, මේ කියනලද; විබත්සයට මැ, විභක්තිෂට්කයට මැ; පඬුවෝ, පණ්ඩිතයෝ; කරුනම්, කාරකනාමය; වියූ, කීහු.

කිරිය නිපැත්මට—හේතෙන් මෙ සකරු නම්
සබඳඅලපෝ බිහි වූ—මෙවැනි අයුරක් නො ලදින්. (2)
යොදනු සබඳ නම්—මෙවිබත් කිරියපද හා
මෙ විනා නො වති වැකියෙක්—විවැකූ අරුත් පවසන. (3)

මුළුදෙට පාපිඬු කනාඟකිලියේ සඳුන්කපින් පිසැ සඟනට දී බෙවෙන් මිදිණි. ඉති කිරියකරුපදන් යොදන අයුරු.

සියල්තැනැ සතලබින් යොදනු. (4)

කිරියකරුපදසබඳඅදියර දසවනු.

---

(2) ප—කිරියනිපැත්මට, ක්‍රියානිෂ්පත්තියට; හේතෙන්, හෙතු වූ හෙයින්; මේ, මෙකී විභක්තිෂට්කය; සකරු නම්, ෂට් කාරක නම් (වියැ); සබඳ අලපෝ, සම්බන්ධ ආලපන විභක්තීහු දෙදෙන; මෙවැනි අයුරක්, (ක්‍රියානිෂ්පත්ති හෙතු සඞ්ඛ්‍යාත) මෙබඳු ආකාරයක්; නො ලදින්, නො ලත් හෙයින්; බිහි වූ, (කාරකනාමයෙන්) බාහ්‍ය වූහු.

භා—කම්, කතෘ, කරණ, සම්ප්‍රදාන, අවධි, ආධාර යන සදෙන ක්‍රියාර්ථයාගේ නිෂ්පාදනයට හෙතු වූ හෙයින් 'ක්‍රියාව කෙරෙයි' යන අර්ථයෙන් **කාරක** නම් වෙතැයි ව්‍යාකරණ ශාස්ත්‍රඥයෝ කියත්. එසේ ක්‍රියානිෂ්පාදනයට හෙතු නො වන හෙයින් සම්බන්ධ ආලපන දෙදෙන කාරක නාමයෙන් පිටත් වූහ හෙවත් **අකාරක** විභක්ති නම් වූහ.

(3) ප—මෙවිබත්, මේ විභක්තීන්; කිරියපද හා, ක්‍රියාපදයක් හා; යොදනු, යුක්තකිරීම; සබඳනම්, සම්බන්ධ නම්; මෙවිනා, මේ සම්බන්ධය හැර; විවැකූ අරුත්, විවක්ෂිතාර්ථයන්; පවසන, ප්‍රකාශ කරන්නා වූ; වැකියෙක්, වාක්‍යයෙක්; නො වති, ප්‍රවෘත්ත නො වේ.

භා—ක්‍රියාපදයක් හා සමග මෙකී කාරකවිභක්තීන් යෙදීම ක්‍රියාකාරකපදසම්බන්ධ නම් වේ. මේ සම්බන්ධය නැති ව කැමැති අර්ථයන් ප්‍රකාශ කළ හැකි වූ වාක්‍යයෙක් අවිද්‍යමාන යි.

වි—වක්තෘහට කැමැති අර්ථයන් ප්‍රකාශකිරීම වාක්‍යයාගේ ප්‍රයොජනය යි. ඒ වාක්‍යය ක්‍රියාපදයකින් ද එය හා යෙදෙන කාරකපදයන්ගෙන් ද යුක්ත වියයුතු යි. එම ක්‍රියාපදය හා කාරකපදයන්ගේ යොජනාව "**ක්‍රියාකාරකපදසම්බන්ධ**" නම් වේ. ඊට උදාහරණ දක්වන්නාහු "මුළුදෙට" යනාදි වාක්‍යය කීහු.

(4) ප—මුළුදෙට, සූදජ්‍යෙෂ්ඨ තෙම; පාපිඬු, පායසපිණ්ඩය; කනාඟකිලියේ, කනකභාජනයෙහි; සඳුන්කපින්, චන්දනකාෂ්ඨයෙන්; පිසැ, පචනය කොට; සඟනට, භික්ෂූන්ට; දී දානය කොට;

**ඉති වියරණ දැන—කිවියර පදි බඳනා**
**ඉටුනිටු ගණඅකුරු ඈ—ලකුණු විමසා බඳනේ. (1)**

**සියලු පටන් මැද අවසන වන ගල නා**
**එ මනබයජරසතනම්නටගණ ව නා**
**දියොද සෙනා ලෙඩ දලසෝ මර වැස නා**
**පටනබිදන්පසු සිටුවා කල කෙමෙ නා (2)**

---

බෙවෙන්, භවයෙන්; මිදිණි, මුක්ත වී. කිරියකරුපදන්, ක්‍රියාකාරකපදයන්; යොදන අයුරු, ප්‍රයෝගකරන ආකාරය; ඉති, මෙසේ යි. සියල්තැන, සකලස්ථානයෙහි; යතලබින්, යථාලාභයෙන්; යොදනු, යොජනය කරනු.

වි—'මුළුදෙට' යනාදි වාක්‍යයෙහි **'මිදිණි'** යනු අකර්මකක්‍රියාපද යැ. එයින් 'මුළුදෙට' යන කර්තෘකාරකය උක්ත වේ. **'බෙවෙන්'** යනු මිදීමට අවධිකාරකය යි. **'දි'** යනු පෙරකිරිය යි. **'සගනට'** යනු ඊට සම්ප්‍රදානකාරකය යි. (මෙහි සඟශබ්දය භික්ෂුවාචක හෙයින් බහුවචන වී.) **'පාපිඬු'** යනු කර්මකාරකය යි. **පිසැ** යනු පෙරකිරිය යි. ඊට ද **'පාපිඬු'** යනු කර්මකාරක වේ. **'සඳුන් කමින්'** යනු කරණකාරකය යි. **'කනාඉකිලියේ'** යනු ආධාරකාරකය යි. කාරකලක්ෂණ විභක්ත්‍යධිකාරව්‍යාඛ්‍යානයෙහි කියන ලද හෙයින් මෙහි විස්තර නො කෙළෙමු.

**දසවැනි වූ ක්‍රියාකාරකපදසම්බන්ධාධිකාරය යි.**

---

## ඉෂ්ටානිෂ්ටාධිකාරය.

(1) **ප**—ඉති, මෙසේ; වියරණ, (විංශතිවිධ) ව්‍යාකරණය; දැන, ජානනය කොට; පදි බඳනා, පද්‍යබන්ධනය කරන්නා වූ; කිවියර, කාව්‍යකාර තෙම; ඉටු, ඉෂ්ට වූ ද; අනිටු, අනිෂ්ට වූ ද; ගණඅකුරු ඈ, ගණඅක්ෂර ආදි වූ; ලකුණු, ලක්ෂණයන්; විමසා, විමංසනය කොට; බඳනේ, බන්ධනය කරන්නේ ය.

**භා**—පෙර කියනලද අධිකාරදශයෙහි කී පරිද්දෙන් ස්වභාෂාව්‍යාකරණය ඉගෙන ගී සැහැලි කව් සිලෝ යන පද්‍යයන් රචනා කරන්නා වූ කවි තෙම ඉෂ්ට වූ ද අනිෂ්ට වූ ද ගණ, අක්ෂර, යෝනි ආදි ලක්ෂණයන් විමසා පද්‍යබන්ධනය කරන්නේ ය. ආදිශබ්දයෙන් ගුණ දෝෂ අලඞ්කාරයන් දන්නේ ය.

(2) **ප**—සියලු, සකලස්ථානය; පටන්, ආදිය; මැද, මධ්‍යය; අවසන, අවසානය යන මෙහි; ගලනා වන, ගුරුලඝුන් වූ කල්හි;

එ, එය; මනබයජරසතනමින්, මගණ නගණ බගණ යගණ ජගණ රගණ සගණ තගණ යන නාමයෙන්; අටගණ වනා, අෂ්ටගණයෙක් වන්නේ ය; පටන්, පද්‍යාරම්භයෙහි ද; අබිදන් පසැ, අභිධාන පාර්ශ්වයෙහි ද; සිටුවා, ස්ථාපනය කොට; කළ, විරචිත කල්හි; කෙමෙනා, ක්‍රමයෙන්; දිය, ජය ද; ඔද, ඔජස් ද; සෙත්, ශාන්ති ද; ආ, ආයුෂ ද; ලෙඩ, රොග ද; දළසෝ, දුඃඛශොක ද; මර, මරණ ද; වැසනා, ව්‍යසන ද (යන විපාක වන්නේ යි.)

වි—ඉෂ්ටානිෂ්ටගණ දක්වනු පිණිස 'සියලු පටන්' යනාදි කව කියනලදි. ගුරු වශයෙන් හෝ ලඝු වශයෙන් හෝ එදෙකින් මිශ්‍ර වශයෙන් හෝ අකුරු තුනක් එක් වූ කලැ ගණයෙක් නම් වේ. ගණශබ්දය සමූහපර්‍යායය වුවත් මෙහි වාක්පර්‍යායය වේ. සියලු වාඞ්මය ම අටගණයෙහි ද තදෙකදෙශ වූ ගුරුලඝු දෙක්හි ද ඇතුළත් වේ. මෙම කියත් ආචාර්‍ය්‍ය ශ්‍රී කෙදාරභට්ටයෝ :-

“ම්‍යරසතජභ්නගෛර්ලාන්තෛරෙභිර්දශභිරක්ෂරෛඃ
සමස්තං වාඞ්මයං ව්‍යාප්තං ත්‍රෛලොක්‍යමිව විෂ්ණුනා”යි.

වාක්පර්‍යායය වූ ගණශබ්දය නිරුක්තශාස්ත්‍රයෙහි යාස්ක මහර්ෂිහු විසින් “ශ්ලොකඃ ධාරා ඉළා ගෞරා” (1.11) යනාදි සූත්‍රයෙහි සප්තපඤ්චාශද්වාග් නාමාන්තරයෙහි දක්වනලද්දේ ය. සියලු වාඞ්මය ම ගුරුලඝුමිශ්‍රාත්මක ගණාෂ්ටකයෙන් ගිණිය හැකි හෙයින් (= මිනිය හැකි හෙයින්) වාඞ්මය නම් ලද සියලු භාෂා ශාස්ත්‍රයන්ට ගණනාමය පර්‍යායය වේ. “ගණ්‍යතෙ ඉති ගණඃ” යනු නිර්වචන යි (මෙයින්) ගණනු ලැබේ නු යි ගණ නම්. 'ගණ = ගණනෙ' යන චුරාද්‍යදන්තපරස්මෛපදීහු කෙරෙන් “අකර්තරි ච කාරකෙ සංඥායාම්” (පා. 3. 3 19) යන සූත්‍රයෙන් කරණයෙහි ඝඤ්ප්‍රත්‍යය වැ සිද්ධ යි. උක්තාදි සවිසි ඡන්දසුන් අතුරෙහි තුන් වන 'මධ්‍යා' නම් ඡන්දස්හුගේ ප්‍රස්තාරයෙන් ලැබෙන වෘත්ත අට ගණ නාමයෙන් ව්‍යවහාර කරනු ලැබේ.

---

### අෂ්ටගණය.

| නාම | වින්‍යාස. | උදහරණ. | දෙවතා. | ඵල. |
|---|---|---|---|---|
| 1 ම | ) ) ) | සෙත්වේවා | භූමි | ඉෂ්ට |
| 2 ය | 1 ) ) | තිලෝනා | ජල | ඉෂ්ට |
| 3 ර | ) 1 ) | බාරුසී | අග්නි | අනිෂ්ට |
| 4 ස | 1 1 ) | නරසී | වායු | අනිෂ්ට |
| 5 ත | ) ) 1 | සප්දැහි | ආකාශ | අනිෂ්ට |

| | | | | |
|---|---|---|---|---|
| 6 ජ | I ) I | මඬෝර | සූර්ය | අනිෂ්ට |
| 7 බ | ) I I | වේසුබ | චන්ද්‍ර | ඉෂ්ට |
| 8 න | I I I | තොපට | දෙව | ඉෂ්ට |

මෙහි පළමුවෙනි අටවෙනි මගණ නගණ දෙක ක්‍රමයෙන් සියල්ල ම ගුරු ව ද, සියල්ල ම ලඝු ව ද සිටියේ ය. සත්වෙනි දෙවෙනි බගණ යගණ දෙක ක්‍රමයෙන් ආදි ගුරු ව ද, ආදි ලඝු ව ද සිටියේ ය. සවෙනි තුන්වෙනි ජගණ රගණ දෙක ක්‍රමයෙන් මධ්‍යගුරු ව ද, මධ්‍යලඝු ව ද සිටියේ ය. සිවුවෙනි පස්වෙනි සගණ තගණ දෙක ක්‍රමයෙන් අන්තගුරු ව ද, අන්තලඝු ව ද සිටියේ ය. මේ පිළිවෙළ ගෙන ආචාර්යයන් විසින් 'සියලු පවන්' යනාදි කව කියනලදි. මෙය ඡන්දෝවෘත්තිකාර භට්ටහලායුධාදි පුරාතනාචාර්යයන් විසිනුදු ප්‍රතිපාදිත බැවි–

"ආදිමධ්‍යාවසානෙසු යරතා යාන්ති ලාඝවම්
භජසා ගෞරවං යාන්ති මනෞ තු ගුරුලාඝවෞ"

යනාදියෙන් පැනේ. මෙකී තාක් විස්තර ඇතුළත් කොට සිත්හි ලා බරන පිණිස ඡන්දෝවිචිතිවේදීන් විසින් මේ මතු දක්වන ශ්ලෝකය කියනලදි.

"මො භූමිස්ත්‍රිගුරුඃ ශ්‍රියං දිශති යො වෘද්ධිං ජලඤ්චාදිලො
රො'ග්නිර්මධ්‍යලඝුර්විනාශමතිලො දෙශාටනං සො'න්ත්‍යගඃ,
තො ව්‍යොමාන්තලඝුර්ධනාපහරණං ජො'ර්කො රුජං මධ්‍යගො
භශ්චන්ද්‍රො යශ උජ්ජ්වලං මුඛගුරුර් නො නාක ආයුස්ත්‍රිලඃ"යි.

"මගණය භූමිගණ නම්, ගුරු තුනෙකි, සම්පත් දෙයි; යගණය ජලගණ නම්, ආදි ලඝු ය අභිවෘද්ධි දෙයි; රගණය ගිනි ගණ නම්, මධ්‍යලඝු ය, විනාශ කෙරෙයි; සගණය වායුගණ නම්, අන්තගුරු ය, දෙශභ්‍රමය කෙරෙයි; තගණය ආකාශගණ නම්, අන්තලඝු ය, ධන විනාශ කෙරෙයි; ජගණය සූර්යගණ නම්, මධ්‍යගුරු ය, රොග කෙරෙයි; භගණය චන්ද්‍රගණ නම්, ආදි ගුරු ය, මහයසස් කෙරෙයි; නගණය දෙවගණ නම්, ලඝු තුනෙකි, ආයුෂ ගෙනදේ". යනු භාව යි.

මෙකියනලද අෂ්ටගණයෙන් ලැබිය හැකි ඉෂ්ටානිෂ්ටඵල කාව්‍යයාගේ ආරම්භයෙහි ද, නාමයාගේ පෙරපරදෙපසෙහි ද යෙදුණු ගණ වශයෙන් සැලකියයුත්තේ ය. එය 'සියලු පවන්' යනාදි කවෙහි අපරාධියෙන් ද, මෙහි දක් වූ 'මො භූමිඃ' යනාදි සිලොවින් ද සුව සේ දතහැකි වේ.

**තියකුරු ගෙණෙක් නම්. නිමෙස්කල් මත්. උසුරුවීමෙහි එක්මත් ඇතියේ ලුහු නම්, දෙමත්ඇතියේ ද හලින් පෙරවූ ද ගුරු නම්, ගත් අඩමත් ඇතියේ. ඇප් ඈ මතසින් වැඩියෙන් මත්වැඩි නම්. ම = සෙත්වේවා. න = තොපට. බ=වේ සුබ. ය = තිලෝනා. ජ=මඬෝර. ර=බාරුසී. ස = තරසී. ත = සප්දූහි.** (3)

**ඉති ඉටුනිටු අටගණපියෝ.**

---

(3) **ප**—තියකුරු, ත්‍ර්‍යක්‍ෂරයෙක් තෙම; ගෙණෙක් නම්, ගණයෙක් නම්; නිමෙස්කල්, නිමෙෂ කාලයෙක් තෙම; මත්, මාත්‍රා නම්; උසුරුවීමෙහි, උච්චාරණය කිරීමෙහි; එක්මත් ඇතියේ, එකමාත්‍රාවක් ඇත්තේ; ලුහු නම්, ලඝු නම්; දෙමත් ඇතියේ ද, මාත්‍රාද්වයක් ඇත්තේ ද; හලින් පෙරවූ ද,(සංයුක්ත) ව්‍යඤ්ජනයා කෙරෙන් පූර්ව වූයේ ද; ගුරු නම්, ගුරු නම්; ගත්, ගාත්‍රාක්‍ෂර තෙම; අඩමත් ඇතියේ, අර්ධමාත්‍රයක් ඇත්තේ ය; ඇප් ඈ, ඇප් යනාදිය; මතසින් වැඩියෙන්, මාත්‍රාංශයෙන් වර්ධිත වූ හෙයින්; මත්වැඩි නම්, මාත්‍රාවෘද්ධි නම්. ම, මගණය තෙම; සෙත්වේවා, සෙත්වේවා යනු යි; හෙවත් ගුරුතුනෙකි; න, නගණය; තොපට, තොපට යනු යි; හෙවත් ලඝුතුනෙකි; බ, බගණය තෙම; වේ සුබ, වේ සුබ යනු යි; හෙවත් ආදිගුරු යි; ය, යගණය තෙම; තිලෝනා, තිලෝනා යනු යි; හෙවත් ආදිලඝු යි; ජ, ජගණය තෙම; මඬෝර, මඬෝර යනු යි; හෙවත් මධ්‍යගුරු යි; ර, රගණය තෙම; බාරුසී, බාරුසී යනු යි; හෙවත් මධ්‍යලඝු යි; ස, සගණය තෙම; තරසී, තරසී යනු යි; හෙවත් අන්තගුරු යි; ත, තගණය තෙම; සප්දූහි, සප්දූහි යනු යි; හෙවත් අන්තලඝු යි. ඉටුනිටු, ඉෂ්ට වූ ද අනිෂ්ට වූ ද; අටගණපියෝ, අෂ්ටගණප්‍රයොග; ඉති, මෙසේ යි.

වි—ගණලක්‍ෂණ පළමු විස්තර කරනලදි. නිමෙෂය යනු ඇසිපිය හෙළීම ය නිමෙෂයක් ප්‍රමාණ වූ කාලය මාත්‍රාවකි. මාත්‍රාවක් කල් කියනු ලබන්නේ ලඝු නම්. හ්‍රස්වාක්‍ෂරය යි. මාත්‍රාදෙකක් කල් කියනු ලබන දීර්ඝාක්‍ෂරය ද, හල්අකුරකින් පෙර වැ සිටි හ්‍රස්වය ද ගුරු නම්. ගාත්‍රා නම් වූ (ස්වර රහිත) ව්‍යඤ්ජනය මාත්‍රාවකින් අර්ධයක් ඇත්තේ ය. ලඝු අක්‍ෂරය ඍජු රෙඛාවකින් ද, ගුරුඅක්‍ෂරය වක්‍රරෙඛාවකින් ද සලකුණු කරනු ලැබේ. l,) මේ ලඝුගුරු දෙකට ලක්‍ෂණ යි. ඇප් යනාදි තන්හි අකාරයාගේ එක්මාත්‍රාවට තවත් මාත්‍රාවකගේ අංශයක් (= කොටසක්) වැඩූ හෙයින් මාත්‍රාවෘද්ධිය යි සලකනු ලැබේ.

**ඉෂ්ටානිෂ්ටගණලක්‍ෂණ මෙසේ යි.**

එ ක ය ම ර ජ අ ණ න ල අං අවාක ර
උ ප බ ග හා නරනමිතිරි වේ අම ර
සුරකර පෙර පසැ වැඩ දේ අවාක ර
නසා සුබ සියල් නරකුරු මැදුම්ස ර (4)

ඉති ඉටුනිටුවණ.

---

'අ ඔ ත ල' ඈ වග වණ සිටි පිළිවෙළි නා
යොදා නකුල් මියු මහවත් වග සපු නා
තුරඟ බිලිඳුමු සරඟන් දූනැ කෙමෙ නා
පෙරපස යොන් බඳු නමයෝනට සොබ නා (5)

ඉති ඉටුනිටු යොන්.

---

වණී.

(4) ප—එකයමරජඅණනලඅං, එ ක ය ම ර ජ අ ණ න ල අං යන (මෙකී අක්ෂර එකොළොස); අවාකර, අපායාක්ෂර නම්; උපබගහා, උ ප බ ග හ යන (මෙකී අක්ෂර පස); නර නම්, මනුෂ්‍යාක්ෂර නම්; ඉතිරි, අතිරික්තාක්ෂර; අමර වේ, දෙවාක්ෂර නම් වේ; සුරකර, දෙවාක්ෂර තෙම; පෙර, පූර්වයෙහි ද; පසැ, (අභිධාන) පාශ්වයෙහි ද; වැඩදේ, වෘද්ධිදනය කෙරෙයි; අවාකර, අපායාක්ෂර තෙම; සියල් සුබ, සකලශුභය; නසා, විනාශ කෙරෙයි; නරකුරු, මනුෂ්‍යාක්ෂර තෙම; මැදුම්සර, මධ්‍යමසාරය හෙවත් මධ්‍යම ඵල ඇත්තේ ය. ඉටුනිටුවණ, ඉෂ්ටානිෂ්ටවණී; ඉති, මෙසේ යි.

වි—වණීයන්ගේ ඉෂ්ටානිෂ්ටඵල දක්වනු පිණිස මෙකාව කියනලදි. මේ ක්‍රමයෙන් ප්‍රාණාක්ෂර පඤ්චකය හා ගාත්‍රාක්ෂර විංශතිය ඉෂ්ට, අනිෂ්ට, මධ්‍යම වශයෙන් ත්‍රිභෙද වේ.

එ ක ය ම ර ජ අ ණ න ල අඃ—අපායාක්ෂර 11 අනිෂ්ට යි.
උ ප බ ග හ මනුෂ්‍යාක්ෂර 5 මධ්‍යම යි
ඉ ඔ ට ඩ ත ද ල ව ස දෙවාක්ෂර 9 ඉෂ්ට යි.

ග්‍රන්ථාන්තරයෙහි අක්ෂරයන්ගේ ඉෂ්ටානිෂ්ටතා දක්වීම මෙයින් වෙනස් ව ද කියනලද හෙයින් මෙහි අනෛකාන්තිකත්වය ද සැලකිය යුතු.

යෝනි.

(5) ප—අඔතල ඈ වග, අඔතල යනාදි වර්ගයෙහි; වණ සිටි පිළිවෙළිනා, වණීයන්ගේ ස්ථිතිපරිපාටියෙන්; යොද, යුක්ත කොට; නකුල්, මුගටි ය; මියු, මහිෂ ය; මහවත්, උලූක ය

**පදිදුබාමැද—සසඳ සඳ සමස් පස්**
**විබත් කරනු විදද්දේ—නො රිසිත් රුසිවිසි දත්.** (6)

( = මහමුහුණු ය); වග, ව්‍යාඝ්‍ර ය; සපුනා, සපී ය; තුරග, අශ්ව ය; බිලීපුටු, කාක ය; සරඟන්, ශාරඞ්ග ය ( = මෘග ය) යන මොවුන්; කොමෙනා, ක්‍රමයෙන්; දූනැ, ජිතනය කොට; පෙර, පද්‍යාරම්භ යෙහි ද; පස, (අභිධානයාගේ උභය) පාර්ශ්වයෙහි ද; නමයෝනට, නාමයොනියට; සොබනා, ශොභන වූ; යොන්, යොනි; බඳු, බන්ධනය කර. ඉටුනිටුයොන්, ඉෂ්ට වූ ද අනිෂ්ට වූ ද යොනි; ඉනි, මෙසේ යි.

වි—අෂ්ටයොනීන්ට වර්ණයන් බෙදන ආකාරය හා ඒ ඒ යොනීන්ගේ නාම වශයෙන් ස්වපක්ෂවිපක්ෂතා ද හැඳිනවීම පිණිස මෙ කව කියනලදි.

අෂ්ටයොනි.

| | |
|---|---|
| 1 අ ඔ න ල—නකුල | 5 උ ජ බ ළ—සපී |
| 2 ආ ඕ ද ව—මහිෂ | 6 ඌ ට ම අං—අශ්ව |
| 3 ඉ ක ත ස—උලූක | 7 එ ඩ ය— කාක |
| 4 ඊ ග ප හ—ව්‍යාඝ්‍ර | 8 ඒ ණ ර— මෘග |

මෙහි ප්‍රථම යොනිය පස්වන යොනිය හා ප්‍රතිවිරුද්ධ ය. එසේ ම දෙවැනි යොනිය සවැන්න හා ද, තුන්වන යොනිය සත්වැන්න හා ද, සිවුවැනි යොනිය අටවැන්න හා ද විරුද්ධ ය. විරුද්ධ යොනි හැර සෙසු සියල්ල ඔවුනොවුන්ට උදාසීන වේ. එහෙයින් ගද්‍යපද්‍යාරම්භයෙහි ද, නාමපාර්ශ්වයෙහි ද අවිරුද්ධ යොනින්ට අයත් අක්ෂර යෙදිය යුතු.

කාව්‍යදෝෂ.

(6) ප—පදිදුබාමැද, පද්‍යයාගේ ද්විභාගමධ්‍යයෙහි; සසඳ, සංසන්දනය වන්නා වූ; සඳ, සන්ධීන්ගේ ද; සමස්, සමාසයන්ගේ ද; පස්, ප්‍රත්‍යයන්ගේ ද; විබත්, විභක්තීන්ගේ ද; කරනු, (ප්‍රයොග) කිරීම; රුසිවිසි දත්, සෘෂිවචන දත්තෘ වූ; විදද්දේ, විදග්ධයෝ ( = පණ්ඩිතයෝ); නොරිසිත්, රුචි නො කෙරෙත්.

ගී, කවි, සිලෝ යන පද්‍යයන්ගේ දෙපාදයක් නිමි තැන ද්විභාග මධ්‍යය වේ. මේ මධ්‍යස්ථානය සන්ධි සමාස ප්‍රත්‍යය විභක්තීන්ගේ නිමාවෙන් යුත් විශ්‍රාමස්ථානයක් වියයුතු ය. පද්‍යයාගේ පූර්වාර්ධ අපරාර්ධ දෙක සන්ධි වශයෙන් හෝ ප්‍රකෘති ප්‍රත්‍යය වශයෙන් හෝ විභක්ති වශයෙන් හෝ ගැළපීම මහ දෙස් හෙයින් ව්‍යාකරණශාස්ත්‍රයෙහි ද ප්‍රතිෂිද්ධ ය. ඡන්දාලඞ්කාරශාස්ත්‍රයන්හි ද වළක්වනලද්දේ ය. උදාහරණ නො පැවත් සුබොධ හෙයින් නිදර්ශන අනුදාහෘත යි.

**අතින් පෙදෙන් හොත—පවසත පුන වියුවා**
**පුනරුත් අරුත් ඒ දනු—යළි සද ද පුනරුත් සේ. (7)**
**වනනට මෙදළඳ—දළ දෙනුයෙ දළඳ නම්**
**සොව්නොබල තුනු තුනුවග—සිගුසෙළෙනග සරු නිගා. (8)**

---

## පුනරුක්තදෝෂය.

(7) **ප**—අතින් හොත, අර්ථයෙන් හෝ; පෙදෙන් හොත, පදයෙන් හෝ; වියුවා, කියනලද්දක්; පුන පවසත, නැවතත් කථනය කළ කල්හි; එ, ඒ (දෝෂය); පුනරුත්අරුත්, පුනරුක්තාර්ථ නමැයි; දනු, ජනනය කරනු; යළි, නැවත; සද ද, ශබ්දයාගේ ද; පුනරුත් සේ, පුනරුක්ත පරිදි; (දනු, ජානනය කරනු.)

**වි**—යම් වාක්‍යයෙක්හි වරක් කියනලද අර්ථයක් හෝ පදයක් හෝ යළිත් කියනුලැබේ නම් එය පුනරුක්තදෝෂවත් වේ.

ආචාර්ය ශ්‍රී භොජදෙවයන් විසිනුදු:—

"පදං පදාර්ථශ්චාභිහිතෞ යත්‍ර තත් පුනරුක්තිමත්"

යන්නෙන් මේ අර්ථය දක්වනලදි. වාමනාචාර්යාදීන් විසින් ඒකාර්ථ දෝෂ නාමයෙන් දක්වනලද්දේත් මේ පුනරුක්ත ම ය. "**උක්තාර්ථ පදමේකාර්ථම්**" යනු වාමනසූත්‍ර යි. කියනලද අර්ථපද ඇති වාක්‍යය ඒකාර්ථ නම්. මේ ආචාර්යමතානුකූල වැ අර්ථපුනරුක්ත, පදපුනරුක්ත සඞ්ඛ්‍යාත දෝෂද්වය දක්වා නැවත තද්ගත වූ ශබ්ද පුනරුක්තයෙක් ද මෙහි කියනලද්දේ ය. මේ කථනය "**ශබ්දයොඃ පුනර්වචනං පුනරුක්තමන්‍යත්‍රානුවාදාත්**" යන පරමාර්ෂි සූත්‍රය ඇසුරු කොට යයි හැඟේ. විශෙෂානුවාදයක් නැති තැනැ ශබ්දයන් දෙදෙනකුන්ගේ පුනර්වචනය පුනරුක්ත වේ. විශෙෂාර්ථයක් හැඟවුවමනා නො වන තැනැ එවැනි පුනරුක්තය සදෝස් වේ. හැඟවුවමනා තැනැ නිදෝස් වේ. ඒ සඳහා වාමනාචාර්යාදීන් විසින් ධනුර්ජ්‍යාධ්වනි, කර්ණාවතංස, ශ්‍රවණකුණ්ඩල, ශිරඃශෙඛර, මුක්තාහාර, පුෂ්පමාලා, කරිකලභාදි ශබ්දයෝ දක්වනලදහ. ආරූඪි, සන්නිධි, ශුද්ධි, උත්කර්ෂ, තාද්‍රූප්‍යාදි අර්ථ සඳහා ජ්‍යා, අවතංස, කුණ්ඩල, ශෙඛර, හාර, මාලා, කලභ යන ශබ්ද විශෙෂයන් විසින් ම කථිත වූ අර්ථ ඇති ධනුස්, කර්ණ, ශ්‍රවණ, ශිරස්, මුක්තා, පුෂ්ප, කරින් ශබ්දයන්ගේ ද කථනය වේ. එහෙයින් පුනරුක්තදොෂ නො වෙයි යනු ආලඞ්කාරික මත යි.

## උදාහරණ.

(8) **ප**—මෙදළඳ, මේ ජලදයක තෙම; වනනට, විරහිණීන්ට; දළදෙනුයෙ, දහදනය කරන්නේ; දළඳ නම්, දළඳ

**පදසසගින් හොත—බෙදුමෙන් හොත අතින් හෝ**
**හුණානිටු ගැමි අරුත්—එ විරුදුඅරුත්දොස් නම්. (9)**
**දිව්රඟ විසකුණන්—තොපකිත්කිළිය නස්නට**
**සොම්ගුණ බමව හිමි නිති—දසදසනැ කොඳහැති සේ.(10)**

---

නම්; අනඟ, අනඞ්ග තෙම; සොවින්, ශොකයෙන්; ඔබල, දුර්බල වූ; තුනුවඟ, තන්‍වඞ්ගියගේ; තුනු, ශරීරය; නිගා කැරැ, නිග්‍රහ කොටැ; සිගු කෙළේ, කෘශ කෙළේ යි.

**වි**—මෙහි දලදා, දල දෙනුයෙ, දලදා යන මොවුන් විසින් දාන දානාර්ථය හෝ ජලදානාර්ථය නැවත නැවත කියනලද්දේ වේ. එහෙයින් අර්ථයෙන් පුනරුක්ත යි. දලදා, දලදා යි එක ම පදය දෙවරක් කීමෙන් පදයෙන් පුනරුක්ත ද වේ. තුනු, තුනුවඟ යන තන්හි තුනුශබ්දය දෙවරක් කියනලදී. මේ ශබ්දයෙන් පුනරුක්තය වේ. ලාටානුප්‍රාසලක්‍ෂණයක් හෝ යමකබන්‍ධනයක් හෝ අභිමත නො වන තැනැ පදයන්ගේ ද ශබ්දයන්ගේ ද පුනරුක්තිය දෝෂ වශයෙන් සලකනු ලැබේ. එහෙයින් **"තාත්පර්‍ය්‍යභෙදෙ ලාටානුප්‍රාසො'භිධෙයභෙදෙ යමකඤ්ච න දොෂඃ"** යනු ආචාර්‍ය්‍ය ශ්‍රී රත්නෙශ්වරයෝ කීහු.

**ග්‍රාම්‍යාර්ථදෝෂය.**

(9) **ප**—පදසසගින් හොත, පදයන්ගේ සංසර්ගයෙන් හෝ; බෙදුමෙන් හොත, (පදයන්ගේ) විභජනයෙන් හෝ; අතින් හෝ, අර්ථයෙන් හෝ; හුණා, ශ්‍රූයමාණ වූ; අනිටු, අනිෂ්ට වූ ද; ගැමි, ග්‍රාම්‍ය වූ ද; අරුත්, (යම්) අර්ථයෙක් ඇද් ද; එ, එය; විරුදුඅරුත් දොස් නම්, විරුද්ධාර්ථදෝෂ නමි.

(10) **ප**—හිමි, ස්වාමිය; විසකුණන්, විචක්‍ෂණයන්ගේ; දිව්රඟ, ජිහ්වා නමැති රඞ්ගයෙහි; තොප, යුෂ්මත්හුගේ; කිත් කිළිය, කීර්ති නමැති ක්‍රීඩිකාව විසින්; නස්නට, නෘත්‍ය කරනු පිණිස; සොම්ගුණ, සෞම්‍යගුණය; කොඳහැති සේ, කුන්දස්තවකයක් මෙන්; නිති, නිරන්තරයෙන්; දසදසනැ, දශදිගන්තයෙහි; බමව, භ්‍රමණය කරව.

**වි**—පදසමූහයක්හුගේ එක්වීමෙන් හෝ, පදච්ඡෙද වශයෙන් වෙන් කිරීමෙන් හෝ,පදයක් පිළිබඳ අර්ථයෙකින් හෝ අසනුලබන නිඃශ්‍රීක අදහස ද, කවිසමයෙන් පිටත ලොකයා කෙරෙහි පමණක් ව්‍යවහාරවන අර්ථය ද විරුද්ධාර්ථදෝෂ නම් වෙයි හෙවත් ග්‍රාම්‍යාර්ථ දෝෂ නම් වේ. පදසංසර්ගයෙන් වන ග්‍රාම්‍යයට ද පදවිභාගයෙන් වන ග්‍රාම්‍යයට ද අර්ථයෙන් වන ග්‍රාම්‍යයට ද එක ම කවෙකින් උදාහරණ දක්වනුකැමැති වූ ආචාර්‍ය්‍යපාදයෝ 'දිව්රඟ' යනාදී කව කීහු.

## ග්‍රාම්‍යපක්‍ෂයට උදාහරණ:-

'දිවිරග' යනාදි කවෙහි අශ්ලීලාර්ථපක්‍ෂයෙහි "දිවිරග වි, සකුණන් නොප අක් ඉත්කිළිය නස්නට සොම්ගුණ බමව හිමිති ඉතිදු අස දසත කොඳ හැතිසේ" යනු කිසියම් ප්‍රියාවක විසින් වල්ලභයක්හට කියාලූ සුරතාක්‍රොශයක් සේත් හැගේ. මේ පද සංසර්ගයෙන් ද පදවිභාගයෙන් ද ජනිත වූ ග්‍රාම්‍යාර්ථ වේ. මෙහි භාවය නිඃශ්‍රීක හෙයින් විඥයන්ට ජුගුප්සාජනක වේ. 'සොම් ගුණ බමව' යන්නෙහි 'බමව' යන ක්‍රියාපදය පද වශයෙන් අග්‍රාම්‍ය වුවත් එයින් ලැබෙන භ්‍රමණාර්ථය ගුණකර්තෘක කොට යෙදීම කවිසමයෙන් පිටත් හෙයින් ග්‍රාමීණ වූ ප්‍රයොගයෙකි. මේ අර්ථයෙන් වූ ග්‍රාම්‍යය යි.

මෙකී ග්‍රාම්‍යාර්ථදොෂය අලඞ්කාරශාස්ත්‍රයෙහි අනෙකවිධ කොට දක්වනලද්දේ ය. සංක්‍ෂෙපයෙන් කියවි වූ ආචාර්‍ය්‍ය ජය දෙවයෝ "එකාං මෙ චුම්බනං දෙහි තව දාස්‍යාමි කඤ්චුකම්" "මට එකම චුම්බනයක් දෙව තිට කඤ්චුකයක් දෙමි" යනාදි නො සරුප්බස් ග්‍රාම්‍ය ය යි කීහ.

වාග්භටාලඞ්කාරයෙහි:-

"යද්‍යත්‍රානුචිතං තදර්ථි තත්‍ර ග්‍රාම්‍යං ස්මෘතං යථා
ඡාදයිත්වා සුරාන් පුෂ්පෛඃ පුරෙ ධාන්‍යං ක්‍ෂිපාම්‍යහම්."

යම් තැනෙක්හි යම් පදයෙක් නුසුදුසු ද එහි එය ග්‍රාම්‍ය ය යි දන්නාලදි. "මම දෙවියන් මලින් වසා ඉදිරියෙහි ධාන්‍ය බහලමි" යනු උදාහරණ යැ යනු භාව යි. මෙහි 'මලින් පුදා ධාන්‍ය වපුරමැ'යි කිම කවිහුගේ අභිප්‍රාය වුවත් 'පුදා' ය යි කියයුතු තැනැ 'වසා' ය යි කීම නුසුදුසු ය. 'වපුරමි' කිවමනා තැනැ 'බහලමි' කීම ද නුසුදුසු යි.

ශ්‍රීභොජදෙවයෝ:-

"අශ්ලීලාමඞ්ගලඝෘණාවදර්ථං ග්‍රාම්‍යමුච්‍යතෙ"යි.

ග්‍රාම්‍යාර්ථය අශ්ලීල ය, අමඞ්ගල ය, ඝෘණාවදර්ථ ය කියා තුන් වැදෑරුම් කොට යළිත්:

"අත්‍රාශ්ලීලමසභ්‍යාර්ථමසභ්‍යාර්ථාන්තරඤ්ච යත්
අසභ්‍යස්මෘතිහෙතුශ්ච ත්‍රිවිධං පරිපඨ්‍යතෙ"යි.

පළමු වූ අශ්ලීලග්‍රාම්‍යය අසභ්‍යාර්ථ ය, අසභ්‍යාර්ථාන්තර ය, අසභ්‍යස්මෘතිහෙතු යයි තුන්වැදෑරුම් කොට කීහ.

"ලොකෙෂු යදශස්තාර්ථමශස්තාර්ථාන්තරඤ්ච යත්
අශස්තස්මෘතිහෙතුශ්චාමඞ්ගලාර්ථං ත්‍රිධෛව තත්"යි.

පෙර පිළිවෙළ යෙදි—පසුපෙදෙ ඉකුත් වී නම්
එ උපිළිවෙළ නම් දෙස්—පැවසූ පදීපඬුවෝ. (11)
සියඟ පියතම වූ—ගිරිඳුසිරිවිසිනට
කසුන්කලද්‍යෝමේවන්—දෙවියෝ සෙතෙළවත්වා. (12)

---

දෙවැනි වූ අමඞ්ගලග්‍රාම්‍යය ද අශස්තාර්ථය, අශස්තාර්ථාන්තර ය, අශස්තසම්ස්මෘතිහෙතු යයි ත්‍රිවිධ කොට දක්වූහ.

"පදමර්ථං ඝෘණාවන්තං යදහාර්ථාන්තරඤ්ච යත්
ඝෘණාවත්සම්ස්මෘතිහෙතුයත් තද්ඝෘණාවදිහ ත්‍රිධා"යි.

තුන්වැනි ඝෘණාවදර්ථග්‍රාම්‍යය ද ඝෘණාවදර්ථය, ඝෘණාවදර්ථාන්තර ය, ඝෘණාවත්සම්ස්මෘතිහෙතු යයි ත්‍රිවිධ කොට කීහ. මෙසින් මූලත්‍රිකයෙහි අශ්ලීල ය යනු "ශ්‍රියයීස්‍යාස්ති තත් ශ්ලීලම් න ශ්ලීලම් අශ්ලීලම්" යන වාක්‍ය විසින් ශ්‍රියක් (= ශොභාවක්) නැත්තේ අශ්ලීල නම්. අසත්තවුන්ට ලජ්ජා උපදවන නිඃශ්‍රික වචන යැ යන අර්ථ යි. අමඞ්ගල ය යනු "න මඞ්ගලම් (ආතඞ්ක දයි ඥප්‍යම්) අස්‍යෙති අමඞ්ගලම්" යන වාක්‍ය විසින් අනිෂ්ට වූ (= සිතට දුක්දෙන) අර්ථ ඇත්තේ අමඞ්ගල නම්. අසත්තවුන්ගේ සිතට පීඩා උපදවන වචන යැ යන අර්ථ යි. "ඝෘණාවාන් අර්ථඃ (ජුගුප්සාදයි ප්‍රත්‍යාය්‍යම්) අස්‍යෙති ඝෘණාවදර්ථම්" යන වාක්‍ය විසින් පිළිකුල් උපදවන අර්ථ ඇති ග්‍රාම්‍යය ඝෘණාවදර්ථ නම්. කුණපගන්ධයක් ආඝ්‍රාණය කරන්නාහට මෙන් අසන්නාහට සිතෙහි පිළිකුල් උපදවන වචන යි. මෙසේ නවවැදෑරුම් ග්‍රාම්‍යාර්ථය ම අලඞ්කාරශාස්ත්‍රයන්හි උදාහරණ සහිත කොට විස්තරකරනලදුවත් ග්‍රන්ථබාහුල්‍යය නො වනු සඳහා මෙහි සංක්ෂෙප කෙළෙමු.

(11) ප—පෙර, පූර්ව (පක්ෂ)යෙහි; යෙදි, යොජිත වූ; පිළිවෙළ, පරිපාටිය; පසුපෙදෙ, පශ්චාත්පදයෙහි; හෙවත් පරපක්ෂයෙහි; ඉකුත් වී නම්, අතික්‍රාන්ත වී නම්; එ, ඒ (දෙෂය), පදීපඬුවෝ, පද්‍ය පණ්ඩිතයෝ; උපිළිවෙළ නම් දෙස්, උත්පරිපාටිකදෙෂ නමැයි; හෙවත් අපක්‍රමදෙෂ නමැයි; පැවසූ, ප්‍රකාශ කළෝ.

(12) ප– ගිරිඳු, පාර්වතී ය; සිරි, ශ්‍රීකාන්තා ය; විසිනට, වාග්දෙවිය යන මොවුන්ට; සියඟ, සතතයෙන්; පියතම වූ, වල්ලභ වූ; කසුන්, කාඤ්චන ය; කලද්‍යෝ, කලධෞත ය; මේ, මෙඝ ය යන මොවුන්ගේ (වර්ණයට බඳු වූ); වන්, වර්ණ ඇති; දෙවියෝ, දෙවතයෝ; සෙත්, ශාන්තිය; එළවත්වා, ආවහනය කෙරෙත්වා.

වි—"ක්‍රමහීනාර්ථමපක්‍රමම්" යනු මෙහි වාමනසූත්‍ර යි. පළමු පක්ෂයෙහි කියනලද පදයෝ 'උද්දෙශිත' නම් වෙති. ඊට

යෙදෙන සේ පශ්චිමපක්ෂයෙහි කියනලද්දහු 'අනුද්දේශිත' නම් වෙත්. උද්දේශිත අනුද්දේශිත දෙපක්ෂයාගේ සම්බන්ධය ක්‍රම නම්. පරිපාටි යනු ද ඊට ම නම්. මෙකී ප්‍රකාරක්‍රමයෙන් තොර වූ අර්ථය අපක්‍රම දෝෂ ඇත්තේ වේ. හෙවත් පිළිවෙළ වැරදවීමෙන් වන 'උපිළිවෙල' නම් දෝෂය වේ.

උදාහරණ:-

උමාවගේ හිමි (= මහදෙවි) තෙමේ රිදියට බඳු සුදුපැහැ ඇත්තෙක. ශ්‍රීකාන්තාවගේ හිමි (= විෂ්ණු) තෙමේ මෙඝයට බඳු නිල්පැහැ ඇත්තෙක. වාග්දෙවියගේ හිමි (= බ්‍රහ්ම) තෙමේ ස්වර්ණයට බඳු රත්පැහැ ඇත්තෙක. එහෙයින් පූර්වෝක්ත දෙවඟනන් තුන්දෙනාගේ නම් පිළිවෙළින් ඔවුන් හිමියෝ "කලධෞමේඝසුන්වන් දෙවියෝ" වෙති. 'සියඟ පියතම වූ' යනාදි කවෙහි ඒ මේ පිළිවෙළ ඉක්මවා 'ඝසුන්කලධෞමේවන් දෙවියෝ'යි යෙදීම උත්පරිපාටික දෝෂය වේ. වාග්භටාදි සමහර සංස්කෘතාලඞ්කාරිකයෝ ප්‍රසිද්ධ චාරිත්‍රාදි ක්‍රම ඉක්මවා කීම අපක්‍රමදෝෂ යයි කීහු.

යේ මෙසේ යි:-

"අපක්‍රමං භවෙද්‍යත්‍ර ප්‍රසිද්ධක්‍රමලඞ්ඝනම්
යථා භුක්ත්වා කෘතස්නානො ගුරූන් දෙවාංශ්ච වන්දතෙ"

යම් වාක්‍යයෙක්හි ප්‍රසිද්ධනියමයාගේ ඉක්මවීමෙක් වේ නම් ඒ වාක්‍යය අපක්‍රමදෝෂයෙන් දුෂ්ට වේ. ඒ මෙසේ ය:- 'ස්නානය කළ තැනැත්තේ වළඳා ගුරුනුදු දෙවියනුදු වඳියි' යන උදාහරණ යයි. ගුරුදෙවප්‍රණාමයෙන් පසු වැළඳිය යුතු ය යනු ප්‍රසිද්ධ නියමය වේ. එය ඉක්මවා කී හෙයින් මෙකී වාක්‍යය අපක්‍රමදෝෂ යුක්ත යයි සලකනු ලැබේ.

අපක්‍රමදෝෂය 'ක්‍රමභ්‍රෂ්ට' යන නමෙකින් ද භොජරාජාදි ආචාර්යවරයෝ දක්වූහ. ඔවුන්ට ක්‍රමභ්‍රෂ්ටය තෙම ආර්ථ ය, ශාබ්ද ය යන දෙපරිද්දෙකින් ම අභිමත ය. යේ මෙසේ යි:-

"තුරඞ්ගමථ මාතඞ්ගං ප්‍රයච්ඡාසෙම මදාලසම්
කාන්තිප්‍රතාපෞ භවතඃ සූර්යාචන්ද්‍රමසොඃ සමෞ"

අසෙම, මොහට; මදාලසම්, මදයෙන් අලස වූ හෙවත් මදයෙන් මත් වූ; මාතඞ්ගං, ඇතකු; ප්‍රයච්ඡ, දෙව; අථ, නොහොත්; තුරඞ්ගම්, අසකු (දෙව). මෙහි පසු ව යෙදියයුතු වූ තුරඞ්ගශබ්දය පළමු කොට යෙදීම ශාබ්දපක්‍රමදෝෂය යි. භවතඃ, තාගේ; කාන්තිප්‍රතාපෞ, කාන්තිය ප්‍රතාපය යන දෙදෙන; සූර්යාචන්ද්‍රමසොඃ,

**ලේවන් සමුදුරෙන්—උලැගියෙ වරහ දෙරණත**
**වියයුතු බැවින් මුලුසුන්—සප්ලේ මෙ වේ නේදෙස්. (13)**

---

හිරු සඳු දෙදෙනාගේ (කාන්තිප්‍රතාප දෙක හා); සමෙඃ, සදෘශ (වෙත්). මෙහි කාන්ත්‍යර්ථය සූර්‍ය්‍යාහට ද ප්‍රතාපාර්ථය චන්ද්‍රයාහට ද සම්බන්ධ වන සේ කීම ක්‍රමභ්‍රංශය වේ. 'කාන්තිප්‍රතාපෞ' යනු 'කිත්තිප්‍රතාපෞ' යී ද ග්‍රන්ථාන්තරයෙහි පැනේ. එහි කිත්තිය සූර්‍ය්‍යරශ්මිය හා ද ප්‍රතාපය චන්ද්‍රරශ්මිය හා ද සම්බන්ධ වන හෙයින් අර්ථාපක්‍රම දෝෂය වේ.

(13) ප—වරහ, වරාහරූපී වූ විෂ්ණුහු විසින්; ලේවන් සමුදුරෙන්, (බුරක්ෂුණ්ණසපිරුධිරය හෙතු කොට) රුධිරවර්ණ වූ සමුද්‍රයෙන්; දෙරණත, ධරණිය; උලැඟියෙ, උල්ලඞ්ඝිත විය; මුලුසුන්, මූලොච්ඡින්න වූ; සප්ලේ, සපිරුධිරය; වියයුතු බැවින්, (අධ්‍යාහාරයෙන්) වක්තව්‍ය වූ හෙයින්; මෙ, මේ තෙම; නේදෙස් වේ, නෙයදෝෂ නම් වේ.

වි—"වරාහයා විසින් ලේවන්මුහුදින් පොළොව නඟනලදී" යි කී පමණින් "වරාහරූපධාරි විෂ්ණුහු විසින් තමන් කුරපහරින් සුන්කරනලද නාගයන්ගේ ලෙයින් ලේපැහැ වූ සමුද්‍රයෙනැ" යි අසන්නාහට කවිහුගේ අභිප්‍රාය අවබොධ නො වේ. අභිප්‍රාය සම්පූර්ණ නො වන සේ වාක්‍ය යෙදූ කල්හි කියවි වූ අර්ථය අධ්‍යාහාර පදයෙන් දතගත යුතු වේ. මේ 'නෙයදෝෂ' නම්.

ආචාර්‍ය්‍ය ශ්‍රී දණ්ඩිහු විසින් අර්ථව්‍යක්තියගේ විපර්‍ය්‍යය නෙයාර්ථ දෝෂ නමැයි කියනලද්දේ ය. 'අර්ථව්‍යක්ති' නම් වක්තෘහුගේ අදහස් ශ්‍රොතෘජනයා කෙරෙහි ප්‍රකාශවීමට වුවමනානාක් විශෙෂණවිශෙෂ්‍යපදයන්ගෙන් වාක්‍යය සම්පූර්ණ වැ පැවැත්ම ය. මේ අර්ථව්‍යක්තිය ආචාර්‍ය්‍ය ශ්‍රී දණ්ඩ්‍යාදීන්ට ඉෂට වූ දශවිධ කාව්‍ය ප්‍රාණයෙහි ද ශ්‍රී මම්මටභට්ටාදීන්ට ඉෂට වූ ගුණත්‍රයෙහි ද ඇතුළත් ශබ්දගුණයෙකි. අර්ථයාගේ සම්පූර්ණාවබොධයට වෙනස් ව ඌන කොට යෙදීම එහි විපර්‍ය්‍යය යි. හේ මෙහි නෙයත්වය වේ. මීට ප්‍රාචීනාලඞ්කාරිකයන් විසින් දක්වනලද උදාහරණය ම සිදතෙහි කියනලද්දේ ය.

හේ මෙසේ ය :–

"මහී මහාවරාහෙණ ලොහිතාදුද්ධෘතොදධෙඃ
ඉතීයත්‍යෙව නිර්දිෂ්ටෙ නෙයා ලෞහිත්‍යහෙතවඃ"

මහාවරාහෙණ, මහාවරාහරූපධාරී වූ විෂ්ණුහු විසින්; මහී, පෘථිවී තොමෝ; ලොහිතාත් උදධෙඃ, ලෙහෙවන් සමුද්‍රයෙන්;

උද්ධෘතා ඉති, උපුරනලද්දී යයි; ඉයති එව, මෙපමණක් ම; නිර්දිෂ්ටෙ, දක්වනලද කල්හි; ලොහිත්‍යහෙතවඃ, ලෙහෙවන් බැව්හි හෙතු වූවෝ; නෙයාඃ, (අධ්‍යාහාරයෙන්) දතයුත්තාහු (වෙත්).

විෂ්ණුහු වරාහවෙශධාරී ව සමුද්‍රමධ්‍යයෙන් පොළොව නඟන කල්හි (=මතු කරන කල්හි) සුනු වූ සපියන්ගේ ලෙය මුහුදුදිය හා එක්වීමෙන් සමුද්‍රය ලෙහෙවන් විය යි ලෞහිත්‍යහෙතුව හැඟවීම වක්තෘහට අභිමත වුවත් මේ ශ්ලොකපූර්වාර්ධයෙහි කී වාක්‍ය පමණෙකින් ශ්‍රොතෘන්ට එය නො හැඟේ. අධ්‍යාහාරයෙන් දත යුත්තක් ම වේ. නිරායාසයෙන් නො හැඟෙන මෙවැනි අර්ථයන් අධ්‍යාහාරයෙන් ගතයුතු සේ යෙදුවහොත් ඒ වාක්‍යය නෙයදොෂ යෙන් දුෂ්ට වේ. මෙයින් අන්‍ය වූ ද නෙයදොෂයෙක් අලඞ්කාර ශාස්ත්‍රඥයන් විසින් සලකනලද්දේ ය. "කල්පිතාර්ථං නෙයාර්ථම්" යන සූත්‍රයෙන් ඒ නිර්දිෂ්ට යි.

"ස්වසඞ්කෙතප්‍රක්ලෘප්තාර්ථං නෙයාර්ථමිති කථ්‍යතෙ"

මුඛ්‍යාර්ථය වලහා රූඪිඅර්ථය ද නො ගෙන ලක්ෂණාවශයෙන් කවිහු තමා විසින් කල්පනා කරනලද සලකුණින් සලසාගත් අර්ථය නෙයාර්ථ නමැයි කියනුලැබේ. ශබ්දයාගේ මුඛ්‍යාර්ථය ද, රූඪ වූ (= ප්‍රසිද්ධ වූ) අර්ථය ද හැර ඒ ආශ්‍රයෙන් අමුතු ව යොදගත් අර්ථ ඇති පදය යනු භාවයි. මේ සඳහා භොජරාජොක්ත උදාහරණය මෙසේ යඃ-

"මුඛාංශවන්තමාස්ථාය විමුක්තපශුපඞ්ක්තිනා
පඞ්ක්ත්‍යනෙකජනාමධ්‍රුතකා ජිත උලූකජිත්."

විමුක්තපශුපඞ්ක්තිනා, හරනලද ශරපඞ්ක්ති ඇති; පඞ්ක්ත්‍යනෙකජනාමධ්‍රුතකා, ලක්ෂ්මණයා විසින්; මුඛාංශවන්තම්, හනුමත්හු පිටට; ආස්ථාය, ආරූඪ වැ; උලූකජිත්, ඉන්ද්‍රජිත් තෙම; ජිතඃ, දිනනලදී.

මෙහි මුඛාංශවත්ශබ්දය කවීහු විසින් හනුමත්හට සලසාලූ නාමයෙකි. මෙ මුඛ්‍යාර්ථ වශයෙන් හෝ රූඪි වශයෙන් හෝ මෙකී අර්ථයෙහි නො ලැබේ. හනුව මුඛයාගේ අංශයෙකි. එහෙයින් මුඛාංශය ඇත්තේ ය යනු හනුමත්පර්යාය කොට කල්පිත යි. පශු යනු ගොශබ්දපර්යාය යැ, ගොශබ්දය ශරපර්යාය යැ. එහෙයින් පශු යනුත් ශරපර්යාය වෙයි කියා කවිහු විසින් කල්පිත යි. 'පඞ්ක්ති' යනු දසවෙනි ඡන්දසට නමෙක. 'අනෙකජ' යනු

නොයෙක් වර උපන්නේ ය යන අර්ථ ඇති හෙයින් ද්විජපර්‍යායය කොට කල්පිත යි. මෙහි ද්විජ යනු චක්‍රවාකපක්‍ෂි තෙමේ යි. ඔහුගේ නාමය 'චක්‍ර' යනු යි. චක්‍රය රථාවයවයෙක් වේ. ඒ චක්‍රය ධරන්නේ 'අනේකජනාමධ්‍ර' නම්. රථය යි. පළමු කී දශය හා රථය එක්වීමෙන් 'දශරථ' නාමය සිද්ධ වේ. 'තුක්' යනු අපත්‍ය පර්‍යායය යි. දශරථයාගේ දරුය යන අර්ථය ගෙන "පඞ්කත්‍යනෙක ජනාමධ්‍රතුක්" යන නාමයක් කවිහු විසින් ලක්ෂ්මණ කුමාරයාහට ලක්‍ෂණයෙන් කල්පිත ය. 'උලූක' යනු කෞශිකයාහට (=මහමුහුණු හට) නමෙක, කෞශික යනු ඉන්ද්‍රයාහට ද නමෙකි. එහෙයින් 'උලූක' යනු ද ඉන්ද්‍රපර්‍යායය කොට ගෙන ඉන්ද්‍රජිත්හට 'උලූකජිත්' යන නාමයක් කවිහු විසින් කල්පිත යි. මෙසේ සිතුමතින් ලාක්‍ෂණික වශයෙන් සලසාගත් පද 'නෙයාර්ථ' නම් වේ. මෙවැනි යෙදුම් ශාස්ත්‍රයෙහි ප්‍රතිෂිද්ධ යි.

තවද—කාව්‍යප්‍රකාශසාහිත්‍යදර්පණාදි අලඞ්කාරශාස්ත්‍රයන්හි ලක්‍ෂ්‍යාර්ථයෙහි මුඛ්‍යාර්ථයාගේ අසම්බන්ධය ද නෙයාර්ථය යි සලකන ලද්දේ ය.

"කමලෙ චරණාඝාතං මුඛං සුමුඛි තෙ 'කරොත්'"

සුන්දර වූ මුඛ ඇත්තිය, තීගේ මුහුණ පද්මයෙහි පාදප්‍රහාරය කෙළේ ය. හෙවත් පද්මය පැරද විය" යන මෙහි චරණාඝාත (=පයින් ගැසීම) යන්නෙන් පැරද වූ බව හැගවීම කවිහුගේ අභිප්‍රාය වේ. එසේ ද වුවත් ඊට නතීං වූ මුහුණට චරණයක් නැති හෙයින් චරණාඝාතපදයාගේ යෙදීම අසම්බන්ධජනක වේ. මෙහි නිර්ජිතත්වය ලක්‍ෂ්‍යාර්ථ යැ චරණය මුඛ්‍යාර්ථ යි.

"ශරත්කාලසමුල්ලාසි පූර්ණිමාශර්වරීප්‍රියම්
කරොති තෙ මුඛං තන්වි චපෙටාපාතනාතිථිම්."

මෙ ද නෙයාර්ථයට උදාහරණයෙකි.

තන්වි, එම්බා තන්වඞ්ගිය; තෙ, තීගේ; මුඛම්, මුහුණ තෙම; ශරත්කාලසමුල්ලාසි, ශරත්කාලයෙහි බබළන්නා වූ; පූර්ණිමා ශර්වරීප්‍රියම්, පුණු පොහෝද චන්ද්‍රයා (=සරාපුන්සඳමඬල); චපෙටා පාතනාතිථිම්, අතුල්පහර දීමෙහි සුදුස්සකු හෙවත් පැරදුණු එකකු; කරොති, කෙරේ.

මෙහි ශොභාව කරණකොටගෙන පැරදවීම ලක්‍ෂණාර්ථ වශයෙන්; "චපෙටාපාතන" ශබ්දයෙන් හැඟ වූ නමුත් මුඛ්‍ය

**එ තට දිය දේවා—රිවි රැඑර කටමැණ**
**නො පැලැගිකෙළෙනැසුරැ ඒ-මෙදෙස් අසබහව් නම්.(14)**

---

වශයෙන් හැඟෙන අර්ථය වූ කරතලප්‍රහාරය මුඛසඞ්ඛ්‍යාත කතීඃ හට සම්බන්ධ නො වන හෙයින් මෙ ද ‘නෙයාර්ථ’ දෝෂය යි කියන ලදි.

අසම්භාව්‍යදෝෂය.

(14) ප—රැඑර, රාහු නමැති සපියාහට; කටමැණ, කණ්ඨ මාණික්‍යයක් බඳු වූ; එරිවි, ඒ සූර්‍ය්‍යී තෙම; තට, යුෂ්මත්හට; දිය දේවා, ජයදූතය කෙරේවා; ඒ ඇසුරැ, ඒ ආශ්‍රය; නො පැලැගි කෙළෙන්, අනුචිත කළ හෙයින්; මේ දෙස්, මේ දෝෂය තෙම; අසබහව් නම්, අසම්භාව්‍යදෝෂ නම් වේ.

වි—මෙහි රාහුග්‍රස්ත සූර්‍ය්‍යී තෙමේ පරාජයට පැමිණියෙක. හේ යුෂ්මත්හට ජයදූතය කෙරේවයි කවිහු විසින් යෙදීම ප්‍රස්තාවට සුදුසු නො වේ. ප්‍රස්තාවොචිත නො වන යෙදීමට වඩා කාව්‍යයාගේ රසභඞ්ගයට අතික් කරුණෙක් නැත් ම ය.

කියනලදමැ යි :-

“අනෞචිත්‍යාදෘතෙ නාන්‍යත් රසභඞ්ගස්‍ය කාරණම්
ප්‍රසිද්ධෞචිත්‍යබන්ධස්තු රසස්‍යොපනිෂත්පරා”යි.

මේ අනුචිතාර්ථදෝෂයට පුරාතනයෝ “තපස්විභිර්‍යා” යනාදි ශ්ලෝකය උදාහරණ කළහ.

“තපස්විභිර්‍යා සුචිරෙණ ලභ්‍යතෙ ප්‍රයත්නතඃ සත්‍රිභිරිෂ්‍යතෙ ච යා
ප්‍රයාන්ති තාමාශුගතිං යශස්විනො රණාශ්වමෙධෙ පශුතාමුපාගතාඃ.”

රණාශ්වමෙධෙ, යුද්ධස්වරූප වූ යාගයෙහි; පශුතාම්, (බිලිය මට දුන්) ගෙරින් බවට; උපාගතාඃ, පැමිණියා වූ හෙවත් මරණයට පැමිණියා වූ; යශස්විනඃ, කීර්ත්තිමත් (වීරපුරුෂයෝ); යා, යම් ගතියක් තොමෝ; තපස්විභිඃ, තාපසයන් විසින්; සුචිරෙණ, ඉතා බොහෝ කලෙකින්; ලභ්‍යතෙ, ලබනු ලැබේ ද; යා ච, යම් ගතියක් තොමෝ වනාහි; සත්‍රිභිඃ, යාඥිකයන් විසින්; ප්‍රයත්නතඃ, මහොත්සාහයෙන්; ඉෂ්‍යතෙ, පතනු ලැබේ ද; තාම් ගතිම්, ඒ (සුගති) ගතියට; ප්‍රයාන්ති, පැමිණෙත්.

මෙහි පශුපදය වීරපුරුෂයන්ගේ කාතරත්වය පහළකෙරේ. එහෙයින් මේ අනුචිතාර්ථ ( = අසම්භාව්‍ය) දෝෂය වේ.

දෙව් බරඬඅඬනෙත්—පස් විසිගුණ රකන තා
නෑසුණනෑ අරුත්ඇතිසෙන්-මේ දනු ගුළුඅරුත්දෙස්. (15)

ගූඪාර්ථදෝෂය.

(15) ප—බර, ද්වාදශයක් සම්බන්ධි වූ; අඬඅඬනෙත්, අඬයෙකින් අඬයක් නෙත්‍ර ඇති; දෙව්, දෙව්තෙම හෙවත් ත්‍රිනෙත්‍ර තෙම; පස් ගුණවිසි, පඤ්චගුණිත විංශතියක් හෙවත් (වශී) ශතයක්; තා, යුෂ්මත්හු; රකන, රක්‍ෂාකරන්න; මේ, මේ (දෝෂය) තෙම; අතෑ නෑසුණු, අනතඃප්‍රචිජතාත වූ; අරුත් ඇතියෙන්, අර්ථ ඇති හෙයින්; ගුළුඅරුත්දෙස්, ගූඪාර්ථදෝෂ නමැයි; දනු ජානනය කරනු.

වි—මෙකවෙහි 'තිනෙත්' යන පදාර්ථය සිද්ධ කරනු පිණිස 'බරඬඅඬනෙත්' යනු ද 'සිය' යන පදාර්ථය පිණිස 'පස් විසිගුණ' යනු ද ශබ්දාඩිකායය කරණකොටගෙන අර්ථය සඟවාලූ තැනි. එහෙයින් මේ 'ගූඪාර්ථදෝෂ' නමැයි කියූ. භොජරාජාදි අලඞ්කාරිකයන් විසින් කියනලද අපුෂ්ටාර්ථදෝෂය ද මේ ලක්‍ෂණයෙන් යුක්තය. හේ මෙසේ සි :—

"ශතාඬපඤ්චාංශභුජො ද්වාදශාඬාඬලොචනඃ
විංශත්‍යඬාඬමූඬා වඃ පුනාතු මදනාන්තකඃ"

සියයක්හුගේ අඬයෙන් පස්වන කොටසක් බාහු ඇති (හෙවත් අත් දසයක් ඇති) දෙළොසක්හුගේ අඬයෙන් අඬයක් නෙත් ඇති (හෙවත් තුන්නෙතක් ඇති) විස්සකගේ අඬයෙන් අඬයක් හිස් ඇති (හෙවත් මුහුණු පසක් ඇති) සමරාරි තෙම (මහදෙව් තෙම) තොප පිරිසුදු කෙරේවා— යනු භාව යි.

දශබාහුඃ, ත්‍රිලොචනඃ, පඤ්චවක්ත්‍රඃ, සි කියයුතු තැන් බහුතර පදයෙන් කී පමණක් මුත් ඒ කරණකොටගෙන කාව්‍යයාගේ සවල්පමාත්‍ර වූ ද උත්කර්ෂයක් (=අර්ථපොෂණයක්) නො පැනෙන හෙයින් මේ අපුෂ්ටාර්ථදෝෂ නම් වේ.

වාමනාදි ආචාර්‍ය්‍යවරයන් විසින් කියනලද ගූඪාර්ථදෝෂය මේ හා සම නො වේ. "අප්‍රසිද්ධාර්ථප්‍රයුක්තං ගූඪාර්ථම්" යනු ගූඪාර්ථ සංඥ සූත්‍ර යි. කවිසමයෙහි ප්‍රසිද්ධ වූ ද අප්‍රසිද්ධ වූ ද දෙඅර්ථයෙක්හි (නිඝණ්ටුශාස්ත්‍ර බලයෙන්) කියහැකි වූ යම් පදයෙක් ඒ අප්‍රසිද්ධාර්ථයෙහි යොදා කියනලද්දේ වී නම් හේ 'ගූඪාර්ථදෝෂ' නම් වෙයි යනු අර්ථයි. හේ මෙසේ ය.

"සහස්‍රගොපිවානීකාං භවතො දුඃසහං පරෛඃ
භරෙරිව තවාභාන්ති භාත්‍යතෙජාංසි තෙජසි"

**සිසි සේ හසක මෙන්-විමලඹරය තලන් මෙන්**
**රිවි එව් කදේ සොබනේ-නහ එව් බෙලෙ හිමිගෙරෙන්.** (16)

---

භවතඃ, යුෂ්මත්හුගේ; අතීකම්, සෛන්‍යය; සහස්‍රගෝඃ ඉව, සහස්‍රාක්‍ෂයාගේ (සෛන්‍යය) මෙන්; පරෛඃ, සතුරන් විසින්; දුඃසහම්, මැඩපිය නො හැක්කේ ය; තව, යුෂ්මත්හුගේ; තෙජසි, තෙද පවත්නා කල්හි; හරෙඃ ඉව, හිරුගේ (තෙද පවත්නා කල්හි) මෙන්; අන්‍යතෙජාංසි, අන්‍යයන්ගේ තෙජස්හු; න ආභාන්ති, නො දිලෙත්.

මෙහි **සහස්‍රගු** ශබ්දය සහස්‍රාක්‍ෂ (= ශක්‍ර)පර්‍යායය කොට කියන ලදී. **ගො**ශබ්දය නිඝණ්ටු නයින් නෙත්‍රාර්ථයෙහිද ඇතත්* කවිසමයෙහි නෙත්‍රාර්ථයෙහි අප්‍රසිද්ධ ය. හරිශබ්දය නිඝණ්ටු නයින්† සූර්‍යපර්‍යාය කොට මෙහි යොදන ලදුවත් කවිසමයෙහි සූර්‍යාර්ථ වූ හරිශබ්දයාගේ බහුල ප්‍රසිද්ධියක් නො පැනේ. එහෙයින් මෙදෙක **ගූඪාර්ථදෝෂ**වත් යයි සලකන ලදී.

**භින්නලිඞ්ගවචන හා හීනොත්කෘෂ්ටතා.**

ඉක්බිති භින්නලිඞ්ගාදිදෝෂචතුෂ්කයට **දණ්ඩ්‍යලඞ්කාරාදියෙහි** කියන ලද :-

“හංසීව ධවලශ්චන්ද්‍රඃ සරාංසීවාමලං නභඃ
භර්තෘභක්තො භටඃ ශ්වෙව ඛද්‍යොතො භාති භානුවත්”

යන උදාහරණ ම ගෙනහැර දක්වන්නාහු “**සිසි සේ හසක මෙන්**” යනාදි කව කීහු.

(16) **ප**—සිසි, චන්ද්‍ර තෙම; හසක මෙන්, හංසියක මෙන්, සේ, ධවල යැ; අඹරය, ආකාශය තෙම; තලන් මෙන්, තඩාගයන් මෙන්; විමල, නිර්මල යැ; කදෝ, ඛද්‍යොත තෙම; රිවි එව්, සූර්‍යයා මෙන්; සොබනේ, ශොභමාන වෙයි; බෙලේ, භට තෙම; හිමි ගෙරෙන්, ස්වාමි ගෞරවයෙන්; නහ එව්, ශුනකයකු මෙනි.

**භා—සිසි, හසක** යන උපමෙය උපමාන දෙක්හි **භින්නලිඞ්ග දෝෂය** ද; **අඹරය, තලන්** යන උපමෙය උපමාන දෙදෙනාගේ **භින්නවචනදෝෂය** ද; **කදෝ, රිවි** යන උපමෙය උපමාන දෙදෙනාගේ සම්බන්ධයෙහි **අධිකොපමාදෝෂය** ද; **බෙලේ, නහ** යන උපමෙය උපමාන දෙදෙනාගේ සම්බන්ධයෙහි **න්‍යූනොපමාදෝෂය** ද; මෙහි සතරපාදයෙහි ක්‍රමයෙන් දක්වන ලදහ.

---

* ‘ගෞඃ ශරාක්ෂිපයඃස්වර්ගපශුවජ්‍රවමඃසු ච’

† ‘හරිඃ කෘෂ්ණෙ ච සිංහෙ ච භෙකාහිභුජගෙෂු ච’—යනු නිඝණ්ටු යි.

**බුන්ලිඟුබස මෙසේ—උකටනිසුවම් මහදෙස්**
**විමසා කව් කරනුයේ—සබමැද යස බජනුයේ.** (17)

**මේ ඈ,සුණු වරා—පොරණැදුරන් දැනැ පදි**
**මත්සඳ එළි ද සවහන්—සමසේ සොඳ, බඳනේ.** (18)

**ඉති ඉමුනිමුඅදිසර එකොළොස්වනු.**

---

(17) **ප**—මෙසේ, මෙපරිද්දෙන්; බුන්ලිඟුබස, භින්නලිඞ්ග භින්නවචන ද; උකටනිසුවම්, උත්කෘෂ්ටනීචොපමා ද යන; මහ දෙස්, මහාදෝෂයන්; විමසා, විමංසනය කොට; කව් කර නුයේ කාව්‍යබන්ධනය කරන තැනැත්තේ; සබමැද, (විද්වත්) සභාමධ්‍ය යෙහි; යස බජනුයේ, යශස් භජනය කරන්නේ යි.

**වි**—භින්න වූ ලිඞ්ගවචනයෝ ද හීනොත්කෘෂ්ට උපමාවෝ ද කිසි තැනෙක්හි ප්‍රාඥයන්ගේ අනුද්වේජකත්වාදිය හෙතුකොට ගෙන ගුණත්වයට ද පැමිණෙතැ යි අලඞ්කාරශාස්ත්‍රොක්ත හෙයින් දෝෂයන්ගේ ද ගුණීභාවය විමසා දැන නිදෙස් වූ පරිද් දෙන් කව් බඳනේ කීර්තිය හා ප්‍රීතිය වින්දනය කෙරේ.

එයින් කිහ :-

"යද්භින්නලිඞ්ගමිත්‍යු ත්‍තං විභින්නවචනඤ්ච යත්
උපමාදූෂණං තන්න යත්‍රොද්වෙගො න ධීමතාම්"

යම් තැනෙක්හි භින්නලිඞ්ග භින්නවචනයන්ගේ යෙදීමෙ කින් කවීන්ට අප්‍රීතියක් නූපදි ද එවැනි තැනැ භින්නලිඞ්ගය ද භින්නවචනය ද උපමාදූෂණ නො වෙයි යනු භාව යි. හීනොත් කෘෂ්ට උපමාවෝ ද ද්‍රතිප්‍රසිද්ධිය ඇති කල්හි දූෂණ නො වෙත්. 'තත් ප්‍රසිද්ධෞ න දූෂ්‍යති" යනු ඒ සඳහා භොජරාජොක්ති යි.

මාඝකාව්‍යයෙහි :–

'අත්‍යද, භූෂණං පුංසඃ ශමො ලජ්ජෙව යොෂිතඃ
පරාක්‍රමඃ පරිභවෙ වෛයාත්‍යං සුරතෙෂ්විව"

යන මෙහි පුංසඃ, යොෂිතඃ යන දෙදෙනාගේ ද-ශමඃ, ලජ්ජා යන දෙදෙනාගේ ද උපමෙයොපමානත්වය ඇතත් භින්නලිඞ්ගත් වය වේ. සමානලිඞ්ගයෙන් දැක්විය යුතු පයර්‍යායාන්තරයක් නැත්තෙන් මේ ප්‍රයොගය ගුණත්වයට පැමිණියේ ය. පරිභවෙ, සුරතෙෂු යන දෙදෙනාගේ වචන භෙදය ද කවීන්ට අනුද්වේජක හෙයින් ගුණ වේ. මෙසේ සෙසු දෝෂයන්ගේ ද අපවාදය විධි වූ පරිද්දෙන් සලකනු

(18) **ප**—මේ ඈ, මේ ආදි වූ; අසුණු, දෝෂයන්; වරා, වරණය **කොටැ; පොරණැදුරන්,** පුරාතනාචාර්‍යයන්ගේ; පදි, **පද්‍යයන්;**

දූතෑ, ජානනය කොට; මත්, මාත්‍රා ද; සඳ, ඡන්දස් ද; එළි ද, අඞ්ගණස්ථාන ද, යවහන්, යවහන් යන චතුරක්ෂරයන්ගේ ප්‍රයොග ද; සම සේ, (ඡේකයන්ගේ පද්‍යබන්ධන හා) සම වන පරිද්දෙන්; හෙවත් ඡන්දෝලඞ්කාරශාස්ත්‍රයන්ට අනුකූල පරිද්දෙන්; බඳනේ, (පද්‍ය) බන්ධනය කරන්නේ ය.

වි-අලඞ්කාර ග්‍රන්ථයන්හි දක්වනලද පද-වාක්‍ය-වාක්‍යාර්ථගත දෝෂයන් පිළිබඳ ලෙශමාත්‍රයක් දක්වා ආදි ශබ්දයෙන් එහි සාකල්‍යය ම සඞ්ග්‍රහ කළහ. එහෙයින් අසාධුත්වාදි පදසංශ්‍රිත ෂොඩශ මහාදෝෂයන් ද, ශබ්දහීනත්වාදි වාක්‍යසංශ්‍රිත ෂොඩශ මහාදෝෂයන් ද, අපාර්ථත්වාදි වාක්‍යාර්ථසංශ්‍රිත ෂොඩශ මහාදෝෂයන් ද අත්‍යන්තයෙන් දුරු කොට ජාතිගත්‍යාදි සූවිසි ශබ්දාලඞ්කාරයෝ ය, ජාතිවිභාවනාදි සූවිසි අර්ථාලඞ්කාරයෝ ය, උපමාරූපකාදි සූවිසි උභයාලඞ්කාරයෝ ය යන දෙසැත්තෑ අලංකාරයන් හා අවාන්තරභෙදයනුදු දූන තදනුරූප අලඞ්කාරයෙකින් සරසා ඒ මේ අලඞ්කාරයන්ට ද වඩා ප්‍රධානයහ යි සලකන ලද සූවිසි **වාහ්‍යගුණයෝ ය**, සූවිසි **ආභ්‍යන්තර ගුණයෝ ය**, සූවිසි **වෛශෙෂික ගුණයෝ ය** යන වාහ්‍යාභ්‍යන්තරාදි ගුණ වශයෙන් අනුරූපගුණයෙන් ද යුක්ත කොට කාව්‍යනිර්මාණය කට යුත්තේ ය. මෙසේ වූ කාව්‍යය තෙමේ ම රසවද්භාවයෙන් යුක්ත වේ. අසන්නවුන්ගේ ඇතුළත හැසිරෙන්නා වූ අතිශය ප්‍රමොදය ආස්වාදවිෂයක වූ රසයක් වැනි හෙයින් කාව්‍යවිෂයෙහි රස යයි කියනු ලැබේ. එයින් තොර වූ විරස වූ කාව්‍යය නිදෙස් වුවත් සත්කවීන් විසින් ආදෘත නො වේ. කර්තෘහට ද ප්‍රීතිය පිණිස හෝ කීර්තිය පිණිස හෝ නො පවතී

එයින් කීහ ශ්‍රීවාග්භටාචාර්යපාදයෝ :-

“සාධුශබ්දාර්ථසන්දර්භං ගුණාලඞ්කාරභූෂිතම්
ස්ඵුටරීතිරසොපෙතං කාව්‍යං කුර්වීත කීර්තයෙ” යි.

මෙකී රසස්වරූපය කාව්‍යනාටකවිද්‍යායෙහි ප්‍රධානත්වයෙන් සලකනලද්දකි. භරතශාස්ත්‍රයෙහි **“විභාවානුභාවව්‍යභිචාරිසංයොගාද් රසනිෂ්පත්තිඃ”** යන සූත්‍රයෙන් දක්වන ලද කාව්‍යනාටක රසස්වරූපය අභිනවගුප්තපාදාදි ආචාර්යවරයන් විසින් විස්තර කරනලද්දේ ය.

චර්ව්‍යමාණතෛකප්‍රාණො විභාවාදිජීවිතාවධිඃ පානකරස න්‍යායෙන චර්ව්‍යමාණඃ පුර ඉව පරිස්ඵුරන් හෘදයමිව ප්‍රවිශන් සර්වාඞ්ගීණමිවාලිඞ්ගන් අන්‍යත් සර්වමිව තිරොදධත් බ්‍රහ්මාස්වාදමිවානුභාවයන් අලෞකිකචමත්කාරකාරී ශෘඞ්ගාරාදිකො රසඃ,

ස ච න කාර්‍යෛඃ විභාවාදිවිනාශෙ'පි තස්‍ය සම්භවප්‍රසඞ්ගාත්, නාපි ඥාප්‍යඃ සිද්ධස්‍ය තස්‍යාසම්භවාත්, අපි තු විභාවාදිභිර්ව්‍යඤ්ජිතශ්චර්වණීයඃ කාරකඥාපකාභ්‍යාමන්‍යත් ක්ව දෘෂ්ටමිත්‍යලෞකිකසිද්ධෙර් භූෂණමෙතන්න දූෂණම්, චර්වණානිෂ්පත්ත්‍යා තස්‍ය නිෂ්පත්ති රුපචරිතෙති, කාර්‍යෝ'ප්‍යුච්‍යතාම්”

“චර්ව්‍යමාණත්වය (=තලුමරා රසවිඳගන්නාක් වැනි බව) අසහායප්‍රාණ කොට ඇති, විභාවාදිඥනයාගේ පැවැත්ම කොළ වර කොට ඇති (මරිචකර්පූරාදිමිශ්‍රිත ආමික්ෂාපානකයාගේ නානාද්‍රව්‍යගත රසස්වරූපය එකත්වාභිමානයෙන් දැනගැන්ම වූ) පානකාරසන්‍යායයෙන් චර්වණය කරනුලබන්නා වූ, ඉදිරියෙහි බබළන්නාක් මෙන් ද, හෘදයට වැදගන්නාක් මෙන් ද, සකල ශරීරයෙහි අවයවයන් වැළඳගන්නාක් මෙන් ද, අන් සියලුදෙය වසාලන්නාක් මෙන් ද, බ්‍රහ්මාස්වාදය අනුභවකරවන්නාක් මෙන් ද, අලෞකික ආනන්දාතිශයජනක වූ, ශෘඞ්ගාරය ආදිකොට ඇති රසය තෙමේ (**කාව්‍ය රස නම්.**) (භරත සූත්‍රයෙන් විභාවාදිඥනයාගේ හෙතුත්වය හා රසයාගේ තද්ධෙතුක වූ කාර්‍යත්වය ද එයින් ඥාප්‍යත්වය ද ප්‍රකාශිත නමුත් එදෙක ම කාර්‍යාන්තර ඥාප්‍යාන්තරයන් හා වෙනස් ලකුණු ඇති හෙයින්) ඒ රසය වනාහි විභාවාදිඥනයට කාර්‍ය ද නො වෙයි, විභාවාදිඥනයාගේ භඞ්ගක්ෂණයෙහිදු ඔහුගේ ස්ථිතිප්‍රසඞ්ගය හෙයිනි. (ඥාප්‍යරූප කාර්‍යය ආලොකාදියෙන් ඥාප්‍ය වූ ඝටාදිය මෙන් ස්වඥානයෙන් පළමුත් පැවැත්තයුතු හෙයින්) විභාවාදිඥනයට ඥාප්‍ය ද නො වෙයි, එයින් පළමු සිද්ධ වූ රසයක්හුගේ අසම්භවය හෙයිනි. එනකුදු වුවත් විභාවාදීන් ප්‍රකාශිත වැ චර්වණයට යොග්‍ය වූයේ වේ. කාරක ඥාපක දෙකින් පිටත් වූවක් කොහි දක්නාලද දැයි ආක්ෂෙප කරත්හොත් කොහිත් නො දක්නාලද්දේ යයි කිය යුතු ය. මෙසේ මේ සම්බාධනය අලෞකික සිද්ධියට භූෂණයෙක, දූෂණයෙක් නො වේ. ලොකදෘෂ්ටියට සාධාරණ වූ කාර්‍යතා ඥාප්‍යතා දෙදෙනාගේ බැහැරලීමෙන් රසයෙහි කාර්‍යත්වඥාප්‍යත්වයෝ විලක්ෂණ ව සිද්ධ වූහ. විභාවාදිඥනයෙහිදු කාරකඥාපක හෙතුත්වයෝ විලක්ෂණ ව ම සිද්ධ වූවාහු යි. ලොකයෙහි අදෘෂ්ටත්වය දූෂණයෙක් නො වෙයි සේයි. චර්වණාවගේ හටගැන්මෙන් රසයාගේ හටගැන්ම උපචරිත නුයි (=අභෙදයෙන් සලකනලද නුයි) කාර්‍ය යයි ද කියනු ලැබේවා” යනාදිය ආචාර්‍ය අභිනව ගුප්තපාදදීන්ට ඉෂ්ට වූ රසනිෂ්පත්ති ප්‍රකාරය යි.

මෙසේ සාහිත්‍යවිද්‍යාවෙහි සූක්ෂ්ම ගම්භීරස්ථලයට පැමිණි රස ස්වරූපයාගේ දැනගැන්ම ද පුරාතනාචාර්‍යයන්ගේ පඥාවිස්තර

විඥානයෙන් ලැබගත හැකි වේ. මාත්‍රාඡන්දසුන්ගේ දැනීම ඡන්දශ්ශාස්ත්‍රයෙන් ලැබියයුත්තේ ය. සංස්කෘතසාහිත්‍යශාස්ත්‍රඥයන් විසින් නො කියනලද ස්වහන්, එළිසම යන ලකුණු ස්වභාෂා කාව්‍යලක්ෂණයෙන් ම දතයුත්තේ ය.

මාත්‍රාසම්බන්ධයෙන් කටයුතු වූ සිවුපදකව් බැඳුම්හි අන්ත්‍යාක්ෂර සතර සමකොට එකාක්ෂරයෙන් පිහිටවීම එළිසම නම්. මෙය නිත්‍යවිධියකි. පාදමධ්‍යයෙහි එළිසම කිරීම කවිහුගේ විවක්ෂා පරිද්දෙන් කළහැකි වේ. එය යම්කිසි කවෙක නො කිරීමෙන් ද දොසෙක් නො වේ. සිද්ධාන්තාවසානපද්‍යය මෙති. පාදන්තයෙහි තියන වූ එළිඅකුරු විෂමාක්ෂරවලින් යෙදීම අත්‍යන්තගර්හිත ම ය. එසේ ද වුවත් සතරකුරෙන් එකකුරක් හෝ දෙකුරක් හෝ තුන්කුරක් හෝ සමකොට සෙස්ස විෂමාක්ෂර කොට ණකාර නකාර දෙකින් හෝ ළකාර ලකාර දෙකින් හෝ එළිඅකුරු පැමිණි තන්හිදී මෙකල බොහෝදෙනා විසින් යොදනුලැබේ. හේ එළිසම කිරීමෙක් නො වේ. දන්ත්‍යාක්ෂරය හා මූර්ධන්‍යාක්ෂරයාගේ කිසිලෙසිනුත් සම්බන්ධයෙක් නො ලැබේ. න, ණ දෙකින් කවරක් වුවත් යගපතැයි ද, ල, ළ දෙකින් කවරක් වුවත් යගපතැයි ද අභෙදයෙන් සැලකීම මහත් මුළාවකි. එකස්ථානයෙක්හි උපදනා සවර්ණ අකුරු දෙකකින් නමුත් එළිසමය නො වේ. එසේ කල්හි භින්නස්ථාන ඇති අසවර්ණ වූ අකුරු දෙකකින් සම්බන්ධය සැලකීම කොතරම් විපර්යාසයෙක් දැයි එවැනි කල්පනා ඇත්තවුන් විසින් මෙනෙහි කටයුතු සි. ලක්දිව ශාස්ත්‍රාගමසමෘද්ධියෙන් අනූන ව පැවති කාලයන්හි ස්වභාෂා කාව්‍යනිර්මාණය කළා වූ ෂඩ්භාෂාපරමේශ්වර ශ්‍රී රාහුල ස්වාමිපාදදී මහාකවිවරයන් විසින් එසේ විෂමාක්ෂරසඞ්කරයෙකින් එළිසම වීමක් නො සැලකූබව කාව්‍යශෙඛරාදි විශුද්ධසන්දේශ නිරීක්ෂණයෙන් නැණවතුන්ට ප්‍රත්‍යක්ෂ වේ. එහෙයින් නිදොස් ලෙස එළිසම කරනු කැමති සිංහල කවීන් විසින් මේ මතු දක්වන රචනා දෘෂ්ටාන්ත කොට සලකනුලැබේවා.

කාව්සේකරයෙහි :-

| මූර්ධන්‍යයෙන් එළිසම. | | දන්ත්‍යයෙන් එළිසම. | |
|---|---|---|---|
| ''රජදෙස් ද නුනුව | ණ | ''අතුපතර කපම් | න |
| මසුරු දුසිරි නො පම | ණ | මොර කත්තවුන් විලසි | න |
| උසුත්මුලු කළ නැ | ණ | අත්නෑයෙන් කර | න |
| ඇති ව වැජඹෙනස්සා මුනිමෙ | ණ''* | නසා රටතොට නෘපයන් ද | න'' |

* මුනිමෙණ - මුනීන්ද්‍රයන් වහන්සේ; (ශ්‍රෙෂ්ඨාර්ථයෙහි රත්නපර්‍ය්‍යාය වූ මණිශබ්දයෙන් 'මෙණ'යි තද්භව වී.)

"නුවන් කනුපුල් ලෙ ළ
දසනග කිරණ මිණිවැ ළ
තුනුරන්ලිය උදු ළ
මෙනාප ඇඳිසේ සිතමි සිතතුළ"

"කළ පින් ගෙවුණු ක ල
කවුරුත් වෙන් ව යෙති බ ල
පියකරු රුවට තෙ ල
අහෝ ළතමනු කිම් ද උදක ල"

'යවහන්දොස්' නම්– ය, ව, හ, න් යන සිවුකුරෙන් එකක් පාදාන්ත එළිඅක්ෂරය වූ කල්හි ඊට පූර්ව කොට සතර පෙදෙහි ම එකකුරක් හෝ නො යෙදීමෙන් වන දෝෂය යි.

ලක්ෂණසාරයෙහි :–

"යවහන් සිවුකුරෙන්—පදතැ එකකුරක් වත්
එයට ඉදිරි කැරු කිසි—එකකුරු නො පැව මහදොස්"

යනු කීහෙයින් යවහන් අක්ෂරයන්ට පූර්වයෙහි යටත්පිරිසෙයෙන් එකකුරක් නමුදු යෙදීම කවිසමයෙහි සම්මත යි.

හංසසන්දේශයෙහි පාදාන්ත යකාරය :–

"ම නු ර ද සිරිත් සත සිත සිත ඇද ලී ය
ම ත ත ඳ රූසිරඳත ලිය ඇස ඇස ලී ය
පි රි සි ඳ නැණින් සත්වග දුක් දුර ලී ය
ඇ ම ස ඳ මෙරද බෝසත් සිරි ඉසි ලී ය

වැඩියක් ද යොදනුලැබේ. එහි ම :–

"සි ත් තිහියෙන් මූනිපුදයට න මා ලි ය
ස ත් ගුණයෙන් සව් සත සිත අ මා ලි ය
ග ත් විකුමෙ න් රුපු තිරිඳුන් ද මා ලි ය
මෙ ත් සිලිලෙ න් මුළු තෙදියත තෙ මා ලි ය"

පාදාන්ත වකාරය. එහි ම :–

"තු න් දො ස් දුරුර සිත මුනිපුදම සතු වූ ව
පි න් රැ ස් කරන සැදූහෙන් ඇමට පෙර වූ ව
ත න් ස ස් කොත්වතින් තිනි සැදුණු නො ප වූ ව
ම න් තොස් කරව දූක වම්පසෙහි ගොත වූ ව"

පාදාන්ත හකාරය. බුදුගුණ අලඞ්කාරයෙහි :–

"රන් රූ සදි සි ය හ
දූක දූක නො යන රි සි ය හ
කන්කලු සුබැ සි ය හ
ඔහු ම නරදෙවියනට නි සි ය හ"

## පාදන්ත (ගල්) තකාරය.

හංසසන්දෙශයෙහි :-

"ගන ගන ගුවන් තල විදුලි වන්
වන ගැබ මෙවන් පැන යනෙනු වන්
දිගු පුළුලු වන් ගනතිල් නු වන්
බලවන මූ වන් තුටුකැරැ නු වන්"

යමගන්දෙසින් මුත් තිදෙස් යෙදුම් මෙපරිද්දෙන් සියලු සත්කවීන්ගේ ප්‍රබන්ධයන්හි දෘශ්‍යමාන වේ. කිසිවිටෙක දෙපාද යෙක්හි යථොක්ත විධානය කිරීමෙන් ද යමගන්දෙස් භඞ්ග වෙයි යනු ආචාර්‍ය්‍යසම්ප්‍රදාය යි

කව්සේකරයෙහි :-

"අහිරිත අනොතප ය "පිළිවෙළිනුපද නෙත්
පවට විළිනැති නො බ නුය නො වේ ඉසුරැ කරැ නෙත්
නසන්සුන් සිත නුය සසරදෙස් විසිදි න්
දනුව උදගස් නමැයි සබවය" නිරෝදය නම් තිවනි සැපව න්"

යනාදිය ඊට දෘෂ්ටාන්ත යි.

**එකොළොස්වනු, එකාදශම වූ; ඉටුනිටු අදියර, ඉෂ්ටානිෂ්ටාධිකාරය; ඉති, (මෙතෙකින්) සමාප්ත යි.**

---

## අලඞ්කාරාධිකාරය.

කාව්‍ය නමැති ශරීරය ශොභාවත් කරන්නා වූ ශබ්දාලඞ්කාර, අර්ථාලඞ්කාර, උභයාලඞ්කාර සඞ්ඛ්‍යාත ත්‍රිවිධ අලඞ්කාරජාතයන් අතුරෙනුදු කතිපය අලඞ්කාර කෙනකුන් දක්වා අලඞ්කාර සඞ්ග්‍රහාධිකාරයකින් ද ග්‍රන්ථභූෂණය කටැටි වූ ප්‍රතිරාජපරිවෙණාධිපති ආචාර්‍ය්‍යපාදයෝ :-

"ශබ්දෙභ්‍යො යඃ පදාර්ථෙභ්‍ය උපමාදිඃ ප්‍රතීයතෙ
විශිෂ්ටොර්ථඃ කවීනාං ස උභයාලඞ්ක්‍රියා මතා"

යනාදි ආලඞ්කාරික උපදෙශ වශයෙන් ත්‍රිවිධාලඞ්කාරයන් කෙරෙහි විශිෂ්ට යයි සම්මත වූ අර්ථාලඞ්කාරජාතය පිළිබඳ එක දෙශයක් දක්වනු පිණිස '**සමභවිසට නැකූ**" යනාදිය කීහු.

**සමහවිසට තැකූ—කිසිවක් උවම් නම් වේ**
**ලබනුයෙ උවම් ඒ හා—උවමෙ නමින් පළ වේ. (1)**

**ඉති උවම්උවමේ.**

---

## උපමා උපමෙය ලක්‍ෂණ.

(1) **ප**—සමහවියට, සමභාවය පිණිස; තැකූ, තර්කණය කරන ලද; කිසිවක්, අන්‍යතර වස්තුයෙක්; උවම් නම් වේ, උපමා නම් වේ; ඒ හා, ඒ උපමාභූත වස්තුව හා; උවම් ලබනුයෙ, ඖපම්‍යය ලබන්නේ- හෙවත් සමානත්වය ලබන වස්තු තෙම; උවමේ නමින්, උපමෙය නාමයෙන්; පළ වේ, ප්‍රකාශ වේ.

**වි**— මෙකවෙන් චතුර්විංශති අර්ථාලඞ්කාරයන් කෙරෙන් ප්‍රථම වූ **උපමාලඞ්කාරය** ම ප්‍රස්තුත කළෝ. කිසියම් වස්තු දෙකක් ඔවුනොවුන් හා සමාන කොට සැලකීමෙහිදී වාක්‍යයෙහි ප්‍රධානත්වයෙන් අභිමත වූ වස්තුව '**උපමෙය**' නම් වේ. අප්‍රධාන වශයෙන් අභිමත වූ වස්තුව '**උපමා**' නම් වේ. මුහුණ ශෝභාවත් වස්තුයෙක පියුම ද ශෝභාවත් වස්තුයෙක. මෙදෙකින් මුහුණ වර්ණනා කරන්ට පටන්ගත් කිවි තෙම ශෝභාසමත්වය සලකා "**මුහුණ පියුමක් මෙනැ**"යි කියන්නේ ය. මෙහි පියුම මුහුණ හා සමාන කොට සැලකූ හෙයින් (පියුම) '**උපමා**' නම් වේ. ඒ හා සමානත්වය ලබන මුහුණ '**උපමෙය**' නම් වේ. මේ උපමා උපමෙය දෙදෙනාගේ සමත්වය දෙදෙනා කෙරෙහි පැවති ගුණයක්හුගේ ලෙශමාත්‍රයෙකින් මුත් සර්වප්‍රකාරයෙන් නො වේ. මුහුණෙහි ද පියුමෙහි ද සර්වප්‍රකාරයෙන් සමත්වයක් නො ලැබෙන නමුත් දුටුවන් පහදවන ශෝභාසෞන්දර්‍ය්‍යගුණයෙන් පමණක් සමත්වය සලකනු ලැබේ.

"**උපමා යත්‍ර සාදෘශ්‍යලක්ෂ්මීරුල්ලසති ද්වයෝඃ**" යනු මේ සඳහා ආචාර්‍ය්‍ය ජයදෙවයන්ගේ සංක්‍ෂෙපොක්ති යි. යම් දෙදෙනකු කෙරෙහි සමානත්වශෝභාව බබළා නම් ඒ දෙදෙනා කෙරෙහි උපමාඋපමෙයත්වය ඇත්තේ ය යනු භාව යි.

උපමාඋපමෙය දෙදෙන එක ම තෙනකුන් කෙරෙහි පිහිටි ගුණද්‍රව්‍යාදීන්ගේ වශයෙනුදු සලකනු ලැබෙත්. උපමාලඞ්කාරයෙන් සාම්‍යය දක්වන ආචාර්‍ය්‍යවරයන්ගේ රචනාවලින් ඒ ප්‍රකාශ වේ.

**අර්ථකථාචාර්‍ය්‍ය බුද්ධඝොෂ මහාස්වාමිපාදයෝ :-**

**"කරුණා විය සත්තෙසු පඤ්ඤා යස්ස මහෙසිනො**
**ඤෙය්‍යධම්මෙසු සබ්බෙසු පවත්තිත්ථ යථාරුචි"**

**නුවන් ඉඳුවර වන් - ඉඳු වන් වුවන් සවැණිය**
**සමදම් ඉති යෙදුයෙන් - මෙ වියූ වත්උවම් නම්. (2)**

---

යනුයෙන් අප තථාගතයන්වහන්සේගේ අනාවරණඥාන සඞ්ඛ්‍යාත ප්‍රඥා තොමෝ සකලසත්ත්වයන් කෙරෙහි පතළා වූ මහා කරුණාව මෙන් සකලඥෙයධර්මයෙහි පැතිර පැවැත්තී යයි වර්ණිතා කළහ. මෙහි කරුණාඥාන දෙක ම තථාගතයන්වහන්සේගේ අනන්‍යරඞ්ගගුණධර්ම යුග්මයෙකි. එදෙක ප්‍රවෘත්තිසාධර්ම්‍යයෙන් **උපමාඋපමෙය** වී.

තව ද අන්‍යොන්‍යොපමාලඞ්කාරවිෂයෙහි එකාශ්‍රය ඇති ගුණයනුදු ඔවුනොවුන්ට සමාන කොට දක්වත්.

**ප්‍රාකෘත උදාහරණ :-**

"තං ණමහ වීතරාඅං
ජිණං දමුඇලිඅ දඪඅරකසාඅං
ජස්ස මණං බබ සරීරං
මණං සරීරං බබ සුපසංණං"

(පින්වත්නි;) ජස්ස, යමක්හුගේ; සරීරං, රූපකාය තෙම; මණං බබ, චිත්තසන්තානය මෙන් ද; මණං, චිත්තසන්තානය තෙමේත්; සරීරං බබ, රූපකාය මෙන් ද; සුපසංණං, අතිශයෙන් ප්‍රසන්න වූයේ ද; වීතරාඅං, පහ වූ රාගඇති; දමුඇලිඅ, ඉන්ද්‍රිය දමනයෙන් තසතලද; දඪඅරකසාඅං, ඉතා දැඩි වූ කෙලෙස් කසට ඇති හෙවත් කෙලෙසුන් දුරුකළා වූ; තං ජිණං, ඒ බුදු රජාණන්වහන්සේ; ණමහ, නමස්කාර කරව්.

මෙහි සර්වඥයන් වහන්සේගේ කායචිත්තද්වය අන්‍යොන්‍යොපමා විසින් සමාන කොට දක්වූහ. මේ ද උපමාලඞ්කාරයාගේ ම විශෙෂයක් වූ **අන්‍යොන්‍යාලඞ්කාරය** යි.

**වස්තූපමාලඞ්කාරය:-**

(2) **ප**—සවැණිය, සර්වඥයාගේ; නුවන්, නයනද්වය තෙම; ඉඳුවර වන්, ඉන්දීවර වැන්න; වුවන්, වදනය තෙම (= වක්ත්‍රය); ඉඳු වන්, චන්ද්‍රයා වැන්නැ යි; ඉති, මෙසේ; සමදම්, සමානධර්මය; යෙදූයෙන්, යුක්ත කළ හෙයින්; මෙ, මේ අලඞ්කාරය තෙම; වත්උවම් නම්, වස්තූපමා නමැ යි; වියූ, කීහු.

**වි**—මෙහි නෙත්‍ර ඉන්දීවර දෙදෙනාගේ ද, වක්ත්‍ර චන්ද්‍ර දෙදෙනාගේ ද සමානත්වය මෙබඳු මෙබඳු ගුණයෙකිනැ යි වාචකශබ්දයෙකින් නො කියනලදුවත් අසන්නවුන්ට ශාබ්ද-

**ඉඳුසැව් පිරිවැටූ - මහමෙර ලොවැ දැහුම් වත**
**සුගතිඳුබඳ එබඳු වී - හඟනේ අබුතුවම් නම්.** (3)

---

බොධයෙන් අනතුරු වැ අර්ථහෙයින් ම හැඟෙන්නා වූ නීලත්‍ව මනොඥත්‍වාදි සාධර්ම්‍යය ඇති හෙයින් 'වස්තූපමා' නම් අලඞ්කාරය වේ.

"චන්‍ද්‍රවද්වදනං තස්‍යා නෙත්‍රෙ නීලොත්පලෙ ඉව
පක්වබිම්බං හසත්‍යොෂ්ඨඃ පුෂ්පධන්‍වධනුර්භ්‍රුවඃ"

යනාදිය මේ සඳහා සංස්කෘතාලඞ්කාරිකයන්ගේ උදාහරණ යි.

මෙහි අර්ථ සුගම යි.

(3) ප — ඉඳුසැව්, ඉන්‍ද්‍රචාපයෙන්; පිරිවැටූ, පරික්ෂිප්තා වූ; මහමෙර, මහාමෙරුව; ලොවැ, ලොකයෙහි; දැහුම් වත, (ඉදින්) ජඞ්ගම වූයේ වී නම්; සුගතිඳු, සුගතෙන්‍ද්‍රයාගේ; බඳ, දෙහය තෙම; එබඳු වී, එවැනි යයි කියා; හඟනේ, චින්තනය කරන්නේ ය (යනු); අබුතුවම් නම්, අද්භුතොපමා නම් වේ.

වි — "දෙව්දුන්නෙන් වටකළ මහමෙරක් ඉදින් ලොකයෙහි ජඞ්ගම වී නම් (= ඇවිදින ප්‍රාණිස්වරූප වී නම්) භාග්‍යවතුන්ගේ ශ්‍රීශරීරය එවැනි යයි දැනගන්නේ ය" යන මෙ වාක්‍යයෙන් ලොකයෙහි සම්භව නො වන ආශ්චර්‍ය්‍යරූප වූ ජඞ්ගමමෙරුවක්හුගේ ශොභාව හා සාදෘශ්‍යය දක්වීම හෙතු කොටගෙන මේ **අද්භුතොපමාලඞ්කාර** යයි කිහු. ශ්‍රීදණ්ඩ්‍යාචාර්‍ය්‍යාදීන්ගේ සංඥවශයෙන් මේ කියනලද්දේ ය :—

"යත්‍රොපමෙයධර්මාඃ ස්‍යුරුපමානෙ'ධිරොපිතාඃ
චමත්කාරවිධානාර්ථං තාමාහුරද්භුතොපමාම්"

චමත්කාරවිධානාර්ථම්, (ශ්‍රොතෘජනයාගේ) සිත ඔදවැඩි කරනු පිණිස හෝ විස්මිත කරනු පිණිස; යත්‍ර උපමානෙ, යම් උපමානයෙක්හි; උපමෙයධර්මාඃ, උපමෙයයා කෙරෙහි (පමණක් ම) පවත්නා ධර්මයෝ; අධිරොපිතාඃ ස්‍යුඃ, ආරොපණය කරනලද්දාහු වෙත් ද; තාම්, ඒ උපමාව; අද්භුතොපමාම්, අද්භුතොපමා නමැ යි; ආහුඃ, කියත්.

ශ්‍රීභොජදෙවාදීහු මෝ **'උත්පාද්‍යොපමා'** නමැයි කියත්.

ඊට උදාහරණ :—

"උජ්ජෘම්භ යදි චෙන්‍යාම්භි පෘථක්ප්‍රවාහාවාකාශගඞ්ගාපයසඃ පතන්තාම්
තදෙපමීයෙත තමාලනීලමාමුක්තමුක්තාලතමස්‍ය වක්ෂඃ"

**පෙදෙන් අතින් හොත - දෙවතට සමගුණ යොද**
**පවසත සබඳ අරුතෙන් - එ වියු සෙලෙසුවම් නම්. (4)**

---

ආකාශගඞ්ගාපයඃ, අහස්ගඟජලයාගේ; උභෞ ප්‍රවාහෞ, ප්‍රවාහයෝ දෙදෙනෙක්; ව්‍යාම්නි, අහසෙහි; යදි, ඉදින්; පෘථක්, වෙන් වෙන් වැ; පතෙතාම්, වැටෙත් ද; තදා, එකල්හි; තමාල නීලම්, තමලුරුකකට බඳු ව නිල් වූ; ආමුක්තමුක්තාලතම්, පැළඳි මුත්හර ඇති; අස්‍ය, මේ විෂ්ණුහුගේ; වක්ෂඃ, උරස්ථලය; උපමීයෙත, සමානකරනුලබන්නේ ය.

ශ්‍රීවාමන විශ්වනාථ මම්මටභට්ටාදි ආචාර්‍ය්‍යවරයෝ මෝ 'අතිශයොක්ති' නමැ යි කියත්. උදාහරණ මෙසේ යි :–

"රාකායාමකලඞ්කඤ්චෙදමෘතාංශොර්භවෙද්වපුඃ
තස්‍යා මුඛං තදා සාම්‍යපරාභවමවාප්නුයාත්"

රාකායාම්, සම්පූර්ණ චන්ද්‍රයා ඇති පනුරස පොහොයෙහි; අමෘතාංශොඃ, චන්ද්‍රයාගේ; වපුඃ, ශරීරය (=බිම්බය); චෙත්, ඉදින්; අකලඞ්කං භවෙත්, ලප නැති වේ නම්; හෙවත් ශශලාඤ්ඡනයක් නැතිබවට පැමිණේ නම්; තදා, එකල්හි; තස්‍යාඃ, ඇයගේ; මුඛම්, වක්ත්‍රය තෙම; සාම්‍යපරාභවම්, තමා හා සමානයකු ඇතිවීමෙන් වන පරාභවයට; අවාප්නුයාත්, පැමිණේ. මෙහි ලප නොමැති චන්ද්‍රයා හා වක්ත්‍රය සමානත්වයෙන් සම්භාවිත යි.

(4) ප—පෙදෙන් හොත, පදයෙන් හෝ, අතින් හොත, අර්ථයෙන් හෝ; දෙවතට, උභයවස්තුවකට; සමගුණ, තුල්‍ය ගුණය; යොද, යුක්ත කොට; අරුතෙන්, අර්ථයෙන්; සබද, සම්බන්ධයක්; පවසත, ප්‍රකාශ කරත්හොත්; එ, ඒ (අලඞ්කාරය) තෙම; සෙලෙසුවම් නම්, ශ්ලෙෂොපමා නමැ යි; වියු, කිහු.

එකස්වරූපයෙන් හෝ එකස්වරූප අර්ථයෙන් හෝ වස්තුද්වයක්හුගේ සමානත්වකථනය කිරීම ශ්ලෙෂොපමා නමු. සංස්කෘතාලඞ්කාරිකයෝ ද මෙය කියත් :–

"එකරූපෙණ වාක්‍යෙන ද්වයොර්භණනමර්ථයොඃ
තන්ත්‍රෙණ යත් ස ශබ්දඥෛඃ ශ්ලෙෂ ඉත්‍යභිශබ්දිතඃ"

තන්ත්‍රෙණ, අනෙකශබ්දයන්ගේ එක්වැනි පැවැත්ම හෙතු කොටගෙන; එකරූපෙණ වාක්‍යෙන, එකස්වරූප වූ වාක්‍යයෙකින්; ද්වයොඃ අර්ථයොඃ, දෙඅර්ථයක්හුගේ; භණනම්, කීම ය යන; යත්, යමෙක් ඇද්ද; සඃ, ඒ අලඞ්කාරය තෙම; ශබ්දඥෛඃ, ශබ්දාලඞ්කාර දත්තවුන් විසින්; ශ්ලෙෂඃ ඉති, ශ්ලෙෂ නමැ යි; අභිශබ්දිතඃ, කියනලදී.

පියවි රු වඩා – කොස්දඹුපත්ගුණසියෝ
දලපල්දුගැ ද සිටියේ – පැරදි පියුමැය සරණින්. (5)

සුවට කෙමිනුලැගි – අඹරතැ රැඳි කොකුම් වන්
තරුපුන් ඇලැ යපනුයේ – වම් තෙනෙ නො මැ ළතික්රැස්. (6)

---

පදශ්ලෙෂයට උදාහරණ :-

(5) ප—පියවි රු, ප්‍රකෘතිරූපය දෝහෝ නො හොත් ජාත්‍යනු රූපය; වඩා, වර්ධනය කොට; කොස්, කොෂයෙන් දෝහෝ නො හොත් කොෂ්ඨයෙන් ද; දඹු, තාලයෙන් දෝහෝ නො හොත් සෛත්‍යයෙන් ද; පත්, පත්‍රයෙන් දෝහෝ නො හොත් වාහන යෙන් ද; ගුණ, සූත්‍රයෙන් දෝහෝ නො හොත් ෂඩ්ගුණයෙන් ද; සියෝ, සඞ්ගත වූ; පියුම, පද්මය තෙම; දලපල්දුගැ සිටියේ ද, ජල පඞ්කදුර්ගයෙහි ස්ථිත වූයේ ද; ඇය සරණින්, ඇයගේ චරණයෙන්; පැරදි, පරාජිත වී.

වි—එකස්වරූප පදයෙන් අර්ථද්වයක් ප්‍රකාශිතහෙයින් මේ පදශ්ලෙෂ නම්. "ද්වයොරිති සඞ්ඛ්‍යා න විවක්ෂිතා, ත්‍රිප්‍රභෘතීනාමපි ශ්ලෙෂසම්භවාත්" යනුයෙන් ආලඞ්කාරික ශ්‍රීරත්නේශ්වරාචාර්‍ය්‍යයෝ "දෙඅර්ථයක්හුගේ ම කථනය ශ්ලෙෂයෙහි විවක්ෂිත නො වෙයි, අර්ථත්‍රයාදීන්ගේ ද ශ්ලෙෂය ලැබෙනහෙයිනැ"යි කීහු.

අර්ථශ්ලෙෂයට උදාහරණ :-

(6) ප—සුවට, සුවෘත්ත වූ (= මනාසේ වට වූ); කෙමින්, ක්‍රම යෙන්; උලැගි, උල්ලඞ්ඝිත වූ; අඹරතැ, අම්බරාභ්‍යන්තරයෙහි; රැඳි, රඤ්ජිත වූ; කොකුම් වන්, කුඞ්කුමවර්ණ ඇතියෙක්; තරුපුන්, තාගේ ශත්‍රූන්; ඇලැ, ශීතකාලයෙහි; යපනුයේ, යාපනය කරන්නේ ය; (හෙතෙම,) වම් තෙනෙ නො මැ, වනිතාව ගේ පයොධරය නො වෙයි; ළතික්රැස්, තරුණ සූර්‍ය්‍යයා තෙමේ යි.

මෙහි එකස්වරූපඅර්ථයෙන් පයොධරය ද බාලාර්කමණ්ඩලය ද සාම්‍ය කොට හැඟවූහෙයින් මෝ තොමෝ අර්ථශ්ලෙෂයෙන් වූ ශ්ලෙෂොපමා යි.

භින්නාභින්නපදක්‍රියාකාරකයන්ගේ වශයෙන් සවැදෑරුම් වූ ශ්ලෙෂයන් අතුරෙහි මේ උදාහරණද්වය අභින්නපදශ්ලෙෂයෙහි ඇතුළත් වේ. පදයන්ගේ අභෙදයෙන් ම අර්ථද්වයක් වැලඳගන්නා හෙයිනි.

**සොම් කියවනසුලු - රිවි සැඩ සයුරු තනතුසෙ**
**ක හි නට ලොවැ උවම් වේ - මෙ වියූ නිඳුඋවම් නම්.** (7)

**ඇති නැති කැරැ හොත - නැති ගුණ කැරැ ද ඇතිසේ**
**පවසත වෙසෙස් අරුතක් - එ වියූ විරුදුවා නම්.** (8)

---

(7) **ප**—සොම්, චන්ද්‍ර තෙම; කියවනසුලු, ක්ෂය වන ශීලී යැ; රිවි, සූර්ය්‍ය තෙම; සැඩ, චණ්ඩ යැ; සයුරු, සාගරය තෙම; තනතුසෙ, කම්පනශීලී යැ; නට, යුෂ්මත්හට; ලොවැ, ලොකයෙහි; ක හි, කවරෙක් නම්; උවම් වේ, උපමා වේ ද (යත); මෙ, මේ තෙම; නිඳුඋවම් නම්, නින්දොපමා නම් අලඞ්කාර යයි; වියූ, කීහු.

**වි**—සඳමඬල අවපැළවියෙහි පටන් දවස දවස කලාවක් බැගින් හිරු ළංළංවූසේ සැඟවෙන්නෙන් ක්ෂය ඇත්තේ ය. සූර්ය්‍ය මණ්ඩලය ක්‍රූරරශ්මි ඇත්තෙන් චණ්ඩ වූයේ ය. සමුද්‍රය වීචි ක්ෂොභයෙන් නිතර කැළඹුම් ඇත්තේ ය. මෙකී වස්තූහු උපමෙයයා හා සමානධර්ම ඇත්තාහු නමුත් ක්ෂයශීලිත්වාදියෙන් නින්දිත යහ යි මෙසේ උපමෙයයාගේ උත්කර්ෂය ද උපමාවන්ගේ නින්දිතත්වය ද දක්වූහෙයින් මෝ තොමෝ **නින්දොපමා** නම් වේ. මේ මෙසේ සියලු ආචාර්ය්‍යවරයන්ට ම අභිමත වේ.

සුබොධාලඞ්කාරයෙහි
සඞ්ඝරක්ෂිතමාහිමියෝ ද මේ දක්වූහ :-

"ඛයී චන්දෝ බහුරජං පදුමං තෙහි තෙ මුඛං
සමානමපි සමුක්කංසීත්‍යයං නින්දොපමා මතා"යි.

**විරොධොක්ති :-**

(8) **ප**—ඇති (ගුණ), විද්‍යමාන (ගුණයක්); නැති කැරැ හොත, අවිද්‍යමාන කොට හෝ; නැති ගුණ, අවිද්‍යමාන ගුණයක්; ඇතිසේ කැරැ ද, විද්‍යමානාකාර කොට හෝ; වෙසෙස් අරුතක්, විශෙෂාර්ථයක්; පවසත, ප්‍රකාශ කරත් හොත්; එ, ඒ (අලඞ්කාරය) තෙම; විරුදුවා නම්, විරොධොක්ති නමැ යි; වියූ, කීහු.

**වි**—යම් උක්තිවිශෙෂයෙක්හි වර්ණනීයවස්තුගත උත්කර්ෂයාගේ කථනය පිණිස විරුද්ධාකාරයෙන් වැටහෙන පදාර්ථයන්ගේ සම්බන්ධදර්ශනයෙක් වේ ද, හෙවත් ඇතිදෑයක් නැතිසේ හෝ නැතිදෑයක් ඇතිසේ හෝ අවිරොධයෙහි විරොධයක් හඟවාලීම යයත යමක් වේ ද ඕ තොමෝ 'විරොධොක්ති' නම් අලඞ්කාරය වේ. මේ වනාහි කාව්‍යප්‍රකාශාදි අලඞ්කාරශාස්ත්‍රයන්හි 'විරොධ' නාමයෙන් ද, ජයදෙවාලඞ්කාරාදියෙහි 'විරොධාභාස' නාමයෙන් ද දක්වනලද්දේ ය.

**කනුදු නැතිවතක් - නො දෙනු දනුමෝ පුවතින්**
**මහබා නො බිය නැත්තෙහි-පරනට කෙසේ බිය දෙහි.** (9)

---

"**කනුදු නැතිවතක්**" යනාදින් දක්වනුලබන නිදර්ශනයෙන් මෙහි උපමාඋපමෙයසාධර්ම්‍යවිවක්‍ෂාවක් ප්‍රකාශ නො වන බැවින් '**විරුදුවම් නම්**' යන පාඨය භ්‍රාන්තිජනිත යයි සැලකියයුතු. සාහිත්‍යදර්පණකාරාදීන් විසින් මේ විරොධාලඞ්කාරය දශාකාරයකින් දක්වනලදුවත් වාග්භටාදි ආචාර්‍ය්‍යවරයෝ ශබ්දවිරොධය අර්ථවිරොධය කියා දෙවැදෑරුම් කොට ම කීහ. මෙහිදු වනාහි ඇතිදූයක් නැතිසේ ද, නැතිදූයක් ඇතිසේ ද කීම්වශයෙන් දෙවැදෑරුම් කළහ.

(9) **ප**—කනුදු, කර්ණයකුදු; නැති, අවිද්‍යමාන වූ; වතක්, වස්තුවක්; නො දෙනු, දානය නො කිරීම; පුවතින්, ප්‍රවර්තනයෙන්; දනුමෝ, ජානනය කරම්හ; නො හොත්- කනුදු, ශ්‍රවණය ද; නැති වතක්, අවිද්‍යමාන වස්තුවකි; (එතකුදුවුවත්) නො දෙනු, දානය නො කිරීම; පුවතින්, ප්‍රවෘත්තිශ්‍රවණයෙන්; දනුමෝ, ජානනය කරම්හ; මහබා, මහාබාහු ඇත්තව; නො, යුෂ්මත් තෙම; බිය නැත්තෙහි, භීති රහිතයෙහි; පරනට, අන්‍යයන්ට; කෙසේ, කවර පරිද්දෙකින්; බිය දෙහි, භීතිදානය කෙරෙහි ද?

**වි**—"තුබවහන්සේ කොනකුදු අඩුදෙයක් නො දෙන්නා වූ (=දානවස්තූන් සම්පූර්ණ කොට ම දෙන්නා වූ) මහාත්‍යාගියකු බව ඔබගේ පැවැත්මෙන් අපි දනුම්හ" යනු අවිරුද්ධාර්ථය යි- "කනත් නැති. පුවතින් දනුම්හ" යනු ඇසෙන විට ශබ්දගතවිරොධයක් ද හැඟෙන හෙයින් මේ පූර්වාර්ධයෙහි ශබ්දයෙන් වූ විරොධය වේ. "මහාබාහු ඇති පින්වත, තෝ බිය නැත්තෙහි, (තමහට නැති) බිය අන්‍යයන්ට කෙසේ දෙන්නෙහි ද" යන මෙහි වූ නැති දෙයක් දීමය යන අර්ථවිරොධයක් ද හැඟවූයෙන් මේ අර්ථයෙන් විරොධය වේ. ඇතිකනත් නැතිසේ නැතිබියත් ඇතිසේ මෙයින් දක්වනලද ය යනු මෙහි තාත්පර්‍ය්‍යාර්ථ යි.

මීට උදාහරණ නෛෂධකාව්‍යයෙහි ද:-

"ප්‍රතීපභූපෛරිව කිං තතො භියා විරුද්ධධර්මෛරපි භෙත්තෘතොජ්ඣිතා
අමිත්‍රජින්මිත්‍රජිදොජසා ස යද් විචාරදෘක් චාරදෘගප්‍යවර්තිත"

ප්‍රතීපභූපෛඃ ඉව, පසමිතුරු රජුන් මෙන් ම; විරුද්ධධර්මෛඃ **අපි**, අසමානාධිකරණධර්ම (=විරුද්ධ පැවතුම්) විසින් ද; තතඃ, ඒ **නලරජහු කෙරෙන්; භියා ඉව, බියෙන් මෙන්;** භෙත්තෘතා, භෙදක

බව; උජ්ඣිතා කිම්, හරනාලද්දී දේහෝ; යත්, යම්හෙයකින්; සඃ, ඒ නලරජ තෙම; ඔජසා, තෙදින්; අමිත්‍රජිත් අපි, සතුරන් දිනන්නේ නමුදු; මිත්‍රජිත්, හිරු පරදවන්නේ; විචාරදෘක් අපි, විමසීමෙන් දක්නේ නමුදු; චාරදෘක්, චරපුරුෂයන් කරණකොට දක්නේ; අවනීත, පැවැත්තේ ද (එහෙයිනි). මෙහි විරෝධ උත්ප්‍රේක්‍ෂා දෙදෙනාගේ අඞ්ගාඞ්ගිභාවය වේ. අමිත්‍රජිත් වූවක්හුගේ මිත්‍රජිත්භාවය ද, විචාරදෘක් වූවක්හුගේ චාරදෘග්භාවය ද මෙහි විරෝධය යි. පරිහාරය යට කී අපෝච්චාරණය පරිද්දෙන් වේ.

මේ විරෝධාලඞ්කාරය වාසවදත්තා, කාදම්බරී, දශකුමාරචරිතාදි සංස්කෘත ගද්‍යකාව්‍යයන්හි ද අත්‍යන්තාදෘත යැ. වාසවදත්තායෙහි "විද්‍යාධරෝ'පි සුමනා ධෘතරාෂ්ට්‍රෝ'පි ගුණප්‍රියඃ ක්‍ෂමානුගතෝ'පි සුධර්මාශ්‍රිතඃ" විද්‍යාධරඃ අපි, (යොනිවශයෙන්) විද්‍යාධර වූයේ ද; සුමනාඃ, දෙව් වූයේ ය; නො හොත්- විද්‍යාධරඃ අපි, අට ලොස් විද්‍යාවන් ධරන්නේ ද; සුමනාඃ, ත්‍රිවිධ මානසපාප රහිත හෙයින්* මනා සිත් ඇත්තේ ය; ධෘතරාෂ්ට්‍රඃ අපි, පාණ්ඩුරජහුගේ එනම් වැඩිමහලුපුත් වූයේ ද; ගුණප්‍රියඃ, සතුරු වූ භීමරජු ප්‍රිය කොට ඇත්තේ ය; නො හොත්- ධෘතරාෂ්ට්‍රඃ අපි, ධරනලද රාජ්‍ය ඇත්තේ ද; ගුණප්‍රියඃ, සන්ධිවිග්‍රහාදි ෂඩ්ගුණයෙහි ප්‍රිය වූයේ ය; ක්‍ෂමානුගතඃ අපි, පෘථිවිය හා අනුගත වූයේ ද; සුධර්මාශ්‍රිතඃ, සුදම් දෙව්සබය ඇසුරු කෙළේ ය; නො හොත්- ක්‍ෂමානුගතඃ අපි, ක්‍ෂාන්තියෙන් යුක්ත වූයේ ද; සුධර්මාශ්‍රිතඃ, ශොභනධර්මයන් ඇසුරු කෙළේ ය" යනාදිය යි.

මහාබොධිවංශාදි මාගධගද්‍යකාව්‍යයන්හි ද "සන්නිහිතබාලාන්ධකාරා භාසමානතනුසම්පදා ච" යනාදීන් මේ විරෝධොක්තිය දක්වනලද්දු. එහි විස්තර ධර්මප්‍රදීපිකායෙහි ආචාර්ය්‍ය ගුරුළුගොමින් විසින් කියනලද නියායෙන් දතයුතු.

මෙහි ලක්‍ෂණ දක්වන ආචාර්ය්‍ය ශ්‍රීජයදෙවයෝ:-

"ආභාසත්වෙ විරෝධස්‍ය විරෝධාභාස ඉෂ්‍යතෙ"යි ද

ආචාර්ය්‍ය ශ්‍රීමම්මටභට්ටයෝ:-

"විරොධඃ සො'විරොධෙ'පි විරුද්ධත්වෙන යද්වචඃ"යි ද

විරුද්ධයක්සේ හැගෙන අවිරුද්ධ වචනයන්ගේ ප්‍රයෝගය හි දක්වූහ. විරෝධවිරෝධාභාසයන්ගේ ග්‍රන්ථාන්තරොක්ත විශෙෂතා ඇතත් ත්‍රිපාඨි ශිවරාමාදි ආචාර්ය්‍යවරයෝ මෙය එකත්වයෙන් ම සැලකූහ.

* "පරද්‍රව්‍යෙෂ්වභිධ්‍යානං මනසා'නිෂ්ටචින්තනම්
විතථාභිනිවෙශශ්ච ත්‍රිවිධං මානසං ස්මෘතම්"-මනුස්මෘති.

උතුරු පසුතුරු දෙන - දෙදෙනකු වදන් පිරියතු
වැනියවි සිරිත්වෙසෙසක් - පළවතුබබස් නම් වේ. (10)

සඳ වනසිඳු කිය කුඹුයොන නම සතු රු
කිවි සෙවෙන තො ද වැලිනී යළි තො ගො රු
අරුණු කිහෙනි වි කොරළුන් ලැබූ හුරි රු
පැවිවනෙදෙසැ යුදු පතිරජ දියඳුසු රු (11)

---

(10) ප—උතුරු පසුතුරු දෙන, උත්තර ප්‍රත්‍යුත්තර දානය කරන්නා වූ; දෙදෙනකු, උභයජනයක්හුගේ; වදන් පිරියතු, වචන පර්‍යන්තයෙහි; වැනියවි, වර්ණනා කරනු කැමැති වූ; සිරිත් වෙසෙසක්, චරිත්‍රවිශෙෂයක්; පළවත, ප්‍රකාශ වූ කල්හි; උබබස් නම් වේ, (ඒ) උභයභාෂා නම් අලඞ්කාරය වේ.

වි—අලඞ්කාරශාස්ත්‍රප්‍රසිද්ධ වූ 'වක්‍රොක්ති' නම් අලඞ්කාරය මෙහි '**උභයභාෂා**' නාමයෙන් කියනලද්දේ වේ. යම් තාවෙක්හි ප්‍රස්තුත වූ (=ප්‍රාරබ්ධ වූ) අර්ථය නො ගෙන සභඞ්ගශ්ලෙෂවශයෙන් අතික් අර්ථයක් ගෙන උත්තර දෙන තැනැත්තේ පිළිතුරු කියා නම් ඕ තොමෝ **වක්‍රොක්ති** නමු. එයින් කීහ අලඞ්කාරසර්වස්වයෙහි :-

"ප්‍රස්තුතාදපරං වාක්‍යමුපාදායොත්තරප්‍රදඃ
භඞ්ගශ්ලෙෂමුඛෙනාහ යත්‍ර වක්‍රොක්තිරෙව සා"යි.

(11) ප-(1) වනසිඳු සඳ, වාලුකාසින්ධුචන්ද්‍රිකාව; (2)කුඹුයොන, කුම්භයොනිය; කිය, කථනය කර; (3) සතරු නම, ශත්‍රැහුගේ නාමය; කිවී, (කුමට) කථනය කෙළෙහි ද; (4) තො ද, යුෂ්මත් තෙමේ ද; සෙවෙත, සපත්නියගේ (නාමය කීයෙහි); (5) වැලිනී, එම්බා වාලුකානදිය; තො, භවතී තොමෝ; ගොරු, ගෞරියෙහි; යළි, නැවත; කිහෙනි, කවරහෙයකින්; අරුණු වී, අරුණවර්ණ විහි ද; (6)කොරළුන්, කොරළුයන්ගේ; හුරිරු ලැබූ, රුධිරය ලදින් (අරුණවර්ණ විම්); එදෙසැ, ඒ දිශායෙහි; පතිරජ දියඳුසුරු, ප්‍රතිරජජගදීශ්වර තෙම; යුදපැවි වන, යුද්ධාරම්භ කෙළේ වී.

වි—අගස්තිඍෂිහුගේත් වාලුකානදියගේත් උත්තරප්‍රත්‍යුත්තරව්‍යාජයෙන් ප්‍රතිරාජදෙවයන්ගේ ජයග්‍රාහයෙක් මෙහි වර්ණනා කරනලද්දේ ය. මෙහි විෂමාඞ්කයෙන් ලකුණුකරනලද (1, 3, 5) ප්‍රශ්නත්‍රය අගස්තිඍෂිහුගේ ය. සමාඞ්කයෙන් ලකුණුකරනලද (2, 4, 6) උත්තරත්‍රය වාලුකානදියගේ ය. අගස්ති තෙමේ ප්‍රසිද්ධි හෙයින් සමුද්‍රයට සතුරු ය. එහෙයින් සමුද්‍රපත්නී වූ නදියට ද අගස්ති තෙමේ සතුරු වේ. නදී තොමෝ ද අගස්තිහට සැතිරි ය.

මුහුදු නමැති සතුරාගේ පත්නී හෙයිනි. සතුරු සැතිරි ව්‍යවහාරය මෙකී ලෙසින් කරනලදි. සංස්කෘතාලඞ්කාරිකයන් විසිනුදු වක්‍රෝක්ති නම් ලද මේ උභයභාෂාවට මෙබඳු ම උදාහරණ දක්වනලද්දේ ය. හේ මෙසේ යි:-

"නාථ මයූරො නෘත්‍යති
තුරගානනවක්‍ෂසඃ කුතො නෘත්‍යම්,
නනු කථයාමි කලාපින-
මිහ සුඛලාපී ප්‍රියෙ කො'ස්ති"

(1) නාථ, පින්වත් ස්වාමිය; මයූරඃ, මොනර තෙම; නෘත්‍යති, නටයි; (2) ප්‍රියෙ, සොඳුර; තුරගානනවක්‍ෂසඃ, කිම්පුරුෂවක්‍ෂස්හු ගේ නෘත්‍යම්, නැටුමෙක්; කුතඃ, කොයින් ද; (මයු යනු කිම්පුරුෂ යාහට නමෙකි. උරස් යනු වක්‍ෂසට නමෙකි. මෙදෙක ෂෂ්ඨී සමාස වූ කලැ 'මයූරස්' ශබ්දය වේ. මෙයින් කිම්පුරුෂයාගේ හෘදය යන අර්ථය වාච්‍ය හෙයින් වල්ලභ තෙම මෙ කී අපරාර්ථය ගෙන මේ වක්‍රෝක්තිය කී.) (3) නනු, (එම්බා) ස්වාමිය; කලාපිනම්, (පිල්කලප් ඇති) මොනරකු; කථයාමි, (මම) කියමි; (4) (ප්‍රියෙ, සොඳුර;) ඉහ, මේ ප්‍රදෙශයෙහි; සුඛලාපී, මිහිරිතෙපුල් කියනසුලු වූ; කඃ අස්ති, කවරෙක් ඇද්ද; කිසිවෙකුත් නැත්තේ යයි සේයි. මේ දෙවන වක්‍රෝක්තියෙහි 'කලාපී' යන්නෙහි කශබ්දය සුඛාර්ථ (= මධුරාර්ථ)වාචී කොට ද, ලාපින් ශබ්දය භාෂණශීලාර්ථ කොට ද "කං මධුරං ලපිතුං ශීලමස්‍යෙති කලාපී" යන කෘදන්තවිග්‍රහවශයෙන් සලකනලද්දේ ය.

"හර්තුඃ පාර්වති නාම කිතිය න චෙත් ත්වාං තාඩයිෂ්‍යාම්‍යහං
ක්‍රීඩාබ්ජෙන ශිවෙති සත්‍යමනඝෙ කිංතෙන ශෘගාලඃ පතිඃ,
නො ස්ථාණුඃ කිමු කීලකො න හි පශුස්වාමී තු ගොප්තා ගවාං
දෝලාඛෙලනකර්මණීති විජයාගෞර්‍ය්‍යෙර්ගිරඃ පාන්තු වඃ"

(1) පාර්වති, එම්බා උමාව; හර්තුඃ, ස්වාමිපුරුෂයාගේ; නාම, නම; කිතීය, කිය; න චෙත්, නො කිවහොත්; අහම්, මම; ත්වාම්, තී; ක්‍රීඩාබ්ජෙන, ලීලාපද්මයෙන්; තාඩයිෂ්‍යාමි, තළන්නෙමි (තිට පහරදෙමි); (යනු උමාවගේ යෙහෙළි වූ විජයාවගේ තෙපුලි). (2) ශිවෙති, (මා හිමිහුගේ නාමය) ශිව යනු යි; (මේ උමාවගේ පිළිතුර ය). (3) අනඝෙ, නිර්දෙෂ නැතැත්තිය; සත්‍යම්, (ඒ හිමිහුගේ නාමය) සැබවෙක් ද; තෙ පතිඃ, (එසේ කලැ) තීගේ හිමි තෙම; ශෘගාලඃ කිම්, සිවලෙක් ද; (යනු විජයාගෙ[illegible]යි). (4) නො, (මාගේ හිමි තෙම සිවලෙක්) නො වෙයි; ස්ථාණුඃ, ස්ථාණු තෙවේ යි;

ගරහා කිසිලෙසින්—පවසන උකට අරුතක්
එ වියූ නිදිපසස් නම්—ලකරමහගතුගතුවෝ. (12)

(මේ උමාවගේ පිළිතුර ය.) (5) කීලකඃ කිමු, (තිගේ හිමි තෙම) කාණුවක් ද; (යනු විජයොක්ති යි.) (6) න හි, (මා හිමි තෙම) කාණුවක් නො වේ ම ය; පශුස්වාමි, පශුපති තෙමේ හි; (මේ උමාවගේ පිළිතුර ය.) (7) (පශුස්වාමී) තූ, (පශුපති නමැත්තෝ) වනාහි; ගවාං ගොප්තා, (ගෙරින් රක්නා) ගොපල්ලෙකි; (යනු විජයොක්ති යි.) ඉති, මෙසේ; දෝලාඛෙලනකර්මණි, දෝලාක්‍රීඩන ව්‍යාපාරයෙහි (පැවැත්තා වූ); විජයාගෞර්‍යෝඃ, විජයා නම් සඛිය හා උමාදෙවිය යන දෙදෙනාගේ; ගිරඃ; තෙපුල්හු; වඃ, තොප; පාන්තු, රකිත්වා. මේ වක්‍රොක්තියෙහි 'ශිවෙති' යනු 'ශිවා ඉති' යි සන්ධිච්ඡේදයෙන් ශිවශබ්ද ශිවාශබ්දය කොට ගත් කල්හි ශෘගාලාර්ථය ද, ස්ථාණුශබ්දයාගේ කීලකාර්ථය ද, පශුස්වාමින් ශබ්දයාගේ ගොපාලකාර්ථය ද, යනු අපරාර්ථපක්ෂය වේ. මෙහි විජයා ගෞරී දෙදෙනාගේ වාගනුභාවය වර්ණනා කිරීම කවිහට විවක්ෂිත වූ අර්ථවිශෙෂය යි.

## නින්දාප්‍රශංසාලඞ්කාරය.

(12) ප—කිසිලෙසින්, කිසියම් ලෙශයකින් (= ව්‍යාජමාත්‍රය කින්); ගරහා, ගර්හා කොට; උකට අරුතක්, උත්කෘෂ්ටාර්ථයක්; පවසන, ප්‍රකාශ කරත්හොත්; එ, එය; ලකරමහගත්උගතුවෝ, අලඞ්කාරමහාග්‍රන්ථයන් උද්ග්‍රහණය කළාහු; නිදිපසස් නම්, නින්දා ප්‍රශංසා නමැ යි; වියූ, කීහු.

වි—නුගුණ කියන්නාක් මෙන් සඟවා උසස් වූ ගුණකීර්තන යක් කිරීම 'නින්දාප්‍රශංසා' නම් අලඞ්කාරය යි මෙයින් දක්වනලදි. මෙ නමින් කියනලද අලඞ්කාරයෙක් දණ්ඩින්, මම්මටභට්ට, භොජ රාජ, ජයදෙව, වාමන, විශ්වනාථාදීන්ගේ අලඞ්කාරග්‍රන්ථයන්හි නො පැනේ. එතකුදුවුවත් දණ්ඩ්‍යලඞ්කාර කාව්‍යප්‍රකාශ දර්පණාදි යෙහි පැනෙන ව්‍යාජස්තුති නම් අලඞ්කාරයට මෙ ද පර්යාය නාම යෙක් වේ. "ව්‍යාජරූපා ව්‍යාජෙන වා ස්තුතිඃ" යනු සමාස නිර්ජන හෙයින් ව්‍යාජස්වරූප වූ හෝ ව්‍යාජයෙන් වූ හෝ ස්තුතිය 'නින්දාප්‍රශංසා' නම් වේ. ව්‍යාජයෙන් වූ ස්තුතිය වනාහි ස්තුති ව්‍යාජයෙන් නින්දා කිරීමක් හෙයින් 'ප්‍රශංසානින්දා' නමැ යි ද කිය යුතු වේ.* සමහර ආලඞ්කාරිකයන්ට ලෙශය හැර ව්‍යාජස්තුති යක් අභිමත නො වේ. ලෙශයෙහි ම එ ද ඇතුළත්වනහෙයිනි.

* "ව්‍යාජස්තුතිර්මුඛෙ නින්දා ස්තුතිර්වා රූඪිරන්‍යථා"- කාව්‍යප්‍රකාශ.

**ගනුතු නොප කොරෙන්—මනගඳුරියසිලිය සැමි**
**පරහු පිරිරූ නදුරෙන්—එබැවිනි හගිමි මහබා.** (13)

---

එයින් කීහ :-

“දෝෂස්‍ය යෝ ගුණීභාවෝ දෝෂීභාවෝ ගුණස්‍ය යඃ
ස ලේශඃ ස්‍යාත්තතෝ නාන්‍යා ව්‍යාජස්තුතිරපීෂ්‍යතේ”යි.

(13) ප—මහබා, මහාබාහු ඇත්තාම; අසිලිය සැමි, ඛඩ්ගලතා මෙන් සේ ශ්‍යාමවර්ණ වූ; මනහඳුරිය, මාතඞ්ගඳුරිකාව (සැබොල්දූව); නොප, යුෂ්මත්හු විසින්; කොරෙන් ගනුතු, හස්තයෙන් ග්‍රහණය කළ කල්හි (= විවාහ කළ කල්හි); එබැවිනි, ඒ භාවයෙන්; පරහු, අන්‍යයෝ; න, නොප; දුරෙන්, දූරයෙන්; පිරිරූ, පරිවර්ජනය කළහයි; හගිමි, කල්පනා කෙරෙමි; නොහොත්—මහබා, මහාභාග්‍ය ඇත්තව; මනහඳුරි, හස්තිස්කන්ධයක් පවා විදාරණය කරන්නා වූ; සැමි, ශ්‍යාමවර්ණ වූ; අසිලිය, ඛඩ්ගලතාව; නොප කොරෙන්, යුෂ්මත්හුගේ හස්තයෙන්; ගනුතු, ග්‍රහණය කළ කල්හි; එබැවිනි, ඒ භාවයෙන්; පරහු, ශත්‍රූහු; න, නොප; දුරෙන්, දූරයෙන්; පිරිරූ, පරිහරණය කළහ යි (= නොප වෙතින් දුරු ව පලා ගියහ යි); හගිමි, කල්පනා කෙරෙමි.

මෙහි සැබොල්දූරියකගේ විවාහස්වරූප නින්දාලේශයක් හැඟවීම ද ඛඩ්ගශිල්පයෙහි අත්‍යන්තශූරත්වය නිසා ශත්‍රුමර්දන ස්වරූප ප්‍රශංසාවක් හැඟවීම ද පැනෙන හෙයින් නින්දාප්‍රශංසාලඞ්කාරය වේ. ඛඩ්ගශිල්පයෙහි කෘතහස්ත වූ වීරයන්ගේ ඛඩ්ගය ඇත්බඳෙක නමුත් නො රඳා පලා විනිවිද යෙයි. මහාද්‍රව්‍ය ප්‍රදානය ආයුධශිල්පාභ්‍යාසයාගේ මස්තකප්‍රාප්තියෙහි එක් අඞ්ගයෙකි. එහෙයින් ප්‍රශංසනපක්ෂයෙහි 'මනගඳුරි' යනු 'ඇත්බඳ පලා ලන' යන අර්ථයෙහි යොදනලද්දේ ය.* ව්‍යාජස්තුතියට ශ්ලේෂය අඞ්ගයක් නො වන නමුත් ශ්ලේෂසංසර්ගය ඇතිකල්හි ම ව්‍යාජස්තුතිය චමත්කාරභූමි වේ. එහෙයින් මෙහි 'මනගඳුරි' යන්නෙන් පදශ්ලේෂය ද 'කොරෙන් ගනුතු' යන්නෙන් අර්ථශ්ලේෂය ද මීට ම සම්බන්ධ කළහ.

---

* නොනැවත ගැඹුරු සයුරට ගොදුරට පිවි ස
නුබප න පැමිණ වැජඹෙන හුරුළසු විල ස
මදම න ගිජිඳු බඳ වත් මිද නො වී ල ස
මොහු අ න සිපත ගොස් නො රඳයි අහස ම් ස

හංසසන්දේශ.

**නැසි ලෙහි තුබූ—කිසිහව් පළකරනු වස්**
**පවසනා අනත් කරුණක්—එ වියූ අන්අලප් නම්.** (14)

---

මේ ව්‍යාජස්තුති තොමෝ (හුදක් දෝෂලක්ෂණ නින්දාව්‍යාජයෙන් වූ) ශුද්ධව්‍යාජස්තුතිය ද, (ස්තුතිපදමිශ්‍රණයෙන් වූ) මිශ්‍රව්‍යාජස්තුතිය දැයි දෙවැදෑරුම්. 'ගනුතු' යනාදි කව ශුද්ධව්‍යාජස්තුතිය වේ. නින්දාර්ථපක්ෂයෙහි ස්තුතිමිශ්‍රණයක් නැති හෙයිනි. මීට ම මේ මතු දක්වන ශ්ලෝකය ශ්‍රීදණ්ඩිභෝජදේවාදි සංස්කෘතාලඞ්කාරිකයෝ දෘෂ්ටාන්ත කළහ.

"පුංසඃ පුරාණාදාච්ඡිද්‍ය ශ්‍රීස්ත්වයා පරිභුජ්‍යතෙ
රාජන්නික්ෂ්වාකුවංශස්‍ය කිමිදං තව යුජ්‍යතෙ"

රාජන්, නරේන්ද්‍රය; ත්වයා, තා විසින්; පුරාණාත් පුංසඃ, මහලු පුරුෂයකු කෙරෙන් ඓහෝ නොහොත් විෂ්ණුහු කෙරෙන්; ආච්ඡිද්‍ය, පැහැරගෙන; ශ්‍රීඃ, සම්පත ඓහෝ නොහොත් ශ්‍රීකාන්තා තොමෝ; පරිභුජ්‍යතෙ, පරිභෝගකරනුලැබේ; ඉක්ෂ්වාකුවංශස්‍ය, ඉක්ෂ්වාකුවංශයෙහි උපන්නා වූ; තව, තට; ඉදම්, මේ (පරදාරාපහරණය); කිම් යුජ්‍යතෙ, කිම යෝග්‍ය වේ ද? (නො වේ මැ යි සේයි) මෙහි පුරාණපදයෙහි ද ශ්‍රීපදයෙහි ද අර්ථගතශ්ලේෂය වේ. පරිභෝගසාම්‍යයෙන් ශ්‍රිය කෙරෙහි ස්ත්‍රීත්වප්‍රතීතිය ඇත් නුයි සමාසෝක්තිසංසර්ගය ද වේ.

### අන්‍යාලාපය.

(14) **ප**—ළෙහි, හෘදයෙහි; නැසී තුබූ, ගුප්ත වැ ස්ථිත වූ; කිසි හව්, කිසියම් භාවයක්; පළකරනු වස්, ප්‍රකාශකරනු පිණිස; අනත්කරුණක්, අන්‍යාර්ථකාරණයක්; පවසන, ප්‍රකාශකරත් හොත්; එ, ඒ අලඞ්කාරය; අන්අලප් නම්, අන්‍යාලාප නමැයි; වියූ, කීහු.

**වි**—උපමේයපක්ෂය සිත තබාගෙන එය හැඟෙනසේ උපමානපක්ෂය පමණක් පහළකිරීම ලක්ෂණකොට ඇති අලඞ්කාරය සංක්ෂෙප ස්වරූපහෙයින් **සමාසෝක්ති** නමැයි ද, ප්‍රස්තුතාර්ථය නො කියා අනිකක් කියන හෙයින් **අන්‍යෝක්ති** නමැයි ද, ඊට ම පර්යාය වශයෙන් **අන්‍යාලාප** යයි ද කියත්. "**සෛෂම් අන්‍යජාතිවිෂයා'න්‍යෝක්තිඃ සමාසෝක්තිරෙව**" යන ශ්‍රීමහාරාජාධිරාජ භෝජදේවයන්ගේ වාක්‍යයෙන් ද, "**සමාසෝක්තිරන්‍යෝක්තිර්වා'භිධීයතෙ**" යන ශ්‍රීවාග්භටාචාර්‍යයී වචනයෙන් ද මේ සඳුට වේ.

මගා මැගි සුව විසලි  ම ලී යා
තිළි දෙළි වැස එසලි  ම ලී යා
බොම් වි මි ලී තුඩු විලි  පි ලී යා
පිලින් නෙලෙන් උලැගි බැලි  මි ලී යා (15)

---

(15) **ප**—මැගී, මාර්ගික වූ; සුව, කීරපක්ෂියෙක් තෙම; විසලි මලියා, විශාල වූ පුෂ්පයන්; මගා, නිරීක්ෂණය කොට; තිළි, තුෂ්ට වැ; දෙළි, දෙහළ ඇති වැ; එසලිමලියා, ඒ ශාල්මලියෙහි; වැස, වැසය කොට; විලිපිලියා, පරිණත ඵලයෙක්හි; මී බොමී වී, මධුපානය කෙරෙමැයි කියා; තුඩු, චඤ්චුව; ලී, ප්‍රක්ෂේප කෙළේ; නෙලෙන්, මාරුතයෙන්; උලැගි, උල්ලඞ්ඝිත වූ; පිලින්, තූලයන්; මිලියා, ම්ලාන වැ; බැලි, නිරීක්ෂණය කෙළේ යි.

මෙහි ගිරාපක්ෂිහට උපමෙය වූ අනිකෙක් ද; ශාල්මලියට උපමෙය වූ අනිකක් දූයි යනාදීහු කවිහුගේ හෘද්ගත වූවෝ වෙත්. ඒ ප්‍රස්තුතාර්ථයන් කෙරෙහි පිටත් අර්ථයෝ ම ස්වරූපයෙන් දක්වනලද්දාහු නුයි මේ '**අන්‍යාලාප**' නම් වී.

**මේ සඳහා සංස්කෘතාලඞ්කාරිකයන්ගේ උදාහරණ ද මෙසේ යි:-**

"ශ්ලාඝ්‍යා ධ්වස්තාධ්වගග්ලානෙඃ කාරීරස්‍ය මරෞ ස්ථිතිඃ
ධිඞ්මෙරෞ කල්පවෘක්ෂාණාමනුපන්‍යාර්පිතාං ශ්‍රියඃ"

**මරෞ**, නිර්ජලභූමියෙහි (= වාලුකාකාන්තාරයෙහි); ධ්වස්ත, නසනලද; අධ්වගග්ලානෙඃ, මාර්ගිකයන්ගේ ගිලන්බැව් ඇති; කාරීරස්‍ය, දළුක්වෘක්ෂයාගේ; ස්ථිතිඃ, පිහිටීම; ශ්ලාඝ්‍යා, පැසසිය යුත්තී ය; මෙරෞ, මෙරමුදුනෙහි; අනුපන්‍යාර්පිතාම්, නො පැමිණි අර්පිත් ඇති; කල්පවෘක්ෂාණාම්, දිව්‍යවෘක්ෂයන්ගේ; ශ්‍රියඃ, ශොභාවන්ට; ධික්, නින්දා (වේවා).

දිය නැති වාලුකාකාන්තාරයෙහි ගමන්කරන මගීන්ට එහි වූ දළුක්ගස ද ගිමන් නිවාගැන්මට කිසිවිටෙක උපකාර වේ. මෙර මුදුනේ පිහිටි කල්පවෘක්ෂයන්ගෙන් දුගිමගීන්ට එපමණ උපකාරයෙකුත් නො වේ. ත්‍යාගී වූ නිර්ධනයාගෙන් පමණ මසුරු වූ ධනවතුන්ගෙන් ලොකයාහට වැඩක් නැතිබව හඟවමින් කිසියම් ආඪ්‍යකෙනකුන්ට නින්දාපිණිසත් අනාඪ්‍යයන්ට ප්‍රශංසාපිණිසත් මේ ශ්ලොකය කියනලද්දේ වේ. මෙහි ප්‍රස්තුත උපමෙය වූ ආඪ්‍ය අනාඪ්‍යයන් නො කියා එයින් අන්‍ය වූ අප්‍රස්තුත උපමානභූත කරීරකල්පවෘක්ෂයන් ම කියනලද හෙයින් අන්‍යාලාප නම් අලඞ්කාරය වේ.

**පියවි අයුරෙකින්—ඇසිරෙන අරුත් වෙසෙසක්**
**සලකනු අන් අයුරෙකින්—ඒ දනු උපේලකර.** (16)
**අපොළනරියොර බිමැ—තනබඳු පෙඳ නොසැහැ මෙන්**
**බියෙනෙව් හිණි නුවන්වන්-කත කන්කපල් පල්ලේ.** (17)

---

### උත්ප්‍රෙක්‍ෂා.

(16) ප—පියවි අයුරෙකින්, ප්‍රකෘති ආකාරයෙකින්; ඇසිරෙන, ආශ්‍රිතවන්නා වූ; අරුත් වෙසෙසක්, අර්ථවිශෙෂයක්; අන් අයුරෙකින්, අන්‍යාකාරයෙකින්; සලකනු, සංලක්‍ෂණය කිරිම ය (යන යමක් ඇද්ද); ඒ, එසේ වූ අලඞ්කාරය; උපේලකර, උත්ප්‍රෙක්‍ෂාලඞ්කාර නමැයි; දනු, ජානනය කරනු.

වි—ප්‍රකෘති ආකාරයෙකින් පවත්නා ද්‍රව්‍යයක් හෝ ගුණයක් හෝ ක්‍රියාවක් හෝ අනික් ආකාරයෙකින් සලකනු ලැබේ නම් ඕ තොමෝ **උත්ප්‍රෙක්‍ෂා** නම් වන්නී ය; "**මෙනි, සිතමි, හඟිමි**" යනාදී ශබ්දයෝ මෙහි උත්ප්‍රෙක්‍ෂා ව්‍යඤ්ජකවශයෙන් යොදනු ලැබෙත්. ද්‍රව්‍යාදීන් ත්‍රිවිධ හෙයින්; **ද්‍රව්‍යොත්ප්‍රෙක්‍ෂා, ගුණොත්ප්‍රෙක්‍ෂා, ක්‍රියොත්ප්‍රෙක්‍ෂා** යයි උත්ප්‍රෙක්‍ෂාව ද ත්‍රිවිධ වේ. උත්ප්‍රෙක්‍ෂාවයවය, උත්ප්‍රෙක්‍ෂොපමාය, මතය යන භෙදත්‍රය ද මෙහි ම ඇතුළත් වේ. මොවුන් අතුරෙන් ගුණොත්ප්‍රෙක්‍ෂාව පමණක් සිදතෙහි උදාහරණ කරනලදී.

**"අතද්‍රූපස්‍යාන්‍යථා'ධ්‍යවසානමතිශයාර්ථමුත්ප්‍රෙක්‍ෂා"**

යනු මේ සඳහා දක්වනලද වාමනසූත්‍රය වේ. අතද්‍රූපස්‍ය, ඒ ස්වරූපය නැත්තාහුගේ; අන්‍යථා, ඒ ස්වරූපය නැති පරිද්දෙන්; අධ්‍යවසානම්, සැලකීම; අතිශයාර්ථම්, අර්ථාතිශයක් පිණිස (කරනු ලැබේ ද); උත්ප්‍රෙක්‍ෂා, (ඕ තොමෝ) උත්ප්‍රෙක්‍ෂා නමු.

ආචාර්ය්‍ය වාග්භට භොජදෙවාදීහු ද මෙය මෙසේ ම කීහු:-

"කල්පනා කාචිදෞචිත්‍යාද්‍යත්‍රාර්ථස්‍ය සතො'න්‍යථා
ද්‍යොතිතෙවාදිභිඃ ශබ්දෛරුත්ප්‍රෙක්‍ෂා සා ස්මෘතා යථා"

"අන්‍යථාවස්ථිතං වස්තු යස්‍යාමුත්ප්‍රෙක්‍ෂ්‍යතෙ'න්‍යථා
ද්‍රව්‍යං ගුණඃ ක්‍රියා වාපි තාමුත්ප්‍රෙක්‍ෂාං ප්‍රචක්‍ෂතෙ"යි.

(17) **ප—තනබඳු, ඝනාකාර වූ; පෙඳ, කඳුකය; නො සැහැ මෙන්, අමර්ෂයෙන් මෙන්; බිමැ, භූමියෙහි; අරියොර, නැවත නැවත; අපොළත්, ආස්ඵෝටනය කරනකල්හි; කත, (ඒ) කාන්තාවගේ; නුවන්වන්, නයනාකාර වූ; කන්කපල්, කර්ණෝත්පලය තෙම; බියෙන් එව්, භීතියෙන් මෙන්; පල්ලේ, පාදතල යෙහි (=පාපිට); හිණි, පතිත වී.**

**සමුද එකතැ හෝ—අන්අරුත් රුහවිසෙකින්
විකපායුරෙව් පවසත—එ වියූ රූලකර නම්. (18)**

---

ක්‍රීඩාචිත්තයෙන් පඤු ගසන්නා වූ කාන්තාවකගේ පැළඳි කනුපුල ගැළවී බිම වැටීම මෙහි ප්‍රකෘති ආකාර යැ. ඒ පඤුව ගැසීම ඉවසිය නොහී මෙන් මෙතැයි ද, කනුපුල බිම හිම බියෙන් මෙතැයි ද කවිහුගේ උත්ප්‍රේක්ෂණය යි. මේ අලඞ්කාරය ද මහා කවීන්ට බොහෝසේ අභිමත වේ.

මහාකවි කාලිදාසයෝත් මේ කිහ :-

"පයොධරාකාරධරෝ හි කන්‍දුකඃ කරේණ රොෂාදභිහන්‍යතෙ මුහුඃ
ඉතීව නෙත්‍රාකෘති භීතමුත්පලං ස්ත්‍රියඃ ප්‍රසාදය පපාත පාදයොඃ"යි.

ශ්‍රී කුමාරදාස මහාකවිහු ද ජානකීහරණයෙහි :-

"භෘඞ්ගා නිලීනෙන සරොජෂණ්ඩ සොමිද්ධිතීයෙන නාරාධිපෙන
උත්සාරිතා වක්තුමිවාපරාසාං කණ්ඨාන්තමීයුර් නිහිතාවතංසම්" යි.

මෙහි රජු විසින් නහාපියනලද භෘඞ්ගයෝ රහස්‍යභාෂණය පිණිස මෙන් කණ්ඨාන්තයට ගියහයි කවිහු විසින් උත්ප්‍රේක්ෂිත යි.

### රූපකාලඞ්කාරය.

(18) **ප**—සමුද, සමුදායයෙහි (හෝ); එකතැ හෝ, එකාවයෙක්හි හෝ; රුහවියෙකින්, රූපභාවයෙකින්; අයුරෙව්, ආකෘතිය මෙන්; විකපා, විකල්පනය කොට; අන්අරුත්, අන්‍යාර්ථයක්; පවසත, ප්‍රකාශකරත්හොත්; එ, හෙ තෙම; රූලකර නම්, රූපකාලඞ්කාර නමැයි; වියු, කිහු.

**වි**—වාක්‍යයෙහි දක්වනුලබන සියලු පදාර්ථයන් විෂය කොට හෝ එකදෙශයක් විෂය කොට හෝ (උපමානොපමෙය වූ වස්තූන්) යම්කිසි ආකාර සම්බන්ධයක් හෙතු කොටගෙන තත්ස්වරූපයෙන් සලකා 'මෙ නම් එ ම ය, එ නම් මෙ ම ය'යි අභෙදයෙන් ආරොපණය කිරීම **රූපකාලඞ්කාර** නම් වේ.

**'උපමානොපමෙයස්‍ය ගුණසාම්‍යාත් තත්ත්වාරොපො රූපකම්'**

යනු මේ සඳහා වාමනාචාර්‍යයන් කළ අලඞ්කාරසූත්‍ර යි—
උපමානොපමෙයස්‍ය, උපමානය හා උපමෙයයාගේ; ගුණසාම්‍යාත්, (විභූත) ගුණයක් පිළිබඳ සාදෘශ්‍යය හෙතු කොටගෙන; තත්ත්වාරොපඃ, අභෙදාරොපණය හෙවත් නො'වෙනස් කොට

**යසපඬෙරෙහු සුපුල්—සොමි සිසි සොඳුරු ගහරැස්**
**සේවලාදල නළ—සෙලෙස් දියවිලැ බිජී.** (19)

---

සැලකීම; රූපකම්, රූපකාලඞ්කාර නම්. උපමාන උපමෙය දෙදෙනා තත්වයෙන් වෙනස් වූවෝ ම ය. එතකුදුවුවත් ප්‍රකාශ වූ ගුණයක් නිසා ඒ භෙදය (= වෙනස) මුවහ කොට "**පාදය පද්මය** මෙනැ"යි නො කියා "**පාද නමැති පද්මය**"යි එකස්වරූප කොට දැක්වීම "**රූපක**" නමැයි මෙයින් දක්වනලද්දේ වේ.

කියනලදමැයි ආග්නෙයයෙහි :-

"උපමානස්‍ය තත්වං යදුපමෙයෙ තු රූප්‍යතෙ
ගුණානාං සමතං දෘෂ්ට්වා රූපකං නාම තද්විදුඃ"යි.

"උපමාන උපමෙය දෙදෙනා පිළිබඳ ගුණයන්ගේ සමානත්වයක් දැක උපමානයාගේ නො වෙනස් බව උපමෙයයා කෙරෙහි ලා දක්වනුලැබෙයි යන යමක් ඇද්ද ඒ රූපක නමැයි දනිත්"- යනු භාව යි.

මේ අලඞ්කාරය ආචාර්‍ය්‍ය දණ්ඩ්‍යාදීන් විසින් සමස්ත, ව්‍යස්ත සමස්තව්‍යස්තාදිවශයෙන් විංශතිප්‍රකාරයෙකින් විස්තර කොටත් අපර්‍ය්‍යන්තවිකල්පඇතැයි උපසංහාර කරනලද්දේ ය. භොජරාජ දීහු ශබ්දභූයිෂ්ඨ, අර්ථභූයිෂ්ඨ, උභයභූයිෂ්ඨ යන ත්‍රිභෙදයෙහි සූවිසි විකල්පයෙකතකුන් දැක්වූහ. මේ අලඞ්කාරාධිකාරයෙහි වූකලී රූපකාලඞ්කාරය ද දිඞ්මාත්‍රවශයෙන් ඉතා සංක්‍ෂිප්ත කොට කියනලද්දේ ය. මේ පිළිබඳ විකල්ප අතුරෙන් හෙතුරූපකාලඞ්කාරය පමණෙක් ම මෙහි නිර්දිෂ්ට යි. **රූපකාලඞ්කාර** නාමය එහි විකල්පයන්ට ද සාධාරණ වේ. විකල්ප වූ හෙතුරූපකාලඞ්කාරය සිදත්පෙළපොත් ආදියෙහි රූපකාලඞ්කාරයටත් මුලින් යෙදූසේ පැනෙන නමුත් අවයවයක්හුගේ පළමු කොට දැක්වීම ද අවයවීහුගේ පසු ව දැක්වීම ද දුෂ්ක්‍රමදොෂය වේ. මේ විපර්‍ය්‍යාසය ද කාලාන්තරයෙහි ලිපිභ්‍රාන්තිවශයෙන් පතිත යයි හැඟේ. එහෙයින් පළමු කොට රූපකාලඞ්කාරනිරූපණය ද තදනන්තර වැ හෙතු රූපක නිරූපණය ද යථාක්‍රමයෙන් මෙහි යොදනුලැබේ.

**රූපකාලඞ්කාරයට උදාහරණ :-**

(19) **ප**—ඔහු, ඔහුගේ; සුපුල්, සුපුල්ල වූ; යසපඬෙර, යශස් නමැති පුණ්ඩරීකය තෙම; දියවිලැ, ජගත් නමැති තඩාගයෙහි; බිජී, භ්‍රාජිත වී; කෙබඳු වූ යශඃපුණ්ඩරීකයෙක් ද යත්? සිසි, චන්ද්‍ර

නමැති; කෙමි, කර්ණිකාවක් ඇති; ගහරුස්, ග්‍රහරාශි (= තාරකා සමූහ) නමැති; කෙසුරු, කෙශර (= රේණු) ඇති; සේවලාදල, ශ්වෙතවලාහක නමැති පත්‍ර ඇති; කෙලෙස්, කෛලාසපර්වත නමැති; නල, නාලයක් ඇති; ඔහු සුපුල් යසපඬෙර දියවිලැ තිජ්, (ඔහුගේ සුප්‍රඵුල්ල වූ යශස් නමැති පුණ්ඩරීකය තෙම ජගත් නමැති තඩාගයෙහි භ්‍රාජිත වී.)

වි—මෙහි යසස ම හෙළපියුමැයි ද, චන්ද්‍රයා ම පියුම්කෙමි යයි ද, තාරකා සමූහය ම රේණු යයි ද, සුදුවලාකුළු ම පියුම්පෙති යයි ද, කෛලාසපර්වතය ම පියුම්දණ්ඩ යයි ද, ලොකය ම විලැයි ද කිවිහු විසින් අභෙදයට පමුණුවනලද්දේ ය. මෙකී උපමානොපමෙය පදාර්ථයෝ මෙහිදී තාදාත්ම්‍යයට ම පමුණුවා සලකනලදහ. යසසත් හෙළපියුම ම ය, හෙළපියුමත් යසස ම ය, අනිකෙක් නො වෙයි, යනාදීන් සැලකීම තාදාත්ම්‍යාරොපය යි. එවැනි ආරොපණයෙන් යුත් හෙයින් මේ රූපකාලඞ්කාර යි. "යශ පඬෙර වැනි යශපඬෙර"යි උපමානොත්තර විශෙෂණසමාසය මෙහි නො යෙදේ. "යශ මැ පඬෙර යශපඬෙර"යි අවධාරණපූර්වපද විශෙෂණසමාසය ම මෙහි යෙදේ. මිට "රූපකසමාසය" යනු ද වෛයාකරණයන්ගේත් ආලඞ්කාරිකයන්ගේත් නාමාන්තර යෙකි. මේ දැක්වූ උදාහරණයෙහි උපමානොපමෙයයන්ගේ සමාසවීම ද නො වීම ද පැනේ, සමාස අසමාස ඛණ්ඩ අඛණ්ඩ වශයෙන් මේ අලඞ්කාරය විකල්පාන්තරයට පැමිණේ.

එයින් කීහ වාග්භටාචාර්යයෝ:-

"රූපකං යත්‍ර සාධර්ම්‍යාදර්ථයොරභිදා භවෙත්
සමස්තං වා'සමස්තං වා ඛණ්ඩං වා'ඛණ්ඩමෙව වා"යි.

යසපඬෙර, සේවලාදල, දියවිලැ යන මොවුන් සමාස ව ද කෙමි, සිසි, කෙසුරු, ගහරුස්, නල, කෙලෙස් යන මොවුන් අසමාස ව ද 'සිසි කෙමි' ආදි අඞ්ගරූපණයෙන් පූර්ණ ව ද සිටියෙන් මේ රූපකාලඞ්කාරය විකල්පාන්තරයෙහි දක්වනලද අශෙෂවස්තුවිෂය වූ සමස්තව්‍යස්ත අඛණ්ඩරූපකය වේ.

ආචාර්ය සඞ්ඝරක්ෂිත සඞ්ඝරාජපාදයෝත් සුබොධාලඞ්කාරයෙහි මේ දැක්වූහ:-

"චන්ද්‍රිකා මන්දහාසා තෙ මුනින්ද වදනින්දුනො
පබොධයත්‍යයං සාධුමනොකුමුදකානනං"යි.

ගැඹුරෙන් සයුරු වී—සොම්ගුණෙනිඳු රිවි තෙදින්
ඇදුරු දිරි තිළිණෙන්—සුරතුරු මෙ හේරු නම්. (20)

---

මුනිඳු, මුනීන්ද්‍ර වූ තථාගතයන්වහන්සේ; තෙ, තුඹවහන්සේ පිළිබඳ වූ; වදනින්දුනො, මුවසඳුහුගේ; අයං, මේ; මන්දහාසො, මඳ සිනා නමැති; චන්දිකා, සඳකැල්ම; සාධු, සුදනන්ගේ; මනොකුමුද කානනං, සිත් නමැති කුමුදුවනය; පබොධයති, පොබයා.

මෙහිදු 'චන්දිකා, මන්දහාසො' යනු අසමස්ත යැ, 'වදනින්දුනො, මනොකුමුදකානනං' යනු සමස්ත යැ. මුඛ, චන්ද්‍ර දෙදෙනාගේ ම සාඞ්ගරූපණය කළ හෙයින් අඛණ්ඩ යැ. එහෙයින් මේ ද අශෙෂ වස්තුවිෂය වූ **සමස්තව්‍යස්ත අඛණ්ඩරූපකාලඞ්කාරය** වේ.

## හෙතුරූපකාලඞ්කාරය.

(20) **ප**—ගැඹුරෙන්, ගාම්භීර්‍ය්‍යයෙන්; සයුරු වී, සාගරය වූයෙහි කියා ද; සොම්ගුණෙන්, සෞම්‍යගුණයෙන්; ඉඳු (වී), චන්ද්‍ර වූයෙහි (කියා ද); තෙදින්, තෙජසින්; රිවි (වී), සූර්‍ය්‍ය වූයෙහි (කියා ද); තිළිණෙන්, ත්‍යාගයෙන්; සුරතුරු (වී), සුරද්‍රැම වූයෙහි (කියා ද); මෙ, මේ (දක්වනලද්දේ); හේරු නම්, හෙතු රූපක නම් (අලඞ්කාරය වේ).

**වි**—මෙහි ගාම්භීර්‍ය්‍යාදිගුණයන් හෙතු කොටගෙන ප්‍රස්තුතයා කෙරෙහි සමුද්‍රාදිභාවය ආරොපණය කරනලද්දේ වේ. මෙසේ හෙතුයෙන් වූ තත්ත්වාරොපණය දණ්ඩ්‍යාචාර්‍ය්‍යාදීහු **'හෙතුරූපක'** නම් අලඞ්කාර යයි කීහු. ආචාර්‍ය්‍ය ක්‍රමදීශ්වරාදීන් විසින්-

**"රූපකං තුල්‍යයොරෙවාභෙදෙන පරිකීර්තිතම්"**යි

කියනලද ප්‍රස්තුතපුරුෂයාගේත් අප්‍රස්තුත සමුද්‍රාදීන්ගේත් අභෙදය ඇති හෙයින් සාමාන්‍යරූපණය ද මෙහි සම්භව වේ.

ජයදෙව විශ්වනාථාදි ආලඞ්කාරිකයෝ වනාහි ප්‍රස්තුත වූ එකක්හු විෂයභෙදයෙන් අනෙකවිධ කොට දක්වීම **"උල්ලෙඛාලඞ්කාර"** නමැයි කීහු. මේ දෙක එක ම අලඞ්කාරය වේ.

කාව්‍යාදර්ශයෙහි :-

"ගාම්භීර්‍ය්‍යෙණ සමුද්‍රො'සි ගෞරවෙණාසි පර්වතඃ
කාමදත්වාච්ච ලොකානාමසි ත්වං සුරපාදපඃ"

යන්නෙන් ද ගාම්භීර්‍ය්‍යාදිගුණයන් හෙතු කොටගෙන ප්‍රස්තුතයා කෙරෙහි සමුද්‍රත්වාදි ආරොපණය ම හෙතුරූපකාලඞ්කාරයට නිදර්ශන කළහ.

**ඝඟ ඈ වණින් මුත්—තුබුපද නො ලා සඳවස්**
**නො ම ලැගැ පෙරකිවිසමා—කව් බැඳ යසබඳ දෙවා.(21)**

**ලකරඅදියර දෙලොස්වනු.**

---

## උලෙලඛාලඞ්කාරය.

"ක්වචිද්භෙදද්ග්‍රහීතෲණාං විෂයාණාං තථා ක්වචිත්
ඒකස්‍යානෙකධොල්ලෙඛො යඃ ස උල්ලෙඛ ඉෂ්‍යතෙ"

ක්වචිත්, කිසිතැනෙක්හි; ග්‍රහීතෲණාං භෙදත්, ග්‍රාහකයන්ගේ භෙදයෙන් ද; තථා, එසේ ම; ක්වචිත්, කිසිතැනෙක්හි; විෂයාණාම්, (ගාම්භීර්‍ය්‍යාදි) විෂයයන්ගේ (භෙදයෙන් ද); ඒකස්‍ය, එකක්හුගේ; අනෙකධා උල්ලෙඛඃ, අනෙකප්‍රකාරයෙන් කථනය යන; යඃ, යමෙක් (ඇද්ද); සඃ, හෙතෙම; උල්ලෙඛඃ ඉෂ්‍යතෙ, **උල්ලෙඛාලඞ්කාර** නමැයි කැමතිවනුලැබේ.

ග්‍රහීතෘභෙදයෙහි උල්ලෙඛයට උදාහරණ :-

"ප්‍රිය ඉති ගොපවධූභිඃ
ශිශුරිති වෘද්ධෛරධීශ ඉති දෙවෛඃ
නාරායණ ඉති භක්තෛර්-
බ්‍රහ්මෙත්‍යග්‍රාහි යොගිභිර්දෙවඃ"

ගොපවධූභිඃ, ගොපාඞ්ගනාවන් විසින්; ප්‍රියඃ ඉති, වල්ලභ යයි ද; වෘද්ධෛඃ, මහල්ලන් විසින්; ශිශුඃ ඉති, ළදරුවෙකැයි ද; දෙවෛඃ, දෙවියන් විසින්; අධීශඃ ඉති, අධීශ්වර යයි ද; භක්තෛඃ, භක්තිමතුන් විසින්; නාරායණඃ ඉති, නාරායණ යයි ද; යොගිභිඃ, තපස්වීන් විසින්; බ්‍රහ්මා ඉති, බ්‍රහ්ම යයි ද; දෙවඃ, (විෂ්ණු) දෙවි තෙම; අග්‍රාහි, දැනගන්නාලද්දේ ය.

විෂයභෙදයෙහි **උල්ලෙඛයට** වනාහි පූර්වෝක්ත ලක්‍ෂණ වූ; හෙතුරූපකය ම හෙවත් "ගාම්භීර්‍ය්‍යෙණ සමුද්‍රො'සි" යනාදිය ම උදාහරණ කළහ.

(21) ප—ඝඟ ඈ වණින් මුත්, ඝකාර ඟකාරාදි වර්ණයන් විනා; සඳවස්, ඡන්දස් පිණිස; තුබුපද, තුච්ඡ වූ පදයන්; නො ලා, ප්‍රක්‍ෂෙප නො කොට; පෙරකිවිසමා, පූර්වකවිසමය; නො ම ලැගැ, උල්ලඞ්ඝනය නො කොට ම; කව් බැඳ, කාව්‍යබන්ධනය කොට; යසබඳ, යශඃශරීරය; දෙවා, ජීවත් කරව්.

වි—අලඞ්කාරනිරූපණයට ඉක්බිති අලඞ්කාරශාස්ත්‍රාක්‍ත ක්‍රමයෙන් දක්වියයුතු වූ කවිසමය ද සිඟිකරවන්නා වූ ආචාර්‍ය්‍ය පාදයෝ "ඝන අෑ වණන්" යනාදි මෙකව අධිකාරොපසංහාර වශයෙන් කීහ. මෙයින් ඡන්දොරක්‍ෂණය සඳහා කවිසමයාගත වූ යකාර හකාරාදි අක්‍ෂරයන් මුත් අන්‍ය වූ නිරර්ථකපදයන් නො යොදා කවිසමය නම්ලද සත්කවීන්ගේ ප්‍රායොගිකය (= රචනාවිධිය) නො ඉක්මවා කාව්‍යබන්ධනය කොට යශශ්ශරීරය ජීවමානකටයුතු බැව් දක්වූහ.

"ඝන අෑ වණන්"යි කියනලද්දවුන්ට ද කවිසමයෙහි පැනෙන උදාහරණ ස්වල්පමාත්‍රයෙක් මෙහි දක්වනුලැබේ.

කව්සේකරයෙහි. ගුත්තිලදාකවෙහි.

"වෙමින් කිසි රුනෑ ණී ය "නොහළ විරූ සිරි ය හ
සිංහිමි කොරෙන් පැරු ණී ය රිපදුරට රිවි උද ය හ
සිතු වෙනත පැමි ණී ය පබල මෙර දිරි ය හ
නෑංල වෙයි අහහත්ට බැමි ණී ය" නැඟී රිය රියැදුරෝ සිටි ය හ"

ඈතබැදයෙන් ය හ ආදීන් කෙරෙහි වූ ස්වරවිශෙෂ
ගන්නේ ය.

බුදුගුණඅලඞ්කාරයෙහි—යකාරසථ ආකාරය.

"තම වෙත දික් කළ අත පෑ දේ යා
සිඟමනකට දීක් කරනු නො දේ යා
තම වෙත යෙමි එසවූ පා දේ යා
නිරයට වැද දුක් විදිනු නො දේ යා"

කව්සේකරයෙහි—හකාරසථ ආකාරය.

"කෙසේ මෙහිමි වදා ළ හා
කිවිහු උනුන් විතා ළ හා
හිවි යසගොස හදා ළ හා
ගෙන සළු හිස සිටා ළ හා"

හංසසන්දෙශයෙහි—හකාර සහිත උකාරය.

"පත් සතත හු මෙත් සිතැත හු කි ත් තොත හු
දෙ ත් සමත හු ල ත් සැපත හු ස ත් සිත හු
ග ත් සමත හු ස ත් සිරිත හු සෙ ත් පාත හු
න ත් සතත හු මු ත් කෙවල හු වත ත් ඔ හු"

යගදෙකින් පිටත් වූවන් කෙරෙන් ද ස්වරවිකෘතිය වේ.

බුදුගුණඅලඞකාරයෙහි—වකාරසථ ආකාරය.

"සතොසි න් පුද කෙරෙමින් මුනිසඳු වා
තොලසි න් ගොස් වැද මහගංතෙර වා
වෙසෙසි න් මුනිපුද කරවන ලෙස වා
මෙලෙසි න් දිනසුන් එවිසල් පුර වා"

මේ නයින් කවිසමයාගත සෙසු අක්‍ෂරයනුදු පරික්‍ෂණය කරන්නේ ය.

---

## කවිසමය.

"**කවිසමය**" යනු කවීන්ගේ සිද්ධාන්ත යැ හෙවත් කවීන් විසින් පිළිගන්නාලද ශිෂ්ටප්‍රයොග නියමය යි. මේ අපර්‍යන්ත හෙයින් සත්කවීන්ගේ යෙදුම් පුහුණුකිරීමෙන් ම අවබොධ කටයුතු වේ. ඊට ද ස්වභාෂානුරූප වූ ප්‍රායික නිදර්‍ශනමාත්‍රයෙක් දක්වනුලැබේ.

එක්පදයක් අලඞකාර පිණිස මුත් දෙවරක් නො යොදන්නේ ය. පාදාන්ත ලඝුහුගේ ගුරුත්වය සියලු වෘත්තවිෂයෙහි ම එක ලෙස නො සලකන්නේ ය. පාදාදියෙහි ශිෂ්ටප්‍රයුක්ත නුවූ නිපාත පද නො යොදන්නේ ය. අර්‍ධයෙකින් නිම්යාක් වැනි වාක්‍යෛක ශෙෂයක් අනික් අර්‍ධයට ඇතුළත් නො කරන්නේ ය: යම් විශෙෂණසමාසයෙක් අන්‍යාර්‍ථසමාසාවබොධය කෙරේ නම් එවැනි සමාසයක් කාව්‍යයෙහි නො යොදන්නේ ය. යම් අන්‍යාර්‍ථසමාස යෙක් විශෙෂණසමාසාවබොධය කෙරේ නම් එවැනි සමාසයක් කාව්‍යයෙහි නො යොදන්නේ ය. විශෙෂ්‍යයාගේ අවබොධය ඇති කල්හි විශෙෂණමාත්‍රයක් යොදන්නේ ය. කවීන් විසින් අතිශයෙන් ප්‍රයුක්ත වූ දෙශභාෂාපද හැර! අනතිප්‍රයුක්ත දෙශභාෂාපද නො යොදන්නේ ය. ද්විලිඞ්ගිකශබ්දයෙක් වී නම් ඔහුගේ අතිප්‍රයුක්තලිඞ්ගය මුත් අනතිප්‍රයුක්තලිඞ්ගය නො යොදන්නේ ය. අතිප්‍රයුක්ත අධ්‍යාහාරය මුත් අනතිප්‍රයුක්ත වූ අධ්‍යාහාරය නො යොදන්නේ ය. ලක්‍ෂණශබ්දයෝ ද අතිප්‍රයුක්ත වූවාහු ම යෙදියයුත්තාහු ය. "කතර දෙදෙනෙක් යමක්හුගේ නම්හි ද එතෙම 'දෙක' නම් = කාක යි" යනාදීන් අනතිප්‍රයුක්තලක්‍ෂණාවෝ නො යෙදියයුත්තාහු ය. එක් වාක්‍යයෙක්හි ලක්‍ෂණාවන්ගේ බාහුල්‍යය නො කරන්නේ ය. යනාදිය කවිසමය නම් වේ. මේ සියල්ල ම ායිකහෙයින් (බොහෝසෙයින්) සැලකියයුත්තේ යි.

## කාව්‍ය හා කාව්‍යහෙතු.

කාව්‍යප්‍රකාශයෙහි :-

කාව්‍ය නම් කවිහුගේ කර්මය හෙවත් කෘතිය වේ.

"කාව්‍යං යශසෙ'ර්ථකෘතෙ-ව්‍යවහාරවිදෙ ශිවෙතරක්‍ෂතයෙ
සද්‍යඃ පරනිර්වෘතයෙ-කාන්තාසම්මිතතයොපදෙශයුජෙ"

යනුහෙයින් කාව්‍ය තෙම කාලිදාසාදීන්ට මෙන් යශස්ලැබීම පිණිස ද, ධාවකාදීන්ට මෙන් ධනලාභය පිණිස ද, රාජාදීන් කෙරෙහි වූ ආචාරව්‍යවහාරයන් දැනීම පිණිස ද, මයූරාදීන්ට මෙන් උපද්‍රව නිවාරණය පිණිස ද, සකලප්‍රයෝජනයන්ට මෞලි ස්වරූප වූ තත්ක්‍ෂණප්‍රවෘත්ත අතිශයාහ්ලාදය පිණිස ද, ඓහික පාරත්‍රික හිතාවහ වූ උපදෙශයොගය පිණිස ද කාන්තාවක මෙන් සරසත්වයට කවිහු ද ශ්‍රොතෘජනයා ද පමුණුවන්නේ වේ.

"ශක්තිර්නිපුණතා ලොකශාස්ත්‍රකාව්‍යාද්‍යවෙක්‍ෂණාත්
කාව්‍යඥශික්‍ෂයාභ්‍යාස ඉති හෙතුස්තදුද්භවෙ"

පූර්වජන්මයෙහි කරනලද පුණ්‍යවිශෙෂයෙන් ජනිත වූ නෛසර්ගිකඥනශක්තිය ද, ඡන්දෝව්‍යාකරණාභිධාන කොෂකලා චතුර්වර්ග ගජතුරගඛඩ්ගාදිලක්‍ෂණ ලෞකිකශාස්ත්‍ර හා මහාකවිවර ප්‍රණීත කාව්‍යග්‍රන්ථ ඉතිහාසාදිය බැලීමෙන් හටගත් නිපුණබව ද, කාව්‍යශාස්ත්‍රඥගුරුවරයන්ගේ උපදෙස් වූ පරිද්දෙන් කාව්‍ය රචනායෙහි නැවත නැවත යෙදීම යයි කියනලද අභ්‍යාසයදැයි යන මේ කාරණත්‍රය එක්වූයේ ඒ කාව්‍යනිර්මාණයෙහි එක ම හෙතුව වේ.

මෙවැනි වර්ණනීය වූ සත්කවිත්වය වනාහි ලොකයෙහි දුර්ලභ ම ය.

කියනලදමැයි ආග්නෙයපුරාණයෙහි :-

"නරත්වං දුර්ලභං ලොකෙ විද්‍යා තත්‍ර සුදුර්ලභා
කවිත්වං දුර්ලභං තත්‍ර ශක්තිස්තත්‍ර සුදුර්ලභා"යි.

කවිත්වයෙහිදු වෛදර්භීදෙශීය කවිවරයන්ට අභිමත වූ වාක් සන්දර්භය සකලවිද්වජ්ජනයන් විසින් වර්ණනීය වේ. එහෙයින් අලඞ්කාරශාස්ත්‍රකර්තෘහු ද එය ම උපදෙශ කොට දක්වූහ.

එයින් කීහ මහාකවි ශ්‍රීරාජශෙඛරයෝ :-

"වාග් වෛදර්භී මධුරිමගුණං ස්‍යන්දතෙ ශ්‍රොත්‍රලෙහ්‍යං
වස්තුන්‍යාසො හරති හෘදයං සූක්තිමුද්‍රාතිවෙද්‍යඃ

**මෑපෙළපමණ සිඹි—කිවිමන් දනන් පසසත**
**ගරහත යළිදු කාම් කිම්—පඬුවෝ මෑ මෙහි පමණෝ. (22)**

**දුහුනදනහට මුත්—මෙ කුදුසිදතින් වියතිනි**
**පිරියත්තට නැත දනක්—මෙහි කළ මතෑතෑ තුස්වා. (23)**

**දකුණලක සියල්—බුජමහවුරෙනි රක්නා**
**දෙදෙ රදළගම්විමනගෑ—පතිරජදෙව් සැර දෙනේ. (24)**

---

සද්‍යඃ සූතෙ රසමනුපමප්‍රෙක්ෂිජන්මා ප්‍රසාදඃ
සන්දර්භශ්‍රීරිති කෘතධියාං ධාම ගීර්දේවතායාඃ”

විදර්භරීත්‍යනුගත වාග්රචනා තොමෝ ශ්‍රොත්‍රයුග්මයෙන් පියයුතු වූ මාධුර්‍ය්‍යරසය ආවහනය කරන්නී ය. ශොභනොක්ති නමැති මුද්‍රායෙන් (තිසැක ව) දතයුතු වූ වස්තුකථනය තෙමේ සිත පැහැරගනී. නිරූපම විචිත්‍රභාවයෙන් හටගත් ප්‍රසාදගුණය තෙමේ එකෙණෙහි ම රසාස්වාදය ප්‍රසව කෙරේ. මෙසෙයින් පවිත්‍රිත වූ බුද්ධි ඇති සත්කවීන්ගේ ප්‍රබන්ධශ්‍රී තොමෝ සරස්වතී දෙවියගේ වාසභවනය වේ.

**ලකරඅදියර, අලඞ්කාරාධිකාර නම් වූ; දොළොස්වනු,**
**ද්වාදසමපරිච්ඡෙදය (නිමි).**

---

(22) මෑපෙළපමණ, මාතෘකාපාලිමාත්‍රයක්; සිඹි, චුම්බනය කළා වූ; කිවිමන් දනන්, කවිම්මන්‍යජනයන්; පසසත, ප්‍රශංසා කළ ද; යළිදු, නැවතත්; ගරහත, ගර්හා කළ ද; කාම් කිම්, (එයින්) කාර්‍ය්‍ය කිම් ද; මෙහි, මේ කෘතියෙහි; පඬුවෝ මෑ, පණ්ඩිතයෝ මෑ; පමණෝ, ප්‍රමාණයෝ යි.

(23) වියතිනි, ව්‍යක්තයෙනි; දුහුනදනහට මුත්, ආධුනික ජනයාහට මුත්; මෙ කුදුසිදතින්, මේ ක්‍ෂුද්‍ර වූ සිද්ධාන්තයෙන්; පිරියත්තට, පර්‍ය්‍යාප්තයන්ට; අතක්, අර්ථයක්; නැත ද, අවිද්‍යමාන වුවත්; මෙහි, මේ ග්‍රන්ථයෙහි; කළ, කරනලද්ද වූ; මතෑතෑ, මාගේ උත්සාහයෙහි; තුස්වා, තුෂ්ට වව්.

(24) සියල් දකණලක, සකල දක්ෂිණලඞ්කාව; බුජමහවුරෙනි, බාහු නමැති මහාප්‍රාකාරයෙන්; රක්නා, රක්ෂණය කරන්නා වූ; රදළගම්විමනගෑ, විප්‍රග්‍රාම (වංශ) නමැති විමානාග්‍රයෙහි; දෙදෙ, ධ්වජයක් බඳු වූ; පතිරජදෙව්, ප්‍රතිරාජදෙව නම් (ප්‍රභුරාජ) තෙම; සැර, චිරකාලයක් මුළුල්ලෙහි; දෙනේ, ජයග්‍රහණය කෙරේ; හෙවත් සමෝත්කර්ෂයෙන් පවතීවා.

**අදරෙනයදන ඔහු—විබතැ නිරණ සියබසැ**
**පළකරනු වස් මෙ කෙළෙමි—කුලුණෙන් සිදත්සඟරා.** (25)

මෙහි ප දනු ව ග දූතැ වියරණ සි ඳු බ ජ මි න
නිතැ ති ති ම න පසිඳ විතඬන ද පිනි පි ලෙ න
යස ර ළ දි ගෙ ළඹෙන විතරප න සයු රු මෙ න
නඟනු මෙලක නිති දිය දදන නර න්නම් න (26)

---

(25) ඔහු, ඒ (ප්‍රතිරාජදෙවයන්); අදරෙන්, ආදරයෙන්; අය දන, ආයාචනය කළ කල්හි; සියබසැ, ස්වභාෂායෙහි; විබතැ නිරණ, විභක්ත්‍යාදීන්ගේ නිර්ණය; පළකරනු වස්, ප්‍රකාශ කරනු පිණිස; මෙ සිදත්සඟරා, මේ සිද්ධාන්තසඞ්ග්‍රහය; කුලුණෙන්, කාරුණායෙන්; කෙළෙමි, රචනා කෙළෙමි.

(26) මෙහි, මේ සිද්ධාන්තසඞ්ග්‍රහයෙහි; පදන්, ප්‍රධාන සූත්‍රය හා; උවඟ, උපාඞ්ගසූත්‍රයන්; දූතැ, ජානනය කොට; වියරණසිඳු, (විංශතිවිධ) ව්‍යාකරණ නමැති සින්ධූන් (= නදීන්); බජමින, භජනය කෙරෙමින්; දපින්, දර්පයෙන්; ඉපිලෙන, උද්ධත වන්නා වූ; විතඬන, විතණ්ඩයන්ගේ හෙවත් ප්‍රතිෂ්ඨා රහිත පරවාදීන්ගේ; මන, මානය; නිතැතිනි, නිරුත්සාහයෙන්; පසිඳ, ප්‍රච්ඡින්න කොට; විතරපත, විස්තාරප්‍රාප්ත වූ; සයුරු මෙන, සාගරය සේ; දිග, දිශාවන්හි; එළඹෙන, උපස්ථිත වන්නා වූ; යසරළ, යශස් නමැති තරඞ්ග ඇත්තා වූ හෝ ශොභන තරඞ්ග ඇත්තා වූ ද්‍රේ හෝ නො හොත් යශොරාශි ඇත්තා වූ; අනනමින, අප්‍රමාණ මත්ස්‍යයන් ඇත්තා වූ ද්‍රේ හෝ නො හොත්; මින නත, ප්‍රඥාවට ස්වාමි වූ (= ප්‍රඥාවලලභ වූ); නර, මනුෂ්‍ය තෙම; මෙලක, මේ ශ්‍රීලඞ්කාද්වීපයෙහි; නිති, නිරන්තරයෙන්; දියදදන, ජයධ්වජයන්; නඟනු, ආරොපණය කරන්නේ යි.

උපමා, රූපක, ශ්ලෙෂ, ජාති සඞ්ඛ්‍යාත අනෙකාලඞ්කාරසංසර්ගයෙන් විරචිත වූ මේ පද්‍යය අර්ථාලඞ්කාරවශයෙන් **"නානාලඞ්කාරසංසෘෂ්ටිඃ සඞ්කීර්ණතා නිගද්‍යතෙ"**යි දක්වනලද සඞ්කීර්ණාලඞ්කාරය වේ. ශබ්දාලඞ්කාර විසින් වනාහි චිත්‍රාලඞ්කාරගත නෛකසන්දර්භවිකල්පයන් අතුරෙහි **"ෂඩරනාමාඞ්කචක්‍රබන්ධ"** නම් වූ විචිත්‍රබන්ධනය වේ. ශාස්ත්‍රනාමය ද කර්තෘනාමය ද මෙහි ගර්භිත හෙයින් **"ශාස්ත්‍රනාම කර්තෘනාම ගර්භචක්‍ර"**යයි ද කියනු ලැබේ. මෙ ද ඉතා දීර්ඝකාලයක් මුළුල්লෙහි අධ්‍යයනාධ්‍යාපන

කරන්නවුන් විසින් නො හඳුනනලදින් භ්‍රමප්‍රමාදජනිත නානා දෝෂයෙන් දුෂ්ට වැ ලුප්තප්‍රාය විය. ඒ මෙහි අප විසින් සකස් කොට ප්‍රකෘතිභාවයට පමුණුවනලදි.

මේ ෂඩරචක්‍රබන්ධනය මහාකවි ශ්‍රීමාඝයන් විසින් තමන්ගේ ශිශුපාලවධ නම් මහාකාව්‍යයෙහි කවීනාම කාව්‍යනාම ගර්භචක්‍ර වශයෙන් කරනලද ෂඩරචක්‍රබන්ධනය ගුරු කොට අලඞ්කාර ශාස්ත්‍රයන්හි කියනලද පරිද්දෙන් රචනා කරනලද්දේ ය.

හේ මෙසේ යි :-

"සත්වං මානවිශිෂ්ටමාජි රභසාදලම්බ්‍ය භව්‍යඃ පුරෝ
ලබ්ධාඝක්ෂයශුද්ධිරුද්ධුරතරශ්‍රීවත්සභූමිර්මුදා
මුක්ත්වා කාමමපාස්තභීඃපරමෘගව්‍යාධඃ ස නාදං හරේ-
රේකෞඝෛඃ සමකාලමභ්‍රමුදයී රෝපෛස්තදා තස්තරේ"

යනු මාඝමහාකවිහුගේ ශිශුපාලවධ නාමාඞ්ක චක්‍රබන්ධය යි.

මෙහි ලක්ෂණ :-

"පුරඃ පුරෝ ලිඛෙත් පාදනත්‍ර ත්‍රීන් ෂඩරීකෘතාන්
තුර්‍යමන්තු භ්‍රමයෙන්නාමෞ නාමාඞ්කශ්චිත්‍රසංවිධිඃ"

යනු ආලඞ්කාරික සංවිධාන හෙයින් මේ චිත්‍රබන්ධචක්‍රයෙහි දැවි සයක් කොට තුන්පාදකෙනකුන් ඉදිරි ඉදිරියෙහි ලියන්නේ ය. චතුර්ථපාදය වනාහි නිම්වළල්ලෙහි සිසාරවන්නේ ය. නාමාඞ්කය ඇති චිත්‍රාලඞ්කාරසංවිධානය වේ.

මෙහි උද්ධාරය මාඝව්‍යාඛ්‍යායෙහි ආචාර්‍ය මල්ලිනාථයන් විස්තර කළ නියායෙන් දක්වනුලැබේ.

දශමණ්ඩලරේඛාත්මක වූ නවමණ්ඩල අනතරාලවත් වූ චක්‍රයෙක්හි නාභිස්ථානය හා සමග එකුන්විසි කොෂ්ඨයක් ඇත්තා වූ වෙන වෙන ම දැවි දෙක දෙක ඇති තුන්පෙළක් සමරේඛාවෙන් ඇඳ එහි එක්පෙළක වාමපාර්ශ්වක්‍රමයෙන් ප්‍රථමපාදය ලියා එසේ ම ඊට පැදකුණින් දෙවන තුන්වන දෙපෙළෙහි ක්‍රමයෙන් දෙවන තුන්වන පාදයන් ලියා අකුරු සහිත වූ කොටු සය හා සමග අටළොස් කොටුවක් ඇති පිටත නිම්වළල්ලෙහි තෘතීය සමරේඛාගත කොෂ්ඨයෙහි සිටි වර්ණය පටන්කොට පැදකුණින් සතරවනපාදය ලියා ඒ ආරම්භවර්ණයෙහි ම නිමවන්නේ ය.

මෙසේ එහි ආද්‍යන්තවර්ණයන්ගෙන් තුර්‍යපාදයාගේ උද්ධාරය වේ. චක්‍රනාභිස්ථානයෙහි පළමු තුන්පාදය පිළිබඳ දශමාක්ෂරයාගේ කීම වේ. තෘතීයාගත කොෂ්ඨයෙහි චතුර්ථපාදය පිළිබඳ

ආද්‍යන්තවර්ණ දෙදෙනාගේ කීම වේ. මේ දක්වනලද මාඝකාව්‍ය ශ්ලෝකය පිළිබඳ චක්‍රයෙහි තුන්වන වළල්ලෙහි "මාඝකාව්‍යමිදං" යනුයෙන් ද=සවනවළල්ලෙහි "ශිශුපාලවධඃ" යනුයෙන් ද කාව්‍ය නාමාඞ්කයොගය වේ. "මෙහි පදනුවග" යනාදි වූ මේ සිද්ධාන්ත චක්‍රබන්ධනය ද පෙර කී සියලු ලක්‍ෂණයෙන් සමන්විත ය. මෙහි තුන්වන වළල්ලෙහි "පතිරජපිරූ" යන අකුරු සය ද, සවන වළල්ලෙහි "වනගෙ සිදත" යන අකුරු සය ද, එක් කොට ගත් කල්හි "පතිරජපිරූවනගෙ සිදත" යි කර්තෘශාස්ත්‍රනාමාඞ්ක යොගය වේ. මෙසේ හෙයින් මේ තෙම "කර්තෘනාමශාස්ත්‍රනාම ගර්භචක්‍ර" යයි කියනලදී.

---

## ෂඩරචක්‍රබන්ධඃ



ශාස්ත්‍රකර්තෘනාමාඞ්ක ගර්භච්ඡත්‍රය

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පද | වි | දි ස | රු | රුව | න | විසෙසන | වි | දූති | | ඝ | න | ත |
| ජය | දූ | ලසු | ව | දෙව | න | විමලරු | ණා | මෙබ | | ර | ණො | ත |
| වර | ල | කර | නා | එද | න | විසිය සු | ර | ඹ තො | සි | ය | | ත |
| තවද | පතිරජ | පිරුව | | | න | වෙත ම සතත වෙ | | | | | | ත |

ෂඩරචක්‍රබන්ධඃ

‘පතිරජපිරුවනගෙ—සිදත’ විමතනැ මිතුරෙව්
‘විදුලකරපිරුවන—විනර’ හිරකල් දිලෙවා.

සුරුකි කෙරෙමින් ති සි
ලෙස මෙවෙහෙරෙහි සවිසි රි
විබිසණ සුරිඳු දමි
නෙදින් සැරදේ මන රමි

ශුභමස්තු.



